පටුන

මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා **http://pitaka.lk** වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# දීඝ නිකාය

# 2

ධර්මවිනය උගත් පණ්ඩිත

**මහාස්ථවිරයන් වහන්සේලාගේ**

ආධාර ඇතුව

**ආචාර්ය්‍ය අධිනීතිඥ**

**ඒ. පී. ද සොයිසා මහතා**

**විසින්**

**සිංහලට පරිවර්තනය කරන ලදී.**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# අනුශාසක මණ්ඩලය

පැලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනේ B.A. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රන්දොඹේ ශ්‍රීසුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ සංඝරාජ විහාරස්ථ ශික්ෂාලංකාර පරිවෙණාධිපති බලපිටියේ පණ්ඩිත විශුද්ධාලොක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්‍ය්‍ය ආර්‍ය්‍යරත්න රේරුකාන මහතා

පටුන



# දීඝ නිකාය

# 2

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
## ඒ. පී. ද සොයිසා මහතා
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**
**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1956
දෙවැනි මුද්‍රණය - 2012

**ත්‍රිපිටකය**
**දීඝ නිකාය 2**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැගීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත්

යොමු කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය

කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මග පෙන්වූ මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඤාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මඟ පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, පාර්ලිමේන්තු මන්ත්‍රී මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2012 සැප්තැම්බර්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන


| | | පිට |
|---|---|---|
| 11. | කෙවට්ට සූත්‍රය | 455 |
| 12. | ලොහිච්ච සූත්‍රය | 496 |
| 13. | තෙවිජ්ජ සූත්‍රය | 525 |
| 14. | මහාපදාන සූත්‍රය | 565 |
| 15. | මහානිදාන සූත්‍රය | 629 |
| 16. | මහාපරිනිර්වාණ සූත්‍රය | 656 |
| 17. | මහාසුදස්සන සූත්‍රය | 786 |
| 18. | ජන වසභ සූත්‍රය | 815 |
| 19. | මහාගොවින්ද සූත්‍රය | 837 |
| 20. | මහාසමය සූත්‍රය | 875 |
| 21. | සක්කපඤ්හ සූත්‍රය | 883 |


මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## සංඥාපනය

සිංහල භාෂාවෙන් ලියා ප්‍රසිද්ධ කරන ත්‍රිපිටක ධර්ම පොත් පඞ්ක්තියේ දෙවෙනි පොතවූද දීඝනිකායේ දෙවෙනි කාණ්ඩයවූද මෙ පොතට සූත්‍ර එකොළහක් අන්තර්ගත කළෙමු තුන්වෙනි පොතට ඉතුරු සූත්‍ර දහතුන ඇතුළත් වේ මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට ගිහි පැවිදි දෙකොටසම දක්වන උනන්දුව අපට මහත් ධෛර්යයක් වේ. නොයෙක් පොත් බැලීම අවශ්‍ය වූ බැවින් පොත අච්චුගස්වා ප්‍රසිද්ධ කිරීම අප බලාපොරොත්තු වූවාට වඩා කලක් ගතවීම ගැන අපේ කණගාටුව ප්‍රකාශ කරමු.

එක එක සූත්‍ර ගැන දැනගත යුතු කරුණු අඩංගු උපග්‍රන්ථයක් දෙවනු එකතු කිරීමට බලාපොරොත්තු වෙමු. අපේ විශේෂ උත්සාහය පොත් පෙළ කියවන්නන්ට බුද්ධ ධර්මය පහසුවෙන් අවබොධ කරගැනීමට උපකාර වීම බැවින් පොතක් කියවන කල තේරුම් ගැනීමට අපහසු කොටස් ඇත්නම් ඒ ගැන දන්වා එවීමෙන් තේරුම් ගැනීමට අපහසු කොටස් තේරුම්කර උපග්‍රන්ථයට ඇතුළත් කිරීමට ඉඩ තිබේ.

මේ පොත් පෙළේ යම් යම් දෝෂ ඇති තැන් දක්වා එවීමෙන් ඒ කරුණුද උපග්‍රන්ථයට ඇතුළත් කිරීමට ඉඩ ලබාදීම ශාසනයට කරන්නාවූ සේවයක් බව මතක් කරමු. බොහෝ වැඩකටයුතුවල යෙදී සිටින කාලයක තමන්ට වැඩි සනීපයක් නැතුව සිටිමිනුත් ඒ හිරිහැර ගැන කිසිසේත් නොසලකා ශාසන ආලයෙන් ආචාර්ය ආයාර්රත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයාර්රත්න රේරුකාන මහත්මයාගේ ආධාර ලැබුනා පමණක් නොව රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර නායක ස්ථවිරයන් වහන්සේද බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන් වහන්සේද, බලපිටියේ පණ්ඩිත විසුද්ධාලොක ස්ථවිරයන් වහන්සේද, අහුන්ගල්ලේ පණ්ඩිත විමලකීර්ති තිස්ස නායක ස්ථවිරයන් වහන්සේද අපට ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත්, බෞද්ධ උපාසක පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

474 - ගාලුපාර,
කොල්ලුපිටිය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# දීඝ නිකාය

## 11. කේවට්ට සූත්‍රය

1. "මා විසින් මෙසේ අසන ලදී. (මාගේ ඇසීම මෙසේය) එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ නාලන්දා නුවර සමීපයේවූ පාවාරික සිටාණන්ගේ අඹවනයේ වාසය කරනසේක. එවිට කේවට්ට තෙමේ භාග්‍යවතුන්වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පැත්තක උන්නේය. එක්පැත්තක උන්නාවූ ගෘහපතිපුත්‍ර කේවට්ට භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීවේය.

"ස්වාමීනි, මේ නාලන්දා නුවර පොහොසත්ය, දියුණුය. බොහෝ ජනයා ඇත්තේය. මිනිසුන්ගෙන් ගැවසීගත්තේය. ඔව්හු භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි විශෙෂයෙන් පැහැදුණාහුය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යමෙක් මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි ප්‍රාතිහාර්යය කරන්නේද, එවැනි එක් භික්ෂුවක් ප්‍රාතිහාර්යය කිරීමට නියම කරණසේක්වා. මෙසේ ඍද්ධි ප්‍රාතිහාර්යය පැවැත්වූ කල්හි මේ නාලන්දා නුවර වාසය කරන ජනයා බොහෝසෙයින් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි විශෙෂයෙන් පහදින්නේය. මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ කේවට්ට ගෘහපති පුත්‍රයාට මේ කාරණය කීසේක.

"කේවට්ටය, මම මෙසේ භික්ෂූන්ට ධර්මදෙශනා නොකරමි. මහණෙනි, එව්. ඔබ, සුදුවස්ත්‍ර අඳින්නාවූ ගිහියන්ට මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි ප්‍රාතිහාර්යය කරව්"යි.

දෙවනුවද, කේවට්ට ගෘහපතිපුත්‍ර භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීයේය. "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ පිළිබඳ ගුණ නොනසමි. නැවතද, මෙසේ කියමි. ස්වාමීනි, මේ නාලන්දා නුවර පොහොසත්ය, දියුණුවට පැමිණියේය. බොහෝ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ජනයා ඇත්තේය. මිනිසුන්ගෙන් ගැවසී ගත්තේය. භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි විශෙෂයෙන් ඔව්හු පැහැදුණාහ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යමෙක් මනුෂ්‍ය ධර්මයට වඩා උතුම් ධර්මයෙන් ඍද්ධි ප්‍රාතිහාර්යය කරන්නේද එබඳුවූ එක් භික්ෂුවක් ප්‍රාතිහාර්යය කිරීමට නියම කරණසේක්වා. මෙසේ ඍද්ධි ප්‍රාතිහාර්යය පැවැත්වූ කල මේ නාලන්දා වැසියෝ බොහොසේ භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි විශෙෂයෙන් පහදින්නාහ."

2. දෙවනුවද භාග්‍යවතුන් වහන්සේ කේවට්ට ගෘහපති පුත්‍රයාට මේ කාරණය කීසේක. "කේවට්ටය, මම භික්ෂූන්ට මෙසේ ධර්මදෙශනා නොකරමි. කෙසේද? "මහණෙනි, ඔබ, සුදු අඳින්නාවූ ගිහියන්ට මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි ප්‍රාතිහාර්යය කරව්" යයි කියාය. තුන්වෙනුවද, කේවට්ට ගෘහපති පුත්‍ර භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීයේය. "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ පිළිබඳ ගුණ නොනසමි. නැවතද මෙසේ කියමි. ස්වාමීනි, මේ නාලන්දා නුවර පොහොසත්ය, දියුණුවට පැමිණියේය. බොහෝ ජනයා ඇත්තේය. මිනිසුන්ගෙන් ගැවසී ගත්තේය. ඔව්හු භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි විශෙෂයෙන් පැහැදුණාහ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යමෙක් මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයෙන් ඍද්ධි ප්‍රාතිහාර්යය කරන්නේද, එබඳුවූ එක් භික්ෂුවක් ප්‍රාතිහාර්යය කිරීමට නියම කරණසේක්වා. මෙසේ ඍද්ධි ප්‍රාතිහාර්යය පැවැත්වූ කල මේ නාලන්දා වැසියෝ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි විශෙෂයෙන් පහදිත්ය" කියාය. කේවට්ටය, මා විසින් විශෙෂ ඥානයෙන් දැන අවබොධ කොට ප්‍රකාශ කරනලද මේ ප්‍රාතිහාර්යයෝ තුන් දෙනෙක් වෙත්. එනම් (ඍද්ධි) නොයෙක් මැවීම් ආදිය කිරීමේ ප්‍රාතිහාර්යය (ආදෙශනා) අනුන්ගේ සිත් දැක්වීමේ ප්‍රාතිහාර්යය (අනුසාසනී) අනුශාසනා කිරීමේ ප්‍රාතිහාර්යය යන තුනයි. කේවට්ටය එයින් ඍද්ධි ප්‍රාතිහාර්යය කවරේද?

3. "කේවට්ටය, මේ ශාසනයෙහි භික්ෂුතෙම නොයෙක් අයුරු ඇති ඍද්ධි විධි වෙන් වෙන් කොට දක්වයි. එකෙක්ව

බොහෝසේ වෙයි. බොහෝසේව එකෙක් වෙයි. ප්‍රකට බවට මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය හරහට, පවුර හරහට, පර්වතය හරහට නොහැපෙමින්යයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම් මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙදා ගමන් කෙරෙයි. පක්ෂියෙකු මෙන් අහසෙහිද පර්යංකයෙන් හිඳගෙනම යයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹලොව තෙක් ශරීරයෙන් වසඟ බව පවත්වයි.

මෙසේ නොයෙක් ඍද්ධි විධි වෙන් වෙන් කොට දක්වන්නාවූ, එකෙක්ව බොහොසේ වන්නාවූ, බොහෝසේව එකෙක් වන්නාවූ, ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය හරහට, පවුර හරහට, පර්වත හරහට නොහැපෙමින් යන්නාවූ දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම්, මතුවීම් කරන්නාවූ, පක්ෂියෙකු මෙන් අහසෙහිද පර්යංකයෙන් හිඳගෙන යන්නාවූ මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති, සඳ හිරු දෙදෙන අතගාන්නාවූ, පිරිමදින්නාවූ, බඹලොව තෙක් ශරීරයෙන් වසඟ බව කරන්නාවූ ඒ ඍද්ධිමත් භික්ෂුව පැහැදුනාවූ එක්තරා ශ්‍රද්ධාවන්තයෙක් දකීද ඒ පැහැදුනාවූ ශ්‍රද්ධාවන්තයා [නොයෙක් අන්දමේ ඍද්ධි දක්වන්නාවූ එකෙක් ද වී බොහෝ සේ වන්නාවූ බොහෝසේව එකෙක් වන්නාවූ ප්‍රකට බවට මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය හරහට, පවුර හරහට, පර්වතය හරහට, නොහැපෙමින් යන්නාවූ දියෙහි මෙන් පොළොවෙහි කිමිදිම් මතුවීම් කරන්නාවූ පක්ෂියෙකු මෙන් අහසෙහිද පර්යංකයෙන් හිඳගෙනම යන්නාවූ මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති සඳ හිරු දෙදෙන අතගාන්නාවූ පිරිමදින්නාවූ බඹලොවතෙක් ශරීරයෙන් වසඟ කරන්නාවූ] මේ භික්ෂුවක් මම දුටුවෙමියි ශ්‍රද්ධා නැත්තාවූ නොපැහැදුනාවූ එක්තරා එකකුට භික්ෂුවගේ මහත් ඍද්ධි ඇති බවද, මහා ආනුභාව ඇති බවද, පින්වත, ඇත්තෙන්ම පුදුමය, පින්වත, ඇත්තෙන්ම ඉතා පුදුමයයි කියන්නේද?

4. ඒ ශ්‍රද්ධා නැත්තාවූ නොපැහැදුනාවූ අය, ඒ ශ්‍රද්ධා ඇත්තාවූ පැහැදුන අයට මෙසේ කියන්නේය. "පින්වත, ගන්ධාරී

නම් විද්‍යාවක් ඇත්තීය. ගන්ධාර රට බොහෝ ඍෂීහු* වාසය කළෝය. ඔවුන් අතරෙහි එකෙකු විසින් කරණ ලද විද්‍යාවක් 'ගන්ධාරී' නම් වීය. ඒ විද්‍යාවෙන් භික්ෂුතෙම නොයෙක් අයුරු ඇති ඍද්ධි විධි වෙන් වෙන්ව කොට දක්වයි. එකෙක්ව බොහෝසේ වෙයි. බොහෝසේව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය හරහට, පවුර හරහට, පර්වත හරහට නොහැපෙමින් යයි. අහසෙහි මෙන් පොළොවෙහි කිමිදීම් මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙදා ගමන් කරයි. පක්ෂියකු මෙන් අහසෙහිද පර්යංකයෙන් හිඳගෙනම යයි. මේ මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹලොව තෙක් ශරීරයෙන් වසඟ බව පවත්වයි" කියායි.

"කේවට්ටය, ඒ කුමකැයි සිතන්නෙහිද? ඒ ශ්‍රද්ධා නැත්තාවූ නොපැහැදුනාවූ තැනැත්තේ ඒ ශ්‍රද්ධාවත් පැහැදුනාවූ තැනැත්තාට මෙසේ කියන්නේදැ"යි ඇසූසේක. "ස්වාමීනි, කියන්නේයයි" කීයේය,

"කෙවට්ටය, මම ඍද්ධි ප්‍රාතිහාර්යයෙහි මේ දොෂ හොඳින් දන්නෙම් ඍද්ධි ප්‍රාතිහාර්යයෙන් ලජ්ජා වෙමි. අසුචි මෙන් පිළිකුල් කරමියි වදාළේය. කෙවට්ටය, ආදෙශනා ප්‍රාතිහාර්යය කවරේද?

"කේවට්ටය, මේ ශාසනයෙහි භික්ෂුතෙම අනුන්ගේ සිත දැන කියයි. සිතේ හටගත් සතුට හෝ අසතුට දැන කියයි. කල්පනා කරන ලද කරුණු දැන කියයි. විමසා බලන ලද කරුණු දැන කියයි. ඔබේ හිත මෙසේ කාම සිතිවිලි වලින් යුක්තවූයේ වෙයි. ඔබේ හිත මේ ආකාරද වෙයි. ඔබේ හිත මේ මේ දෙයක් සිතමින් පවතීයයි කියයි. මෙසේ අනුන්ගේ සිත දැන කියන්නාවූ, සිතෙහි හටගත් සතුට සහ අසතුට දැන කියන්නාවූ කල්පනා කරන ලද කරුණු දැන කියන්නාවූ විමසා බලන ලද කරුණු දැන කියන්නාවූ ඔබේ හිත මෙසේ කාම සිතිවිලි වලින් යුක්තවූයේයයිද, ඔබේ හිත මේ ආකාරයෙන්

* ඍෂි ශුද්ධ ජීවිතයක් ගතකරන නුවණ ඇත්තා.

පැවතෙන්නේයයිද, ඔබේ හිත මෙසේ මේ මේ දෙයක් සිතමින් පවතීයයි කියන්නාවූද ඒ භික්ෂුතෙම ප්‍රසන්නවූ එක්තරා ශ්‍රද්ධාවන්තයෙක් දකීද, [අනුන්ගේ හිත කියන්නාවූ හිතේ හටගත් සතුට සහ අසතුට කියන්නාවූ කල්පනා කරන ලද කරුණු කියන්නාවූ විමසා බලන කරුණු කියන්නාවූ ඔබේ හිත මෙසේ මේ මේ දෙයක් සිතමිනි පවතීයයි කියන්නාවූ] මේ භික්ෂුවක් මම දුටුයෙමියි ඒ ශ්‍රද්ධාවත් ප්‍රසන්න තැනැත්තා ශ්‍රද්ධා නැත්තාවූ අප්‍රසන්නවූ යම් කෙනෙකුට භික්ෂුහුගේ මහත් ඍද්ධි ඇති බවද, මහා ආනුභාව ඇති බවද ඇත්තෙන්ම පුදුමයකි, ඇත්තෙන්ම ඉතා පුදුමයකි යයි කියන්නේද,

**5.** ඒ ශ්‍රද්ධා නැත්තාවූ නොපැහැදුනාවූ තැනැත්තා ඒ ශ්‍රද්ධාවන්ත පැහැදුනු තැනැත්තාට මෙසේ කියන්නේය. "පින්වත, චින්තාමණි නම් එක් විද්‍යාවක් ඇත. ඒ විද්‍යාවෙන් ඒ භික්ෂුතෙම අනුන්ගේ සිත දැන කියයි. සිතේ හටගත් සතුට හෝ අසතුට දැන කියයි. කල්පනා කරන ලද කරුණු දැන කියයි. විමසා බලන ලද කරුණු දැන කියයි. ඔබේ හිත මෙසේ කාම සිතිවිලි වලින් යුක්තවූයේ වෙයි. ඔබේ හිත මේ ආකාරද වෙයි. ඔබේ හිත මේ මේ දෙයක් සිතමින් පවතීයයි කියයි. මෙසේ අනුන්ගේ සිත දැන කියන්නාවූ සිතෙහි හටගත් සතුට සහ අසතුට දැන කියන්නාවූ කල්පනා කරන ලද කරුණු දැන කියන්නාවූ, විමසා බලනලද කරුණු දැන කියන්නාවූ ඔබේ හිත මෙසේ කාම සිතිවිලිවලින් යුක්ත වූයේ යයිද, ඔබේ හිත මේ ආකාරයෙන් පැවතෙන්නේයයිද, ඔබේ හිත මෙසේ මේ මේ දෙයක් සිතමින් පවතීයයි කියයි. (කේවට්ටය, ඒ කුමකැයි සිතන්නෙහිද? "ඒ ශ්‍රද්ධාව නැත්තාවූ නොපැහැදුනාවූ තැනැත්තා ඒ ශ්‍රද්ධාව ඇත්තාවූ පැහැදුනාවූ තැනැත්තාට මෙසේ කියන්නේද, ස්වාමීනි, කියන්නේයයි" කීයේය.)

"කේවට්ටය, මම ආදෙශනා ප්‍රාතිහාර්යයෙහි මේ දොෂය හොඳින් දකින්නෙමි. ආදෙශනා ප්‍රාතිහාර්යයෙන් මම ලජ්ජා වෙමි. අසුචියක් මෙන් පිළිකුල් කරමි.

"කේවට්ටය, (අනුශාසනී) අනුශාසනාකිරීමේ ප්‍රාතිහාර්යය කවරේද? කෙවට්ටය, භික්ෂුතෙම මෙසේ අනුශාසනා කෙරෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මෙසේ කල්පනා කරව්, මෙසේ කල්පනා නොකරව්. මෙසේ මෙනෙහි කරව්, මෙසේ මෙනෙහි නොකරව්. මෙය දුරු කරව්, මීට පැමිණ වාසය කරව් කියයි" මෙයද කේවට්ටය, අනුශාසනා කිරීමේ ප්‍රාතිහාර්යයයි කියනු ලැබේ.

"කේවට්ටය, අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, විදර්ශනාඥාන ආදී විද්‍යාඅට සීල සංවරය ආදී හසුරුවන ධර්ම පසළොස යන අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් යුක්තවූ, යහපත් ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දන්නාවූ, ශ්‍රෙෂ්ඨවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියදුරෙකු වැනිවූ, දෙව් මිනිසුන්ට ගුරුවරයෙක්වූ, (චතුරාර්‍ය්‍ය සත්‍ය) සත්‍යවූ උතුම් ධර්මසතර අවබොධකළාවූ, තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිතවූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, රජුන් හා මිනිසුන් සහිතවූ, සත්ව වර්ගයා ස්වකීය උසස් ඥානයෙන් දැන පැහැදිලි කොට ප්‍රකාශ කෙරේ. ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූ, මැද යහපත්වූ, කෙළවර යහපත්වූ අර්ථ සහිතවූ, දස ආකාරයෙන් නියමවිදියට වචන ශබ්දකරන්නාවූ (ව්‍යඤ්ජන සහිත) සියලු ලෙසින් සම්පූර්ණවූ, පිරිසිදුවූ සියලු ශාසනමාර්ග බ්‍රහ්මචර්යාව ගෙන හැර දක්වති.

**6** "ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක්හෝ අසයි. ඔහු ඒ දහම අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කෙරෙහි ඔහු ඒ ශ්‍රද්ධාවෙන් යුක්තවූයේ මෙසේ සලකන්නේය. ගෘහවාසය පීඩා සහිතයි. රාගාදී කෙලෙස් සහිත මාර්ගයෙකි. මහණකම වනාහි කිසිවක් නොමැති අවකාශය මෙන් නිදහස්ය. ගිහිගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ සියලු ආකාරයෙන් පිරිසිදුවූ, ලියවූ හක්ගෙඩියක් වැනිවූ මෙම බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්ට නොහැක්කේය. මම කෙස් දැළිරැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වන්නෙම් නම් ඉතා යහපතැයි කියායි.

"ඔහු පසු කාලයක ස්වල්පවූ හෝ බොහෝවූ හෝ සම්පත් රාශිය හැර, ස්වල්පවූ හෝ බොහෝවූ නෑපිරිස් හැර, කෙස්

දැළිරැවුලු කපා දමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණවේ. මෙසේ මහණවූ ඔහු ප්‍රධාන සංවරසීලයෙන් යුක්ත වූයේ, යහපත් හැසිරීමෙන් හා වරදනැති පැවැත්මෙන් යුක්ත වූයේ, ස්වල්පවූත් අකුසලයන්හි විශෙෂයෙන් භයදක්නා ගති ඇත්තෙකුවූයේ, යහපත්වූ ශරීරයෙන් වචනයෙන් ක්‍රියාවෙන් යුක්තවූයේ, ශික්ෂාපද සමාදන්ව එහි මොනවට හික්මෙයි. පිරිසිදුවූ ජීවිත පැවතුම් ඇත්තේ වෙයි. ශීලයෙන් යුක්ත වූයේ වෙයි, ඉන්ද්‍රියයන්හි වැසූ දොරටු ඇත්තේ වෙයි, කෑමෙහි පමණ දන්නේ වෙයි. යහපත් සිහියෙන් හා නුවණින් යුක්ත වූයේ වෙයි. සන්තෝෂයෙන් යුක්තවෙයි.

7. කේවට්ටය, භික්ෂුනමක් කෙසේ නම් සීල සම්පන්න වේද? තරුණය, මේ සස්නෙහිවූ භික්ෂුනමක් ප්‍රාණවධය හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, බහාතබන ලද දඬු ඇත්තේ බහා තබන ලද ආයුද ඇත්තේ, පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ කරුණාවන්තවූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිත අනුකම්පාව ඇතුව වාසයකෙරේ. මෙයද ඔහුගේ සීලයක්වේ. නොදුන්දෙය ගැනීමෙන් වෙන්ව, එයින් සම්පූර්ණයෙන් වැළැක්කේ, දුන් දෙයම ගන්නේ, දුන් දෙයම කැමතිවන්නේ, සොර නොවූ පිරිසිදුවූ සිතින් යුක්තව වාසය කෙරේ. මෙයද ඔහුගේ සීලයෙකි. අබ්‍රහ්මචර්‍ය්‍යාව හැර උතුම් පැවතුම් ඇත්තේ ස්ත්‍රී පුරුෂ සංසර්ගය නම්වූ ග්‍රාම ධර්මයෙන් වෙන්වූයේ බ්‍රහ්මචාරීවේ. මෙයද ඔහුගේ සීලයෙකි. බොරු කීමෙන් දුරුව, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, සැබෑ තෙපුල් කියන්නේ, සැබවින් සැබව ගළපන ගති ඇතුව ස්ථිර කථා ඇත්තේ, ඇදහිය යුතු වචන ඇත්තේ ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකෙරේ. මෙයද ඔහුගේ සීලයෙකි. පිසුණු බස් හැර, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, මෙතනින් අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන ගති ඇත්තේද, එතැනින් අසා මොවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන ගති ඇත්තේද, මෙසේ භෙදවූවන් ගළපන්නේ සමගිවූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබලදෙන්නේ, සමගියෙහි ඇලුම් බහුලකොට ඇත්තේ, සමගිකම්හි ඇලුනේ, සමගිකම්හි සතුටුවන ගති ඇත්තේ සමගිය ඇති කරණ තෙපුල් කියන්නේය. මෙයද

ඔහුගේ සීලයෙකි. ඵරුෂ වචනය හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ යම් වචනයක් නිදොස් වේද, කනට සැපද, ප්‍රෙමණීයද, සතුටු කරයිද, යහපත්ද, බොහෝ දෙනාට ප්‍රියද, බොහෝ දෙනාගේ හිත් ප්‍රියකරන්නේද, එබඳු වචනම කියන්නේ වේ. මෙයද ඔහුගේ එක් සීලයෙකි. හිස් ප්‍රලාප කථා හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ. කාලයට සුදුසු කථා කරන්නේ, සිදුවූ තෙපුල්ම කියන්නේ, අර්ථයෙන් යුක්තවූ, ධර්මයෙන් යුක්ත විනය සම්බන්ධවූ තෙපුල් කියන්නේ, සුදුසු කල්හි උපමා හා කරුණු සහිතවූ, සීමාඇති, අර්ථයෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේවේ. මෙසේ ඒ හිස් කථාවෙන් වැළැක්කේද දියුණුවට හේතුවන වචන කියන්නේද, මෙයද ඔහුගේ සීලයෙකි.

"තණ, ගස්, වැල් සිඳීම් බිඳීම් ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන කෑම ඇත්තේ, රාත්‍රීකෑමෙන් හා අවේලේ කෑමෙන් සම්පූර්ණයෙන් වැළැක්කේය. නැටීම්, ගීකීම්, බෙර ආදිය වැයීම්, විසුලුදැකීම් යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. මල්, ගඳ විලවුන් පැළඳීම, ඉන් සැරසීම, අඩු තැන් පිරවීමෙන් අලංකාර කිරීම යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළක්කේය. රන් රිදී මසුරන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් වැළැක්කේය. අමුවූ ධාන්‍ය වර්ග පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේ. අමුමස් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද ස්ත්‍රීන් හා ගෑනුලමයින් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද වේ. වැඩකරුවන් වැඩකාරියන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන්තොරවූයේ, එළුවන් හා තිරෙළුවන් පිළිගැනීමෙන් තොරවූයේ, කුකුළන්, හූරන්, ඇතුන්, ගවයන්, අසුන්, වෙළඹුන් කෙත්, වත්, යන මේ පිළිගැන්මෙන්ද, සම්පූර්ණයෙන් තොර වූයේය. ගිහීන්ගේ දූත මෙහෙවරය, ගෙන්ගෙට යන මහත් මෙහෙවරය යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. ගනු දෙනු කිරීමය, තරාදි ආදියෙන් වඤ්චාකිරීමය, රන් හා තොරන් මිශ්‍ර වඤ්චාකිරීමය. වී ආදිය මැණීමෙන් වඤ්චා කිරීමය, හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන්

රැවටීමය, යකඩ ආදී ලොහ රන් රිදීයයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයොගය යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. කැපීමය. මැරීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැරගැන්මය. ගම් නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාරකමින් වස්තු පැහැරගැන්මය, යන මෙයින්ද සම්පූර්ණයෙන් වැළැක්කේය, මෙයද ඔහුගේ සීලයක් වේ.

8. "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මූලබීජය, ඛන්ධබීජය, ඵලබීජය, දලුබීජය, පස්වැනිවූ බීජබීජය යන මේ ගස් ආදිය වැවීමෙහි යෙදී වාසය කරත්. මෙබඳුවූ බීජගාම භූතගාමයන් සිඳීම් බිඳීම් ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේවේනම් මෙයද ඔහුගේ එක් සීලයක් වේ.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා ආහාර වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයෝජන ගැන්මය, බීම වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයෝජන ගැන්මය, නොඉටන ලද (අයිතියට නොගත්) සිවුරු ආදිය, යාන සංඛ්‍යාත වහන් දෙකකින් වැඩි සයන, සුගන්ධයන්, තල සහල් ආදිය තැන්පත් කොට තබා ප්‍රයෝජන ගැන්මයයි කියන ලද පසුවට තබා ප්‍රයෝජන ගැන්මෙහි යෙදී වාසය කරත්. මෙබඳුවූ සන්නිධිකාර පරිභොගයෙන් වැළකී වෙසේ. මෙයද ඔහුගේ සීලයකි.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා නැටීමය, ගී කීමය, බෙර ආදිය වැයීමය, රඟමඬුලු සැරසීමය, වැඩක් නැති කථා ඇසීමය, කයිතාලම් හා අත්ලෙන් අත්ල ගැසීමය, මන්ත්‍ර පිරචීමෙන් මළමිණී නැංවීමය, සතරැස් හෝ කළ බෙර ගැසීමය, ශොභන චිත්‍ර විචිත්‍රය, සණදොවූන් කෙළිය, හුණගස් ඔසවා නැටීමය, මිනීඇට සෝදා තැබීමය, ඇතුන් හා පොරය, අශ්වයින් යොදා පොරය, මීවුන් හා පොරය, ගවයින් හා පොරය, එළුපොරය, මෙණ්ඩක එළුපොරය, කුකුළුපොරය, වටුපොරය, දඬු (පොලු) පොරය, තොරතුරු ඇනීමය, මල්ලව යුද්ධය, යුද්ධය, ඇත් අස් ආදිය දැකීමය යන විකාර දර්ශනයෙහි යෙදී වාසය කරත්. මෙසේ මෙබඳු විසුලු දැක්මෙන් සම්පූර්ණයෙන් වැළකේ. මෙයද ඔහුගේ සීලයකි.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා දූ පෝරු ආදියෙහි කෙළීම්වූ ක්‍රීඩාවය, දශපද ක්‍රීඩාවය, දූ පෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි ක්‍රීඩාකිරීමය, බිම මණ්ඩල වශයෙන් සාදා පැන පැන ක්‍රීඩාකිරීමය, දූ කැට නොසොල්වා නියෙන් ගසා ක්‍රීඩා කිරීමය, දාදු කෙළීමය, සිං කෙළීමය, භිත්ති ආදියෙහි ඉරටම්ටි ගසා ඇත් අස් ආදි රූප දක්වා කෙළීමය, පන්දු කෙළීමය, නලා පිඹීමය, ක්‍රීඩා නගුල් ගෙන සෙල්ලම් සීසෑමය, කරනම් ගැසීමය, තල්පත් ආදියෙන් කන්නන්ගුරුවා තනා ක්‍රීඩා කිරීමය, කොළ නැළියෙන් වැලි ආදිය මැන කෙළීමය, කුඩා රථයෙන් කෙළීමය, කුඩා දුන්නෙන් කෙළීමය, අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ඇඳ කෙළීමය, සිතූ දේ කියවීම් කීම් ආදියෙන් කෙළීමය, ඒ ඒ දොෂ රූප දක්වා කෙළීමය, යන මෙබඳුවූ ප්‍රමාදයට කාරණාවූ දූ කෙළීමෙහි යෙදී වාසය කෙරෙත්. මෙසේ මෙබඳුවූ දූ කෙළියෙන් සම්පූර්ණයෙන් වළකියි. මෙයද ඔහුගේ සීලයකි.

**9.** "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා දික්හඟලා පුටුය, පලස්ය, සතරඟුලෙන් දිග ලොම් ඇතිරිය, විසිතුරු එළුලොම් ඇතිරිය, එළුලොම් සුදුඇතිරිය, එළුලොමින් කළ ඉදිරියට නෙරූ මල් ඇති ඇතිරිය, සිංහාදි රූපයෙන් විසිතුරු එළුලොම් ඇතිරිය, එක් පිට ලොම් ඇති ඇතිරිය, දෙපිට ලොම් ඇති එළුලොම් ඇතිරිය, රත්රන් නූලෙන් කළ පට ඇතිරිලිය, එක්විට නැට්ටුක්කාරියන් දහසය දෙනෙක් නටනා එළුලොමින් කළාවූ මහඇතිරිය, ඇතුන් පිට අතුරණ ඇතිරිය, අසුන් පිට අතුරන ඇතිරිය, රථපිට අතුරණ ඇතිරිය, අඳුන්දිවි සමින් කළ ඇතිරිය, කෙසෙල් මුව සමින් කළ උතුම් ඇතිරිය, දෙපස තබනලද රතුපාට කොට්ට ඇති ආසනය යන මෙබඳු උස් අසුන් මහ අසුන් පාවිච්චි කෙරෙත්. මෙසේ මෙබඳුවූ උස් අසුන් මහ අසුන්හි හිඳීම් ආදියෙන් වළකියි. මෙයද ඔහුගේ සීලයකි.

"එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ඇඟ ඉලීමය, පිරිමැදීමය, නෑවීමය, මැඞීමය, මූනබලන කන්නාඩි, අඳුන් තෙල් හා සුවඳ පාවිච්චිය, මූණේ ගානා සුවඳ

කුඩු, මූණේ ගානා සුවඳ ද්‍රව්‍ය අත්වල බඳින ආභරණ යන මේ දේ දැරීම හා පැළඳීමය, රත්රන් නූල් ආදියෙන් කුඩුම්බි බැඳීමය, විසිතුරු දඬුගෙන හැසිරීමය. බෙහෙත් නල එල්වාගෙන ඇවිදීමය, කඩු විසිතුරු කුඩ ගෙනයෑම, විසිතුරු සෙරෙප්පු හෝ සපත්තු පයලා ඇවිදීමය, නලල්පට බැඳීමය, කොණ්ඩා මාණික්‍ය පැළඳීමය, අවන් දැරීමය දික්වූ හවලු ඇති සුදුරෙදි ඇඳීමයයි මෙසේවූ සැරසීම් හා අඩුතැන් පිරවීමෙහි නිතර නිතර යෙදෙත්. මෙබඳුවූ සැරසීම් අලංකාර කිරීම් ආදියෙහි යෙදීමෙන් සම්පූර්ණයෙන් වළකියි. මෙයද ඔහුගේ සීලයකි.

10. "එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ කථාය, මහඇමතියන් පිළිබඳ කථාය. සෙනා පිළිබඳ කථාය, භය පිළිබඳ කථාය, යුද පිළිබඳ කථාය, ආහාර පිළිබඳ කථාය, පානවර්ග පිළිබඳ කථාය, ඇඳුම් පිළිබඳ කථාය, ඇඳන් පිළිබඳ කථාය, මාලා පිළිබඳ කථාය, ගන්ධද්‍රව්‍යයන් පිළිබඳ කථාය, නෑයන් පිළිබඳ කථාය, රථ පිළිබඳ කථාය, ගම් පිළිබඳ කථාය, නියම්ගම් පිළිබඳ කථාය, නුවර පිළිබඳ කථාය, දනව් පිළිබඳ කථාය, ස්ත්‍රීන් පිළිබඳ කථාය, පුරුෂයන් පිළිබඳ කථාය, ගෑනු දරුවන් පිරිමි දරුවන් පිළිබඳ කථාය, යොධයන් පිළිබඳ කථාය, වීථි පිළිබඳ කථාය, වතුර ගෙන යන දාසීන් හෝ වතුර ගෙන යන තැන් හෝ පිළිබඳ කථාය, මළ නෑයන් යන ආදීන් පිළිබඳ කථාය, මුහුද පිළිබඳ කථාය, භවාභව කථාය යන මෙබඳු පහත් කථාවෙහි යෙදී වෙසෙත්. මෙබඳුවූ පහත් කථාවෙන් සම්පූර්ණයෙන් වළකියි. මෙයද ඔහුගේ සීලයකි.

11. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා 'ඔබ මේ ධර්මවිනය නොදන්නෙහිය, මම මේ ධර්මවිනය දනිමි' ඔබ මේ ධර්මවිනය කුමකැයි දන්නෙහිද? ඔබ වරදවා පිළිපදින්නෙහිය, මම මනාකොට පිළිපදින්නේ වෙමි' 'මාගේ වචන යහපත්ය හෝ අර්ථසහිතය, ඔබගේ වචන අර්ථ රහිතය.' 'පළමු කියයුත්ත පසුව කීයෙහිය, පසුව කිය යුත්ත පළමුව කීයෙහිය. යමක් ඔබ බොහෝ කල් පුරුදු කරණ ලද

නම් ඒ සියල්ල නිෂ්ඵලවිය. ඔබට වාදාරොපනය කරණලදී. නින්දා කරණ ලද්දෙහිය. වාදයෙන් මිදෙනු පිණිස ක්‍රියා කරව. ඉදින් හැක්කෙහි නම් වාදයෙන් ගැළවෙව' යන ආදි දොෂාරොපණ කථාවෙහි යෙදී වෙසෙත්. මෙසේ මෙබඳු දොෂාරොපණ කථාවෙන් සම්පූර්ණයෙන් වළකින්නේය. මෙයද ඔහුගේ සීලයකි.

12. 'එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා රජුන්ගේ, රජ මහ ඇමතියන්ගේ, ක්ෂත්‍රියයන්ගේ, බමුණන්ගේ, ගෘහපතියන්ගේ සහ කුමරුන්ගේද හසුන් ගෙණ, 'මෙතනින් අසවල් තැනට යව. අසවල් තැනින් මෙහි එව, මෙය ගෙණ යව, එතැනින් අසවල් දෙයගෙණෙවයි දූතභාවයෙහි හා හසුන් ගෙණ යෑමෙහි යෙදී වෙසෙත්. මෙබඳු දූතභාවය, හසුන් ගෙනයෑම යන මෙයින් වළකින්නේය. මෙයද ඔහුගේ ඒ සීලයකි.

13. "ඒසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා කුහකයෝද, සිව්පස උදෙසා කථා කරන්නෝද, නිමිති කරන්නෝද නොහොත් ලාභ සත්කාර සඳහන් කරවන්නෝද, පරලාභාදිය උදෙසා කියන්නෝද, ලාභයකින් ලාභයක් සොයන්නෝද වෙත්. මෙබඳුවූ කුහක වංචා ප්‍රයෝග ආදියෙන් වළකියිද මෙයද ඔහුගේ සීලයකි."

14. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා සාමුද්‍රිකා ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, හෙනගැසීම ආදී මහ නිමිතිබලා කියන ශාස්ත්‍රය, ස්වප්න ශාස්ත්‍රය, ලක්ෂණ ශාස්ත්‍රය, මීයන්කැපූ වස්ත්‍රාදිය බලාකියනශාස්ත්‍රය ගිනිදෙවියා පිදීමය, දබ්බිහොමය, ථූස හොමය, තණ්ඩුල හොමය, කණ හොමය, සප්පි හොමය, තෙල හොමය, මුඛහොමය, ලේ හොමය, ශරීර විද්‍යා, වස්තුවිද්‍යා, නීති ශාස්ත්‍රය, සොහොනෙහි ශාන්ති කරන්නාවූ විද්‍යා, භූත විද්‍යා, නාග විද්‍යා, විෂ විද්‍යා, ගෝනුසු විද්‍යා, මී විද්‍යා, කුරුලු විද්‍යා, කපුටු විද්‍යා, ජීවිත කාලය කීම, ආයුධ වැළැක්වීම, තිරිසන් සතුන්ගේ ශබ්ද දැනීම වශයෙන් පැවති මන්ත්‍රය යන පහත් විද්‍යා හේතුකොට ගෙන වැරදි ජීවිතයෙන් ජීවිකා කෙරෙත්. මෙසේ මෙබඳු පහත් විද්‍යා

හෙතුවෙන් කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේද මෙයද ඔහුගේ සීලයකි.

15. "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා මණි ලක්ෂණය, වස්ත්‍ර ලක්ෂණය, දණ්ඩ ලක්ෂණය, කඩු ලක්ෂණය, දුනු ලක්ෂණය, ආයුධ ලක්ෂණය, ස්ත්‍රී ලක්ෂණය, පුරිස ලක්ෂණය, පිරිමිදරු ලක්ෂණය, ගෑනුදරු ලක්ෂණය, දාස ලක්ෂණය, දාසී ලක්ෂණය, ඇත් ලක්ෂණය, අශ්ව ලක්ෂණය; කැස්බෑ ලක්ෂණය, එළු ලක්ෂණය, මීහරක් ලක්ෂණය ගව ලක්ෂණය, ලොකු එළු ලක්ෂණය, කුකුළු ලක්ෂණය, වටු ලක්ෂණය, තලගොයි ලක්ෂණය, කර්ණිකා ලක්ෂණය, මුව ලක්ෂණයයි, මෙබඳු පහත් විද්‍යාවන් කරණකොට ගෙණ වැරදි ජීවිකාව කෙරෙත්. මෙසේවූ පහත් විද්‍යාවන් නිසා කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේද මෙයද ඔහුගේ සීලයකි.

16. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා අසවල් දිනට රජුන්ගේ බැහැරයෑම වන්නේය. අසවල් දින ඇතුළු නුවරට එන්නේය. අසවල් දින ඇතුළු නුවර රජුන් වෙත පැමිණීම වන්නේය. බැහැර රජුන්ගේ බැහැරට යෑම වන්නේය. බැහැර රජුන්ගේ ඇතුළු නුවරට ඊම වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ ආපසු යෑම වන්නේය. ඇතුළු නුවර රජුන්ට ජය වන්නේය. බැහැර රජුන්ගේ පරාජය වන්නේය. බැහැර රජුන්ගේ ජය වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ පරාජය වන්නේය. මෙසේ මොහුට ජය වන්නේය. මෙසේ පරාජය වන්නේයයි කියා මෙසේ පහත් විද්‍යා හෙතුකොට ලාමක ජීවිකා කෙරෙත්. මෙබඳුවූ පහත් විද්‍යා හෙතුවෙන් කරණ වැරදි ජීවිතයෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ සීලයක් වේ.

17. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා චන්ද්‍රග්‍රහණය වන්නේය. සූර්යග්‍රහණය වන්නේය, තාරකා සමාගමය වන්නේය, සඳහිරු දෙදෙනාගේ නියම මාර්ග ගමන වන්නේය, සඳ හිරු දෙදෙනාගේ නොමග යෑම වන්නේය,

තාරකාවන්ගේ මාර්ග ගමන වන්නේය. තාරකාවන්ගේ නොමග යෑම වන්නේය, උල්කාපාතය වන්නේය, දිසා දැවීම වන්නේය, පොළොව කම්පාව වන්නේය, අහස ගිගුරුම් වන්නේය, සඳ, හිරු, තාරකාවන්ගේ නැඟීම හා බැසීමද කෙළෙසීමද පිරිසිදු වීමද වන්නේය, චන්ද්‍ර ග්‍රහණය මෙබඳු විපාක ඇතිවන්නේය, සූර්යග්‍රහණය මෙබඳු විපාක ඇති වන්නේය, තාරකා සමාගමය මෙබඳු විපාක ඇතිවන්නේය, චන්ද්‍ර සූර්යයන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳු විපාක ඇති වන්නේය, ඔවුන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇති වන්නේය, තාරකාවන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, තාරකාවන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇතිවන්නේය. උල්කාපාතය මෙබඳු විපාක ඇතිවන්නේය. දිගුන් දැවීම මෙබඳු විපාක ඇතිවන්නේය, භූමි කම්පාව මෙබඳු විපාක ඇතිවන්නේය, අහස් ගිගුම් මෙබඳු විපාක ඇති වන්නේය, සඳ, හිරු, තාරකාවන්ගේ නැඟීම, බැසීම, කිලිටු වීම හා පිරිසිදුවීම මෙබඳු විපාක ඇතිවන්නේයයි කියා මෙසේ පහත් විද්‍යා හෙතුවෙන් කරණ වැරදි ජීවිකාවෙන් ජීවිකා කෙරෙත්. මෙසේවූ පහත් විද්‍යා හෙතුකොට ගෙණ කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ සීලයකි.

18. "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා මනා වැසි ඇතිවන්නේය, මනා වැසි නැතිවන්නේය, යහපත් ආහාරපාන ඇතිවන්නේය, ආහාර පාන නැති වන්නේය, නිර්භය ඇතිවන්නේය, භය ඇතිවන්නේය, රොග ඇතිවන්නේය, නිරෝගී බව ඇතිවන්නේයයි කීමද, ඇඟිල්ල ඇල්ලීමය, ගණන්කිරීමය, කොටස්කර ගණන්කිරීමය, කාව්‍ය කිරීමය, ලෝකයට සිදුවන දේ ගැන ශාස්ත්‍ර ඉගෙණීමයයි මෙසේ පහත් විද්‍යාවන් කරණකොට වැරදි ජීවිකා කෙරෙත්. මෙසේවූ පහත් විද්‍යා හෙතුවෙන් වන වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ සීලයකි.

19. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා ආවාහ කරවීමය, විවාහ කරවීමය, සමගිය පිළිබඳ

කථාකිරීමය, වියොගය පිළිබඳ කථාකිරීමය, ධන රැස් කිරීමය, වියදම් කිරීමය, යහපත් ශ්‍රියාව ඇතිකිරීමය, දුර්ගර්භකරණය, ගර්භවිරොධි කරණය, දිව් තද කිරීමය, නූල්බැඳීමය, අත් පෙරළීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, ශබ්ද නොඇසීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, කැඩපත්හි දෙවතාරොපණයකොට ප්‍රශ්න ඇසීමය, ගෑනුදරුවන්ගේ ශරීරයෙහි දෙවතාරොපණය කොට ප්‍රශ්න ඇසීමය, දෙවදාසියගේ ශරීරයෙහි යකුන් ආරොපණය කොට ප්‍රශ්න ඇසීමය හිරු වැඳීමය, මහබඹුට උපස්ථාන හෝ වැඳුම් කිරීමය, කටින් ගිනිදැල් පිට කිරීමය, ශ්‍රී දෙවිය කැඳවීමයයි කියන මෙබඳු පහත් විද්‍යාවෙන් වැරදි ජීවිකා කෙරෙත්. මෙබඳුවූ පහත් විජ්ජාවෙන් කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ සීලයකි.

**20.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ශාන්ති කිරීමය, කාර්ය සමෘද්ධි කටයුතු කර්මය, මන්ත්‍ර කිරීමය, භූරිකර්මය, පණ්ඩකයා පුරුෂයකු කිරීමය, පුරුෂයා පණ්ඩක කිරීමය, ගෙවල් නොකළ බිම් ගෙවල් කිරීමය, ගෙට සුදුසු තැන බලිකම් විධානය, දියෙන් මූන සුද්ධ කිරීමය, නැහැවීමය, ගිනි පිදීමය, වමන කරවීමය, විරේක කරවීමය, උඩුකය විරේකය, යටිකය විරේකය, හිස විරේකය, කන්තෙලය, ඇස් බෙහෙත් ගැල්වීමය, නස්‍ය කිරීමය, අඳුන් ගෑමය, සිසිල් බෙහෙත් අඳුන් සෑදීමය, ආයුධ කටු ගසා කරන වෙදකමය, ශල්‍යකර්මය, ළදරුවන් පිළිබඳ වෙදකම්ය, මූලික බෙහෙත් දීමය, සැර බෙහෙත් දී පසුව එහි බල හැරීමය කියා හෝ මෙබඳු පහත් විද්‍යා කරණකොට වැරදි ජීවත්වීමෙන් ජීවිකා කෙරෙත්. මෙබඳුවූ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ සීලයකි.

**21.** කේවට්ටය, මෙසේ සීලසම්පන්නවූ භික්ෂුහට භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ඔහුගේ සීලසංවරය හෙතුකොටගෙණ කිසිතැනකදී නොඋපදනේය. කුමක් මෙන්ද යත්:- කේවට්ටය, ක්ෂත්‍රියාභිෂෙකයෙන් මුදුනෙහි අභිෂෙක ලද්දාවූ, සතුරන් නැති කළාවූ ක්ෂත්‍රිය රජෙක් කිසියම්

සතුරෙකුගෙන් කිසි භයක් නොදක්නේද, එපරිද්දෙන්ම, කෙවට්ටය, සීලසම්පන්නවූ භික්ෂුතෙමේ භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු සීලසංවරය හෙතුකොට කිසි තැනකදී නොදක්නේය. ආර්යවූ (උතුම්වූ) මේ ශීල රාශියෙන් යුක්තවූ ඒ භික්ෂුතෙම, තමන් තුළ පිරිසිදුවූ (කායික චෛතසික) සැපය විඳියි. කෙවට්ටය, මෙසේ දැක්වූ ශීලයෙන් යුක්තවූ භික්ෂුව සීලසම්පන්න නම් වේ.

**22.** කෙවට්ටය, භික්ෂුව කෙසේ නම් ඉන්ද්‍රියයන්හි වැසූ දොරටු ඇත්තේද? කෙවට්ටය, මේ සස්නෙහි භික්ෂු තෙමේ ඇසින් රූපයක් දැක එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. ඇස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කිපීම ආදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. ඔහු තමාගේ ඇස් ඉන්ද්‍රියය රකී. ඇස් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කණින් ශබ්දයක් අසා එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. කන් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කිපීමාදි අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ කන් ඉන්ද්‍රියය රකී. කන් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. නාසයට ගඳ සුවඳ දැනී එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. නාස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කිපීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ නාස් ඉන්ද්‍රියය රකී. නාස් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. දිවෙන් රසයක් විඳ එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. දිව් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කිපීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල් වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ දිව් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කයින් ස්පර්ශයක් ස්පර්ශකොට එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. ශරීර ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කිපීම ආදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද එබඳු දෙයින් වැලකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ ශරීර ඉන්ද්‍රියය රකී. ශරීර ඉන්ද්‍රියයෙහි

සංවරයට පැමිණේ. සිතින් (ධර්මයක්) අරමුණක් දැන එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. සිත් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් නිසා දැඩි ආසාව හා කෝපය ආදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. හෙතෙම සිත් ඉන්ද්‍රිය රකී. සිත් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. එබඳුවූ භික්ෂුව උතුම්වූ ශීලරාශියෙන් යුක්තවූයේ අභ්‍යන්තරයෙහි පිරිසිදුවූ අධිචිත්ත සැපය විඳියි. කෙවට්ටය, මෙසේවූ භික්ෂු තෙමේ ඉන්ද්‍රියයන්හි වසන ලද දොරටු ඇත්තේ වේ.

23. "කෙවට්ටය, භික්ෂුව කෙසේ නම් සිහියෙන් හා මනා ප්‍රඥාවෙන් යුක්තවූයේ වේද?"

"කෙවට්ටය, මේ සස්නෙහි භික්ෂුතෙම ඉදිරියට යෑමෙහිද ආපසු යෑමෙහිද, නුවණින් දැන කරන්නේය. ඉදිරි බැලීමෙහිද, වටපිට බැලීමෙහිද නුවණින් දැන බලන්නේය. අත් පා හැකිලීමෙහිද, දිගු කිරීමෙහිද, මනා නුවණින් දැන එසේ කරන්නේය. දෙපට සිවුරය, පාත්‍රය, සිවුරුය යන මේ දේ දැරීමෙහිද මනා නුවණින් දැන එසේ කරන්නේය. අනුභව කිරීමය, පානය කිරීමය, වැළඳීමය, රස විඳීමය යන මෙහිද මනා නුවණින් යෙදී එසේ කරන්නේය. මල මූත්‍ර පහකිරීම්ද නුවණින් (ආදීනව) සලකා කරන්නේය. යෑම්, සිටීම්, හිඳීම් සැතපීම්, නිදි තොරකිරීම්, කථාකිරීම්, නිශ්ශබ්දව සිටීම් යන මේ දේ මනා නුවණින් දැන කරන්නේය. කෙවට්ටය, මෙසේ කරන්නාවූ භික්ෂු තෙමේ සිහියෙන් යුක්තවූයේ යහපත් නුවණින් යුක්ත වූයේ වෙයි.

24. "කෙවට්ටය, භික්ෂු තෙමේ කෙසේ ලද පමණින් සතුටු වූයේ වේද?

"කෙවට්ටය, භික්ෂු තෙමේ යන්තම් කය වැසීමට තරම්වූ සිවුරෙන්ද, බඩ ආරක්ෂාවට ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද සතුටු සිත් ඇත්තේ වේ. ඔහු යම් යම් තැනකට යේ නම් අටපිරිකර (කය පිළිබඳවූ දේ) පමණක් ගෙනයයි. කෙවට්ටය, යම්සේ පක්ෂියෙක් යම් තැනෙක පියාඹායේ නම් ඒ සියලුතැන

පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේද, කෙවට්ටය, එපරිද්දෙන්ම භික්ෂු තෙමේද ශරීරය ආරක්ෂාවට ප්‍රමාණවූ සිවුරෙන්ද බඩ ආරක්ෂාවට ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද සතුටු වන්නේ වේ. ඔහු යම් තැනක යා නම් අටපිරිකර පමණක් රැගෙණ බැහැරයයි. කෙවට්ටය, මෙසේවූ භික්ෂු තෙමේ සන්තොෂයෙන් යුක්ත වේ.

**25.** "උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූද, උතුම්වූ මේ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූද, මේ උතුම්වූ සන්තොෂයෙන් යුක්තවූද ඒ භික්ෂු තෙමේ කැලයද, ගහක් මුලද, කඳු පළාත්ද, කඳුරැලි ගල්ගුහාවන් හෝ මහා මගද, සොහොන්ද, ඉතා දුරවූ කැලෑ වාසස්ථානද, බොහෝ ඉඩකඩ ඇති තැන් සහ තණ ගුහාද යන මේ ස්ථාන ආශ්‍රය කෙරෙයි. ඔහු පසුබත් කාලයෙහි පිණ්ඩපාතයෙන් හැරී ආයේ පර්යංකය බැඳ, (කකුල් අකුලුවා හිඳ) ශරීරයේ උඩු කොටස කෙලින් තබා අරමුණට සිහිය එළවා හිඳී.

**26.** "ඔහු ලොකයෙහි ලොභය පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේ. ලොභයෙන් සිත පිරිසිදු කෙරේ. සිත කෙලෙසන්නාවූ ක්‍රොධය පහකොට, ක්‍රොධයෙන් දුරුවූ සිත් ඇතිව පණඇති සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේව වාසය කරයි. ක්‍රොධ දොෂයෙන් සිත පිරිසිදු කෙරේ. කාය චිත්ත දෙදෙනාගේ අලස බව දුරුකොට කය-සිත පිළිබඳ පහවූ අලස බව ඇත්තේ පිරිසිදු හැඟීම් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥා ඇත්තෙක්ව වෙසේ. අලස බව දුරුකොට සිත පිරිසිදු කෙරේ. නොසන්සුන්කම හා පසුතැවීම දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව වාසය කෙරේ. ඇතුළත සංසිඳුනු සිත් ඇත්තේ, සිත විසිරයාම හා පසුතැවීමෙන් පිරිසිදු කෙරේ. විචිකිච්ඡාව (සැකය) දුරු කොට පහකළ විචිකිච්ඡා ඇත්තේ කුශලධර්ම විෂයෙහි සැක නැතිව වෙසේ. විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කෙරේ.

**27.** "කෙවට්ටය, යම්සේ පුරුෂයෙක් ණය ගෙණ කර්මාන්තයන්හි යොදන්නේද, ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණු

වන්නාහු නම් ඔහුගේ ඒ පරණ ණය මුදල් සියල්ලම ගෙවන්නේය. ඔහුගේ අඹු දරුවන් ආරක්ෂාකරණ පිණිස වැඩි යමක් ඉතුරුවූයේ නම් ඔහට මෙබඳු අදහසක් ඇතිවේ. 'මම පළමුවෙන් ණය ගෙණ කර්මාන්තයන්හි යෙදුවෙමි. ඒ මාගේ කර්මාන්තයෝ දියුණුවූහ. ඒ මම පැරණි ණය ගෙවූයෙමි. අඹු දරුවන් පොෂ්‍යකිරීම පිණිස අතිරේක මුදලක්ද මට ඇත්තේය' කියායි. හෙතෙම ඒ ණය නැති බව මුල්කොට ගෙණ බලවත් සතුටක් ලබන්නේය. සතුටටද පැමිණෙන්නේය.

28. "කෙවට්ටය, යම්සේ රොගයෙන් පෙළෙන දුක් ඇත්තාවූ, දැඩි ගිලන් බව ඇති පුරුෂයෙක් වන්නේද, ඔහට ආහාර රුචි නොවන්නේද, ඔහුගේ ශරීරයෙහි කිසි ශක්තියක් නැත්තේද වෙයි. ඒ පුරුෂයා පසු කාලයක ඒ ආබාධයෙන් මිදෙන්නේ නම්, ඔහුට ආහාර රුචිය ඇතිවන්නේ නම්, ඔහුගේ ශරීර බලය ඇතිවන්නේ නම්, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. කෙබඳුද යත්. 'මම පෙර ආබාධ ඇත්තාවූ, දුක් ඇති දැඩි ගිලන් බව ඇති කෙනෙක් වීමි. මට බත් රුචියද නොවීය, ශරීර බලයද නැතිවිය. ඒ මම පළමු තිබූ ආබාධයෙන් මිදුනෙමි. මට ආහාර රුචියද ඇත්තේය. කාය බලයද තිබේය' කියායි. ඔහු ඒ කාරණය මුල්කොට බලවත් සතුටක් ලබන්නේය. සොම්නසටද පැමිණෙන්නේය.

29. "කෙවට්ටය, යම්සේ පුරුෂයෙක් සිරගෙයි බැඳුනේ වේද, ඔහු පසු කලක පීඩා නැතුව සැපසේ ඒ සිරගෙයින් මිදෙන්නේය. ඔහුගේ කෑම පිළිබඳ කිසිත් වියදමක්ද නොවන්නේය. ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම් "මම පෙර සිරගෙයි බැඳුනෙක් වූයෙමි. ඒ මම දැන් පීඩා රහිතව සැපසේ. ඒ සිරගෙයින් මිදුනෙමි. මගේ කෑම පිළිබඳ කිසි වියදමක්ද නොවූයේය' කියායි. ඔහු සිරගෙයින් මිදීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය. සතුටටද පැමිණෙන්නේය.

30. "කෙවට්ටය, යම්සේ සිය කැමැත්තෙන් යමක් කරන්ට නොහැකිවූ අනුන්ට යටත්වූ තමා කැමති ගමනක් ඒ වූ පරිදි යා නොහැකිවූ වැඩකරුවෙක් වන්නේද, ඔහු පසු කලක ඒ දාස

භාවයෙන් මිදෙන්නේ, තමාම අධිපතිකොට ඇත්තේ, අනුන්ට යටත් නොවී තමාගෙන්ම යැපෙන්නේ. සිය අදහස් පරිදි ඒ ඒ තැන යා හැකි වන්නේද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්, 'මම පෙර තමා කැමති පරිදි යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත් මා අදහස් පරිදි කිසිතැනෙක යානොහැකි දාසයෙක්වීමි. ඒ මම දැන් ඒ දාස භාවයෙන් මිදුනෙක්මි. තමා අධිපතිකොට ඇත්තෙක් වීමි. අනුන්ට යටත්නූන කෙනෙක්වීමි. අනුන්ට යටත් නොවී මා සපයාගත් දෙයින්ම යැපෙන්නෙමි, මා අදහස් පරිදි ඒ ඒ කැමැති තැනෙක යාහැක්කේද වෙමි'යි කියායි ඔහු ඒ දාසභාවයෙන් මිදීම හෙතුකොට බලවත් සතුටක් ලබන්නේය එසේම සතුටටද පැමිණෙන්නේය.

31. "කෙවට්ටය, යම්සේ ධනවත්වූ භොග සම්පත් ඇති පුරුෂයෙන් ආහාර දුර්ලභවූ, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණෙන්නේය. ඔහු මඳ කලකින් ඒ කාන්තාර මාර්ගය ඉක්මවා යන්නේ සොර සතුරන්ගෙන් පීඩා නැති ගම්මානයකට සැපසේ ක්‍රමයෙන් පැමිණෙන්නේද, ඔහුට මෙබඳු අදහසක් ඇතිවේ. එනම්- 'මම පෙර ධනවත් වූයෙමි, භොග සම්පත් සහිත වූයෙමි, දුර්ලභ භික්ෂා ඇති, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාරමාර්ගයකට පැමිණියෙක් වූයෙමි එසේවූ මම දැන් එම කාන්තාර මාර්ගය පසු කළෙමි. සැපවත්වූ භය රහිතවූ, ගමකට සැපසේ ක්‍රමයෙන් පැමණියෙමි' යි කියායි. ඒ පුරුෂයා ඒ කාන්තාර මාර්ගය එතර කිරීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය. එසේම සතුටටද පැමිණෙන්නේය.

32. කෙවට්ටය, ණය යම්සේද, රෝගය යම්සේද, හිරගේ යම්සේද, දාසභාවය යම්සේද, දීර්ඝ කාන්තාර මාර්ගය යම්සේද, එපරිද්දෙන් භික්ෂු තෙමේ පහනොකළ (පඤ්චනීවරණ) කුසල් වළක්වන කරුණු පහ තමා කෙරෙහි ඇති බව නුවණින් දකී. කෙවට්ටය, ණය නැති බව යම්සේද, නිරෝගී බව යම්සේද සිර ගෙයින් මිදීම යම්සේද, අනුන්ට යටත් නැති බව යම්සේද, භය නැති භූමිය යම්සේද, එපරිද්දෙන්ම කෙවට්ටය, භික්ෂු තෙමේ පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමන් තුළ නැති බව නුවණින් දක්නේය.

33. පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමා කෙරෙහි නැතැයි නුවණින් දක්නාවූ ඒ භික්ෂුහට සතුටු ආකාරය උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීතිසහගත සිත් ඇත්තහුගේ නාමකය (වේදනාදී ස්කන්ධ හතර) සංසිඳෙයි. සංසිඳුනු කය ඇති තැනැත්තේ කායික චෛතසික සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට (එකඟ බවට) පැමිණෙයි.

34. ඒ භික්ෂුතෙමේ වස්තුකාම ක්ලෙශකාමයන්ගෙන් වෙන් වූයේම, අකුශල ධර්මයන් කෙරෙන්ද වෙන් වූයේම (විතක්ක) අරමුණට සිත පැමිණවීම, (විචාර) අරමුණෙහි නැවත නැවත යෙදී හැසිරීම සහිතවූ, සිතෙහි විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැපය ඇති, ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කෙරේද, කෙවට්ටය, මේද අනුශාසනී ප්‍රාතිහාර්යයයි කියනු ලැබේ. දෙවෙනි ධ්‍යානයටද තුන්වෙනි ධ්‍යානයටද හතරවෙනි ධ්‍යානයටද පැමිණ වාසය කෙරේද, කෙවට්ටය, මෙයද අනුශාසනී ප්‍රාතිහාර්යයයි කියනු ලැබේ.

35. "නැවතද, කෙවට්ටය, ඒ භික්ෂුතෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය ඉපදවීම පිණිස සිත එලවා තබයි. ඒ සඳහා වෙසෙසින් සිත නමයි. ඔහු මෙසේ දැන ගනී. 'මාගේ මේ ශරීරය වනාහි රූපයෙන් යුක්තය, සතර මහාභූතයන්ගේ හේතුවෙන් හටගත්තේය. මව්පියන් නිසා හටගත්තේය. ආහාරයෙන් වඩනා ලද්දේය. අනිත්‍ය බවය, ඇඟ ඉලීමය, පිරිමැදීමය, බිඳීමය, විනාශය යන මේ දේ ස්වභාවකොට ඇත්තේය, මාගේ මේ විඤ්ඤාණය ශරීරය ආශ්‍රය කෙරේ. මෙහිම බැඳුනේ වෙයි' කියායි.

36. "කෙවට්ටය, යම්සේ යහපත්වූ පිරිසිදු ආකාරයෙන් උපන්නාවූ, අටැස්වූ, ගල් ආදී දොස් බැහැර කිරීමෙන් හොඳ ලෙස සකස් කරණ ලද්දාවූ, නිර්මලවූ, විශෙෂයෙන් ප්‍රසන්නවූ කැලැල් නැතිවූ, සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, වෛඩූර්‍ය

මැණිකක් වේද, එහි නිල්වූ හෝ කහපාටවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ නූලක් අමුණන ලද්දේද ඒ මේ මැණික ඇස් ඇති පුරුෂයෙක් අතට ගෙණ මෙසේ සලකා බලන්නේය. මේ වෛඪූර්‍ය්‍ය මැණික මනාසේ කාන්තිමත් හෙයින් යහපත්වේ. පිරිසිදු ආකාරයෙන් උපන්නේය. අටැස් ඇත්තේය, දොස් දුරුකිරීමෙන් මනාකොට සකස් කරණ ලද්දේය. නිර්මලය, විශෙෂයෙන් ප්‍රසන්නය, කැලැල් නැත, සියලු ආකාරයෙන් සම්පූර්ණය. ඒ මැණිකෙහි මේ නීලවර්ණවූ හෝ කහපාටවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ නූලක් අමුණන ලද්දේය' කියායි.

"කෙවට්ටය, එපරිද්දෙන්ම යොගීවූ මේ භික්ෂු තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, පහවූ ක්ලෙශයන් ඇතිවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය පිණිස සිත එලවා තබයි, ඒ සඳහා විශෙෂයෙන් සිත නමයි. ඒ භික්ෂු තෙමේ මෙසේ දන්නේය, කෙසේද යත්, 'මාගේ මේ ශරීරය වනාහි රූපයෙන් යුක්තවේ. සතර මහාභූතයන්ගෙන් හටගත්තේය. මව්පියන් නිසා හටගත්තේය, ආහාරයෙන් වඩනා ලද්දේය. අනිත්‍ය බවය, ඉලීමය පිරිමැදීමය, බිඳීමය, විනාශය යන මේ ස්වභාවකොට ඇත්තේය. මාගේ මේ විඥ්ඥාණය මේ ශරීරය ආශ්‍රය කෙළේ වෙයි. මෙහිම බැඳී සිටියේය' කියායි.

මෙයද කෙවට්ටය අනුශාසනී ප්‍රාතිහාර්යයයි කියනුලැබේ.

37. "ඔහු මෙසේ ධ්‍යානයෙන් සිත එකඟවූ කල්හි. පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි කෙලෙස් නැතිවූ කල්හි ක්ලෙශයන් පහවූ කල්හි. මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, නොසැලෙන බවට පැමිණි කල්හි, මනොමයවූ රූපයක් මනාකොට නිපදවීම පිණිස සිත එලවා තබයි, වෙසෙසින් නමයි. ඔහු ආකාරවත්වූ, මනොමයවූ (ධ්‍යාන සිතින් නිපදවනලද) ශරීරය හා අත පය ආදී අවයව ඇති, විකලනුවූ ඉඳුරන් ඇති, මේ ශරීරයෙන් අන්‍යවූ ශරීරයක් හොඳ ලෙස මවයි.

38. "කෙවට්ටය, යම්සේ පුරුෂයෙක් මුදු තණ ගසින් තණබඩය උදුරා ගැනීම කරන්නේද, මේ තණ ගසය, මේ තණබඩයය, තණගස අනිකෙක, තණබඩය අනිකෙක, තණ ගසින්ම තණබඩය ඇදගන්නා ලද්දේය, තනන ලද්දේය යන වැටහීම ඕහට පහළ වන්නේය.

"කෙවට්ටය, යම්සේ පුරුෂයෙක් කඩුව කොපුවෙන් ඉවත් කරන්නේද ඔහුට මෙබඳු අදහසක් වන්නේය. මේ කඩුවය, මේ කොපුවය, කඩුව අනිකෙක, කොපුව අනිකෙක, කොපුවෙන් කඩුව ඉවත් කරණ ලද්දේය කියායි.

"කෙවට්ටය, යම් පුරුෂයෙක් සර්පයකු සැවයෙන් පහ කරන්නේද ඕහට මේ සර්පයාය, මේ සැවයය, සර්පයා එකෙකි, සැවය අනිකකි, සැවයෙන් සර්පයා වෙන්කරණ ලද්දේයයි වැටහීමක් ඇතිවන්නේය.

"කෙවට්ටය, එසේම භික්ෂුතෙමේ (මෙසේ සිත සමාධිගතවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි) සිතින් උපදවන කය මැවීම පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට ඊට නමයි. ඔහු මේ කයින් රූ ඇති, සිතින් මවනලද, සියලුශරීරය සහ අතපය ආදී අවයවඇති, නොපිරිහුණු ඉන්ද්‍රිය ඇති, වෙන කයක් මවයි.

කෙවට්ටය, මෙයද අනුශාසනී ප්‍රාතිහාර්යයයි කියනු ලැබේ.

39. "ඔහු (මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, නැවතීමට පැමිණි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි) ඍද්ධිවිධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත්කොට නමයි. ඔහු (නොයෙක් අයුරු ඇති ඍද්ධිවිධි වෙන් වෙන්කොට දක්වයි. එකෙක්ව බොහෝසේ වෙයි. බොහෝසේව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය හරහට, පවුර හරහට

පර්වතය හරහට නොහැපෙමින් යයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම් මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙදා ගමන් කෙරෙයි. පක්ෂියකු මෙන් අහසෙහිද පර්යංකයෙන් හිඳගෙනම යෙයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති සඳ හිරු දෙදෙන අතගායි. පිරිමදියි, බඹලොව තෙක් ශරීරයෙන් වසඟ බව පවත්වයි.)

40. "කෙවට්ටය, දක්ෂ කුඹල්කරුවෙක් හෝ කුඹල්කරු අතවැසියෙක් හෝ යහපත්සේ පදම්කළ මැටියෙන් කැමති කැමති වලන් ආදි වර්ගයන් යම්සේ කරන්නේද, නිපදවන්නේද, කෙවට්ටය, දළ කැටයම් කරුවෙක් හෝ අතවැසියෙක් හෝ සකස්කළ දළයෙහි යම්සේ කැමති කැමති දළ කැටයම් වර්ගයක් කරන්නේද, නිපදවන්නේද, කෙවට්ටය, දක්ෂරන්කරුවෙක් හෝ රන්කරු අතවැසියෙක් හෝ පදම්කළ රණින් කැමති කැමති රන් අබරණ ජාතීන් යම්සේ කරන්නේද, නිපදවන්නේද- කෙවට්ටය, එසේම භික්ෂුව (සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි,) ඍද්ධි විධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට නමයි. ඔහු (නොයෙක් ඍද්ධි විධි වෙන් වෙන් කොට දක්වයි. එකෙක්ව බොහෝ සේ වෙයි. බොහෝසේව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය හරහට, පවුර හරහට, පර්වත හරහට නොහැපෙමින් යෙයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම් මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙදා ගමන් කරයි. පක්ෂියකු මෙන් අහසෙහිද පර්යංකයෙන් හිඳගෙනම යෙයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති, සඳ හිරු දෙදෙන අතගායී. පිරිමදියි. බඹලොව තෙක් ශරීරයෙන් වසඟබව කෙරෙයි.) මෙයද කෙවට්ටය අනුශාසනී ප්‍රාතිහාර්යයයි කියනු ලැබේ.

41. "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, ක්ලේශයන් පහව

ගිය කල්හි මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි) දිව්‍ය කණ සම්බන්ධ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට නමයි. ඒ භික්ෂුව පිරිසිදුවූ මිනිස් බව ඉක්මවූ, දිව්‍ය කණ සම්බන්ධ ඥානයෙන් දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද, දුරෙහිවූද, සමීපයෙහිවූද, දෙයාකාර ශබ්දයන් අසයි.

42. "කෙවට්ටය, දික් මඟට පැමිණි පුරුෂයෙක් බෙර හඬද, මිහිඟු බෙර හඬද, සක්, පණාබෙර, ගැටබෙර හඬද, යම්සේ අසාද, ඔහුට මේ බෙර හඬයයිද, මිහිඟු බෙර හඬයයිද, සක්, පණාබෙර, ගැටබෙර හඬයයිද සිතෙන්නේය. කෙවට්ටය, එලෙසින්ම භික්ෂුව (මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමසිත් රහිතවූ කල්හි, පහවූ ක්ලෙශයන් ඇති කල්හි, මෘදුවූ කල්හි, ස්ථිර බවට පැමිණි කල්හි, කම්පානොවන බවට පැමිණි කල්හි) දිව්‍ය කණ සම්බන්ධ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට නමයි. ඔහු මෙසේ පිරිසිදුවූ, මිනිස් කණ ඉක්මවූ දිව්‍ය කණ සම්බන්ධ ඥානයෙන් දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද, දුරෙහිවූද, සමීපයෙහිවූද, දෙයාකාර ශබ්දයන් අසයි. මෙයද කෙවට්ටය, අනුශාසනී ප්‍රාතිහාර්යයයි කියනු ලැබේ.

43. 'ඔහු මෙසේ (සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි පහවූ ක්ලෙශයන් ඇති කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුවූ කල්හි, ස්ථිර බවට පැමිණි කල්හි කම්පා නොවන බවට පැමිණි කල්හි) පර සිත් දැනගන්නා ඤාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට නමයි. ඔහු අන්‍ය සත්වයන්ගේ, අන්‍ය පුද්ගලයන්ගේ සිත සිතින් පිරිසිඳ දනියි. රාග සහිත සිත රාග සහිත සිතයයි දනියි. රාගය පහවූ සිත රාගයෙන් තොරවූ සිතයයී දනියි. ද්වෙෂ සහිත සිත දොසසහිත සිතයයී දනියි. මොහ සහිත සිත මොහ සහිත සිතයයි දනියි, මොහය පහවූ සිත මොහයෙන් තොරවූ සිතයයි දනියි. හැකුලුණු සිත හැකුලුණු සිතයයි දනියි. විසුරුණු සිත විසුරුණු සිතයයි දනියි. මහත් බවට ගිය සිත, මහත් බවට

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ගිය සිතයයි දනියි. මහත් බවට නොගිය සිත, මහත් බවට නොගිය සිතයයි දනියි. කාම සහිත සිත, කාම සහිත සිතයයි දනියි. ලෞකික හිත් අතුරෙන් උසස්ම සිත අනුත්තර සිතයයි දනියි. සමාධිගතවූ සිත සමාධිගත සිතයයි දනියි. සමාධිගතනොවූ සිත සමාධි ගත නොවූ සිතයයි දනියි. (ක්ලෙශයන්ගෙන්) මිදුනු සිත, මිදුනු සිතයයි දනියි. නොමිදුනු සිත නොමිදුනු සිතයයි දනියි.

44. "කෙවට්ටය, සැරසෙන ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ළමාවයසෙහි සිටියෙක් හෝ තරුණයෙක් හෝ පිරිසිදු නොකිළිටි කැඩපතෙක හෝ පිරිසිදු දිය භාජනයෙක්හි හෝ තමාගේ මූනේ ශෝභාව පරීක්ෂා කරන්නේ යම්සේ කැලල් සහිත නම් කැලල් සහිතයයි දැනගනියිද, කැලල් රහිත නම් කැලල් රහිතයයි දැනගනියිද.

"කෙවට්ටය, එසේම භික්ෂු තෙම (මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, සිත ස්ථිරවූ කල්හි කම්පානොවන බවට පැමිණි කල්හි,) (පරසිත් දැනගන්නා ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු අන්‍ය සත්වයන්ගේ, අන්‍ය පුද්ගලයන්ගේ සිත (තමන්ගේ) සිතින් දැන ගනියි. රාග සහිත සිත රාග සහිත සිතයයි දනියි, රාගයෙන් තොරවූ සිත රාගයෙන් තොරවූ සිතයයි දනියි. දොසසහිත සිත දොස සහිත සිතයයි දනියි. දොසයෙන් තොරවූ සිත දොසයෙන් තොරවූ සිතයයි දනියි. මොහ සහිත සිත මොහ සහිත සිතයයි දනියි. මොහයෙන් තොරවූ සිත මොහයෙන් තොරවූ සිතයයි දනියි. හැකුලුණු සිත හෝ විසුරුණු සිත හෝ මහත් බවට ගිය සිත හෝ මහත් බවට නොගිය සිත හෝ කාම සහිත සිත හෝ අනුත්තර සිත හෝ එකඟවූ සිත හෝ එකඟනොවූ සිත හෝ දනියි, මිදුණු සිත හෝ මිදුණු සිතයයි දනියි. නොමිදුණු සිත හෝ නොමිදුණු සිතයයි දනියි.) කෙවට්ටය, මෙයද අනුශාසනී ප්‍රාතිහාර්යයයි කියනු ලැබේ.

**45.** "ඔහු (මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම සිත් රහිතවූ කල්හි ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, සිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි,) පෙර ජාති සිහිකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට (ඊට) නමයි. හේ තෙමේ නොයෙක් විධියේ පෙර විසීම් සිහිකෙරෙයි. කෙසේද යත්, (එක් ජාතියක්ද, දෙ ජාතියක්ද, තුන් ජාතියක්ද, හතර ජාතියක්ද, පස් ජාතියක්ද, දස ජාතියක්ද, විසි ජාතියක්ද, තිස් ජාතියක්ද, සතළිස් ජාතියක්ද, පණස් ජාතියක්ද, සියක් ජාතියක්ද, දහස් ජාතියක්ද, සියක් දහස් ජාතියක්ද, නොයෙක් විනාශ වෙමින් පවතින කල්පයන්ද, නොයෙක් හැදෙමින් පවතින කල්පයන්ද, නොයෙක් විනාශවන හෝ හැදෙන කල්පයන්ද, 'අසුවල් තැන වීමි, මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පාට ඇත්තෙමි මේ කෑම ඇත්තෙමි, මේ සැප දුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුතවූයෙම් අසවල් තැන උපන්නෙමි; එහිදු මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පාට ඇත්තෙමි, මේ කෑම ඇත්තෙමි, මේ සැප දුකුවින්දෙමි, මේ ආයුෂ කෙළවරකොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතවූයෙම්, මෙහි උපන්නෙමි' යි මෙසේ ආකාර සහිතව දැන්වීම් සහිතව, නොයෙක්විදියේ පෙර ජීවිත සිහි කෙරෙයි.

**46.** "කෙවට්ටය, පුරුෂයෙක් යම්සේ තම ගමින් අන් ගමකට යන්නේද, ඒ ගමිනුත් අන් ගමකට යන්නේද, ඒ ගමිනුත් තමන්ගේ ගමට එන්නේද. 'මම සිය ගමින් අසවල් ගමට ගියෙමි. එහි මෙසේ සිටියෙමි. මෙසේ හුන්නෙමි. මෙසේ කථාකළෙමි. මෙසේ නිශ්ශබ්ද වීමි. එගමිනුදු අසවල් ගමට ගියෙමි. එහිද මෙසේ සිටියෙමි. මෙසේ හුන්නෙමි. මෙසේ කථාකෙළෙමි. මෙසේ නිශ්ශබ්ද වීමි. ඒ මම ඒ ගමින් සිය ගමට පැමිණියෙමි'යි හෙතෙම දන්නේය.

"කෙවට්ටය, එපරිද්දෙන්ම භික්ෂුව (මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි,

ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි හිත ස්ථිරවූ කල්හි කම්පා නොවන බවට පැමිණි කල්හි) (පෙර ජාති සිහිකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට නමයි. හේ නොයෙක් පෙරවිසීම් සිහි කෙරෙයි. කෙසේද යත්: එක් ජාතියක්ද ජාති දෙකක්ද, ජාතිතුනක්ද, ජාතිසතරක්ද, ජාතිපහක්ද, ජාතිදසයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති හතළිහක්ද, ජාති පණහක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති සියක් දහසක්ද, නොයෙක් කල්ප විස්සකින් යුත් කල්පයන්ද නොයෙක් කල්ප රාශියකින් යුත් කල්පයන්ද, නොයෙක් කල්පයන්ද, අසවල් තැන වීමි. මෙබඳු නම් ඇත්තෙම් මෙබඳු ගොත්‍ර ඇත්තෙම්, මෙබඳු පාට ඇත්තෙම්. මෙබඳු ආහාර ඇත්තෙම්. මෙබඳු සැප දුක් වින්දෙම්, මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතව අසවල්තැන උපන්නෙමි; එහිදු මෙනම් ඇත්තෙම්, මෙබඳු ගොත්‍ර ඇත්තෙම්, මෙබඳු පාට ඇත්තෙම්, මෙබඳු ආහාර ඇත්තෙම්, මෙබඳු සුව දුක් වින්දෙම්, මෙබඳු ආයුෂ කෙළවරකොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතව මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිත පෙරවිසූ පිළිවෙළ දැක්වීම් සහිත, නොයෙක් ආකාරවූ පෙරවිසීම් සිහි කෙරෙයි.) මෙයද කෙවට්ටය අනුශාසනී ප්‍රාතිහාර්යයයි කියනු ලැබේ.

47. "ඔහු (මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසුදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි හිත ස්ථිරවූ කල්හි, කම්පානොවන බවට පැමිණි කල්හි (සත්වයන් ගේ මරණින් පසු උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත්කෙරෙයි. ඉදිරිපත්කොට නමයි. හේ පිරිසුදුවූ, මිනිස් ඇස ඉක්මවූ දිව්‍ය ඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳ ලොව ගියාවූද නරකලොව ගියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනී. මේ පින්වත් සත්වයෝ ශරීර දුශ්චරිතයෙන් යුක්තය. වචන දුශ්චරිතයෙන් යුක්තය, හිතේ දුශ්චරිතයෙන් යුක්තය උත්තමයන්ට බණින්නෝය. මිථ්‍යාදෘෂ්ටිකයෝය. මිථ්‍යාදෘෂ්ටි

කර්ම සමාදන් වූවෝය. ඔවුහු මරණින් මතු සැපයෙන් පහවූ නපුරුවූ දුක්වූ නිරයට පැමිණෙත්. නැතහොත් මේ පින්වත් සත්වයෝ ශරීර සුචරිතයෙන් යුක්තය. වචන සුචරිතයෙන් යුක්තය හිතේ සුචරිතයෙන් යුක්තය. උත්තමයින්ට නොබණින්නෝය. සත්‍යය අදහන්නෝය. සත්‍ය ඇදහීම් සමාදන්වූවෝය. මරණින් මතු යහපත් පැමිණීමවූ, ස්වර්ග ලොකයට පැමිණියෝය' යි මෙසේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳ ලොව ගියාවූද නරක ලොව ගියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනී.

48. "කෙවට්ටය, යම්සේ පාරේ හන්දියක ප්‍රාසාදයක් වේද, එහි ඇස් ඇති පුරුෂයෙක් සිටියේ ගෙට ඇතුල්වෙන ගෙයින් නික්මෙන, වීථියෙහි හැසිරෙන, පාර හන්දියේ හිඳින මනුෂ්‍යයන් දක්නේද, ඔහුට මෙසේ සිතෙයි. 'මේ මිනිස්සු ගෙට ඇතුළුවෙති, මොවුහු නික්මෙති, මොවුහු වීථියෙහි හැසිරෙති, මොවුහු පාර හන්දියේ ඉඳිති'යි කියායි. කෙවට්ටය, එසේම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, සිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි සත්වයන්ගේ චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, සිත ඉදිරිපත් කොට නමයි. හේ මිනිස් ඇස ඉක්මවූ දිවඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳලොව ගියාවූද නරක ලොව ගියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනී. මේ පින්වත් සත්වයෝ ශරීර දුශ්චරිතයෙන් යුක්තය, වචන දුශ්චරිතයෙන් යුක්තය, හිතේ දුශ්චරිතයෙන් යුක්තය, උත්තමයින්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු ශරීරයෙන් වෙන්ව මරණින් මතු අපායවූ, දුර්ගතියවූ, දුකවූ, නිරයට පැමිණෙත්. නැතහොත් 'මේ පින්වත් සත්වයෝ ශරීර සුචරිතයෙන් යුක්තය, වචන සුචරිතයෙන් යුක්තය, හිතේ සුචරිතයෙන් යුක්තය, උත්තමයින්ට නොබනින්නෝය, සත්‍යය අදහන්නෝය, සත්‍යය ඇදහීම්

සමාදන් වූවෝය. ශරීරයෙන් වෙන්ව මරණින් මතු යහපත් ගතියවූ, ස්වර්ගලෝකයට පැමිණියෝය'යි මෙසේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද සුගතියට පැමිණියාවූද දුර්ගතියට පැමිණියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනී. මෙයද, කෙවට්ටය අනුශාසනී ප්‍රාතිහාර්යයයි කියනු ලැබේ.

**49.** "ඔහු මෙසේ සිත එකඟවූ, කල්හි පිරිසුදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පානොවන බවට පැමිණි කල්හි, (ආශ්‍රව) සිතේ පැසවන කෙලෙස් පහකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට නමයි. ඔහු මේ දුකයයි තතුලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හෙතුවයයි තතුලෙස දැනගණී, මේ දුක් නැතිකිරීමයයි තතුලෙස දැනගණී, මේ දුක් නැතිකිරීමේ මාර්ගයයි තතුලෙස දැනගණී, මේ (ආශ්‍රව) පැසවන කෙලෙස්යයි තතුලෙස දැනගණී, මේ ඒ කෙලෙස් නැතිකිරීම යයි තතුලෙස දැනගණී, මේ ඒ කෙලෙස් නැතිකිරීමේ මාර්ගය යයි තතුලෙස දැනගණී, මෙසේ දන්නා ඔහුගේ සිත කාම ආශාවන් කෙරෙන්ද මිදේ, සංසාරයට (භවයට) ඇති ආශාවන් කෙරෙන්ද සිත මිදේ, දැඩි මෝහය කෙරෙන්ද සිත මිදේ. මිදුනු කල්හි මිදුනේය යන සිත වෙයි. ඉපදීම නැතිවිය. උතුම් හැසිරීමෙහි වසන ලදී, කටයුත්ත කරණ ලදී. මෙයින් පසු කළයුත්තක් නැතැ'යිද දැනගණී.

**50.** "කෙවට්ටය, යම්සේ පර්වත මුදුනක පිරිසිදු, සිත් සතුටු කරන නොකැළඹුනු, දියවිලක් වේද, එහි ඉවුරේ ඇස් ඇති පුරුෂයෙක් සිටියේ නැවතී තිබෙන්නාවූ සිප්පිබෙල්ලන් හා සක්බෙල්ලන්ද, කැටකැබිලිතිද, එහා මෙහා යන්නාවූ මසුන් රැන්ද, දක්නේද, ඔහුට මෙසේ සිතෙන්නේය. 'මේ දිය විල පිරිසිදුය, මනා සිත් ප්‍රිය කරන්නේය, නොකැළඹුනේය, එහි සිප්පි බෙල්ලන් හා සක්බෙල්ලන්ද, කැටකැබිලිතිද නැවතී තිබේ. මසුන් රැන් හැසිරෙත්ය'කියායි. කෙවට්ටය, එලෙසින් භික්ෂුව

මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමසිත් රහිත කල්හි, ක්ලෙශයන් පහවගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පානොවන බවට පැමිණි කල්හි, බොහෝ කල් සිට එන ක්ලෙශයන් නැතිකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉද්රිපත්කොට නමයි. ඔහු මේ දුකයයි තතු ලෙස දැනගණී. මේ දුක් ඉපදීමේ හෙතුවයයි තතු ලෙස දැනගණී. මේ දුක් නැතිකිරීමයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැතිකිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස්යයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් හේතුයයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් නැතිකිරීමයයි තතු ලෙස දැන ගණී. මේ කෙලෙස් නැතිකිරීමේ මාර්ගයයයි තතුලෙස දැනගණී මෙසේ දන්නා ඔහුගේ සිත කාම ආශාවන් කෙරෙන්ද මිදේ, භවයට ඇති ආශාවන් කෙරෙන්ද මිදේ, මෝහය කෙරෙන්ද සිත මිදේ, මිදුනු කල්හි මිදුනේය යන සිත වෙයි. ඉපදීම නැති විය, උතුම් හැසිරීමෙහි වසනලදී, කටයුත්ත කරණලදී, මෙයින් පසු කටයුතු අනිකක් නැතැයි' දැනගණී. කෙවට්ටය, මෙයද අනුශාසනී ප්‍රාතිහාර්යයයි කියනු ලැබේ.

මේ ප්‍රාතිහාර්යය තුන මා විසින් තමන්ගේ විශෙෂ ඥානයෙන් දැන අවබොධකොට ප්‍රකාශකරණ ලද්දාහුය.

**51.** කෙවට්ටය, පෙරවූ දෙයක් කියමි. මේ භික්ෂුසංඝයා අතුරෙහිමවූ එක්තරා භික්ෂුවක්හට මෙවැනි අදහසක් පහළ වූයේය. *පඨවිධාතු අපොධාතු තෙජොධාතු වායොධාතු යන මේ සතර මහාභූතයෝ කවර තැනෙක්හි කුමකට පැමිණ කුමකට පැමිණි තැනැත්තා හට ඉතිරි නොවී නැවත නූපදින පරිදි විනාශ වන්නාහුදැයි කියාය.

"කෙවට්ටය, එවිට ඒ භික්ෂුතෙම යම් ආකාරයකින් සිත එකඟවූ කල දිව්‍ය ලොකයට යන මාර්ගයයි කියන ලද ඍද්ධිවිධඥානය පහළවන්නේද එවැනි සමාධියකට සමවැදුනේය. කෙවට්ටය, එවිට ඒ භික්ෂුතෙම චාතුර්මහාරාජික

* පස් දිය ගිනි සුලන් යන ලොව ඇති මහා ධාතු සතර.

දෙවියෝ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ චාතුර්මහාරාජික දෙවියන්ගෙන් මේ කාරණය ඇසුයේය. “ඇවැත්නි, පඨවිධාතු අපොධාතු තෙජොධාතු වායොධාතු යන මේ සතර කවර තැනක කුමකට පැමිණ කුමකට පැමිණි තැනැත්තාහට ඉතිරි නොවී නැවත නොපවතින පරිද්දෙන් විනාශ වන්නාහුදැයි, කියාය.’ කෙවට්ටය, මෙසේ කී කල චාතුර්මහාරාජික දෙවියෝ ඒ භික්ෂුවට මේ වචන කීවෝය. ‘මහණ, පඨවිධාතු අපොධාතු තෙජොධාතු වායොධාතු යන මේ සතර මහාභූතයෝ යම්තැනක ඉතිරිනොවී නැවත නොපවතින අන්දමින් විනාශ වන්නාහුද යන මේ කාරණය අපිද නොදනිමු. අපට වඩා රූප සම්පත්තියෙන් හා ප්‍රඥා ආදී ගුණවලින් යුක්තවූද ශරීර වර්ණය පිරිවර ආදියෙන් ඉතා උතුම්වූද සතරවරම් රජකෙනෙක් ඇත්තාහුය. පඨවිධාතු අපොධාතු තෙජොධාතු වායොධාතු යන මේ සතර මහා භූතයෝ යම් තැනෙක ඉතිරිනොවී නැවත නොපවතින පරිද්දෙන් විනාශ වන්නාහුද යන මේ කාරණය ඒ සතරවරම් මහරජහු දන්නාහුය. කෙවට්ටය, එවිට ඒ භික්ෂුතෙම සතර වරම් රජහු යම් තැනකද එතනට පැමිණියේය. පැමිණ සතර වරම් රජුන්ගෙන් මේ කාරණය ඇසුවේය.

(“ඇවැත්නි, පඨවිධාතු, අපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතර මහාභූතයෝ කවර තැනෙක්හි කුමකට පැමිණ කුමකට පැමිණි තැනැත්තාහට සම්පූර්ණයෙන්(ඉතුරු නැතුව) නැවත නොපවතින පරිදි විනාශවන්නාහුදැයි කියාය.) කෙවට්ටය, මෙසේ ඇසූ කල සතරවරම් රජහු ඒ භික්ෂුවට මේ වචන කීවෝය. (“මහණ, පඨවිධාතු, අපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතර මහාභූතයෝ යම් තැනක ඉතිරි නොවී නැවත නොපවතින පරිදි විනාශවන්නාහුද යන මේ කාරණය අපිද නොදනිමුයයි” කියාය.) මහණ, අපට වඩා ඉතා රූප සම්පත්ති ආදියෙන් යුක්තවූද ශරීර වර්ණය පිරිවර ආදියෙන් උත්තමවූ තාවතිංස නම් දෙවිකෙනෙක් ඇත්තාහුය.

**52.** (පඨවිධාතු, අපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතර මහා භූතයෝ යම් තැනෙක ඉතිරි නොවී නැවත

නොපවතින ආකාරයෙන් විනාශවන්නාහුද යන මේ කාරණය) ඒ දෙවියෝ දන්නාහුය. කෙවට්ටය, එවිට ඒ භික්ෂුතෙම තව්තිසා වැසි දෙවියෝ යම් තැනකද එතනට පැමිණියේය. පැමිණ තව්තිසා වැසි දෙවියන්ගෙන් මේ කාරණය ඇසුවේය. ඇවැත්නි, (පඨවිධාතු, අපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතර මහා භූතයෝ කවර තැනෙක්හි කුමකට පැමිණ, කුමකට පැමිණි තැනැත්තාහට ඉතිරි නොවී නැවත නොපවතිනා ආකාරයෙන් විනාශ වන්නාහුදැයි' කියාය.) කෙවට්ටය, මෙසේ ඇසූ කල තව්තිසා වැසි දෙවියෝ ඒ භික්ෂුවට මේ වචන කීවෝය. 'මහණ, (පඨවිධාතු, අපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතර මහාභූතයෝ යම් තැනක ඉතිරි නොවී නැවත නොපවතිනා ආකාරයෙන් විනාශ වන්නාහුද යන මේ කාරණය අපිද නොදනිමු.) මහණ. අපට වඩා ඉතා රූප සම්පත්තයාදියෙන් යුක්තවූද, වර්ණය පිරිවර ආදියෙන් උත්තමවූද දෙවියන්ට ප්‍රධානවූ ශක්‍ර නම් දෙවියෙක් ඇත්තේය. (පඨවිධාතු, අපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතර මහා භූතයෝ යම් තැනෙක ඉතිරි නොවී නැවත නොපවතිනා අන්දමින් විනාශවන්නාහුද යන මේ කාරණය) දෙවියන්ට ප්‍රධානවූ ඒ ශක්‍ර දෙවියා දන්නේය.

"කෙවට්ටය, එවිට ඒ භික්ෂුතෙම ශක්‍ර දෙවි තෙම යම් තැනකද එතනට පැමිණියේය. පැමිණ ශක්‍ර දෙවියාගෙන් මේ කාරණය ඇසුවේය. ඇවැත්නි, (පඨවිධාතු, අපොධාතු, තෙජොධාතුව, වායොධාතු යන මේ සතර මහාභූතයෝ කවර තැනෙක්හි කුමකට පැමිණ කුමකට පැමිණි තැනැත්තාහට ඉතිරි නොවී නැවත නොපවතිනා අන්දමින් විනාශ වන්නාහු දැයි' කියාය.) කෙවට්ටය, මෙසේ ඇසූ කල ශක්‍රදෙවියා ඒ භික්ෂුවට මේ වචන මෙසේ කීයේය. 'මහණ, (පඨවිධාතු, අපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතර මහා භූතයෝ යම් තැනක ඉතිරි නොවි නොපවතින පරිදි විනාශ වන්නාහුදැයි යන මේ කාරණය මමද නොදනිමි.) මහණ, අපට වඩා ඉතා රූප සම්පත්තයාදියෙන් යුක්තවූද, වර්ණය පිරිවර ආදියෙන් අතිශයින් උත්තමවූ යාම නම් දෙවි කෙනෙක් ඇත්තාහුය.

(පඨවිධාතු, අපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතර මහාභූතයෝ යම් තැනක ඉතිරි නොවී නැවත නොපවතිනා පරිද්දෙන් විනාශ වන්නාහුද යන මේ කාරණය) ඒ යාම දෙවියෝ දන්නාහුය. කෙවට්ටය, එවිට ඒ භික්ෂුතෙම යාමදෙවියෝ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ යාම දෙවියන්ගෙන් මේ කාරණය ඇසුවේය.

53. "ඇවැත්නි, සතර මහාභූතයෝ කවර තැනෙක කුමකට පැමිණ ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශ වන්නාහුදැයි කියාය."-කෙවට්ටය, මෙසේ ඇසූ කල යාම දෙවියෝ ඒ භික්ෂුවට මේ වචන කීවෝය මහණ, යම් තැනක (පස්ධාතු, දියධාතු, ගිනිධාතු, වාතධාතු යන මේ සතර මහාභූතයෝ නිරවශෙෂව නොපවත්නා පරිදි නිරුද්ධ වන්නාහුද යන මේ කාරණය අපිද නොදනිමු.) මහණ, අපට වඩා රූපසම්පත් ආදියෙන් යුක්තවූද, වර්ණ සම්පත් ආදියෙන් උත්තමවූද සුයාම නම් දිව්‍යපුත්‍රයෙක් ඇත්තේය. ඒ දිව්‍යපුත්‍රයා සතර මහාභූතයෝ යම් තැනක ඉතුරු නොවී නැවත නූපදින පරිදි විනාශ වන්නාහුදැයි යන මේ කාරණය දන්නේය.' කෙවට්ටය, එවිට ඒ භික්ෂුතෙම සුයාම දිව්‍ය පුත්‍රතෙම යම්තැනකද එතැනට පැමිණියේය. පැමිණ සුයාම දිව්‍යපුත්‍රයාගෙන් මේ කාරණය ඇසුවේය. "ඇවැත්නි, සතර මහාභූතයෝ කවර තැනෙක්හි කුමකට පැමිණ, කුමකට පැමිණි තැනැත්තාහට ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශවන්නාහුදැ' යි කියාය. කෙවට්ටය, මෙසේ ඇසූ කල සුයාම දිව්‍යපුත්‍රයා ඒ භික්ෂුවට මේ වචන කීයේය. මහණ, (පස්ධාතු දියධාතු ගිනිධාතු වාතධාතු යන මේ සතර මහාභූතයෝ යම් තැනක ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශවන්නාහුදැ'යි යන මේ කාරණය මම නොදනිමි.) මහණ, අපට වඩා ඉතා රූප සම්පත්ති ආදියෙන් යුක්තවූද, වර්ණ සම්පත් ආදියෙන් උත්තමවූද තුසිත නම් දෙවි කෙනෙක් ඇත්තාහ. (පස්ධාතු දියධාතු ගිනිධාතු වායුධාතු යන මේ සතර මහාභූතයෝ යම්තැනක ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශවන්නාහුදැයි යන මේ කාරණය) ඒ තුසිත දෙවියෝ දන්නාහුය.' කෙවට්ටය, එවිට ඒ භික්ෂුතෙම තුසිත දෙවියෝ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ,

තුසිත දෙවියන්ගෙන් මේ කාරණය ඇසුවේය. ‘ඇවැත්නි, (පස්ධාතු දියධාතු ගිනිධාතු වායුධාතු යන මේ සතර මහා භූතයෝ කවර තැනෙක කුමකට පැමිණ කුමකට පැමිණි තැනැත්තාහට ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශ වන්නාහුදැයි කියාය.) කෙවට්ටය, මෙසේ ඇසූ කල තුසිත දෙවියෝ ඒ භික්ෂුවට මේ වචන කීවෝය.

**54.** “මහණ, මේ සතර මහාභූතයෝ යම් තැනක ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශවන්නාහුදැ’යි යන කාරණය අපිද නොදනිමු. මහණ, අපට වඩා ඉතා රූප සම්පත්ති ආදියෙන් යුක්තවූද, වර්ණ සම්පත්ති ආදියෙන් උත්තමවූද සන්තුසිත නම් දිව්‍ය පුත්‍රයෙක් ඇත්තේය. (පස්ධාතු දියධාතු ගිනිධාතු වායුධාතු යන මේ සතර මහා භූතයෝ යම් තැනක ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශවන්නාහුදැ’යි යන මේ කාරණය) ඒ සන්තුසිත දිව්‍යපුත්‍රයා දන්නේය “කෙවට්ටය, එවිට ඒ භික්ෂුතෙම සන්තුසිත දිව්‍යපුත්‍රයා යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, සන්තුසිත දිව්‍ය පුත්‍රයාගෙන් මේ කාරණය ඇසුවේය. ඇවැත්නි, සතර මහා භූතයෝ කවර තැනක කුමකට පැමිණ, කුමකට පැමිණි තැනැත්තාහට ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශ වන්නාහුදැ’යි කියාය. ‘කෙවට්ටය, මෙසේ ඇසූ කල සන්තුසිත දිව්‍යපුත්‍රයා ඒ භික්ෂුවට මේ වචන කීයේය. ‘මහණ, පස්ධාතු, දියධාතු ගිනිධාතු වායුධාතු යන මේ සතර මහාභූතයෝ යම් තැනක ඉතුරු නොවී නැවත නූපදින පරිදි විනාශ වන්නාහුදැයි යන මේ කාරණය) මමද නොදනිමි. මහණ අපට වඩා ඉතා රූප සම්පත් ආදියෙන් යුක්තවූද, වර්ණ සම්පත් ආදියෙන් උත්තමවූද නිම්මාන රතී නම් දෙවි කෙනෙක් ඇත්තාහුය. මේ සතර මහාභූතයෝ යම් තැනක ඉතුරු නොවී නැවත නූපදින පරිදි විනාශවන්නාහුද යන මේ කාරණය ඒ දෙවියෝ දන්නාහුය.

කෙවට්ටය, එවිට ඒ භික්ෂුතෙම නිම්මානරතී දෙවියන් යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, නිම්මානරතී දෙවියන්ගෙන් මේ කාරණය ඇසුවේය. ඇවැත්නි, සතර

මහාභූතයෝ කවර තැනක කුමකට පැමිණ කුමකට පැමිණි තැනැත්තාහට ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශ වන්නාහුදැයි කියාය. කෙවට්ටය, මෙසේ ඇසූ කල ඒ නිම්මානරතී දෙවියෝ ඒ භික්ෂුවට මේ වචන කීවෝය. මහණ, (පස්ධාතු දියධාතු ගිනිධාතු වායුධාතු යන මේ සතර මහාභූතයෝ යම් තැනක ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශ වන්නාහුදැයි යන මේ කාරණය) අපිද නොදනිමු. මහණ, අපට වඩා රූප සම්පත්ති ආදියෙන් යුක්තවූද වර්ණ සම්පත් ආදියෙන් උත්තමවූද සුනිම්මිත නම් දිව්‍යපුත්‍රයෙක් ඇත්තේය. ඒ සතර මහාභූතයෝ යම් තැනක ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශ වන්නාහුද යන මේ කාරණය ඒ දිව්‍යපුත්‍රයා දන්නේය.

**55** කෙවට්ටය, එවිට ඒ භික්ෂුතෙම සුනිම්මිත නම් දිව්‍ය පුත්‍රයා යම්තැනකද එතැනට පැමිණියේය. පැමිණ, සුනිම්මිත දිව්‍ය පුත්‍රයාගෙන් මේ කාරණය ඇසුවේය. ඇවැත්නී, සතර මහාභූතයෝ කවර තැනක කුමකට පැමිණ, කුමකට පැමිණි තැනැත්තාහට ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශ වන්නාහුදැයි කියාය. කෙවට්ටය, මෙසේ ඇසූ කල ඒ සුනිම්මිත දිව්‍යපුත්‍රයා ඒ භික්ෂුවට මේ වචන කීයේය. මහණ, (පඨවිධාතු අපොධාතු තෙජෝධාතු වායොධාතු යන මේ සතර මහාභූතයෝ යම් තැනක ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශ වන්නාහුදැයි යන මේ කාරණය මමද නොදනිමි.) මහණ, අපට වඩා රූප සම්පත්ති ආදියෙන් යුක්තවූද වර්ණ සම්පත්තියෙන් උත්තමවූද පරනිම්මිත වසවත්ති නම් දෙවි කෙනෙක් ඇත්තාහුය. ඒ සතර මහාභූතයෝ යම් තැනක ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශවන්නාහුද යන මේ කාරණය ඒ දෙවියෝ දන්නාහුය.

කෙවට්ටය, එවිට ඒ භික්ෂුතෙම පරනිම්මිත වසවත්තී නම් දෙවියන් යම් තැනකද එතනට පැමිණියේය. පැමිණ පරනිම්මිත වසවත්තී නම් දෙවියන්ගෙන් මේ කාරණය ඇසුවේය. ඇවැත්නි, සතර මහාභූතයෝ කවර තැනක කුමකට පැමිණි තැනැත්තාහට ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශ වන්නාහුදැයි කියාය. කෙවට්ටය, මෙසේ ඇසූ කල ඒ පරනිම්මිත වසවත්තී දෙවියෝ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඒ භික්ෂුවට මේ වචන කීවෝය. මහණ, (ඒ පස්ධාතු දියධාතු ගිනිධාතු වායුධාතු යන මේ සතර මහාභූතයෝ යම් තැනක ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශ වන්නාහුදැයි යන මේ කාරණය අපිද නොදනිමු.) මහණ, අපට වඩා රූප සම්පත්ති ආදියෙන්ද වර්ණ සම්පත් ආදියෙන්ද උත්තමවූ වසවත්තී නම් දිව්‍ය පුත්‍රයෙක් ඇත්තේය. ඒ සතර මහාභූතයෝ යම් තැනක ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශවන්නාහුද යන මේ කාරණය ඒ දිව්‍යපුත්‍රයා දන්නේය.

කෙවට්ටය, එවිට ඒ භික්ෂුතෙම වසවත්තී නම් දිව්‍ය පුත්‍රයා යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, වසවත්තී දිව්‍ය පුත්‍රයාගෙන් මේ කාරණය ඇසුවේය. ඇවැත්නි, සතර මහාභූතයෝ කවර තැනක කුමකට පැමිණ කුමකට පැමිණි තැනැත්තාහට ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශවන්නාහුදැයි කියාය. කෙවට්ටය, මෙසේ ඇසූ කල ඒ වසවත්තී දිව්‍යපුත්‍රයා ඒ භික්ෂුවට මේ වචන කීයේය. මහණ, (පඨවිධාතු අපොධාතු තෙජොධාතු වායොධාතු යන මේ සතර මහාභූතයෝ යම්තැනක ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශ වන්නාහුදැයි යන මේ කාරණය මමද නොදනිමි.) මහණ, අපට වඩා රූප සම්පත්ති ආදියෙන් යුක්තවූද වර්ණ සම්පත්තියෙන් උත්තමවූද බ්‍රහ්මකායික නම් දෙවි කෙනෙක් ඇත්තාහුය. ඒ සතර මහාභූතයෝ යම් තැනක ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශවන්නාහුද යන මේ කාරණය ඒ දෙවියෝ දන්නාහුය.

**56** කෙවට්ටය, එවිට ඒ භික්ෂුතෙම යම්සේ සිත එකඟවූ කල්හි බඹලොවට යන මාර්ගය පහළ වූයේද එබඳුවූ සමාධියට සමවැදුනේය. කෙවට්ටය, ඉක්බිති ඒ භික්ෂුතෙම බ්‍රහ්ම කායික නම් දෙවියන් යම් තැනකද එතනට පැමිණියේය. පැමිණ, ඒ බ්‍රහ්මකායික දෙවියන්ගෙන් මේ කාරණය ඇසුවේය. ඇවැත්නි, සතර මහාභූතයෝ කවර තැනක කුමකට පැමිණ කුමකට පැමිණි තැනැත්තාහට ඉතුරු නොවී නැවත නූපදින පරිදි විනාශවන්නාහුදැයි කියායි. මහණ, පස්, දිය, ගිනි, වායු යන

මේ සතර මහාභූතයෝ යම් තැනක ඉතිරිනොවී නැවත නූපදින පරිදි විනාශවන්නාහුදැයි යන මේ කාරණය අපිද නොදනිමු. මහණ, අපට වඩා ඉතා රූප සම්පත්ති ආදියෙන් යුක්තවූද යස ඉසුරු ආදියෙන් උත්තමවූද සියල්ලන් මැඩපවත්වා සිටියාවූද අන්‍යයන් විසින් මැඩපැවැත්විය නොහැක්කාවූද, ඒකාන්තයෙන් සියල්ල දක්නාවූ සියලු ජනයා තමා යටතෙහි පවත්වන්නාවූ ලොකයට අධිපතිවූ ලොකය සාදන්නාවූ ලොකය මවන්නාවූ සත්වයන් කොටස් වලට බෙදන්නාවූ පුරුදුකරණ ලද ධ්‍යාන ඇත්තාවූ, උපන්නාවූද, උපදින්නාවූද සියලු සත්වයන්හට පියවූ මහාබ්‍රහ්මවූ බ්‍රහ්මයෙක් ඇත්තේය. (පස්ධාතු දියධාතු ගිනිධාතු වායුධාතු යන මේ සතර මහාභූතයෝ යම් තැනක ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශ වන්නාහුද යන මේ කාරණය) ඔහු දන්නේය.” ඇවැත්නි, ඒ මහාබ්‍රහ්මතෙම දැන් කොතනදැයි ඇසුවේය. “මහණ, බ්‍රහ්මතෙම යම් තැනකදැයි කියා හෝ බ්‍රහ්මතෙම යම් ස්ථානයකදැයි කියා හෝ අපි නොදනිමු. මහණ, එසේද වුවත් යම්සේ (නිමිති) ලකුණු දකින්ට ලැබෙත්ද, එළියක් හටගනීද, බැබලීමක් පහළවේද එකල බ්‍රහ්මතෙම පහළවන්නේය. එළියක් හටගනීද බැබලීමක් පහළවේද යන මේ එක පූර්වලකුණක් බ්‍රහ්මයාගේ පහළවීම ගැන ඇත්තේය.”

“කෙවට්ටය, එවිට ඒ බ්‍රහ්මතෙම ටික වේලාවකින්ම පහළවූයේය. කෙවට්ටය, එවිට ඒ භික්ෂුතෙම ඒ මහාබ්‍රහ්මයා යම් තැනකද එතනට පැමිණියේය. පැමිණ, බ්‍රහ්මයාගෙන් මේ කාරණය ඇසුවේය. “ඇවැත්නි, (පස්ධාතු දියධාතු ගිනිධාතු වායුධාතු යන මේ සතර මහාභූතයෝ කවර තැනෙක කුමකට පැමිණ කුමකට පැමිණි තැනැත්තාහට ඉතුරු නොවී නැවත නූපදින පරිදි විනාශ වන්නාහුදැයි’) කියාය.

**57** “කෙවට්ටය, මෙසේ ඇසූ කල ඒ මහාබ්‍රහ්මතෙම ඒ භික්ෂුවට මෙසේ කීයේය. මහණ, මම බ්‍රහ්මවෙමි, මහා බ්‍රහ්මවෙමි, සියල්ලන් මැඩපවත්වා සිටින්නාවූ ප්‍රධානයා වෙමි, අනුන් විසින් මැඩපැවැත්විය නොහැක්කෙක් වෙමි. ඒකාන්තයෙන් සියල්ල දක්නෙමි. සියලු ජනයා වසඟයෙහි

පවත්වමි. ලොවට ප්‍රධාන දෙවියා වෙමි, ලොකයට කර්තෘවෙමි, ලොකය මවන්නෙක් වෙමි, ලොකයට උත්තම වෙමි, සත්වයන් කොට්ඨාසවලට බෙදන්නෙක් වෙමි, පුරුදු කරනලද ධ්‍යාන ඇත්තෙමි, උපන්නාවූද උපදින්නාවූද සියලු සත්වයන්ට පියා වෙමි."

"කෙවට්ටය, දෙවනුවද ඒ භික්ෂුතෙම ඒ මහාබ්‍රහ්මයාට මේ කාරණය කීයේය. 'ඇවැත්නි, මම ඔබගෙන් මෙසේ නොඅසමි, ඔබ බ්‍රහ්මයෙක් වූයෙහිද, මහා බ්‍රහ්මයෙක් වූයෙහිද, සියල්ල මැඩපවත්වා සිටින ප්‍රධානියා වෙහිද, අනුන් විසින් මැඩපැවැත්විය නොහැක්කෙක්වූයෙහිද, ඒකාන්තයෙන් සියල්ල දක්නෙක් වූයෙහිද, සියලු ජනයා වසඟයෙහි පවත් වන්නෙක් වූයෙහිද, ලොවට ප්‍රධාන දෙවියාවූයෙහිද, ලොකයට කර්තෘ වූයෙහිද, ලොකය මවන්නෙක් වූයෙහිද, ලොකයට උත්තම වූයෙහිද, සත්වයන් කොට්ඨාස වලට බෙදන්නෙක් වූයෙහිද, පුරුදු කරණ ලද ධ්‍යාන ඇත්තෙක් වූයෙහිද, උපන්නාවූද උපදින්නාවූද සියලු සත්වයන්ට පියා වූයෙහිදැයි' කියායි.

'ඇවැත්නි, මම ඔබගෙන් මෙසේ අසමි. 'ඇවැත්නි, (පස්ධාතු දියධාතු ගිනිධාතු වායුධාතු යන මේ සතර මහා භූතයෝ කවර තැනෙක කුමකට පැමිණ, කුමකට පැමිණි තැනැත්තාහට ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශ වන්නාහුදැයි) කියාය.

කෙවට්ටය, දෙවනුවද ඒ මහාබ්‍රහ්මතෙම (ඒ භික්ෂුවට මෙසේ කියේය. මහණ, මම බ්‍රහ්මවෙමි, මහාබ්‍රහ්ම වෙමි, සියල්ලන් මැඩපවත්වා සිටින්නාවූ ප්‍රධානයා වෙමි, අනුන් විසින් මැඩපැවැත්විය නොහැක්කේ වෙමි, ඒකාන්තයෙන් සියල්ල දක්නෙමි, සියලු ජනයා වසඟයෙහි පවත්වමි, ලොවට ප්‍රධාන දෙවියා වෙමි, ලොකයට කර්තෘ වෙමි, ලොකය මවන්නෙක් වෙමි. ලොකයට උත්තම වෙමි. සත්වයන් කොටස්වලට බෙදන්නෙක් වෙමි, පුරුදු කරණ ලද ධ්‍යාන ඇත්තෙමි. උපන්නාවූද උපදින්නාවූද සියලු සත්වයන්ට පියා වෙමි.)

කෙවට්ටය, තෙවනුවද ඒ භික්ෂුතෙම ඒ මහාබ්‍රහ්මයාට මේ කාරණය කීයේය. ඇවැත්නි, (මම ඔබගෙන් මෙසේ නොඅසමි.

ඔබ බ්‍රහ්මයෙක් වූයෙහිද, මහා බ්‍රහ්මයෙක් වූයෙහිද, සියල්ල මැඩපවත්වා සිටින ප්‍රධානයා වූයෙහිද, අනුන් විසින් මැඩපැවැත්විය නොහැක්කෙක් වූයෙහිද, ඒකාන්තයෙන් සියල්ල දක්නෙක් වූයෙහිද, සියලු ජනයා වසඟයෙහි පවත්වන්නෙක් වූයෙහිද, ලොවට ප්‍රධාන දෙවියා වූයෙහිද, ලොකයට කර්තෘ වූයෙහිද, ලොකයට උත්තම වූයෙහිද, සත්වයන් කොටස්වලට බෙදන්නෙක් වූයෙහිද පුරුදු කරණ ලද ධ්‍යාන ඇත්තෙක් වූයෙහිද, උපන්නාවූද උපදින්නාවූද සියලු සත්වයන්ට පියා වූයෙහිදැයි කියායි.)

ඇවැත්නි, මම ඔබගෙන් මෙසේ අසමි. ඇවැත්නි, පස්ධාතු දියධාතු ගිනිධාතු වායුධාතු යන මේ සතර මහා භූතයෝ කවර තැනක කුමකට පැමිණ කුමකට පැමිණි තැනැත්තාහට ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශ වන්නාහුදැයි) කියාය.

58 "කෙවට්ටය, එවිට ඒ මහාබ්‍රහ්මතෙම ඒ භික්ෂුව අතින් අල්වාගෙන එක්පැත්තකට පමුණුවා, ඒ භික්ෂුවට මේ කාරණය කීයේය. 'මහණ, මේ බ්‍රහ්මකායික දෙවියෝ මා මෙසේ දනිත්:- මහාබ්‍රහ්මයා විසින් නොදක්නාලද කිසිවක් නැත්තේය. මහාබ්‍රහ්මයා විසින් අවබොධනොකරනලද කිසිවකුත් නැත්තේයයි කියායි. එහෙයින් මම ඔවුන් ඉදිරියෙහි මේ කාරණය නොදන්නා බව ප්‍රකාශ නොකෙළෙමි. මහණ, පස්ධාතු දියධාතු ගිනිධාතු වායුධාතු යන සතර මහාභූතයෝ යම්තැනක ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශවන්නාහුද යන මේ කාරණය මමද නොදනිමි' (කියායි.

"මහණ, යම් හේතුවකින් නුඹවහන්සේ භාග්‍යවතුන් වහන්සේ ඉක්මවා මේ ප්‍රශ්නය විසඳීම පිණිස බඹලොව දක්වා පිටත සෙවීමට පැමිණියෙහිද. මහණ, එබැවින් නුඹ වහන්සේ විසින් මේ කාරණය වරදවා කරණ ලද්දේය, අපරාධයක් කරණ ලද්දේය. මහණ, නුඹවහන්සේ වැඩිය මැනව. ඒ භාග්‍යවතුන් වහන්සේ වෙතට පැමිණ මේ ප්‍රශ්නය ඇසුව මැනව. යම් ආකාරයකින් භාග්‍යවතුන් වහන්සේ නුඹවහන්සේට

ප්‍රකාශකරණසේක්ද එපරිද්දෙන් එය පිළිගත මැනවයි' මහාබ්‍රහ්මතෙම කීයේය.

"කෙවට්ටය, එවිට ඒ භික්ෂුතෙම ශක්තිමත් පුරුෂයෙක් හකුළාගත් අතක් දිගුකරන්නේ හෝ යම්සේද, දිගුකළ අතක් හකුළන්නේ හෝ යම්සේද, ඒ ආකාරයෙන් බ්‍රහ්මලොකයෙන් නොපෙනී ගොස් මාගේ ඉදිරියෙහි පහළවූයේය. කෙවට්ටය එවිට ඒ භික්ෂුතෙම වැඳ එකපැත්තක උන්නේය. කෙවට්ටය, එකපැත්තක උන්නාවූ ඒ භික්ෂුතෙම මා මෙසේ ප්‍රශ්නකළේය."

"ස්වාමීනි (පස්ධාතු, දියධාතු, ගිනිධාතු, වායුධාතු යන මේ සතර මහාභූතයෝ කවර තැනෙක්හි කුමකට පැමිණ, කුමකට පැමිණි තැනැත්තාහට ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශවන්නාහුදැයි") කියායි.

59 "කෙවට්ටය, මෙසේ ඇසූ කල මම ඒ භික්ෂුවට මේ කාරණය කීවෙමි. "මහණ, පෙර පැවැති කරුණක් කියමි. මුහුදෙහි යාත්‍රා කරන්නාවූ වෙළෙන්දෝ වෙරළ දකින ගති ඇති කවුඩු, උකුසු යන මොවුන් අතුරෙන් කුරුල්ලෙකු ගෙන නැවෙන් මුහුදට බැසගනිද්ද, ඔව්හු වෙරළ නොදක්නාවූ බැවින් වෙරළ දකින ගති ඇති කුරුල්ලා මුදත්. ඒ කුරුල්ලා නැගෙනහිර දිසාවට යයි, දකුණු දිසාවට යයි, බස්නාහිර දිසාවට යයි, උතුරු දිසාවට යයි, උඩටද යයි, පහල දිසාවටද යයි. ඉදින් ඒ කුරුල්ලා හාත්පස වෙරළ දක්නේද ඒ වෙරළ දෙසට යන්නේය. ඉදින් ඒ කුරුල්ලා හාත්පස වෙරළ නොදක්නේ නම් ඒ නැවටම ආපසු එයි' මහණ, එපරිද්දෙන්ම ඔබ යම් හේතුවකින් බ්‍රහ්ම ලොකය දක්වා සොයන්නේ මේ ප්‍රශ්නය විසඳන්නෙකු වෙතට නොපැමිණියෙහිද එහෙයින් නැවත මාගේ සමීපයටම හැරී ආයෙහිය. මහණ, ඒ ප්‍රශ්නය මෙසේ නොඇසිය යුතුයි. කෙසේද? "ස්වාමීනි, (පස්ධාතු, දියධාතු, ගිනිධාතු, වායුධාතු යන මේ සතර මහාභූතයෝ කවර තැනෙක කුමකට පැමිණ කුමකට පැමිණි තැනැත්තාහට ඉතුරුනොවී නැවත නූපදින පරිදි විනාශවන්නාහුදැ"යි) කියායි. මහණ මේ ප්‍රශ්නය ඇසිය යුත්තේ මෙසේය:-

කුමකට පැමිණ කුමක් හේතුකොටගෙන පස්, දිය, වතුර වායු යන සතර මහාභූතයෝ නොපිහිටත්ද හෙවත් පිහිටීම නොලබත්ද කවර තැනෙක්හි දීර්ඝවූ හෝ කොටවූ හෝ සියුම්වූ හෝ මහත්වූ හෝ ප්‍රියවූ හෝ අප්‍රියවූ හෝ (උපාදාය රූප රැස) මහාභූතයන් නිසා පවත්නා කුඩා රූපධාතු සමූහය නොපිහිටාද හෙවත් පිහිටීම නොලබාද කවර තැනක කුමකට පැමිණ නාමයත් රූපයත් (සිතත් කයත්) ඉතිරි නොවී නිරුද්ධවේද කියායි.

'එහි විවරණය මෙසේ වෙයි.'

'නුවණින් දැනගත යුතුවූ ඇසින් නොදැක්ක හැකිවූ ඉපදීම්, නැතිවීම කොන් නැති හැම පැත්තෙන්ම පැමිණිය හැකි තොටවල් ඇති මේ නිර්වාණ ධාතුවට පැමිණ පස්, දිය, ගිනි, වායු යන සතර මහාභූතයෝ පිහිටීම නොලබත්. මෙහි දීර්ඝවූ හෝ කොටවූ හෝ කුඩාවූ හෝ මහත්වූ හෝ ප්‍රියවූ හෝ අප්‍රියවූ හෝ මහාභූතයන් නිසා පවත්නා කුඩා රූපයෝ නොපිහිටත්. මෙහි නාම රූප දෙක ඉතිරි නොවී නිරුද්ධ වෙයි. විඤ්ඤාණ (සිත) නිරොධයෙන් මේ නාමරූප රාශිය මේ නිර්වාණයට පැමිණ ඉතිරි නොවී නැවත නූපදින පරිදි නිරුද්ධ වෙයි.

භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය වදාළසේක. සතුටු සිත් ඇති කෙවට්ට නම් ගෘහපති පුත්‍රයා භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදෙශනාව සතුටින් පිළිගත්තේය.

එකොළොස් වෙනිවූ කෙවට්ට සූත්‍රය නිමියේයි.

---

## 12. ලොහිච්ච සූත්‍රය

1 මා විසින් මෙසේ අසන ලදී. (මාගේ ඇසීම මෙසේය.) එක් කලක භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් පන්සියයක් පමණවූ මහා භික්ෂු සංඝයා සමග කොසොල් රට ගමන් කරමින් වඩිනා කල සාලවතිකා නම් ගම යම් තැනකද එතැනට වැඩිසේක. එකල ලොහිච්ච බ්‍රාහ්මණතෙම ගව මහිසාදී බොහෝ සතුන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇත්තාවූ බොහෝ ලීදඬු, වැව්, පොකුණු ආදියෙන් යුක්තවූ. බොහෝ ධාන්‍ය සහිතවූ, රජුන් විසින් දෙන ලද්දාවූ, රජුගෙන් ලැබූ තෑග්ගවූ පසේනදී කොසොල් රජු විසින් දෙන ලද සාලවතිකා නම් ගම ප්‍රධානියාව වාසය කරයි.

2 එකල ලොහිච්ච නම් බ්‍රාහ්මණයාහට මෙවැනි ලාමකවූ මිථ්‍යාදෘෂ්ටි අදහසක් උපන්නේය. මේ ලොකයෙහි මහණෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ යම් කුසල කර්මයකට පැමිණෙන්නේද කුසල කර්මයකට පැමිණ අනුන්ට ප්‍රකාශ නොකරන්නේය. අනිකෙක් අනිකෙකුට කුමක් කරන්නේද පරණ බැම්මක් කපා වෙන අලුත් බැම්මක් බඳින්නේ යම්සේද මෙය එවැනිවූ ලාමක ලොභයකැයි කියමි. අනිකෙක් අනිකෙකුට කුමක් කරන්නේද කියායි.

3 'ශාක්‍ය පුත්‍රවූ ශාක්‍ය කුලයෙන් ගොස් මහණවූ ශ්‍රමණ භවද් ගෞතම තෙම භික්ෂූන් පන්සියයක් පමණවූ මහා භික්ෂු සංඝයා සමග කොසොල් රට ගමන් කරන අතර සාලවතිකා නම් ගමට වැඩියේයයි ලොහිච්ච බ්‍රාහ්මණයාට අසන්ට ලැබුණේය. ඒ භාග්‍යවත් ගෞතමයානන් වහන්සේ ගැන මෙවැනි හිත් සතුටු කරන කීර්ති ඝොෂාවක් පැන නැංගේය. එනම් (ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙන් අර්හත්වූසේක. සම්‍යක් සම්බුද්ධවූසේක, විදර්ශනාඥාන ආදී විද්‍යා අට සීලසංවරය ආදී හසුරුවන ධර්ම පසළොස යන අෂ්ටවිද්‍යා පසළොස් චරණධර්මයන්ගෙන් යුක්තවූසේක. යහපත් ගමන් ඇතිසේක. සියලු ලෝකයන් දන්නාසේක. ශ්‍රෙෂ්ඨවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනිසේක. දෙව් මිනිසුන්ට ගුරුවරයෙක් වූසේක. (චතුරාර්‍ය්‍ය සත්‍ය) සත්‍යවූ උතුම් ධර්ම සතර අවබොධ කළසේක.) ඒ තථාගත තෙමේ දෙවියන් සහිතවූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, රජුන් හා මිනිසුන් සහිතවූ, සත්ත්ව වර්ගයා ස්වකීය උසස් ඥානයෙන් දැන අවබොධකොට ප්‍රකාශ කෙරේ. ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූ මැද යහපත්වූ, කෙළවර යහපත්වූ, අර්ථ සහිතවූ, දස ආකාරයෙන් නියම විදියට වචන

ශබ්දකරන්නාවූ (ඛ්‍යඤ්ජන සහිත) සියලු ලෙසින් සම්පූර්ණවූ, පිරිසිදුවූ, සිසලු ශාසන මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව ගෙනහැර දක්වතියි කීයේය.

ලොහිච්ච බ්‍රාහ්මණ තෙම මෙය අසා එවැනි රහතුන්ගේ දැකීම යහපත්වේයයි සිතුවේය.

4 එවිට ලොහිච්ච බ්‍රාහ්මණ තෙම රොසික නම් ඇම්බැට්ටයාට අඬගසා මෙසේ කීවෙය. "යහලු රොසිකය, මෙහි එන්න. ශ්‍රමණ භවද් ගෞතමයන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණෙන්න. පැමිණ, ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ආබාධ නැති බව, රෝග නැති බව සැහැල්ලු පැවතුම ඇති බව, ශරීර ශක්තිය ඇති බව, සැපයෙන් වාසය කිරීම යන කරුණු ලොහිච්ච බ්‍රාහ්මණයා අසන්නේයයි මාගේ වචනයෙන් අසන්න. අසා, හෙට දිනයෙහි ලොහිච්ච බ්‍රාහ්මණයාගේ භොජනය භවත් ගෞතමයන් වහන්සේ භික්ෂු සංඝයා සමග පිළිගන්නාසේක්වායිද දැනුම් දෙන්න.

5 "ස්වාමීනි, එසේයයි" රොසික නම් ඇම්බැට්ටයා ලොහිච්ච බ්‍රාහ්මණයාගේ වචනය සතුටින් පිළිගෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කොට එක පැත්තක උන්නේය. එක පැත්තක උන්නාවූ රොසික නම් ඇම්බැට්ටයා භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ දැන්නුවේය.

"ස්වාමීන් වහන්ස, ඔබවහන්සේගේ ආබාධ නැති බවද රොග නැති බවද සැහැල්ලු පැවතුම් ඇති බවද ශරීර ශක්තිය ඇති බවද සැපයෙන් වාසය කිරීමද යන මේ කරුණු ලොහිච්ච බ්‍රාහ්මණතෙම අසයි" ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, සෙට දවසෙහි ලොහිච්ච බ්‍රාහ්මණයාගේ භෝජනය භික්ෂු සංඝයා සමග පිළිගනිත්වායි කියාද දැන්නුවේය. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද භාවයෙන් එය පිළිගත්තේය.

6 එකල රොසික නම් ඇම්බැට්ටයා භාග්‍යවතුන් වහන්සේගේ පිළිගැනීම දැන උන්තැනින් නැගිට භාග්‍යවතුන්

වහන්සේ වැඳ (පැදකුණු කොට) ගෞරව ලෙස පැත්තකින් ගොස් ලොහිච්ච බ්‍රාහ්මණ තෙම යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ. ලොහිච්ච බ්‍රාහ්මණයාට මේ කරුණ කීයේය. පින්වත ඔබගේ වචනයෙන් ඒ භාග්‍යවතුන් වහන්සේට, ස්වාමීන් වහන්ස, ඔබවහන්සේගේ ආබාධ නැති බව, රොග නැති බව, සැහැල්ලු පැවතුම් ඇති බව, සැපයෙන් වාසය කිරීම යන කරුණු ලොහිච්ච බ්‍රාහ්මණතෙම අසයි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ලොහිච්ච බ්‍රාහ්මණයාගේ භෝජනය සෙට දවසෙහි භික්ෂු සංඝයා සමග පිළිගනිත්වායි, මෙසේද කීවේයයි" අපි දැනුම් දුනිමු. භාග්‍යවතුන් වහන්සේ විසින් එය පිළිගන්නා ලද්දේය කියායි.

7 එවිට ලොහිච්ච බ්‍රාහ්මණතෙම ඒ රාත්‍රිය පසුවූ කල සිය නිවසෙහි මිහිරිවූ කෑ යුතු දේද, වැළඳිය යුතු දේද පිළියෙළ කරවා රොසික නම් ඇම්බැට්ටයාට කථාකර මෙසේ කීයේය. "යහලුව රොසිකය මෙහෙ එන්න, ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ යම් තැනකද එතනට පැමිණෙව, පැමිණ ශ්‍රමණ ගෞතමයන් වහන්සේට 'භවද් ගෞතමයන් වහන්ස, භෝජනය පිළියෙළ කරන ලද්දේය. ඊට කාලයයි' කාලය දන්වනු."

ස්වාමීනි, එසේයයි" කියා රොසික නම් ඇම්බැට්ටයා ලොහිච්ච බ්‍රාහ්මණයාගේ වචන අසා පිළිගෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට නමස්කාරකොට එක පැත්තක සිටියේය. එක පැත්තක සිටියාවූ රොසික නම් ඇම්බැට්ටයා ස්වාමීන් වහන්ස, භෝජනය සූදානම් කරන ලද්දේය. ඊට කාලයයි" භාග්‍යවතුන් වහන්සේට කාලය දැන්නුවේය, එවිට භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි ඇඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන භික්ෂු සංඝයා සමග සාලවතිකා නම් ගම යම් තැනකද එතනට පැමිණියෝය.

8 එකල රොසික නම් ඇම්බැට්ටයා භාග්‍යවතුන් වහන්සේ පසු පස්සෙන් ගමන් කෙළේය. එකල්හි රොසික නම් ඇම්බැට්ටයා භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ දැන්නුවේය.

ස්වාමීන් වහන්ස, (ලොහිච්ච බ්‍රාහ්මණයාහට ලාමකවූ මෙවැනි වැරදි මතයක් උපන්නේය. "මේ ලොකයෙහි මහණෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ කුශල ධර්මයට පැමිණෙන්නේද, කුශල ධර්මයට පැමිණ අනුන්ට එය ප්‍රකාශ නොකරන්නේය. අනිකෙක් අනිකෙකුට කුමක් කරන්නේද? පැරණි බැම්මක් කපාදමා වෙන අලුත් බැම්මක් කරන්නේ යම් සේද මේ ලාමකවූ ලොභය එසේම යයි කියමි. අනිකෙක් අනිකෙකුට කුමක් කරන්නේදැයි" කියාය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ලොහිච්ච බ්‍රාහ්මණයා ලාමකවූ මේ වැරදි මතයෙන් මුදවන සේක්වා."

"රොසිකය, ඉතා යහපත් වන්නේය. රොසිකය, ඉතා යහපත් වන්නේය'යි කීසේක.

**9** එවිට භාග්‍යවතුන් වහන්සේ ලොහිච්ච බ්‍රාහ්මණයාගේ ගෙදර යම් තැනකද එතැනට පැමිණියෝය. පැමිණ, පණවනලද ආසනයෙහි වැඩහුන්නෝය. එකල ලොහිච්ච බ්‍රාහ්මණ තෙම බුදුන් ප්‍රධාන භික්ෂු සංඝයා මිහිරි කෑයුතු වැළඳිය යුතු දෙයින් සිය අතින් අනුභව කරවා මනාකොට පැවරුවේය. එවිට වළඳා පාත්‍රයෙන් ඉවත් කරණ ලද අත් ඇතිව හිඳින භාග්‍යවතුන් වහන්සේ දැක එක්තරා පහත් ආසනයක් ගෙන එක පැත්තක උන්නාවූ ලොහිච්ච බ්‍රාහ්මණයාහට භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ කීසේක.

"ලොහිච්චය, (මේ ලොකයෙහි මහණෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ කුශල ධර්මයට පැමිණෙන්නේද, කුශල ධර්මයට පැමිණ අනුන්ට එය ප්‍රකට නොකරන්නේය. අනිකෙක් අනිකෙකුට කුමක් කරන්නේද? පරණ බැම්මක් කපා දමා වෙන අලුත් බැම්මක් කරන්නේ යම්සේද මේ එවැනි ලාමකවූ ලොභයකැයි කියමි. අනිකෙක් අනිකෙකුට කුමක් කරන්නේද,) යන මෙබඳුවූ ලාමක මතයක් ඔබට උපන්නේ සැබෑද? "භවද් ගෞතමයන් වහන්ස, එසේයයි" කීයේය.

**10** "ලොහිච්චය, ඒ කුමකැයි සිතන්නෙහිද? ඔබ සාලවතිකා නම් ගම ප්‍රධානියාව වාසය කරන්නේ නොවෙහිද?"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"භවද් ගෞතමයන් වහන්ස, එසේය."

ලොහිච්චය, යමෙක් මෙසේ කියන්නේද, 'ලොහිච්ච බ්‍රාහ්මණතෙම සාලවතිකා නම් ගම ප්‍රධානියාව වාසය කරයි. සාලවතිකා නම් ගමෙහි යම් පමණ වස්තු හටගණීද, එය ලොහිච්ච බ්‍රාහ්මණ තෙම තනිවම ප්‍රයෝජන ගන්නේය. අනුන්ට නොදෙන්නේය' මෙසේ කියන්නාවූ ඔහු යම් කෙනෙක් ඔහු නිසා ජීවත් වෙත්ද, ඔවුන්ට ලාභ අන්තරාය කරන්නේ හෝ වේද, නොහොත් ලාභ අන්තරාය නොකරන්නේ හෝ වේද?"

"භවද් ගෞතමයන් වහන්ස, ලාභ අන්තරාය කරන්නේ වේ."

"ලාභ අන්තරාය කරන්නෙක් වූයේම ඔවුන්ගේ හිත වැඩ කැමැත්තේ හෝ වේද, නොහොත් හිත වැඩ නොකමැත්තේ හෝ වේද?"

"භවද් ගෞතමයන් වහන්ස, හිත වැඩ නොකැමැත්තේ වේ."

"හිත වැඩ නොකැමැත්තේ ඔවුන් කෙරෙහි මෛත්‍රී සිත හෝ එළඹ සිටියේ වේද නොහොත් ක්‍රොධ සිත පිහිටියේ වේද?"

"භවද් ගෞතමයන් වහන්ස, ක්‍රොධ සිත පිහිටියේ වේ."

"ක්‍රොධ සිත එළඹ සිටි කල්හි මිථ්‍යාදෘෂ්ටි (වැරදි දැකීම්) ඇත්තේ හෝ වේද? සම්‍යක්දෘෂ්ටි (යහපත් දැකීම්) ඇත්තේ හෝ වේද?"

"භවද් ගෞතමයන් වහන්ස, මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වේ."

"ලොහිච්චය, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහට නිරයට පැමිණීම හෝ තිරිසන් යොනියට පැමිණීම දෙයාකාර ගති අතුරෙන් එක්තරා ගතියක් මම කියමි."

11 "ලොහිච්චය, ඒ කුමකැයි සිතන්නෙහිද? පසේනදි කොසොල් රජ තෙම කසී කොසොල් දෙරටෙහි අධිපතිව වසන්නේ නොවේද?"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"භවද් ගෞතමයන් වහන්ස, එසේය."

"ලොහිච්චය, යමෙක් මෙසේ කියන්නේද? පසේනදි කොසොල් රජතෙම කසී කොසොල් දෙරටෙහි අධිපතිව වාසය කරයි. කසී කොසොල් දෙරටෙහි යම් වස්තුවක් හට ගනීද එය පසේනදි කොසොල් රජතෙම තනිවම ප්‍රයෝජන ගන්නේය. අනුන්ට නොදෙන්නේයයි මෙසේ කියන්නාවූ ඔහු, යම් කෙනෙක් ඒ රජහු නිසා ජීවත්වෙත්ද ඔවුන්ට ලාභ අන්තරාය කරන්නෙ හෝ වේද, නොහොත් ලාභ අන්තරාය නොකරන්නේ හෝ වේද?"

"භවද් ගෞතමයන් වහන්ස, ලාභ අන්තරාය කරන්නේ වේ."

"ලාභ අන්තරාය කරන්නෙක් වූයේ ම ඔවුන්ගේ හිත වැඩ කැමැත්තේ හෝ වේද, හිත වැඩ නොකැමැත්තේ හෝ වේද"

"භවද් ගෞතමයන් වහන්ස, හිත වැඩ නොකැමැත්තේ වේ."

"හිත වැඩ නොකැමැති වූයේ ඔවුන් කෙරෙහි මෛත්‍රී සිත හෝ එළඹ සිටියේ වේද, නොහොත් ක්‍රොධ සිත එළඹ සිටියේ වේද?"

"භවද් ගෞතමයන් වහන්ස, ක්‍රොධ සිත පිහිටියේවේ."

"ක්‍රොධ සිත එළඹ සිටි කල මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ හෝ වේද, නොහොත් සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වේද?"

"භවද් ගෞතමයන් වහන්ස, මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වේ"

"ලොහිච්චය, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහට නිරයට පැමිණීම හෝ තිරිසන් යොනියට පැමිණීම යන දෙයාකාර ගති අතුරෙන් එක්තරා ගතියක් මම කියමි."

12 ලොහිච්චය, මෙතෙකින් යමෙක් මෙසේ කියන්නේද, ලොහිච්ච බ්‍රාහ්මණ තෙම සාලවතිකා නම් ගම අධිපතිව වාසය කරයි. සාලවතිකා නම් ගම හටගන්නා යම් පමණ වස්තුව වේද

එය ලොහිච්ච බ්‍රාහ්මණ තෙම තනිවම ප්‍රයෝජන ගන්නේය. අනුන්ට නොදෙන්නේයයි' මෙසේ කියන්නාවූ ඔහු, යමෙක් ඒ ලොහිච්ච බ්‍රාහ්මණයා නිසා ජීවත් වෙත්ද ඔවුන්ට ලාභ අන්තරාය කරන්නේ වේ. ලාභ අන්තරාය කරන්නෙක් වූයේ හිත වැඩ නොකැමැත්තේ වේ. හිත වැඩ නොකැමැත්තහුට ක්‍රොධ සිත එළඹ සිටියේ වෙයි. ක්‍රොධ සිත එළඹ සිටි කල මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වෙයි.

13 "ලොහිච්චය, ඒ ආකාරයෙන්ම යමෙක් මෙසේ කියන්නේද, (මේ ලොකයෙහි මහණෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ කුශල ධර්මයට පැමිණෙන්නේද කුශල ධර්මයට පැමිණ අනුන්ට එය ප්‍රකාශ නොකරන්නේය. අනිකෙක් අනිකෙකුට කුමක් කරන්නේද? පරණ බැම්මක් කපාදමා වෙන අලුත් බැම්මක් කරන්නේ යම්සේද මේ එවැනි ලාමකවූ ලොභයකැයි කියමි. අනිකෙක් අනිකෙකුට කුමක් කරන්නේද?" කියායි. මෙසේ කියන්නාවූ හෙතෙම යම් කුල පුත්‍රයෝ තථාගතයන් විසින් ප්‍රකාශ කරන ලද ධර්මවිනය ඇති ශාසනයට පැමිණ මෙබඳුවූ මහත්වූ විශෙෂ අවබොධයකට පැමිණෙත්. සෝවාන් ඵලයද අවබොධ කෙරෙත්. සකෘදාගාමි ඵලයද අවබොධ කෙරෙත්. අනාගාමි ඵලයද අවබෝධ කෙරෙත්. අර්හත් ඵලයද අවබොධ කෙරෙත්. යම් කෙනෙක් දෙව්ලොව උපදිනු සඳහා දෙව්ලොව උපදින කුසල්ද දියුණු කරත්. එබඳුවූ ඔවුන්ට අන්තරාය කරන්නේ වෙයි. ඔවුන්ට අන්තරාය කරවූයේ හිත වැඩ නොකැමැත්තේ වේ. හිත වැඩ නොකැමැත්තහුට ක්‍රොධ සිත එළඹ සිටියේ වේ. ක්‍රොධ සිත එළඹ සිටි කල මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වේ. ලොහිච්චය, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහට නිරය ගතිය හෝ තිරිසන් ගතිය යන දෙයාකාර ගති අතුරෙන් එක්තරා ගතියක් මම කියමි.

14 (ලොහිච්චය, මෙතෙකින් යමෙක් මෙසේ කියන්නේද, පසේනදි කොසොල් රජතෙම කසී කොසොල් දෙරටෙහි අධිපතිව වාසය කරයි. කසී කොසොල් දෙරටෙහි යම් වස්තු උත්පත්තියක් ඇද්ද එය පසේනදි කොසොල් රජ තෙම තනිවම ප්‍රයෝජන ගන්නේය. අනුන්ට නොදෙන්නේය.) කියායි. මෙසේ කියන්නාවූ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ඔහු ඔබ හෝ වෙනත් අය හෝ යම් කෙනෙක් ඒ පසේනදි කොසොල් රජු නිසා ජීවත්වෙත්ද, ඔවුන්ට අන්තරාය කරන්නේ වේ. අන්තරාය කරවූයේ හිත වැඩ නොකැමැත්තේ වේ. හිත වැඩ නොකැමැත්තහුට ක්‍රොධ සිත පිහිටියේ වෙයි. ක්‍රොධ සිත් ඇත්තහුට මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වේ.

15 "ලොහිච්චය, එමෙන්ම යමෙක් මෙසේ කියන්නේද "මේ ලොකයෙහි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ කුශල ධර්මයට පැමිණෙන්නේද, කුශල ධර්මයට පැමිණ අනුන්ට එය ප්‍රකාශ නොකරන්නේය. අනිකෙක් අනිකෙකුට කුමක් කරන්නේද, පරණ බැම්මක් කපා දමා වෙන අලුත් බැම්මක් කරන්නේ යම්සේද මේ එවැනි ලාමකවූ ලොභයකැයි කියමි.) මෙසේ කියන්නාවූ හෙතෙම යම් ඒ කුලපුත්‍රයෝ තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද ධර්ම විනය ඇති ශාසනයට පැමිණ මෙබඳුවූ මහත් විශෙෂ අවබොධයකට පැමිණෙත්. සොවාන් ඵලයද අවබොධ කෙරෙත්. සකෘදාගාමි ඵලයද අවබොධ කෙරෙත්. අනාගාමි ඵලයද අවබොධ කෙරෙත්. අර්හත් ඵලයද අවබොධ කෙරෙත්. යම්කෙනෙක් දෙව්ලොව ඉපදීම සඳහා දෙව්ලොව උපදින කුසල්ද දියුණු කරත්. එබඳුවූ ඔවුන්ට අන්තරායක් කරන්නේවේ. අන්තරාය කරන්නේ හිත වැඩ නොකැමැත්තේ වේ. හිත වැඩ නොකැමැත්තහුට ක්‍රොධ සිත එළඹ සිටියේ වෙයි. ක්‍රොධ සිත එළඹ සිටියහුට මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වේ. ලොහිච්චය, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහට නිරය ගතිය හෝ තිරිසන් ගතිය යන දෙයාකාර ගති අතුරෙන් එක්තරා ගතියක් මම කියමි.

16 "ලොහිච්චය, මේ ලෝකයෙහි චොදනාකිරීම සුදුසුවූ (ශාස්තෘවරයෝ) අනුශාසකයෝ තුන්දෙනෙක් ඇත්තාහ. යමෙක් මෙබඳුවූ ශාස්තෘවරයන්ට චොදනා කෙරේද, ඒ චොදනාව ඇත්තක්මය, සැබවක්මය, ධර්මයට එකඟය, නිවරදය, කවර තුන් දෙනෙක්ද? ලොහිච්චය, මේ ලොකයෙහි ඇතැම් අනුශාසකයෙක් යම් ප්‍රයෝජනයක් සඳහා ගිහිගෙන් නික්ම අනගාරික (ගිහි ජීවිතයෙන් තොර) ශාසනයෙහි මහණවේද,

ඔහු විසින් ඒ ශ්‍රමණ භාවයේ ඵලය වන රහත් බව නොලබන ලද්දේ වේද, ඔහු ඒ රහත් බවට නොපැමිණ (ශ්‍රාවකයන්ට) තොපට මේ හිත පිණිසය, තොපට මේ සැප පිණිසයයි ගෝලයින්ට ධර්ම දෙශනා කරයිද, ඔහුගේ ඒ ගෝලයෝ එය නොඅසත්ද, ඒ ධර්මය ඇසීම පිණිස කන් නොනමත්ද, ඒ ධර්මය දැනගැනීම පිණිස සිත එළඹ නොපිහිටුවත්ද, අනුශාසකයාගේ අනුශාසනයෙන් ඉවත්ව පවතිත්ද, ඔහු මෙසේ චෝදනා කටයුතු වන්නේය. 'ආයුෂ්මත්තෙම යම් ප්‍රයෝජනයක් පිණිස ගිහිගෙන් නික්ම අනගාරික ගිහි (ජීවිතයෙන් තොර) ශාසනයෙහි පැවිදිවූයේද, ඔබ විසින් ඒ අර්හත්ඵලය නොලබන ලද්දේය. ඔබ ඒ මහණ අර්ථයට නොපැමිණ තොපට මේ හිත පිණිසය, තොපට මේ සැප පිණිසයයි ගෝලයන්ට ධර්මදෙශනා කෙරෙහිද, ඔබගේ ඒ ගෝලයෝ ඒ ධර්මය නොඅසත්, ඒ ධර්මය ඇසීමට කන් නොනමත්. ඒ ධර්මය දැනගැනීම පිණිස සිත එළඹ නොසිටුවත්, ගුරුවරයාගේ අනුශාසනයෙන් පිටත පවතිත්. යම්සේ අහක්ව යන ස්ත්‍රියක් වෙතට පැමිණෙන්නේ හෝ වේද, යම්සේ පිටිපෑ එකියක් වැළඳගන්නේද මෙයද එවැනිවූ ලාමක ලොභ ධර්මයකැයි කියමි. අනිකෙක් අනිකෙකුට කුමක් කරන්නේද? ලොහිච්චය, මේ ලොකයෙහි චෝදනා කිරීමට සුදුසුවූ ඒ පළමුවෙනි අනුශාසකයායි. යමෙක් මෙවැනි අනුශාසකයාට චෝදනා කෙරේද, ඒ චෝදනාව ඇත්තක්මය, සැබවක්මය, ධර්මයට එකඟද වේ. නිවරදය.

17 "ලොහිච්චය, නැවතද අනිකක් කියමි. මේ ලොකයෙහි සමහර අනුශාසකයෙක් යම් ප්‍රයෝජනයක් සඳහා ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි මහණවේද ඔහු ඒ ප්‍රයෝජනය වන රහත් බවට නොපැමිණියේ වේද, ඔහු ඒ රහත් බවට නොපැමිණ, තොපට මේ හිත පිණිසය. තොපට මේ සැප පිණිසයයි ගෝලයින්ට ධර්ම දෙශනා කෙරෙයිද ඒ ගෝලයෝ ඔහුගේ ධර්මය අසත්ද, ඒ ධර්මය දැනගැනීම පිණිස කන් නමත්ද, ඒ ධර්මය දැනගැනීමට සිත් එළඹ සිටුවත්ද? ගුරුවරයාගේ අනුශාසනයෙන් පිටත නොපවතිත්ද, ඔහු මෙසේ චෝදනා

කටයුතු වන්නේය. ආයුෂ්මත් තෙම යම් අර්හත්ඵල ලාභයක් පිණිස ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි මහණවූයේ ඔබ විසින් ඒ රහත් බව නොලබන ලද්දේය. ඔබ රහත් බවට නොපැමිණ තොපට මේ හිත පිණිසය, තොපට මේ සැප පිණිසයයි ගෝලයින්ට ධර්ම දෙශනා කෙරෙහිද, ඒ ගෝලයෝ ඔබගේ ධර්මය අසත්ද, කන් නමත්ද, ඒ ධර්මය දැනගැනීම පිණිස සිත එළඹ සිටුවත්ද? ඒ ගුරුවරයාගේ අනුශාසනයෙන් පිටත නොපවතිත්ද, තමන්ගේ කුඹුර හැර අනුන්ගේ කුඹුරක් පිරිසිදු කළයුතුයයි යම්සේ හඟින්නේද මේ එවැනි ලාමකවූ ලොභ ධර්මයකැයි කියමි. අනිකෙක් අනිකෙකුට කුමක් කරන්නේද? ලොහිච්චය, යමෙක් මේ ලොකයෙහි චෝදනා කිරීමට සුදුස්සෙක් වේද, මේ දක්වන ලද්දේ ඒ චෝදනාවට සුදුසුවූ දෙවෙනි අනුශාසකයායි. යමෙක් මෙබඳු අනුශාසකයෙකුට චෝදනා කෙරේද, ඒ චෝදනාව ඇත්තක්මය, සැබෑවක්මය, ධර්මයට එකඟවේ, නිවරදය.

18 "ලොහිච්චය, නැවතද අනිකක් කියමි. මේ ලොකයෙහි සමහර ගුරුවරයෙක් යම් අර්හත්ඵල ලාභයක් පිණිස ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි මහණවූයේ ඔහු ඒ ප්‍රයෝජනය වන රහත් බවට පැමිණියේ වේද, ඔහු ඒ රහත් බවට පැමිණ, "තොපට මේ හිත පිණිසය, තොපට මේ සැප පිණිසයයි" ගෝලයින්ට ධර්මදෙශනා කෙරෙයිද, ඒ ගෝලයෝ ඔහුගේ ධර්මය නොඅසත්ද, ඒ ධර්මය දැනගැනීම පිණිස කන් නොනමත්ද, ඒ ධර්මය දැනගැනීමට සිත් එළඹ නොසිටුවත්ද, ගුරුවරයාගේ අනුශාසනයෙන් පිටත පවතිත්ද ඔහු මෙසේ චොදනා කටයුතු වන්නේය. ආයුෂ්මත්තෙම යම් අර්හත්ඵල ලාභයක් පිණිස ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි මහණ වූයේද ඔබ විසින් ඒ රහත් බව ලබන ලද්දේය. ඔබ ඒ රහත් බවට පැමිණ, තොපට මේ හිත පිණිසය, තොපට මේ සැප පිණිසය'යි ගෝලයින්ට ධර්ම දෙශනා කෙරෙහිද, ඒ ගෝලයෝ ඔබගේ ඒ ධර්මය නොඅසත්ද, කන් නොනමත්ද, ඒ ධර්මය දැනගැනීම පිණිස සිත එළඹ සිටුවත්ද, ගුරුවරයාගේ අනුශාසනයෙන් පිටත පවතිත්ද, පරණ බැම්මක් කපා දමා

වෙනත් අලුත් බැම්මක් කරන්නේ යම්සේද, මේ එවැනි ලාමකවූ ලොභ ධර්මයකැයි කියමි. අනිකෙක් අනිකෙකුට කුමක් කරන්නේද? ලොහිච්චය, ලොකයෙහි යමෙක් චොදනා කිරීමට සුදුසුවේද, මේ දක්වන ලද්දේ එසේ චෝදනා කිරීමට සුදුසු ඒ තුන්වෙනි අනුශාසකායයි. යමෙක් මෙවැනි ගුරුවරයාට චොදනා කෙරේද, ඒ චෝදනාව ඇත්තක්මය, සැබෑවක්මය, ධර්මයට එකඟවේ, නිවරදය.

"ලොහිච්චය, මොවුන් තුන්දෙනා ලොකයෙහි චොදනා කිරීමට සුදුසු අනුශාසකයෝ වෙත්. යමෙක් මෙවැනි ගුරුවරයන්ට චොදනා කෙරේද, ඒ චොදනාව ඇත්තක්මය, සැබැවක්මය, ධර්මයට එකඟවේ. නිවරදය.

**19** මෙසේ කී කල ලොහිච්ච බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ දැනුම් දුන්නේය. "භවද් ගෞතමයන් වහන්ස, ලොකයෙහි යමෙක් චොදනා කිරීමට නුසුදුසු වේද, එවැනි කිසියම් ගුරුවරයෙක් ඇත්තේද?"

"ලොහිච්චය, ලොකයෙහි යමෙක් චොදනා කිරීමට නුසුදුසු වේද එවැනි ගුරුවරයෙක් ඇත්තේමය."

"භවද් ගෞතමයන් වහන්ස, ලොකයෙහි යමෙක් චොදනා කිරීමට නුසුදුසුවේද, ඒ ගුරුවරයා නම් කවුද?"

"ලොහිච්චය, (අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, විදර්ශනාඥාන ආදී විද්‍යා අට සීල සංවරය ආදී හසුරුවන ධර්ම පහළව යන අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් යුක්තවූ, යහපත් ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දන්නාවූ, ශ්‍රෙෂ්ඨවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනිවූ, දෙවි මිනිසුන්ට ගුරුවරයෙක්වූ (චතුරාර්‍ය්‍ය සත්‍ය) සත්‍යවූ උතුම් ධර්මසතර අවබොධකළාවූ, තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිතවූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ රජුන් හා මිනිසුන් සහිතවූ, සත්ත්ව වර්ගයා ස්වකීය උසස් ඥානයෙන් දැන පැහැදිලි කොට ප්‍රකාශ කෙරේ. ඒ තථාගතයන්වහන්සේ මුල යහපත්වූ, මැද

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යහපත්වූ, කෙළවර යහපත්වූ, අර්ථ සහිතවූ, දස ආකාරයෙන් නියම විදියට වචන ශබ්ද කරන්නාවූ (ව්‍යඤ්ජන සහිත) සියලු ලෙසින් සම්පූර්ණවූ, පිරිසිදුවූ සියලු ශාසනමාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව ගෙන හැර දක්වති.

**20** ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයි. ඔහු ඒ දහම අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කෙරෙයි. ඔහු ඒ ශ්‍රද්ධාවෙන් යුක්තවූයේ මෙසේ සලකන්නේය. ගෘහවාසය පීඩා සහිතයි. රාගාදී කෙලෙස් සහිත මාර්ගයෙකි. මහණකම වනාහි කිසිවක් නොමැති අවකාශය මෙන් නිදහස්ය. ගිහිගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ, ලියවූ හක්ගෙඩියක් වැනිවූ මෙම බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්ට නොහැක්කේය. මම කෙස් දැළිරැවුලු කපා දමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වන්නෙම් ඉතා යහපතැයි කියායි.

"ඔහු පසු කාලයක ස්වල්පවූ හෝ බොහෝවූ හෝ සම්පත් රාශිය හැර, ස්වල්පවූ හෝ බොහෝවූ නෑපිරිස් හැර, කෙස් දැළිරැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණවේ. මෙසේ මහණවූ ඔහු ප්‍රධාන සංවර සීලයෙන් යුක්ත වූයේ, යහපත් හැසිරීමෙන් හා වරද නැති පැවැත්මෙන් යුක්ත වූයේ ස්වල්පවූත් අකුසලයන්හි විශෙෂයෙන් භය දක්නා ගති ඇත්තෙකුවූයේ, යහපත්වූ ශරීරයෙන් වචනයෙන් ක්‍රියාවෙන් යුක්තවූයේ, ශික්ෂාපද සමාදන්ව එහි මොනවට හික්මෙයි. පිරිසිදුවූ ජීවිත පැවැතුම් ඇත්තේ වෙයි. ශීලයෙන් යුක්ත වූයේ වෙයි, ඉන්ද්‍රියයන්හි වැසූ දොරටු ඇත්තේ වෙයි, කෑමෙහි පමණ දන්නේ වෙයි, යහපත් සිහියෙන් හා නුවණින් යුක්තවූයේ වෙයි, සන්තෝෂයෙන් යුක්ත වෙයි.

**21** ලොහිච්චය, භික්ෂුනමක් කෙසේ නම් සීලසම්පන්න වේද? ලොහිච්චය, මේ සස්නෙහිවූ භික්ෂුනමක් ප්‍රාණවධය හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, බහා තබන ලද දඬු ඇත්තේ බහා තබන ලද ආයුධ ඇත්තේ, පව් කිරීමෙහි ලජ්ජාඇත්තේ

කරුණාවන්තවූයේ. සියලු ප්‍රාණීන් කෙරෙහි හිත අනුකම්පාව ඇතුව වාසය කෙරේ. මෙයද ඔහුගේ සීලයක්වේ. නොදුන්දෙය ගැනීමෙන් වෙන්ව, එයින් සම්පූර්ණයෙන් වැළැක්කේ, දුන් දෙයම ගන්නේ, දුන් දෙයම කැමතිවන්නේ. සොරනොවූ පිරිසිදුවූ සිතින් යුක්තව වාසය කෙරේ. මෙයද ඔහුගේ සීලයකි. අබ්‍රහ්මචරියාව හැර උතුම් පැවතුම් ඇත්තේ ස්ත්‍රී පුරුෂ සංසර්ගය නම්වූ ග්‍රාම ධර්මයෙන් වෙන්වූයේ බ්‍රහ්මචාරීවේ. මෙයද ඔහුගේ සීලයෙකි. බොරු කීමෙන් දුරුව, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ සැබෑ තෙපුල් කියන්නේ, සැබවින් සැබව ගළපන ගතිඇතුව ස්ථිර කථා ඇත්තේ, ඇදහිය යුතු වචන ඇත්තේ ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකෙරේ. මෙයද ඔහුගේ සීලයෙකි. පිසුණු බස් හැර, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, මෙතැනින් අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන ගති ඇත්තේද, එතැනින් අසා මොවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන ගති ඇත්තේද, මෙසේ භෙදවූවන් ගළපන්නේ සමගිවූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ. සමගියෙහි ඇලුම් බහුලකොට ඇත්තේ, සමගිකම්හි ඇලුනේ, සමගිකම්හි සතුටුවන ගති ඇත්තේ සමගිය ඇති කරණ තෙපුල් කියන්නේය. මෙයද ඔහුගේ සීලයෙකි. ඵරුෂ වචනය හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ යම් වචනයක් නිදොස් වේද, කනට සැපද, ප්‍රෙමණීයද, සතුටු කරයිද, යහපත්ද, බොහෝදෙනාට ප්‍රියද, බොහෝදෙනාගේ හිත් ප්‍රියකරන්නේද, එබඳු වචනම කියන්නේ වේ. මෙයද ඔහුගේ එක් සීලයෙකි. හිස් ප්‍රලාප කථා හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, කාලයට සුදුසු කථා කරන්නේ. සිදුවූ තෙපුල්ම කියන්නේ, අර්ථයෙන් යුක්තවූ, ධර්මයෙන් යුක්ත විනය සම්බන්ධවූ තෙපුල් කියන්නේ, සුදුසු කල්හි, උපමා හා කරුණු සහිතවූ, සීමා ඇති, අර්ථයෙන් යුත් නිධානයක් මෙන් සිතෙහි තැබියයුතු වචන කියන්නේවේ. මෙසේ ඒ හිස් කථාවෙන් වැළැක්කේද දියුණුවට හේතුවන වචන කියන්නේද, මෙයද ඔහුගේ සීලයෙකි.

"තණ, ගස්, වැල්, සිඳීම් බිඳීම් ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන කෑම ඇත්තේ, රාත්‍රිකෑමෙන්

හා අවේලේ කෑමෙන් සම්පූර්ණයෙන් වැළැක්කේය, නැටීම්, ගීකීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය, මල්, ගඳ විලවුන් පැළඳීම්, ඉන් සැරසීම, අඩුතැන් පිරවීමෙන් අලංකාර කිරීම යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළැක්කේය. රන් රිදී මසුරන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් වැළැක්කේය. අමුවූ ධාන්‍ය වර්ග පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේ, අමුමස් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද ස්ත්‍රීන් හා ගෑනුලමයින් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොර වූයේදවේ. වැඩකරුවන් වැඩකාරියන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේ, එළුවන් හා තිරළුවන් පිළිගැනීමෙන් තොර වූයේ, කුකුළන්, හූරන්, ඇතුන්, ගවයන්, අසුන්, වෙළඹුන්, කෙත්, වත්, යන මේ පිළිගැන්මෙන්ද, සම්පූර්ණයෙන් තොර වූයේය. ගිහීන්ගේ දූත මෙහෙවරය, ගෙන්ගෙට යන මහත් මෙහෙවරය යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. ගනුදෙනු කිරීමය, තරාදි ආදියෙන් වඤ්චාකිරීමය. රන් හා නොරන් මිශ්‍ර වඤ්චාකිරීමය, වී ආදිය මැණීමෙන් වඤ්චා කිරීමය, හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදී ලොහ රන් රිදීයයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයොගය යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. කැපීමය, මැරීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැරගැන්මය, ගම් නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාරකමින් වස්තු පැහැරගැන්මය යන මෙයින්ද සම්පූර්ණයෙන් වැළැක්කේය, මෙයද ඔහුගේ සීලයක් වේ.

**22** "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මූලබීජය. ඛන්ධබීජය, ඵලබීජය, දලුබීජය, පස්වැනිවූ බීජබීජය යන මේ ගස් ආදිය වැවීමෙහි යෙදී වාසය කරත්. මෙබඳුවූ බීජගාම භූතගාමයන් සිඳීම් බිඳීම් ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේනම් මෙයද ඔහුගේ එක් සීලයක් වේ.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා ආහාර වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයෝජන ගැන්මය,

බීම වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයෝජන ගැන්මය, නොඉටන ලද (අයිතියට නොගත්) සිවුරු ආදිය, යාන සංඛ්‍යාත වහන් දෙකකින් වැඩි සයන, සුගන්ධයන්, තල සහල් ආදිය තැන්පත්කොට තබා ප්‍රයෝජන ගැන්මයයි කියන ලද පසුවට තබා ප්‍රයෝජන ගැන්මෙහි යෙදී වාසය කරත්. මෙබඳුවූ සන්නිධිකාර පරිභොගයෙන් වැළකී වෙසේ. මෙයද ඔහුගේ සීලයකි.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා නැටීමය, ගී කීමය, බෙර ආදිය වැයීමය, රඟමඬුලු සැරසීමය, වැඩක් නැති කථා ඇසීමය, කයිතාලම් හා අත්ලෙන් අත්ල ගැසීමය, මන්ත්‍ර පිරවීමෙන් මළමිණී නැංවීමය, සතරැස් හෝ කළ බෙර ගැසීමය, ශොභන චිත්‍ර විචිත්‍රය, සණදොවුන් කෙළිය. හුණගස් ඔසවා නැටීමය, මිනීඇට සෝදා තැබීමය, ඇතුන් හා පොරය, අශ්වයින් යොදා පොරය, මීවුන් හා පොරය, ගවයින් හා පොරය, එළුපොරය, මෙණ්ඩක එළුපොරය, කුකුළු පොරය, වටුපොරය, දඬු (පොලු) පොරය, තොරතුරු ඇනීමය, මල්ලව යුද්ධය, යුද්ධය, ඇත් අස් ආදිය දැකීමය යන විකාර දර්ශනයෙහි යෙදී වාසය කරත්. මෙසේ මෙබඳු විසුලු දැක්මෙන් සම්පූර්ණයෙන් වැළකේ. මෙයද ඔහුගේ සීලයකි.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා දූ පෝරු ආදියෙහි කෙළීම්වූ ක්‍රීඩාවය. දශපද ක්‍රීඩාවය, දූ පෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි ක්‍රීඩාකිරීමය, බිම මණ්ඩල වශයෙන් සාදා පැන පැන ක්‍රීඩා කිරීමය, දූ කැට නොසොල්වා තියෙන් ගසා ක්‍රීඩා කිරීමය, දාදු කෙළීමය, සිං කෙළීමය, භිත්ති ආදියෙහි ඉරටමිටි ගසා ඇත් අස් ආදී රූප දක්වා කෙළීමය, පන්දු කෙළීමය, නලා පිඹීමය, ක්‍රීඩා නගුල් ගෙන සෙල්ලම් සීසෑම්ය, කරනම් ගැසීමය, තල්පත් ආදියෙන් කන්නන් ගුරුවා තනා ක්‍රීඩා කිරීමය, කොළ නැළියෙන් වැලි ආදිය මැන කෙළීමය, කුඩා රථයෙන් කෙළීමය, කුඩා දුන්නෙන් කෙළීමය, අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ඇඳ කෙළීමය, සිතූ දේ කියවීම් කීම් ආදියෙන් කෙළීමය, ඒ ඒ දෝෂ රූප දක්වා කෙළීමය, යන

මෙබඳුවූ ප්‍රමාදයට කාරණාවූ දූ කෙළීමෙහි යෙදී වාසය කෙරෙත්. මෙසේ මෙබඳුවූ දූ කෙළියෙන් සම්පූර්ණයෙන් වළකියි. මෙයද ඔහුගේ සීලයකි.

23 "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා දික්සඟලා පුටුය, පලස්ය, සතරඟුලෙන් දිග ලොම් ඇතිරිය, විසිතුරු එළුලොම් ඇතිරිය, එළුලොම් සුදු ඇතිරිය, එළුලොමින් කළ ඉදිරියට නෙරූ මල් ඇති ඇතිරිය, සිංහාදි රූපයෙන් විසිතුරු එළුලොම් ඇතිරිය, එක් පිට ලොම් ඇති ඇතිරිය, දෙපිට ලොම් ඇති එළුලොම් ඇතිරිය, රත්රන් නූලෙන් කළ පට ඇතිරිලිය, එක්විට නැට්ටුක්කාරියන්දහසය දෙනෙක් නටනා එළුලොමින් කළාවූ මහඇතිරිය, ඇතුන්පිට අතුරන ඇතිරිය, අසුන්පිට අතුරණ ඇතිරිය, රථපිට අතුරණ ඇතිරිය, අඳුන්දිවි සමින් කළ ඇතිරිය, කෙසෙල් මුව සමින් කළ උතුම් ඇතිරිය, දෙපස තබන ලද රතුපාට කොට්ට ඇති ආසනය, යන මෙබඳු උස් අසුන් පාවිච්චි කෙරෙත්. මෙසේ මෙබඳුවූ උස් අසුන් මහඅසුන්හි හිඳීම් ආදියෙන් වළකියි. මෙයද ඔහුගේ සීලයකි.

"එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ඇඟ ඉලීමය, පිරිමැදීමය, නැවීමය, මැඩීමය, මූනබලන කන්නාඩි, අඳුන්, තෙල් හා සුවඳ පාවිච්චිය මූණේ ගානා සුවඳ කුඩු, මූණේගානා සුවඳ ද්‍රව්‍ය, අත්වල බඳින ආභරණ යන මේ දේ දැරීම හා පැළඳීමය, රත්රන් නූල් ආදියෙන් කුඩුම්බි බැඳීමය, විසිතුරු දඬුගෙන හැසිරීමය, බෙහෙත් නල එල්වාගෙන ඇවිදීමය, කඩු විසිතුරු කුඩ ගෙනයෑම, විසිතුරු සෙරෙප්පු හෝ සපත්තු පයලා ඇවිදීමය, නලල්පට බැඳීමය, කොණ්ඩා මාණික්‍ය පැළඳීමය, අවන් දැරීමය, දික්වූ දහවලු ඇති සුදුරෙදි ඇඳීමයයි මෙසේවූ සැරසීම් හා අඩුතැන් පිරවීමෙහි නිතර නිතර යෙදෙත්. මෙබඳුවූ සැරසීම් අලංකාර කිරීම් ආදියෙහි යෙදීමෙන් සම්පූර්ණයෙන් වළකියි. මෙයද ඔහුගේ සීලයකි.

24 "එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ කථාය, මහඇමතියන් පිළිබඳ කථාය, සේනා පිළිබඳ කථාය, භය පිළිබඳ

කථාය, යුද පිළිබඳ කථාය, ආහාර පිළිබඳ කථාය, පානවර්ග පිළිබඳ කථාය, ඇඳුම් පිළිබඳ කථාය, ඇඳන් පිළිබඳ කථාය, මාලා පිළිබඳ කථාය, ගන්ධ ද්‍රව්‍යයන් පිළිබඳ කථාය, නෑයන් පිළිබඳ කථාය, රථ පිළිබඳ කථාය, ගම් පිළිබඳ කථාය, නියම්ගම් පිළිබඳ කථාය, නුවර පිළිබඳ කථාය, දනව් පිළිබඳ කථාය, ස්ත්‍රීන් පිළිබඳ කථාය, පුරුෂයන් පිළිබඳ කථාය, ගෑනු දරුවන් පිරිමි දරුවන් පිළිබඳ කථාය, යෝධයන් පිළිබඳ කථාය, වීථි පිළිබඳ කථාය, වතුර ගෙන යන දාසීන් හෝ වතුර ගෙන යන තැන් හෝ පිළිබඳ කථාය, මළ නෑයන් යන ආදීන් පිළිබඳ කථාය, නොයෙක් ආකාරවූ තේරුම් නැති කථාය, ලොකය පිළිබඳ කථාය, මුහුද පිළිබඳ කථාය, භවාභව කථාය යන මෙබඳු පහත් කථාවෙහි යෙදී වෙසෙත්. මෙබඳුවූ පහත් කථාවෙන් සම්පූර්ණයෙන් වළකියි. මෙයද ඔහුගේ සීලයකි.

**25** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා 'ඔබ මේ ධර්මවිනය නොදන්නෙහිය, මම මේ ධර්මවිනය දනිමි.' 'ඔබ මේ ධර්මවිනය කුමකැයි දන්නෙහිද? ඔබ වරදවා පිළිපදින්නෙහිය, මම මනාකොට පිළිපදින්නේ වෙමි.' මාගේ වචන යහපත්ය හෝ අර්ථ සහිතය, ඔබගේ වචන අර්ථ රහිතය.' 'පළමු කියයුත්ත පසුව කීයෙහිය, පසුව කිය යුත්ත පළමුව කීයෙහිය. යමක් ඔබ බොහෝ කල් පුරුදුකරණ ලද නම් ඒ සියල්ල නිෂ්ඵල විය, ඔබට වාදාරොපණය කරණ ලදී. නින්දා කරණ ලද්දෙහිය. වාදයෙන් මිදෙනු පිණිස ක්‍රියා කරව. ඉදින් හැක්කෙහි නම් වාදයෙන් ගැළවේ' යන ආදී දොෂාරොපණ කථාවෙහි යෙදී වෙසෙත්. මෙසේ මෙබඳු දොෂාරොපණ කථාවෙන් සම්පූර්ණයෙන් වළකින්නේය, මෙයද ඔහුගේ සීලයකි.

**26** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා රජුන්ගේ, රජ මහ ඇමතියන්ගේ, ක්ෂත්‍රියයන්ගේ, බමුණන්ගේ, ගෘහපතියන්ගේ සහ කුමරුන්ගේ හසුන් ගෙණ, 'මෙතනින් අසවල් තැනට යව අසවල් තැනින් මෙහි එව, මෙය ගෙණ යව. එතැනින් අසවල් දෙය ගෙණෙව'යි දූතභාවයෙහි හා හසුන් ගෙණ යෑමෙහි යෙදී වෙසෙත්. මෙබඳු දූතභාවය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

හසුන් ගෙණයෑම යන මෙයින් වළකින්නේය. මෙයද ඒ ඔහුගේ සීලයකි.

27 "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා කුහකයෝද, සිව්පසය උදෙසා කථා කරන්නෝද, නිමිති කරන්නෝද නොහොත් ලාභ සත්කාර සඳහන් කරවන්නෝද, පරලාභාදිය උදෙසා කියන්නෝද, ලාභයකින් ලාභයක් සොයන්නෝද වෙත්. මෙබඳුවූ කුහක වංචා ප්‍රයෝග ආදියෙන් වළකියිද මෙයද ඔහුගේ සීලයකි."

28 "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා සාමුද්‍රිකා ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, හෙනගැසීම ආදී මහ නිමිතිබලා කියන ශාස්ත්‍රය, ස්වප්න ශාස්ත්‍රය, ලක්ෂණ ශාස්ත්‍රය, මීයන්කැපූ වස්ත්‍රාදිය බලා කියන ශාස්ත්‍රය, ගිනි දෙවියො පිදීමය, දබ්බිහොමය, ථුස හොමය, තණ්ඩුල හොමය, කණ හොමය, සප්පි හොමය, තෙල හොමය, මුඛ හොමය, ලේ හොමය, ශරීර විද්‍යා, වාස්තු විද්‍යා, නීති ශාස්ත්‍රය, සොහොනෙහි ශාන්ති කරන්නාවූ විද්‍යා, භූත විද්‍යා, නාග විද්‍යා, විෂ විද්‍යා, ගෝනුසු විද්‍යා, මී විද්‍යා, කුරුලු විද්‍යා, කපුටු විද්‍යා, ජීවිත කාලය කීම, ආයුධ වැළැක්වීම, තිරිසන් සතුන්ගේ ශබ්ද දැනීම වශයෙන් පැවති මන්ත්‍රය යන පහත් විද්‍යා හේතුකොට ගෙන වැරදි ජීවිතයෙන් ජීවිකා කෙරෙත්. මෙසේ මෙබඳු පහත් විද්‍යා හෙතුවෙන් කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේද මෙයද ඔහුගේ සීලයකි.

29 "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා මණි ලක්ෂණය, වස්ත්‍ර ලක්ෂණය, දණ්ඩ ලක්ෂණය, කඩු ලක්ෂණය, දුනු ලක්ෂණය, ආයුධ ලක්ෂණය, ස්ත්‍රී ලක්ෂණය, පුරුෂ ලක්ෂණය, පිරිමිදරු ලක්ෂණය, ගෑනුදරු ලක්ෂණය, දාස ලක්ෂණය, දාසී ලක්ෂණය, ඇත් ලක්ෂණය, අශ්ව ලක්ෂණය, කැස්බා ලක්ෂණය, එළු ලක්ෂණය, මීහරක් ලක්ෂණය, ගව ලක්ෂණය, ලොකු එළු ලක්ෂණය, කුකුළු ලක්ෂණය, වටු ලක්ෂණය, තලගොයි ලක්ෂණය, කර්ණිකා ලක්ෂණය, මුව ලක්ෂණයයි, මෙබඳු පහත් විද්‍යාවන් කරණ

කොට ගෙණ වැරදි ජීවිකාව කෙරෙත්. මෙසේවූ පහත් විද්‍යාවන් නිසා කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේද මෙයද ඔහුගේ සීලයකි.

30 "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා අසවල් දිනට රජුන්ගේ බැහැරයෑම වන්නේය. අසවල් දින ඇතුළු නුවරට එන්නේය. අසවල් දින ඇතුළු නුවර රජුන් වෙත පැමිණීම වන්නේය. බැහැර රජුන්ගේ බැහැරට යෑම වන්නේය. බැහැර රජුන්ගේ ඇතුළු නුවරට ඊම වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ ආපසු යෑම වන්නේය. ඇතුළු නුවර රජුන්ට ජය වන්නේය. බැහැර රජුන්ගේ පරාජය වන්නේය. බැහැර රජුන්ගේ ජය වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ පරාජය වන්නේය. මෙසේ මොහුට ජය වන්නේය. මෙසේ පරාජය වන්නේයයි කියා මෙසේ පහත් විද්‍යා හෙතුකොට ලාමක ජීවිකා කෙරෙත්. මෙබඳුවූ පහත් විද්‍යා හෙතුවෙන් කරණ වැරදි ජීවිතයෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ සීලයක් වේ.

31 "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා චන්ද්‍රග්‍රහණය වන්නේය, සූර්යග්‍රහණය වන්නේය, තාරකා සමාගමය වන්නේය, සඳහිරු දෙදෙනාගේ නියම මාර්ග ගමන වන්නේය, සඳ හිරු දෙදෙනාගේ නොමඟ යෑම වන්නේය, තාරකාවන්ගේ මාර්ග ගමන වන්නේය, තාරකාවන්ගේ නොමඟ යෑම වන්නේය, උල්කාපාතය වන්නේය, දිසා දැවීම වන්නේය, පොළොව කම්පාව වන්නේය, අහස ගිගුරුම් වන්නේය, සඳ හිරු තාරකාවන්ගේ නැඟීම හා බැසීමද කෙළෙසීමද පිරිසිදු වීමද වන්නේය, චන්ද්‍රග්‍රහණය මෙබඳු විපාක ඇතිවන්නේය, සූයර්‍යග්‍රහණය මෙබඳු විපාක ඇති වන්නේය, තාරකා සමාගමය මෙබඳු විපාක ඇතිවන්නේය, චන්ද්‍ර සූයර්‍යයන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳු විපාක ඇති වන්නේය, ඔවුන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇති වන්නේය, තාරකාවන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, තාරාකාවන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, උල්කාපාතය මෙබඳු විපාක

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇතිවන්නේය, දිගුන් දැවීම මෙබඳු විපාක ඇතිවන්නේය, භූමි කම්පාව මෙබඳු විපාක ඇතිවන්නේය, අහස් ගිගුම මෙබඳු විපාක ඇති වන්නේය, සඳ හිරු තාරකාවන්ගේ නැඟීම, බැසීම, කිලිටු වීම හා පිරිසිදු වීම මෙබඳු විපාක ඇතිවන්නේයයි කියා මෙසේ පහත් විද්‍යා හෙතුවෙන් කරණ වැරදි ජීවිකාවෙන් ජීවිකා කෙරෙත්. මෙසේවූ පහත් විද්‍යා හෙතුකොට ගෙණ කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ සීලයකි.

32 "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා මනා වැසි ඇතිවන්නේය, මනා වැසි නැතිවන්නේය, යහපත් ආහාරපාන ඇතිවන්නේය, ආහාරපාන නැති වන්නේය, නිර්භය ඇතිවන්නේය, භය ඇතිවන්නේය, රොග ඇතිවන්නේය, නිරෝගී බව ඇතිවන්නේයයි කීමද, ඇඟිල්ල ඇල්ලීමය, ගණන්කිරීමය, කොටස්කර ගණන්කිරීමය, කාව්‍ය කිරීමය, ලෝකයට සිදුවන දේ ගැන ශාස්ත්‍ර ඉගෙණීමයයි මෙසේ පහත් විද්‍යාවන් කරණකොට වැරදි ජීවිකා කෙරෙත්. මෙසේවූ පහත් විද්‍යා හෙතුවෙන් වන වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ සීලයකි.

33 "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා අවාහ කරවීමය, විවාහ කරවීමය, සමගිය පිළිබඳ කථාකිරීමය, වියොගය පිළිබඳ කථාකිරීමය, ධන රැස් කිරීමය, වියදම් කිරීමය, යහපත් ශ්‍රියාව ඇතිකිරීමය, දුර්භගකරණය, ගර්භවිරොධි කරණය, දිව තද කිරීමය, නූල්බැඳීමය, අත් පෙරළිම පිණිස මන්ත්‍ර ජපකිරීමය, ශබ්ද නොඇසීම පිණිස මන්ත්‍ර ජපකිරීමය, කැඩපත්හි දෙවතාරොපණයකොට ප්‍රශ්න ඇසීමය, ගෑනුදරුවන්ගේ ශරීරයෙහි දෙවතාරොපණය කොට ප්‍රශ්න ඇසීමය, දෙවදාසියගේ ශරීරයෙහි යකුන් ආරොපණයකොට ප්‍රශ්න ඇසීමය, හිරු වැඳීමය, මහබඹුට උපස්ථාන හෝ වැඳුම් කිරීමය. කටින් ගිනිදැල් පිට කිරීමය, ශ්‍රී දෙවිය කැඳවීමයයි කියන මෙබඳු පහත් විද්‍යාවෙන් වැරදි ජීවිකා කෙරෙත්. මෙබඳුවූ පහත් විජ්ජාවෙන් කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ සීලයකි.

34 "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ශාන්ති කිරීමය, කාය්‍ය සමෘද්ධි කටයුතු කර්මය, මන්ත්‍ර කිරීමය, භූරි කර්මය, පණ්ඩකයා පුරුෂයකු කිරීමය, පුරුෂයා පණ්ඩක කිරීමය, ගෙවල් නොකළ බිම් ගෙවල් කිරීමය, ගෙට සුදුසු තැන බලිකම් විධානය, දියෙන් මූන සුද්ධ කිරීමය, නැහැවීමය, ගිනි පිදීමය, වමන කරවීමය, විරේක කරවීමය, උඩු කය විරේකය, යටිකය වීරේකය, හිස විරේකය, කන්තෙලය, ඇස් බෙහෙත් ගැල්වීමය, නස්‍ය කිරීමය, අඳුන් ගෑමය, සිසිල් බෙහෙත් අඳුන් සෑදීමය, ආයුධ කටු ගසා කරන වෙදකමය, ශල්‍යකර්මය, ළදරුවන් පිළිබඳ වෙදකමය, මූලික බෙහෙත් දීමය, සැර බෙහෙත් දී පසුව එහි බල හැරීමය කියා හෝ මෙබඳු පහත් විද්‍යා කරණකොට වැරදි ජීවිත්වීමෙන් ජීවිකා කෙරෙත්. මෙබඳුවූ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ සීලයකි.

35 "ලොහිච්චය, මෙසේ සීලසම්පන්නවූ භික්ෂුහට භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ඔහුගේ සීලසංවරය හෙතුකොටගෙණ කිසිතැනකදී නොඋපදනේය. කුමක් මෙන්ද යත්:- ලොහිච්චය, ක්ෂත්‍රියාභිෂෙකයෙන් මුදුනෙහි අභිෂෙක ලද්දාවූ, සතුරන් නැති කළාවූ ක්ෂත්‍රිය රජෙක් කිසියම් සතුරෙකුගෙන් කිසි භයක් නොදක්නේද, එපරිද්දෙන්ම ලොහිච්චය, සීලසම්පන්නවූ භික්ෂුතෙමේ භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු සීලසංවරය හෙතුකොට කිසි තැනකදී නොදක්නේය. ආය්‍යවූ (උතුම්වූ) මේ සීල රාශියෙන් යුක්තවූ ඒ භික්ෂුතෙම තමන්තුළ පිරිසිදුවූ (කායික චෛතසික) සැපය විඳියි. ලොහිච්චය මෙසේ දැක්වූ ශීලයෙන් යුක්තවූ භික්ෂුව සීලසම්පන්න නම් වේ.

36 ලොහිච්චය, භික්ෂුව කෙසේ නම් ඉන්ද්‍රියයන්හි වැසූ දොරටු ඇත්තේද? ලොහිච්චය, මේ සස්නෙහි භික්ෂුතෙමේ ඇසින් රූපයක් දැක එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. ඇස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කිපීම ආදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින්

වැළකීම පිණිස ඔහු පිළිපදී. ඔහු තමාගේ ඇස් ඉන්ද්‍රියය රකී. ඇස්ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කණින් ශබ්දයක් අසා එහි නො ඇලේ. එහි නොපෙළඹෙන්නේය. කන් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කිපීමාදි අකුශල ධර්මයෝ හිතට ඇතුල් වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ කන් ඉන්ද්‍රියය රකී. කන් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. නාසයට ගඳ සුවඳ දැනී එහි නො ඇලේ. එහි නොපෙළඹෙන්නේය. නාස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කිපීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ නාස් ඉන්ද්‍රියය රකී. නාස් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. දිවෙන් රසයක් විඳ එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. දිව් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කිපීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල් වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ දිව් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කයින් ස්පර්ශයක් ස්පර්ශකොට එහි නො ඇලේ. එහි නොපෙළඹෙන්නේය. ශරීර ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කිපීම ආදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ ශරීර ඉන්ද්‍රියය රකී. ශරීර ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. සිතින් (ධර්මයක්) අරමුණක් දැන එහි නො ඇලේ. එහි නොපෙළඹෙන්නේය. සිත් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් නිසා දැඩි ආසාව හා කෝපය ආදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. හෙතෙම සිත් ඉන්ද්‍රිය රකී. සිත් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. එබඳුවූ භික්ෂුව උතුම්වූ ශීලරාශියෙන් යුක්තවූයේ අභ්‍යන්තරයෙහි පිරිසිදුවූ අධිචිත්ත සැපය විඳියි. ලොහිච්චය, මෙසේවූ භික්ෂුතෙමේ ඉන්ද්‍රියයන්හි වසන ලද දොරටු ඇත්තේ වේ.

37 "ලොහිච්චය, භික්ෂුව කෙසේ නම් සිහියෙන් හා මනා ප්‍රඥාවෙන් යුක්තවූයේ වේද?"

"ලොහිච්චය, මේ සස්නෙහි භික්ෂුතෙම ඉදිරියට යෑමෙහිද, ආපසු යෑමෙහිද, නුවණින් දැන කරන්නේය. ඉදිරි බැලීමෙහිද, වටපිට බැලීමෙහිද නුවණින් දැන බලන්නේය. අත් පා හැකිලීමෙහිද, දිගු කිරීමෙහිද, මනා නුවණින් දැන එසේ කරන්නේය. දෙපට සිවුරය, පාත්‍රය, සිවුරුය යන මේ දේ දැරීමෙහිද මනා නුවණින් දැන එසේ කරන්නේය. අනුභව කිරීමය, පානය කිරීමය, වැළඳීමය රස විඳීමය යන මෙහිද මනා නුවණින් යෙදී එසේ කරන්නේය. මල මූත්‍ර පහකිරීම්ද නුවණින් (ආදිනව) සලකා කරන්නේය. යෑම්, සිටීම්, හිඳීම් සැතපීම්, නිදි තොරකිරීම්, කථාකිරීම්, නිශ්ශබ්දව සිටීම් යන මේ දේ මනා නුවණින් දැන කරන්නේය. ලොහිච්චය, මෙසේ කරන්නාවූ භික්ෂුතෙමේ සිහියෙන් යුක්තවූයේ යහපත් නුවණින් යුක්තවූයේ වෙයි.

38 "ලොහිච්චය, භික්ෂුතෙමේ කෙසේ ලද පමණින් සතුටුවූයේ වේද?

"ලොහිච්චය, භික්ෂුතෙමේ යන්තම් කය වැසීමට තරම්වූ සිවුරෙන්ද බඩ ආරක්ෂාවට ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද සතුටු සිත් ඇත්තේ වේ. ඔහු යම් යම් තැනකට යේ නම් අටපිරිකර (කය පිළිබඳවූ දේ) පමණක් ගෙන යයි. ලොහිච්චය, යම්සේ පක්ෂියෙක් යම් තැනෙක පියාඹා යේනම් ඒ සියලුතැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේද, ලොහිච්චය. එපරිද්දෙන්ම භික්ෂුතෙමේද ශරීරය ආරක්ෂාවට ප්‍රමාණවූ සිවුරෙන්ද බඩ ආරක්ෂාවට ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද සතුටු වන්නේවේ. ඔහු යම් තැනක යා නම් අටපිරිකර පමණක් රැගෙණ බැහැර යයි. ලොහිච්චය, මෙසේවූ භික්ෂු තෙමේ සන්තොෂයෙන් යුක්ත වේ.

39 "උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූද, උතුම්වූ මේ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූද, මේ උතුම්වූ සන්තොෂයෙන් යුක්තවූද, ඒ භික්ෂුතෙමේ කැලයද, ගහක් මුලද, කඳු පලාත්ද, කඳුරැලි ගල් ගුහාවන් හෝ මහා මගද, සොහොන්ද, ඉතා දුරවූ කැලෑ වාසස්ථානද, බොහෝ

ඉඩකඩ ඇති තැන් සහ තණ ගුහාද යන මේ ස්ථාන ආශ්‍රය කෙරෙයි. ඔහු පසුබත් කාලයෙහි පිණ්ඩපාතයෙන් හැරී ආයේ පර්යංකය බැඳ (කකුල් අකුලුවා හිඳ) ශරීරයේ උඩුකොටස කෙලින් තබා අරමුණට සිහිය එළවා හිඳී.

40 "ඔහු ලොකයෙහි ලොභය පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේ. ලොභයෙන් සිත පිරිසිදු කෙරේ. සිත කෙලසන්නාවූ ක්‍රොධය පහකොට, ක්‍රොධයෙන් දුරුවූ සිත් ඇතිව පණඇති සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේව වාසය කරයි. ක්‍රොධ දොෂයෙන් සිත පිරිසිදු කෙරේ. කාය චිත්ත දෙදෙනාගේ අලස බව දුරුකොට කය-සිත පිළිබඳ පහවූ අලස බව ඇත්තේ පිරිසිදු හැඟීම් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥා ඇත්තෙක්ව වෙසේ. අලස බව දුරුකොට සිත පිරිසිදු කෙරේ. නොසන්සුන්කම හා පසුතැවීම දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව වාසය කෙරේ. ඇතුළත සංසිඳුනු සිත් ඇත්තේ, සිත විසිරයාම හා පසුතැවීමෙන් පිරිසිදු කෙරේ. විචිකිච්ඡාව (සැකය) දුරුකොට පහකළ විචිකිච්ඡා ඇත්තේ කුශලධර්ම විෂයෙහි සැක නැතිව වෙසේ; විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කෙරේ.

41 "ලොහිච්චය, යම්සේ පුරුෂයෙක් ණය ගෙණ කර්මාන්තයන්හි යොදන්නේද, ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණු වන්නාහු නම් ඔහුගේ ඒ පරණ ණය මුදල් සියල්ලම ගෙවන්නේය. ඔහුගේ අඹු දරුවන් ආරක්ෂා කරණ පිණිස වැඩි යමක් ඉතුරුවූයේ නම් ඕහට මෙබඳු අදහසක් ඇතිවේ. 'මම පළමුවෙන් ණය ගෙණ කර්මාන්තයන්හි යෙදුවෙමි. ඒ මාගේ කර්මාන්තයෝ දියුණුවූහ. ඒ මම පැරණි ණය ගෙවූයෙමි. අඹු දරුවන් පොෂ්‍යකිරීම පිණිස අතිරේක මුදලක්ද මට ඇත්තේය' කියායි. හෙතෙම ඒ ණය නැති බව මුල්කොටගෙණ බලවත් සතුටක් ලබන්නේය. සතුටටද පැමිණෙන්නේය.

42 "ලොහිච්චය, යම්සේ රොගයෙන් පෙළෙන දුක් ඇත්තාවූ, දැඩි ගිලන් බව ඇති පුරුෂයෙක් වන්නේද, ඕහට ආහාර රුචි නොවන්නේද, ඔහුගේ ශරීරයෙහි කිසි ශක්තියක් නැත්තේද වෙයි. ඒ පුරුෂයා පසු කාලයක ඒ ආබාධයෙන්

මිදෙන්නේ නම්, ඔහුට ආහාර රුචිය ඇතිවන්නේ නම්, ඔහුගේ ශරීර බලය ඇති වන්නේ නම්, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. කෙබඳුද යත්: 'මම පෙර ආබාධ ඇත්තාවූ, දුක් ඇති, දැඩි ගිලන් බව ඇති කෙනෙක්වීමි. මට බත් රුචියද නොවීය. ශරීර බලයද නැතිවිය. ඒ මම පළමු තිබූ ආබාධයෙන් මිදුනෙමි. මට ආහාර රුචියද ඇත්තේය. කාය බලයද තිබේය' කියායි. ඔහු ඒ කාරණය මුල්කොට බලවත් සතුටක් ලබන්නේය. සොම්නසටද පැමිණෙන්නේය.

43 "ලොහිච්චය, යම්සේ පුරුෂයෙක් සිරගෙයි බැඳුනේ වේද, ඔහු පසුකලක පීඩා නැතුව සැපසේ ඒ සිරගෙයින් මිදෙන්නේය. ඔහුගේ කෑම පිළිබඳ කිසිත් වියදමක්ද නොවන්නේය. ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: "මම පෙර සිරගෙයි බැඳුනෙක් වූයෙමි. ඒ මම දැන් පීඩා රහිතව සැපසේ ඒ සිරගෙයින් මිදුනෙමි. මගේ කෑම පිළිබඳ කිසි වියදමක්ද නොවූයේය' කියායි. ඔහු සිරගෙයින් මිදීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය, සතුටටද පැමිණෙන්නේය.

44 "ලොහිච්චය, යම් සේ සිය කැමැත්තෙන් යමක් කරන්ට නොහැකිව අනුන්ට යටත්වූ තමා කැමති ගමනක් ඒ වූ පරිදි යා නොහැකිවූ වැඩකරුවෙක් වන්නේද, ඔහු පසු කලක ඒ දාසභාවයෙන් මිදෙන්නේ, තමාම අධිපතිකොට ඇත්තේ, අනුන්ට යටත් නොව තමාගෙන්ම යැපෙන්නේ සිය අදහස් පරිදි ඒ ඒ තැන යා හැකි වන්නේද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: 'මම පෙර තමා කැමති පරිදි යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත් මා අදහස් පරිදි කිසි තැනෙක යා නොහැකි දාසයෙක් වීමි. ඒ මම දැන් ඒ දාස භාවයෙන් මිදුනෙක්මි. තමා අධිපතිකොට ඇත්තෙක් වීමි. අනුන්ට යටත්නූන කෙනෙක් වීමි. අනුන්ට යටත් නොව මා සපයාගත් දෙයින්ම යැපෙන්නෙමි, මා අදහස් පරිදි ඒ ඒ කැමැති තැනෙක යා හැක්කේද වෙමි' යි කියායි. ඔහු ඒ දාසභාවයෙන් මිදීම හෙතුකොට බලවත් සතුටක් ලබන්නේය. එසේම සතුටටද පැමිණෙන්නේය.

45 "ලොහිච්චය, යම්සේ ධනවත්වූ භොග සම්පත් ඇති පුරුෂයෙක් ආහාර දුර්ලභවූ, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර

මාර්ගයකට පැමිණෙන්නේද, ඔහු මඳ කලකින් ඒ කාන්තාර මාර්ගය ඉක්මවා යන්නේ සොර සතුරන්ගෙන් පිඩා නැති ගම්මානයකට සැපසේ ක්‍රමයෙන් පැමිණෙන්නේද. ඔහුට මෙබඳු අදහසක් ඇතිවේ. එනම්:- 'මම පෙර ධනවත්වූයෙම්, භොග සම්පත් සහිත වූයෙම්, දුර්ලභ භික්ෂා ඇති, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණියෙක් වූයෙමි. එසේවූ මම දැන් එම කාන්තාර මාර්ගය පසුකෙළෙමි. සැපවත්වූ භය රහිතවූ, ගමකට සැපසේ ක්‍රමයෙන් පැමිණියෙමි' යි කියායි. ඒ පුරුෂයා ඒ කාන්තාර මාර්ගය එතර කිරීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය. එසේම සතුටටද පැමිණෙන්නේය.

**46** ලොභිච්චය, ණය යම්සේද, රෝගය යම්සේද හිරගේ යම්සේද, දාසභාවය යම්සේද' දීර්ඝ කාන්තාර මාර්ගය යම්සේද, එපරිද්දෙන් භික්ෂුතෙමේ පහනොකළ (පඤ්චනීවරණ) කුසල් වළක්වන කරුණු පහ තමා කෙරෙහි ඇති බව නුවණින් දකී. ලොභිච්චය, ණය නැති බව යම්සේද, නිරෝගි බව යම්සේද, සිරගෙයින් මිදීම යම්සේද, අනුන්ට යටහත් නැති බව යම්සේද භය නැති භූමිය යම්සේද, එපරිද්දෙන්ම ලොභිච්චය, භික්ෂු තෙමේ පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමන් තුළ නැති බව නුවණින් දක්නේය.

**47** පහකළාවූ (නීවරණ) නුවණ මුවාකරණ ධර්ම පස තමා තුළ නැතැයි දක්නාවූ ඒ භික්ෂුවට උපදියි. සියලු ශරීරයෙහි පැතිර යන බලවත් සතුට උපදවයි. බලවත් සතුට උපන්නහුගේ සිත කෙලෙස් දැවිල්ලෙන් සංසිඳෙයි. සිත සංසිඳීගිය තැනැත්තේ සැපය විඳියි. සැපට පැමිණියහුගේ සිත එකඟවෙයි. හෙතෙමේ කාම ආශාවෙන් වෙන්වූයේ අකුශලයන් කෙරෙන් වෙන්වූයේ (විතර්ක) අරමුණට සිත පැමිණවීම සහිතවූ (විචාර) අරමුණ පිරිමැදීම සහිතවූ පළමු වැනි ධ්‍යානයට පැමිණ වාසය කරයි.) ඔහු මේ ශරීරය සිතේ විවේකයෙන් උපන් ප්‍රීති සැපයෙන් තෙමයි. නැවත නැවත තෙමයි. තව තව සම්පූර්ණ කරයි. වැඩියත් පතුරුවා හරියි. ලේ මස් ආදී සියලු කොටස් ඇත්තාවූ මේ ශරීරයෙහි ඒ ප්‍රීති සැපයෙන් ස්පර්ශ නොවූ (නොතැවරුණු) එකම කොටසක්වත් නැත්තේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

48 ලොහිච්චය, යම් සේ නෑමට පාවිච්චිකරන සුණු කල්ක සෑදීමෙහි දක්ෂයෙක් හෝ ඔහුගේ ගෝලයෙක් හෝ සුණු කල්ක ලොහ භාජනයක දමා වතුර ඉස ඉස ගුලි කරන්නේද ඒ වර්ණයෙහි ඇතුළත හා පිටත සැමතැන ජලය පැතිරී යන්නේය. ජලයෙන් ස්පර්ශ වන්නේය. නමුත් ජලය නොවැගිරෙන්නේය.

ලොහිච්චය, එසේම මේ භික්ෂුතෙම මේ ශරීරය සිතේ විවේකයෙන් උපන් ප්‍රීති සැපයෙන් තෙමයි. නැවත නැවත තෙමයි. වැඩි වැඩිය සම්පූර්ණ කරයි. වැඩියක් පතුරුවා හරියි. ඔහුගේ සියලු කොටස් ඇත්තාවූ මේ ශරීරයෙහි ප්‍රීති සැපයෙන් ස්පර්ශ නොවූ එක් කොටසක්වත් නැත්තේය.

ලොහිච්චය, යම් ශාස්තෘවරයකු (අනුශාසකයෙකු) නිසා ශ්‍රාවකතෙමේ (ගෝලයා) මෙවැනි මහත් විශෙෂ බවකට පැමිණේද, ලොහිච්චය, ලොකයෙහි යම් ශාස්තෘවරයෙක් චොදනා කිරීමට නුසුදුසු වන්නේ නම් මේ ශාස්තෘ තෙමේද එසේ චොදනා කිරීමට නුසුදුසු ශාස්තෘවරයෙකි. යමෙක් එවැනිවූ ශාස්තෘවරයාට චොදනා කෙරේ නම් ඒ චොදනාව ඇත්තක් නොවේ. සැබෑ නොවේ, ධර්මයට එකඟ නොවේ, වරදය.

49 නැවතද ලොහිච්චය, භික්ෂුතෙමේ විතර්ක විචාරයන් සංසිඳවීමෙන් ඇතුළත පහදවන්නාවූ සිත එකඟ කරන්නාවූ විතර්කය නැති විචාරය නැති සමාධියෙන් උපන් ප්‍රීතිය හා සැපය ඇති දෙවෙනි ධ්‍යානයට තුන්වැනි ධ්‍යානයට සතර වැනි ධ්‍යානයට පැමිණ වාසය කරයි. ලොහිච්චය, යම් ශාස්තෘවරයකු නිසා ශ්‍රාවක තෙමේ මෙවැනි මහත් විශෙෂ බවකට පැමිණේද ලොහිච්චය, ලොකයෙහි යම් ශාස්තෘවරයෙක් චොදනාවට සුදුසු නොවේ නම් මේ ශාස්තෘ තෙමේද ඒ චොදනාවට නුසුදුසු ශාස්තෘවරයෙකි. යමෙක් එවැනි ශාස්තෘවරයාට චොදනා කෙරේ නම් ඒ චෝදනාව ඇත්තක් නොවේ, සැබෑ නොවේ, ධර්මයට එකඟ නොවේ, වරදය.

50 ඒ භික්ෂුතෙමේ මෙසේ සිත සමාධියට පැමිණි කල්හි පිරිසිදුවූ කල්හි, කෙලෙස් දුරුවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුවූ කල්හි, කම්පානොවන බවට පැමිණි කල්හි,

විදර්ශනාඥානය සඳහා සිත යොමුකරයි, නමයි.) ලොහිච්චය, යම් ශාස්තෘවරයකු නිසා ශ්‍රාවකතෙමේ මෙබඳුවූ මහත් විශෙෂ බවකට පැමිණේද ලොහිච්චය, ලොකයෙහි යම් ශාස්තෘවරයෙක් චොදනාවට නුසුදුසු නම් මේ ශාස්තෘ තෙමේ ඒ චොදනාවට නුසුදුසු ශාස්තෘවරයෙකි. යමෙක් එවැනි ශාස්තෘවරයෙකුට චොදනා කරයි නම් ඒ චොදනාව ඇත්තක් නොවේ. සැබෑ නොවේ, ධර්මයට එකඟ නැත. වරදය)

51 (හෙතෙමේ මෙසේ සිත සමාධියට පැමිණි කල්හි පිරිසිදුවූ කල්හි, හැම ආකාරයෙන් පිරිසිදුවූ කල්හි, කෙලෙස් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුවූ කල්හි, කම්පානොවන බවට පැමිණි කල්හි, ආශ්‍රවයන් පහකිරීම සඳහා සිත යොමු කරයි, සිත නමයි. හෙතෙමේ මේ දුකයයි දැනගනී. මේ දුකට හේතුවයයි දැනගනී. මේ දුක නැති කිරීමයයි දැනගනී. මේ දුක නැතිකිරීමේ මාර්ගයයි දැනගනී. මේ ආශ්‍රව (කෙලෙස්) යයි දැනගනී. මේ ආශ්‍රවයන්ට හෙතුවයයි දැනගනී. මේ ආශ්‍රව නැතිකිරීමයයි දැනගනී. මේ ආශ්‍රව නැති කිරීමේ මාර්ගයයි දැනගනී.) නැවත ඉපදීම කෙළවර කරන ලදී. උතුම් පිළිපැදීමෙහි පිළිපදින ලදී. කළයුත්ත කරන ලදී. මින්පසු කළයුත්තක් නැතැයි දැනගනී. (ලොහිච්චය, යම් ශාස්තෘවරයෙකු නිසා ශ්‍රාවකතෙමේ මෙවැනි මහත් විශෙෂ බවකට පැමිණේද ලොකයෙහි යම් ශාස්තෘවරයෙක් චොදනාවට නුසුදුසු වන්නේ නම් මේ ශාස්තෘ තෙමේද ඒ චෝදනාවට නුසුදුසු ශාස්තෘවරයෙකි. යමෙක් එවැනි ශාස්තෘවරයෙකුට චොදනා කෙරේ නම් ඒ චොදනාව ඇත්තක් නොවේ, සැබෑ නොවේ, ධර්මයට එකඟ නැත, වරදය.)

52 මෙසේ කී කල ලොහිච්ච බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ දැන්නුවේය. නරා වළක වැටෙන්නාවූ පුරුෂයෙක් කෙස්වැටියෙන් අල්වාගෙන ගොඩ ගෙන පොළොවෙහි පිහිටුවන්නේ යම්සේද එපරිද්දෙන්ම මිථ්‍යාදෘෂ්ටි නමැති නරාවළෙහි වැටෙන්නාවූ මම ධර්මදෙශනාව නමැති අතින් ඉන් ගොඩගෙන භාග්‍යවතුන් වහන්සේ විසින් ස්වර්ග මාර්ග තලයෙහි පිහිටුවන ලද්දෙමි. ගෞතමයාණන් වහන්ස,

ධර්මදෙශනාව යහපති, ගෞතමයාණන් වහන්ස, ධර්මදෙශනාව යහපති. භවත් ස්වාමීන් වහන්ස, මුනින් තබනලද භාජනයක් උඩුකුරුකොට තබන්නේ හෝ යම්සේද වැසී තිබුණ යමක් එලිකොට දක්වන්නේ හෝ යම්සේද, මංමුළාවූවෙකුට මග කියන්නේ හෝ යම්සේද, 'ඇස් ඇත්තෝ රූපයන් දකිත්වායි අඳුරෙහි තෙල් පහන් දරන්නේ හෝ යම්සේද, ඒ පරිද්දෙන්ම ගෞතම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය දෙශනා කරන ලද්දේය. ඒ මම භාග්‍යවතුන් වහන්සේද ධර්මයද භික්ෂු සංඝයාද සරණ යමි. ගෞතම භාග්‍යවතුන් වහන්සේ අද පටන් ජීවිතයේ අග දක්වා සරණගිය උපාසකයෙකැයි මා දරාගනිත්වා.

දොළොස්වෙනිවූ ලොහිච්ච සූත්‍රය නිමියේයි.

---

## 13. තෙවිජ්ජ සූත්‍රය

1 මා විසින් මෙසේ අසන ලදී. (මාගේ ඇසීම මෙසේය) එක් කලක භාග්‍යවතුන් වහන්සේ පන්සියයක් භික්ෂූන්ගෙන් යුත් මහා භික්ෂු සංඝයා සමග කොසොල් රට ගමන් කරමින් එන අතර මනසාකට නම් කොසොල් රට වැසියන්ගේ බමුණු ගම යම් තැනකද එතනට පැමිණියෝය. එහි භාග්‍යවතුන් වහන්සේ මනසාකට බමුණු ගමට සමීපවූ උතුරු පැත්තෙහි අචිරවතී ගංගා ඉව්රෙහිවූ අඹවනයෙහි වාසය කරණ සේක.

2 ඒ කාලයෙහි බොහෝවූ කුලචාරිත්‍රාදියෙන් ප්‍රසිද්ධ ප්‍රසිද්ධවූ මහා සාර කුලවත් බ්‍රාහ්මණයෝ මනසාකට බමුණු ගමෙහි වාසය කෙරෙත්. ඔව්හු කවරහුදයත්, චංකී බ්‍රාහ්මණ තෙමේද, තාරුක්ඛ බ්‍රාහ්මණ තෙමේද, පොක්ඛරසාති බ්‍රාහ්මණ තෙමේද, ජානුස්සොණි බ්‍රාහ්මණ තෙමේද, තොදෙය්‍ය බ්‍රාහ්මණ තෙමේද, මෙයින් අන්‍යවූ ප්‍රසිද්ධ කුලවල බ්‍රාහ්මණයෝද වෙති.

3 එවිට බොහෝ වේලා වාඩිවී හිඳීමෙන් ඇති ශරීර විඩාව දුරුකර ගැනීම සඳහා සක්මන් කරමින් හැසිරෙන්නාවූ

පොක්ඛරසාති බ්‍රාහ්මණයාගේ ගෝලයකුවූ වාසෙට්ඨ බ්‍රාහ්මණයාද තාරුක්ඛ බ්‍රාහ්මණයාගේ ගෝලයකුවූ භාරද්වාජ බ්‍රාහ්මණයාද යන දෙදෙනා අතර මාර්ග හා අමාර්ග ගැන කථාවක් ඇතිවිය. එවිට වාසෙට්ඨ තරුණයා මෙසේ කියයි. පොක්ඛරසාති බ්‍රාහ්මණයා විසින් යම් මාර්ගයක් කියන ලද්දේ නම් මෙයම ඇද නැති මාර්ගය වේ. මේ මාර්ගයම එතෙර කරන්නේ වෙයි.

ඒ පිළිපදින්නා බ්‍රහ්මයා සමග එක්වීම පිණිස' පවතියි.

**4** භාරද්වාජ තරුණයා මෙසේ කියයි. 'තාරුක්ඛ බ්‍රාහ්මණයා විසින් යම් මාර්ගයක් කියන ලද්දේ නම් මෙයම ඇද නැති කෙලින් මාර්ගය වේ. මේ මාර්ගයම එතෙර කරන්නේ වේ. ඒ පිළිපදින්නා බ්‍රාහ්මයා සමග එක්වීම පිණිස පවතියි යනුයි.

**5** වාසෙට්ඨ තරුණයා විසින් භාරද්වාජ තරුණයාට ඔහුගේ කථාව පිළිගන්වන්ට නොහැකිවිය. වාසෙට්ඨ තරුණයා විසින්ද භාරද්වාජ තරුණයාට ඔහුගේ කථාව පිළිගන්වන්ට නොහැකි විය.

**6** එවිට වාසෙට්ඨ තරුණයා භාරද්වාජ තරුණයාට කථා කර මෙසේ කීවේය. "භාරද්වාජය, ශාක්‍ය පුත්‍රවූ ශාක්‍ය කුලයෙන් නික්ම මහණවූ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මනසාකට නම් බමුණු ගමට සමීපයෙහිවූ උතුරු පැත්තෙහි අචිරවති ගංගා ඉවුරෙහිවූ අඹ වනයෙහි වාසය කරති. ඒ භවත් ගෞතමයන් වහන්සේ ගැන මෙසේ යහපත් කීර්ති ඝොෂාවක් උස්ව නැංගේය. (ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙන් අර්හත්යහ. සම්‍යක් සම්බුද්ධයහ, අෂ්ට විද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් සම්පූර්ණයහ. ශොභන ගමන් ඇත්තාහ. තුන් ලෝකය දන්නාහ. ශ්‍රෙෂ්ඨවූ හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනියහ. දෙවි මිනිසුන්ට අනුශාසනා කරන්නාහ. සම්‍යක් සම්බුද්ධයහ. භාග්‍යවත්හ කියායි.)

පින්වත් භාරද්වාජය යමු. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ යම් තැනකද එතනට පැමිණෙමු. පැමිණ මේ කාරණය ශ්‍රමණ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ගෞතමයන් වහන්සේගෙන් අසමු. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ යම් පරිද්දෙකින් අපට කියත්ද, එසේ මේ කාරණය පිළිගනිමුයි.”

“පින්වත, එසේ යයි” භාරද්වාජ තරුණයා වාසෙට්ඨ තරුණයාට උත්තර දුන්නේය.

7 එවිට වාසෙට්ඨ භාරද්වාජ තරුණයෝ දෙදෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතනට පැමුණුනාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවූහ. සතුටු වියයුතු සිහිකටයුතු කථාව අවසන්කොට එක පැත්තක උන්හ. එක පැත්තක උන් වාසෙට්ඨ තරුණයා භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දැන්නුවේය.

“භවද් ගෞතමයන් වහන්ස, දවස මුළුල්ලේ හිඳීමෙන් ඇතිවූ අපහසුව මඟහරවා ගැනීම සඳහා එහා මෙහා සක්මන් කරමින් සිටි අප අතර මාර්ග අමාර්ග දෙක ගැන කථාවක් උපන්නේය. මම මෙසේ කීයෙමි.”

“පොක්ඛරසාති බ්‍රාහ්මණයා විසින් යම් මේ මාර්ගයක් කියන ලද්දේද මෙයම කෙලින් මාර්ගය වේ. මේ මාර්ගයම එතරට පමුණුවන මාර්ගය වේ. ඒ මාර්ගයෙහි පිළිපැදීම බ්‍රහ්මයා සමග එක්වීම පිණිස පවතීය’යනුයි. භාරද්වාජ තරුණයා මෙසේ කියයි. “තාරුක්ඛ බ්‍රාහ්මණයා විසින් යම් මේ මාර්ගයක් කියන ලද්දේ නම් මෙයම කෙලින් මාර්ගය වේ. මේ මාර්ගයම එතරට පමුණුවන මාර්ගය වේ. ඒ මාර්ගයෙහි පිළිපැදීම බ්‍රහ්මයා සමග එක්වීම පිණිස පවතීය’යනුයි. භවද් ගෞතමයන් වහන්ස, මේ මාර්ග අමාර්ග ගැන පෙර සිටම එකිනෙකට විරුද්ධ ගැනීම් ඇත්තේමය. විරුද්ධවාද ඇත්තේමය. නොයෙක් වාද ඇත්තේමය” කියායි.

8 “වාසෙට්ඨය, ඔබ මෙසේ කියන්නෙහිද? ‘පොක්ඛරසාති බ්‍රාහ්මණයා විසින් යම් මේ මාර්ගයක් කියන ලද්දේ නම් මෙයම කෙලින් මාර්ගය වේ. මේ මාර්ගයම එතරට පමුණුවන මාර්ගය වේ. ඒ මාර්ගය ලෙස පිළිපැදීම බ්‍රහ්මයා සමග එකතැන පහළවීම පිණිස පවතීය’ භාරද්වාජ තරුණයා මෙසේ කියයි. ‘තාරුක්ඛ

බ්‍රාහ්මණයා විසින් යම් මේ මාර්ගයක් කියන ලද්දේ නම් මෙයම කෙලින් මාර්ගය වේ. මේ මාර්ගයම එතරට පමුණුවන්නේය. ඒ මාර්ගය ලෙස පිළිපැදීම බ්‍රහ්මයා සමග එක්වීම පිණිස පවතිය' යනුද? වාසෙට්ඨය, එසේම නම් තොප දෙදෙනාගේ විරුද්ධ ගැනීම කුමක් ගැනද වාදය කුමක් ගැනද වෙනස්වූ කීම කුමක් ගැන දැයි" ඇසුවේය.

**9** භවද් ගෞතමයන් වහන්ස, මාර්ග අමාර්ග දෙක ගැනය, හෙවත් කෙලින් මාර්ගය කුමක්ද ඇදවූ මාර්ගය කුමක්ද යන්න ගැන යයි කීවේය. භවද් ගෞතමයන් වහන්ස, යම් සේ බ්‍රාහ්මණයෝ නොයෙක් මාර්ගයන් ප්‍රකාශ කරත්ද, එනම්, අඬරිය නම් බ්‍රාහ්මණ කොටසක් ඇත්තේය. තිත්තිරිය නම් බ්‍රාහ්මණ කොටසක් ඇත්තේය. ඡන්දොකා නම් බ්‍රාහ්මණ කොටසක් ඇත්තේය. ඡන්දාවා නම් බ්‍රාහ්මණ කොටසක් ඇත්තේය. බ්‍රහ්මචරිය නම් බ්‍රාහ්මණ කොටසක් ඇත්තේය. ඔවුන්ගේ ඒ සියලු මාර්ග බඹලොවට පමුණු වන්නාහු ඒ මාර්ගයන්හි පිළිපදින්නහුගේ බ්‍රහ්මයා සමග එක්වීම පිණිස පවතිත්. භවද් ගෞතමයන් වහන්ස, යම්සේ ගමකට, නියම් ගමකට සමීපයෙහි බොහෝවූ නොයෙක් මාර්ගයෝ වෙත්ද එසේ ඇති කල්හි ඒ සියලු මාර්ග ගමට ඇතුල් වන්නාහුම වෙත්ද, භවද් ගෞතමයන් වහන්ස, එපරිද්දෙන්ම යම්සේ බ්‍රාහ්මණයෝ නොයෙක් මාර්ගයන් ප්‍රකාශ කරත්ද, එනම් අද්ධරිය බ්‍රාහ්මණයෝය, තිත්තිරිය බ්‍රාහ්මණයෝය, ඡන්දොකා බ්‍රාහ්මණයෝය, ඡන්දාවා බ්‍රාහ්මණයෝය, බ්‍රහ්මචරිය බ්‍රාහ්මණයෝය යන මොව්හුය, එසේ ඇති කල දුකින් එතර කරන්නාහු ඒ සියලු මාර්ග බඹලොවට පමුණුවන්නාහු වෙති. ඒ මාර්ගයෙහි පිළිපැදීම බ්‍රහ්ම ආත්ම ලාභය පිණිස පවතියි.

**10** "වාසෙට්ඨය, කිමෙක්ද දුකින් එතර කරත්යයි කියන්නෙහිදැයි" ඇසූහ.

"භවද් ගෞතමයන් වහන්ස, දුකින් එතර කරත්යයි කියමි.

"වාසෙට්ඨය, කිමෙක්ද දුකින් එතර කරත්යයි කියන්නෙහිදැයි" දෙවනුවද ඇසූහ.

භවත් ගෞතමයන්වහන්ස, දුකින් එතරකරත්යයිකියමි

"වාසෙට්ඨය, කිමෙක්ද, දුකින් එතර කරත්යයි කියන්නෙහිදැයි" තුන්වෙනුවද ඇසූහ.

"භවද් ගෞතමයන් වහන්ස, දුකින් එතර කරත්යයි" කියමි.

11 "වාසෙට්ඨය, කිමෙක්ද, තුන් වේදය දත් බමුණන් අතුරෙන් එකෙකු විසින්වත් ඒ බ්‍රහ්මයා දක්නා ලද්දේ දැයි ඇසූහ.

"භවද් ගෞතමයන් වහන්ස, එය නොවේමය (දුටු කෙනෙක් නැතැයි)" දැන්නුවේය.

"වාසෙට්ඨය, කිමෙක්ද, තුන්වේදය දත් බමුණන්ගේ කිසියම් එක් ගුරුවරයකු විසින් වත් ඒ බ්‍රහ්මයා දකින ලද්දේදැයි ඇසූහ.

"භවද් ගෞතමයන් වහන්ස, එබන්දෙක් නැතැයි" දැන්නුවේය.

'වාසෙට්ඨය, කිමෙක්ද, තුන්වේදය දත් බමුණන්ගේ කිසි යම් ගුරුන්ගේ ගුරුවරයෙකු විසින්වත් ඒ බ්‍රහ්මයා දකින ලද්දෙදැයි ඇසූහ.

"භවද් ගෞතමයන් වහන්ස, එවැන්නෙක් නැත්තේ යයි" දැන්නුවේය.

"වාසෙට්ඨය, කිමෙක්ද, තුන්වේදය දත් බමුණන්ගේ හත් මුතු පරම්පරාවේ කිසියම් එක් බ්‍රාහ්මණයෙකු විසින්වත් ඒ බ්‍රහ්මයා දකින ලද්දේ දැයි ඇසූහ.

"භවද් ගෞතමයන් වහන්ස. එබන්දෙක් නැතැයි" දැන්නුවේය.

12 "වාසෙට්ඨය, කිමෙක්ද, මන්ත්‍ර කර්තෘවූ මන්ත්‍ර පැවැත්තුවාවූ තුන් වේදය දත් බමුණන්ගේ යම් ඒ පූර්ව ඍෂිවරයෝ වූවාහුද ඔවුන්ගේ යම් පුරාණවූ මන්ත්‍ර පද වෙත්ද ගීත වෙත්ද කියන ලද දේ වෙත්ද රැස්කර තබනලද දේ වෙත්ද දැන සිටින තුන් වේදය දත් බමුණෝ ඊට අනුව ගායනා

කෙරෙත්ද, ඊට අනුව කියත්ද, ඔවුන් විසින් කියන ලද්දට අනුව කියද්ද, ඔවුන් විසින් කියන ලද්දට අනුව කියවද්ද ඔව්හු කවරහුදයත්ඃ අට්ටකය, වාමකය, වාමදෙවය, වෙස්සා මිත්තය, යමතග්ගීය, අංගීරසය, භාරද්වාජය, වාසෙට්ඨය, කස්සපය, භගුය යන මොව්හු වෙත්. ඔව්හුද බ්‍රහ්මතෙමේ යම් තැනක වේද, යම් භූමියක වේද, යම් ලොකයක වේද, අපි මෙය දනිමුය, අපි මෙය දකිමුයයි' කීවාහුදැයි, ඇසූහ.

"භවද් ගෞතමයන් වහන්ස, මෙසේ නොකීවාහුමය"

13 "වාසෙට්ඨය, මෙසේ ඇති කල තුන් වේදයන් දත් බමුණන් අතුරෙන් යමෙකු විසින් බ්‍රහ්මතෙම ඇසින් දකින ලද්දේද, එබඳු එක් බමුණෙක්වත් නැත්තේය. තුන් වේදය දත් බමුණන් අතුරෙන් යමෙකු විසින් බ්‍රහ්මතෙම ඇසින් දකින ලද්දේද, එබඳු එක් ආචාර්‍ය්‍ය බමුණෙක්වත් නැත්තේය. තුන්වේදය දත් බමුණන් අතුරෙන් යමෙකු විසින් බ්‍රහ්මතෙම ඇසින් දකින් ලද්දේද, එබඳු එක් (ආචාර්‍ය්‍ය ප්‍රාචාර්‍ය්‍ය) ගුරුන්ගේ ගුරුවූ බමුණෙක්වත් නැත්තේය. තුන් වේදය දත් බමුණන්ගේ සත්වෙනි ආචාර්‍ය්‍ය පරම්පරාව දක්වා පැවැත්තවුන් විසින්ද බ්‍රහ්ම තෙම ඇසින් නොදක්නා ලද්දේය. මන්ත්‍ර කර්තෘවූ මන්ත්‍ර පැවැත්තුවාවූ තුන් වේදය දත් බමුණන්ගේ යම් ඒ පූර්ව ඍෂීහු වූවාහුද, ඔවුන්ගේ පුරාණවූ මන්ත්‍ර පද වෙත්ද, ගීත වෙත්ද, උස්වූ හඬින් කියන ලද දේ වෙත්ද, රැස්කර තබනලද දේ වෙත්ද දැන් සිටින තෙවිජ්ජක බමුණෝ ඊට අනුව ගායනා කෙරෙත්ද, ඊට අනුව කියද්ද, ඔවුන් විසින් කියන ලද්දට අනුව කියත්ද, ඔවුන් විසින් කියවන ලද්දට අනුව කියවත්ද, ඔව්හු කවරහුද යත්ඃ අට්ටකය, වාමකය, වාමදෙවය, වෙස්සාමිත්තය, යමතග්ගීය, අංගීරසය, භාරද්වාජය, වාසෙට්ඨය, කස්සපය, භගුය යන මොව්හුයි. බ්‍රහ්මතෙම යම් තැනකවේද, යම් භූමියක වේද, යම් ලොකයෙක්හි වේද අපි මෙය දනිමුය, අපි මෙය දකිමු යයි ඔව්හුද මෙසේ නොකිවාහුය.

ඒකාන්තයෙන් ඒ තුන්වේදය දත් බමුණෝ මෙසේ කීහ. "අපි යම් බ්‍රහ්මයෙකු නොදනිමුද, යම් බ්‍රහ්මයෙකු නොදකිමුද

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ඔහු හා එක්වීම පිණිස මාර්ගය කියමු. කෙසේද, මෙයම කෙලින් මාර්ගයයි, මේ මාර්ගයම එතරට පමුණුවන්නේ මේ මාර්ගය ලෙස පිළිපදින්නහුගේ බ්‍රහ්ම ආත්ම ලාභය පිණිස පවතීය" කියායි, වාසෙට්ඨය, ඒ කුමකැයි හඟින්නේද? මෙසේ ඇති කල තුන් වේදය දත් බමුණන්ගේ කීම උත්තර නොදියහැකි බවට නොපැමිණේද?

"භවද් ගෞතමයන් වහන්ස, ඒකාන්තයෙන් මෙසේ ඇති කල තුන් වේදය දත් බමුණන්ගේ ඉගැන්වීම උත්තර නොදියහැකි බවට පැමිණේමයයි' දැන්නුවේය.

14 "වාසෙට්ඨය, ඒකාන්තයෙන් ඒ තුන්වේදය දත් බමුණෝ යමක් නොදනිත්ද යමක් නොදකිත්ද,

එය ලැබීම පිණිස මාර්ගය දෙශනා කරන්නාහුය. 'මෙයම කෙලින් මාර්ගය වේ. මේ මාර්ගයම එතරට පමුණුවන්නේ මේ මාර්ගය ලෙස පිළිපදින්නහුගේ බ්‍රහ්ම ආත්ම ලාභය පිණිස පවතීය' කියායි. මේ කාරණය ඇත්ත නොවේ. වාසෙට්ඨය, එක් අන්ධයෙකු විසින් ගන්නාලද හැරමිටිකොණ තවත් අන්ධයෙක් දැයි, මෙසේ පණහක් හැටක් පමණවූ අන්ධ සමූහයක් එක එකාට සම්බන්ධතාවයක් ඇතුව ඉදිරියේ යන තැනැත්තා නොදකීද, මැද යන තැනැත්තා නොදකීද පසුව යන තැනැත්තා නොදකීද, වාසෙට්ඨය, එපරිද්දෙන්ම ඒ තුන් වේදය දත් බමුණන්ගේ ඉගැන්වීම අන්ධ සමූහයකට බඳු උපමා ඇත්තේ වේ. ඉදිරියේ යන තැනැත්තාද නොදකී. මැද යන තැනැත්තාද නොදකී, පසුව යන තැනැත්තාද නොදකී. ඒ තුන්වේදය දත් බමුණන්ගේ ඉගැන්වීම සිනාසිය යුතු බවටම පැමිණේ. ලාමක බවටම පැමිණේ, අර්ථ නැති බවටම පැමිණේ. එහෙයින් හිස් බවට පැමිණේ.

15 "වාසෙට්ඨය, ඒ කුමකැයි හඟින්නේද? තුන්වේදය දත් බමුණෝද වෙනත් බොහෝ ජනයෝද ඉර හඳ දකිත් යම් කලක ඉර හඳ පායද්ද, යම් කලක ඉර හඳ බහිත්ද එකල ඔවුන්ට යාච්ඤා කෙරෙත්ද, ඔවුන්ට ස්තුති කෙරෙත්ද දෑතබැඳගෙන නමස්කාර කරමින් ඔබ මොබ පෙරලෙත්ද?"

"භවද් ගෞතමයන් වහන්ස, එසේය, තුන්වේදය දත් බමුණෝද වෙනත් ජනයෝද ඉර හඳ දකිත්. යම් කලක ඉර හඳ නැගෙත්ද යම් කලක බහිත්ද, එකල ඔවුන්ට යාච්ඤා කෙරෙත්, ස්තුති කෙරෙත්, දෑතබැඳගෙන නමස්කාර කරමින් ඔබ මොබ පෙරලෙත්."

16 "වාසෙට්ඨය, ඒ කුමකැයි සිතන්නෙහිද? යම් හේතුවකින් තුන්වේදය දත් බමුණෝ ඉර හඳ දකිත්ද, යම් කලක ඉර හඳ උදාවෙත්ද, යම්කලක බහිත්ද, එකල ඔවුන්ට යාච්ඤා කෙරෙත්ද, ස්තුති කෙරෙත්ද, ඇඳිලි බැඳගෙන නමස්කාර කරමින් ඔබමොබ පෙරලෙත්ද, ඒ තුන්වේදය දත් බමුණෝ මෙයම කෙලින් මාර්ගය වේ. මේ එහි පමුණුවන මාර්ගය වේ. ඒ මාර්ගය ලෙස පිළිපදින්නහුගේ පැවැත්ම ඉර හඳ හා එක්ව විසීම පිණිස පවතීයයි ඉර හඳ දෙක හා එක්ව විසීම පිණිස මාර්ගයක් දෙශනා කරන්ට සමර්ථ වෙත්දැයි" ඇසුවෝය.

"භවද් ගෞතමයන් වහන්ස, මෙය නොහැකියයි" කීය.

17 "වාසෙට්ඨය, මෙසේ යම් ඒ තුන්වේදය දත් බමුණෝද වෙනත් බොහෝ ජනයෝද ඉර හඳ දකිත්. යම් කලක ඉර හඳ පායත්ද යම් කලක ඉර හඳ බහිත්ද එකල 'පින්වත් චන්ද්‍රය උදාවනු මැනව, පින්වත් සූර්‍ය්‍යය උදාවනු මැනව' යනාදීන් යාච්ඤාකෙරෙත්ද, ඔවුන්ට ස්තුති කෙරෙත්ද දෑත් බැඳගෙන නමස්කාර කරමින් ඔබ මොබ පෙරළෙත්ද ඔවුන්ටද ඉර හඳ දෙදෙනා හා එක්වීම පිණිස මාර්ගයක් දෙශනා කරන්ට නොහැකි වෙත්. කෙබඳු මාර්ගයක්ද යත්, මෙයම කෙලින් මාර්ගය වේ. මේ ඊට පමුණුවන මාර්ගය වූයේ ඒ මාර්ගය ලෙස පිළිපදින්නහුගේ පැවැත්ම ඉර හඳ දෙදෙනාගේ සහභාවය පිණිස පවතීය' කියායි. කිමෙක්ද? තුන්වේදය දත් බමුණන් විසින් බ්‍රහ්මතෙමේ ඇසින් දක්නා ලද්දේද නැතහොත් තුන්වේදය කට පාඩමේ කියන්නාවූ බමුණන්ගේ ආචාර්‍ය්‍යයන් විසින් බ්‍රහ්මතෙමේ ඇසින් දකිනා ලද්දේද, නැතහොත් තුන්වේදය කටපාඩමේ කියන්නාවූ බමුණන්ගේ ගුරුවරයාගේත් ගුරුවරයා විසින් බ්‍රහ්මතෙමේ ඇසින් දක්නා ලද්දේද, නැතහොත් තුන්වේදය

දත් බමුණන්ගේ සත්වෙනි ආචාර්‍ය්‍ය පරම්පරා දෙක දක්වා සිටියවුන් විසින් බ්‍රහ්මතෙමේ ඇසින් දකිනා ලද්දේද මන්ත්‍ර කර්තෘවූ මන්ත්‍ර පැවැත්තුවාවූ තුන් වේදය දත් බමුණන්ගේ යම් ඒ පළමු ඍෂීහු වූවාහුද ඔවුන්ගේ පුරාණවූ මන්ත්‍රපද වෙත්ද ගීත වෙත්ද උස්වූ හඬින් කියන ලද දේ වෙත්ද රැස්කොට තබනලද දේ වෙත්ද දැන් තුන්වේදය දත් බමුණෝ ඊට අනුව ගායනා කෙරෙත්ද ඊට අනුව කියත්ද, කියනලද්දට අනුව කියත්ද කියවන ලද්දට අනුව කියවත්ද, ඒ කවරහුදයත්, අට්ටකය, වාමකය, වාමදෙවය, වෙස්සාමිත්තය, යමතග්ගීය, අංගීරසය, භාරද්වාජය, වාසෙට්ඨය, කස්සපය, භගුය යන මොහුයි. ඔව්හුද බ්‍රහ්මතෙම යම්තැනෙක්හි වේද යම් භූමියක බ්‍රහ්මවේද යම් ලෝකයෙක්හි බ්‍රහ්මතෙමේ වේද මෙය අපි දනිමුය, මෙය අපි දකිමුයයි මෙසේ නොකීහ. ඒකාන්තයෙන් ඒ තුන් වේදය දත් බමුණෝ මෙසේ කීහ. යම් බ්‍රහ්මයකු නොදනිමූද, යම් බ්‍රහ්මයකු නොදකිමුද, ඔහු හා එක්ව විසීම පිණිස මාර්ගය දෙශනා කරමු. 'මෙයම ඍජු මාර්ගය වේ. මේ මාර්ගයම ඊට පමුණුවන මාර්ගය වූයේ, ඒ මාර්ගය ලෙස පිළිපදින්නහුගේ බ්‍රහ්මාත්ම ලාභය පිණිස පවතීය" කියායි, වාසෙට්ඨය, ඒ කුමකැයි හඟින්නෙහිද? එසේ ඇති කල තුන්වේදය දත් බමුණන් විසින් කියන ලද්ද උත්තර නොදිය හැකි බවට නොපැමිණේදැයි' ඇසුවෝය.

"භවද් ගෞතමයන් වහන්ස. ඒකාන්තයෙන් මෙසේ ඇතිකල තුන්වේදය දත් බමුණන් විසින් කියන ලද්ද උත්තර නොදිය හැකි බවට පැමිණේයයි කීයේය.

වාසෙට්ඨය, හොඳයි, වාසෙට්ඨය, එකාන්තයෙන් ඒ තුන් වේදය දත් බමුණෝ යමක් නොදනිත්ද, යමක් නොදකිත්ද, එය ලැබීම පිණිස මාර්ගය දෙශනා කරන්නාහුය. මෙයම කෙලින් මාර්ගය වේ. මේ එතරට පමුණුවන මාර්ගය වූයේ එය පිළිපදින්නහුගේ බ්‍රහ්ම ආත්ම ලාභය පිණිස පවතීය යන මේ කාරණය ඇත්ත නොවේ.

18 "වාසෙට්ඨය, යම්සේ පුරුෂයෙක් මෙසේ කියන්නේය. කෙසේද? මේ ජනපදයෙහි යම් ඒ ජනපද කළ්‍යාණියක් වේද,

මම ඈ රුචි කෙරෙමි, කැමැත්තෙමියි" කියායි. ඒ පුරුෂයාහට මෙසේ කියන්නාහුය. එනම්: එම්බල පුරුෂය, ඔබ යම් ජනපද කල්‍යාණියක් රුචි කෙරෙහිද කැමැත්තෙහිද ඒ ජනපද කල්‍යාණි ක්ෂත්‍රිය කුල ඇත්තිය කියා හෝ බමුණු කුල ඇත්තිය කියා හෝ ශුද්‍ර කුල ඇත්තිය කියා හෝ දන්නෙහිදැයි" කියායී. මෙසේ අසනලද්දේ 'නැතැයි' කියන්නේ නම් ඔහුට මෙසේ කියන්නාහුය. එම්බල පුරුෂය, ඔබ යම් ඒ ජනපද කල්‍යාණියක් රුචි කෙරෙහිද කැමැත්තෙහිද ඒ ජනපද කල්‍යාණි මෙවැනි නම් ඇත්තිය කියා හෝ මෙවැනි ගොත්‍ර ඇත්තිය කියා හෝ උස්ය කියා හෝ මිටිය කියා හෝ මධ්‍යමය කියා හෝ, යහපත් පාට ඇත්තීය කියා හෝ (මගුරුසැව) දුඹුරුපාට ඇත්තිය කියා හෝ අසවල් ගමෙහිය කියා හෝ අසවල් නියම්ගමෙහිය කියා හෝ අසවල් නුවරය කියා හෝ මෙසේ ඇසූ කල 'නැතැයි' කියන්නේ නම් ඔහුට මෙසේ කියන්නාහුය. එම්බල පුරුෂය, තෝ යම් ඒ ස්ත්‍රියක් නොදක්නෙහිද නොදැක්කෙහිද, එවැනි ස්ත්‍රියක් රුචි කෙරෙහිද කැමැත්තෙහිදැයි කියායි. මෙසේ අසන ලද්දේ එසේයයි කියන්නේය.

වාසෙට්ඨය, ඒ කුමකැයි සිතන්නෙහිද මෙසේ ඇති කල්හි ඒ පුරුෂයාගේ කීම උත්තර නොදිය හැකි බවට නොපැමිණේදැයි ඇසුවෝය.

"භවද් ගෞතමයන් වහන්ස, ඒකාන්තයෙන් මෙසේ ඇති කල ඒ පුරුෂයාගේ කීම උත්තර නොදිය හැකි බවට පැමිණේමය" යි කීයේය.

**19** වාසෙට්ඨය, එමෙන්ම තුන්වේදය දත් බමුණන් විසින් බ්‍රහ්මතෙම ඇසින් නොදක්නා ලද්දේය. තුන් වේදය දත් බමුණන්ගේ ගුරුවරයන් විසින්ද බ්‍රහ්මතෙම ඇසින් නොදක්නා ලද්දේය. තුන් වේදය දත් බමුණන්ගේ ගුරුවරයින්ගේ ගුරුවරයින් විසින්ද බ්‍රහ්මතෙම ඇසින් නොදක්නා ලද්දේය. තුන්වේදය දත් බමුණන්ගේ සත්වෙනි ගුරුවර පරම්පරා දෙක දක්වා පැවැත්තවුන් විසින්ද බ්‍රහ්මතෙමේ ඇසින් නොදක්නා ලද්දේය. මන්ත්‍ර කර්තෘවූ මන්ත්‍ර පැවැත්තුවාවූ තුන් වේදය දත් බමුණන්ගේ

යම් ඒ පූර්ව ඍෂිහු වෙත්ද ඔවුන්ගේ පුරාණවූ මන්ත්‍ර පදද, ගීතද, උස්හඬින් කියන ලද්දද රැස්කොට තබන ලද දේද ඇත්තාහ. දැන් තුන් වේදය දත් බමුණෝ ඊට අනුව ගායනා කෙරෙත්ද, ඊට අනුව කියද්ද, කියනලද්දට අනුව කියත්ද, කියවන ලද්දට අනුව කියවත්ද, ඒ කවරහුදයත්. අට්ටකය, වාමකය, වාමදෙවය, වෙස්සාමිත්තය, යමතග්ගීය, අංගීරසය, භාරද්වාජය, වාසෙට්ඨය කස්සපය, භගුය යන මොව්හුයි. බ්‍රහ්මතෙම යම් තැනක වේද, යම් භූමියක බ්‍රහ්මතෙම වේද, යම් ලොකයෙක්හි බ්‍රහ්මතෙම වේද යන මෙය අපි දනිමුය. මෙය අපි දකිමුයයි ඒ පුරාණ කාලයේ ඍෂිහුද මෙසේ නොකීහ.

ඒකාන්තයෙන් ඒ තුන්වේදය දත් බමුණෝ මෙසේ කීහ. අපි යම් බ්‍රහ්මයකු නොදනීමුද අපි යම් බ්‍රහ්මයකු නොදකිමුද ඔහුගේ සහභාවය පිණිස මාර්ගය දෙශනා කරමු.

"මෙයම කෙලින් මාර්ගය වේ. මේ මාර්ගයම එතර කරන මාර්ගය වූයේ මේ මාර්ගය ලෙස පිළිපදින්නන්ගේ බ්‍රහ්ම ආත්ම ලාභය පිණිස පවතීය' කියායි. වාසෙට්ඨය, ඒ කුමකැයි හඟින්නෙහිද? මෙසේ ඇති කල ඒ තුන්වේදය දත් බමුණන්ගේ කීම නොපිළිගත යුතු බවට පැමිණෙන්නේ නොවේදැයි" ඇසුවෝය.

"භවද් ගෞතමයන් වහන්ස, ඒකාන්තයෙන් මෙසේ ඇති කල ඒ තුන්වේදය දත් බමුණන්ගේ කීම නොපිළිගත යුතු බවට පැමිණෙන්නේමයයි" කීයේය.

"වාසෙට්ඨය, හොඳයි, ඒකාන්තයෙන් ඒ තුන්වේදය දත් බමුණෝ යම් බ්‍රහ්මයකු නොදනිත්ද, යම් බ්‍රහ්මයකු නොදකිත්ද ඔහුගේ සහභාවය පිණිස මාර්ගය දෙශනා කෙරෙත්. මෙයම කෙලින් මාර්ගය වේ. මේ මාර්ගය එතර කරන මාර්ගය වූයේ මේ මාර්ගය ලෙස පිළිපදින්නන්ගේ බ්‍රහ්ම ආත්මලාභය පිණිස පවතී' යන මේ කාරණය ඇත්ත නොවේ.

**20** "වාසෙට්ඨය, යම්සේ පුරුෂයෙක් සතරමංහන්දියක ප්‍රාසාදයකට නැගීම පිණිස ඉනිමගක් සාදන්නේද ඔහුට මෙසේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

කියන්නාහුය. 'එම්බල පුරුෂය' තෝ යම් ප්‍රාසාදයකට නැගීම පිණිස ඉණිමගක් සාදන්නෙහිද? ඒ ප්‍රාසාදය නැගෙනහිර දෙසය කියා හෝ දකුණු දෙසය කියා හෝ බස්නාහිර දෙසය කියා හෝ උතුරු දෙසය කියා හෝ උස්ය කියා හෝ දන්නෙහිද? මිටිය කියා හෝ මධ්‍යමය කියා හෝ දන්නෙහිදැයි' කියායි. මෙසේ අසන ලද්දේ නැතැයි කියන්නේ නම්, ඔහුට මෙසේ කියන්නහුය. 'එම්බල පුරුෂය, තෝ යම් ඒ ප්‍රාසාදයක් නොදන්නෙහිද, නොදක්නෙහිද ඒ ප්‍රාසාදයට නැගීම පිණිස ඉණිමගක් සාදන්නෙහිද? මෙසේ අසන ලද්දේ 'එසේ යයි' කියන්නේය. වාසෙට්ඨය, ඒ කුමකැයි හඟින්නෙහිද? එසේවූ කල ඒ පුරුෂයාගේ කීම නොපිළිගත යුතු බවට නොපැමිණේදැයි" ඇසුවෝය.

"භවද් ගෞතමයන් වහන්ස, ඒකාන්තයෙන් එසේවූ කල ඒ පුරුෂයාගේ කීම නොපිළිගත යුතු බවට පැමිණෙන්නේ යයි" කීයේය.

**21** "වාසෙට්ඨය, එසේම තුන්වේදය දත් බමුණන් විසින් බ්‍රහ්මතෙම ඇසින් නොදක්නා ලද්දේය. තුන්වේදය දත් බමුණන්ගේ ආචාය්‍ය්‍යයන් විසින්ද බ්‍රහ්මතෙම ඇසින් නොදක්නා ලද්දේය. තුන්වේදය දත් බමුණන්ගේ ආචාය්‍ය්‍යයන්ගේ ආචාය්‍ය්‍යයන් විසින්ද බ්‍රහ්ම තෙම ඇසින් නොදක්නා ලද්දේය. තුන්වේදය දත් බමුණන්ගේ සත්වෙනි ආචාය්‍ය්‍ය පරම්පරා දෙක දක්වා පැවති බමුණන් විසින්ද මහාබ්‍රහ්ම තෙම ඇසින් නොදක්නා ලද්දේය. මන්ත්‍ර කර්තාවූ මන්ත්‍ර පැවැත්තුවාවූ තුන්වේදය දත් බමුණන්ගේ යම් ඒ පූර්ව ඍෂිහු වෙද්ද, ඔවුන්ගේ පුරාණවූ මන්ත්‍ර පද වෙත්ද ගීත වෙත්ද, උස්හඬින් කියන ලද්දක් වේද රැස්කොට තබන ලද්දක් වේද දැන් තුන්වේදය දත් බමුණෝ ඊට අනුව ගායනා කෙරෙත්ද, ඊට අනුව කීම කෙරෙත්ද, ඔවුන් විසින් කියන ලද්දට අනුව කියද්ද, ඔවුන් විසින් කියවන ලද්දට අනුව කියවත්ද, ඒ කවුරුද යතහොත් අට්ටකය, වාමකය, වාමදෙවය, වෙස්සාමිත්තය, යමතග්ගීය, අංගීරසය, භාරද්වාජය, වාසෙට්ඨය, කස්සපය, භගුය යන මොහුයි. යම්තැනක බ්‍රහ්ම

තෙම වේද, යම් භූමියෙක්හි බ්‍රහ්මතෙම වේද, යම් ලොකයෙක්හි බ්‍රහ්ම තෙම වේද යන මේ කාරණය අපි දනිමුය. අපි මෙය දකිමුයයි ඒ පූර්ව ඍෂීහුද මෙසේ නොකීහ. ඒකාන්තයෙන් ඒ තුන්වේදය දත් බමුණෝ මෙසේ කීහ.

"මෙයම කෙලින් මාර්ගයවේ. මේ මාර්ගයම එතර කරන මාර්ගය වූයේ මේ මාර්ගය ලෙස පිළිපදින්නන්ගේ බ්‍රහ්ම ආත්ම ලාභය පිණිස පවතී. යම් බ්‍රහ්මයකු අපි නොදනිමුද, යම් බ්‍රහ්මයකු අපි නොදකිමුද, ඒ සඳහා මාර්ගය දෙශනා කරමුයි මෙසේ කීහ. වාසෙට්ඨය ඒ කුමකැයි හඟින්නෙහිද? මෙසේ ඇති කල තුන්වේදය දත් බමුණන්ගේ කීම නොපිළිගත යුතු බවට නොපැමිණේදැයි" ඇසුවෝය.

"භවද් ගෞතමයන් වහන්ස, ඒකාන්තයෙන් මෙසේ ඇති කල තුන්වේදය දත් බමුණන්ගේ කීම් නොපිළිගත යුතු බවට පැමිණේයයි කීයේය.

**22** වාසෙට්ඨය, හොඳයි, වාසෙට්ඨය, ඒ තුන්වේදය දත් බමුණෝ යම් බ්‍රහ්මයකු නොදනිත්ද, යම් බ්‍රහ්මයකු නොදකිත්ද, 'මෙයම කෙලින් මාර්ගය වේ. මේ මාර්ගයම එතර කරන මාර්ගයවූයේ මේ මාර්ගය ලෙස පිළිපදින්නන්ගේ බ්‍රහ්ම ආත්ම ලාභය පිණිස පවතීයයි' ඒ බ්‍රහ්මයාගේ සහභාවය පිණිස මාර්ගය දේශනා කරන්නාහුය යන මේ කාරණය ඇත්ත නොවේ.

**23** "වාසෙට්ඨය, යම්සේ මේ අචිරවතී ගංගාව ජලයෙන් පිරී කවුඩන් විසින් බොන්නට හැකි තරම් ඉවුර දක්වා සමවූ කල එයින් එතර ප්‍රයෝජනකොට ඇත්තාවූ එයින් එතරට යන ස්වභාව ඇත්තාවූ, එයින් එතර සොයන්නාවූ එයින් එතරවීම කරනු කැමැත්තාවූ පුරුෂයෙක් එන්නේද, ඒ පුරුෂයා මෙතෙර සිට 'පරතෙර මෙතරට එව, පරතෙර මෙතරට එවයි' පරතෙරට අඬගාන්නේද වාසෙට්ඨය, ඒ කුමකැයි සිතන්නෙහිද? කිමෙක්ද, ඒ පුරුෂයාගේ අඬගෑමේ හේතුවෙන් යාච්ඤා කිරීම් හේතුවෙන් හෝ ප්‍රාර්ථනාකිරීම් හේතුවෙන් හෝ බොහෝ කැමතිවීමේ හේතුවෙන් හෝ අචිරවතී ගඟේ පරතෙර මෙතෙරට එන්නේද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"භවද් ගෞතමයන් වහන්ස, මෙය නොවේමයයි" කීයේය.

**24** "වාසෙට්ඨය, එසේම තුන් වේදය දත් බමුණෝ යම් ධර්මයක් බ්‍රාහ්මණ භාවය ඇති කරන්නේද ඒ ධර්මයෙන් ඉවත්ව යම් ධර්මයක් බ්‍රාහ්මණ භාවය නොකරන්නේද, ඒ ධර්මයන් සමාදන්ව වසමින් මෙසේ කීවාහුය. "සක්දෙව් රජ කැඳවමු. චන්ද්‍රයා කැඳවමු. වරුණ දෙවියා කැඳවමු. ඊසාන දෙවියා කැඳවමු. ප්‍රජාපති දෙවියා කැඳවමු. බ්‍රහ්මයා කැඳවමු. මහින්ධි දෙවියා කැඳවමු. යාම දෙවියා කැඳවමුයි' කියායි. වාසෙට්ඨය ඒකාන්තයෙන් ඒ තුන්වේදය දත් බමුණෝ යම් ධර්මයක් බ්‍රාහ්මණභාවය ඇතිකරන්නේද ඒ ධර්මයෙන් වෙන්ව යම් ධර්මයක් බ්‍රාහ්මණභාවය නොකරන්නේද ඒ ධර්මය සමාදන්ව වසන්නාහ. ඔවුන්ගේ යාච්ඤා කිරීම හේතුවෙන් හෝ ප්‍රාර්ථනාකිරීම් හෙතුවෙන් හෝ බොහෝ කැමතිවීමේ හේතුවෙන් හෝ මරණින් මතු බ්‍රහ්මයාගේ සහභාවයට පැමිණෙන්නෝ වන්නාහුය, යන මේ කාරණය ඇත්තක් නොවේ.

**25** වාසෙට්ඨය, යම්සේ මේ අචිරවතී ගංගාව ජලයෙන් පිරී කවුඩන් විසින් බොන තරම් ඉවුර දක්වා සමවූ කල එයින් එතර ප්‍රයෝජනකොට ඇත්තාවූ, එයින් එතරට යන ස්වභාව ඇත්තාවූ, එයින් එතර සොයන්නාවූ, එයින් එතර වීම කරනු කැමැත්තාවූ පුරුෂයෙක් එන්නේද ඒ පුරුෂයා මෙතෙර අත්පිටිකරට තබා දම්වැලකින් බඳිනා ලද්දේවේද, වාසෙට්ඨය, ඒ කුමකැයි සිතන්නෙහිද, කිමෙක්ද, ඒ පුරුෂයා අචිරවතී ගඟේ මෙතෙරින් එතෙරට යන්නේදැයි" ඇසුවෝය.

"භවද් ගෞතමයන් වහන්ස, මෙය නොවේමයයි" කීවේය.

**26** "වාසෙට්ඨය, එසේම මේ කාම ගුණ (බැඳුම්) පහ (ආයර්‍ය විනයෙහි) බුද්ධශාසනයෙහි දම්වැලයයිද, බැඳීමයයිද කියනු ලැබේ. ඒ පහ කවරහුද යත්: ඉෂ්ටවූ, කැමති වන්නාවූ, හිත ප්‍රිය කරන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, ආසා ඇති කරන්නාවූ, ඇලුම් කටයුතුවූ, ඇසින් බලා දතයුතුවූ රූපද, කණින් අසා දතයුතුවූ ශබ්දද, නාසයෙන් විඳ දත යුතුවූ ගඳ සුවඳද, දිවෙන් විඳ දතයුතුවූ

රසද, ඉෂ්ටවූ, කැමති වන්නාවූ, හිත ප්‍රිය කරන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ, ආසා ඇති කරන්නාවූ, ශරීරයෙන් ස්පර්ශකොට දතයුතුවූ හැඟීම්ද යන මොහුය. වාසෙට්ඨය, මේ පස්කම් බැම්ම මේ බුද්ධ ශාසනයෙහි දම්වැලයයිද බැඳීම්යයිද කියනු ලැබෙත්. වාසෙට්ඨය, තුන්වේදය දත් බමුණෝ මේ පස්කම් ගුණයෙහි බැඳුණාහු, සිහිමුළාවූවාහු, ගිලුණාහු, එහි දොෂ නොදක්නාහු, සසරින් නික්මයාමේ ප්‍රඥා නැත්තෝව ඒ පස්කම් සැප විඳිත්.

27 වාසෙට්ඨය, ඒකාන්තයෙන් ඒ තුන්වේදය දත් බමුණෝ යම් ධර්මයක් බ්‍රාහ්මණභාවය ඇති කරන්නේද ඒ ධර්මයන් දුරුකොට යම් ධර්මයක් බ්‍රාහ්මණ භාවය නොකරන්නේද ඒ ධර්මයන් රැගෙන පවත්නාහු පස්කම් නමැති රැහැන් වලින් බැඳුනාහු එයින්ම සිහිමුළා වූවාහු ඊට ඇතුළත් වූවාහු එහි දොස් නොදක්නා ස්වභාව ඇත්තෝ පඤ්චකාම බැමි කපා දුක් කෙළවර කිරීම් වශයෙන් සංසාරයෙන් නික්ම යාමේ නුවණ නැතිව (පරිභොග කරන්නාහු) ඒ පස්කම් සැප විඳින්නාහු කාම බැම්මෙන් බඳිනා ලද්දෝව (ශරීරය විනාශ වීමෙන්) මරණින් මතු බ්‍රහ්මයා හා එක්වීමට පැමිණෙත්ය යන මේ කාරණය ඇත්ත නොවේ.

28 "වාසෙට්ඨය, යම්සේ මේ අචිරවතී ගංගාව ජලයෙන් පිරී ගංගා තීරයෙහි සිටි කාක්කන් විසින් බොන්නට හැකි ජලය ඇතිවූවාද එකල එතෙර ප්‍රයෝජන කොට ඇත්තාවූ එතෙරට යන පුරුද්ද ඇතිවූ එතෙර සොයන්නාවූ එතරවීමට කැමැත්තාවූ පුරුෂයෙක් එන්නේද ඒ පුරුෂයා මෙතෙර හිස සහිතව පොරවා නිදාගන්නේද, වාසෙට්ඨය ඒ කුමකැයි සිතන්නෙහිද? කිමෙක්ද එසේ ඇති කල ඒ පුරුෂයා අචිරවතී ගඟේ මෙතෙරින් එතෙරට යන්නේදැයි" ඇසුවෝය.

"භවද් ගෞතමයන් වහන්ස, මේ කාරණය ඇත්ත නොවේමයයි" කීයේය.

29 වාසෙට්ඨය, එසේම මේ (නීවරණ) ධර්ම පහ (ආයයී) උතුම් විනයෙහි ආවරණයෝයයිද කියනු ලැබෙත්.

නීවරණයෝයයිද කියනු ලැබෙත්. බැඳුම්යයිද කියනු ලැබෙත්. හැම අතින් බැඳුම්යයිද කියනු ලැබෙත්. ඒ පහ මොනවාද? වස්තු කාමයන් කෙරෙහි ඇලීම නම්වූ නීවරණය, (කාමච්ඡන්දය) ක්‍රොධ නම්වූ නීවරණය, (ව්‍යාපාදය) කයේ සහ සිතේ අලස බවයයි කියනලද නීවරණය, (ථිනමිද්ධ) නොසන්සුන් බව හා පසුතැවීම නම්වූ නීවරණය, (උද්ධච්ච කුක්කුච්ච) සැකකිරීම යයි කියන නීවරණය, (විචිකිච්ඡා) යන මේයි. වාසෙට්ඨය, මේ නීවරණ පහ උතුම් විනයෙහි ආවරණයෝයයිද කියනු ලැබෙත්, නීවරණයෝයයිද කියනු ලැබෙත්, බැඳුම්යයිද කියනු ලැබෙත්. හැම ආකාරයෙන් බැඳුම්යයිද කියනු ලැබෙත්. වාසෙට්ඨය, තුන්වේදය දත් බමුණෝ මේ නීවරණ පහෙන් ආවරණය කරණ ලද්දෝ සෑම ආකාරයෙන් වසන ලද්දෝ එයින් යට කරන ලද්දෝ එයින් වෙලන ලද්දෝ එයින් හාත්පසින් වසන ලද්දෝ වෙත්.

"වාසෙට්ඨය, ඒ තුන්වේදය දත් බමුණෝ යම් ධර්මයක් බ්‍රාහ්මණභාවය ඇතිකරන්නේද, ඒ ධර්මයන් දුරුකොට යම් ධර්මයක් බ්‍රාහ්මණභාවය නොකරන්නේද. ඒ ධර්මයන් සමාදන්ව පවතින්නාහු ස්වර්ග මොක්ෂය මුවහ කරන ධර්ම පහෙන් ආවරණය කරන ලද්දෝ සම්පූර්ණයෙන් වසන ලද්දෝ සෑම ආකාරයෙන් යටකරන ලද්දෝ සෑම ආකාරයෙන් වසන ලද්දෝ (ශරීරය විනාසවූ) මරණින් මතු බ්‍රහ්මයන්ගේ සහභාවයට පැමිණෙන්නාහුය යන මේ කාරණය ඇත්තක් නොවේ.

**30** වාසෙට්ඨය, ඒ කුමකැයි සිතන්නෙහිද? වැඩි සිටියාවූ මහලුවූ ආචාර්‍ය්‍ය ප්‍රචාර්‍ය්‍යවූ බමුණන් විසින් බ්‍රහ්මතෙම ස්ත්‍රීන් සමග වාසය ඇත්තේ හෝ ස්ත්‍රීන් සමග වාසය නැත්තේදැයි කියන ලද කථාවක් අසා ඇත්තේද?"

"භවද් ගෞතමයන් වහන්ස, ස්ත්‍රීන් සමග වාසය නැත්තේයි."

"වෛර සහිත සිත් ඇත්තේද වෛර නැති සිත් ඇත්තේද"

"භවද් ගෞතමයන් වහන්ස, වෛර නැති සිත් ඇත්තේය"

"ක්‍රොධ සහිත සිත් ඇත්තේද ක්‍රොධ නැති සිත් ඇත්තේද"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"භවද් ගෞතමයන් වහන්ස, ක්‍රොධ නැති සිත් ඇත්තේය."

"කිලුටු සිත් ඇත්තේද කිලුටු නොවූ සිත් ඇත්තේද?"

"භවද් ගෞතමයන් වහන්ස, කිලුටු නොවූ සිත් ඇත්තේය."

"පුරුදු කරන ලද සිත් ඇත්තේ හෝ පුරුදු කරන ලද සිත් නැත්තේද?"

"භවද් ගෞතමයන් වහන්ස, පුරුදු කරන ලද සිත් ඇත්තේය."

31 වාසෙට්ඨය, ඒ කුමකැයි සිතන්නෙහිද? තුන්වේදය දත් බමුණෝ ස්ත්‍රීන් සමග වාසය ඇත්තෝද නොහොත් ස්ත්‍රීන් සමග වාසය නැත්තෝද?

"භවද් ගෞතමයන් වහන්ස, ස්ත්‍රීන් සමග වාසය ඇත්තෝය."

"වෛර සහිත සිත් ඇත්තෝ හෝ වෛර රහිත සිත් ඇත්තෝද?"

"භවද් ගෞතමයන් වහන්ස, වෛර සහිත සිත් ඇත්තෝය."

'ක්‍රොධ සහිත සිත් ඇත්තෝ හෝ ක්‍රොධ රහිත සිත් ඇත්තෝද?"

"භවද් ගෞතමයන් වහන්ස, ක්‍රොධ සහිත සිත් ඇත්තෝය."

"කිලුටු සිත් ඇත්තෝ හෝ කිලුටු නැති සිත් ඇත්තෝද?"

"භවද් ගෞතමයන් වහන්ස, කිලුටු සිත් ඇත්තෝය."

"පුරුදු කරනලද සිත් ඇත්තෝ හෝ පුරුදු කරන ලද සිත් නැත්තෝද?"

"භවද් ගෞතමයන් වහන්ස, පුරුදු කරනලද සිත් නැත්තෝයයි" කීයේය.

32 වාසෙට්ඨය, මෙසේවූ කල තුන්වේදය දත් බමුණෝ ස්ත්‍රීන් සමග වාසය ඇත්තෝය. බ්‍රහ්මතෙම ස්ත්‍රීන් සමග වාසය නැත්තේය. කිමෙක්ද? ස්ත්‍රීන් සමග වාසය ඇත්තාවූ තුන්වේදය

දත් බමුණන්ගේ ස්ත්‍රීන් සමග වාසය නැත්තාවූ බ්‍රහ්මයා සමග සංසන්දනය වේද, සමාන වේද?

"භවද් ගෞතමයන් වහන්ස, එසේ නොවන්නේය."

33 වාසෙට්ඨය, හොඳයි, වාසෙට්ඨය, කාම ආසා ඇති හෙයින් ස්ත්‍රීන් සමග වාසය කරන්නාවූ ඒ තුන්වේදය දත් බමුණෝ මරණින් මතු කාම ආසා නැති හෙයින්, ස්ත්‍රීන් සමග වාසයක් නැත්තාවූ බ්‍රහ්මයා සමග එක්වීමට පැමිණෙන්නාහුය යන මේ කාරණය ඇත්ත නොවේ.

34 "වාසෙට්ඨය, මෙසේ තුන්වේදය දත් බමුණෝ වෛර සහිත සිත් ඇත්තෝයි. බ්‍රහ්මතෙම වෛර රහිත සිත් ඇත්තේය. කිමෙක්ද? වෛර සහිත සිත් ඇති තුන්වේදය දත් බමුණන්ගේ වෛර රහිත සිත් ඇති බ්‍රහ්මයා සමග සංසන්දනය වේද සමාන වේද?

"භවද් ගෞතමයන් වහන්ස, එසේ නොවන්නේය."

"වාසෙට්ඨය, හොඳයි, වාසෙට්ඨය, වෛර සහිත සිත් ඇති ඒ තුන්වේදය දත් බමුණෝ මරණින් මතු වෛර සිත් නැත්තාවූ බ්‍රහ්මයා හා එක්වීමට පැමිණෙන්නාහුය, යන මේ කාරණය ඇත්තක් නොවේ.

"වාසෙට්ඨය, මෙසේ තුන්වේදය දත් බමුණෝ ක්‍රොධ සිත් ඇත්තෝයි. බ්‍රහ්මතෙම ක්‍රොධ සිත් නැත්තේය කිමෙක්ද? ක්‍රොධ සිත් ඇති තුන්වේදය දත් බමුණන්ගේ ක්‍රොධ සිත් නැති බ්‍රහ්මයා සමග සංසන්දනය වේද සමාන වේද?

"භවද් ගෞතමයන් වහන්ස, එසේ නොවන්නේය."

"වාසෙට්ඨය, හොඳයි, වාසෙට්ඨය, ක්‍රොධ සහිත සිත් ඇති. ඒ තුන්වේදය දත් බමුණෝ මරණින් මතු ක්‍රොධ සිත් ඇත්තාවූ බ්‍රහ්මයාගේ සහභාවයට පැමිණෙන්නාහුය යන මේ කාරණය ඇත්තක් නොවේ.

"වාසෙට්ඨය, මෙසේ වූකල තුන්වේදය දත් බමුණෝ කිලුටු සිත් ඇත්තෝය. බ්‍රහ්මතෙම නොකිලුටු සිත් ඇත්තේය. කිමෙක්ද?

කිලුටු සිත් ඇති තුන්වේදය දත් බමුණන්ගේ කිලුටු සිත් නැති බ්‍රහ්මයා සමග සංසන්දනය වේද සමාන වේද?

"භවද් ගෞතමයන් වහන්ස, එසේ නොවන්නේය."

"වාසෙට්ඨය, හොඳයි, කිලුටු සිත් ඇති තුන්වේදය දත් බමුණෝ මරණින් මතු කිලුටු සිත් නැත්තාවූ බ්‍රහ්මයාගේ සහභාවයට පැමිණෙන්නාහුය, යන මේ කාරණය ඇත්තක් නොවේ.

"වාසෙට්ඨය, මෙසේවූ කල තුන්වේදය දත් බමුණෝ පුරුදු කරනලද සිත් ඇත්තෝය. බ්‍රහ්මතෙම පුරුදු කරන ලද සිත් ඇත්තේය. කිමෙක්ද? පුරුදු කරන ලද සිත් නැති තුන්වේදය දත් බමුණෝ පුරුදු කරන ලද සිත් ඇති බ්‍රහ්මයා සමග සංසන්දිනය වේද සමාන බවට පැමිණේද?

"භවද් ගෞතමයන් වහන්ස, එසේ නොවන්නේය."

**35** "වාසෙට්ඨය, හොඳයි, පුරුදු කරන ලද සිත් නැති තුන්වේදය දත් බමුණෝ පුරුදු කරන ලද සිත් ඇති බ්‍රහ්මයාගේ සහභාවයට පැමිණෙන්නාහුය, යන මේ කාරණය ඇත්තක් නොවේ.

වාසෙට්ඨය, මෙහි තුන්වේදය දත් බමුණෝ බඹලොවට නොපැමිණෙන මාර්ගයක් බඹලොවට පැමිණෙන මාර්ගයයි වරදවාගෙන එහි පිළිපැද මඩවළක් පොළොවයයි බැස ගිලෙන්නාක් මෙන් ගිලෙති. ගිලී, සතර අපායෙහි වැටී දුකට පැමිණෙත්. මිරිඟුව දැක දියෙන් පිරුණු ගංගාවකැයි එතරවීමට පීනන්නට ගොස් අත් පා බිඳගනිත්. එහෙයින් මේ මාර්ගය තෙවිජ්ජ බමුණුන්ගේ කිමකැයිද, තෙවිජ්ජ බමුණන්ගේ මහ කැලෑවක්යයිද තෙවිජ්ජ බමුණන්ගේ විනාශයකැයිද කියනු ලැබේ.

**36** මෙසේ වදාළ කල වාසෙට්ඨ තරුණයා භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීවේය. "භවද් ගෞතමයන් වහන්ස, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ බ්‍රහ්මයාගේ සහභාවය පිණිස පවත්නා මාර්ගය දන්නේයයි මේ කාරණය මා විසින් අසන ලද්දේය."

"වාසෙට්ඨය. ඒ කුමකැයි සිතන්නෙහිද? මනසාකට ගම මේ අඹ වනයට සමීප නොවේද? මනසාකට ගම මට නුහුරු වූයේ නොවේද?"

"භවද් ගෞතමයන් වහන්ස, එසේය. මනසාකට ගම මීට සමීපය. මනසාකට ගම මීට දුර නොවේයයි" කීයේය.

"වාසෙට්ඨය, ඒ කුමකැයි සිතන්නෙහිද? මේ මානසාකට ගමෙහි උපන්නාවූද එහි වැඩුනාවූද පුරුෂයෙක් ඇත්තේද, ඒ ගමින් පිටත ගියාවූ ඔහුගෙන් කිසිවෙක් මනසාකට ගමට පාර අසත් නම්, වාසෙට්ඨය, මනසාකට ගමෙහි උපන්නාවූ එහිම වැඩුනාවූ මනසාකට ගමට පාර අසනු ලැබුවාවූ ඒ පුරුෂයාට ඒ පාර කීමට කල්පනාකිරීම ආදීවශයෙන් කල්ගතවීමක් වන්නේදැයි" ඇසුවෝය.

"භවද් ගෞතමයන් වහන්ස, එසේ නොවේමය,"

"ඊට හේතු කවරේද?"

"භවද් ගෞතමයන් වහන්ස, ඒ පුරුෂයා, මනසාකට ගමෙහි උපන්නේය, එහිම වැඩුනේය. ඔහු විසින් මනසාකට ගම ගැන සියලු මාර්ග හොඳින් දැනගත් බැවිනි"

37 "වාසෙට්ඨය, මනසාකට ගමෙහි උපන්නාවූ එහිම වැඩුනාවූ මනසාකට ගමට පාර අසනලද්දාවූ ඒ පුරුෂයාට ප්‍රමාද භාවයක් හෝ, තද මුළාවක් හෝ වන්නේ නමුත් බ්‍රහ්ම ලොකයෙහි හෝ බ්‍රහ්ම ලොකයට පමුණුවන ගති ඇති පිළිපැදීම සම්බන්ධව අසනලද්දාවූ තථාගතයානන් වහන්සේට ඒ සඳහා පිළිපැදීම කුමක්ද යනාදීන් ප්‍රමාද භාවයක් හෝ මුලාබවක් නොවේමය. වාසෙට්ඨය, මම බ්‍රහ්මයන්ද දනිමි. බ්‍රහ්ම ලොකයද දනිමි. බ්‍රහ්ම ලොකයට පමුණුවන ගති ඇති පිළිපැදීම දනිමි. යම් මාර්ගයකින් පිළිපැදීම කළ කෙනෙක් බ්‍රහ්ම ලොකයෙහි උපන්නේද එය හෝ ඔහු දනිමි" කීවාහුය.

38 මෙසේ කී කල වාසෙට්ඨ තරුණයා භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීයේය.

"භවද් ගෞතමයන් වහන්ස, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ බ්‍රහ්මයන්ගේ සහභාවය පිණිස මාර්ගය දෙශනා කරනසේකැයි මේ කාරණය මා විසින් අසන ලද්දේය. භවද් ගෞතමයන් වහන්සේ බ්‍රහ්මයන්ගේ සහභාවය පිණිස මාර්ගය අපට දෙශනා කරණසේක්වා. භවද් ගෞතමයන් වහන්සේ බ්‍රහ්ම පුත්‍රවූ මා අපාය මාර්ගයෙන් උදුරණ සේක්වායි" කීවේය.

"වාසෙට්ඨය, එහෙනම් අසව, හොඳින් කල්පනා කරව, කියන්නෙමියි" වදාළෝය.

'පින්වතුන් වහන්ස, එසේයයි" වාසෙට්ඨ තරුණයා භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය වදාළසේක.

"වාසෙට්ඨය, (අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, විදර්ශනාඥාන ආදී විද්‍යා අට සීල සංවරය ආදී හසුරුවන ධර්ම පහළවයන අෂ්ට විද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් යුක්තවූ, යහපත් ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දන්නාවූ, ශ්‍රෙෂ්ඨවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනිවූ, දෙවි මිනිසුන්ට ගුරුවරයෙක්වූ, (චතුරාර්‍ය්‍ය සත්‍ය) සත්‍යවූ උතුම් ධර්මසතර අවබොධකළාවූ, තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිතවූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, රජුන් හා මිනිසුන් සහිතවූ, සත්ත්ව වර්ගයා ස්වකීය උසස් ඥානයෙන් දැන පැහැදිලි කොට ප්‍රකාශ කෙරේ. ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූ, මැද යහපත්වූ, කෙළවර යහපත්, අර්ථ සහිතවූ, දස ආකාරයෙන් නියමවිදියට වචන ශබ්ද කරන්නාවූ (ව්‍යඤ්ජන සහිත) සියලු ලෙසින් සම්පූර්ණවූ, පිරිසිදුවූ සියලු ශාසනමාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව ගෙන හැර දක්වති.

**39** "ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයි. ඔහු ඒ දහම අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කෙරෙයි. ඔහු ඒ ශ්‍රද්ධාවෙන් යුක්තවූයේ මෙසේ සලකන්නේය.

'ගෘහවාසය පීඩා සහිතයි. රාගාදි කෙලෙස් සහිත මාර්ගයෙකි. මහණකම වනාහි කිසිවක් නොමැති අවකාශයමෙන් නිදහස්ය. ගිහි ගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ, ලියවූ හක්ගෙඩියක් වැනිවූ මෙම බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්ට නොහැක්කේය මම කෙස් දැළිරැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වන්නෙම් නම් ඉතා යහපතැයි' කියායි.

"ඔහු පසු කාලයක ස්වල්පවූ හෝ බොහෝවූ හෝ සම්පත් රාශිය හැර ස්වල්පවූ හෝ බොහෝවූ නෑපිරිස් හැර, කෙස් දැළිරැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණවේ. මෙසේ මහණවූ ඔහු ප්‍රධාන සංවරසීලයෙන් යුක්ත වූයේ, යහපත් හැසිරීමෙන් හා වරද නැති පැවැත්මෙන් යුක්ත වූයේ, ස්වල්පවූත් අකුසලයන්හි විශෙෂයෙන් භය දක්නා ගති ඇත්තෙකු වූයේ, යහපත්වූ ශරීරයෙන් වචනයෙන් ක්‍රියාවෙන් යුක්ත වූයේ, ශික්ෂාපද සමාදන්ව එහි මොනවට හික්මෙයි. පිරිසිදුවූ ජීවිත පැවතුම් ඇත්තේවෙයි, ශීලයෙන් යුක්ත වූයේ වෙයි, ඉන්ද්‍රියයන්හි වැසූ දොරටු ඇත්තේ වෙයි, කෑමෙහි පමණ දන්නේවෙයි, යහපත් සිහියෙන් හා නුවණින් යුක්ත වූයේ වෙයි, සන්තෝෂයෙන් යුක්තවෙයි.

**40** "වාසෙට්ඨය, භික්ෂුනමක් කෙසේ නම් සීල සම්පන්න වේද? වාසෙට්ඨය, මේ සස්නෙහිවූ භික්ෂුනමක් ප්‍රාණවධය හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, බහා තබන ලද දඬු ඇත්තේ බහා තබනලද ආයුධ ඇත්තේ, පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ කරුණාවන්ත වූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිත අනුකම්පාව ඇතිව වාසය කෙරේ. මෙයද ඔහුගේ සීලයක්වේ නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් සම්පූර්ණයෙන් වැළැක්කේ, දුන්දෙයම ගන්නේ, දුන් දෙයම කැමතිවන්නේ, සොර නොවූ පිරිසිදුවූ සිතින් යුක්තව වාසය කෙරේ. මෙයද ඔහුගේ සීලයෙකි. අබ්‍රහ්මචර්‍ය්‍යාව හැර උතුම් පැවතුම් ඇත්තේ ස්ත්‍රී පුරුෂ සංසර්ගය නම්වූ ග්‍රාම ධර්මයෙන් වෙන් වූයේ බ්‍රහ්මචාරීවේ. මෙයද ඔහුගේ සීලයෙකි බොරුකීමෙන් දුරුව, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සැබෑ තෙපුල් කියන්නේ, සැබවින් සැබව ගළපන ගති ඇතිව ස්ථිර කථා ඇත්තේ, ඇදහිය යුතු වචන ඇත්තේ ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකෙරේ. මෙයද ඔහුගේ සීලයෙකි. පිසුණු බස් හැර, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, මෙතැනින් අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන ගති ඇත්තේද, එතැනින් අසා මොවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන ගති ඇත්තේද, මෙසේ භෙදවූවන් ගළපන්නේ සමගි වූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමගියෙහි ඇලුම් බහුලකොට ඇත්තේ, සමගිකම්හි ඇලුනේ, සමගිකම්හි සතුටුවන ගති ඇත්තේ සමගිය ඇති කරණ තෙපුල් කියන්නේය. මෙයද ඔහුගේ සීලයෙකි. ඵරුෂ වචනය හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ යම් වචනයක් නිදොස්වේද, කනට සැපද, ප්‍රෙමණීයද, සතුටු කරයිද, යහපත්ද, බොහෝ දෙනාට ප්‍රියද, බොහෝ දෙනාගේ හිත් ප්‍රියකරන්නේද, එබඳු වචනම කියන්නේවේ. මෙයද ඔහුගේ එක් සීලයෙකි. හිස් ප්‍රලාප කථා හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, කාලයට සුදුසු කථා කරන්නේ, සිදුවූ තෙපුල්ම කියන්නේ, අර්ථයෙන් යුක්තවූ, ධර්මයෙන් යුක්ත විනය සම්බන්ධවූ තෙපුල් කියන්නේ, සුදුසු කල්හි, උපමා හා කරුණු සහිතවූ, සීමා ඇති, අර්ථයෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේ. මෙසේ ඒ හිස් කථාවෙන් වැළැක්කේද දියුණුවට හේතුවන වචන කියන්නේද, මෙයද ඔහුගේ සීලයෙකි.

"තණ, ගස්, වැල්, බිඳීම් සිඳීම් ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන කෑම ඇත්තේ, රාත්‍රී කෑමෙන් හා අවේලේ කෑමෙන් සම්පූර්ණයෙන් වැළැක්කේය. නැටීම්, ගීකීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය මල්, ගඳ, විලවුන් පැළඳීම, ඉන් සැරසීම, අඩුතැන් පිරවීමෙන් අලංකාර කිරීම යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළැක්කේය. රන් රිදී මසුරන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් වැළැක්කේය අමුවූ ධාන්‍ය වර්ග පිළිගැන්මෙන් සම්පූර්ණයෙන්

තොරවූයේ අමුමස් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද ස්ත්‍රීන් හා ගෑනු ලමයින් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද වේ වැඩකරුවන් වැඩකාරියන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේ, එළුවන් හා තිරළුවන් පිළිගැනීමෙන් තොරවූයේ, කුකුළන්, හූරන්, ඇතුන්, ගවයන්, අසුන් වෙළඹුන්, කෙත්, වත් යන මේ පිළිගැන්මෙන්ද, සම්පූර්ණයෙන් තොරවූයේය. ගිහීන්ගේ දූත මෙහෙවරය, ගෙන්ගෙට යන මහත් මෙහෙවරය යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. ගනුදෙනු කිරීමය, තරාදි ආදියෙන් වඤ්චා කිරීමය, රන් හා නොරන් මිශ්‍ර වඤ්චා කිරීමය, වී ආදිය මැණීමෙන් වඤ්චා කිරීමය, හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය. උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදී ලොහ රන් රිදීයයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයොගය යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය කැපීමය, මැරීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැරගැන්මය, ගම් නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාරකමින් වස්තු පැහැරගැන්මය යන මෙයින්ද සම්පූර්ණයෙන් වැළැක්කේය මෙයද ඔහුගේ සීලයක් වේ

41 "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මූලබීජය, ඛන්ධබීජය, ඵලබීජය, දලුබීජය, පස්වැනිවූ බීජබීජය යන මේ ගස් ආදිය වැවීමෙහි යෙදී වාසය කරත්. මෙබඳුවූ බීජගාම භූතගාමයන් සිඳීම් බිඳීම් ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේ නම් මෙයද ඔහුගේ එක් සීලයක් වේ

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා ආහාර වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයෝජන ගැන්මය, බීම වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයෝජන ගැන්මය, නොඉටන ලද (අයිතියට නොගත්) සිවුරු ආදිය, යාන සංඛ්‍යාත වහන් දෙකකින් වැඩි සයන, සුගන්ධයන්, තල සහල් ආදිය තැන්පත් කොට තබා ප්‍රයෝජන ගැන්මයයි කියනලද පසුවට තබා ප්‍රයෝජන ගැන්මෙහි යෙදී වාසය කරත් මෙබඳුවූ සන්නිධිකාර පරිභොගයෙන් වැළකී වෙසේ. මෙයද ඔහුගේ සීලයකි.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා නැටීමය, ගී කීමය, බෙර ආදිය වැයීමය, රඟමඬුලු සැරසීමය, වැඩක් නැති කථා ඇසීමය. කයිතාලම් හා අත්ලෙන් අත්ල ගැසීමය. මන්ත්‍ර පිරවීමෙන් මළමිණී නැංවීමය, සතරැස් හෝ කළ බෙර ගැසීමය, ශොභන චිත්‍ර විචිත්‍රය, සණදොවුන් කෙළිය, හුණගස් ඔසවා නැටීමය, මිනී ඇට සෝදා තැබීමය, ඇතුන් හා පොරය, අශ්වයින් යොදා පොරය, මීවුන් හා පොරය ගවයින් හා පොරය, එළුපොරය, මෙණ්ඩක එළුපොරය, කුකුළුපොරය, වටුපොරය, දඬු (පොලු) පොරය, තොරතුරු දැනීමය, මල්ලව යුද්ධය, යුද්ධය, ඇත් ඇස් ආදිය දැකීමය යන විකාර දර්ශනයෙහි යෙදී වාසය කරත්. මෙසේ මෙබඳු විසුලු දැක්මෙන් සම්පූර්ණයෙන් වැළකේ. මෙයද ඔහුගේ සීලයකි.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙනලද කෑම කා දූ පෝරු ආදියෙහි කෙළීම්වූ ක්‍රීඩාවය, දශපද ක්‍රීඩාවය, දූ පෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි ක්‍රීඩාකිරීමය, බිම මණ්ඩල වශයෙන් සාදා පැන පැන ක්‍රීඩා කිරීමය, දූ කැට නොසොල්වා නියෙන් ගසා ක්‍රීඩා කිරීමය, දාදු කෙළීමය, සිං කෙළීමය, භිත්ති ආදියෙහි ඉරටම්ටි ගසා ඇත් අස් ආදි රූප දක්වා කෙළීමය, පන්දු කෙළීම්ය, නලා පිඹීම්ය, ක්‍රීඩා නගුල් ගෙන සෙල්ලම් සීසෑම්ය, කරනම් ගැසීමය, තල්පත් ආදියෙන් කන්නන් ගුරුවා තනා ක්‍රීඩා කිරීමය, කොළ නැළියෙන් වැලි ආදිය මැන කෙළීමය, කුඩා රථයෙන් කෙළීමය. කුඩා දුන්නෙන් කෙළීමය, අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ඇඳ කෙළීමය, සිතූ දේ කියවීම් කීම් ආදියෙන් කෙළීමය, ඒ ඒ දොෂ රූප දක්වා කෙළීමය, යන මෙබඳුවූ ප්‍රමාදයට කාරණාවූ දූ කෙළීමෙහි යෙදී වාසය කෙරෙත්. මෙසේ මෙබඳුවූ දූ කෙළියෙන් සම්පූර්ණයෙන් වළකියි. මෙයද ඔහුගේ සීලයකි.

**42.** "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා දික්හගලා පුටුය, පලස්ය, සතරඟුලෙන් දිග ලොම් ඇතිරිය, විසිතුරු එළුලොම් ඇතිරිය, එළුලොම් සුදුඇතිරිය, එළුලොමින් කළ ඉදිරියට නෙරූ මල් ඇති ඇතිරිය, සිංහාදි

රූපයෙන් විසිතුරු එළුලොම් ඇතිරිය, එක් පිට ලොම් ඇති ඇතිරිය, දෙපිට ලොම් ඇති එළුලොම් ඇතිරිය, රත්රන් නූලෙන් කළ පට ඇතිරිලිය, එක්විට නැට්ටුක්කාරියන් දහසය දෙනෙක් නටනා එළුලොමින් කළාවූ මහඇතිරිය, ඇතුන් පිට අතුරණ ඇතිරිය, අසුන් පිට අතුරණ ඇතිරිය, රථ පිට අතුරණ ඇතිරිය, අඳුන් දිවිසමින් කළ ඇතිරිය, කෙසෙල් මුව සමින් කළ උතුම් ඇතිරිය, දෙපස තබනලද රතුපාට කොට්ට ඇති ආසනය, යන මෙබඳු උස් අසුන් මහ අසුන් පාවිච්චි කෙරෙත්. මෙසේ මෙබඳුවූ උස් අසුන් මහ අසුන්හි හිඳීම් ආදියෙන් වළකියි. මෙයද ඔහුගේ සීලයකි.

"එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ඇඟ ඉලීමය, පිරිමැදීමය, නෑවීමය, මැඩීමය, මූනබලන කන්නාඩි අඳුන්, තෙල් හා සුවඳ පාවිච්චිය, මූණේ ගානා සුවඳ කුඩු, මූණේ ගානා සුවඳ ද්‍රව්‍ය, අත්වල බඳින ආභරණ යන මේ දේ දැරීම හා පැළඳීමය, රත්රන් නූල් ආදියෙන් කුඩුම්බි බැඳීමය, විසිතුරු දඬුගෙන හැසිරීමය, බෙහෙත් නල එල්වාගෙන ඇවිදීමය, කඩු විසිතුරු කුඩ ගෙනයෑම, විසිතුරු සෙරෙප්පු හෝ සපත්තු පයලා ඇවිදීමය, නලල්පට බැඳීමය, කොණ්ඩා මාණික්‍ය පැළඳීමය, අවන් දැරීමය දික්වූ දහවලු ඇති සුදුරෙදි ඇඳීමයයි මෙසේවූ සැරසීම් හා අඩුතැන් පිරවීමෙහි නිතර නිතර යෙදෙත්. මෙබඳුවූ සැරසීම් අලංකාර කිරීම් ආදියෙහි යෙදීමෙන් සම්පූර්ණයෙන් වළකියි. මෙයද ඔහුගේ සීලයකි.

43. "එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ කථාය, මහඇමතියන් පිළිබඳ කථාය, සෙනා පිළිබඳ කථාය, භය පිළිබඳ කථාය, යුද පිළිබඳ කථාය, ආහාර පිළිබඳ කථාය, පානවර්ග පිළිබඳ කථාය, ඇඳුම් පිළිබඳ කථාය, ඇඳන් පිළිබඳ කථාය, මාලා පිළිබඳ කථාය, ගන්ධ ද්‍රව්‍යයන් පිළිබඳ කථාය, නෑයන් පිළිබඳ කථාය, රථ පිළිබඳ කථාය, ගම් පිළිබඳ කථාය, නියම්ගම් පිළිබඳ කථාය, නුවර පිළිබඳ කථාය, දනව් පිළිබඳ කථාය, ස්ත්‍රීන් පිළිබඳ කථාය, පුරුෂයන් පිළිබඳ කථාය, ගෑනු දරුවන් පිරිමි

දරුවන් පිළිබඳ කථාය, යොධයන් පිළිබඳ කථාය, වීථි පිළිබඳ කථාය, වතුර ගෙන යන දාසීන් හෝ වතුර ගෙන යන තැන් හෝ පිළිබඳ කථාය, මළ නෑයන් යන ආදීන් පිළිබඳ කථාය, නොයෙක් ආකාරවූ තේරුම් නැති කථාය, ලොකය පිළිබඳ කථාය, මුහුද පිළිබඳ කථාය, භවාභව කථාය යන මෙබඳු පහත් කථාවෙහි යෙදී වෙසෙත්. මෙබඳුවූ පහත් කථාවෙන් සම්පූර්ණයෙන් වළකියි. මෙයද ඔහුගේ සීලයකි.

44 "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා 'ඔබ මේ ධර්මවිනය නොදන්නෙහිය. මම මේ ධර්මවිනය දනිමි.' 'ඔබ මේ ධර්මවිනය කුමකැයි දන්නෙහිද? ඔබ වරදවා පිළිපදින්නෙහිය, මම මනාකොට පිළිපදින්නේවෙමි.' 'මාගේ වචන යහපත්ය හෝ අර්ථය සහිතය, ඔබගේ වචන අර්ථ රහිතය.' 'පළමු කිය යුත්ත පසුව කීයෙහිය' පසුව කිය යුත්ත පළමුව කීයෙහිය යමක් ඔබ බොහෝ කල් පුරුදුකරණ ලද නම් ඒ සියල්ල නිෂ්ඵල විය. ඔබට වාදාරොපනය කරණ ලදී නින්දා කරණ ලද්දෙහිය. වාදයෙන් මිදෙනු පිණිස ක්‍රියා කරව. ඉදින් හැක්කෙහි නම් වාදයෙන් ගැළවෙව, යන ආදි දොෂාරොපණ කථාවෙහි යෙදී වෙසෙත්. මෙසේ මෙබඳු දොෂාරොපණ කථාවෙන් සම්පූර්ණයෙන් වළකින්නේය. මෙයද ඔහුගේ සීලයකි.

45. "එසේම සමහර පින්වත් මහණබමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා රජුන්ගේ, රජ මහ ඇමතියන්ගේ, ක්ෂත්‍රියයන්ගේ, බමුණන්ගේ, ගෘහපතියන්ගේ සහ කුමරුන්ගේද හසුන් ගෙණ, 'මෙතනින් අසවල් තැනට යව, අසවල් තැනින් මෙහි එව, මෙය ගෙණ යව, එතැනින් අසවල්දෙය ගෙණෙව'යි දූත භාවයෙහි හා හසුන් ගෙණ යෑමෙහි යෙදී වෙසෙත්. මෙබඳු දූත භාවය, හසුන් ගෙණයෑම යන මෙයින් වළකින්නේය. මෙයද ඒ ඔහුගේ සීලයකි.

46. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා කුහකයෝද, සිව්පසය උදෙසා කථා කරන්නෝද, නිමිති කරන්නෝද නොහොත් ලාභ සත්කාර සඳහන්

කරවන්නෝද, පරලාභාදිය උදෙසා කියන්නෝද, ලාභයකින් ලාභයක් සොයන්නෝද වෙත්. මෙබඳුවූ කුහක වංචා ප්‍රයෝග අදියෙන් වළකියිද මෙයද ඔහුගේ සීලයකි.'

47 "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා සාමුද්‍රිකා ශාස්ත්‍රය නිමිතිශාස්ත්‍රය, හෙනගැසීම ආදී මහ නිමිති බලා කියන ශාස්ත්‍රය, ස්වප්න ශාස්ත්‍රය ලක්ෂණ ශාස්ත්‍රය මීයන් කැපූ වස්ත්‍රාදිය බලා කියන ශාස්ත්‍රය, ගිනි දෙවියා පිදීමය, දබ්බිහොමය, ථුස හොමය, තණ්ඩුල හොමය, කණ හොමය සප්පි හොමය, තෙල හොමය, මුඛ හොමය ලේ හොමය, ශරීර විද්‍යා වාස්තු විද්‍යා, නීති ශාස්ත්‍රය, සොහොනෙහි ශාන්ති කරන්නාවූ විද්‍යා භූත විද්‍යා, නාග විද්‍යා, විෂ විද්‍යා, ගෝනුසු විද්‍යා, මී විද්‍යා, කුරුළු විද්‍යා, කපුටු විද්‍යා, ජීවිත කාලය කීම, ආයුධ වැළැක්වීම්, තිරිසන් සතුන්ගේ ශබ්ද දැනීම වශයෙන් පැවති මන්ත්‍රය යන පහත් විද්‍යා හේතු කොට ගෙන වැරදි ජීවිතයෙන් ජීවිකා කෙරෙත්. මෙසේ මෙබඳු පහත් විද්‍යා හෙතුවෙන් කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේද මෙයද ඔහුගේ සීලයකි.

48 "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා මණී ලක්ෂණය. වස්ත්‍ර ලක්ෂය, දණ්ඩ ලක්ෂණය, කඩු ලක්ෂණය, දුනු ලක්ෂණය, ආයුධ ලක්ෂණය, ස්ත්‍රී ලක්ෂණය, පුරිස ලක්ෂණය, පිරිමිදරු ලක්ෂණය ගෑනුදරු ලක්ෂණය, දාස ලක්ෂණය, දාසී ලක්ෂණය, ඇත් ලක්ෂණය අශ්ව ලක්ෂණය, කැස්බෑලක්ෂණය, එළු ලක්ෂණය, මීහරක් ලක්ෂණය ගව ලක්ෂණය, ලොකු එළු ලක්ෂණය, කුකුළු ලක්ෂණය, වටු ලක්ෂණය තලගොයි ලක්ෂණය, කර්ණිකා ලක්ෂණය, මුව ලක්ෂණයයි මෙබඳු පහත් විද්‍යාවන් කරණ කොට ගෙණ වැරදි ජීවිකාව කෙරෙත්. මෙසේවූ පහත් විද්‍යාවන් නිසා කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේද මෙයද ඔහුගේ සීලයකි.

49 "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා අසවල් දිනට රජුන්ගේ බැහැර යෑම වන්නේය.

අසවල් දින ඇතුළු නුවරට එන්නේය අසවල් දින ඇතුළු නුවර රජුන් වෙත පැමිණීම වන්නේය. බැහැර රජුන්ගේ බැහැරට යෑම වන්නේය. බැහැර රජුන්ගේ ඇතුළු නුවරට ඊම වන්නේය. ඇතුළුනුවර රජුන්ගේ ආපසු යෑම වන්නේය. ඇතුළු නුවර රජුන්ට ජය වන්නේය. බැහැර රජුන්ගේ පරාජය වන්නේය. බැහැර රජුන්ගේ ජය වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ පරාජය වන්නේය. මෙසේ මොහුට ජය වන්නේය. මෙසේ පරාජය වන්නේයයි' කියා මෙසේ පහත් විද්‍යා හෙතුකොට ලාමක ජීවිකා කෙරෙත්. මෙබඳුවූ පහත් විද්‍යා හෙතුවෙන් කරණ වැරදි ජීවිතයෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ සීලයක් වේ

**50** 'එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා චන්ද්‍රග්‍රහණය වන්නේය. සූර්‍ය්‍යග්‍රහණය වන්නේය, තාරකා සමාගමය වන්නේය. සඳ හිරු දෙදෙනාගේ නියම මාර්ග ගමන වන්නේය, සඳ හිරු දෙදෙනාගේ නොමඟ යෑම වන්නේය, තාරකාවන්ගේ මාර්ග ගමන වන්නේය, තාරකාවන්ගේ නොමග යෑම වන්නේය, උල්කාපාතය වන්නේය, දිසා දැවීම වන්නේය, පොළව කම්පා වන්නේය, අහස ගිගුරුම් වන්නේය, සඳ, හිරු, තාරකාවන්ගේ නැගීම හා බැසීම්ද කෙළෙසීමද පිරිසිදු වීමද වන්නේය, චන්ද්‍ර ග්‍රහණය මෙබඳු විපාක ඇති වන්නේය, සූර්‍ය්‍යග්‍රහණය මෙබඳු විපාක ඇති වන්නේය, තාරකා සමාගමය මෙබඳු විපාක ඇති වන්නේය, චන්ද්‍ර සූර්‍ය්‍යයන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, ඔවුන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇති වන්නේය, තාරකාවන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, තාරකාවන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇති වන්නේය, උල්කාපාතය මෙබඳු විපාක ඇති වන්නේය, දිගුන් දැවීම මෙබඳු විපාක ඇතිවන්නේය, භූමි කම්පාව මෙබඳු විපාක ඇතිවන්නේය, අහස් ගිගුම මෙබඳු විපාක ඇතිවන්නේය. සඳ, හිරු, තාරකාවන්ගේ නැගීම, බැසීම, කිලිටුවීව හා පිරිසිදුවීම මෙබඳු විපාක ඇතිවන්නේයයි' කියා මෙසේ පහත් විද්‍යා හෙතුවෙන් කරණ වැරදි ජීවිකාවෙන් ජීවිකා කෙරෙත්. මෙසේවූ පහත් විද්‍යා හෙතුකොටගෙණ කරණ ලාමක

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ සීලයකි.

51 'එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා 'මනා වැසි ඇතිවන්නේය, මනා වැසි නැතිවන්නේය යහපත් ආහාරපාන ඇති වන්නේය, ආහාර පාන නැති වන්නේය, නිර්භය ඇති වන්නේය, භය ඇතිවන්නේය, රොග ඇතිවන්නේය, නිරෝගී බව ඇතිවන්නේයයි' කීමද, ඇඟිල්ල ඇල්ලීමය, ගණන්කිරීමය, කොටස්කර ගණන් කිරීමය, කාව්‍ය කිරීමය, ලෝකයට සිදුවන දේ ගැන ශාස්ත්‍ර ඉගෙණීමයයි මෙසේ පහත් විද්‍යාවන් කරණකොට වැරදි ජීවිකා කෙරෙත්. මෙසේවූ පහත් විද්‍යා හෙතුවෙන් වන වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ සීලයකි.

52 "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා ආවාහ කරවීමය, විවාහ කරවීමය, සමගිය පිළිබඳ කථාකිරීමය, වියොගය පිළිබඳ කථාකිරීමය, ධන රැස් කිරීමය, වියදම් කිරීමය, යහපත් ශ්‍රියාව ඇතිකිරීමය දුර්ගර්භකරණය ගර්භවිරොධි කරණය, දිව් තද කිරීමය, නූල් බැඳීම, අත් පෙරළීම පිණිස මන්ත්‍ර ජපකිරීමය, ශබ්ද නොඇසීම පිණිස මන්ත්‍ර ජපකිරීමය, කැඩපත්හි දෙවතාරොපණයකොට ප්‍රශ්නඇසීමය, ගෑණු දරුවන්ගේ ශරීරයෙහි දෙවතාරොපණය කොට ප්‍රශ්න ඇසීමය, දෙවදාසියගේ ශරීරයෙහි යකුන් ආරොපණයකොට ප්‍රශ්න ඇසීමය, හිරු වැඳීමය, මහබඹුට උපස්ථාන හෝ වැඳුම් කිරීමය, කටින් ගිනි දැල් පිටකිරීමය, ශ්‍රී දෙවිය කැඳවීමයයි කියන මෙබඳු පහත් විද්‍යාවෙන් වැරදි ජීවිකා කෙරෙත්. මෙබඳු පහත් විජ්ජාවෙන් කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ සීලයකි.

53 "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ශාන්ති කිරීමය, කායසි සමෘද්ධි කටයුතු කර්මය, මන්ත්‍ර කර්මය, භූරිකර්මය, පණ්ඩකයා පුරුෂයකු කිරීමය, පුරුෂයා පණ්ඩක කිරීමය, ගෙවල් නොකළ බිම් ගෙවල් කිරීමය, ගෙට සුදුසු තැන බලිකම් විධානය දියෙන් මූන සුද්ධ කිරීමය,

තැහැවීමය, ගිනි පිදීමය, වමන කරවීමය, විරේක කරවීමය, උඩු කය විරේකය, යටිකය විරේකය, හිස විරේකය, කන්තෙලය, ඇස් බෙහෙත් ගැල්වීමය, නස්‍ය කිරීමය, අඳුන් ගෑමය, සිසිල් බෙහෙත් අඳුන් සෑදීමය, ආයුධ කටු ගසා කරන වෙදකම්මය, ශල්‍යකර්මය, ළදරුවන් පිළිබඳ වෙදකම්මය, මූලික බෙහෙත් දීමය, සැර බෙහෙත්දී පසුව එහිබල හැරීමය කියා හෝ මෙබඳු පහත් විද්‍යා කරණකොට වැරදි ජීවත්වීමෙන් ජීවිකා කෙරෙත්. මෙබඳුවූ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ සීලයකි.

54 "වාසෙට්ඨය, මෙසේ සීලසම්පන්නවූ භික්ෂූහට භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ඔහුගේ සීල සංවරය හෙතුකොටගෙණ කිසි තැනකදී නොඋපදනේය. කුමක් මෙන්ද යත්:- වාසෙට්ඨය, ක්ෂත්‍රියාභිෂෙකයෙන් මුදුනෙහි අභිෂෙක ලද්දාවූ, සතුරන් නැති කළාවූ ක්ෂත්‍රිය රජෙක් කිසියම් සතුරෙකුගෙන් කිසි භයක් නොදක්නේද. එපරිද්දෙන්ම, වාසෙට්ඨය, සීලසම්පන්නවූ භික්ෂුතෙමේ භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු සීලසංවරය හෙතුකොට කිසිතැනකදී නොදක්නේය. ආර්‍ය්‍යවූ (උතුම්වූ) මේ සීල රාශියෙන් යුක්තවූ ඒ භික්ෂුතෙම, තමන්තුළ පිරිසිදුවූ (කායික චෛතසික) සැපය විඳියි. ලොහිච්චය මෙසේ දැක්වූ ශීලයෙන් යුක්තවූ භික්ෂුව සීලසම්පන්න නම් වේ.

55 "වාසෙට්ඨය, භික්ෂුව කෙසේ නම් ඉන්ද්‍රියයන්හි වැසූ දොරටු ඇත්තේද? වාසෙට්ඨය, මේ සස්නෙහි භික්ෂූ තෙමේ ඇසින් රූපයක් දැක එහි නොඇලේ එහි නොපෙළඹෙන්නේය. ඇස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කිපීම ආදී අකුශල ධර්මයෝ හිතට ඇතුල් වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. ඔහු තමාගේ ඇස් ඉන්ද්‍රියය රකී. ඇස් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කණින් ශබ්දයක් අසා එහි නොඇලේ එහි නොපෙළඹෙන්නේය. කන් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කිපීමාදි අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී.

තමාගේ කන් ඉන්ද්‍රියය රකී. කන් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. නාසයට ගඳ සුවඳ දැනී එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය නාස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කිපීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ නාස් ඉන්ද්‍රියය රකී. නාස් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. දිවෙන් රසයක් විඳ එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. දිව්ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කිපීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද එබඳුදෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ දිව් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ කයින් ස්පර්ශයක් ස්පර්ශකොට එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. ශරීර ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කිපීම ආදී අකුශල ධර්මයෝ හිතට ඇතුල් වන්නාහුද එබඳු දෙයින් වැලකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ ශරීර ඉන්ද්‍රියය රකී, ශරීර ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. සිතින් (ධර්මයක්) අරමුණක් දැන එහි නොඇලේ එහි නොපෙළඹෙන්නේය. සිත් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් නිසා දැඩි ආසාව හා කෝපය ආදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. හෙතෙම සිත් ඉන්ද්‍රිය රකී, සිත් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ එබඳුවූ භික්ෂුව උතුම්වූ ශීල රාශියෙන් යුක්තවූයේ අභ්‍යන්තරයෙහි පිරිසිදුවූ අධිචිත්ත සැපය විඳියි. වාසෙට්ඨය, මෙසේවූ භික්ෂුතෙමේ ඉන්ද්‍රියයන්හි වසනලද දොරටු ඇත්තේ වේ.

**56** "වාසෙට්ඨය, භික්ෂුව කෙසේ නම් සිහියෙන් හා මනා ප්‍රඥාවෙන් යුක්තවූයේවේද?"

"වාසෙට්ඨය, මේ සස්නෙහි භික්ෂුතෙම ඉදිරියට යෑමෙහිද, ආපසු යෑමෙහිද, නුවණින් දැන කරන්නේය. ඉදිරි බැලීමෙහිද, වටපිට බැලීමෙහිද නුවණින් දැන බලන්නේය. අත් පා හැකිලීමෙහිද, දිගුකිරීමෙහිද, මනා නුවණින් දැන එසේ කරන්නේය. දෙපට සිවුරය, පාත්‍රය, සිවුරුය යන මේ දේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

දැරීමෙහිද මනා නුවණින් දැන එසේ කරන්නේය. අනුභව කිරීමය, පානය කිරීමය, වැළඳීමය. රස විඳීමය, යන මෙහිද මනා නුවණින් යෙදී එසේ කරන්නේය. මල මූත්‍ර පහකිරීම්ද නුවණින් (ආදිනව) සලකා කරන්නේය. යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොරකිරීම්, කථාකිරීම්, නිශ්ශබ්දව සිටීම් යන මේ දේ මනා නුවණින් දැන කරන්නේය. වාසෙට්ඨය, මෙසේ කරන්නාවූ භික්ෂුතෙමේ සිහියෙන් යුක්තවූයේ යහපත් නුවණින් යුක්තවූයේ වේයි.

57 "වාසෙට්ඨය, භික්ෂුතෙමේ කෙසේ ලද පමණින් සතුටුවූයේ වේද?

"වාසෙට්ඨය, භික්ෂුතෙමේ යන්තම් කය වැසීමට තරම්වූ සිවුරෙන්ද, බඩ ආරක්ෂාවට ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද සතුටු සිත්ඇත්තේවේ ඔහු යම් යම් තැනකට යේනම් අටපිරිකර (කය පිළිබඳවූ දේ) පමණක් ගෙන යයි. වාසෙට්ඨය, යම්සේ පක්ෂියෙක් යම් තැනෙක පියාඹායේනම් ඒ සියලුතැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේද, වාසෙට්ඨය, එපරිද්දෙන්ම භික්ෂුතෙමේද ශරීරය ආරක්ෂාවට ප්‍රමාණවූ සිවුරෙන්ද බඩ ආරක්ෂාවට ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද සතුටුවන්නේ වේ ඔහු යම් තැනක යා නම් අටපිරිකර පමණක් රැගෙණ බැහැර යයි. වාසෙට්ඨය, මෙසේවූ භික්ෂු තෙමේ සන්තෝෂයෙන් යුක්තවේ.

58 "උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූද, උතුම්වූ මේ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූද, මේ උතුම්වූ සන්තොෂයෙන් යුක්තවූද, ඒ භික්ෂුතෙමේ කැලයද, ගහක්මුලද, කඳුපලාත්ද, කඳුරැලි ගල්ගුහාවන් හෝ මහා මගද, සොහොන්ද, ඉතා දුරවූ කැලෑ වාසස්ථානද, බොහෝ ඉඩකඩ ඇති තැන සහ තණ ගුහාද යන මේ ස්ථාන ආශ්‍රය කෙරෙයි. ඔහු පසුබත් කාලයෙහි පිණ්ඩපාතයෙන් හැරීආයේ පර්යංකය බැඳ, (කකුල් අකුලුවා හිඳ) ශරීරයේ උඩු කොටස කෙලින් තබා අරමුණට සිහිය එළවා හිඳී.

59 "ඔහු ලොකයෙහි ලොභය පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේ. ලොභයෙන් සිත පිරිසිදු කෙරේ. සිත

කෙලසන්නාවූ ක්‍රොධය පහකොට, ක්‍රොධයෙන් දුරුවූ සිත් ඇතිව පණ ඇති සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේව වාසය කරයි. ක්‍රොධ දොෂයෙන් සිත පිරිසිදු කෙරේ. කාය චිත්ත දෙදෙනාගේ අලසබව දුරුකොට කය-සිත පිළිබඳ පහවූ අලසබව ඇත්තේ පිරිසිදු හැඟීම් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥා ඇත්තෙක්ව වෙසේ. අලසබව දුරුකොට සිත පිරිසිදු කෙරේ. නොසන්සුන්කම හා පසුතැවීම දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව වාසයකෙරේ. ඇතුළත සංසිඳුන සිත් ඇත්තේ සිත විසිරයාම හා පසුතැවීමෙන් පිරිසිදු කෙරේ. විචිකිච්ඡාව (සැකය) දුරුකොට, පහකළ විචිකිච්ඡා ඇත්තේ කුශලධර්ම විෂයෙහි සැක නැතිව වෙසේ, විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කෙරේ.

**60** "වාසෙට්ඨය, යම්සේ පුරුෂයෙක් ණය ගෙණ කර්මාන්තයන්හි යොදන්නේද ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණු වන්නාහු නම් ඔහුගේ ඒ පරණ ණය මුදල් සියල්ලම ගෙවන්නේය. ඔහුගේ අඹු දරුවන් ආරක්ෂාකරණ පිණිස වැඩි යමක් ඉතුරුවූයේ නම් ඕහට මෙබඳු අදහසක් ඇතිවේ. 'මම පළමුවෙන් ණය ගෙණ කර්මාන්තයන්හි යෙදුවෙමි. ඒ මාගේ කර්මාන්තයෝ දියුණුවූහ. ඒ මම පැරණි ණය ගෙවූයෙමි. අඹු දරුවන් පොෂ්‍යකිරීම පිණිස අතිරේක මුදලක්ද මට ඇත්තේය' කියායි. හෙතෙම ඒ ණය නැති බව මුල්කොට ගෙණ බලවත් සතුටක් ලබන්නේය. සතුටටද පැමිණෙන්නේය.

**61** "වාසෙට්ඨය, යම්සේ රෝගයෙන් පෙළෙන දුක් ඇත්තාවූ, දැඩි ගිලන්බව ඇති පුරුෂයෙක් වන්නේද, ඕහට ආහාර රුචිනොවන්නේද, ඔහුගේ ශරීරයෙහි කිසි ශක්තියක් නැත්තේද වෙයි. ඒ පුරුෂයා පසු කාලයක ඒ ආබාධයෙන් මිදෙන්නේ නම් ඔහුට ආහාර රුචිය ඇතිවන්නේ නම්, ඔහුගේ ශරීර බලය ඇතිවන්නේ නම්, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. කෙබඳුද යත්: මම පෙර ආබාධ ඇත්තාවූ, දුක් ඇති දැඩි ගිලන් බව ඇති කෙනෙක් වීමි. මට බත් රුචියද නොවීය ශරීර බලයද නැතිවිය. ඒ මම පළමුතිබූ ආබාධයෙන් මිදුනෙමි. මට ආහාර රුචියද ඇත්තේය. කාය බලයද තිබේය' කියායි ඔහු ඒ කාරණය

මුල්කොට බලවත් සතුටක් ලබන්නේය, සොම්නසටද පැමිණෙන්නේය.

62 "වාසෙට්ඨය, යම්සේ පුරුෂයෙක් සිරගෙයි බැඳුනේ වේද, ඔහු පසු කලක පීඩා නැතුව සැපසේ ඒ සිරගෙයින් මිදෙන්නේය. ඔහුගේ කෑම පිළිබඳ කිසිත් වියදමක්ද නොවන්නේය. ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම් "මම පෙර සිරගෙයි බැඳුනෙක් වූයෙමි. ඒ මම දැන් පීඩා රහිතව සැපසේ ඒ සිරගෙයින් මිදුනෙමි. මගේ කෑම පිළිබඳ කිසි වියදමක්ද නොවූයේය' කියායි. ඔහු සිරගෙයින් මිදීම නිමිතිකොට බලවත් සතුටක් ලබන්නේය, සතුටටද පැමිණෙන්නේය.

63 "වාසෙට්ඨය, යම්සේ සිය කැමැත්තෙන් යමක් කරන්ට නොහැකිවූ අනුන්ට යටත්වූ තමා කැමති ගමනක් ඒ වූ පරිදි යා නොහැකිවූ වැඩකරුවෙක් වන්නේද ඔහු පසු කලක ඒ දාස භාවයෙන් මිදෙන්නේ, තමාම අධිපතිකොට ඇත්තේ අනුන්ට යටත් නොව තමාගෙන්ම යැපෙන්නේ, සිය අදහස් පරිදි ඒ ඒ තැන යාහැකි වන්නේද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: 'මම පෙර තමා කැමැති පරිදි යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත් මාඅදහස් පරිදි කිසි තැනෙක යා නොහැකි දාසයෙක් වීමි. ඒ මම දැන් ඒ දාස භාවයෙන් මිදුනෙක්මි. තමා අධිපතිකොට ඇත්තෙක් වීම. අනුන්ට යටත්නූන කෙනෙක් වීමි. අනුන්ට යටත් නොව මා සපයාගත් දෙයින්ම යැපෙන්නෙමි. මා අදහස් පරිදි ඒ ඒ කැමැති තැනෙක යා හැක්කේද වෙමි'යි කියායි. ඔහු ඒ දාසභාවයෙන් මිදීම හෙතුකොට බලවත් සතුටක් ලබන්නේය. එසේම සතුටටද පැමිණෙන්නේය.

64 "වාසෙට්ඨය, යම්සේ ධනවත්වූ භොග සම්පත් ඇති පුරුෂයෙක් ආහාර දුර්ලභවූ, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණෙන්නේද, ඔහු මද කලකින් ඒ කාන්තාර මාර්ගය ඉක්මවා යන්නේ සොර සතුරන්ගෙන් පීඩා නැති ගම්මානයකට සැපසේ ක්‍රමයෙන් පැමිණෙන්නේද, ඔහුට මෙබඳු අදහසක් ඇතිවේ. එනම්:- 'මම පෙර ධනවත් වූයෙමි, දුර්ලභ භික්ෂා ඇති භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට

පැමිණියෙක් වූයෙමි. එසේවූ මම දැන් එම කාන්තාර මාර්ගය පසුකෙළෙමි. සැපවත්වූ භය රහිතවූ, ගමකට සැපසේ ක්‍රමයෙන් පැමිණියෙමියි'කියායි. ඒ පුරුෂයා ඒ කාන්තාර මාර්ගය එතර කිරීම නිමිතිකොට බලවත් සතුටක් ලබන්නේය, එසේම සතුටටද පැමිණෙන්නේය.

**65.** "වාසෙට්ඨය, ණය යම්සේද, රෝගය යම්සේද, හිරගේ යම්සේද, දාසභාවය යම්සේද, දීර්ඝ කාන්තාර මාර්ගය යම්සේද, එපරිද්දෙන් භික්ෂුතෙමේ පහනොකළ (පඤ්ච නීරවණ) කුසල් වළක්වන කරුණු පහ තමා කෙරෙහි ඇති බව නුවණින් දකී. වාසෙට්ඨය, ණය නැති බව යම්සේද, නිරෝගි බව යම්සේද, සිර ගෙයින් මිදීම යම්සේද, අනුන්ට යටහත් නැති බව යම්සේද, භය නැති භූමිය යම්සේද එපරිද්දෙන්ම වාසෙට්ඨය, භික්ෂුතෙමේ පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමන් තුළ නැති බව නුවණින් දක්නේය.

**66.** "පහකළාවූ (නීවරණ) නුවණ මුවාකරණ ධර්ම පස තමා තුළ නැතැයි දක්නාවූ ඒ භික්ෂුවට සතුට උපදියි. සියලු ශරීරයෙහි පැතිර යන බලවත් සතුට උපදියි. බලවත් සතුට උපන්නහුගේ සිත කෙලෙස් දැවිල්ලෙන් සංසිඳෙයි. සිත සංසිඳී ගිය තැනැත්තේ සැපය විඳියි. සැපට පැමිණියහුගේ සිත එකඟවෙයි.

**67.** "ඒ භික්ෂුතෙම මෛත්‍රිය සමග පැවැත්තාවූ සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කෙරේ. දෙවෙනි දිසාවද එසේම තුන්වෙනි දිසාවද, එසේම සතරවෙනි දිසාවදැයි, මෙසේ උඩද යටද හරහදැයි සියලු කාලයෙහි සියලු තැන පැතිර පවත්නා බැවින් සියල්ල ඇත්තාවූ ලොකය මෛත්‍රිය සමග පැවැත්තාවූ මහත්වූ උසස් බවට පැමිණියාවූ ප්‍රමාණ කළ නොහැකිවූ වෛර නැත්තාවූ ක්‍රොධ රහිතවූ සිතින් පතුරුවා වාසය කෙරේ"

**68** "වාසෙට්ඨය, බලසම්පන්නවූ සක් පිඹින්නෙක් පහසුවෙන්ම හතර දිසාවන් සක්ගෙඩි නාදයෙන් යම්සේ පතුරුවන්නේද, වාසෙට්ඨය, එසේම වඩන ලද්දාවූ මෛත්‍රී

සහගත සමාධියෙන් (කෙලෙස් සහිත හෙයින්) ප්‍රමාණ කරන ලද කාම ලොකයට අයත් යම් කුශල කර්මයක් වේද, (කාමාවචර) ඒ කාම ලොකයට අයත් කුසල කර්මය තෙමේ ඒ මහද්ගත කුසල කර්මය (රූපාවචර, අරූපාවචර කුසලය) යටපත්කර නොසිටි එය මැඩගෙන නොපිහිටයි. මේ මාර්ගයද බ්‍රහ්මයාගේ සහභාවය පිණිස පවතී.

**69.** "නැවතද භික්ෂු තෙම කරුණාව සමග පැවැත්තාවූ සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කෙරේ. දෙවෙනි දිගද එසේම තුන්වන දිගද එසේම සතරවෙනි දිග දැයි මෙසේ උඩද යටද හරහදැයි සියලු කල සියලු තැන පැතිර පවත්නා බැවින් සියල්ල ඇත්තාවූ ලොකය කරුණාව සමග පැවැත්තාවූ මහත්වූ උසස් බවට පැමිණියාවූ ප්‍රමාණ නොකළ හැකි වෛර රහිතවූ (ව්‍යාපාද) ක්‍රොධ රහිතවූ සිතින් පතුරුවා වාසය කෙරේ.

**70.** "වාසෙට්ඨය, බලසම්පන්නවූ සක් පිඹින්නෙක් සුවසේම සතර දිසාවන් හක්ගෙඩි නාදයෙන් යම්සේ පතුරුවන්නේද, වාසෙට්ඨය, එසේම වඩන ලද්දාවූ කරුණා සහගත සමාධිය කරණකොට ප්‍රමාණ කරනලද යම් කාම ලොකයට අයත් කුශල කර්මයක් වේද ඒ කාම ලොකයට අයත් කුසල කර්මය තෙමේ ඒ මහද්ගත කුසලකර්මය යටපත්කර නොසිටී. එය මැඩගෙන නොපිහිටයි. වාසෙට්ඨය, මේ මාර්ගයද බ්‍රහ්මයාගේ සහභාවය පිණිස පවතී.

"නැවතද වාසෙට්ඨය, ඒ භික්ෂුතෙමේ මුදිතා සහගත (සැප ඇත්තවුන්ගේ සැපයට සතුටුවීම සහිත) සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයිද දෙවෙනි දිසාවද තුන්වැනි දිසාවද සතරවැනි දිසාවද උඩද යටද සරසද සියලු කල්හි සියලු තැන පැතිර පවත්නා හෙයින් සියල්ල සහිතවූ ලොකය මහත්වූ උසස් බවට ගියාවූ අප්‍රමාණවූ ක්‍රොධ රහිත මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කරයි.

"වාසෙට්ඨය, යම්සේ බලවත් සක් පිඹින්නෙක් පහසුවෙන්ම සතර දිසාව සක් හඬින් පතුරුවන්නේද එමෙන් මුදිතා සහගත

සමාධිය කරණකොට කෙලෙස් සහිත හෙයින් ප්‍රමාණ කරවූ කාමාවචර කුසලකර්මය තෙමේ ඒ මහද්ගත කර්මය යටපත්කර නොසිටී. එය මැඩගෙන නොපිහිටයි. වාසෙට්ඨය, මේ මාර්ගයද බ්‍රහ්මයා හා එක්වීම පිණිස පවත්නේය.

"නැවතද වාසෙට්ඨය, ඒ භික්ෂුතෙමේ උපෙක්ඛා සහගත සිතින් එක් දිසාවක්ද දෙවෙනි දිසාවද තුන්වැනි දිසාවද සතරවැනි දිසාවද උඩද යටද සරසද සියලු තන්හි සියලු කල්හි සියලු තැන පැතිර පවත්නා හෙයින් සියල්ල ඇත්තාවූ ලොකය මහත්වූ උසස් බවට ගියාවූ අප්‍රමාණවූ ක්‍රොධ රහිතවූ උපෙක්ෂා සහිත සිතින් පතුරුවා වාසය කරයි

"වාසෙට්ඨය, යම්සේ බලවත් සක් පිඹින්නෙක් පහසුවෙන් සතර දිසාව සක්හඬින් පතුරුවන්නේද එමෙන් උපෙක්ෂා සහගත සමාධිය කරණකොට ප්‍රමාණ කරවූ කාමාවචර කුසල කර්මය තෙමේ ඒ මහද්ගත කර්මය යටපත්කර නොසිටී. එය මැඩගෙන නොපිහිටයි. වාසෙට්ඨය, මේ මාර්ගයද බ්‍රහ්මයා හා සමග එක්වීම පිණිස පවත්නේය.

71. "වාසෙට්ඨය, ඒ කුමකැයි සිතන්නෙහිද? මෙබඳු (හතර ආකාර) බ්‍රහ්මවිහරණ ඇත්තාවූ ඒ භික්ෂු තෙම ස්ත්‍රීන් සමග වාසය ඇත්තේ හෝ ස්ත්‍රීන් සමග වාසය නැත්තේද?"

'භවද් ගෞතමයන් වහන්ස, ස්ත්‍රීන් සමග වාසය නැත්තේය."

"වෛර සිත් ඇත්තේ හෝ වෛර සිත් නැත්තේද?

"භවද් ගෞතමයන් වහන්ස, වෛර සිත් නැත්තේය.

(ව්‍යාපාද) ක්‍රොධ සිත් ඇත්තේ හෝ ක්‍රොධ සිත් නැත්තේද?

"භවද් ගෞතමයන් වහන්ස, ක්‍රොධ සිත් නැත්තේය.'

"කිලුටු සිත් ඇත්තේ හෝ නොකිලුටු සිත් ඇත්තේද?"

"භවද් ගෞතමයන් වහන්ස, නොකිලුටු සිත් ඇත්තේය."

"පුරුදු කරනලද සිත් ඇත්තේ හෝ නැත්තේද?"

"භවද් ගෞතමයන් වහන්ස, පුරුදු කරනලද සිත් ඇත්තේයයි" කීයේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

72. "වාසෙට්ඨය, මෙසේවූ කල භික්ෂු තෙමෙ ස්ත්‍රීන් සමග වාසය නැත්තේය. බ්‍රහ්ම තෙමද ස්ත්‍රීන් සමග වාසය නැත්තේය. කිමෙක්ද? ස්ත්‍රීන් සමග වාසය නැත්තාවූ බ්‍රහ්මයා සමග ස්ත්‍රීන් සමග වාසය නැත්තාවූ භික්ෂුහුගේ පැවැත්මගැළපේද? සමභාවයට පැමිණේද?"

'භවද් ගෞතමයන් වහන්ස, එසේය."

"වාසෙට්ඨය, හොඳයි වාසෙට්ඨය, 'ඒකාන්තයෙන් ස්ත්‍රීන් සමග වාසයක් නැත්තාවූ ඒ භික්ෂු තෙම (ශරීරය අභාවයට යෑමෙන්) මරණින් මතු ස්ත්‍රීන් හා වාසයක් නැත්තාවූ බ්‍රහ්මයාගේ සහභාවයට පැමිණෙන්නෙක් වන්නේය.' යන මේ කාරණය ඇත්තමය. වාසෙට්ඨය, මෙසේවූ කල භික්ෂුතෙම වෛර රහිත සිත් ඇත්තේය. බ්‍රහ්මතෙමද වෛර රහිත සිත් ඇත්තේය කිමෙක්ද? වෛර සිත් රහිත බ්‍රහ්මයා සමග වෛර සිත් රහිත භික්ෂුහුගේ පැවැත්ම ගැළපේද? සමභාවයට පැමිණේද?"

"භවද් ගෞතමයන් වහන්ස, එසේය."

"වාසෙට්ඨය, හොඳයි, වාසෙට්ඨය, 'ඒකාන්තයෙන් වෛර සිත් රහිතවූ ඒ භික්ෂු තෙම (ශරීරය අභාවයට යෑමෙන්) මරණින් මතු වෛර සිත් රහිත බ්‍රහ්මයාගේ සහභාවයට පැමිණෙන්නෙක් වන්නේය' යන මේ කාරණය ඇත්තමය

"වාසෙට්ඨය, මෙසේවූ කල භික්ෂු තෙම ක්‍රොධ සිත් රහිතය, බ්‍රහ්මතෙම ද ක්‍රොධ සිත් රහිතය. කුමක්ද? ක්‍රොධ සිත් රහිතවූ බ්‍රහ්මයා සමග ක්‍රොධ සිත් රහිතවූ භික්ෂූහුගේ පැවැත්ම ගලපේද? සමභාවයට පැමිණේද?"

"භවද් ගෞතමයන් වහන්ස, එසේය."

"වාසෙට්ඨය, හොඳයි, වාසෙට්ඨය, ඒකාන්තයෙන් ක්‍රොධ රහිත සිත් ඇත්තාවූ ඒ භික්ෂු තෙම (ශරීරය අභාවයට යෑමෙන්) මරණින් මතු ක්‍රොධ රහිත සිත් ඇත්තාවූ බ්‍රහ්මයාගේ සහභාවයට පැමිණෙන්නෙක් වන්නේය' යන මේ කාරණය ඇත්තමය.

"වාසෙට්ඨය, මෙසේවූ කල භික්ෂු තෙම කිලුටු සිත් නැත්තේය. බ්‍රහ්ම තෙමද කිලුටු සිත් නැත්තේය. කිමෙක්ද කිලුටු

සිත් නැත්තාවූ බ්‍රහ්මයා සමග කිලුටු සිත් නැත්තාවූ භික්ෂුහුගේ පැවැත්ම ගැලපේද? සමභාවයට පැමිණේද?

"භවද් ගෞතමයන් වහන්ස, එසේය."

'වාසෙට්ඨය, හොඳයි, වාසෙට්ඨය, 'ඒකාන්තයෙන් කිලුටු සිත් නැත්තාවූ භික්ෂූ තෙම (ශරීරය අභාවයට යෑමෙන්) මරණින් මතු කිලුටු සිත් නැත්තාවූ බ්‍රහ්මයාගේ සහභාවයට පැමිණෙන්නෙක් වන්නේය' යන මේ කාරණය ඇත්තමය.

"වාසෙට්ඨය, මෙසේවූ කල භික්ෂූ තෙම, පුරුදු කරන ලද සිත් ඇත්තේය. බ්‍රහ්ම තෙමද පුරුදු කරනලද සිත් ඇත්තේය. කිමෙක්ද? පුරුදු කරන ලද සිත් ඇත්තාවූ බ්‍රහ්මයා සමග පුරුදු කරන ලද සිත් ඇත්තාවූ භික්ෂූහුගේ පැවැත්ම ගැළපේද? සම භාවයට පැමිණේද?"

"භවද් ගෞතමයන් වහන්ස, එසේය."

"වාසෙට්ඨය, හොඳයි, වාසෙට්ඨය, 'ඒකාන්තයෙන් පුරුදු කරන ලද සිත් ඇත්තාවූ භික්ෂූ තෙම (ශරීරය අභාවයට යෑමෙන්) මරණින් මතු පුරුදු කරන ලද සිත් ඇත්තාවූ බ්‍රහ්මයාගේ සහභාවයට පැමිණෙන්නෙක් වන්නේය' යන මේ කාරණය ඇත්තමයයි" කීවෝය.

73 මෙසේ කී කල වාසෙට්ඨ භාරද්වාජ තරුණයෝ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීවෝය.

"භවද් ගෞතමයන් වහන්ස, ධර්මදේශනාව ඉතා හොඳයි. භවද් ගෞතමයන් වහන්ස, ධර්මදේශනාව ඉතා හොඳය, භවද් ගෞතමයන් වහන්ස, යටිකුරුකොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ යම්සේද, වැසී තිබෙන්නක් එළිදරව්කොට දක්වන්නේ හෝ යම්සේද, මංමුළා වූවෙකුට මග කියන්නේ හෝ යම්සේද, 'ඇස් ඇත්තෝ රූපයන් දකිත්වායි' අඳුරෙහි තෙල් පහනක් දරන්නේ හෝ යම්සේද, එසේම භවද් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් කාරණයෙන් ධර්මය ප්‍රකාශ කරන ලද්දේය, මේ අප භවද් ගෞතමයන් වහන්සේ අද පටන්

දිව්හිමිකොට සරණ ගිය උපාසකයන්යයි දරා ගන්නා සේක්වායි” කීවෝය.

(දහතුන්වෙනිවූ තෙවිජ්ජ සූත්‍රය නිමියේයි)

බ්‍රහ්මජාල, සාමඤ්ඤඵල, අම්බට්ඨ, සොණදණ්ඩ, කූටදන්ත, මහාලි, ජාලිය, කස්සප සීහනාද, පොට්ඨපාද, සුභ, කෙවට්ට, ලොහිච්ච, තෙවිජ්ජ’ යයි මේ වර්ගයෙහි සූත්‍ර දහතුනක් ඇත්තේය.

(පළමුවෙනිවූ ශීලස්කන්ධ වර්ගය නිමියේය.)

---

## 14. මහාපදාන සූත්‍රය

1 මේ මාගේ ඇසීමය-(මා විසින් මෙසේ අසනලදී,) එක් කලක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ ජේතවනයෙහි අනේපිඩු මහා සිටාණන් විසින් කරවනලද ආරාමයෙහි වාසය කරති. එවිට පසුබත් කාලයෙහි පිණ්ඩපාතයෙන් හැරී ඇවුත් කරෙරි (ලුණුවරණ ගස්වලින් වටවූ) මණ්ඩපය අසල විවේකගන්නා ශාලාවෙහි එක්ව උන්නාවූ රැස්වූ භික්ෂූන් අතරෙහි අතීත ආත්ම පිළිවෙළ මෙසේය. පෙරවිසූ ආත්ම මෙසේයයි භාග්‍යවතුන්වහන්සේගේ පෙරවිසූ ආත්ම දන්නාවූ ඥානය පිළිබඳ ධාර්මික කථාවක් උපන්නේය.

2 භාග්‍යවතුන් වහන්සේ පිරිසිදුවූ මනුෂ්‍ය ඥානය ඉක්ම පැවැත්තාවූ දිව්‍යකණින් ඒ භික්ෂූන්ගේ මේ කථාවඇසුවෝය. එවිට භාග්‍යවතුන් වහන්සේ උන් ආසනයෙන් නැගිට කෙරෙරි මණ්ඩපය සමීපයෙහිවූ විවේකගන්නා ශාලාව යම් තැනෙක්හිද එතනට පැමිණියෝය. පැමිණ පැණවූ ආසනයෙහි වැඩ උන්හ. වැඩහිඳ භාග්‍යවතුන්වහන්සේ “මහණෙනි, මෙහි තෙපි දැන් කිනම් කථාවකින් යුක්තව උන්නහුද? තොපගේ කිනම් කථාවක් අතරතුර නතර කළාහුදැයි” ඇසුවෝය.

3 මෙසේ ඇසූකල ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීවෝය. “ස්වාමීන් වහන්ස, මෙහි පිණ්ඩපාතයෙන්

හැරී ආවාවූ, කරෙරි මණ්ඩපය සමීපයෙහිවූ විවේක ගන්නා ශාලාවෙහි එක්ව උන්නාවූ රැස්වූ අප අතරෙහි පෙර ආත්ම මෙසේය. පෙර ආත්ම මෙසේයයි භාග්‍යවතුන් වහන්සේගේ ඉහත ආත්ම දැනගැනීමේ ඥානය පිළිබඳවූ ධාර්මික කථාවක් භාග්‍යවතුන් වහන්සේ ගැන උපන්නේය. ස්වාමීන් වහන්ස, අපගේ මේ කථාව අතරතුර නැවැත්වූහ. එකල භාග්‍යවතුන් වහන්සේ වැඩියෝයයි" කීවාහුය.

4 "මහණෙනි, තෙපි පෙර විසූ ආත්ම පිළිබඳවූ ධර්ම කථාවක් අසන්නට කිමෙක කැමැත්තහුදැයි" ඇසුවෝය.

"යම් හේතුවකින් භාග්‍යවතුන් වහන්සේ ඉහත ආත්ම පිළිබඳවූ ධර්ම කථාවක් දෙශනා කරන්නේ නම්, භාග්‍යවතුන් වහන්ස, මේ ඊට සුදුසු කාලයයි. තථාගතයන් වහන්ස, මේ ඊට සුදුසු කාලයයි. භාග්‍යවතුන් වහන්සේ වෙතින් අසා භික්ෂූහු දරාගන්නාහුයයි" කීවෝය

"මහණෙනි, එහෙනම් අසව්, හොඳින් සිහිකරව්, කියන්නෙමියි' වදාළහ.

"ස්වාමීන් වහන්ස, එසේයයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළෝය.

5 "මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සි බුදුරජාණන් වහන්සේ මෙයින් අනූඑක්වෙනි කල්පයෙහි ලොවපහළ වූවෝය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ සිඛී බුදුරජාණන් වහන්සේ මෙයින් තිස්එක්වෙනි කල්පයෙහි ලොව පහළ වූවෝය. මහණෙනි, ඒ තිස් එක්වෙනි කල්පයෙහිම අර්හත් සම්‍යක් සම්බුද්ධවූ වෙස්සභූ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූවෝය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කකුසන්ධ නම් බුදුරජාණන් වහන්සේ මේ මහාභද්‍ර කල්පයෙහිම ලොව පහළ වූවෝය මහණෙනි, මේ මහාභද්‍ර කල්පයෙහිම අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කොණාගමන නම් බුදුරජාණන් වහන්සේ ලොව පහළවූවෝය. මහණෙනි, මේ මහාභද්‍ර කල්පයෙහිම අර්හත්

සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූවෝය. මහණෙනි, මේ මහාභද්‍ර කල්පයෙහිම දැන් අර්හත් සම්‍යක් සම්බුද්ධවූ මම උපන්නෙමි.”

කල්ප පරිච්ඡෙද කථායි.

6 “මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී බුදුරජාණන් වහන්සේ ජාතියෙන් ක්ෂත්‍රිය වූවෝය. ක්ෂත්‍රිය කුලයෙහි උපන්නෝය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ සිඛී බුදුරජාණන් වහන්සේ ජාතියෙන් ක්ෂත්‍රිය වූවෝය. ක්ෂත්‍රිය කුලයෙහි උපන්නෝය මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ වෙස්සභූ බුදුරජාණන් වහන්සේ ජාතියෙන් ක්ෂත්‍රිය වූවෝය. ක්ෂත්‍රිය කුලයෙහි උපන්නෝය මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කකුසන්ධ බුදුරජාණන් වහන්සේ ජාතියෙන් බ්‍රාහ්මණ වූවෝය. බ්‍රාහ්මණ කුලයෙහි උපන්නෝය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කොණාගමන බුදුරජාණන් වහන්සේ ජාතියෙන් බ්‍රාහ්මණ වූවෝය. බ්‍රාහ්මණ කුලයෙහි උපන්නෝය. මහණෙනි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ජාතියෙන් බ්‍රාහ්මණ වූවෝය, බ්‍රාහ්මණ කුලයෙහි උපන්නෝය. මහණෙනි, දැන් අර්හත් සම්‍යක් සම්බුද්ධවූ මම ජාතියෙන් ක්ෂත්‍රිය වූයෙමි. ක්ෂත්‍රිය කුලයෙහි උපන්නෙමි.”

ජාති පරිච්ඡෙද කථායි.

7 “මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී බුදුරජාණන් වහන්සේ ගොත්‍රයෙන් කොණ්ඩඤ්ඤ නම් වූවෝය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ සිඛී බුදුරජාණන් වහන්සේ ගොත්‍රයෙන් කොණ්ඩඤ්ඤ නම් වූවෝය මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ වෙස්සභූ බුදුරජාණන් වහන්සේ ගොත්‍රයෙන් කොණ්ඩඤ්ඤ නම් වූවෝය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කකුසන්ධ බුදුරජාණන් වහන්සේ ගොත්‍රයෙන් කාශ්‍යප නම් වූවෝය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කොණාගමන බුදුරජාණන් වහන්සේ ගොත්‍රයෙන් කාශ්‍යප නම් වූවෝය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ගොත්‍රයෙන් කාශ්‍යප නම් වූවෝය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මහණෙනි, දැන් අර්හත් සම්‍යක් සම්බුද්ධවූ මම ගොත්‍රයෙන් ගෞතම නම් වූයෙමි.”

ගොත්‍ර පරිච්ඡෙද කථායි

8 “මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට අසූ දහසක් අවුරුදු ආයුෂ කාලය විය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ සිඛී භාග්‍යවතුන් වහන්සේට සැත්තෑ දහසක් අවුරුදු ආයුෂ කාලය විය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේට සැට දහසක් අවුරුදු ආයුෂ කාලය විය මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කකුසන්ධ භාග්‍යවතුන් වහන්සේට සතලිස් දහසක් අවුරුදු ආයුෂ ප්‍රමාණය විය මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කොණාගමන භාග්‍යවතුන් වහන්සේට තිස් දහසක් අවුරුදු ආයුෂ ප්‍රමාණය විය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේට විසිදහසක් අවුරුදු ආයුෂ ප්‍රමාණය විය. මහණෙනි, දැන් මට ආයුෂ ප්‍රමාණය ස්වල්ප ටික කාලයක් වෙයි යමෙක් වැඩි කලක් ජීවත් වේනම් ඔහු අවුරුදු සියයකට අඩු කාලයක් හෝ වැඩි කාලයක් ජීවත් වෙයි”

ආයුෂ පරිච්ඡෙද කථාවයි.

9 “මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සීවූ බුදුරජාණන් වහන්සේ පළොල් රුක මුල බුදුවූසේක. මහණෙනි, අර්හත්වූ සම්මා සම්බුද්ධවූ සිඛී බුදුරජාණන් වහන්සේ ඇටඹ රුක් මුලදී බුදුවූ සේක. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ වෙස්සභූ බුදුරජාණන් වහන්සේ සල්රුක මුලදී බුදුවූ සේක. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කකුසඳ බුදුරජාණන් වහන්සේ මහරි රුක් මුලදී බුදුවූ සේක. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කොණාගමන බුදුරජාණන් වහන්සේ දිඹුල් රුක්මුලදී බුදුවූසේක. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප බුදු රජාණන් වහන්සේ නුගරුක් මුලදී බුදුවූසේක. මහණෙනි, දැන් අර්හත් සම්‍යක් සම්බුද්ධවූ මම ඇසටු රුක් මුලදී බුදුවූයෙමි”

බොධි පරිච්ඡෙද කථායි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

10 "මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට ඛණ්ඩය, තිස්සය යනු අග්‍ර ශ්‍රාවකයෝ දෙදෙනෙක් වූවෝය.

"මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ සිඛී භාග්‍යවතුන් වහන්සේට අභිභූ, සම්භව යන අග්‍ර ශ්‍රාවකයෝ දෙදෙනෙක් වූවෝය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේට සොණය, උත්තරය යන අග්‍ර ශ්‍රාවකයෝ දෙදෙනෙක් වූවෝය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කකුසන්ධ භාග්‍යවතුන් වහන්සේට විධුරය සංජීවය යන අග්‍ර ශ්‍රාවකයෝ දෙදෙනෙක් වූවෝය.

"මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කොණාගමන භාග්‍යවතුන් වහන්සේට භීයොසොය, උත්තරය යන අග්‍ර ශ්‍රාවකයෝ දෙදෙනෙක් වූවෝය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන්වහන්සේට තිස්සය, භාරද්වාජය යන අග්‍ර ශ්‍රාවකයෝ දෙදෙනෙක් වූවෝය. මහණෙනි, දැන් මට සාරිපුත්තය, මොග්ගල්ලානය යන අග්‍ර ශ්‍රාවකයෝ දෙදෙනෙක් වූවෝය."

ශ්‍රාවක යුග පරිච්ඡෙද කථායි

11 "මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට ශ්‍රාවකයන්ගේ රැස්වීම් තුණක් වූහ. සැට අටලක්ෂයක් භික්ෂූන් ඇති එක් ශ්‍රාවක රැස්වීමක් වීය. භික්ෂූන් ලක්ෂයක් ඇති එක් ශ්‍රාවක රැස්වීමක් විය. අසූ දහසක් භික්ෂූන් ඇති එක් ශ්‍රාවක රැස්වීමක් වීය. මහණෙනි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට සියල්ලන්ම රහත්වූ මේ ශ්‍රාවක රැස්වීම් තුණ වූහ. මහණෙනි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ සිඛී භාග්‍යවතුන් වහන්සේට ශ්‍රාවකයන්ගේ රැස්වීම් තුනක් වූහ. අර්හත් භික්ෂුන් ලක්ෂයක් ඇති එක් ශ්‍රාවක රැස්වීමක් වීය. අර්හත් භික්ෂුන් අසූදහසක් ඇති එක් ශ්‍රාවක රැස්වීමක් විය. තිස්හත් දහසක් අර්හත් භික්ෂූන් ඇති එක් ශ්‍රාවක රැස්වීමක් විය. මහණෙනි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ සිඛී

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

භාග්‍යවතුන් වහන්සේට සියල්ලන්ම රහත්වූ භික්ෂූන්ගේ මේ රැස්වීම් තුණ වූහ.

"මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේට ශ්‍රාවකයන්ගේ රැස්වීම් තුණක් වූහ. අසූ දහසක් භික්ෂූන් ඇති එක් ශ්‍රාවක රැස්වීමක් විය. සැත්තෑ දහසක් භික්ෂූන් ඇති එක් ශ්‍රාවක රැස්වීමක් විය. සැටදහසක් භික්ෂූන් ඇති එක් ශ්‍රාවක රැස්වීමක් විය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේට සියල්ලන්ම රහත්වූ මේ ශ්‍රාවක රැස්වීම් තුණ වූහ.

"මහණෙනි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කකුසන්ධ භාග්‍යවතුන් වහන්සේට සතළිස් දහසක් භික්ෂූන් ඇති එක් ශ්‍රාවක රැස්වීමක් විය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කකුසන්ධ භාග්‍යවතුන් වහන්සේට සියල්ලන්ම රහත්වූ මේ එකම ශ්‍රාවක රැස්වීම වූයේය, මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කොණාගමන භාග්‍යවතුන් වහන්සේට තිස්දහසක් භික්ෂූන් ඇති එක් ශ්‍රාවක රැස්වීමක් වීය. මහණෙනි, කොණාගමන භාග්‍යවතුන්වහන්සේට සියල්ලන්ම රහත්වූ මේ එකම රැස්වීම වීය. මහණෙනි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේට විසිදාහක් ශ්‍රාවකයන් ඇති එක රැස්වීමක් විය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේට සියල්ලන්ම රහත්වූ මේ එකම ශ්‍රාවක රැස්වීම වූයේය. මහණෙනි, දැන් මට එක් දහස් දෙසිය පණසක් භික්ෂූන් ඇති එක් ශ්‍රාවක රැස්වීමක් වූයේය. මහණෙනි, මට සියල්ලන්ම රහත්වූ මේ එකම රැස්වීම වූයේය."

ශ්‍රාවක රැස්වීම් පරිච්ඡෙද කථායි.

**12** මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට උතුම් ලෙස උපස්ථාන කරන්නාවූ අසොක නම් භික්ෂු කෙනෙක් උපස්ථායක වූයේය, මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ සිඛී භාග්‍යවතුන් වහන්සේට උතුම් ලෙස උපස්ථාන කරන්නාවූ ඛෙමංකර නම් භික්ෂුකෙනෙක්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

උපස්ථායක වූයේය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේට උතුම් ලෙස උපස්ථාන කරන්නාවූ උපසන්ත නම් භික්ෂු කෙනෙක් උපස්ථායක වූයේය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කකුසන්ධ භාග්‍යවතුන් වහන්සේට උතුම් ලෙස උපස්ථාන කරන්නාවූ බුද්ධිජ නම් භික්ෂු කෙනෙක් උපස්ථායක වූයේය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කොණාගමන භාග්‍යවතුන්වහන්සේට උතුම් ලෙස උපස්ථාන කරන්නාවූ සොත්ථිජ නම් භික්ෂු කෙනෙක් උපස්ථායක වූයේය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේට උතුම් ලෙස උපස්ථාන කරන්නාවූ සබ්බමිත්ත නම් භික්ෂු කෙනෙක් උපස්ථායක වූයේය. මහණෙනි, දැන් මට උතුම් ලෙස උපස්ථාන කරන්නාවූ ආනන්ද භික්ෂුතෙම උපස්ථායක වූයේය.

උපස්ථායක භික්ෂු පරිච්ඡෙද කථායි.

13 "මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට බන්ධුමාන නම් රජතෙම පිය වූයේය. බන්ධුමතී නම් දේවියක් මව් විය. බන්ධුමාන රජහට බන්ධුමතී නුවර රාජධානිය විය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ සිඛී භාග්‍යවතුන් වහන්සේට අරුණ නම් රජ පිය වූයේය. පභාවතී නම් දේවිය මව් විය අරුණ රජහට අරුණවතී නම් නුවර රාජධානි විය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේට සුප්පතීත නම් රජතෙම පිය විය, යසවතී නම් දේවියක් මව් විය. සුප්පතීත රජහට අනොපම නුවර රාජධානි විය.

"මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ කකුසන්ධ භාග්‍යවතුන් වහන්සේට අග්නිදත්ත නම් බ්‍රාහ්මණතෙම පිය විය. විශාඛා නම් බැමිණිතොමෝ මව් විය. මහණෙනි, ඒ කාලයේදී ඛෙම නම් රජෙක් වූයේය. ඛෙම රජුහට ඛෙමවතී නම් නුවරක් රාජධානි විය.

"මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කොණාගමන භාග්‍යවතුන් වහන්සේට යඤ්ඤදත්ත නම් බ්‍රාහ්මණතෙම පිය

වූයේය උත්තරා නම් බැමිණිතොමෝ මව් විය. මහණෙනි, ඒ කාලයෙහි සොභ නම් රජෙක් වූයේය. සොභ රජහට සොභවතී නම් නුවරක් රාජධානි වූයේය.

මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේට බ්‍රහ්මදත්ත නම් බ්‍රාහ්මණතෙම පිය වූයේය. ධනවතී නම් බැමිණිතොමෝ මව් විය. මහණෙනි, ඒ කාලයෙහිදී කිකී නම් රජෙක් වූයේය. කිකී රජහට බරණැස් නම් නුවරක් රාජධානි වූයේය. මහණෙනි, දැන් මට සුද්ධොදන රජතෙම පිය වූයේය. මායාදේවී තොමෝ මව් විය. කපිල වත්ථු නම් නගරයක් රාජධානි විය."

භාග්‍යවතුන්වහන්සේ මේ කරුණු කීවෝය. තථාගතයන් වහන්සේ පෙර ඇතිවූ ආත්ම භාවයන් සම්බන්ධවූ ධර්ම දේශනාව කර උන් ආසනයෙන් නැගිට වෙහෙරට වැඩියෝය.

මාතා පිතා පරිච්ඡෙද කථායි.

14 එවිට භාග්‍යවතුන් වහන්සේ වැඩමකොට ගොස් නොබෝ වේලාවකින් ඒ භික්ෂූන් අතර මේ අතුරුකථාව පහළ විය. "ආයුෂ්මතුනි තථාගතයන් වහන්සේගේ මහත් සෘද්ධිමත් භාවය හා මහත් ආනුභාවය පුදුමයි. පෙර නොවූ, දෙයකි. පිරිනිවන් පෑවාවූ සසර ප්‍රමාද කරන ධර්මයන් කපා දැම්මාවූ කපාදමනලද කුසලාකුසල ධර්ම ඇති සංසාරය අවසාන කල සියලු දුක් කෙළවර කළ අතීත බුදුවරයන් ජාති වශයෙනුත් සිහිකළෝය, ආයුෂ ප්‍රමාණ වශයෙනුත් සිහි කළෝය, ශ්‍රාවක දෙදෙනා වශයෙනුත් සිහිකළෝය, ශ්‍රාවක රැස්වීම් වශයෙනුත් සිහිකළෝය, කෙසේද? ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙවැනි ජාති ඇත්තෝ වූහයි කියාද, මෙවැනි නම් ඇත්තෝයයි කියාද, මෙබඳු ගොත්‍ර ඇත්තෝයයි කියාද, මෙබඳු සිල් ඇත්තෝ යයි කියාද, මාර්ගඵල සමාධි ආදී මෙවැනි සමාධි ඇත්තෝයයි කියාද, මාර්ගඵල ප්‍රඥා අදී මෙවැනි ප්‍රඥා ඇත්තෝයයි කියාද, නිරොධ සමාපත්ති ආදී මෙවැනි විහරණ ඇත්තෝයයි කියාද, මෙවැනි (විමුක්ති) මිදීම් ඇත්තෝයයි කියාද වෙත්.

15 "ඇවැත්නි, කිමෙක්ද? තථාගතයන් වහන්සේ යම් ඥානයක් මනාකොට අවබොධ කිරීම හේතුකොට ගෙන (පිරිනිවන් පෑවාවූ, කපාදැමූ සසර ප්‍රමාදකරන ධර්මයන් ඇත්තාවූ කපාදමනලද කුසලාකුසල කර්ම ඇති සංසාරය අවසාන කල සියලු දුක් කෙළවර කළ අතීත බුදුරවයන් ජාති වශයෙනුත් සිහිකරති, ආයුෂ ප්‍රමාණ වශයෙන්ද සිහිකරති, ශ්‍රාවක දෙදෙනා වශයෙනුත් සිහි කරති, ශ්‍රාවක රැස්වීම් වශයෙනුත් සිහිකරති. කෙසේද? ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙවැනි ජාති ඇත්තෝයයි කියාද, මෙවැනි නම් ඇත්තෝයයි කියාද, මෙබඳු සිල් ඇත්තෝයයි කියාද මාර්ගඵල සමාධි ආදි මෙවැනි සමාධි ඇත්තෝයයි කියාද මාර්ගඵල ප්‍රඥා ආදී මෙවැනි ප්‍රඥා ඇත්තෝ යයි කියාද නිරොධ සමාපත්ති ආදී මෙවැනි විහරණ ඇත්තෝයයි කියාද පස්වැදෑරුම් (විමුක්ති) මිදීම් ඇත්තෝයයි කියාද වෙත්.) ඒ ඥානය තථාගතයන් වහන්සේ විසින්ම අවබොධ කරගන්නා ලද්දේද?

16 "නැතහොත් දේවතාවෝ තථාගතයන් වහන්සේට මේ කාරණය දැන්නුවාහුද? යම් කාරණයකින් තථාගතයන් වහන්සේ පිරිනිවන් පෑවාවූ කපාදැමූ සසර ප්‍රමාදකරන ධර්මයන් ඇත්තාවූ, කපාදමනලද කුසලාකුශල කර්ම ඇති, සංසාරය අවසානකළ සියලු දුක් කෙළවරකළ අතීත බුදුවරයන් ජාති වශයෙනුත් සිහිකරති, නාම වශයෙනුත් සිහි කරති, ගොත්‍රවශයෙනුත් සිහිකරති, ආයුෂ ප්‍රමාණවශයෙනුත් සිහිකරති, ශ්‍රාවක දෙදෙනා වශයෙනුත් සිහිකරති, ශ්‍රාවක රැස්වීම් වශයෙනුත් සිහිකරති, කෙසේද? ඒ භාග්‍යවතුන් වහන්සේලා, මෙවැනි ජාති ඇත්තෝයයි කියාද, මෙවැනි නම් ඇත්තෝයයි කියාද, මෙබඳු ගොත්‍ර ඇත්තෝයයි කියාද, මෙබඳු සිල් ඇත්තෝයයි කියාද, මාර්ගඵල, සමාධි ආදී මෙවැනි සමාධි ඇත්තෝයයි කියාද, මාර්ගඵල ප්‍රඥා ආදී මෙවැනි ප්‍රඥා ඇත්තෝයයි කියාද නිරොධ සමාපත්ති ආදී මෙවැනි විහරණ ඇත්තෝ යයි කියාද, පස්වැදෑරුම් (විමුක්ති) මිදිම් ඇත්තෝයයි කියාද වෙත්. යන මේ අතුරු කථාවකොට නිමවීය. එවිට භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි විවේකයෙන් නැගී සිට කරේරි මණ්ඩපය සමීපයේවූ විවේක

ගන්නා ශාලාව යම් තැනකද එතනට පැමිණියෝය. පැමිණ පණවනලද ආශනයෙහි වැඩඋන්නෝය. භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳ ඒ භික්ෂූන්ට කථාකළෝය. කථාකර, "මහණෙනි, මෙහි තෙපි කිනම් කථාවකින් උන්නහුද, තොපගේ කිනම් කථාවක් කොට කිමකළාහුදැයි" ඇසුවෝය.

17 මෙසේ ඇසූකල ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීවෝය. "ස්වාමීන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වැඩි නොබෝ වේලාවකින් මෙහි අප අතරෙහි මේ අතුරු කථාව උපන්නේය. එනම්: "ඇවැත්නි, තථාගතයන් වහන්සේගේ මහත් ඍද්ධිමත්භාවය හා මහත් ආනුභාවය පුදුමයි. ඇවැත්නි, පෙර නොවූ දෙයකි පිරිනිවන් පෑවාවූ සසර ප්‍රමාද කරන ධර්මයන් කපා දැම්මාවූ කපා දමනලද කුසලාකුසල කර්ම ඇති සංසාරය අවසාන කළ සියලු දුක් කෙළවර කළ අතීත බුදුවරයන් ජාති වශයෙනුත් සිහි කරන්නාහුය, නාම වශයෙනුත් සිහිකරන්නාහුය, ගොත්‍ර වශයෙනුත් සිහිකරන්නාහුය, ආයුෂ ප්‍රමාණ වශයෙනුත් සිහි කරන්නාහුය, ශ්‍රාවක දෙදෙනා වශයෙනුත් සිහිකරන්නාහුය ශ්‍රාවක රැස්වීම් වශයෙනුත් සිහිකරන්නාහුය. කෙසේද? ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙවැනි ජාති ඇත්තෝ යයි කියාද, මෙවැනි නම් ඇත්තෝයයි කියාද මෙවැනි සිල් ඇත්තෝ යයි කියාද, මාර්ගඵල ආදී මෙවැනි සමාධි ඇත්තෝයයි කියාද, මාර්ගඵල ප්‍රඥාආදී මෙවැනි ප්‍රඥා ඇත්තෝයයි කියාද. නිරොධ සමාපත්තිආදී මෙවැනි විහරණ ඇත්තෝයයි කියාද, මෙවැනි පස්වැදෑරුම් මිදීම් ඇත්තෝ යයිද කියායි."

18. "ඇවැත්නි, කිමෙක්ද? තථාගතයන් වහන්සේ යම් ඥානයක් අවබොධ කිරීම හෙතුකොටගෙන පිරිනිවන් පෑවාට සසර ප්‍රමාද කරන ධර්මයන් කපා දැම්මාවූ, කපා දමනලද, කුසලාකුසල කර්ම ඇති සංසාරය අවසාන කළ සියලු දුක් කෙළවර කළ අතීත බුදුවරයන් ජාති වශයෙනුත් සිහි කරන්නාහ, ආයුෂ ප්‍රමාණ වශයෙනුත් සිහිකරන්නාහ, ශ්‍රාවක දෙදෙනා වශයෙනුත් සිහිකරන්නාහ. ශ්‍රාවක රැස්වීම වශයෙනුත්

සිහිකරන්නාහ. කෙසේද? ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙවැනි ජාති ඇත්තෝ වූහයි කියාද, මෙවැනි නම් ඇත්තෝයයි කියාද, මෙබඳු ගොත්‍ර ඇත්තෝයයි කියාද, මෙවැනි සිල් ඇත්තෝයයි කියාද, මාර්ගඵල සමාධි ආදි මෙවැනි සමාධි ඇත්තෝයයි කියාද, මාර්ග ඵල ප්‍රඥා ආදි මෙවැනි ප්‍රඥා ඇත්තෝයයි කියාද, නිරෝධ සමාපත්ති ආදි මෙවැනි විහරණ ඇත්තෝයයි කියාද, මෙවැනි පස්වැදෑරුම් මිදීම් ඇත්තෝයයිද කියායි. ඒ ඥානය තමන් වහන්සේ විසින්ම අවබොධකරන ලද්දේද?

"නැතහොත් දෙවතාවෝ තථාගතයන් වහන්සේට මේ කාරණය සැළකළාහුද? යම් කාරණයක් හෙතුකොට ගෙන තථාගතයන් වහන්සේ පිරිනිවන් පෑවාවූ කපා දැමූ සසර ප්‍රමාද කරන ධර්මයන් ඇත්තාවූ කපාදමන ලද කුසලාකුසල කර්ම ඇති, සංසාරය අවසාන කළ සියලු දුක් කෙළවර කළ අතීත බුදුවරයන් ජාති වශයෙනුත් සිහි කරති, නාම වශයෙනුත් සිහි කරති. ගොත්‍ර වශයෙනුත් සිහි කරති. ආයුෂ ප්‍රමාණ වශයෙනුත් සිහි කරති, ශ්‍රාවක දෙදෙනා වශයෙනුත් සිහි කරති, ශ්‍රාවක රැස්වීම් වශයෙනුත් සිහි කරති. කෙසේද? ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙවැනි ජාති ඇත්තෝයයි කියාද, මෙවැනි නම් ඇත්තෝයයි කියාද, මෙබඳු ගොත්‍ර ඇත්තෝයයි කියාද, මෙබඳු සිල් ඇත්තෝයයි කියාද, මාර්ගඵල සමාධි ආදි මෙවැනි සමාධි ඇත්තෝයයි කියාද, මාර්ගඵල ප්‍රඥා ආදි මෙවැනි ප්‍රඥා ඇත්තෝයයි කියාද, නිරොධ සමාපත්ති ආදි මෙවැනි විහරණ ඇත්තෝයයි කියාද මෙවැනි පස්වැදෑරුම් මිදීම් ඇත්තෝ යයි කියාද වෙත් යන මේ අපේ අතුරු කථාව ඇතිවූයේය. එකල භාග්‍යවතුන් වහන්සේ පැමිණියෝය' යි කීවෝය.

19 "මහණෙනි, තථාගතයන් වහන්සේ විසින්ම මේ ඥානය අවබොධකරන ලද්දේය. යම් ඥානයක් අවබොධ කිරීම හෙතුකොටගෙන තථාගතයන් වහන්සේ පිරිනිවන් පෑවාවූ කපාදැමූ සසර ප්‍රමාද කරන ධර්මයන් ඇති කපා දමනලද කුසලාකුසල කර්ම ඇති සංසාරය අවසාන කළ සියලු දුක් කෙළවර කළ අතීත බුදුවරයන් ජාති වශයෙනුත් සිහි කරති.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නාම වශයෙනුත් සිහි කරති. ගොත්‍ර වශයෙනුත් සිහි කරති. ආයුෂ ප්‍රමාණ වශයෙනුත් සිහි කරති, ශ්‍රාවක දෙදෙනා වශයෙනුත් සිහි කරති, ශ්‍රාවක රැස්වීම් වශයෙනුත් සිහි කරති, කෙසේද? ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙවැනි ජාති ඇත්තෝයයි කියාද, මෙවැනි නම් ඇත්තෝයයි කියාද, මෙබඳු ගොත්‍ර ඇත්තෝයයි කියාද, මෙබඳු සිල් ඇත්තෝයයි කියාද, මාර්ගඵල සමාධි ආදි මෙවැනි සමාධි ඇත්තෝයයි කියාද මාර්ගඵල ප්‍රඥා ආදි මෙවැනි ප්‍රඥා ඇත්තෝයයි කියාද නිරොධ සමාපත්ති ආදි මෙවැනි විහරණ ඇත්තෝයයි කියාද මෙවැනි පස්වැදෑරුම් මිදීම් ඇත්තෝයයි කියාද වෙත්.

"දෙවතාවෝද තථාගතයන් වහන්සේට මේ කාරණය දැන්නුවාහුය. යම් කාරණයකින් තථාගතයන් වහන්සේ පරිනිර්වානයට පැමිණියාවූ කපාදැමූ සසර ප්‍රමාද කරණ ධර්මයන් ඇත්තාවූ කපා දමනලද කුසලාකුසල කර්ම ඇති, සංසාරය අවසාන කළ සියලු දුක් කෙළවර කළ අතීත බුදුවරයන් ජාති වශයෙනුත් සිහි කරත්ද නාම වශයෙනුත් සිහි කරත්ද, ගොත්‍ර වශයෙනුත් සිහිකරත්ද, ආයුෂ ප්‍රමාණ වශයෙනුත් සිහි කරත්ද, ශ්‍රාවක දෙදෙනා වශයෙනුත් සිහි කරත්ද, ශ්‍රාවක රැස්වීම් වශයෙනුත් සිහි කරත්ද කෙසේද? ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙවැනි ජාති ඇත්තෝ වූහයි කියාද, මෙවැනි නම් ඇත්තෝයයි කියාද, මෙබඳු ගොත්‍ර ඇත්තෝයයි කියාද, මෙබඳු සිල් ඇත්තෝයයි කියාද මාර්ග ඵල සමාධි ආදී මෙවැනි සමාධි ඇත්තෝයයි කියාද, මාර්ග ඵල ප්‍රඥා ආදි මෙවැනි ප්‍රඥා ඇත්තෝයයි කියාද, නිරොධ සමාපත්ති ආදි මෙවැනි විහරණ ඇත්තෝයයි කියාද මෙවැනි පස්වැදෑරුම් මිදීම් ඇත්තෝයයි කියාද වෙත්.

"මහණෙනි, තොපි බොහෝ සෙයින්ම පෙර විසීම් පිළිබඳවූ ධර්ම කථාවක් ඇසීමට කැමති නොවන්නහුදැයි" ඇසුවෝය.

"යම් හෙතුවකින් භාග්‍යවතුන් වහන්සේ බොහෝ සෙයින් පෙර විසීම් පිළිබඳ ධර්ම කථා කරත් නම්, භාග්‍යවතුන් වහන්ස, මේ ඊට සුදුසු කාලයයි. තථාගතයන් වහන්ස, මේ ඊට සුදුසු

කාලයයි. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු සිත්හි දරා ගන්නාහුයයි” කීවෝය.

“මහණෙනි, එසේ නම් අසව්. හොඳින් හිතට ගනිව්. කියන්නෙමි” යි කීවෝය.

“පින්වතුන් වහන්ස, එසේ යහපතැයි” ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නෝය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ දෙශනා කළහ.

**20.** “මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ යම් කලෙක ලොව පහලවූ සේක්ද ඒ මෙයින් අනූඑක්වෙනි කල්පයයි. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ ජාතියෙන් ක්ෂත්‍රිය වූසේක. ක්ෂත්‍රිය කුලයෙහි උපන්සේක. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ ගොත්‍රයෙන් කොණ්ඩඤ්ඤ නම් වූසේක. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට අසූදහසක් අවුරුදු ආයුෂ ප්‍රමාණවීය මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන්වහන්සේ පළොල්රුක මුලදී චතුස්සත්‍යය අවබොධ කළසේක. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට ඛණ්ඩය තිස්සය යන නම් ඇති ප්‍රධාන ශ්‍රාවකයෝ දෙදෙනෙක් වූහ. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට ශ්‍රාවකයන්ගේ රැස්වීම් තුණක් වූයේය. අටසැට ලක්ෂණයක් භික්ෂූන් ඇති එක් ශ්‍රාවක රැස්වීමක් විය. භික්ෂූන් ලක්ෂයක් ඇති එක් ශ්‍රාවක රැස්වීමක් වූයේය. අසූදහසක් භික්ෂූන් ඇති එක් ශ්‍රාවක රැස්වීමෙක් වූයේය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට සියල්ලන්ම රහත්වූ භික්ෂූන්ගෙන් යුක්තවූ මේ ශ්‍රාවකයන්ගේ රැස්වීම් තුණක් වූයේය. මහණෙනි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට අග්‍ර ලෙස උපස්ථාන කරන්නාවූ අශොක නම් භික්ෂු කෙනෙක් වූයේය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට බන්ධුම නම් රජතෙම පිය වූයේය.

බන්ධුමතී නම් දේවී තොමෝ මව් විය. බන්ධුම රජහට බන්ධුමතී නම් නුවර රාජධානි වීය.

21. "මහණෙනි, එවිට විපස්සී බොධිසත්වයන් වහන්සේ තුසිත දෙව්ලොවින් චුතව සිහි නුවණින් යුක්ත වූයේ මව් කුස පිළිසිඳ ගත්තේය. මෙසේ සිහිනුවණින් යුක්තව මව් කුස පිළිසිඳීම බුදුවරයන්ගේ ධර්මතාවකි

"මහණෙනි, යම් කලෙක බෝධිසත්වතෙම තුසිත දෙව් ලොවින් චුතව මව් කුස පිළිසිඳගනීද එකල දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බඹුන් සහිතවූ ලොකයෙහිද, මහණ බමුණන් සහිතවූ දෙව්මිනිසුන් සහිතවූ සත්වයන් කෙරෙහිද දෙවියන්ගේ දිව්‍ය ආනුභාවය ඉක්මවා අප්‍රමාණවූ මහත්වූ ආලොකයක් පහළවෙයි. යම් තැනක් මෙසේ මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති සඳු හිරු දෙදෙන තමන්ගේ ආලොකයෙන් ආලොක නොකරත්ද මහත් ඝනාන්ධකාරයෙන් අඳුරුව පවත්නාවූ යටින් පිහිටීමක් හෝ උඩින් වැසීමක් හෝ නැත්තාවූ ඒ ලොකාන්තරික නිරයෙහිද දෙවියන්ගේ දෙවානුභාවය ඉක්මවා මහත් ආලොකයක් පහළ වන්නේය.

"යම් සත්ව කෙනෙක් එහි උපන්නාහුද ඒ සත්වයෝද ඒ ආලොකයෙන් ඔවුනොවුන් හඳුනත්. පින්වත්නි, යම්සේ මෙහි අපි මහ දුක් විඳිමුද එපරිද්දෙන් දුක් විඳින්නාවූ මෙහි උපන් අන්‍ය සත්වයෝද ඇත්තාහයි කියායි. මේ දශ සහශ්‍රී ලොක ධාතුවද කම්පාවෙයි. ඉතා වැඩිව කම්පාවෙයි. වැඩිව සෙලවෙයි. දෙවියන්ගේ දෙවානුභාවය ඉක්මවා අප්‍රමාණවූ මහත් ආලොකයක් පහළවෙයි මෙයද බුදුවරයන්ගේ ධර්මතාවකි.

22. 'මහණෙනි, මේ කියනු ලබන්නේද ධර්මතාවකි. එනම්, යම් කලක බොධිසත්වයන් වහන්සේ මව් කුස පිළිසිඳ ගත්සේක්ද, එකල දිව්‍ය පුත්‍රයෝ සතර දෙනෙක් හතර දිසාව ආරක්ෂාව පිණිස පැමිණෙත්. ඒ බොධිසත්වයන් වහන්සේ හෝ බොධිසත්වයන් වහන්සේගේ මව මනුෂ්‍යයෙක් හෝ අමනුෂ්‍යයෙක් හෝ පාංශු පිශාචාදි අන් කිසිවෙක් නො පෙළාවායි" කියායි. මේද බුදුවරයන්ගේ ධර්මතාවකි

23 "මෙයද ධර්මතාවකි. මහණෙනි, යම් කලෙක බොධිසත්වයන් වහන්සේ මව් කුසට පැමිණියේ වේද, ස්වභාවයෙන්ම බොධිසත්ව මව් තොමෝ සිල් ඇත්තියක් වේ ප්‍රාණඝාතයෙන් වැළැක්කේවෙයි නුදුන් දෙය ගැනීමෙන් වැළැක්කේවෙයි. කාමමිථ්‍යාචාරයෙන් වැළැක්කේවෙයි. බොරු කීමෙන් වැළැක්කේවෙයි, මත්පැන් පාන ආදියෙන් වැළැක්කේවෙයි, මෙයද මෙහි ධර්මතාවකි.

24. "මෙයද ධර්මතාවකි. මහණෙනි, යම් කලක බොධිසත්වයන් වහන්සේ මව් කුසට පැමිණියේ වේද, එකල බොධිසත්වයන් වහන්සේගේ මවට කිසියම් පුරුෂයෙකු කෙරෙහි කාම ගුණ සහිත සිතක් නූපදී.

"රාග සිත් ඇති කිසියම් පුරුෂයෙකු විසින් බොධිසත්වයන් වහන්සේගේ මව් තොමෝ ආශ්‍රය නොකළ හැක්කේවෙයි. මේද ධර්මතාවකි.

25. "මෙයද ධර්මතාවකි. මහණෙනි, යම් කලෙක බොධිසත්වයන් වහන්සේ මව් කුසට පැමිණියේ වේද එකල බොධිසත්ව මව් තොමෝ බොහෝ සම්පත් ලබන්නියක් වේ. ඈ බොහෝවූ සම්පත්තියෙන් යුක්ත කොට හසුරුවයි. මෙයද ධර්මතාවකි.

26 "මෙයද ධර්මතාවකි. මහණෙනි, යම් කලක බොධිසත්වයන් වහන්සේ මව් කුසට ඇතුළත් වූයේ වේද එකල බොධිසත්ව මවුට කිසියම් ආබාධයක් නූපදී. බොධිසත්ව මව සැප ඇත්තියක් වේ. බොධිසත්ව මවු දුර්වල නුවූ ශරීර ඇත්තීම කුස තුළවූ සම්පූර්ණ ඉන්ද්‍රියයන් ඇති සියලු අඟපසඟ ඇත්තාවූ බොධිසත්වයන් දකී.

"මහණෙනි, යහපත්වූ ජාතිමත්වූ අටැස්වූ හොඳින් පිරිසිදු කරන ලද්දාවූ විශෙෂයෙන් හිත් ප්‍රිය කරන සෑම ආකාරයෙන් සම්පූර්ණවූ වෛරෝඩිමැණිකක් යම්සේද ඒ මැණිකේ සිදුරෙහි නිල් නූලක් හෝ රන්වන් නූලක් හෝ රතු නූලක් හෝ සුදු නූලක් හෝ පඬුවන් නූලක් හෝ අමුණන ලද්දේවේද, ඒ නූල සහිත

මැණික ඇස් ඇති පුරුෂයෙක් අතට ගෙන නුවණින් පරීක්ෂා කර බලන්නේද, කෙසේද? මේ වෛඩූර්‍ය්‍ය මාණික්‍යය යහපත්ය, යහපත් ජාති ඇත්තේය, අටැස්ස, හොඳින් ඔප දැමීමාදියෙන් සකස් කර තිබේ නිර්මලය, විශෙෂයෙන් හිත් ප්‍රිය කරන්නේය. හැම ආකාරයෙන් සම්පූර්ණය, ඒ මැණිකෙහි මේ නිල් නූල් හෝ මේ රන්වන් නූල හෝ මේ සුදු නූල හෝ මේ පඬුවන් නූල හෝ අමුණන ලද්දේය,' කියායි.

'මහණෙනි, එසේම යම් කලක බොධි සත්වයන් වහන්සේ මව් කුසට ඇතුළත් වූයේ වේද එකල බොධිසත්ව මවුට කිසියම් ආබාධයක් නූපදී. බොධිසත්ව මවු සැප ඇත්තියක් වේ. බොධිසත්ව මවු දුර්වල නුවූ ශරීර ඇත්තියක්වෙයි. බොධිසත්ව මවු සියලු අඟපසඟ ඇත්තාවූ සම්පූර්ණ ඉන්ද්‍රියයන් ඇති බොධිසත්වයන් දකී. මේද මෙහි ධර්මතාවයි.

27. "මෙයද ධර්මතාවකි. මහණෙනි, බොධිසත්වයන් උපන් සත්වෙනි දිනයෙහි බොධිසත්ව මවු පරලොව යන්නීය. තුෂිත දිව්‍ය ලොකයෙහි උපදී. මේද මෙහි ධර්මතාවයි.

28 "මෙයද ධර්මතාවකි. මහණෙනි, අන්‍ය ස්ත්‍රීහු නව මාසයක් හෝ දස මාසයක් ගැබක් කුසින් උසුලා සිට යම්සේ වදත්ද, එසේ බොධිසත්වයන් නොවදයි. බොධිසත්ව මව බොධිසත්වයන් දසමසක්ම කුසින් උසුලා සිට වදයි. මේද මෙහි ධර්මතාවයි.

29 "මෙයද ධර්මතාවකි. මහණෙනි, යම්සේ අන්‍ය ස්ත්‍රීහු නිදාගෙන හෝ හිඳගෙන හෝ වදත්ද, ඒ ආකාරයෙන් බොධිසත්ව මවු බොධිසත්වයන් නොවදයි. බොධිසත්ව මවු සිටගෙනම බොධිසත්වයන් වදයි. මේද මෙහි ධර්මතාවයි

30 "මෙයද ධර්මතාවකි මහණෙනි යම් කලක බොධිසත්වයෝ මව්කුසින් බිහිවේද, දෙවියෝ පළමුකොට පිළිගනිත්. පසුව මනුෂ්‍යයෝ පිළිගනිත්. මේද මෙහි ධර්මතාවයි.

31 "මෙයද ධර්මතාවකි මහණෙනි, යම් කලක බොධි සත්වයෝ මව් කුසින් නික්මෙත්ද, එකල බෝධිසත්වයෝ

පොළොවට නොපැමිණියෝම වෙත්. දෙව්වරු හතරදෙනෙක් ඒ බොධිසත්වයන් පිළිගෙන මැණියන් ඉදිරියේ තබත්.

'දේවියනි, ඔබට මහානුභාව ඇති පුතෙක් උපන්නේය' දේවිය සතුටු වෙයි. මේද මෙහි ධර්මතාවයි.

32 "මෙයද ධර්මතාවකි. මහණෙනි, යම් කලක බොධි සත්වයෝ මව් කුසින් නික්මෙත්ද, එකල පිරිසිදුව නික්මෙති. ලෙයෙන් නොතැවරෙණ ලද්දේ වේ. සෙමෙන් නොතැවරෙන ලද්දේවේ. එසේම අන්‍ය කිසි කැතකුණකින් නොතැවරෙන ලද්දේවේ, සුද්ධවෙයි, පිරිසිදුවෙයි. මහණෙනි, කසීරට රෙද්දක තබනලද්දාවූ මැණික් රත්නයක් යම්සේද, ඒ මැනික්රත්නය කසීරට රෙද්ද ඒ මැණික් කාන්තියෙන් ගැල්වීම නොකෙරේමය. කසීරෙද්ද මැණික් රත්නය රෙද්දේ කාන්තියෙන් ගැල්වීම නොකෙරේමය ඊට හේතුව කුමක්ද? දෙකම පිරිසිදු බැවිනි. මහණෙනි, එසේම යම් කාලයක බොධිසත්වයෝ මව් කුසින් නික්මේද පිරිසිදුවම නික්මෙයි. ලෙයෙන් නො තැවරෙණ ලද්දේවේ. සෙමෙන් නොතැවරෙණ ලද්දේ වේ. එසේම අන්‍ය කිසි කැතකුණකින් නොතැවරෙණ ලද්දේවේ. සුද්ධවෙයි, පිරිසිදු වෙයි. මේද මෙහි ධර්මතාවයි.

33 "මෙයද මහණෙනි, ධර්මතාවකි. යම් කලක බොධි සත්වයෝ මව් කුසින් නික්මෙත්ද එකල බොධිසත්වයන්ගේ හා මවගේ යම් කටයුත්තක් ජලයෙන් කෙරෙත්ද ඒ සඳහා ජලධාරා දෙකක් අහසින් පහළ වෙත්. එයින් එකක් සීත ජලය වෙයි. එකක් උෂ්ණ ජලය වෙයි. මේද මෙහි ධර්මතාවයි.

34 "මෙයද මහණෙනි, ධර්මතාවකි. බොධිසත්වයන් වහන්සේ උපන්කෙණෙහි බ්‍රහ්ම දේව මනුෂ්‍යයන්ගේ අතින් පොළොවට බැස සම පාදයන්ගෙන් පොළොවේ පිහිටා උතුරු දිසාවට අභිමුඛව ශ්වෙතච්ඡත්‍රය දරමින් සත් පියවරක් ඉදිරියට ගමන් කෙරෙයි. සියලු දිසාවන්ද බලයි. 'මම ලෝකයට අග්‍ර වෙමි. මම ලෝකයට ප්‍රධාන වෙමි. මම ලොකයට උතුම් වෙමි. මේ අවසාන ජාතියයි. දැන් මට මෙයින් මතු නැවත උත්පත්තියක් නැතැයි" යන අභීත වචන කියයි. මෙයද මෙහි ධර්මතාවයි.

35 "මෙයද මහණෙනි, ධර්මතාවකි, යම් කලක බොධිසත්වයෝ මව් කුසින් නික්මෙත්ද, එකල දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බඹුන් සහිතවූ ලෝකයෙහිද මහණ බමුණන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ සත්වයන් කෙරෙහිද දෙවියන්ගේ දේවානුභාවය ඉක්මවා ප්‍රමාණ නොකළහැකි මහත්වූ ආලෝකයක් පහළවේ.

36 "මහත් ආනුභාව ඇත්තාවූ ඉර හඳ දෙදෙනාටත් ආලෝක කළ නොහැක්කාවූ ගැටීමක් නැති, වැසී නැති, යට පිහිටීමක් නැති, අඳුර ඇත්තාවූ, ගණ අඳුර ඇත්තාවූ යම් ලොකාන්තරික නම් නිරයක් ඇත්තේද, ඒ ලෝකාන්තරික නිරයෙහිද දෙවියන්ගේ දෙවානුභාවය ඉක්මවූ මහත් ආලොකය පහළ වෙයි. ඒ ලොකාන්තරික නිරයෙහි උපන්නාවූ යම් සත්වයෝ වෙත්ද, ඒ සත්වයෝද ඒ ආලොකයෙන් ඔවුන් ඔවුන් දැනගනිත්. කෙසේද? "යම්සේ අපි මෙහි මහ දුක් විඳිමුද, එසේම දුක් විඳින්නාවූ මෙහි උපන් අන්‍ය සත්වයෝද ඇත්තාහුයයි. කියායි. මේ දස දහසක් ලෝකධාතුව කම්පාවෙයි. ඉතා වැඩියෙන් කම්පාවෙයි. වැඩියක් වෙව්ලයි. දෙවියන්ගේ දේවානුභාවය ඉක්මවූ ප්‍රමාණ නොකළ හැකි මහත් ආලෝකයක් පහළවෙයි. මේද මෙහි ධර්මතාවයි.

37 "මහණෙනි, විපස්සී කුමාරයා උපන් කල්හි, 'දේවයන් වහන්ස, ඔබට පුතෙක් උපන්නේය. දේවයන්, වහන්සේ ඒ පුතු බලනු මැනවයි බන්ධුම රජුහට දැන්වූහ. මහණෙනි, බන්ධුම රජතෙම විපස්සි කුමාරයා දුටුයේය දැක නිමිති දත් බමුණන් කැඳවා මෙසේ කීයේය 'පින්වත් නිමිති දත් බ්‍රාහ්මණයෝ මේ කුමාරයා බලත්වා' කියාය. මහණෙනි, නිමිති දත් බ්‍රාහ්මණයෝ විපස්සී කුමාරයා දුටුවාහුය. දැක බන්ධුම රජහට මේ කාරණය කීහ. "දේවයන් වහන්ස, ඔබ වහන්සේ සතුටු සිත් ඇත්තෙක් වුවමැනව. දේවයන්වහන්ස, ඔබවහන්සේට මහා ආනුභාව ඇති පුතෙක් උපන්නේය. යම් බඳුවූ ඔබගේ කුලයෙහි මෙබඳු කුමරෙක් උපන්නේද මහරජ, එය ඔබට ලාභයකි. මහරජ එය ඔබට යහපත් ලාභයකි, දේවයන් වහන්ස, මේ කුමරු දෙතිස් මහ පුරිස්

ලකුණෙන් යුක්තය මේ ලකුණෙන් යුක්තවූ මහාපුරුෂයෙකුගේ ගති දෙකක්ම වෙත්. අනික් ගතියක් නොවේ. ඉදින් ගිහිගෙයි වාසයකෙරේ නම් ධාර්මිකවූ සතර මහාද්වීපයට අධිපතිවූසියලු සතුරන් දිනන ලද්දාවූ ජනපදයන්හි ස්ථිරවූ රත්න හතකින් යුක්තවූ සක්විති රජෙක්වෙයි. ඒ රජුගේ රත්න හතක් වෙත්. එනම් චක්‍ර රත්නය, අශ්ව රත්නය, මාණික්‍ය රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, සත්වෙනිවූ පරිනායක රත්නය, (පුත්‍ර රත්නය) යන මොව්හුයි ඔහුට නිර්භීත වියඝී ඇත්තාවූ පරසේනාව මැඩ පවත්වන්නාවූ දහසකට වැඩි පුත්‍රයෝ වෙත්. ඒ සක්විතිරජ සාගරයෙන් වටකොටඇති මේ පෘථිවිය දඬුවම් කිරීමක් නැතුව ආයුධ නැතුව ධර්මයෙන් ජයගෙන අධිපතිව වාසය කෙරේ ඉදින් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවේ නම් කෙලෙස් නමැති වහළ සිඳ දමා ලොකයෙහි අර්හත් සම්‍යක් සම්බුදු වන්නේය

38 "දේවයන් වහන්ස, මේ කුමාරයා කවර දෙතිස්මහා පුරුෂ ලකුණුවලින් යුක්තද? යම් ලකුණුවලින් යුක්තවූ මහා පුරුෂයෙකුගේ ගති දෙකක්ම වෙත්ද, අනික් ගතියක් නොවේද, එනම් ගිහිගෙයි වාසය කෙරේනම්, ධාර්මිකවූ හතර මහාද්වීපයට අධිපතිවූ සතුරන් දිනන්නාවූ ජනපදයන්ට ස්ථිර වූ රත්න හතෙන් යුක්තවූ සක්විති රජෙක් වෙයි. ඒ රජුගේ රත්න හතක් වෙත්. එනම්, චක්‍රරත්නය, හස්තිරත්නය, අශ්ව රත්නය, මාණික්‍ය රත්නය, ස්ත්‍රි රත්නය, ගෘහපති රත්නය, සත්වෙනිවූ පුත්‍ර රත්නය යන මොව්හුයි ඔහුට නිර්භීත වීයඝී ඇත්තාවූ පර සේනාව මැඩපවත්වන්නාවූ දහසකට වැඩි පුත්‍රයෝ වෙත්. ඒ සක්විති රජ සාගරයෙන් වටකොට (සිමාවී) ඇති මේ පෘථිවිය දඬුවම් නැතුව ආයුධ නැතුව ධර්මයෙන් ජයගෙන අධිපතිව වාසයකෙරේ. ඉදින් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවේ නම් කෙලෙස් නමැති වැස්ම සිඳ ලෝකයෙහි අර්හත් සම්‍යක් සම්බුදු වන්නේද?

"දේවයන් වහන්ස, මේ කුමාරයා යහපත් ලෙස පිහිටි පාද තල ඇත්තේය, දේවයන් වහන්ස, යම් හේතුවකින් මේ කුමාරයා එක පහරින් භූමිය ස්පර්ශවෙන යහපත් ලෙස පිහිටි පාදතල

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇත්තෙක්වේද, මෙය ඒ මහාපුරුෂයාගේ මහාපුරුෂ යයි දැනගන්නා ලක්ෂණවේ. දේවයන්වහන්ස, මේ කුමාරයාගේ යටිපතුල්හි දහසක් දැති (ගරාදි) ඇත්තාවූ නිම්වලලු (වක් අතු) සහිතවූ නාභි (බොස්ගෙඩිය) සහිතවූ සෑම ආකාරයෙන් සම්පූර්ණවූ චක්‍ර දෙකක් හටගත්තාහු වෙත්. දේවයන් වහන්ස යම් හේතුවකින් මේ කුමාරයාගේ යටි පතුල්හි දහසක් දැති ඇත්තාවූ, වක්අතුවලල්ල සහිතවූ බොස්ගෙඩිය සහිතවූ සෑම ආකාරයෙන් සම්පූර්ණවූ චක්‍ර දෙකක් හටගත්තාහු වේද, ඒ මහා පුරුෂයාගේ මහා පුරුෂ ලක්ෂණයක් වේ.

"දේවයන් වහන්ස, මේ කුමාරයාගේ දික්වූ සම්පූර්ණ විලුඹක් ඇත්තේය. මේ කුමාරයාගේ දිගුවූ අත්පා ඇඟිලි ඇත්තේය. දේවයන් වහන්ස, යම් හේතුවකින් වේද ඒ මහා පුරුෂයාගේ මහා පුරුෂ ලක්ෂණයක් වේ.

"දේවයන් වහන්ස, මේ කුමාරයා මොලොක් ලපටි අත්පා ඇත්තෙකි. මේ කුමාරයා අත්වල ඇඟිලි සතරද පාදයේ ඇඟිලි පසද අගින් සමව විනිවිද පෙනෙන ජාල හස්ත පාද ලක්ෂණයෙන් යුක්තය. දේවයන් වහන්ස, මේ කුමාරයා උස්ව සිටි විලුම් ඇත්තෙකි දේවයන් වහන්ස, මේ කුමාරයා ඒණිමුවන්ගේ (මුවන් වර්ගයක්) කෙණ්ඩා හා සමාන, සමවූ මසින් වටවූ කෙණ්ඩා ඇත්තෙකි. දේවයන්වහන්ස, මේ කුමාරයා සිට නොනැමී දෙදන (දනහිස්) අතගෑමට සමර්ථය. දේවයන්වහන්ස, මේ කුමාරයා කය තුළ වැද සිටියාවූ පුරුෂ නිමිති ඇත්තේය. දේවයන් වහන්ස, මේ කුමාරයා රත්රන් පාට වෙයි. රත්රන් පාට සිහින් සමක් ඇත්තෙකි. දේවයන් වහන්ස මේ කුමාරයා සිහින් සිවි ඇත්තෙකි. සිවිය සියුම් බැවින් ශරීරයේ දූවිලි දැලි නොඇලේ. දේවයන්වහන්ස, මේ කුමාරයා එක එක කූපයක එක එක ලොම් ඇත්තෙකි. එක එක ලොම් ලොම කූපයන්හි හටගත්තාහුය. දේවයන් වහන්ස, නිල්වූ අඳුන් වැනි පාට ඇති කන් මුදුවක් සේ දකුණට කැරකැවී අග උඩට හැරීගිය ලොම් ඇත්තෙකි. දේවයන්වහන්ස, මේ කුමාරයා බ්‍රහ්ම ශරීරයක්මෙන් කෙලින් පිහිටි ශරීර ඇත්තෙකි. දේවයන් වහන්ස,

මේ කුමාරයා දෙඅත් පිටය, දෙපා පිටය, දෙඋරය පිටය යන තන්හි පිරුණු මස් ඇත්තෙකි. දේවයන් වහන්ස, මේ කුමාරයා සිංහයෙකුගේ මෙන් සම්පූර්ණවූ කයේ උඩු කොටස ඇත්තෙකි. දේවයන් වහන්ස, මේ කුමාරයා තුනටියේ සිට උරහිස් දක්වා මස් රොදකින් වැසීගිය පිට මැද ඇත්තෙකි. දේවයන්වහන්ස, මේ කුමාරයා නුග ගසක් මෙන් උසට සරි මහතද මහතට සරි උසද ඇත්තෙකි. ඔහුගේ ශරීරය යම් ප්‍රමාණයක් වේද ඔහුගේ බඹයද එපමණම වේ. ඔහුගේ බඹය යම් පමණද ඔහුගේ ශරීරයද එපමණ වේ. දේවයන්වහන්ස මේ කුමාරයා දිග ද නොවූ කොටද නොවූ යහපත් ලෙස පිහිටි ගෙල (බෙල්ල) ඇත්තේය දේවයන්වහන්ස, මේ කුමාරයා උඩුකුරුව බෙල්ලෙහි බැඳී සිටි සත්දහසක් රස නහර ඇත්තෙකි. දේවයන් වහන්ස, මේ කුමාරයා සිංහයෙකුගේ මෙන් පිරුණු හනු දෙකක් ඇත්තෙකි. දේවයන් වහන්ස, මේ කුමාරයා දත් හතලිහක් ඇත්තෙකි. දේවයන් වහන්ස, මේ කුමාරයා උස් මිටි නොව සමව පිහිටි දත් ඇත්තෙකි දේවයන් වහන්ස, මේ කුමාරයා අතර සිදුරු නැති දත් ඇත්තෙකි. දේවයන් වහන්ස, මේ කුමාරයා ඉතා සුදු රැස් විහිදෙන දත් ඇත්තෙකි. දේවයන් වහන්ස, මේ කුමාරයා දික්වූද පලල්වූද දිවක් ඇත්තෙකි. දේවයන් වහන්ස, මේ කුමාරයා කොවුලන්ගේ හඬ මෙන් මිහිරි උතුම් නාදයක් ඇත්තෙකි. දේවයන් වහන්ස, මේ කුමාරයා ඉතා නිල් ඇස් දෙකක් ඇත්තෙකි. දේවයන් වහන්ස, මේ කුමාරයා වස්සෙකුගේ මෙන් නොගිලුණු නොඉල්පුණු ඇස් ඇත්තෙකි. දේවයන් වහන්ස, මේ කුමාරයා දෙබැම මැද නලලෙහි හටගත් සුදුපාට පුළුන් රොදක්සේ මෘදුවූ ඌර්ණ නම් රෝමයක් ඇත්තෙකි. දේවයන් වහන්ස, යම් හේතුවකින් මේ කුමාරයා දෙබැම මැද නලලෙහි හටගත් ඌර්ණ නම් රෝමයක් ඇත්තෙක්වීද මේද ඒ මහා පුරුෂයාගේ මහා පුරුෂ ලක්ෂණයක් වෙයි. දේවයන් වහන්ස, මේ කුමාරයා නලල් පටක් සහිත හිස ඇත්තේය. නොහොත් දිය බුබුලක් මෙන් වටවූ හිසක් ඇත්තෙකි. දේවයන් වහන්ස, යම් හේතුවකින් මේ කුමාරයා දිය බුබුලක් මෙන් වටවූ හිසක් ඇත්තෙක් වේද, මේද ඒ මහා පුරුෂයාගේ මහාපුරුෂ ලක්ෂණයක් වේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**39** "දේවයන් වහන්ස, මේ කුමාරයා මේ දෙතිස් මහ පුරුෂ ලක්ෂණවලින් යුක්තය. යම් ලක්ෂණයන්ගෙන් යුක්ත වූ මහා පුරුෂයෙකුගේ ගති දෙකක්ම වේද අනික් ගතියක් නොවේද, ඉදින් ගිහිගෙයි වාසය කෙරේ නම් දසකුසල ධර්මය ඇත්තාවූ ධර්මයෙන් රජකම් කරන්නාවූ හතර මහාද්වීපයට අධිපතිවූ සතුරන් දිනන්නාවූ ජනපදයන්ට ස්ථිරවූ රත්න හතෙන් යුක්තවූ සක්විති රජ වෙයි. ඒ රජුගේ මේ රත්න හත වෙත්. එනම්, චක්‍රරත්නය, ඇත් රත්නය, අශ්ව රත්නය මැණික් රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය හත්වෙනිවූ පුත්‍ර රත්නය යන මොහු වෙත්. ඔහුට නිර්භීතවූ වීර්‍ය්‍යය ඇත්තාවූ සේනා මැඩ පවත්වන්නාවූ පුත්‍රයෝ දහසකට වැඩිවෙත්. ඒ සක්විති රජ සාගරය සීමාකොට ඇති මේ පෘථිවිය දඬුවම් රහිතව ආයුධ රහිතව ධර්මයෙන් ජය ගෙන අධිපතිව වාසය කරයි. ඉදින් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වේනම් ලොකයෙහි රාගාදී කෙලෙස් වැසීම් නසා අර්හත් සම්‍යක් සම්බුදු වෙයිද එවැනි ලක්ෂණයෝයි.

"මහණෙනි, එවිට බන්ධුම නම් රජ නිමිති දත් බ්‍රාහ්මණයන් අලුත් ඇඳුම් අන්දවා සියලු කැමති දෙයින් සිත් සතුටු කළේය.

**40.** "මහණෙනි, එවිට බන්ධුම රජ විපස්සී කුමාරයාට කිරි මවුන් පත්කළේය. වෙනත් ස්ත්‍රීහූ කිරි පොවත්, වෙනත් ස්ත්‍රීහු නාවත්, වෙනත් ස්ත්‍රීහු දරත්, වෙනත් ස්ත්‍රීහු ඇකයෙන් වඩා ගනිත්.

"මහණෙනි, උපන්නාවූ විපස්සී කුමාරයාට රෑ දාවල් දෙකෙහි සේසත (සුදු කුඩය) දැරූහ. ඒ බොධිසත්වයන් සීතල හෝ උෂ්ණය හෝ තණ හෝ දූවිලි හෝ පිනි හෝ පීඩා නොකෙරේවායි කියායි. මහණෙනි, උපන්නාවූ විපස්සී කුමාර තෙම බොහෝ දෙනාට ප්‍රිය වූයේය. හිත සතුටු කරන්නෙක්ද විය.

"මහණෙනි, මහනෙල් මල් හෝ නෙළුම් මල් හෝ සුදු නෙළුම් මල් හෝ යම්සේ බොහෝ දෙනාට ප්‍රියවේද හිත සතුටු කරන්නේ වේද, මහණෙනි, එසේම විපස්සී කුමාරයා බොහෝ දෙනාට ප්‍රිය විය. හිත් සතුටු කරන්නේ විය. ඒ විපස්සී කුමාරයා

අතින් අතට උකුලෙන් උකුලට වඩා ගනිමින් පරිහරණය කරණු ලැබේ.

41. 'මහණෙනි, උපන්නාවූ විපස්සි කුමාරයා සිහින් කටහඬ ඇත්තේද, දක්ෂවූ කටහඬ ඇත්තේද, මිහිරි කටහඬ ඇත්තේද, ප්‍රේම කටයුතු කටහඬ ඇත්තේද විය. මහණෙනි, හිමාල පර්වතයෙහි සිහින් කටහඬ ඇත්තාවූද, දක්ෂ කටහඬ ඇත්තාවූද, මිහිරි කටහඬ ඇත්තාවූද, ප්‍රේම කටයුතු කටහඬ ඇත්තාවූද කරවීක නම් පක්ෂි වර්ගයක් ඇත්තේය. මහණෙනි, ඒ පරිද්දෙන්ම විපස්සී කුමාරයා ඒ කොවුලන්ගේ කටහඬ මෙන් සිහින් කටහඬ ඇත්තේද, දක්ෂ කටහඬ ඇත්තේද, මිහිරි කටහඬ ඇත්තේද, ප්‍රේමනීය කටහඬ ඇත්තේද විය.

42. "මහණෙනි, උපන්නාවූ විපස්සී කුමාරයාට රෑ දාවල් දෙකෙහි තමන් වටේට යොදුන් සියයක් තැන පෙණේද, එවැනි කර්ම විපාකයෙන් හටගත්තාවූ දෙවියන්ගේ ඇස් වැනි ඇස් ඇත්තේය.

43. "මහණෙනි, උපන්නාවූ විපස්සී කුමාරයා තව්තිසා දෙවියන් මෙන් ඇස්පිය නොහෙලමින් බලයි. මහණෙනි, කුමාරයා ඇස්පිය නොහෙළා බලයි. යන කාරණයෙන්ම විපස්සී කුමාරයාට විපස්සීය විපස්සීය යන නාමය උපන්නේය. මහණෙනි, එවිට බන්ධුම රජතෙම රාජ්‍යානුශාසනා කරන තන්හි විපස්සී කුමාරයා උකුලේ හිඳුවාගෙන රාජ්‍යානුශාසනා කෙරේ. මහණෙනි, විපස්සී කුමාරයා එකල්හි පිය මහරජුගේ උකුලෙහි ඉඳගෙන විශෙෂයෙන් පරීක්ෂා කරමින් යුක්තිය ලෙස කාරණයන් පෙන්වා දෙයි. මහණෙනි, කුමාරයා පරීක්ෂා කරමින් යුක්තිලෙස කාරණයන් පෙන්වා දෙයි යන මේ කාරණයෙන් වැඩියක් විපස්සීය විපස්සීය යන මේ නාමය උපන්නේය.

44 "මහණෙනි, එවිට බන්ධුම රජතුමා විපස්සී කුමාරයාට ප්‍රාසාද තුනක් කරවීය. එක් ප්‍රාසාදයක් වර්ෂා ඍතුවට සුදුසු වේ. එක් ප්‍රාසාදයක් හිම ඍතුවට සුදුසු වෙයි එක් ප්‍රාසාදයක් ග්‍රීෂ්ම ඍතුවට සුදුසු වෙයි. සියලු පඤ්චකාම සැපද සම්පූර්ණ කෙළේය. මහණෙනි, එක් කලක විපස්සී කුමාරයා වර්ෂා කාලයට

සුදුසුවූ ප්‍රාසාදයෙහි වර්ෂා සාරමාසය මුලුල්ලෙහි, පුරුෂයන් නැති, ස්ත්‍රීන් විසින්ම පවත්වන තූර්‍ය්‍යයෙන්, පිරිවරණ ලද්දේ පහළ තලයට නොබැසම වාසය කෙරේ.”

ජාතික්ඛණ්ඩය නිමියේයි.

1. ‘මහණෙනි, එකල්හි විපස්සී කුමාර තෙමේ බොහෝ අවුරුදු සිය ගණන් අවුරුදු දහස් ගණන් අවුරුදුගතවීමෙන් පසු රියදුරාට කථාකොට යහලු රියැදුර, හොඳ හොඳ යානාවන් පිළියෙල කරව. උයන දැකීම සඳහා උයනට යන්නෙමුයි කීය. මහණෙනි, ‘දේවයන්වහන්ස, එසේයයි’ රියැදුරු තෙමේ විපස්සී කුමාරයාට පිළිතුරුදී හොඳ හොඳ යානාවන් පිළියෙල කොට විපස්සී කුමාරයාට දැන්වීය. ‘දෙවයන් වහන්ස නුඹ වහන්සේට යානා පිළියෙල කරන ලද්දාහුය.’ යම් ගමනකට කැමැත්තේ නම් දැන් ඊට කාලය දනුමැනවැයි කීය. මහණෙනි, එකල්හි විපස්සී කුමාර තෙමේ හොඳ යානාවකට නැග හොඳ හොඳ යානාවලින් උයන් බිමට පැමිණියේය.

2 “මහණෙනි, උයන් බිමට යන්නාවූ විපස්සී කුමාර තෙමේ ජරාවටගියාවූ ගොනැස්සක් (වකුටුපරාලය) මෙන් නැමුණාවූ මැදින් බිඳුණාවූ සැරයටියක් පිහිට කොට ඇත්තාවූ වෙව්ලමින් යන්නාවූ ලෙඩ සහිතවූ තරුණකම ගතවූ පුරුෂයකු දැක්කේය. දැක රියැදුරාට කථා කළේය. ‘යහළු රියැදුර’ මේ පුරුෂ තෙම කුමක් කරන ලද්දේද, ඔහුගේ කෙස්ද අන්‍යයන්ගේ කෙස් මෙන් නොවෙත්. ඔහුගේ කයද අන්‍ය පුරුෂයන්ගේ කය මෙන් නොවේ, කීයේය ‘දෙවයන් වහන්ස, මෙතෙමේ ජරාවටපැමිණි පුරුෂයෙක්යයි’ කීයේය ‘කිමෙක්ද යහළු රියැදුර, මේ තෙමේ ජරාවට ගිය පුරුෂයෙක්දැයි ඇසීය ‘දේවයන්වහන්ස, එසේය, මෙතෙමේ ජරාවට ගිය කෙනෙක් නම් වේ දැන් ඔහු වැඩි කලක් ජීවත් නොවන්නේයයි’ කීය. ‘යහළු සාරථිය, කිමෙක්ද මමත් ජරාව ස්වභාවකොට ඇත්තෙම්ද? මා විසින් ජරාව නොඉක්මවනලද්දීදැයි, ඇසීය, ‘දෙවයන් වහන්ස, නුඹ වහන්සේද අපිද යන සියල්ලෝම ජරාව ස්වභාවකොට ඇත්තෝ වෙමු. අපවිසින් ජරාව නොයික්මවන ලද්දීයයි’ කීයේය. එහෙනම්

අද උයන් ක්‍රීඩාවට යාමෙන් කමක් නැත, දැන්ම ආපසුහැරී ඇතුළුනුවරට රථය ගෙනයවයි' කීය.

"මහණෙනි, රියදුරුතෙමේ 'දේවයන් වහන්ස, එසේයයි' පිළිතුරුදී එතනින්ම ඇතුළු නුවරට ආපසු ගියේය. මහණෙනි, එසේ ඇතුළු නුවරට පැමිණියාවූ විපස්සී කුමාර තෙමේ දුක් සහිත වූයේ නොසතුටු සිත් ඇත්තේ කලකිරුණු සිත් ඇතිව මෙසේ සිතයි. කෙසේද? 'පින්වත්නි, ඉපදීමට නින්දා වේවා, යම් තැනක උපන්නහුගේ ජරාව පෙනේයයි' කියායි.

3 මහණෙනි, එකල බන්ධුම රජ රියැදුරාට කථාකොට මෙසේ කීය. 'රියැදුර, කිමෙක්ද කුමාරයා උයනෙහි ඇලී වාසය කෙළේද, කිමෙක්ද රියැදුර, කුමාරයා උයනෙහි සතුටු සිත් ඇතිව වාසය කෙළේද' කියායි. 'දේවයන් වහන්ස, කුමාරතෙමේ උයනෙහි සතුටු සිත් ඇතිව වාසය නොකෙළේ යයි' කීය. 'යහළු රියැදුර, උයනට යන්නාවූ කුමාර තෙමේ කුමක් දුටුයේද?' 'දේවයන්වහන්ස, උයනට යන්නාවූ කුමාර තෙමේ ජරාවටගියාවූ දෙකට නැමුණුවූ මැදින් බිඳුනාවූ සැරයටියක් පිහිට කොට ඇති වෙව්ලමින් යන ජරාවෙන් පෙළෙන ගතවූ තරුණකම ඇති එක් පුරුෂයකු දිටුවේය. දැක, මට මෙසේ කීයේය. 'යහළු සාරථිය, මේ පුරුෂතෙමේ කුමක් කරන ලද්දේද? ඔහුගේ කෙස්ද අන්‍යයන්ගේ මෙන් නොවේ. ඔහුගේ කයද අන්‍යයන්ගේ මෙන් නොවේයයි' කීය. 'දෙවයන් වහන්ස, මෙතෙමේ ජරාවට ගිය කෙනෙකැයි කීයෙමි' 'යහළු රියැදුර, කිමෙක්ද, ඔහු ජරාවට ගිය කෙනෙක් දැයි' ඇසීය. 'දෙවයන් වහන්ස, ඔහු ජරාවට ගිය කෙනෙක ඔහු වැඩි කලක් ජීවත් නොවන්නෙකැයි' කීවෙමි. 'රියැදුර, මමද ජරාව ඇත්තෙම්ද? මා විසින් ජරාව නොයික්මවන ලද්දී දැයි' ඇසීය. 'දෙවයන් වහන්ස, ඔබ වහන්සේද අපිද යන සියල්ලෝම ජරාවට පැමිණෙන්නාහුය. ජරාව නොඉක්මවන ලද්දීයයි' කියෙමි. 'යහළු රියැදුර, එසේ නම් අද උයනට යාමෙන් කම් නැත. මෙතැනින් ආපසු ඇතුළු නුවරට රථය ගෙන යවයි' කීය. 'දෙවයන් වහන්ස, 'එසේයයි' මම විපස්සී කුමාරයාට උත්තරදී එතනින් ඇතුල් නුවරට රථය ගෙන ගියෙමි.

'දෙවයන්වහන්ස, ඇතුල්නුවරට පැමිණියාවූ කුමාර තෙමේ දුක් සහිත වූයේ නොසතුටු සිත් ඇත්තේ කලකිරී මෙසේ සිතයි. 'පිංවත්නි, ඉපදීමට නින්දා වේවා. යම්තැනක උපන්නහුගේ ජරාව පෙනේය' කියායි.

4 "මහණෙනි, එකල බන්ධුම රජහට මේ අදහස ඇති විය. 'කුමාරයා රාජ්‍යය කරන්නෙක්ම වේවා. විපස්සී කුමාරයා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වන්නෙක් නොවේවා. නිමිති දත් බ්‍රාහ්මණයන්ගේ වචනය සත්‍යනොවේවායි' කියායි. මහණෙනි, එවිට බන්ධුම රජ බොහෝසෙයින්ම විපස්සී කුමාරයාට පඤ්චකාම සම්පත් ගෙනදුන්නේය. එනම්, යම්සේ විපස්සී කුමාරයා රජය කරවන්නේද, යම්සේ විපස්සී කුමාරයා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි නොවන්නේද යම්සේ නිමිති දත් බ්‍රාහ්මණයන්ගේ වචනය සත්‍ය නොවන්නේද, එබඳු පස්කම් සැප වෙත්. මහණෙනි, එකල්හි විපස්සී කුමාරයා පස්කම් සැපයෙන් යුක්තවූයේ එයින් ඉන්ද්‍රියයන් පිනවමින් වාසය කරයි.

5 "මහණෙනි, එවිට විපස්සී කුමාරයා බොහෝ අවුරුදු බොහෝ සියගණන් අවුරුදු බොහෝ දහස් ගණන් අවුරුදු පසුවූකල රථාචාය්‍ර්යයාට කථාකර මෙසේ කීයේය. "යහලුව සාරථිය, යහපත් යහපත් යානාවන් යොදව. උයන දැකීමට උයන්බිමට යන්නෙමියි" කීයේය. මහණෙනි, 'දේවයන් වහන්ස, එසේයයි' ඒ සාරථී විපස්සී කුමාරයාට උත්තරදී යහපත් යානාවන් යොදවා විපස්සී කුමාරයාට දැන් විය. 'දේවයන් වහන්ස, නුඹවහන්සේට යහපත් යහපත් යානාවෝ යොදන ලද්දාහුය. නුඹවහන්සේ යම් ගමනකට කාලය බව දන්නේ නම් එය කරනු මැනවයි' ද කීවේය මහණෙනි, එවිට විපස්සී කුමාරයා යහපත් යානාවකට නැගී යහපත් යහපත් යානාවලින් උයනට ගියේය.

6 "මහණෙනි, විපස්සී කුමරු උද්‍යානයට යන අතර ලෙඩ ඇත්තාවූ දුක් ඇත්තාවූ දැඩිසේ ලෙඩවූ තමාගේ මල මූත්‍රයෙහි සයනය කරන්නාවූ, අනුන් විසින් නැගිටවනු ලබන්නාවූ අනුන් විසින් සයනය කරවනු ලබන්නාවූ අනුන් විසින් කවනු පොවනු ලබන්නාවූ පුරුෂයෙකු දුටුවේය. දැක සාරථීයාගෙන් මෙසේ

ඇසුවේය. 'යහලුව සාරථිය, මේ පුරුෂයා කුමක් කරන ලද්දේද? ඔහුගේ ඇස් අනුන්ගේ ඇස් මෙන් නොවෙත්, ඔහුගේ ශබ්දයද අනුන්ගේ ශබ්දයන් මෙන් නොවේ' 'දේවයන් වහන්ස, මොහු ලෙඩ වූවෙක්' යයි කීයේය. 'කිමෙක්ද? සාරථිය, මොහු ලෙඩවූවෙක්දැයි' ඇසුවේය.

'දේවයන් වහන්ස, මොහු ලෙඩ වූවෙකැයි' කීවේය. 'ඒ රෝගයෙන් මිදෙන්නේ නම් ඉතා හොඳයයි' කීයේය. 'කිමෙක්ද? යහලු රියැදුර, මමත් ලෙඩවන ස්වභාව ඇත්තෙක් වම්ද? ලෙඩවන ස්වභාව නැති නොකළ කෙනෙක් වෙම් දැයි' ඇසුවේය.

'දේවයන් වහන්ස, ඔබවහන්සේද අපිද යන සියල්ලෝම ලෙඩවන ස්වභාව ඇත්තෝවෙමු. ලෙඩවන ස්වභාව නොඉක්මවූවෝ වමු.'

'යහලුව, සාරථිය, එහෙනම් දැන් උයනට යාමෙන් කම් නැත. මෙතනින්ම ඇතුළු නුවරට ආපසු රථය ගෙනයවයි' කීයේය.

"මහණෙනි, එකල විපස්සී කුමාරයා ඇතුළුනුවරට ගියේ දුකින්, නොසතුටු සිතින් නොයෙක් ආකාරයෙන් පසුතැවිලි සිතිවිලි සිතයි. මහණෙනි, 'යම් තැනෙක උපන් අයගේ දිරීම පෙනෙන්නේද, ලෙඩ පෙනෙන්නේද ඒ ඉපදීමට නින්දා වේවායි' කියායි.

7 "මහණෙනි, එවිට බන්ධුම රජ රියැදුරාට කථාකර මේ කාරණය ඇසුවේය. 'යහලුව සාරථිය, කිමෙක්ද? කුමාරයා උයනෙහි ඇලුණේද? යහලු සාරථිය, කිමෙක්ද? කුමාරයා උද්‍යානයෙහි සතුටුවූයේදැයි' ඇසුවේය.

'දේවයන් වහන්ස, කුමාරයා උයනෙහි නොඇලුණේය. දේවයන් වහන්ස, කුමාරයා උයනෙහිදී සතුටු නොවූයේයයි' කීවේය

'යහලුව සාරථිය, කිමෙක්ද කුමාරයා උයනට යන අතර මගදී කුමක් නම් දුටුවේදැයි' ඇසුවේය.

'දේවයන් වහන්ස, කුමාරයා උයනට යන කල් අතර මගදී ලෙඩ ඇත්තාවූ දුඃඛිතවූ දැඩි ගිලන් බැව් ඇත්තාවූ තමාගේ මලමුත්‍රයෙහි සයනය කරන්නාවූ අනුන් විසින් ඔසවනු ලබන්නාවූ, අනුන් විසින් සයනය කරවනු ලබන්නාවූ, අනුන් විසින් කවනු පොවනු ලබන්නාවූ පුරුෂයෙකු දුටුයේය. දැක මට මෙසේ කීයේය. 'යහලුව සාරථිය, මේ පුරුෂයා කුමක් කරන ලද්දේද? ඔහුගේ ඇස් අනුන්ගේ ඇස් මෙන් නොවෙත්. ඔහුගේ ශබ්දයද අනුන්ගේ ශබ්දයන් මෙන් නොවේ' යනුයි.

'දේවයන් වහන්ස, මොහු ලෙඩ තැනැත්තෙක් යයි' කීයේය 'කිමෙක්ද? සාරථිය, මොහු ලෙඩ ඇත්තෙක්දැයි, ඇසුවේය. 'දේවයන් වහන්ස, මොහු ලෙඩ ඇත්තෙක්වේ. ඔහු ඒ රෝගයෙන් මිදෙන්නේ නම් ඉතා හොඳයයි කීයේය.

'කිමෙක්ද? යහලු රියැදුර, මමත් ලෙඩවන ස්වභාව ඇත්තෙක්, ලෙඩ නැති නොකළ කෙනෙක් වෙම්දැයි' ඇසුවේය.

'දේවයන් වහන්ස, ඔබවහන්සේද අපිද යන සියල්ලෝම ලෙඩ ස්වභාවකොට ඇත්තෝ වමු. ලෙඩ නැති නොකළ ඇත්තෝ වෙමුයයි' කීයෙමි.

'යහලුව සාරථිය, එහෙනම් දැන් අද උයනට යාමෙන් කම් නැත. මෙතනින්ම ඇතුළු නුවරට ආපසු රථය ගෙනයවයි' කීයේය. දේවයන් වහන්ස 'මම, දේවයිනි ඒ මැනවයි' විපස්සී කුමාරයාට උත්තරදී එතනින්ම ඇතුළු නුවරට ආපසු ආවෙමි.

'දේවයන්වහන්ස, ඒ කුමාරයා ඇතුළුනුවරට පැමිණියේ දුක් ඇතුව නොසතුටු සිත් ඇතිව නොයෙක් ආකාරයෙන් පසුතැවිලි සිතිවිලි සිතයි' මහණෙනි, 'යම්තැනක උපන්නහුගේ ජරාව පෙනේද ලෙඩවීම පෙනේද එවැනි ඉපදීමට නින්දා වේවායි' කියායි.

8 මහණෙනි, එකල බන්ධුම රජහට මේ අදහස ඇති විය. 'විපස්සි කුමාරයා රාජ්‍යය කරන්නෙක්ම වේවා. විපස්සී කුමාරයා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවන්නෙක් නොවේවා නිමිතිදත් බ්‍රාහ්මණයන්ගේ වචනය සත්‍යනොවේවායි' කියායි. මහණෙනි,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

එවිට බන්ධුම රජ බොහෝසෙයින්ම විපස්සී කුමාරයාට පඤ්චකාම සැප ගෙන දුන්නේය. යම්සේ විපස්සී කුමාරයා රාජ්‍යය කරවන්නේද, යම්සේ විපස්සී කුමාරයා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි නොවන්නේද, යම්සේ නිමිති දත් බ්‍රාහ්මණයන්ගේ වචනය සත්‍ය නොවන්නේද එබඳු පස්කම් සැපයෙනි.' මහණෙනි, එහි විපස්සී කුමාරයා පස්කම්සැපයෙන් යුක්තවූයේ ඉන්ද්‍රියයන් පිනවමින් වසයි.

9 "මහණෙනි, එවිට විපස්සී කුමාරයා බොහෝ අවුරුදු බොහෝ සියගණන් අවුරුදු බොහෝ දහස්ගණන් අවුරුදු පසුවූකල රථාචාර්‍ය්‍යයාට කථාකර මෙසේ කීයේය. 'යහළුව සාරථිය යහපත් යහපත් යානාවන් යොදව. උයන දැකීම සඳහා උයනට යන්නෙමි' යි කියායි. මහණෙනි, දේවයන් වහන්ස, එසේයයි' ඒ සාරථී විපස්සි කුමාරයාට උත්තරදී යහපත් යහපත් යානාවන් යොදවා විපස්සී කුමාරයාට දැන් වීය. දේවයන්වහන්ස, නුඹවහන්සේට යහපත් යහපත් යානාවෝ යොදන ලද්දාහුය. යම්ගමනක් සඳහා නුඹවහන්සේ දැන් කාලය බව දන්නේ නම් එය කරනු මැනවයිද' කීවේය.

"මහණෙනි, එවිට විපස්සී කුමාරයා යහපත් යානාවකට නැගී යහපත් යහපත් යානාවලින් උයනට ගියේය.

10 "මහණෙනි, විපස්සී කුමාරයා උයනට යන කල නොයෙක් රත්නවලින් හා රෙදිවලින් සිවිගෙයක් සාදන්නාවූ මිනිසුන් බොහෝ සමූයක් දුටුවේය. දැක රියැදුරාගෙන් මෙසේ ඇසුවේය. 'යහලුව සාරථිය, රැස්වූ මේ මහජනයා කුමක් සඳහා නොයෙක් රත්නවලින් හා රෙදිවලින් සිවි ගෙයක් කෙරේදැයි' ඇසුවේය. 'දේවයන් වහන්ස, මේ මළමිනියකැයි' කීය.

'යහලුව සාරථිය, එමෙන්ම ඒ මලමිනිය යම් තැනකද එතනට රථය ගෙනයවයි' කීයේය.

'දේවයන් වහන්ස, එසේ යහපතැයි' ඒ සාරථියා විපස්සී කුමාරයාට උත්තරදී, මහණෙනි, ඒ මළමිනිය යම් තැනකද එතනට රථය යැවීය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, විපස්සී කුමාරයා මළමිනිය දුටුවේය. දැක සාරථියාට කථා කර (මෙසේ) කීයේය. 'යහලුව, සාරථිය, කිමෙක්ද? මේ මළමිනියක්දැයි' ඇසීය.

'දේවයන් වහන්ස, මේ මළමිනියකැයි කීය' 'දැන් ඔහුගේ මව් හෝ පියා හෝ අන්‍ය සහ ලේ නෑයෝ හෝ ඔහු නොදකිත්. ඒ මැරුණු තැනැත්තාද මව් හෝ පියා හෝ අන් සහ ලේ නෑයන් හෝ නොදකින්නේය' 'යහලුව සාරථිය, කිමෙක්ද? මමත් මරණය ස්වභාව කොට ඇත්තෙම්ද? මරණය නොයික්මවන ලද්දේම්දැයි' ඇසුවේය.

'දේවයන් වහන්සේ හෝ, දෙවීන් වහන්සේ හෝ අන්‍යවූ සහ ලේ නෑයෝ හෝ මා නොදකිත්ද? මමත් දේවයන් වහන්සේ හෝ දේවීන්වහන්සේ හෝ අන්‍යවූ සහ ලේ නෑයින් හෝ නොදකින්නෙම්දැයි' ඇසුවේය.

'ඔබ වහන්සේද අපිද යන සියල්ලෝ මරණය ස්වභාව කොට ඇත්තෝවෙමු. මරණය වළක්වන ලද්දෝ හෝ නොවෙමුයි' කීයේය. 'දේවයන් වහන්සේ හෝ දේවීන් වහන්සේ හෝ අන්‍යවූ සහ ලේ නෑයෝ හෝ ඔබ වහන්සේද නොදකිත්. ඔබවහන්සේද දේවයන් වහන්සේ හෝ දේවීන් වහන්සේ හෝ අන්‍යවූ සහ ලේ නෑයන් හෝ නොදකින්නෙහිය.'

'යහලුව, සාරථිය, එහෙනම් දැන් අද උයනට යාමෙන් කම් නැත. මෙතැනින්ම ඇතුළු නුවරට ආපසු යන ලෙස රථය පදවයි' කීයේය.

'දේවයන් වහන්ස, එසේයයි' සාරථී තෙම විපස්සී කුමාරයාට උත්තරදී එතනින්ම ආපසු ඇතුළු නුවරට ගියේය. මහණෙනි, එකල ඇතුළුනුවරට පැමිණි විපස්සී කුමාරයා දුක් සහිතව නොසතුටු සිත් ඇතුව නොයෙක් ආකාරයෙන් පසුතැවිලි සිතිවිලි සිතයි. මහණෙනි, 'යම් තැනක උපන්නහුගේ දිරීම පෙනෙන්නේද, ලෙඩවීම පෙනෙන්නේ ද, මරණය පෙනෙන්නේ ද ඒ ජාතියට නින්දා වේවා' කියායි.

11. "මහණෙනි, එවිට බන්ධුම රජ රියැදුරාට කථාකර මේ කාරණය කීයේය. 'යහලුව, සාරථිය, කිමෙක්ද? කුමාරයා

උයනෙහි ඇලුණේද? යහලුව සාරථිය කිමෙක්ද? කුමාර තෙම උයනෙහි සතුටු වූයේදැයි' විචාළේය. 'දේවයන් වහන්ස, කුමාරතෙම උයනෙහි ඇලුම් නොකෙළේය. දෙවයන් වහන්ස, කුමාරතෙම උයනෙහිදී සතුටු නොවූයේ යයි' කීයේය. 'යහළු සාරථිය, කුමාරතෙම උයනට යන අතර මගදී කුමක් දුටුවේදැයි' විචාළේය. දෙවයන්වහන්ස, කුමාර තෙම උයනට යද්දී නොයෙක් රත්නවලින් හා රෙදිවලින් සිවි ගෙයක් කරන්නාවූ, මහත් ජනසමූහයක් දුටුවේය. දැක, මට මෙසේ කීයේය. 'යහලුව සාරථිය, මේ මහාජන සමූහය රැස්ව නොයෙක් රත්නවලින් හා රෙදිවලින් කුමක් පිණිස සිවිගෙයක් කරන්නේදැයි' විචාළේය. 'දෙවයන් වහන්ස, මේ මළ මිනියකැයි' කියෙමි. 'යහලු සාරථිය, එහෙනම් ඒ මළ මිනිය යම් තැනෙක්හිද, එතැනට රථය ගෙන යවයි' කීයේය 'දෙවයන් වහන්ස, මමද, දෙවයිනි, ඒ මැනවයි' විපස්සී කුමාරයන්ට උත්තර දී ඒ මළමිනිය යම් තැනකද එතැනට රථය යැව්වෙමි. දේවයන් වහන්ස, කුමාර තෙමේ ඒ මළමිනිය දුටුයේය. දැක, මට මෙසේ කීයේය. 'යහලුව, සාරථිය, කිමෙක්ද? මේ මළ කෙනෙක්දැයි විචාළේය.

'දෙවයන් වහන්ස, මේ මළකෙනෙකි. මව් හෝ පියා හෝ අන්‍යවූ සහ ලේ නෑයෝ හෝ ඔහු නොදකිත්, ඒ මළ තැනැත්තේද මව හෝ පියා හෝ අන්‍යවූ සහ ලේ නෑයන් හෝ නොදක්නේයයි' කීයෙමි. 'යහලුව සාරථිය, කිමෙක්ද? මමත් මරණය ස්වභාව කොට ඇත්තෙම්ද? මරණය නොයික්මවන ලද්දෙම්ද?'

'දෙවයන් වහන්සේ හෝ දෙවීන් වහන්සේ හෝ අන්‍යවූ සහ ලේ නෑයෝ හෝ මා නොදකිත්ද? මමත් දෙවයන් වහන්සේ හෝ දෙවීන් වහන්සේ හෝ අන්‍යවූ සහ ලේ නෑයන් නොදක්නේමදැයි' විචාළේය. 'දෙවයන්වහන්ස, ඔබ වහන්සේද අපිද යන සියල්ලෝම මරණය ස්වභාවකොට ඇත්තෝ වම්හ. මරණය නොයික්මවන ලද්දෝ වම්හ. දෙවයන් වහන්සේ හෝ දෙවීන් වහන්සේ හෝ අන්‍යවූ සහ ලේ නෑයෝ හෝ ඔබවහන්සේ නොදක්නාහ. ඔබවහන්සේද දෙවයන් වහන්සේ හෝ දෙවීන් වහන්සේ හෝ අන්‍යවූ සහ ලේ නෑයන් හෝ නොදක්නෙහියයි'

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කීයෙමි. 'යහලුව සාරථිය, එහෙනම් දැන් උයනට යාමෙන් කම් නැත. මෙතැනින්ම ඇතුළුනුවරට පෙරළා යවයි කීයේය. දෙවයන් වහන්ස' මම, 'දෙවයිනි ඒ මැනවැයි' විපස්සී කුමාරයාට උත්තරදී එතැනින්ම ඇතුළුනුවරට පෙරළා ගියෙමි දෙවයන් වහන්ස ඒ මේ කුමාරතෙම ඇතුළුනුවරට පැමිණියේම දුක් ඇත්තේ නොසතුටු සිත් ඇත්තේ නොයෙක් ලෙසින් විපිළිසර සිතිවිලි සිතයි. 'පින්වත්නි, යම් තැනක උපන්නහුගේ ජරාව පෙනෙන්නේද, ලෙඩවීම පෙනෙන්නේද, මරණය පෙනෙන්නේද ඒ ජාතියට (උත්පත්තියට) නින්දාවේවායි' කියායි.

12 "ඉක්බිති බන්ධුම රජහට මේ අදහස වීය. 'විපස්සී කුමාරතෙම රාජ්‍යය කෙරේවා. විපස්සී කුමාරතෙම ගිහි ගෙන් නික්ම සස්නෙහි පැවිදි නොවේවා. නිමිති කියන බමුණන්ගේ වචනය බොරු වේවා" යි මහණෙනි, ඉක්බිති බන්ධුම රජතෙම විපස්සී කුමාරයාට බොහෝසෙයින්ම පස්කම් ගුණයන් සැලැස්වීය. කෙසේද? යම්සේ විපස්සී කුමාරතෙම රාජ්‍යය කරවන්නේද? යම්සේ විපස්සී කුමාර තෙම ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි නොවන්නේද, නිමිති කියන බමුණන්ගේ වචන බොරු වන්නේද, එබඳු පඤ්චකාම ගුණයෝයි. මහණෙනි, එකල විපස්සී කුමාරතෙම පස්කම් ගුණයන්ගෙන් පිණා ගියේ, එයින්ම යුක්ත වූයේ ඉන්ද්‍රියයන් හසුරුවාලයි.

13 "මහණෙනි, ඉන්පසු විපස්සී කුමාරතෙම බොහෝ අවුරුදු, බොහෝ සියගණන් අවුරුදු, බොහෝ දහස් ගණන් අවුරුදු පසුවූකල රියැදුරාට කථාකළේය 'යහලුව සාරථිය, හොඳ හොඳ යානාවන් යොදව, උයන දැකීම පිණිස යන්නෙමි' යි කීය. 'දෙවයන්වහන්ස ඒ මැනවැයි' ඒ රියැදුරුතෙම කුමරුට පිළිතුරුදී හොඳ හොඳ යානාවන් යොදවා, විපස්සී කුමාරයාට දැන්වීය. 'දෙවයන්වහන්ස, ඔබවහන්සේට හොඳ හොඳ යානාවෝ යොදන ලද්දාහුය. දැන් ඔබවහන්සේ යම් ගමනකට කල් දන්නාසේක් නම් එය කරනු මැනවැයි' කීයේය. මහණෙනි, එවිට විපස්සී කුමාරතෙම යහපත් යානාවකට නැඟී හොඳ හොඳ යානාවලින් උයනට පිටත්ව ගියේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

14 "විපස්සී කුමාරයා උයනට යන කල හිස මුඩුකළාවූ පැවිදිවූ කහවස්ත්‍ර ඇඳගත් පුරුෂයෙකු දැක, රියැදුරාගෙන් මෙසේ ඇසුවේය. 'යහලුව සාරථිය, මේ පුරුෂයා කුමක් කරන ලද්දේද, ඔහුගේ හිස සෙසු අයගේ හිස මෙන් නොවේ. ඔහුගේ ඇඳුම් අන්‍යයන්ගේ ඇඳුම් මෙන් නොවේයයි' කීයේය.

'දෙවයන් වහන්ස, මොහු ශ්‍රමණයෙක්යයි' කීයේය.

'යහලුව සාරථිය, කිමෙක්ද? මොහු ශ්‍රමණයෙක්දැයි' ඇසුවේය.

"දෙවයන් වහන්ස, මොහු ධර්මයෙහි හැසිරීම යහපතැයි කියාද, උතුම් පිළිපැදීම යහපතැයි කියාද, කුශලයෙහි හැසිරීම යහපතැයි කියාද, පින් කිරීම යහපතැයි කියාද, සත්ව හිංසා නොකිරීම යහපතැයි කියාද, සත්ව අනුකම්පාව යහපතැයි කියාද, පැවිදි වූයේය' 'යහලුව සාරථිය ඔහු ධර්මයෙහි හැසිරීම යහපතියි කියාද, උතුම් පිළිපැදීම් යහපතියි කියාද, කුශලයෙහි හැසිරීම යහපතැයි කියාද, පින් කිරීම යහපතැයි කියාද, සත්ව හිංසා නොකිරීම යහපතැයි කියාද, සත්ව අනුකම්පාව යහපතියි කියා පැවිදි වූයේද? 'යහලුව සාරථිය, එහෙනම් ඒ ප්‍රව්‍රජිත තෙම යම් තැනකද එතැනට රථය යවවයි' කීයේය.

"මහණෙනි, 'දේවයන්වහන්ස, එසේ යහපතියි' සාරථී තෙම විපස්සී කුමාරයාට උත්තර දී ඒ පැවිදිතෙම යම් තැනකද එතැනට රථය යැව්වේය. මහණෙනි, එවිට විපස්සී කුමාරයා ඒ ප්‍රව්‍රජිතයාගෙන් මේ කාරණය ඇසුවේය.

'යහලුව, ඔබ කුමක් කරන ලද්දෙහිද? ඔබගේ හිසද අනුන්ගේ හිසමෙන් නොවේ. ඔබගේ ඇඳුම්ද අනුන්ගේ ඇඳුම් මෙන් නොවේ"

'දේවයෙනි, මම පැවිදි වූවෙක් නමැයි' කීයේය.

'යහලුව, කිමෙක්ද? ඔබ පැවිදි වූවෙක් නම් වෙහිදැයි' ඇසුවේය.

'දේවයෙනි, මම ධර්මයෙහි හැසිරීම යහපතැයි කියාද, ඉන්ද්‍රියයන් සංසිඳුවා විසීම යහපතැයි කියාද, කුශලයෙහි හැසිරීම

යහපතැයි කියාද, පින් කිරීම යහපතැයි කියාද, සත්ව හිංසා නොකිරීම යහපතැයි කියාද, සත්ව අනුකම්පාව යහපතැයි කියාද පැවිදි වූයෙමි' යි දැන්වීය.

'යහලුව, ධර්මයෙහි හැසිරීම යහපතැයි කියාද, සංසිඳී විසීම යහපතැයි කියාද, කුශලයෙහි හැසිරීම යහපතැයි කියාද, පින් කිරීම යහපතැයි කියාද, සත්ව හිංසා නොකිරීම යහපතැයි කියාද, සත්ව අනුකම්පාව යහපතැයි කියාද, පැවිදිවූ ඔබ යහපත්ය' යි කීයේය.

**15.** "මහණෙනි, එවිට විපස්සී කුමාරයා රථාචාර්‍ය්‍යයාට කථාකොට (මෙසේ) කීයේය. 'යහලුව, රියැදුර, එහෙනම් රථය රැගෙණ මෙතැනින්ම ඇතුළුනුවරටආපසු යව. මම හිසකෙස් රැවුල් කපා දමා කහවස්ත්‍ර ඇඳ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වන්නෙමියි' කීයේය. මහණෙනි, 'ඒ යහපත දේවයන් වහන්සැයි' සාරථියා විපස්සී කුමාරයාට උත්තර දී රථය රැගෙන එතැනින්ම ඇතුළුනුවරට පෙරළා ගියේය. විපස්සී කුමාරයා එහිදීම හිසකෙස් රැවුල් කපාදමා කහවස්ත්‍ර ඇඳ ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදි වූයේය.

**16.** 'මහණෙනි, බන්ධුමති නම් රාජ්‍යයෙහි අසූහාර දහසක් ප්‍රාණීන්වූ ජන සමූහයා විපස්සී කුමාරයා හිස රැවුල් කපාදමා කහ වස්ත්‍ර හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූයේයයි ඇසුයේය. අසා ඔවුන්ට මේ අදහස ඇතිවිය. 'විපස්සී කුමාරයා හිස රැවුල් කපාදමා කහ වස්ත්‍ර හැඳ ගිහි ගෙයින් නික්ම යම් සස්නෙක පැවිදි වූයේ නම් ඒ ධර්ම විනය ඒකාන්තයෙන් ලාමක නොවන්නේය. ඒ මහණ වීමද ලාමක නොවන්නේය. විපස්සී නම් කුමාරයා හිස රැවුල් කපාදමා කහ වස්ත්‍රය හැඳ ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදි වූයේ නම්, අපි පැවිදි වෙමුය, යනු කියනුම කවරේදැයි, සිතීය.

"මහණෙනි, එකල අසූහාරදාහක්වූ ඒ මහජන සමූහය හිස රැවුල් කපාදමා කහ වස්ත්‍ර හැඳ ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවූ විපස්සී බොධි සත්වයන් අනුව යමින් පැවිදි වීය.

"මහණෙනි, එකල්හි ඒ මහත් පිරිස විසින් පිරිවරන ලද්දාවූ විපස්සී බොධිසත්ව තෙමේ ගම් නියම් ගම් ජනපද රාජධානීන්හි චාරිකාවෙහි හැසිරෙයි

17 "මහණෙනි, එවිට තනිව විවේකව උන්නාවූ විපස්සී බොධිසත්වයන්හට මෙවැනි කල්පනාවක් පහළ විය. එනම්: 'මේ සමූහයක් පිරිවරාගෙන වාසය කිරීම මට සුදුසු නොවෙයි මා තනිව සමූහයාගෙන් වෙන්ව වාසය කෙරෙම් නම් යහපති' කියායි.

"මහණෙනි, එවිට විපස්සී බොධිසත්වයන් වහන්සේ පසු කලකදී තනිව සමූහයෙන් වෙන්ව වාසය කළේය. ඒ අසූහාර දහසක් පැවිද්දෝ අන් මගකින් ගියාහුය. විපස්සී බොධිසත්වයෝ අන් මගකින් ගියාහුය.

18. "මහණෙනි, එවිට බෝමැඩ එක් රාත්‍රියක් විසීමට පැමිණියාවූ රහසිගතවූ, තනිව හුන්නාවූ විපස්සී බොධිසත්වයන් වහන්සේට මෙවැනි අදහසක් පහළ වීය. 'ඒකාන්තයෙන් මේ ලෝවැසි සත්වයා මහත් දුකට පැමිණියේය. උපදින්නේද වෙයි දිරන්නේද වෙයි, මැරෙන්නේද වෙයි. චුතවන්නේද වෙයි, නැවත උපදින්නේද වෙයි. එසේද වුවත් මේ ජරා මරණ දුක් කෙළවර කිරීමක් නොදනී. කෙසේද, කවර කලක මේ ජරා මරණ අවසාන කිරීමක් දකින්නේදැයි:' කියායි.

"මහණෙනි, එවිට විපස්සී බොධිසත්වයන් වහන්සේට මේ අදහස විය. 'කුමක් ඇති කල ජරා මරණ වේද, කුමක් හෙතුකොට ගෙන ජරා මරණ දෙක වේදැයි කියායි,

"මහණෙනි, එකල විපස්සී බොධිසත්වයන් වහන්සේට නුවණින් මෙනෙහි කිරීම හෙතුකොටගෙන ඉපදීම ඇති කල ජරා මරණ දෙක වෙයි. ඉපදීම නිසා ජරා මරණ දෙක වේ යයි' යන මේ ප්‍රඥාවගේ අවබොධය විය.

"මහණෙනි, එවිට විපස්සී බොධිසත්වයන් වහන්සේට කුමක් නම් ඇති කල ඉපදීම වේද, කුමක් නිසා ඉපදීම වේදැයි' මේ කල්පනාව ඇති විය.

"මහණෙනි, එකල විපස්සී බොධිසත්වයන් වහන්සේට (යොනිසො මනස්කාරය) නුවණින් මෙනෙහි කිරීම හෙතු කොට ගෙන, කර්ම භවය (දෙවෙනි භවයෙහි උපදවන කර්මය) ඇති කල ඉපදීම වෙයි, කර්ම භවය නිසා ඉපදීම වේයයි ප්‍රඥාවගේ අවබොධය විය.

"මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බොධිසත්වයන් වහන්සේට මෙබඳු අදහසක් විය. 'කුමක් ඇති කල කර්ම භවය වේදැයි කියායි.

"මහණෙනි, එකල විපස්සී බොධිසත්වයන් වහන්සේට නුවණින් මෙනෙහි කිරීම හෙතුකොටගෙන දැඩිසේ අල්වා ගන්නා ආශාව ඇති කල කර්ම බවය වෙයි, දැඩිසේ අල්වා ගන්නා ආශාව නිසා කර්ම භවය වේයයි ප්‍රඥාවගේ අවබොධය වූයේය.

"මහණෙනි එවිට විපස්සී බොධිසත්වයන්හට මේ අදහස විය. කුමක් නම් ඇති කල දැඩි ආශාව වේද, කුමක් නිසා දැඩි ආශාව වේදැයි' කියායි මහණෙනි, එකල විපස්සී බොධි සත්වයන් වහන්සේට නුවණින් සිහිකිරීම හෙතුකොටගෙන ආශාව ඇති කල දැඩි ආශාව වෙයි. දැඩි ආශාව නිසා වේයයි ප්‍රඥාවේ අවබොධය වූයේය.

'මහණෙනි, එවිට විපස්සී බොධිසත්වයන් වහන්සේට මේ අදහස ඇතිවිය. 'කුමක් නම් ඇති කල ආශාව වේද. කුමක් හෙතුකොටගෙන ආශාව වේදැයි' කියායි

"මහණෙනි, එකල විපස්සී බොධිසත්වයන් වහන්සේට සැප, දුක් විඳීම ඇති කල ආශාව වෙයි. 'විඳීම හේතුකොට ගෙන ආශාව වේයයි' නුවණින් මෙනෙහි කිරීමෙන් ප්‍රඥාවගේ අවබොධය වූයේය.

"මහණෙනි, එවිට විපස්සී බොධිසත්වයන්ට මේ අදහස ඇතිවිය. 'කුමක් නම් ඇති කල විඳීම වේද, කුමක් හේතු කොටගෙන විඳීම වේදැයි කියායි.

"මහණෙනි, එකල විපස්සී බොධිසත්වයන්ට නුවණින් මෙනෙහි කිරීමෙන්' සිත අරමුණෙහි ගැටීම (ස්පර්ශ) ඇති කල්හි වේදනාව වෙයි ස්පර්ශය හේතුකොට වේදනාව වේයයි' නුවණින් මෙනෙහි කිරීමෙන් ප්‍රඥාවගේ අවබොධය වූයේය.

"මහණෙනි, එවිට විපස්සී බොධිසත්වයන්ට මේ අදහස වූයේය. 'කුමක් නම් ඇති කල සිත අරමුණෙහි ගැටීමවේද? කුමක් හේතුකොටගෙන සිත අරමුනෙහි ගැටීම වේදැයි' කියායි.

"මහණෙනි, එකල විපස්සී බොධිසත්වයන්ට 'ඇස, කන, දිව, නාසය, කය, සිත යන දොරටු සය (ෂඩායතනය) ඇතිකල ස්පර්ශය වෙයි. ෂඩායතනය හේතු කොටගෙන ස්පර්ශය වේයයි' නුවණින් මෙනෙහි කිරීමෙන් ප්‍රඥාවගේ අවබොධය වූයේය.

"මහණෙනි, එවිට විපස්සී බොධිසත්වයන්ට මේ අදහස වූයේය. 'කුමක් නම් ඇති කල ෂඩායතනය වේද, කුමක් හේතුකොටගෙන ෂඩායතනය වේදැයි, කියායි.

"මහණෙනි, එකල විපස්සී බොධිසත්වයන්ට නුවණින් මෙනෙහි කිරීමෙන් නාම රූප (සිත කය) දෙක ඇති කල ආයතන සය (දොරටු) වෙයි නාම රූප (සිත කය) දෙක හෙතුකොටගෙන ආයතන සය වේයයි, නුවණින් මෙනෙහි කිරීමෙන් ප්‍රඥාවේ අවබොධය වූයේය.

"මහණෙනි, එවිට විපස්සී බොධිසත්වයන්ට මේ අදහස ඇති විය. 'කුමක් නම් ඇති කළ නාමරූප දෙක වේද? කුමක් හෙතුකොටගෙන නාමරූප දෙක වේදැයි කියායි.'

"මහණෙනි, එකල විපස්සී බොධිසත්වයන්ට නුවණින් මෙනෙහි කිරීම හේතුකොටගෙන ප්‍රතිසන්ධි විඥානය (උත්පත්තිය ඇති කරන සිත) ඇතිකල නාමරූප දෙක වෙයි, ප්‍රතිසන්ධි විඥානය හේතුකොටගෙන නාමරූප දෙක වේයයි නුවණින් මෙනෙහි කිරීමෙන් ප්‍රඥාවගේ අවබොධය වූයේය.

"මහණෙනි, එවිට විපස්සී බොධිසත්වයන්ට මේ අදහස ඇතිවිය. 'කුමක් නම් ඇති කල්හි විඥානය වේද, කුමක් හෙතුකොටගෙන විඥානය වේදැයි කියායි.'

"මහණෙනි, එකල විපස්සී බොධිසත්වයන්ට නුවණින් මෙනෙහි කිරීම හෙතුකොටගෙන නාම රූප දෙක ඇති කල විඥානය වෙයි, නාමරූප හෙතුකොටගෙන විඥානය වේයයි ප්‍රඥාවගේ අවබොධය වූයේය.

19 "මහණෙනි, එවිට විපස්සී බොධිසත්වයන්ට මේ අදහස ඇතිවිය. ප්‍රතිසන්ධි සිතත් විදර්ශනා සිතත් යන මේ දෙකම නාමරූප දෙකින් වෙන්ව නොපවතියි. මේ ආකාරයෙන් සත්වයෝ උපදින්නාහුද දිරන්නාහුද මැරෙන්නාහුද චුත වන්නාහුද වෙත්. එහෙයින් නාමරූප දෙක විඤ්ඤාණයට හේතුවේ. මෙසේ යම්සේ නාමරූපයන් හේතුකොටගෙන පිළිසිඳගන්නා සිත ඇතිවේද, පිළිසිඳගන්නාසිත හේතුකොට ගෙන නාම රූප දෙක ඇතිවන්නේය. නාම රූප දෙක හේතු කොටගෙන ඇස ආදි දොරටු සය ඇතිවන්නේය. දොරටු සය හේතුකොටගෙන සිත අරමුණෙහි වැදීම වන්නේය. සිත අරමුණෙහි වැදීම හේතුකොටගෙන තුන් ආකාර වේදනාව වන්නේය, වේදනාව හේතුකොටගෙන උපාදානය (අරමුණු දැඩිකොට අල්වා ගැනීම) වන්නේය. උපාදානය හේතුකොටගෙන ඉපදීම ඇතිකරන කර්මය (කර්ම භවය) වන්නේය. කර්ම භවය හේතුකොටගෙන ජාතිය වන්නේය, ජාතිය හේතුකොටගෙන ජරාව හා මරණයද වන්නේය. ජරා මරණ දෙක හේතුකොටගෙන සොක කිරීමය, වැලපීමය, කයේ දුකය, සිතේ දුකය සොකයෙන් ඇතිවන වෙහෙස (උපායාස) යන මොව්හු පහල වෙත්. මේ ආකාරයෙන් තනි කර දුක් රාශියක්හුගේම පහලවීම වේ.

'මහණෙනි, දුක් ඇති කිරීමේ හේතුව දුක් ඇති කිරීමේ හේතුවයයි විපස්සී බොධිසත්වයන් වහන්සේට, මින් පෙර නොඇසූ ධර්මයන් පිළිබඳ දැනීම පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලොකය පහළ විය.

20 "මහණෙනි, එවිට විපස්සී බොධිසත්වයන්ට මේ අදහස ඇතිවිය. 'කුමක් නම් නැති කළ ජරා මරණ දෙක නොවේද.

කුමක් නම් නැති කිරීමෙන් ජරා මරණ නැති කිරීම වේදැයි' කියායි.

"මහණෙනි, එකල විපස්සී බොධිසත්වයන්ට නුවණින් කරුණු සහිතව සිතා බැලීම හේතුකොටගෙන ඉපදීම නැති කල ජරා මරණ දෙක නොවෙයි. ඉපදීම නැතිකිරීමෙන් ජරා මරණ නැතිකිරීමෙන් වේයයි යන ප්‍රඥාවගේ ප්‍රතිවෙධය විය.

"මහණෙනි, එවිට විපස්සි බොධිසත්වයන්ට මේ අදහස වූයේය. 'කුමක් නම් නැති කල ඉපදීම නොවේ ද? කුමක් නැති කිරීමෙන් ඉපදීම නැතිවේදැයි' කියායී

"මහණෙනි, එකල විපස්සී බොධිසත්වයන්ට නුවණින් මෙනෙහි කිරීමෙන් 'උත්පත්තියට හේතු වන කර්මය නැති කල ඉපදීම නොවෙයි. උත්පත්තියට හේතුවන කර්මය නැති කිරීමෙන් ඉපදීම නැතිවේයයි' නුවණින් කල්පනා කිරීමෙන් ප්‍රඥාවෙන් දැකීම ඇතිවිය.

"මහණෙනි, එවිට විපස්සී බොධිසත්වයන්ට මේ අදහස ඇතිවූයේය 'කුමක් නම් නැතිකල උත්පත්තියට හේතුවන කර්මය නොවේද? කුමක් නැති කිරීමෙන් උත්පත්තියට හේතු වන කර්මය නැතිවීම වේදැයි' කියායි,

"මහණෙනි, එකල විපස්සි බොධිසත්වයන්ට නුවණින් මෙනෙහි කිරීම හේතුකොටගෙන 'දැඩිසේ අල්වා ගන්නා ආශාව (උපාදානය) නැති කල කර්ම භවය නොවෙයි දැඩිසේ අල්වා ගන්නා ආශාව (උපාදානය) නැති කිරීමෙන් කර්ම භවය නැතිවේයයි' ප්‍රඥාවෙන් දැකීම ඇතිවිය.

"මහණෙනි, එකල විපස්සී බොධිසත්වයන්ට මේ අදහස වූයේය. 'කුමක් නැති කළ කල දැඩිව අල්වා ගන්නා ආශාව නොවේද? කුමක් නැති කිරීමෙන් දැඩිව අල්වාගන්නා ආශාව නැතිවීම වේදැයි' කියායි.

"මහණෙනි, එකල විපස්සී බොධිසත්වයන්ට නුවණින් මෙනෙහි කිරීමෙන් 'ආශාව නැති කල කළ, දැඩි ලොභය

නොවෙයි. ආශාව නැති කිරීමෙන් (උපාදාන) තද ඇල්ම නැතිවේයයි' ප්‍රඥාවෙන් දැකීම පහළ විය.

"මහණෙනි, එවිට විපස්සී බොධිසත්වයන්ට මේ අදහස වූයේය කුමක් නම් නැති කල ආශාව නොවේද? කුමකගේ නැති කිරීමෙන් ආශාව නැතිවේදැයි' කියායි.

"මහණෙනි, එකල විපස්සී බොධිසත්වයන්ට නුවණින් මෙනෙහි කිරීම හේතුකොටගෙන 'තුන් ආකාර වේදනාව නැති කළ කල ආශාව නොවේය. වේදනාවන්ගේ නැතිකිරීමෙන් ආශාව නැති කිරීම වේවයි' ප්‍රඥාවෙන් දැකීම ඇතිවිය.

"මහණෙනි, එවිට විපස්සී බොධිසත්වයන්ට මේ අදහස වූයේය.' කුමක්නම් නැතිකල වේදනාව නොවේද? කුමකගේ නැති කිරීමෙන් වේදනා විඳීම නැති වේදැයි කියායි.

"මහණෙනි, එකල විපස්සී බොධිසත්වයන්ට නුවණින් සිහිකිරීම හේතුකොටගෙන 'අරමුණෙහි සිතගැටීම නැතිකල වේදනාව නොවෙයි අරමුණෙහි සිත ගැටීම නැති කිරීමෙන් වේදනාව නැතිකිරීම වේයයි' ප්‍රඥාවෙන් දැකීම විය.

"මහණෙනි, එවිට විපස්සී බොධිසත්වයන්ට මේ අදහස වූයේය. 'කුමක් නම් නැති කල අරමුණෙහි සිත ගැටීම නොවේද? කුමක් නැති කිරීමෙන් අරමුණෙහි සිත ගැටීම නැතිවේදැයි' කියායි.

"මහණෙනි, එකල විපස්සී බොධිසත්වයන්ට නුවණින් සිහිකිරීම හේතුකොටගෙන 'ෂඩායතනය (ඇස්, කන්, නාසා දිව, ඇඟ, හිත යන දොරටු සය) නැතිකල අරමුණෙහි සිත හැපීම නොවෙයි, දොරටු සය නැති කිරීමෙන් අරමුණෙහි සිත හැපීම නැතිවේයයි' ප්‍රඥාවෙන් දැකීම විය.

"මහණෙනි, එවිට විපස්සී බොධිසත්වයන්ට මේ අදහස ඇතිවූයේය. 'කුමක් නම් නැති කල ෂඩායතනය (ඇස්, කන්, නාසා, දිව්, ඇඟ, හිත) නොවේද, කුමකගේ සම්පූර්ණ විනාශයෙන් ෂඩායතන (ඇස්, කන්, නාසා, දිව්, ඇඟ, හිත යන දොරටු සය) නැතිවේදැයි' කියායි.

"මහණෙනි, එකල විපස්සී බොධිසත්වයන්ට නුවණින් සිහි කිරීම හේතුකොටගෙන 'නාමය හා රූපය නැති කල ෂඩායතනය (ඇස්, කන්, නාසා, දිව්, ඇඟ, හිත) නොවෙයි. නාම රූප විනාශය හේතුකොටගෙන ෂඩායතන (ඇස්, කන්, නාසා, දිව්, ඇඟ හිත) විනාශයවේයයි' ප්‍රඥාවේ අවබොධයවිය.

"මහණෙනි, එවිට විපස්සී බොධිසත්වයන්ට මේ අදහස ඇතිවූයේය 'කුමක් නම් නැතිකල නාමරූප දෙක නොවේද? කුමකගේ නැතිවීමෙන් නාමරූප දෙක නැතිවේදැයි' කියායි

"මහණෙනි, එකල විපස්සී බොධිසත්වයන්ට නුවණින් සිහි කිරීම හේතුකොටගෙන 'ප්‍රතිසන්ධි විඥානය නැති කල නාමරූප නොවෙයි. ප්‍රතිසන්ධි විඥානය නැති කිරීමෙන් නාම රූප දෙක නැතිවේයයි ප්‍රඥාවෙන් දැකීම ඇති විය.

"මහණෙනි, එවිට විපස්සී බොධිසත්වයන්ට මේ අදහස ඇතිවූයේය. 'කුමක් නම් නැති කල විඥානය නොවේද? කුමකගේ නැතිවීමෙන් විඥානය නැතිවේදැයි' කියායි

"මහණෙනි, එකල විපස්සී බොධිසත්වයන්ට නුවණින් සිහිකිරීම හේතුකොටගෙන නාමරූප දෙක නැතිකල විඥානය නොවෙයි. නාමරූප දෙදෙනාගේ නැතිකිරීමෙන් ප්‍රතිසන්ධි විඥානය විනාශවෙයි. යනු ප්‍රඥාවෙන් දැකීම විය.

21. "මහණෙනි, එවිට විපස්සී බොධිසත්වයන්ට මේ අදහස ඇතිවූයේය. "මා විසින් බුදුවීම පිණිස මේ මාර්ගය අවබොධ කරණ ලද්දේය. එනම් නාමරූප දෙක නැතිවීමෙන් විඥානය නැතිවෙයි විඥානය නැතිවීමෙන් නාමරූප දෙක නැතිවෙයි. නාමරූප දෙක නැතිවීමෙන් (ඇස්, කන්, නාසා, දිව්, ඇඟ, හිත) දොරටු සය නැතිවෙයි. (ඇස්, කන්, නාසා, දිව්, ඇඟ, හිත) දොරටු සය නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් තුන් ආකාර වේදනා නැතිවේ. වේදනා නැතිවීමෙන් තන්හාව නැතිවේ. තන්හාව නැතිවීමෙන් දැඩිකොට ගන්නා ආශාව විනාශවෙයි. දැඩිව ගන්නා ආශාව විනාශවීමෙන් (උත්පත්තිය දෙන) කර්මභවය විනාශවෙයි. භවය විනාශවීමෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ජාතිය විනාශවෙයි. ජාතිය (උත්පත්තිය) විනාශවීමෙන් ජරාව සහ මරණ දෙක නැතිවෙයි. එයින් ශෝක කිරීම, වැළපීම, කයේ දුක, සිතේ දුක, තද වෙහෙස යන මොහු උපදින්නේ නැතිවීමෙන් නිදහස් වෙත්. මෙසේ මේ සියලු දුක් රාශියේ උපදින්නේ නැති නිදහස්වීම වෙයි.

"මහණෙනි, නිදහස්වීම, නිදහස්වීමයයි විපස්සී බොධි සත්වයන්ට පෙර නොඇසූ ධර්මය පිළිබඳ ඇස පහළ විය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළවිය, විද්‍යාව පහළවිය, ආලොකය පහළවිය.

**22.** "මහණෙනි, එවිට විපස්සී බොධිසත්වයෝ පසුව පංචස්කන්ධයෙහි ඇතිවීම හා නැතිවීම, නැවත නැවත නුවනින් සලකමින් වාසය කළේය. කෙසේදයත්, මේ රූපයයි. මේ රූපය ඇතිවීමට හෙතුවයි. මේ රූපයන්ගේ නැතිවීමයි, මේ වේදනාවයි, මේ වේදනාව ඇතිවීමට හෙතුවය, මේ වේදනාවේ නැතිවීමයි. මේ සංඥාවයි, මේ සංඥාව ඇතිවීමට හෙතුවයි. මේ සංඥාවේ නැතිවීමයි. මේ සංස්කාරයෝයි. මේ සංස්කාරයන් ඇතිවීමට හෙතුවයි. මේ සංස්කාරයන් නැතිවීමය. මේ විඥානයයි මේ විඥානය ඇතිවීමට හෙතුවයි. මේ විඥානයේ නැතිවීමයි. මෙසේ පඤ්ච උපාදාන ස්කන්ධයන්ගේ ඇතිවීම හා නැතිවීම නැවත නැවත බලමින් වාසය කරන්නාවූ බොධිසත්වයන්ගේ සිත කාමාදී කෙලෙසුන් කෙරෙන් මිදුනේය.

දෙවෙනි බණවර නිමියේය.

**1.** "මහණෙනි, එවිට අර්හත්වූ සම්මා සම්බුදුවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට මේ අදහස ඇතිවිය එනම්, මම ධර්මය දෙශනා කරන්නෙම් නම් යහපත්ය යනුයි.

"මහණෙනි, එවිට අර්හත්වූ සම්මා සම්බුදුවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට මේ අදහස ඇතිවිය. මා විසින් අවබොධ කරගත් මේ ධර්මය ගැඹුරුවෙයි, දුකසේ දැක්ක යුතුවෙයි, දුකසේ අවබොධ කටයුතුවෙයි. සාන්තවෙයි, ප්‍රණීත වෙයි, තර්කඥානයෙන් බැසගත නොහැකිවෙයි. සියුම්වෙයි,

පණ්ඩිතයන් විසින්ම දතයුතුවෙයි. මේ ජනයා පංචකාම සැපයෙහි කැමතිව වසන්නේය. පංචකාම සැපයෙහි ඇලුනේ වෙයි. පංචකාම සැපයෙන් සතුටු වන්නේය මේ පංචකාමයෙහි කැමති වන්නාවූ, එහි ඇලුනාවූ, එහි ප්‍රීතිමත් වන්නාවූ සත්වයන් විසින් මේ හේතුවෙන් මේ ඵලය වන්නේයයි දක්වන පටිච්ච සමුප්පාද ධර්මය දුකසේ දැක්ක යුතුවෙයි.

"හේතුන් නිසා ඇතිවන ස්වභාවය ඇත්තාවූ සියලු සංස්කාරයන්ගේ සංසිඳීමට හේතුවූ, සියලු කෙලෙස් නැති කිරීමට තණ්හාව නැතිකිරීමට හේතුවූ, නොඇලීමට හේතුවූ, සියලු දුක් නැති කිරීමට හේතුවූ, නිර්වාණය යන යමක් ඇද්ද මේ කාරණයද දුකසේ දැක්ක යුතුවෙයි.

"මම ධර්මය දෙශනා කරන්නෙම් නමුත් අනුන් මගේ ධර්මය අවබොධ නොකරන්නාහු නම් ඒ කටයුත්ත මට වෙහෙසීමක් වන්නේය. ඒ ධර්ම දෙශනාව මට වෙහෙස වන්නීය.

2. "මහණෙනි, තවද අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට පෙර නොඇසූ මේ අද්භූත ගාථා ඥානයට ගොචර (අසු) වූහ.

"මා විසින් දුකසේඅවබොධ කර ගන්නාලද මේ ධර්මය දැන් දෙශනා කිරීමෙන් ප්‍රයෝජන නැත. රාග ද්වෙෂාදීන්ගෙන් පීඩිතවූවන් විසින් මේ ධර්මය හොඳින් අවබොධ කළ නොහැකි වන්නේය. ලොක වාසීන් යන අතට නොගොස් උඩ අතට, යන්නාවූ සියුම්වූ, ගැඹුරුවූ, එහෙයින්ම දුකසේ දැක්ක යුතුවූ, දුකසේ අවබොධ කටයුතුවූ මේ ධර්මය කාම රාගාදීන් ඇලුණාවූ මෝහයෙන් යට කරන ලද්දාවූ සත්වයෝ නොදක්නාහුය' යනුයි.

"මහණෙනි, මෙසේ මේ ධර්මයේ ගැඹුරු භාවය ගැන සලකන්නාවූ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ උත්සාහය අඩු බවට නැමුනේය. ධර්ම දෙශනාව පිණිස හිත නොනැමුනේය මහණෙනි, එවිට අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ සිත පිළිබඳවූ අදහස් දැනගත් එක්තරා මහා බ්‍රහ්මයෙකුට මේ අදහස ඇති විය. යම්

ලොකයක අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ සිත ධර්ම දෙශනාවට උනන්දු නොවේද, ඒ ධර්ම දෙශනාව පිණිස සිත නොනැමේද, ඒකාන්තයෙන් ඒ ලොකය විනාශ වන්නේය. පින්වත්නි, ඒකාන්තයෙන් ඒ ලොකය වැනසෙන්නේය' කියායි.

3 "මහණෙනි, එවිට ඒ මහා බ්‍රහ්මතෙම, බලවත් පුරුෂයෙක් නැමූ අත දික් කරන්නේ හෝ දික් කළ අත නමන්නේ හෝ යම්සේද එසේම බඹලොවදී නොපෙනී ගියේ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි පහළ වූයේය. මහණෙනි, එකල ඒ මහා බ්‍රහ්මතෙම උතුරු සළුව එක අංසයකින් පොරවා දකුණු දණහිස බිම තබා අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි නම් ඒ දෙසට ඇඟිලි එක්කොට තබා වැඳ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළේය.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ධර්ම දේශනා කරණ සේක්වා, සුගතයන් වහන්සේ ධර්මදෙශනා කරනසේක්වා ප්‍රඥා ඇසෙහි ස්වල්පවූ රාගාදී කිලුටු ඇත්තාවූ සත්වයෝ ඇත්තාහ. ධර්මය නොඇසීම හේතුකොටගෙන සත්වයෝ පිරිහෙත්. ධර්මය අවබොධකර ගන්නෝ ඇතිවන්නාහයි' කියායි.

4 'මහණෙනි, මෙසේ ආරාධනා කළ කල අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ ඒ මහා බ්‍රහ්මයාට මේ කාරණය වදාළෝය. බ්‍රහ්මය, මම ධර්මදෙශනා කරන්නෙම් නම් යහපත්යයි මට මේ අදහස ඇතිවිය. බ්‍රහ්මය, මා විසින් අවබොධ කරනු ලැබූ මේ ධර්මය ගැඹුරුවෙයි, එහෙයින්ම දුකසේ අවබොධ කටයුතුවෙයි. ශාන්තයි, ශ්‍රෙෂ්ඨ වෙයි, තර්ක ඥානයෙන් බැසගත නොහැකිවෙයි, සියුම්වෙයි, පණ්ඩිතයින් විසින්ම දතයුතුවෙයි

"මේ ජනයා පංචකාම සැපයෙහි කැමතිව වාසය කරන්නේය. පංචකාම සැපයෙහි ඇලුණේය, පංචකාම සැපයෙහි සතුටු වන්නේය. මේ පංචකාමයට කැමතිව එහි ඇලුනාවූ එහි

සතුටු වන්නාවූ සත්වයන් විසින් පටිච්ච සමුප්පාද ධර්මය යන මේ කාරණය දුකසේ දැක්ක යුතුවෙයි. සියලු සංස්කාරයන්ගේ සංසිඳීමට හේතුවූ, තන්හාව නැති කිරීමට හේතුවූ රාගාදී කිලුටු නැත්තාවූ නිර්වාණය යන යමක් ඇද්ද මේ කාරණයද දුකසේ දැක්ක යුතුවෙයි. මම ධර්මය දෙශනා කරන්නෙම් නමුත් අනුන් මගේ ධර්මය අවබොධ නොකරන්නාහු නම් ඒ කටයුත්ත මට වෙහෙසීමක් වන්නේය ඒ ධර්මදෙශනාව මට වෙහෙස වන්නීය.

"මහණෙනි, තවද අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට පෙර නොඇසූ මේ අද්භූත ගාථා ඥානයට (ගොචර) පහළ විය.

මා විසින් දුකින් අවබොධ කරගන්නාලද ධර්මය දැන් දෙශනා කිරීමෙන් ප්‍රයෝජන නැත. රාග ‍ද්වෙෂාදීන්ගෙන් පීඩිතවූවන් විසින් මේ ධර්මය හොඳින් අවබොධ කළ හැකි නොවන්නේය. උඩු අතට යන්නාවූ සියුම්වූ ගැඹුරුවූ එහෙයින් දුකසේ දැක්ක යුතුවූ දුකසේ අවබොධ කටයුතුවූ ඉතා උතුම්වූ ධර්මය කාමරාගාදීන් ඇළුණාවූ මෝහයෙන් යට කරණලද්දාවූ සත්වයෝ නොදක්නාහුයයි කියායි

'බ්‍රහ්මය, මෙසේ ධර්මයේ ගැඹුරු භාවය ගැන සලකන්නාවූ මාගේ සිත උනන්දු නැති බවට නැමුනේය. ධර්ම දෙශනාව පිණිස සිත නොනැමුනේය.

**5** "මහණෙනි, දෙවනුවද ඒ මහා බ්‍රහ්මතෙම අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සීභාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැළකළේය 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ධර්මදෙශනා කරන සේක්වා. සුගතයන් වහන්සේ ධර්මදෙශනා කරන සේක්වා. ප්‍රඥා ඇසෙහි ස්වල්පවූ රාගාදී කිලුටු ඇත්තාවූ සත්වයෝ ඇත්තාහ. ධර්මය නොඇසීම හේතුකොටගෙන සත්වයෝ පිරිහෙත්. ධර්මය අවබොධ කරගන්නෝ ඇති වන්නාහයි' කියායි.

**6** "මහණෙනි, තුන්වෙනි වරද ඒ මහාබ්‍රහ්මතෙම අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැළකළේය. 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ධර්මදෙශනා

කරනසේක්වා සුගතයන් වහන්සේ ධර්මදෙශනා කරනසේක්වා. ප්‍රඥා ඇසෙහි ස්වල්පවූ රාගාදී කිලුටු ඇත්තාවූ සත්වයෝ ඇත්තාහ. ධර්මය නොඇසීම හේතුකොට ගෙන සත්වයෝ පිරිහෙත්. ධර්මය අවබෝධ කරගන්නෝ ඇති වන්නාහ'යි කියායි.

"මහණෙනි, එවිට අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ ඒ මහාබ්‍රහ්මයාගේද ආරාධනාව දැන සත්වයන් කෙරෙහි කරුණාභාවයද නිසා බුද්ධඥානයෙන් ලොව බැලුවෝය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ බුද්ධඥානයෙන් ලොව බැලූකල ස්වල්පවූ කෙලෙස් ඇත්තාවූද මහත් ක්ලේශයන් ඇත්තාවූ තියුණුවූ ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ධර්මයන් ඇත්තාවූද මඳවූ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් ඇත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, අයහපත් ගති ඇත්තාවූද යහපත් ආකාර ඇත්තාවූද අයහපත් ආකාර ඇත්තාවූද සුවසේ අවබොධ කළ හැක්කාවූද, දුකසේ අවබොධ කටයුතුවූද සත්වයන්ද, පරලොව සහ වරදෙහි බිය දක්නාවූ සමහර සත්වයන්ද දුටුවෝය.

"මානෙල් විලක හෝ නෙළුම්විලක හෝ සුදු නෙළුම්විලක හෝ වතුරෙහි හටගත්තාවූ වතුරෙහි වැඩුනාවූ වතුරෙන් උඩ නොනැංගාවූ වතුරට යටව වැඩෙන්නාවූ සමහර මානෙල් හෝ සමහර නෙළුම් හෝ සමහර සුදු නෙළුම් හෝ යම්සේද, වතුරෙහි හටගත්තාවූ වතුරෙහි වැඩුනාවූ වතුරමට්ටමට සමව සිටියාවූ සමහර මානෙල් හෝ නෙළුම් හෝ සමහර සුදුනෙළුම් හෝ යම්සේද, වතුරෙහි හටගත්තාවූ වතුරෙහි වැඩුනාවූ සමහර මානෙල් හෝ සමහර නෙළුම් හෝ සමහර සුදුනෙළුම් හෝ වතුරෙන් උඩනැගී යම්සේ සිටිද්ද, මහණෙනි, එසේම අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ බුද්ධ ඥානයෙන් ලොව බලා වදාරණසේක් ප්‍රඥා ඇසෙහි ස්වල්පවූ රාගාදී කිලුටු ඇත්තාවූද, මහත්වූ රාගාදී කිලුටු ඇත්තාවූද, තියුණු ඉඳුරන් ඇත්තාවූද, මෘදු ඉඳුරන් ඇත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, නපුරුගති ඇත්තාවූද, යහපත් ආකාර ඇත්තාවූද, අයහපත් ආකාර ඇත්තාවූද, සත්වයන්ද පරලොව සහ වරදෙහි බය දකින ස්වභාව ඇතිව වාසය කරන්නාවූ සමහර සත්වයන්ද දුටුවෝය.

7 "මහණෙනි, එවිට ඒ මහා බ්‍රහ්මතෙම අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ සිත පිළිබඳව අදහස් දැනගෙන, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට ගාථාවලින් මෙසේ සැලකළේය.

"යම්සේ ඝන ගල් පර්වතයක් මුදුනේ සිටියාවූ පුරුෂයෙක් ඒ පර්වතය වටේ සිටියාවූ ජනසමූහයා සුවසේ දකීද, යහපත් ප්‍රඥා ඇත්තාවූ හැමතැනම පෙනෙන ඇසක් වැනි වූ සර්වඥතාඥානය ඇත්තාවූ භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේද ඒ ගල්පර්වතය වැනි ප්‍රඥා ප්‍රාසාදයට නැඟී ඔබවහන්සේ සෝක දුරුකළ බැවින් සෝකයෙහි වැටුනාවූ ජාති, ජරා ආදියෙන් මිරිකී සිටින්නාවූ ජනසමූහයා ප්‍රඥාවෙන් නැවත නැවත පරීක්ෂා කරනු මැනව. දිනනලද ක්ලේශ කාමාදී යුද්ධ ඇති ජාති කාන්තාරාදියෙන් සත්වයන්නිර්වාන නමැති ශාන්ත මාර්ගයට පමුණුවන්නාවූ, කාම තෘෂ්ණාව නමැති ණය නැත්තාවූ මහා වීරයන්වහන්ස, නැගිටිනු මැනව, ලෝකයෙහි හැසිරෙනු මැනව. භාග්‍යවතුන් වහන්ස, ධර්ම දෙශනා කරනු මැනව. ධර්මය අවබොධ කරගන්නෝ ඇතිවන්නාහු යයි" සැලකළේය.

එවිට අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ ඒ මහා බ්‍රහ්මයාට ගාථාවකින් උත්තර දුන්නෝය

"බ්‍රහ්මය, යම් කෙනෙක් ධර්මය අසන්නෝ නම් ඔවුන්ට අමෘතයට පැමිණෙන දොරටුව මා විසින් ඇර තබන ලද්දේය. සියලු සත්වයෝ ශ්‍රද්ධාව පහළ කෙරෙත්වා බ්‍රහ්මය, ධර්ම දෙශනාවට මට (කාය වාක්) වෙහෙස පැමිණේය යන අදහසින් ප්‍රගුණවූ ශ්‍රෙෂ්ඨවූ ධර්මය මනුෂ්‍යයන්ට නොකීයෙමියි" කීවෝය.

"මහණෙනි, එවිට ඒ මහාබ්‍රහ්මතෙම 'අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මදෙශනාව පිණිස මම ඉල්ලනලද අවසර ඇත්තෙමියි' අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ හොඳින් වැඳ (පැදකුණුකොට) ගෞරවයෙන් දකුණු පැත්තෙන් ගොස් ඒ අජපල් නුගගහ සමීපයේදීම නොපෙනී ගියේය.

8 'මහණෙනි, එකල අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන්වහන්සේට මේ අදහස ඇතිවිය. 'මම කවරෙකුට නම් මුලින් ධර්මදෙශනා කරන්නෙම්ද? කවරෙක් නම් ධර්මය වහා දැනගනීද?" යනුයි.

"මහණෙනි, එවිට අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට මේ අදහස ඇතිවිය. 'පණ්ඩිතවූ සමත්වූ ප්‍රඥා ඇත්තාවූ බොහෝ කලක් මුළුල්ලෙහි ප්‍රඥා ඇසෙහි ස්වල්පවූ රාග ආදී කිලුටු ඇත්තාවූ රාජපුත්‍රවූ මේ ඛණ්ඩ තෙමද පුරොහිත බමුණාගේ පුත්‍රවූ තිස්ස තෙමද යන දෙදෙනා බන්ධුමතී නම් රාජ්‍යයෙහි වාසය කෙරෙත්. මම ඛණ්ඩ නම් රාජ පුත්‍රයාට හා තිස්ස නම් පුරොහිත පුත්‍රයාටත් පළමුකොට ධර්මදෙශනා කරන්නෙම් නම් ඉතා යහපති ඔව්හු මේ ධර්මය වහාම අවබොධ කරගන්නාහුයයි' යනුයි.

9 "මහණෙනි, එවිට අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ බලවත් පුරුෂයෙක් නැමුවාවූ අතක් දික්කරන්නේ හෝ යම්සේද දික්කළ අතක් නමන්නේ හෝ යම්සේද එමෙන්ම බෝගහ සමීපයෙහිවූ අජපල් නුගගහ මුලදී නොපෙනී ගොස් බන්ධුමතී රාජ්‍යයෙහිවූ මුවන්ට ජීවිත දානය පිණිස දෙන ලද ඛෙම නම් උයනෙහි පහළවූහ. මහණෙනි, එවිට අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ උයන බලාගන්නාට කථාකර මෙසේ කීවෝය. 'යහලු උයන්පාලය, මෙහි එව, නුඹ බන්ධුමතී රාජධානියට ගොස් ඛණ්ඩ රාජපුත්‍රයාට හා තිස්ස නම් පුරොහිත පුත්‍රයාටත් මෙසේ කියව.

'ස්වාමීනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ බන්ධුමතී රාජධානියට වැඩියෝය. මුවන්ට ජීවිත දානය පිණිස දුන් ඛෙම නම් උයනෙහි වාසය කරන්නෝය. ඒ භාග්‍යවතුන් වහන්සේ ඔබතුමන්ලා දැකීමට කැමැත්තෝය' යනුයි.

'ස්වාමීන් වහන්ස, යහපතැයි' උයන්පාලයා අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන්වහන්සේට උත්තරදී බන්ධුමතී

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

රාජධානියට ගොස් ඛණ්ඩ රාජපුත්‍රයාට හා තිස්ස නම් පුරෝහිත පුත්‍රයාටත් මේ කාරණය දැන්වීය. 'ස්වාමීන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ බන්ධුමතී රාජධානියට පැමිණ මුවන්ට ජීවිත දානය පිණිස දුන් ඛෙම නම් උයනෙහි වාසයකරන්නෝය. ඒ භාග්‍යවතුන් වහන්සේ ඔබතුමන්ලා දැකීමට කැමැත්තෝය' යනුයි.

**10.** "මහණෙනි, එවිට ඛණ්ඩ නම් රාජපුත්‍රයාද තිස්ස නම් පුරොහිත පුත්‍රයාද යහපත් යහපත් යානාවන් යොදවා යහපත් යානාවකට නැගී යහපත් යහපත් යානාවලින් බන්ධුමතී රාජධානියෙන් පිටත්ව ගියාහුය. මුවන්ට ජීවිත දානය පිණිස දෙනලද ඛෙම නම් උයන යම් තැනකද එතැනට ගියාහුය. යානාවෙන් යාහැකි භූමිය යම්පමණද එපමණ තැන යානාවෙන් ගොස් යානාවෙන් බැස අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන්වහන්සේ යම් තැනකද එතැනට පයින්ම පැමිණියාහුය. පැමිණ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ හොඳාකාර වැඳ එකපැත්තක උන්හ

**11.** "අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට පිළිවෙළ කථාව කීවෝය. එනම්; දාන කථාය, ශීල කථාය, ස්වර්ග කථාය, කාමයන්ගේ දොෂය, ලාමක බවය, කෙලෙසෙන බවය (නෛෂ්ක්‍රම්‍යයෙහි) පැවිදිවීමෙහි අනුසස්ද ප්‍රකාශ කළෝය. යම් කලෙක භාග්‍යවතුන් වහන්සේ ඔවුන් යහපත් සිත් ඇතියන් බවද, මෘදු සිත් ඇතියන් බවද, (නිවනට) බාධාකරණ කරුණුවලින් පහවූ සිත් ඇතියන් බවද, ප්‍රීතිමත් සිත් ඇතියන් බවද, ප්‍රසන්න සිත් ඇතියන් බවද දැනගත්සේක්ද එකල බුදු වරයන් වහන්සේලා තමන් ඔසවා දැක්වූ දුකය, දුකට හේතුවය, දුක් නැතිවීමය, ඊට මගය යන තමන්වහන්සේම අවබොධ කළ යම් ධර්ම දේශනාවක් ඇත්තීද එය ප්‍රකාශ කළේය.

"යම්සේ පහවූ කලුපාට ඇති පිරිසිදුවූ රෙද්දක් හොඳට සායම අල්වා ගන්නේද, එසේම චණ්ඩරාජ පුත්‍රයාට හා තිස්ස නම් පුරොහිත පුත්‍රයාටත් ඒ අස්නෙහිදීම පහවූ කෙලෙස් නමැති දූවිලි ඇති, පහවූ රාගාදී කිලුටු ඇති ධර්ම ඇස පහළ වූයේය.

කෙසේදයත් යම් කිසිවක් (සමුදය) හටගන්නා ස්වභාවය ඇත්තේ වේද ඒ සියල්ල වැනසීම ස්වභාව කොට ඇත්තේය' කියායි,

12. "දක්නාලද ධර්ම ඇත්තාවූ, පැමිණි මාර්ග ධර්ම ඇත්තාවූ, දන්නාලද ධර්ම ඇත්තාවූ, සෑම ආකාරයෙන් ඥානයෙන් බැසගත් ධර්ම ඇත්තාවූ, සැක දුරුකළාවූ බය නැති බවට පැමිණියාවූ, අන්‍ය ගුරුවරයන් කෙරෙහි ඇදහීමක් නැත්තාවූ ඔව්හු අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දැන්වූහ. භවද්, ගෞතමයන් වහන්ස, යටිකුරු කරන ලද්දක් උඩුකුරු කර තබන්නේ හෝ යම්සේද, තණකොළ ආදියෙන් වසන ලද්දක් එලිදරව් කොට දක්වන්නේ හෝ යම්සේද, මංමුළා වූවෙකුට මග කියන්නේ හෝ යම්සේද, ඇස් ඇත්තෝ රූපයන් දකිත්වායි අඳුරෙහි තෙල් පහනක් දරන්නේ හෝ යම්සේද එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ප්‍රකාරයෙන් ධර්මය දෙශනා කරන ලද්දේය. ස්වාමීන් වහන්ස, මේ අපි භාග්‍යවතුන් වහන්සේද ධර්මයද පිහිට කොට යමු ස්වාමීන් වහන්ස, අපි භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මහණ වන්නෙමු. උපසම්පදාවද ලබන්නෙමුයි' සැලකළෝය.

13 "මහණෙනි, රාජ පුත්‍රවූ ඛණ්ඩ තෙමේද පුරොහිත පුත්‍රවූ තිස්ස තෙමේද යන දෙදෙන අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන්වහන්සේගේ සමීපයෙහි මහණකමලැබූහ. උපසම්පදාව ලැබූහ. අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන්වහන්සේ ඔවුන්ට ධර්ම කථාවෙන් කරුණු දැක්වූවෝය. එය අවබොධ කරවූහ. එහි තෙද ගැන්වූවෝය. එහි වැඩියක් සතුටු කළාහුය. සංස්කාරයන්ගේ දොෂයද, ලාමක බවද, කෙලෙසන බවද, නිර්වාණයෙහි අනුසස්ද ප්‍රකාශ කළෝය. අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ ධර්ම කථාවෙන් කරුණු දක්වනු ලබන්නාවූ, එහි අවබොධය කරනු ලබන්නාවූ එහි තෙද ගන්වනු ලබන්නාවූ එහි පහදවනු ලබන්නාවූ ඒ ඛණ්ඩරාජ පුත්‍ර තිස්ස පුරෝහිත පුත්‍ර දෙදෙනාගේ සිත් නොබෝ කලකින්ම කාමාදී ආශ්‍රවයන් කෙරෙන් මිදුනාහ.

14. "බන්ධුමතී රාජධානියෙහි අසූහාර දාහක් මහජන සමූහයා අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ බන්ධුමතී රාජධානියට පැමිණ මුවන්ට ජීවිත දානය පිණිස දෙනලද ඛෙම උයනෙහි වාසය කරන්නේයයිද ඛණ්ඩ රාජ පුත්‍රයාද තිස්ස පුරෝහිත පුත්‍රයාද අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි හිස කෙස් රැවුල් කපාදමා කහ වස්ත්‍රයන් ඇඳ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූවාහුයයි ඇසූයේය. අසා ඔවුන්ට මේ අදහස ඇතිවිය. යම් සසුනෙක ඛණ්ඩ නම් රාජ පුත්‍රයා හා තිස්ස නම් පුරොහිත බමුණු පුත්‍රයා හිසකෙස් රැවුල් කපා දමා කහ වස්ත්‍ර හැඳ ගිහිගෙන් නික්ම මහණ වූවාහු නම් ඒකාන්තයෙන් ඒ ශාසනය ලාමක නොවේමය. ඛණ්ඩ රාජ පුත්‍රතෙමේද තිස්ස පුරෝහිත පුත්‍ර තෙමේද හිසකෙස් රැවුල් කපාදමා කහ වස්ත්‍ර හැඳ ගිහිගෙයින් නික්ම සසුනෙහි මහණ වන්නාහු නම් අපි මහණ වෙමු යනු කියනුම කවරේ දැයි කියායි.' එකල අසූහාර දහසක් පමණ ඒ මහජන සමූහයා බන්ධුමතී රාජධානියෙන් නික්ම මුවන්ට ජීවිත දානය පිණිස දෙන ලද්දාවූ ඛෙම උයන නම් තැනකද අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතනට පැමිණියේය. පැමිණ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට වැඳ එක පැත්තකින් උන්හ.

15. "අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට පිළිවෙල කථාව වදාළසේක. ඒ කවරේද යත්, දාන කථාය, සීල කථාය, ස්වර්ග කථාය, කාමයන්ගේ දොෂය, ලාමක බවය, කිලුටුවන බවය, ගිහිගෙන් නික්මීමේ අනුසස් වදාළසේක. යම් කලක භාග්‍යවතුන් වහන්සේ ඔවුන් යහපත් සිත් ඇත්තන් බවද, මොලොක් සිත් ඇත්තන් බවද, නීවරණයන් කෙරෙන් තොරවූ සිත් ඇත්තන් බවද, ප්‍රීතිමත් සිත් ඇත්තන් බවද, පැහැදුනු සිත් ඇත්තන් බවද, දැන වදාළසේක්ද, එකල්හිදී බුදුවරයන්ගේ තමාම අවබොධකර ගත්තාවූ යම් ධර්ම දෙශනාවක් වේද, දුකය, දුක් ඉපදීමට හේතුවය. දුක් නැති කිරීමය, දුක් නැති කිරීමේ මාර්ගය යන ඒ ධර්ම දෙශනාව දෙශනා කළසේක, කළු පැහැය නැති පිරිසිදු වස්ත්‍රයක් යම්සේ ඉතා

හොඳින් සායම අල්ලා ගන්නේද, එපරිද්දෙන්ම ඒ අසූහාර දහසක් ප්‍රාණීන්ට ඒ ආසනයේදීම (හෙවත් ඒ දෙශනාව අසද්දීම) කෙලෙස් දූවිල්ලෙන් තොරවූ, කෙලෙස් කිලුටු නැති දහම් නමැති ඇස හෙවත් සෝවාන් මාර්ග ඥානය පහළ වූයේය. යම්කිසිවක් ඇතිවන ස්වභාව ඇත්තේද, ඒ සියල්ල නැතිවීම ස්වභාව කොට ඇත්තේය කියායි.

**16** "ධර්මය දැක්කාවූ, මාර්ග ධර්මයට පැමිණියාවූ ධර්මය දැනගන්නාවූ, ධර්මයට බැසගත්තාවූ, සැකය දුරු කළාවූ, භය නැති බවට පැමිණියාවූ ශාස්තෘ ශාසනයෙන් පිට පිහිට නොසොයන්නාවූ ඒ අසූහාර දහසක් දෙනා අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීහ. 'ස්වාමීන් වහන්ස, ධර්ම දෙශනාව ඉතා හොඳය. ස්වාමීන් වහන්ස, ධර්ම දෙශනාව ඉතාම හොඳය. ස්වාමීනි, යටිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ යම් සේද, වසා තබන ලද්දක් වැසුම් හැර දක්වන්නේ හෝ යම්සේද, මංමුළාවූවෙකුට මග කියන්නේ හෝ යම්සේද ඇස් ඇත්තෝ රූප දකිත්වායි අඳුරෙහි තෙල් පහනක් දරන්නේ හෝ යම්සේද, එමෙන්ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්ම දෙශනා කරන ලද්දේය. ස්වාමීන් වහන්ස මේ අපි භාග්‍යවතුන් වහන්සේද ධර්මයද පිහිටකොට යමු ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මහණකම ලබන්නෙමු. උපසම්පදාවද ලබන්නෙමුයි' සැලකළාහුය.

**17** 'මහණෙනි, ඒ අසූහාර දහසක් දෙනා අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මහණකම ලැබුවාහුය, උපසම්පදාව ලැබුවාහුය.

"අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන්වහන්සේ ඔවුන්ට ධර්ම කථාවකින් කරුණු දැක්වූහ. එහි සමාදන්කර වූහ. එහි තියුණු කරවූහ වැඩියක් සතුටු කරවූහ, සංස්කාරයන්ගේ දොෂයද, ලාමක බවද, කිලුටුවන බවද, නිර්වාණයෙහි ආනිසංසද වදාළ සේක. අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ විසින් ධාර්මික කථාවෙන් කරුණු දක්වනු ලබන්නාවූ,

එහි සමාදන් කරවනු ලබන්නාවූ එහි තියුණු කරවනු ලබන්නාවූ වැඩියක් සතුටු කරවනු ලබන්නාවූ ඒ අසූහාරදහසක් භික්ෂූන්ගේ සිත් (සසර) දැඩිකොට අල්ලාගැන්මෙන් තොරව (ආශ්‍රව) කෙලෙසුන් කෙරෙන් මිදුනාහුය.

18 'මහණෙනි පළමුකොට විපස්සී බොධිසත්වයන් වහන්සේ සමීපයෙහි මහණවූ ඒ අසූහාර දහසක් දෙනාද අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සි භාග්‍යවතුන්වහන්සේ බන්ධුමතී රාජධානියට පැමිණ මුවන්ට ජීවිත දානය පිණිස දෙන ලද ඛෙම නම් උයනෙහි වාසය කරති ධර්මයද දෙශනා කරතියි ඇසූහ. මහණෙනි, එවිට අසූහාර දහසක් (ප්‍රව්‍රජිතයෝ) මහණහුද බන්ධුමතී රාජධානිය යම් තැනෙකද මිගදාය නම් ලද ඛෙම උයන යම් තැනක්හිද අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතනට පැමිණියෝය. පැමිණ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට වැඳ එක පැත්තකින් උන්හ.

19 "අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සි භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට පිළිවෙළ කථාව වදාළසේක. ඒ කවරේදයත්? දාන කථාය, සීල කථාය, ස්වර්ග කථාය, කාමයන්ගේ දොෂය, ලාමක බවය, කිලුටුවන බවය, ගිහිගෙන් නික්මීමේ අනුසස්ද වදාළ සේක. යම් කලක භාග්‍යවතුන් වහන්සේ ඔවුන්යහපත් සිත් ඇත්තන් බවද, මොලොක් සිත් ඇත්තන් බවද, නීවරණයන් කෙරෙන් තොරවූ සිත් ඇත්තන් බවද, ප්‍රීතිමත් සිත් ඇත්තන් බවද, පැහැදුනු සිත් ඇත්තන් බවද දැන වදාළ සේක්ද, එකල්හිදී බුදුවරයන්ගේ තමාම අවබොධ කරගත්තාවූ යම් ධර්ම දෙශනාවක් වේද, දුකය, දුක් ඉපදීමට හේතුවය දුක් නැතිකිරීමය දුක් නැති කිරීමේ මාර්ගයය යන ඒ ධර්ම දෙශනාව කළ සේක. කළු පැහැය නැති පිරිසිදු වස්ත්‍රයක් යම්සේ ඉතා හොඳින් සායම අල්ලාගන්නේද, එපරිද්දෙන්ම ඒ අසූහාරදහසක් භික්ෂූන්ට ඒ ආසනයේදීම (ඒ දෙශනාව අසද්දීම) කෙලෙස් දූවිල්ලෙන් තොරවූ කෙලෙස් කිලුටු නැති දහම් නමැති ඇස හෙවත් සොවාන් මාර්ගඥානය පහළවූ

යේය යම් කිසිවක් ඇතිවන ස්වභාව ඇත්තේද ඒ සියල්ල නැතිවීම ස්වභාවකොට ඇත්තේය කියායි.

**20** "ධර්මය දැක්කාවූ, මාර්ග ධර්මයට පැමිණියාවූ ධර්මය දැනගත්තාවූ, ධර්මයට බැසගත්තාවූ, සැක දුරුකළාවූ භය නැති බවට පැමිණියාවූ, ශාස්තෘ ශාසනයෙන් පිට පිහිට නොසොයන්නාවූ ඒ අසූහාරදහසක් දෙනා, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීහ.' ස්වාමීන් වහන්ස, ධර්මදෙශනාව ඉතා හොඳය, ධර්ම දෙශනාව ඉතාම හොඳය, ස්වාමීනි, යටිකුරුකොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ යම්සේද, වසාතබන ලද්දක් වැසුම් හැර දක්වන්නේ හෝ යම්සේද, මංමුළාවූවෙකුට මග කියන්නේ හෝ යම්සේද, ඇස් ඇත්තේ රූප දකිත්වායි අඳුරෙහි තෙල් පහනක් දරන්නේ හෝ යම්සේද, එමෙන්ම භාග්‍යවතුන් වහන්සේ නොයෙක් ආකාරයෙන් ධර්මය දෙශනා කරන ලද්දේය. ස්වාමීනි, මේ අපි භාග්‍යවතුන් වහන්සේද ධර්මයද පිහිටකොට යමු ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මහණකම ලබන්නෙමු. උපසම්පදාවද ලබන්නෙමුයි' සැලකළාහුය.

**21** "මහණෙනි, ඒ අසූහාර දහසක් දෙනා අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි නැවත මහණකම ලැබුවාහුය, උපසම්පදාව ලැබුවාහුය අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන්ට ධර්ම කථාවකින් කරුණු දැක්වූහ, සමාදන් කරවූහ. එහි තියුණු කරවූහ. වැඩියක් සතුටු කරවූහ, සංස්කාරයන්ගේ දොෂයද, ලාමක බවද, කිලුටුවන බවද, නිර්වාණයෙහි ආනිසංසද වදාළ සේක. අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ විසින් ධාර්මික කථාවෙන් කරුණු දක්වනු ලබන්නාවූ එහි සමාදන් කරවනු ලබන්නාවූ, එහි තියුණු කරණු ලබන්නාවූ, වැඩියක් සතුටු කරනු ලබන්නාවූ, ඒ අසූසාර දහසක් භික්ෂූන්ගේ සිත් සසර ඇඩි කොට අල්වාගැන්මෙන් තොරව (ආශව) කෙලෙසුන් කෙරෙන් මිදුනාහුය.

22 'මහණෙනි, එකල බන්ධුමතී රාජධානියෙහි අටසැට ලක්ෂයක් මහා භික්ෂුසංඝයා වාසය කරයි. මහණෙනි, එවිට රහසිගතව තනිව වාසය කරන්නාවූ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට මෙවැනි අදහසක් පහළවූයේය, 'දැන් බන්ධුමතී රාජධානියෙහි හැටඅට ලක්ෂයක් මහත්වූ භික්ෂු සමූහයක් වාසය කෙරෙයි. මේ භික්ෂූන්ට මෙසේ නියම කරන්නේ නම් ඉතා යහපති. 'මහණෙනි, බොහෝදෙනාට හිතපිණිස, බොහෝදෙනාට සැප පිණිස, ලොවට අනුකම්පා පිණිස දෙවි මිනිසුන්ට හිත පිණිසද, වැඩ පිණිසද, ගමින් ගමට ඇවිදීම කරව්. දෙදෙනෙක් එකමගින් නොයව්. මහණෙනි, මුල යහපත්වූද, මැද යහපත්වූද, අග යහපත්වූද, අර්ථ සහිතවූ ව්‍යඤ්ජන (යහපත් වචන) සහිතවූ ධර්මය දෙශනා කරව්. හැම ආකාරයෙන්ම සම්පූර්ණවූ පිරිසිදු මාර්ග බ්‍රහ්ම චරියාව උතුම් හැසිරීම ප්‍රකාශ කරව්. ප්‍රඥා ඇසෙහි ස්වල්පවූ රාගාදි කිලුටු (දූවිලි) ඇත්තාවූ සත්වයෝ ඇත්තාහ. ධර්මය නොඇසීම හේතුකොටගෙන ඒ සත්වයෝ පිරිහෙත්. එහෙයින් ධර්මය අවබොධ කරගන්නෝ ඇතිවන්නාහුය තවද අවුරුදු හයකට වරක් බැගින් බන්ධුමතී රාජධානියට (පාමොක් උදෙසීම) භික්ෂු ශීලය කීම පිණිස භික්ෂූහු පැමිණිය යුත්තාහුය' කියායි.

23 "මහණෙනි, එවිටඑක්තරා මහාබ්‍රහ්මයෙක් අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ සිත පිළිබඳ විතර්කය තමාගේසිතින් දැනගෙන බලවත් පුරුෂයෙක් හකුළුවනලද අතක් දිගහරින්නේ යම්සේද, දික්කළ අතක් හකුළුවන්නේ හෝ යම්සේද එපරිද්දෙන්ම බ්‍රහ්මලොකයෙන් අතුරුදහන්වී අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි පහළ වූයේය.

"මහණෙනි, එකල්හි ඒ බ්‍රහ්මතෙම උතුරුසළුව එක් උරයකට කර අර්හත් සම්‍යක් සම්බුද්ධව විපස්සී භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද ඒ දෙසට අත් එකට බැඳ තබා වැඳ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කියා සිටියේය.

"භාග්‍යවතුන් වහන්ස, නුඹවහන්සේ විසින් සිතනලද මේ කාරණය එසේමැයි. සුගතයන්වහන්ස, මේ කාරණය එසේමය. ස්වාමීන් වහන්ස, දැන් බන්ධුමතී රාජධානියෙහි සැටඅට ලක්ෂයක්වූ මහා භික්ෂු සංඝයා වාසය කරන්නේය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට මෙසේ නියම කරත්වා, 'මහණෙනි, බොහෝදෙනාට හිත පිණිසද, බොහෝදෙනාට සැප පිණිසද, ලොවට අනුකම්පා පිණිසද, දෙවි මිනිසුන්ට හිත පිණිසද, වැඩ පිණිසද, සැප පිණිසද, ගමින් ගමට ඇවිදිව්. එක් මගකින් දෙදෙනෙක් නොයව්, මහණෙනි, මුල යහපත් වූද, අග යහපත්වූද, අර්ථ සහිතවූ යහපත් වචන සහිතවූ ධර්මය දෙශනාකරව්. සැමආකාරයෙන්ම සම්පූර්ණවූ පිරිසිදුවූ (මාර්ග බ්‍රහ්මචරියාව) උතුම් හැසිරීම ප්‍රකාශ කරව්. ප්‍රඥා ඇසෙහි ස්වල්පවූ රාගාදි කිලුටු දූවිලි ඇත්තාවූ සත්වයෝ ඇත්තාහ. ධර්මය නොඇසීම හේතුකොටගෙන සත්වයෝ පිරිහෙත්, එහෙයින් ධර්මය අවබොධ කරගන්නෝ ඇතිවන්නාහ. තවද ස්වාමීන් වහන්ස, අවුරුදු හයකට වරක් බන්ධුමතී රාජධානියට භික්ෂුහු (පාමොක් උදෙසීම පිණිස) එක්ව සීලය කීම සඳහා පැමිණෙන්නාහුද අපි එසේ කරමු' යනුයි

මහණෙනි, ඒ මහා බ්‍රහ්ම තෙම මේ කාරණය කීයේය. මේ කාරණය කියා අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට වැඳ ගෞරවයෙන් දකුණු පැත්තෙන් ගොස් එහිම නොපෙනී ගියේය.

**24** "මහණෙනි, එවිට අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි විවේකව හිඳීමෙන් නැගී සිට භික්ෂූන්ට කථාකර මෙසේ කීවෝය.

"මහණෙනි, මෙහි රහසිගතව විවෙකව සිටියාවූ මට සිත පිළිබඳ මෙබඳු විතර්කයක් උපන්නේය.

මේ කාලයෙහි බන්ධුමතී රාජධානියෙහි හැට අට ලක්ෂයක්වූ මහා භික්ෂු සංඝයා වාසයකෙරෙයි. මේ භික්ෂූන්ට මෙසේ නියම කරන්නේ නම් ඉතා යහපති. ("මහණෙනි, බොහෝ

දෙනාට හිත පිණිස, සැප පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙවිමිනිසුන්ට හිත පිණිසද වැඩ පිණිසද සැපපිණිසද (චාරිකා කරව්) ඇවිදිව්, දෙදෙනෙක් එකමග නොයව්. මහණෙනි, මුල යහපත්වූද, මැද යහපත්වූද, අග යහපත්වූද අර්ථ සහිත වූද (ව්‍යංජන) යහපත් වචන සහිතවූ ධර්මය දෙශනා කරව්. හැම ආකාරයෙන්ම සම්පූර්ණවූ පිරිසිදු (මාර්ග බ්‍රහ්මචරියාව) උතුම් හැසිරීම ප්‍රකාශ කරව්. ප්‍රඥා ඇසෙහි ස්වල්පවූ රාගාදී කිලුටු (දූවිලි) ඇත්තාවූ සත්වයෝ ඇත්තාහ. ධර්මය නොඇසීම හේතුකොටගෙන ඒ සත්වයෝ පිරිහෙත්. ධර්මය අවබොධ කරගන්නෝ ඇතිවන්නාහුය. තවද අවුරුදු හයකට වරක් බන්ධුමතී රාජධානියට (පාමොක් උදෙසීම) සීලය සංක්ෂේපයෙන් කීම පිණිස පැමිණිය යුත්තාහුය යනුයි.

**25** මහණෙනි, එවිට එක්තරා මහා බ්‍රහ්මයෙක් මාගේ සිත පිළිබඳ විතර්කය තමාගේ සිතින් දැනගෙන බලවත් පුරුෂයෙක් හකුළුවන ලද අතක් දිගහරින්නේ හෝ යම්සේද දික් කළ අතක් හකුළුවන්නේ හෝ යම්සේද එපරිද්දෙන්ම බ්‍රහ්ම ලෝකයෙන් අතුරුදහන්වී මාගේ ඉදිරියෙහි පහළවූයේය. මහණෙනි, ඒ බ්‍රහ්මතෙම උතුරුසලුව එක අංශයකට කර මම යම් තැනෙක්හිද ඒ දෙසට අත් එකතු කර වැඳ මට මේ කාරණය සැලකළේය. 'භාග්‍යවතුන් වහන්ස, නුඹවහන්සේ විසින් සිතනලද ඒ කාරණය එසේමැයි. සුගතයන් වහන්සේ, ඒ කාරණය එසේමැයි. ස්වාමීන්වහන්ස, බන්ධුමතී රාජධානියෙහි සැටඅට ලක්ෂයක් මහත් භික්ෂුසංඝයා වාසය කරයි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට මෙසේ නියම කරත්වා.

"මහණෙනි, බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සැප පිණිස, ලොවට අනුකම්පා පිණිස දෙවිමිනිසුන්ට හිත පිණිසද, වැඩ පිණිසද, සැප පිණිසද (චාරිකා කරව්) ඇවිදිව්. දෙදෙනෙක් එක් මගක නොයව්. මුල යහපත්වූද, මැද යහපත්වූද, අග යහපත්වූද අර්ථ සහිතවූ පිරිසිදු වචන සහිතවූ, පිරිසිදු (මාර්ග බ්‍රහ්මචරියාව) උතුම් හැසිරීම ප්‍රකාශ කරව්. ප්‍රඥා ඇසෙහි ස්වල්පවූ රාගාදී කිලුටු (දූවිලි) ඇත්තාවූ සත්වයෝ ඇත්තාහ.

ධර්මය නොඇසීම හේතු කොටගෙන ඒ සත්වයෝ පිරිහෙත්. ධර්මය අවබොධ කරගන්නෝ ඇතිවන්නාහුය. තවද ස්වාමීන් වහන්ස, අවුරුදු හයකට වරක් බන්ධුමතී රාජධානියට පාමොක් උදෙසීම පිණිස, භික්ෂූහු පැමිණිය යුත්තාහුය කියායි. අපි එසේ කරමුයි යනුයි.

මහණෙනි, ඒ මහා බ්‍රහ්මතෙම මේ කාරණය කීයේය. මේ කාරණය කියා මට වැඳ ගෞරවයෙන් දකුණු පැත්තෙන් ගොස් එහිදීම නොපෙනී ගියේය.

**26** "මහණෙනි, මම මෙසේ ඔබලාට නියම කරමි. මහණෙනි, බොහෝ දෙනාට හිත පිණිසද බොහෝ දෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවිමිනිසුන්ගේ ප්‍රයෝජන පිණිසද, වැඩ පිණිසද, සැප පිණිසද ඇවිදිව්, (චාරිකා කරව්) දෙදෙනෙක් එක් මගින් නොයව්. මහණෙනි, මුල යහපත්වූද, මැද යහපත්වූද අවසානය යහපත්වූද අර්ථ සහිතවූ යහපත් වචන සහිතවූ ධර්මය දෙශනා කරව්. සියල්ලෙන් සම්පූර්ණවූ, පිරිසිදුවූ (බ්‍රහ්මචරියාව) උතුම් හැසිරීම ප්‍රකාශ කරව්. ප්‍රඥා ඇසෙහි ස්වල්පවූ රාගාදී කිලුටු (දූවිලි) ඇත්තාවූ සත්වයෝ ඇත්තාහ. ධර්මය නොඇසීම හෙතුකොට ගෙණ ඒ සත්වයෝ පිරිහෙත්. ධර්මය අවබොධ කරන්නෝ වන්නාහුය. තවද, හය අවුරුද්දකට වරක් පාමොක් උදෙසීම පිණිස බන්ධුමතී රාජධානියට පැමිණිය යුත්තාහ.) යනුවෙනි. මහණෙනි, එවිට ඒ භික්ෂූහු බොහෝ සෙයින් එක් දවසකින්ම (දනව් සැරිසැරීමට) පලාත් සංචාරයට ගියාහුය.

**27** මහණෙනි, එකල දඹදිව අසූහතර දහසක් (ආවාසයෝ) භික්ෂූන්ගේ වාසස්ථානය වෙත්.

එක් වසක් ඉක්මුණු කල දෙවතාවෝ ශබ්දනගා මෙසේ කීවාහුය. නිදුකාණෙනි, එක් අවුරුද්දක් ඉක්මුණේය. දැන් මින් ඉදිරියට අවුරුදු පහක් ගතවීමෙන් පාමොක් උදෙසීම පිණිස බන්ධුමතී නම් රාජධානියට පැමිණිය යුතුයි' කියායි.

අවුරුදු දෙකක් ඉවරවූ කල දෙවතාවෝ ශබ්දනගා මෙසේ කීවාහුය. නිදුකාණෙනි, අවුරුදු දෙකක් ඉක්මුණාහුය. දැන් මින්

ඉදිරියට අවුරුදු හතරක් ඉතුරුවූහ. අවුරුදු හතර ගතවූ කල පාමොක් උදෙසීම පිණිස බන්ධුමතී රාජධානියට පැමිණිය යුතුය.

අවුරුදු තුනක් ඉක්මුණු කල දෙවතාවෝ ශබ්ද නගා මෙසේ කීවාහුය. 'නිදුකානෙනි, අවුරුදු තුනක් ඉක්මුණාහුය. දැන් මින් ඉදිරියට අවුරුදු තුනක් ඉතිරිවූහ. අවුරුදු තුණ ගතවූ කල පාමොක් උදෙසීම පිණිස බන්ධුමතී රාජධානියට පැමිණිය යුතුය.' අවුරුදු හතරක් ඉක්මුණු කල දේවතාවෝ ශබ්දනගා මෙසේ කීවාහුය. නිදුකානෙනි, අවුරුදු හතරක් ඉක්මුණාහුය. දැන් මින් ඉදිරියට අවුරුදු දෙකක් ඉතුරුවූහ. අවුරුදු දෙක ගතවූ කල බන්ධුමතී රාජධානියට පාමොක් උදෙසීම පිණිස පැමිණිය යුතුය, කියායි. අවුරුදු පහක් ඉක්මුණු කල දේවතාවෝ ශබ්දනගා මෙසේ කීවාහුය.

'නිදුකාණෙනි, අවුරුදු පහක් ඉක්මුණාහුය. දැන් මින් ඉදිරියට අවුරුද්දක් ඉතුරුවූයේය. එක් අවුරුද්දක් ගතවීමෙන් බන්ධුමතී රාජධානියට පාමොක් උදෙසීම පිණිස පැමිණිය යුතුය' කියායි. අවුරුදු හයක් ඉක්මුණු කල දේවතාවෝ ශබ්දනගා මෙසේ කීවාහුය. නිදුකාණෙනි, අවුරුදු හයක් ඉක්මුණාහුය. දැන් බන්ධුමතී රාජධානියට පාමොක් උදෙසීම පිණිස පැමිණීමට සුදුසු කාලයයි, කියායි.

එවිට ඒ භික්ෂූහු ඇතැම්කෙනෙක් ස්වකීය ඍද්ධි ආනුභාවයෙන්ද ඇතැම් කෙනෙක් දෙවියන්ගේ දෙවානුභාවයෙන්ද බන්ධුමතී රාජධානියට එක දවසකින්ම පාමොක් උදෙසීම පිණිස පැමිණියාහුය.

28 "මහණෙනි, එකල අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ බන්ධුමතී රාජධානියෙහිවූ සංඝ සමාගමයෙහි මෙසේ පාමොක් උදෙසති.

'අනුන්ගේ තැළීම් පෙළීම් දොස් කීම් ආදිය ඉවසීමයයි කියනලද ක්ෂාන්තිය මේ ශාසනයෙහි උතුම් තපසෙක. සියලු බුදුවරයෝ නිර්වාණය උතුම් සැපයයි කියත්. අනුන්ට හිංසා කරන තැනැත්තා පැවිද්දෙක් නම් නොවේ. අනුන්ට වෙහෙස කරන තැනැත්තාද මහණෙක් නම් නොවේ.

සියලු අකුසල් නොකිරීමද, නූපන් කුසල් ඉපදවීම හා උපන් කුසල් වැඩීමද, සිත පිරිසිදු කිරීමද යන මෙය සියලු බුදුවරයින්ගේ අනුශාසනායි. හිත රිදෙන වචන නොකීමද හිංසාවෙන් වැළකීමද උතුම් සීලයෙන් සංවරවීමද ආහාරයෙහි පමණ දැනීමද වනාන්තරයෙහි ඇල්මද සමාධියෙහි යෙදී වාසය කිරීමද යන මෙය සියලු බුදුවරයින්ගේ අනුශාසනායි.

**29** "මහණෙනි, මම එක් කලක උක්කාඨා නුවර සුභග නම් වනයෙහි මහා සල්ගස සමීපයෙහි වාසය කරමි. මහණෙනි, රහසිගතවූ තනිව වාසය කරන්නාවූ ඒ මට සිතෙහි මෙවැනි විතර්කයක් පහළවිය. 'මා විසින් මේ දීර්ඝ කාලය තුළ සුද්ධාවාස බඹතලය හැර වාසය නොකළ යම් සත්වාවාසයක් ඇත්නම් එවැනි සත්වාවාසයක් සුලභ නොවේ. මම සුද්ධාවාස දෙවියෝ යම් තැනෙක්හිද එතනට පැමිණෙම් නම් ඉතා යහපති කියායි.

මහණෙනි, එවිට මම ශක්තිමත් පුරුෂයෙක් හකුළුවන ලද අතක් දික් කරන්නේ හෝ යම්සේද දික්කළ අතක් හකුළු වන්නේ හෝ යම්සේද, එමෙන්ම උක්කාඨා නුවර සුභග නම් වනයෙහි මහා සල්ගස සමීපයෙහිදී නොපෙනී ගොස් අවිහ දෙවියන් කෙරෙහි පහළවූයෙමි. ඒ දිව්‍ය සමූහයෙහි නොයෙක් දහස් ගණන් දේවතාවෝ මම යම් තැනකද එතනට පැමිණියාහුය. පැමිණ මට නමස්කාර කොට එක පැත්තක සිටියාහුය. එක පැත්තක සිටියාවූ ඒ දේවතාවෝ මට මේ කාරණය දැන්වූහ. 'නිදුකාණෙනි, යම් කලක අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන්වහන්සේ ලොව පහළවූ සේක්ද, එය මෙයින් අනූ එක්වෙනි කල්පයයි. නිදුකාණන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ ජාතියෙන් ක්ෂත්‍රියවූහ. ක්ෂත්‍රිය කුලයෙහි උපන්නාහ. නිදුකාණන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ ගොත්‍රයෙන් කොණ්ඩඤ්ඤ නම් වූහ. නිදුකාණන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන්වහන්සේට අවුරුදු අසූදහසක් ආයුෂ ප්‍රමාණය වූයේය. නිදුකාණන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ පලොල් ගස මුලදී

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

බුදු බවට පැමිණියෝය. නිදුකාණන් වහන්ස. අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට ඛණ්ඩය, තිස්සය යන නම් ඇත්තෝ අග්‍රශ්‍රාවක දෙදෙනාවූහ. නිදුකාණන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට ශ්‍රාවකයන්ගේ රැස්වීම් තුනක් වූහ. හැටඅට ලක්ෂයක් භික්ෂූන්වූ ශ්‍රාවකයන්ගේ එක් රැස්වීමක් වූයේය. භික්ෂූන් ලක්ෂයක් ඇත්තාවූ ශ්‍රාවකයන්ගේ එක් රැස්වීමක් වූයේය. අසූදහසක් භික්ෂූන් ඇති ශ්‍රාවකයන්ගේ එක් රැස්වීමක් වූයේය. නිදුකාණන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට සියල්ලම අර්හත් භික්ෂූන්ගෙන් යුත් මේ ශ්‍රාවකයන්ගේ රැස්වීම් තුණ වූයේය. නිදුකාණන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට උතුම් ලෙස උපස්ථාන කරන්නාවූ අසොක නම් භික්ෂුකෙනෙක් අග්‍රඋපස්ථායක වූයේය. නිදුකාණන් වහන්ස, සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට බන්ධුම නම් රජ පිය වූයේය. බන්ධුමතී නම් දේවිය වැදූ මව් විය. බන්ධුම නම් රජහට බන්ධුමතී නම් නුවර රාජධානිය විය. නිදුකාණන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ ගිහිගෙය අත්හැර යාම මෙසේ වූයේය. මෙසේ මහණවීම වූයේය. මෙසේ වීර්‍ය්‍ය වැඩීම විය. මෙසේ සම්‍යක් සම්බොධිය වූයේය. දම්සක් පැවැත්වීම මෙසේ විය. නිදුකාණන් වහන්ස, ඒ අපි විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ සස්නෙහි (බ්‍රහ්මචරියාව කොට) උතුම් හැසිරීමේ පැවත අනාගාමි මාර්ගයෙන් කාමයන්හි ආශාව සම්පූර්ණයෙන් දුරු කොට මේ බ්‍රහ්ම ලොකයෙහි උපන්නෙම්හයි දැන්නුවාහුය.'

30 "මහණෙනි, ඒ දිව්‍ය සමූහයෙහිම නොයෙක් දහස් ගණන් දෙවතාවෝද, නොයෙක් සිය ගණන් දේවතාවෝද මම යම් තැනෙකද එතනට පැමිණියාහුය. පැමිණ මට වැඳ එක පැත්තක සිටියාහුය. මහණෙනි, එක පැත්තක සිටියාවූ ඒ දේවතාවෝ මට මේ කාරණා දැන්නුවාහුය. 'නිදුකාණන් වහන්ස, දැන් අර්හත් සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන්වහන්සේ මේ භද්‍ර කල්පයෙහිම ලොව පහළ වූයේය. නිදුකාණන් වහන්ස, ඒ භාග්‍යවතුන් වහන්සේ ජාතියෙන් ක්ෂත්‍රිය වූහ. රජ කුලයෙහි උපන්හ.

නිදුකාණන් වහන්ස, ගෞතම භාග්‍යවතුන් වහන්සේ ගොත්‍රයෙන් ගෞතම වූවෝය. නිදුකාණන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ ආයුෂ ප්‍රමාණය ඉතා ස්වල්පයි, කොටයි. යමෙක් කලක් ජීවත් වේනම් හෙතෙම අවුරුදු සියයකට අඩුවෙන් හෝ ටිකක් වැඩියෙන් ජීවත් වේ. නිදුකාණන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ඇසතුගස මුලදී බුදු බව ලැබුවෝය. නිදුකාණන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේට සැරියුත් මුගලන් නම් අග්‍රශ්‍රාවක දෙදෙනෙක්වූහ. නිදුකාණන්වහන්ස, භාග්‍යවතුන්වහන්සේට එක්දහස්දෙසියපණහක් ඇති ශ්‍රාවක රැස්වීමක් වූයේය. නිදුකාණන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේට සියල්ලන්ම රහත් භික්ෂූන්ගෙන් යුත් මේ එකම භික්ෂු රැස්වීම වූයේය. නිදුකාණන්වහන්ස, භාග්‍යවතුන් වහන්සේට උතුම් ලෙස උපස්ථාන කරන්නාවූ ආනන්ද භික්ෂු තෙම ප්‍රධාන උපස්ථායක වූයේය. නිදුකාණන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේට සුද්ධොදන රජ පියවූයේය. මායාදේවි වැදූ මව් විය. කිඹුල්වත් නුවර රාජධානි විය. නිදුකාණන් වහන්ස, මෙසේ භාග්‍යවතුන් වහන්සේ ගිහිගේ අත්හැර ගියෝය. මෙසේ වීර්‍ය්‍යී වැඩුවෝය. මෙසේ බුදුවූහ, මෙසේ ධම්මචක්ක දෙශනාව වීය. නිදුකාණන් වහන්ස, ඒ අපි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි (බ්‍රහ්මචර්‍ය්‍යාව) උතුම් හැසිරීම කොට අනාගාමි මාර්ගයෙන් කාමයන්හි ආශාව සම්පූර්ණයෙන් දුරු කොට මේ බ්‍රහ්මලොකයෙහි උපන්නෙමුයයි' දැන්නුවාහුය.

31 "මහණෙනි, එවිට මම අවිහ දෙවියනුත් සමග අතප්ප දෙවියෝ යම් තැනෙක්හිද එතැනට පැමිණියෙමි. මහණෙනි, එකල මම අවිහ දෙවියනුත් අතප්ත දෙවියනුත් සමග සුදස්ස දෙවියෝ යම් තැනකද එතැනට පැමිණියෙමි. මහණෙනි, තවද අවිහ දෙවියනුත් අතප්ප දෙවියනුත් සුදස්ස දෙවියනුත් සමග සුදස්සී දෙවියෝ යම් තැනෙක්හිද එතැනට පැමිණියෙමි. මහණෙනි, තවද අවිහ දෙවියනුත් අතප්ප දෙවියනුත් සුදස්ස දෙවියනුත් සුදස්සී දෙවියනුත් සමග අකනිඨක දෙවියෝ යම් තැනෙක්හිද එතැනට පැමිණියෙමි. මහණෙනි, දිව්‍ය නිකායෙහි නොයෙක් දහස් දහස් ගණන් දේවතාවෝ මම යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ, මට වැඳ එක පැත්තක

සිටියාහුය. එකපැත්තක සිටියාවූ ඒ දේවතාවෝ මට මේ කාරණය දැන්නුවාහුය. නිදුකාණන් වහන්ස, යම් කලක අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ ලොව පහළවූවාහුද ඒ මෙයින් අනූඑක්වෙනි කල්පයයි. නිදුකාණන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ ජාතියෙන් ක්ෂත්‍රියවූහ. ක්ෂත්‍රිය කුලයෙහි උපන්නාහ. නිදුකාණන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ ගොත්‍රයෙන් කොණ්ඩඤ්ඤ නම් වූහ. නිදුකාණන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධ විපස්සී භාග්‍යවතුන් වහන්සේට අවුරුදු අසූදහසක් ආයුෂ ප්‍රමාණය වූයේය. නිදුකාණන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ පළොල් ගස මුලදී බුදු බවට පැමිණියාහුය. නිදුකාණන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට ඛණ්ඩය, තිස්සය යන නම් ඇති අග්‍ර ශ්‍රාවක දෙදෙනෙක් වූහ. නිදුකාණන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට ශ්‍රාවකයන්ගේ රැස්වීම් තුනක් වූහ. සැටඅට ලක්ෂයක් භික්ෂූන්වූ ශ්‍රාවකයන්ගේ එක් රැස්වීමක් වූයේය. භික්ෂූන් ලක්ෂයක් ඇත්තාවූ ශ්‍රාවකයන්ගේ එක් රැස්වීමක් වූයේය. අසූදහසක් භික්ෂූන් ඇති ශ්‍රාවකයන්ගේ එක් රැස්වීමක් වූයේය, නිදුකාණන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට සියල්ලම අර්හත් භික්ෂූන්ගෙන් යුත් මේ ශ්‍රාවකයන්ගේ රැස්වීම් තුණ වූයේය. නිදුකාණන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන්වහන්සේට උතුම් ලෙස උපස්ථාන කරන්නාවූ අශොක නම් භික්ෂුකෙනෙක් අග්‍ර උපස්ථායකවූහ. නිදුකාණන්වහන්ස, සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යගවතුන් වහන්සේට බන්ධුම නම් රජ පිය වූයේය. බන්ධුමති නම් දේවිය වැදූ මව් විය. බන්ධුම නම් රජහට බන්ධුමතී නම් නුවර ප්‍රධාන රාජධානිය විය.

නිදුකාණන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ මෙසේ ගිහිගෙය අත්හැර ගියේය. මෙසේ මහණ වූයේය. මෙසේ උතුම් වීය්‍ය‍ී වැඩූයේය. මෙසේ සම්‍යක් සම්බොධිය වූයේය. දම්සක් පැවතුම් දෙශනාව මෙසේ විය.

නිදුකාණන්වහන්ස, ඒ අපි විපස්සී භාග්‍යවතුන්වහන්සේගේ සස්නෙහි (බ්‍රහ්මචරියාව කොට) උතුම් හැසිරීමේ පැවත අනාගාමි මාර්ගයෙන් කාමයන්හි (කාමච්ඡන්දය) ආශාව සම්පූර්ණයෙන් දුරුකොට මේ බ්‍රහ්ම ලොකයෙහි උපන්නෙම්හයි දැන්නුවාහුය, “මහණෙනි, ඒ දිව්‍ය නිකායෙහිම නොයෙක් දහස් ගණන් දේවතාවෝද, නොයෙක් සියගණන් දේවතාවෝද මම යම්තැනකද එතැනට පැමුණුනාහුය. පැමිණ, මට වැඳ එකපැත්තක සිටියාහුය. මහණෙනි, එකපැත්තක සිටියාවූ ඒ දේවතාවෝ මට මේ කාරණා දැන් නුවාහුය. ‘නිදුකාණන් වහන්ස, දැන් අර්හත් සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ මේ භද්‍ර කල්පයෙහිම ලොව පහළවූහ. නිදුකාණන් වහන්ස, ඒ භාග්‍යවතුන් වහන්සේ ජාතියෙන් ක්ෂත්‍රියහ. රාජ කුලයෙහි උපන්හ. නිදුකාණන්වහන්ස, ගෞතම භාග්‍යවතුන්වහන්සේ ගොත්‍රයෙන් ගෞතම වූයේය. නිදුකාණන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ ආයුෂ ප්‍රමාණය ස්වල්පවූයේ ඉතා ස්වල්ප යයි. යමෙක් කලක් ජීවත්වේ නම් හෙතෙම අවුරුදු සියයක් හෝ සියයකට ටිකක් වැඩියෙන් හෝ ජීවත්වේ. නිදුකාණන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ඇසතු ගස මුලදී බුදුබව ලැබුවෝය. නිදුකාණන් වහන්ස, භාග්‍යවතුන්වහන්සේට සැරියුත් මුගලන් නම් අග්‍රශ්‍රාවක දෙදෙනෙක්වූහ. නිදුකාණන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේට එක්දහස් දෙසියපණහක් භික්ෂූන් ඇති ශ්‍රාවක රැස්වීමක් වූයේය. නිදුකාණන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේට සියල්ලන්ම රහත් භික්ෂූන්ගෙන් යුත් මේ එකම ශ්‍රාවක රැස්වීම වූයේය. නිදුකාණන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේට උතුම් ලෙස උපස්ථාන කරන්නාවූ ආනන්ද භික්ෂුතෙම ප්‍රධාන උපස්ථායක වූයේය. නිදුකාණන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේට සුද්ධොදන රජ පිය වූයේය. මායාදේවී වැදූ මව විය. කිඹුල්වත් නුවර රාජධානි විය. නිදුකාණන් වහන්ස, මෙසේ භාග්‍යවතුන් වහන්සේ ගිහිගේ අත්හැර ගියෝය. මෙසේ මහණවූහ. මෙසේ උතුම් වීර්‍ය්‍යී වැඩුවෝය. මෙසේ බුදු වූහ. මෙසේ ධම්මචක්ක දෙශනාව විය. නිදුකාණන් වහන්ස, ඒ අපි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි (බ්‍රහ්මචර්‍ය්‍යාව) උතුම් හැසිරීම

කොට අනාගාමි මාර්ගයෙන් කාමයන්හි කාමච්ඡන්දය (ආශාව) සම්පූර්ණයෙන් දුරුකොට මේ බ්‍රහ්ම ලොකයෙහි උපන්නෙමුයයි දැන්නුවාහුය.

33 මහණෙනි, මෙසේ මේ ඥානය තථාගතයන් වහන්සේ විසින් හොඳාකාර අවබොධකරන ලද්දේය. එනම්, යම් ඥානයක් අවබොධ කළ බැවින් තථාගතයන් වහන්සේ පිරිනිවන්පෑවාවූද, කපාදමනලද ලොභ මාන දෘෂ්ටි ඇත්තාවූද කපාදමනලද කුසල් අකුසල් කර්ම ඇති කෙළවර කළ සංසාරය ඇති දුක් රාශිය ඉක්මවූ අතීත බුදුවරයන් ජාති වශයෙන් සිහිකෙරේද, ආයුස ප්‍රමාණ වශයෙන් සිහිකෙරේද ශ්‍රාවක දෙදෙනා වශයෙන් සිහිකෙරේද ශ්‍රාවක රැස්වීම් වශයෙනුත් සිහිකෙරේද ඒ ඥානයයි. කෙසේ සිහිකෙරේදයත් ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු ජාති ඇත්තෝ වූහයිද මෙබඳු නම් ඇත්තෝ වූහයිද, මෙබඳු ගොත්‍ර ඇත්තෝ වූහයිද මෙබඳු සීල ඇත්තෝ වූහයිද, මෙබඳු ධර්ම ඇත්තෝ වූහයිද, මෙබඳු ප්‍රඥා ඇත්තෝ වූහයිද, මෙබඳු (විහරණ) වාසය කිරීම් ඇත්තෝ වූහයිද යනුවෙනි. භාග්‍යවතුන්වහන්සේ පෙර ජාති පිළිබඳවූ මෙම ධර්මදෙශනාව දේශනා කළාහුය. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ ඒ ධර්මදෙශනාව සතුටින් පිළිගත්හ.

දාහතරවෙනි මහාපදාන සූත්‍රය මෙතෙකින් නිමියේය.

---

## 15. මහානිදාන සූත්‍රය

1 මා විසින් මෙසේ අසන ලදී. එක් කලක භාග්‍යවතුන් වහන්සේ කුරුරට කම්මාසදම්ම නම්වූ කුරුරට වැස්සන්ගේ නියම්ගමක්වීද එහි වාසය කළෝය. එවිට ආයුෂ්මත් ආනන්ද තෙරුන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ හොඳින් වැඳ එක පැත්තක උන්නේය. එක පැත්තක උන්නාවූ ආයුෂ්මත් ආනන්ද තෙරුන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙ කාරණය

දැන්නුවේය. ස්වාමීන්වහන්ස, මේ (පටිච්ච සමුප්පාදය) හෙතු ඵල දෙශනාව පමණ ඉක්මවා ගැඹුරුවේද හෙවත් ඉතා ගැඹුරු වේද ගැඹුරු දැකුම් ඇත්තේ වේද ස්වාමීන් වහන්ස, ඒ කාරණය පුදුමයි. ස්වාමීන් වහන්ස, ඒ කාරණය ඉතා පුදුමයි. එසේ නමුත් මට නොගැඹුරුවූවක් මෙන් පහසුවූවක් මෙන් වැටහේයයි" දැන්නුවේය.

"ආනන්දය, එසේ නොකියව. ආනන්දය, එසේ නොකියව ආනන්දය, මේ (පටිච්ච සමුප්පාදය) හේතු ඵල ධර්මය ගැඹුරු වෙයි. ගැඹුරු දැකුම් ඇත්තේද වෙයි. ආනන්දය, මේ ධර්මය නොදැනීම හේතුකොට ගෙන, හොඳින් අවබොධ නොකිරීම හේතුකොටගෙන මේ සත්ව සමූහයා මීයන් විසින් කපා අවුල් කර දමනලද රෙදි වියන්නන්ගේ නූල් කැටියක් මෙන් අවුල්වී, කුරුළු කූඩුවක් මෙන් ගෙතී, තණ බිස්සක් මෙන් පැටලී සැපයෙන් පහවූ බැවින් අපාය නම්වූ නපුරු ගති ඇත්තාවූ දුක් ඇත්තාවූ සසර නොයික්මවයි.

**2** "ආනන්දය, යමක් හේතුකොටගෙන ජරාව හා මරණය වේ නම් ඒ හේතුව කිමෙක ඇත්තේදැයි මෙසේ අසනලද්දාවූ ප්‍රඥාවන්තයා විසින් ඒකාන්තයෙන් ඇත්තේම යයි ඔහුට කිය යුතුයි. යමක් හේතුකොටගෙන ජරා මරණ දෙක වේ නම් ඒ ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කවරේදැයි කියන්නෙම් නම් ජාතිය ප්‍රත්‍යය (අවශ්‍ය කරුණු) කොට ගෙන ජරා මරණ දෙක වේයයි කිය යුතුයි.

ආනන්දය, යමක් ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කොටගෙන ජාතිය වේනම් ඒ ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කිමෙක ඇත්තේ දැයි මෙසේ අසන ලද්දාවූ ප්‍රඥාවන්තයා විසින් එකාන්තයෙන් ඒ ප්‍රත්‍යය ඇත්තේමයයි ඔහුට කිය යුතුයි. යමක් කරුණු (ප්‍රත්‍යය) කොට ගෙන ජාතිය වේනම් ඒ ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කවරේදැයි මෙසේ කියන්නේ නම් භවය ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කොටගෙන ජාතිය වේයයි ඔහුට මෙසේ කිය යුතුයි. ආනන්දය, යමක් ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කොට ගෙන භවය වේනම් ඒ ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කිමෙක ඇත්තේදැයි මෙසේ

අසනලද්දාවූ ප්‍රඥාවන්තයා විසින් ඒකාන්තයෙන් ඒ ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) ඇත්තේමයයි කිය යුතුයි. යමක් ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කොටගෙන භවය වේනම් ඒ ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කුමක්දැයි මෙසේ කියන්නේ නම් උපාදානය දැඩිකොට (අල්වා ගැනීම) ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කොටගෙන භවය වේයයි ඔහුට මෙසේ කිය යුතුයි. ආනන්දය, යමක් ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කොටගෙන උපාදානය (දැඩි කොට අල්වාගැනීම) වේ නම් ඒ ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) ඇත්තේදැයි මෙසේ අසන ලද්දාවූ ප්‍රඥාවන්තයා විසින් ඒකාන්තයෙන් ඒ ප්‍රත්‍යය (අවශ්‍යකරුණ) ඇත්තේමයයි ඔහුට මෙසේ කිය යුතුයි. යමක් ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කොටගෙන උපාදානය වේනම් ඒ ප්‍රත්‍යය (අවශ්‍යකරුණ) කුමක්දැයි මෙසේ කියන්නේ නම් ලොභය ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කොටගෙන උපාදානය (දැඩිකොට අල්වාගැනීම) වේයයි ඔහුට මෙසේ කිය යුතුයි. ආන්නදය, යමක් ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කොටගෙන, ලොභය වේනම් ඒ ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කිමෙක ඇත්තේදැයි මෙසේ අසන ලද්දාවූ ප්‍රඥාවන්තයා විසින් ඇත්තේමයයි ඔහුට මෙසේ කිය යුතුයි. යමක් ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කොටගෙන ලොභය වේනම් ඒ ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කුමක්දැයි මෙසේ කියන්නේ නම් වේදනාව ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කොටගෙන ලොභය වේයයි ඔහුට මෙසේ කිය යුතුයි. ආනන්දය, යමක් ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කොටගෙන වේදනාව වේනම් ඒ ප්‍රත්‍යය අවශ්‍ය කරුණ) කිමෙක ඇත්තේදැයි මෙසේ අසන ලද්දාවූම ප්‍රඥාවන්තයා විසින් ඒකාන්තයෙන් ඒ ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) ඇත්තේමයයි ඔහුට මෙසේ කිය යුතුයි. යමක් ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කොටගෙන වේදනාව වේනම් ඒ ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කුමක්දැයි මෙසේ කියන්නේ නම් ස්පර්ශය ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කොටගෙන වේදනාව වේයයි ඔහුට මෙසේ කියයුතුයි. ආනන්දය, යමක් ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කොටගෙන ස්පර්ශය වේනම් ඒ ප්‍රත්‍යය කිමෙක ඇත්තේ දැයී මෙසේ අසනලද්දාවූම ප්‍රඥාවන්තයා විසින් ඒකාන්තයෙන් ඒ ප්‍රත්‍යය ඇත්තේමයයි ඔහුට මෙසේ කියයුතුයි. යමක් ප්‍රත්‍යය (අවශ්‍ය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කරුණු) කොටගෙන ස්පර්ශය වේනම් ඒ ප්‍රත්‍යය (අවශ්‍ය කරුණු) කුමක්දැයි මෙසේ කියන්නේ නම් නාම රූප දෙක ප්‍රත්‍යය (අවශ්‍ය කරුණු) කොටගෙන ස්පර්ශය වේයයි ඔහුට මෙසේ කියයුතුයි. ආනන්දය, යමක් ප්‍රත්‍යය (අවශ්‍ය කරුණු) කොටගෙන නාම රූප දෙක වේ නම් ඒ ප්‍රත්‍යය (අවශ්‍ය කරුණු) කිමෙක ඇත්තේදැයි මෙසේ අසන ලද්දාවූම ප්‍රඥාවන්තයා විසින් ඒකාන්තයෙන් ඒ ප්‍රත්‍යය (අවශ්‍ය කරුණු) ඇත්තේයයි කියයුතුය. යමක් ප්‍රත්‍යකොට ගෙන නාම රූප දෙක වේනම් ඒ ප්‍රත්‍යය (අවශ්‍ය කරුණු) කුමක්දැයි මෙසේ කියන්නේ නම් විඥානය ප්‍රත්‍යය (අවශ්‍ය කරුණු) කොටගෙන නාම රූප දෙක වේයයි ඔහුට මෙසේ කියයුතුයි. ආනන්දය, යමක් ප්‍රත්‍යය (අවශ්‍ය කරුණු) කොට ගෙන විඥානය වේ නම් ඒ ප්‍රත්‍යය (අවශ්‍ය කරුණු) කිමෙක ඇත්තේදැයි මෙසේ අසන ලද්දාවූ ප්‍රඥාවන්තයා විසින් ඒ ප්‍රත්‍යය (අවශ්‍ය කරුණු) ඇත්තේමයයි ඔහුට මෙසේ කියයුතුයි. යමක් ප්‍රත්‍යය (අවශ්‍ය කරුණු) කොටගෙන විඥානය වේනම් ඒ ප්‍රත්‍යය (අවශ්‍ය කරුණු) කුමක්දැයි මෙසේ කියන්නේ නම් නාම රූප දෙක ප්‍රත්‍යය (අවශ්‍ය කරුණු) කොටගෙන විඥානය වේයයි මෙසේ ඔහුට කියයුතුයි.

3 ආනන්දය, මෙසේ ඇති කල නාම රූප ප්‍රත්‍යය (අවශ්‍ය කරුණු) කොටගෙන විඥානය වෙයි, විඥානය ප්‍රත්‍යය කොටගෙන නාම රූප දෙක වෙයි. නාම රූප ප්‍රත්‍යය කොට ගෙන ස්පර්ශය වෙයි. ස්පර්ශය ප්‍රත්‍ය කොටගෙන වේදනා වෙයි. වේදනාව ප්‍රත්‍යය කොට ගෙන ලාභය (තන්හාව) වෙයි. තන්හාව ප්‍රත්‍යයකොට ගෙන උපාදානය (දැඩිව අල්වා ගැනීම) වෙයි. උපාදානය ප්‍රත්‍යය කොට ගෙන භවය වෙයි. භවය ප්‍රත්‍යය කොට ගෙන ජාතිය වෙයි. ජාතිය ප්‍රත්‍යය කොටගෙන ජරාව හා මරණය වෙයි, ජරා මරණ ප්‍රත්‍යය කොට ගෙන සොක කිරීමය, වැළපීමය, කායික දුකය, දොම්නස්ය, දැඩි වෙහෙසය යන මොහු පහළ වෙත්. මෙසේ මේ සියලු දුක් රාශීහුගේ පහළවීම වේ.

4 ආනන්දය, ජාතිය ප්‍රත්‍යය (අවශ්‍ය කරුණු) කොටගෙන ජරාව මරණ වේය. මෙසේ මෙය කියන ලද්දේය. මෙය යම්සේ

ජාතිය ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කොටගෙන ජරාමරණ වෙන බව මේ ආකාරයෙන්ද දැනගත යුතුයි. ආනන්දය, දෙවියන්ගේ දෙව භාවය පිණිස හෝ ගන්ධර්වයන්ගේ ගන්ධර්ව භාවය පිණිස හෝ යක්ෂයන්ගේ යක්ෂභාවය පිණිස හෝ භූතයන්ගේ භූතභාවය පිණිස හෝ මනුෂ්‍යයන්ගේ මනුෂ්‍ය භාවය පිණිස හෝ පක්ෂීන්ගේ පක්ෂිභාවය පිණිස හෝ සිවුපාවන්ගේ සිව්පාභාවය පිණිස හෝ (දිග සතුන්ගේ) සර්පයින්ගේ සර්පභාවය පිණිස හෝ ජාතියක් ඉපදීමක් මුළුමනින් නොවන්නේ නම් ආනන්දය, ඒ සත්වයන්ගේ ඇතිවීමක් නොවන්නේය. සියලු ප්‍රකාරයෙන්ම උත්පත්තිය නැති කල ජාති නිරොධය (උත්පත්තියෙන් වැලකීම) හෙතුකොටගෙන ජරා මරණ දෙක පෙනෙන්නේදැයි" ඇසුවෝය.

"ස්වාමීන් වහන්ස, නොපෙනේයයි කීය."

ආනන්දය, එබැවින් මෙසේ මේ හේතු ඵල ධර්මයෙහි යම් ඒ ජාතියක් වේද, ජරා මරණ දෙක ඇතිවීමට එයම හේතු වෙයි. එයම මුල් කාරණය වෙයි. මේ ඉපදීම හෙතුකොට ගෙන ජරා මරණ වන්නේයයි" කීවෝය.

**5** "භවය ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කොට ගෙන ජාතිය වේයයි මෙසේ මෙය කියන ලදී. ආනන්දය, භවය ප්‍රත්‍යය (අවශ්‍ය කාරණය) කොටගෙන ජාතිය වේද යන මේ කාරණය මේ ආකාරයෙන් දතයුතුයි. ආනන්දය, භවය සියලු ආකාරයෙන් කිසිවෙකු සම්බන්ධව කිසි භවයෙක්හි එනම්: කාම භවය, රූප භවය, අරූප භවය යනුවෙන් නොවන්නේ නම් සියලු ආකාරයෙන් භවය නැති කල භවය නිරුද්ධකිරීම හෙතුකොටගෙන ජාතිය (උත්පත්තිය) පෙනෙන්නේදැයි" ඇසුවෝය.

"ස්වාමීන් වහන්ස, මේ කාරණය නොවේමය."

"ආනන්දය, එබැවින් මෙහි භවය හෙතුකොටගෙන යම් ජාතියක් වේනම් මේ භවයම ඊට හේතුවයි. මෙයම මූලකාරණය වෙයි. මෙසම ජාතිය හටගන්නා හේතුව වේයයි කීවෝය.

6 "උපාදානය (දැඩිකොට අල්වාගැනීම) හෙතු කොට ගෙන භවය වේයයි මෙසේ මෙය කියන ලදී.

ආනන්දය, යම්සේ උපාදානය (දැඩිකොට අල්වාගැණීම) හේතුකොට ගෙන භවය වේද ඒ මේ කාරණයද මේ ආකාරයෙන් දත යුතුයි.

ආනන්දය, සියලු ආකාරයෙන් උපාදානය (දැඩිකොට අල්වාගැනීම) කිසිවෙකු සම්බන්ධව කිසි තැනෙක්හි නොවේද එනම් කාම ආශාවෙන් දැඩිසේ අල්වා ගැනීමය, වරදවා ගැනීමෙන් දැඩිසේ අල්වා ගැනීමය, ශීලව්‍රත වශයෙන් දැඩිසේ අල්වා ගැනීමය, ආත්මය දැඩිසේ අල්වා ගැනීමය යන මොහුයි.

හැම ආකාරයෙන් උපාදානය නැති කල උපාදානය නැති කිරීම හේතුකොට ගෙන භවය පෙනෙන්නේදැයි" ඇසුවෝය.

'ස්වාමීන් වහන්ස එසේ නොපෙනේයයි" කීය.

"ආනන්දය, එබැවින් මෙසේ මෙහි යම් මේ උපාදානයක් (දැඩිකොට අල්වාගැනීමක්) වේද භවය ලැබීමට මෙයම හේතු වෙයි, මෙයම මූල කාරණා වෙයි, මෙයම හටගන්නා හේතුව වෙයි, මෙයම ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) වේයයි" පැවසුවෝය.

7 "තණ්හාව හේතුකොටගෙන උපාදානය වේයයි මෙසේ මෙය කියන ලදී. ආනන්දය, යම්සේ තණ්හාව හෙතු කොටගෙන උපාදානය වේද, ඒ මේ කාරණයද මේ ආකාරයෙන් දත යුතුයි.

ආනන්දය, කිසිවෙකුට කිසිතැනෙක සියලු ආකාරයෙන් මුළුමනින් එනම්, රූප ආශාවය, ශබ්ද කෙරෙහි ආශාවය, ගන්ධ කෙරෙහි ආශාවය, රස කෙරෙහි ආශාවය, ස්පර්ශ කෙරෙහි ආශාවය, රූප ශබ්දාදියෙන් අන්‍ය දෙයෙහි ආශාවය යන තණ්හාවය සියලු ආකාරයෙන් තණ්හාව නැති කල තණ්හා නිරොධය හෙතුකොට ගෙන දැඩිකොට අල්වාගැනීම (උපාදානය) පෙනෙන්නේදැයි" ඇසුවෝය.

"ස්වාමීන් වහන්ස, එසේ නොපෙනේමයයි" කීය.

"ආනන්දය, එහෙයින් මෙසේ මෙහි යම් ඒ තණ්හාවක් වේද උපාදානයට මෙයම හේතුවේ, මෙයම මූලකාරණය වේ,

මෙයම හටගැනීමේ හේතුව වේ. මෙයම ප්‍රත්‍යය (අවශ්‍ය කාරණය) වේයයි කීවෝය.”

8 වේදනාව හෙතුකොට තණ්හාව වේයයි මෙසේ මෙය කියන ලදී.

ආනන්දය, යම්සේ වේදනාව හෙතුකොටගෙන තණ්හාව වේද, ඒ මේ කරුණද මේ ආකාරයෙන් දතයුතුයි.

ආනන්දය, කිසිවෙකුට කිසිතැනෙක්හි සියලු ආකාරයෙන් මුළුමනින් එනම්, ඇසේ ස්පර්ශයෙන් හටගන්නා වේදනාය, කන් ස්පර්ශයෙන් හටගන්නා වේදනාය, නාසයේ ස්පර්ශයෙන් හටගන්නා වේදනාය, දිවේ ස්පර්ශයෙන් හටගන්නා වේදනාය, ශරීරයේ ස්පර්ශයෙන් හටගන්නා වේදනාව යන මොහුයි. ඉදින් වේදනාව නොවන්නේ නම් සෑම ආකාරයෙන් වේදනාව නැති කල වේදනා නිරොධය හෙතුකොටගෙන තණ්හාව පෙනෙන්නේදැයි” ඇසුවෝය.

“ස්වාමීන් වහන්ස, එසේ නොවන්නේමය”

ආනන්දය, එබැවින් මෙහි යම් ඒ වේදනාවක් වේද, තණ්හාව ඇතිවීම පිණිස වේදනාවම හේතුවෙයි. මෙයම මූල කාරණය වෙයි, මෙයම (සමුදය) හේතුව වෙයි, මෙයම ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) වේයයි” කීවෝය.

9 “ආනන්දය, මෙසේ ඇති කල වේදනාව ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කොටගෙන තණ්හාව වේ. තණ්හාව ප්‍රත්‍යය කොටගෙන රූප ආදී අරමුණු සෙවීම ඇති වන්නේය. (පරියෙසනා) සෙවීම ඇති කල රූපාදී අරමුණු ලැබීම වේ. රූපාදී අරමුණු ලැබීම ඇති කල හොඳ නරක විනිශ්චය කරයි. විනිශ්චය ඇතිකල (ඡන්ද රාගය) දුර්වල රාගය සහ බලවත් රාගය උපදී. ඡන්දරාගය ඇති කල මමය මාගේය යන අදහස උපදී මමය මාගේය යන අදහස ඇතිකල දැඩිකොට ගැනීම (තණ්හාව වශයෙන් දැකීම) වෙයි. තණ්හා වශයෙන් දැකීම ඇතිකල මසුරු බව වේ. මසුරු බව ඇති කල ආරක්ෂා ඇති කිරීම වේ. ආරක්ෂා ඇති කිරීම ඇති කල දඬු ගැන්ම ආයුධ ගැන්ම, කොලහලය. විරුද්ධකම්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

විවාද, ‘තෝ’ ‘තා’ යන වචන කීම, බොරු කීම යනාදී නොයෙක් ලාමක අකුශල ධර්ම පහළ වෙත්.”

10. “ආරක්ෂා ඇති කිරීම කරණකොටගෙන දඬු ආයුධ ගැන්ම, කෝලාහල, විරුද්ධකම් වාදවිවාද, ‘තෝ තා’ යනාදී කේලාම් කීම, බොරු කීම යනාදීවූ නොයෙක් ලාමක අකුසල් ඇති වෙන්නේයයි මෙසේ මෙය ප්‍රකාශ කරන ලද්දේද.

“ආනන්දය, යම්සේ ආරක්ෂා ඇති කිරීම කරණකොට ගෙන දඬුගැන්ම, ආයුධ ගැන්ම, කෝලාහල, විරුද්ධකම් වාදවිවාද, ‘තෝ තා’ යනාදී කේළාම් කීම, බොරු කීම යනාදීවූ නොයෙක් ලාමක අකුසල් ඇති වන්නේද යනු මේ ආකාරයෙන් දතයුතුයි.

“ආනන්දය, සියලු ආකාරයෙන් කිසිවෙකුට කිසිතැනෙක ආරක්ෂාව ඉදින් නොවන්නේ නම් සෑම ආකාරයෙන් ආරක්ෂාව නැති කල ආරක්ෂාවක් නැතිවීම හෙතුකොටගෙන දඬුගැන්ම, ආයුධ ගැන්ම, කෝලාහල, විරුද්ධකම්, වාදවිවාද, ‘තෝ තා’ යනාදී කේළාම් කීම, බොරුකීම යනාදීවූ නොයෙක් ලාමක අකුශල් පහළ වන්නාහුදැයි” ඇසුවෝය.

“ස්වාමීන් වහන්ස, මේ කාරණය නොවේමය”

“ආනන්දය, එබැවින් මෙහි යම් මේ ආරක්ෂාවක් වේනම් ඒ ආරක්ෂාකිරීම, දඬුගැන්ම, ආයුධ ගැන්ම, කෝලාහල, විරුද්ධකම්, වාද විවාද, ‘තෝ තා’ යනාදී කේලාම් කීම, බොරු කීම, යනාදිවූ නොයෙක් ලාමක අකුසල් කරුණු ඇතිවීමට හේතුවේ. මෙයම ඊට මූල කාරණයවේ. මෙයම ඊට හේතුවවේ. මෙයම ඊට ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) වේයයි ප්‍රකාශ කළෝය.

11. “මසුරුකම නිසා ආරක්ෂාව වේයයි මෙය මෙසේ කියන ලදී. යම්සේ මසුරුකම නිසා ආරක්ෂාව වේද, එයද මේ ආකාරයෙන් දතයුතුයි. සියලු ආකාරයෙන් යම් කෙනෙකුට යම් තැනක මසුරුකම නොවන්නේ නම් සියලු ආකාරයෙන් මසුරුකම නැති කල්හි මසුරුකම සහමුලින් නැති කිරීම හේතුකොටගෙන ආක්ෂාව පෙනෙන්නේදැයි” ඇසුවෝය.

“ස්වාමීන් වහන්ස, මේ කාරණය නොවේමය” කීය.

"ආනන්දය, එහෙයින් යම් මේ මසුරු බවක් වේ නම් ආරක්ෂාවට මෙයම හේතුවවෙයි. මෙයම මුල් කාරණය වෙයි. මෙයම පහළවීමේ හේතුව වෙයි. මෙයම ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) වේයයි" කීවෝය.

12. "පරිග්‍රහණය (අයිතිකර ගැනීම) නිසා මසුරු බව වේයයි මෙසේ මෙය කියන ලදී."

"ආනන්දය, යම්සේ පරිග්‍රහණය (අයිතිකර ගැනීම) නිසා මසුරු බව වේද? ඒ මේ කාරණය මේ ආකාරයෙන් දතයුතුයි.

"ආනන්දය, සියලු ආකාරයෙන් යම් කෙනෙකුට යම් තැනෙක ඉදින් අයිතිකර ගැනීම නොවන්නේ නම් සියලු ආකාරයෙන් අයිතිකර ගැනීම නැති කල්හි, අයිතිකර ගැනීම සහමුලින් නැතිකිරීම හේතුකොටගෙණ කිමෙක්ද මසුරු බව පෙණෙන්නේදැයි" ඇසුවෝය.

"ස්වාමීන් වහන්ස, මේ කාරණය නොවේමය" කීය.

"ආනන්දය, එහෙයින් මෙහි යම් යම් අයිතිකර ගැනීමක් වේ නම් මසුරු බවට මෙයම හේතුව වෙයි. මෙයම මුල් කාරණය වෙයි. මෙයම (සමුදය) ඇතිවීමේ කරුණවෙයි. මෙයම ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) වේයයි" කීවාහුය.

13. "මමය මාගේයයි දැඩිකොට ගැනීම නිසා අයිතිකර ගැන්ම වේයයි මෙසේ මෙය කියනලදී.

"ආනන්දය, යම්සේ මමය මාගේයයි දැඩිකොට ගැන්ම නිසා අයිතිකර ගැන්මවේද, ඒ මේ කරුණද මේ ආකාරයෙන් දතයුතුයි.

"ආනන්දය, සියලු ආකාරයෙන් යමෙකුට යම් තැනක ඉදින් මමය මාගේයයි දැඩිසේ ගැනීම නොවන්නේ නම් සියලු ආකාරයෙන් මමය මාගේයයි දැඩිසේ ගැනීම සහමුලින් නැති කිරීම හේතුකොට ගෙන අයිතිකර ගැනීම පෙණෙන්නේදැයි" ඇසුවෝය.

"ස්වාමීන් වහන්ස, ඒ කාරණය නොවේමය,"

"ආනන්දය, එහෙයින් මෙහි මමය මාගේයයි දැඩිකොට ගැනීම යන යමක් වේද අයිතිකර ගැනීමට මෙයම හේතුව වේ. මෙයම මුල් කාරණය වේ. මෙයම ඇතිවීමේ හේතුව (සමුදය) නම් වේ. මෙයම ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) වේයයි" කීවෝය.

14 "දුර්වලවූද බලවත්වූද ඇලීම (ඡන්ද රාගය) නිසා මමය මාගේයයි දැඩිකොට ගැනීම වේයයි මෙය මෙසේ කියන ලදී.

"ආනන්දය, දුර්වලවූද බලවත්වූද ඇලීම නිසා මමය මාගේ යයි දැඩිකොට ගැනීම වේද ඒ මේ කාරණයද මේ ආකාරයෙන් දතයුතුයි. සියලු ආකාරයෙන් යමෙකුට යම් තැනෙක්හි ඉදින් දුර්වල රාගය හා බලවත් රාගය නොවන්නේ නම් සියලු ආකාරයෙන් දුර්වල රාගය හා බලවත් රාගය නැතිවීම හේතුකොටගෙන මෙය මාගේයයි දැඩිකොට ගැනීම පෙණෙන්නේදැයි" ඇසුවෝය.

"ස්වාමීනි, මේ කාරණය නොවේමය."

"ආනන්දය, එහෙයින් මමය මාගේයයි දැඩිකොට ගැනීමට යම් මේ දුර්වල රාගයක් හා බලවත් රාගයක් වේ නම් එයම හේතුව වෙයි. එයම මුල් කාරණය වෙයි. එයම ඇතිවීමේ හේතුව (සමුදය) වෙයි. එයම ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) වේයයි' කීවෝය.

15. "විනිශ්චය (හොඳ නරක විමසීම) නිසා ඡන්ද රාගය වේයයි මෙසේ මෙය කියන ලදී

"ආනන්දය, යම්සේ විනිශ්චය නිසා ඡන්ද රාගය වේද ඒ මේ කාරණයද මෙසේ දතයුතුයි.

"ආනන්දය, සියලු ආකාරයෙන් යමෙකුට යම් තැනක ඉදින් විනිශ්චයක් නොවේ නම් සියලු ආකාරයෙන් විනිශ්චය නැති කල්හි සියලු ආකාරයෙන් විනිශ්චය නැතිවීම හේතු කොටගෙන දුර්වල රාගය හා බලවත් රාගය පෙණෙන්නේදැයි" ඇසුවෝය.

"ස්වාමීන් වහන්ස, මේ කාරණය නොවේමය."

"ආනන්දය, එහෙයින් ඡන්ද රාගයට යම් මේ ප්‍රිය අප්‍රිය යන විනිශ්චයක් වේනම් මෙයම හේතුව වෙයි. මෙයම මුල්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

කාරණය වෙයි, මෙයම ඇතිවීමට හේතුව වෙයි, මෙයම ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) වේයයි" කීවෝය.

16. "රූපාදී අරමුණු ලැබීම නිසා ප්‍රිය අප්‍රිය යන විනිශ්චය වේයයි මෙසේ මෙය කියන ලදී.

"ආනන්දය, යම්සේ ලැබීම නිසා ප්‍රිය අප්‍රිය යන විනිශ්චය වේද මෙසේ මෙය මේ ආකාරයෙන් දතයුතුයි.

"ආනන්දය, සියලු ආකාරයෙන් යමෙකුට යම් තැනක ඉදින් රූපාදිය ලැබීම නොවේ නම් සියලු ආකාරයෙන් ලැබීම නැතිවීම හේතුකොටගෙන ප්‍රිය අප්‍රිය යන විනිශ්චය පෙණෙන්නේදැයි" ඇසුවෝය.

"ස්වාමීනි, මේ කාරණය නොවේමය"

"ආනන්දය, ප්‍රිය අප්‍රිය විනිශ්චයට යම් මේ ලැබීමක්වේ නම් මෙයම හේතුව වෙයි. මෙයම මුල් කරුණ වෙයි. මෙයම ඇතිවීමේ හේතුව වෙයි. මෙයම ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) වේයයි" කීවෝය.

17. "සෙවීම (පරියෙසන) නිසා ලැබීම වේයයි මෙසේ මෙය කියන ලදී. යම්සේ සෙවීම නිසා ලැබීම වේද යන මේ කාරණය මේ ආකාරයෙන් දතයුතුයි.

ආනන්දය, සියලු ආකාරයෙන් යමෙකුට යම් තැනක ඉදින් සෙවීම නොවන්නේ නම් සියලු ආකාරයෙන් සෙවීම නැති කල්හි, සෙවීම නැතිවීම හේතුකොටගෙන ලැබීම පෙණෙන්නේදැයි" ඇසුවෝය.

"ස්වාමීනි, මේ කාරණය නොවේමය"

"ආනන්දය, මෙහි ලැබීමට යම් මේ සෙවීමක් වේනම්. මෙයම හේතුව වෙයි, මෙයම මුල් කරුණ වෙයි, මෙයම ඇතිවීමේ හේතුව වෙයි, මෙයම අවශ්‍ය කාරණය (ප්‍රත්‍යය) වේයයි" කීවෝය.

18 "තණ්හාව නිසා සෙවීම වන්නේයයි මෙසේ මෙය කියන ලදී.

"ආනන්දය, යම්සේ තණ්හාව නිසා සෙවීම වේද, ඒ මේ කරුණද මේ ආකාරයෙන් දත යුතුයි.

"ආනන්දය, සියලු ආකාරයෙන් කිසිවෙකුට කිසිතැනක තණ්හාව ඉදින් නොවන්නේ නම්, සියලු ආකාරයෙන් තණ්හාව නැතිකම, තණ්හා නැතිවීම හේතුකොට ගෙන සෙවීම පෙණෙන්නේදැයි" ඇසුවෝය.

"ස්වාමීනි, මේ කරුණ නොවේමය."

"ආනන්දය, එහෙයින් මෙහි සෙවීමට යම් මේ තණ්හාවක් වේනම් මෙයම හේතුව වෙයි. මෙයම මුල් කරුණ වෙයි. මෙයම ඇතිවීමේ හේතුව වෙයි. මෙයම ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) වේයයි" කීවෝය.

**19.** "ස්පර්ශය හේතුකොට ගෙන වේදනාව (විඳීම) වේයයි මෙසේ කියන ලදී. යම්සේ ස්පර්ශ හේතුවෙන් වේදනාව වේද යන ඒ මේ කරුණද මේ ආකාරයෙන් දත යුතුයි.

"ආනන්දය, සියලු ආකාරයෙන් කිසිවෙකුට කිසි තැනක ඇසේ ස්පර්ශය, කණේ ස්පර්ශය, නාසයේ ස්පර්ශය, දිවේ ස්පර්ශය, ශරීරයේ ස්පර්ශය, සිතේ ස්පර්ශය, යන ස්පර්ශ ඉදින් නොවන්නේ නම් සියලු ආකාරයෙන් ස්පර්ශය නැති කල්හි, ස්පර්ශය නැතිවීම හේතුකොටගෙන වේදනාව (විඳීම) පෙනෙන්නේ දැයි" ඇසුවෝය.

"ස්වාමීනි, මේ කාරණය නොවේමය"

"ආනන්දය, යම් මේ ස්පර්ශයක් වේනම් මෙයම විඳීමට හේතුවෙයි, මෙයම මුල් කාරණය වෙයි, මෙයම ඇතිවීමේ හේතුව වෙයි, මෙයම ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) වේයයි" කීවෝය.

**20.** "නාමරූපයන්, ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කොටගෙන ස්පර්ශය වේයයි මෙසේ මෙය කියන ලදී. ආනන්දය, යම්සේ නාම රූපයන් ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කොට ස්පර්ශය වේද යන කාරණය මේ ආකාරයෙන් දත යුතුයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ආනන්දය, යම් ආකාරයන්ගෙන් යම් හේතූන්ගෙන් යම් යම් කරුණු වලින් යම් (උදෙසුම්වලින්) දැක්වීම් වලින් නාම සමූහයේ (චිත්ත චෛතසිකයන්ගේ) ඵස්ස වේදනා යනාදීන් පැණවීම වේද, ඒ ආකාරයන්ද, ඒ හේතුද, ඒ කරුණුද, (ඒ උදෙසුම්ද) ඒ දැක්වීම්ද නැති කල නාම කය අරමුණු කොට මනොද්වාරයෙහි ස්පර්ශය උපදින්නේද, කිමෙක්ද? ඒ මනො ස්පර්ශය රූප කයෙහි පඤ්චප්‍රසාද වස්තු කොට ඉපදීම පෙනෙන්නේදැයි" ඇසූහ.

"ස්වාමීන් වහන්ස, මේ කාරණය නොවේමය."

"ආනන්දය, ඒ යම් ඔවුනොවුන්ට අසමාන ආකාරවලින්ද යම් ඒ වෙන් වෙන්වූ ස්වභාවයන්ගෙන්ද, යම් ඒ නාමධර්මයන් හැඳිනගන්නා හෙතුවලින්ද, යම් ඵස්ස වේදනාදි නම්වලින්ද, නාම සමූහයාගේ යම් පැනවීමක් වේද, ඒ ආකාරයන්ද, ඒ වෙන් වෙන්වූ ස්වභාවයන්ද, ඒ හැඳින ගන්නා හේතූන්ද, ඒ පැනවීම්ද, නැති කල සතර නාම ස්කන්ධයන් අරමුණු කොට මනොද්වාරයෙහි උපදින ස්පර්ශය වැනි ස්පර්ශයක් රූප කයෙහි දක්නට ලැබේදැයි" ඇසූහ.

"ස්වාමීන් වහන්ස, මේ කාරණය නොවේමය."

"ආනන්දය, යම් ආකාරයන්ගෙන්, යම් වෙන් වෙන්වූ ස්වභාව වලින් යම් හැඳින ගතයුතු හෙතුවලින්, යම් පැනවිය යුතු කරුණුවලින් රූප කයේ පැනවීම වේද, ඒ ආකාරයන්ද, ඒ ස්වභාවයන්ද, ඒ පැනවිය යුතු කරුණුද, නැති කල හුදෙක් නාම කයෙහි හැපීම් සහිතවූ ස්පර්ශයක් දක්නට ලැබේදැයි" ඇසූහ.

"ස්වාමීන්වහන්ස, මේ කාරණය නොවේමය"

"ආනන්දය, යම් ආකාරවලින්ද, යම් වෙන් වෙන්වූ ස්වභාවවලින්ද, යම් හැඳින ගතයුතු හේතුවලින්ද, යම් පැනවියයුතු කරුණුවලින්ද, නාමකය රූප කය දෙදෙනාගේ පැනවීම වේද, ඒ ආකාරයෙන්ද, ඒ ස්වභාවයන්ද, ඒ කරුණද, ඒ පැනවියයුතු හේතුද, නැතිකල හුදෙක් නාමධර්ම අරමුණුවී

මනො ද්වාරයේ උපදින ස්පර්ශය රූප කයෙහි හෝ හැපීම් සහිතවූ රූප ස්පර්ශය නාම කයෙහි හෝ දක්නට ලැබේදැයි" ඇසුවෝය.

"ස්වාමීන්වහන්ස, මේ කාරණය නොවේමය."

"ආනන්දය, යම් ඔවුනොවුන්ට වෙනස්වූ ආකාරවලින්, යම් වෙන් වෙන්වූ ස්වභාව වලින්, යම් හැඳිනගතයුතු හේතු වලින්, යම් පැනවියයුතු කරුණුවලින් නාම රූප දෙදෙනාගේ පැනවීම වේද, ඒ ආකාරයන්ද, ඒ ස්වභාවයන්ද ඒ හේතුද, ඒ පැනවියයුතු කරුණුද, නැති කල හුදෙක් ස්පර්ශයක් දක්නට ලැබේදැයි" ඇසුවෝය.

"ස්වාමීනි, ඒ කාරණය නොවේමය"

"ආනන්දය, එබැවින් මෙහි ස්පර්ශයට යම් මේ නාම රූපයක් වේනම්, ඒ ස්පර්ශයම හේතුවෙයි. එයම මූල කාරණා වෙයි. එයම (සමුදය) ඇතිවීමේ හේතුව වෙයි. එයම ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) වේයයි කීවෝය.

21 "විඥානය ප්‍රත්‍ය (අවශ්‍ය කරුණ) කොටගෙන නාම රූප වේයයි මෙසේ මෙය කියනලදී. ආනන්දය, යම්සේ විඥානය ප්‍රත්‍යකොටගෙන නාමරූපය වේද යන කාරණය මේ ආකාරයෙන් දතයුතුයි. ආනන්දය, විඥානය මව්කුසට ප්‍රතිසන්ධි වශයෙන් නොපැමිණෙන්නේ නම් කිමෙක් ද මව් කුසෙහි ප්‍රතිසන්ධි විඥානය නැතිකල නාම රූපය කලල රූප ආදී භාවයන් මිශ්‍රව පවත්නේදැයි" ඇසුවෝය.

"ස්වාමීන්වහන්ස, මේ කාරණය නොවේමය."

"ආනන්දය, විඥානය මව්කුසට බැසගෙන නිරුද්ධ (නැතිවීම) වන්නේ නම් නාම රූප දෙක මේ භවය පිණිස කිමෙක පවත්නේදැයි" ඇසුවෝය.

"ස්වාමීන්වහන්ස, මේ කාරණය නොවේය."

"ආනන්දය, ලදරු අවස්ථාවෙහි සිටි පිරිමි දරුවෙකුගේ හෝ ගැනුදරුවෙකුගේ හෝ විඥානය සිඳීගියේ නම් විඥානය

විනාශවූ කල ඔවුහු හැදීමට වැඩීමට පැමිණෙන්නාහුදැයි' ඇසූහුවෝය.

"ස්වාමීන්වහන්ස, මේ කාරණය නොවේමය."

"ආනන්දය, එබැවින් මෙහි යම් මේ විඥානයෙක් වේනම් නාමරූපයට මෙයම හේතුවෙයි. මෙයම මූලකාරණය වෙයි. මෙයම (සමුදය) හටගන්නා හේතුව වෙයි. මෙයම ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) වේයයි" කීවෝය.

22 "නාම රූප ප්‍රත්‍යය (අවශ්‍ය කරුණ) කොටගෙන විඥානය වේයයි මෙසේ මෙය කියනලදී ආනන්දය, යම්සේ නාම රූප දෙක ප්‍රත්‍යය කොටගෙන විඥානය පවතීද ඒ කාරණයද මේ ආකාරයෙන් දතයුතු, ආනන්දය, මෙහි විඤ්ඤාණය නාම රූප දෙකෙහි පිහිට නොලබන්නේ නම් මත්තෙහි ජාති, ජරා, මරණ, දුක් රාශියේ පහළවීම කිමෙක පෙනෙන්නේදැයි" ඇසූහුවෝය.

"ස්වාමීන්වහන්ස, මේ කාරණය නොවේමය."

"ආනන්දය, එබැවින් මෙහි යම් මේ නාමරූපයක් වේනම් විඥානයට මෙයම හේතු වෙයි. මෙයම මූලකාරණය වෙයි. මෙයම (සමුදය) හටගන්නා හේතුව වෙයි. මෙයම ප්‍රත්‍යය වේයයි" කීවෝය. "ආනන්දය, විඥානය නාම රූපයට ප්‍රත්‍යය වීම නාම රූපය විඥානයට ප්‍රත්‍යය වීම යන මෙපමණකින් උපදින්නේ හෝ දිරන්නේ හෝ මැරෙන්නේ හෝ චුත වන්නේ හෝ නැවත උපදින්නේ හෝ වෙයි. මෙපමණකින් සිරිවඩ්ඪක ධනවඩ්ඪක යනාදී නාම මාත්‍රය පමණක් ඇති ව්‍යවහාරයට හේතු වේ. මෙපමණකින් ඒ ඒ අර්ථ ප්‍රකාශ කරන වචනයන්ට හේතු වෙයි. මෙපමණකින් ඒ ඒ අදහස් අඟවන නම්වලට හේතු වෙයි. මෙපමණකින් ප්‍රඥාවෙන් දත යුතු වෙයි. මෙපමණකින් සංසාර චක්‍රය පවතී. මෙපමණකින් විඥාන සහිතවූ නාම රූප දෙක මේ භවය පැණවීම පිණිස පවතී.

23. "ආනන්දය, කොපමණකින්ම ආත්මය පණවන තැනැත්තේ පණවාද යත්, ආනන්දය, යමෙක් නොවඩනලද

කසිණ නිමිත්ත ආත්මයයි ගනීද, ඔහු රූප සහිත ස්වල්ප ආත්මයක් පණවන්නේ රූප සහිතවූ මගේ ස්වල්ප ආත්ම යයි ප්‍රකාශ කරයි. ආනන්දය යමෙක් වඩනලද කසිණ නිමිත්ත ආත්මයයි ගනීද, ඔහු රූප සහිතවූ කෙලවරක් නැති ආත්මයක් ප්‍රකාශ කරන්නේ රූප සහිතවූ මාගේ කෙලවරක් නැති ආත්මයයි ප්‍රකාශ කරයි. ආනන්දය, අරූපීවූ ස්වල්ප ආත්මයක් පනවන්නේ මගේ අරූපීවූ ස්වල්ප ආත්මයයි පනවයි. ආනන්දය, අරූපීවූ අනන්ත ආත්මයක් පනවන්නේ මගේ අරූපීවූ අනන්ත ආත්මයයි පනවයි.

**24.** "ආනන්දය, ඒ සතරදෙනාගෙන් යම් කෙනෙක් රූප සහිතවූ ස්වල්පවූ ආත්මයක් ප්‍රකාශ කරමින් පණවාද ඔහු මෙලොව පමණක් ඇති පරලොවට නොයන රූප සහිතවූ ස්වල්ප ආත්මයක් හෝ ප්‍රකාශ කරමින් පණවයි. පරලොවට යන්නාවූ රූප සහිතවූ ස්වල්ප ආත්මයක් හෝ පණවයි. කෙසේදයත්, ඔවුනොවුන් ඔවුනොවුන්ගේ (විද්‍යමාන) සත්‍ය නොවූවක් සත්‍යබවට පමුණුවන්නෙමියි කියායි.

"ආනන්දය, මෙවැනිවූ මේ රූප කසිණ ලාභී පුද්ගලයා කෙරෙහි ස්වල්පවූ ආත්මයක් ඇත යන දෘෂ්ටිය සන්තානගතව ඇත්තේයයි කීමට සුදුසුයයි" කීවෝය.

"ආනන්දය, ඒ සතර දෘෂ්ටිකයන් අතුරෙන් යම් කෙනෙක් රූප සහිතවූ අවසානයක් නැති ආත්මයක් ප්‍රකාශ කරන්නේ පනවාද, ඔහු මෙලොව පමණක් ඇති පරලොවට නොයන රූප සහිතවූ අවසානයක් නැති ආත්මයක් හෝ ප්‍රකාශකරමින් පණවයි, පරලොවට යන රූප සහිත කෙළවරක් නැති ආත්මයක් හෝ ප්‍රකාශකරමින් පණවයි. කෙසේද? ඔවුනොවුන් ඔවුනොවුන්ගේ (විද්‍යමානනොවූ) සත්‍යයක් සත්‍ය බවට පමුණුවන්නෙමියි" කියායි.

"ආනන්දය, මෙවැනි මේ රූප කසිණලාභි පුද්ගලයා කෙරෙහි කෙළවරක් නැතිවූ ආත්මයක් ඇත යන ඇදහීම (දැකීම) සන්තානගතව නොනැසී පවතීය යන මෙය කීමට සුදුසුයයි" කීවෝය.

"ආනන්දය, ඒ දෘෂ්ටිකයන් සතරදෙනා අතුරෙන් යම් කෙනෙක් රූපනැත්තාවූ ස්වල්පවූ ආත්මයක් ප්‍රකාශ කරන්නේ පණවාද, ඔහු මෙලොව පමණක් ඇති රූප නැත්තාවූ ස්වල්ප ආත්මයක් හෝ ප්‍රකාශ කරන්නේ පණවයිද, පරලොවට යන්නාවූ රූප නැත්තාවූ ස්වල්පවූ ආත්මයක් හෝ ප්‍රකාශ කරන්නේ පණවයිද, කෙසේදයත්, ඔවුනොවුන් ඔවුනොවුන්ගේ අසත්‍යයක් සත්‍ය බවට පමුණුවන්නෙමියි" කියායි.

"ආනන්දය, මෙබඳුවූ මේ අරූප ධ්‍යාන ලාභි පුද්ගලයා කෙරෙහි ස්වල්පවූ අරූප ආත්මයක් ඇත යන මේ ඇදහීම (දැකීම) සන්තානගතව නොනැසී පවතීය යන මෙය කීමට සුදුසුයයි" කීවෝය.

"ආනන්දය, ඒ ඇදහීම් ඇත්තන් අතුරෙන් යම් ඒ කෙනෙක් රූප රහිතවූ කෙළවරක් නැති ආත්මයක් ප්‍රකාශ කරන්නේ පණවාද, ඔහු මෙලොව පමණක් ඇත්තාවූ හෝ පරලොවට යන්නාවූ හෝ රූප නැත්තාවූ කෙළවරක් නැතිවූ ආත්මයක් ප්‍රකාශ කරන්නේ පණවයි. කෙසේද? ඔවුනොවුන් ඔවුනොවුන්ගේ අසත්‍යයක් සත්‍ය බවට පමුණුවන්නෙමියි" කියායි.

"ආනන්දය, මෙබඳුවූම මේ අරූප ධ්‍යානලාභි තැනැත්තා කෙරෙහි කෙළවරක් නැති ආත්මයක් ඇත යන ඇදහීම සන්තානගතව නැති නොවී පවතීයයි කීමට සුදුසු වෙයි.

"ආනන්දය, මෙපමණකින් ආත්මයක් පනවන තැනැත්තේ පණවයි."

**25** "ආනන්දය, කොපමණකින් නම් ආත්මය නො පණවන්නේ නොපණවාද, යතහොත්, ආනන්දය, රූප සහිතවූ ස්වල්ප ආත්මයක් හෝ නොපණවන්නේ රූප ඇත්තාවූ මාගේ ස්වල්පවූ ආත්මයයි ප්‍රකාශ නොකරයි.

"ආනන්දය, රූප සහිතවූ කෙළවරක් නැති ආත්මයක් ප්‍රකාශ නොකරන්නේ 'රූප සහිතවූ මාගේ කෙලවරක් නැතිවූ ආත්මයයි' ප්‍රකාශ නොකරයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ආනන්දය, රූප නැත්තාවූ ස්වල්පවූ ආත්මයක් හෝ ප්‍රකාශ නොකරන්නේ 'රූප නැත්තාවූ මාගේ ස්වල්පවූ ආත්ම යයි' ප්‍රකාශ නොකරයි. ආනන්දය, රූප නැත්තාවූ කෙළවරක් නැතිවූ ආත්මයක් හෝ ප්‍රකාශ නොකරන්නේ 'රූප නැත්තාවූ මාගේ කෙළවරක් නැති ආත්මයයි' ප්‍රකාශ නොකරයි.

**26** "ආනන්දය, යම් ඒ අයෙක් රූපවත්වූ ස්වල්පවූ ආත්මයක් හෝ ප්‍රකාශ නොකරන්නේ ප්‍රකාශ නොකරයිද, ඔහු මෙලොව පමණක් ඇති රූපවත්වූ ස්වල්පවූ ආත්මයක් හෝ ප්‍රකාශ නොකරන්නේ ප්‍රකාශ නොකරයි ද, පරලොවට යන්නාවූ රූපවත්වූ ස්වල්පවූ ආත්මයක් හෝ ප්‍රකාශ නොකරන්නේ ප්‍රකාශ නොකරයි. අසත්‍යයක් සත්‍ය බවට පමුණුවන්නෙමි යන අදහසක් ඔහුට නැත්තේය.

"ආනන්දය, මෙවැනිවූ රූපකසිණලාභී අය කෙරෙහි ස්වල්පවූ ආත්මයක් ඇත යන ඇදහීම සන්තානගතව නො පවතීයයි කීමට සුදුසුය.

"ආනන්දය ඒ ඇදහීම ඇත්තන් අතුරෙන් යම් කෙනෙක් රූපවත්වූ කෙළවරක් නැති ආත්මයක් ප්‍රකාශ නොකරන්නේ ප්‍රකාශ නොකරයිද, ඒ අය එසේ මෙලොව පමණක් ඇත්තාවූ හෝ පරලොවට යන්නාවූ හෝ රූපවත්වූ කෙළවරක් නැති ආත්මයක් ප්‍රකාශ නොකරන්නේ ප්‍රකාශ නොකරයි. ඔවුනොවුන් ඔවුනොවුන්ගේ අසත්‍ය සත්‍යබවට පමුණුවන්නෙමි යන අදහසක් ඔහුට නැත.

"ආනන්දය, මෙවැනිවූම රූපධ්‍යානලාභී පුද්ගලයා කෙරෙහි කෙළවරක් නැති ආත්මය ඇත යන මතය සන්තානගතව නොපවතී යන වචනය කීමට සුදුසුයි.

"ආනන්දය ඒ ඇදහීම ඇත්තන් අතුරෙන් යම් අයෙක් අරූපවත්වූ ස්වල්ප ආත්මයක් ප්‍රකාශ නොකරන්නේ ප්‍රකාශ නොකරයිද, ඔහු මෙලොව පමණක් ඇත්තාවූ හෝ පරලොවට යන්නාවූ හෝ අරූපවත්වූ ස්වල්ප ආත්මයක් ප්‍රකාශ නොකරන්නේ ප්‍රකාශ නොකරයි. ඔවුනොවුන් ඔවුනොවුන්ගේ අසත්‍යයක් සත්‍යබවට පමුණුවම් යන අදහසක් ඔහුට නැත.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ආනන්දය, මෙවැනිවූම අරූප ධ්‍යානලාභී තැනැත්තා කෙරෙහි ස්වල්පවූ ආත්මය යන ඇදහීම (අනුසයනය) සන්තාන ගතව පැවැත්ම නොකෙරේයයි ඒ ඇදහීම් ඇත්තා සම්බන්ධව මේ වචනය කීමට සුදුසුයි.

"ආනන්දය, එහි යම් අයෙක් අරූපවත් ආත්මයක් ප්‍රකාශ නොකරන්නේ ප්‍රකාශනොකරයිද, මෙලොව පමණක් ඇත්තාවූ හෝ පරලොවට යන්නාවූ හෝ ඒ අරූපවත්වූ කෙළවරක් නැති ආත්මයක් ප්‍රකාශ නොකරන්නේ ප්‍රකාශ නොකරයිද, ඔවුනොවුන්ට ඔවුනොවුන්ගේ අසත්‍යයක් සත්‍ය බවට පමුණුවන්නෙමි යන අදහසක් ඔහුට නැත.

"ආනන්දය, මෙවැනිවූ අරූප ධ්‍යානලාභී තැනැත්තා කෙරෙහි කෙළවරක් නැති ආත්මයක් ඇත යන ඇදහීම (අනුස්සනය) සන්තානගතව නොපවතීයයි කීමට සුදුසු වෙයි. ආනන්දය, මෙපමණකින් ආත්මයයි ප්‍රකාශ නොකරන්නේ ප්‍රකාශ නොකරයි" කීවෝය.

**27.** "ආනන්දය, කොපමණකින් නම් ආත්මය දෘෂ්ටි වශයෙන් දකින්නා දකීද යතහොත්; ආනන්දය, වේදනාව හෝ ආත්මයයි දකින්නා වේදනාව මාගේ ආත්මයයි' දකී. ආනන්දය, 'වේදනාව මගේ ආත්මය නොවෙයි, මාගේ ආත්මය නොවිඳින ස්වභාව ඇත්තේය'යයි මෙසේත් ආත්මයයි දකින්නා දකී. ආනන්දය, 'වේදනාව මාගේ ආත්මය නොවේමය, නොවිඳින ස්වභාවයද මගේ ආත්මය නොවේ. මාගේ ආත්මය විඳිනු ලබයි. මාගේ ආත්මය විඳීම ස්වභාව කොට ඇත්තේය'යයි මෙසේද ආත්මයයි දකින්නා දකී.

**28.** "ආනන්දය, එහි යමෙක් 'වේදනාව මගේ ආත්ම යයි' කියාද, ඔහුට මෙසේ කියයුතු වන්නේය. 'ඇවැත්නි, මේ මේ වේදනා තුණක් වෙත්. සැප වේදනාවය, දුක් වේදනාවය උපෙක්ෂා (සැප හෝ දුක නුවූ) වේදනාවය යන මොව්හුයි. මේ තුන් වේදනා අතුරෙන් කවර නම් වේදනාවක් ආත්ම වශයෙන් දකීදැයි' ඇසිය යුතුය. ආනන්දය, යම් කලක සැප විඳීමක් ලබාද එකල දුක් විඳීමක් නොලබයි. උපෙක්ෂා වේදනාවක් නොලබයි.

ඒ කාලයෙහි සැප විඳීමක්ම විඳී, යම් කලක දුක් විඳීමක් විඳීද එකල සැප විඳීමක් නොවිඳීමය. උපෙක්ෂා වේදනාවක් නොවිඳීමය. දුක් විඳීමක්ම විඳී. ආනන්දය, යම් කලක උපෙක්ෂා වේදනාවක් විඳීද, එකල සැප විඳීමක් නොවිඳී, දුක් විඳීමක්ද නොවිඳී. ඒ කාලයෙහි උපෙක්ෂා වේදනාවක්ම විඳී.

**29.** "ආනන්දය, සැප විඳීමද අනිත්‍යයි. (සැමදාම නොපවතී.) ඒ ඒ කාරණයන්ගෙන් රැස්වන ලද්දිය. ප්‍රත්‍යය හේතුවෙන් උපන්නීය. ගෙවීයාම ස්වභාවකොට ඇත්තීය. වැනසීම ස්වභාවකොට ඇත්තීය. නොඇලීම ස්වභාවකොට ඇත්තීය. නිරොධය (නැතිවීම) ස්වභාවකොට ඇත්තීය. ආනන්දය, දුක් විඳීමද අනිත්‍යයි. (හැමදා එකසේ නොපවනී) ඒ ඒ කාරණයන්ගෙන් රැස්වන ලද්දීය. ප්‍රත්‍යය කරණ කොට උපන්නීය. ගෙවියාම ස්වභාවකොට ඇත්තීය. වැනසීම ස්වභාවකොට ඇත්තීය. නොඇලීම ස්වභාව කොට ඇත්තීය. නිරොධය ස්වභාවකොට ඇත්තීය. ආනන්දය, දුක්ද නොවූ සැපද නොවූ විඳීමද අනිත්‍යයි ඒ ඒ කාරණයන්ගෙන් රැස්වන ලද්දීය. ප්‍රත්‍යය කරණකොට උපන්නීය. ගෙවීයාම ස්වභාවකොට ඇත්තීය. වැනසීම ස්වභාවකොට ඇත්තීය. නොඇලීම ස්වභාවකොට ඇත්තීය. නිරොධය (නැතිවීම) ස්වභාවකොට ඇත්තීය. ඒ සැප වේදනාව විඳින්නාහට මෙය මගේ ආත්මයයි සිතෙයි. ඒ සැප විඳීම නැතිවීමෙන්ම මාගේ ආත්මය පහව ගියේයයි අදහස් වෙයි. දුක් විඳීමක් විඳින්නාටද මෙය මගේ ආත්මය යයි අදහස් වෙයි. ඒ දුක් වේදනාව නැතිවීමෙන්ම මගේ ආත්මය පහව ගියේයි අදහස් වෙයි. දුක්ද නොවූ සැපද නොවූ විඳීමක් විඳින්නාහටද මෙය මාගේ ආත්මය යන අදහස වෙයි. ඒ උපෙක්ෂා වේදනාවගේ නැතිවීමෙන් මාගේ ආත්මය පහව ගියේයි අදහස වෙයි. මෙසේ ඒ පුද්ගලයා මේ ආත්මයේදීම අනිත්‍යවූ සැප දුක් වන්නාවූද ඒ දෙකින්ම මිශ්‍රවූද, ඉපදීම හා වැනසීම ස්වභාව කොට ඇතිවූවක් ආත්මයයි දකින්නේ දකී. යම් පුද්ගලයෙක් වේදනාව මගේ ආත්මයයි මෙසේ කියයිද, ආනන්දය, එහෙයින් මේ දැක්වූ කාරණයෙන්ද වේදනාව මාගේ ආත්මයයි දැකීමට සුදුසු නොවේ

**30.** "ආනන්දය, යම් ඒ කෙනෙක් වේදනාව මගේ ආත්මය නොවේමය. මගේ ආත්මය විඳින ස්වභාවයක් නැත්තේයයි මෙසේ කියයිද, ඔහු මෙසේ කියයුතු වන්නේය. ඇවැත්නි, යම් තැනක සියලු ආකාරයෙන් විඳීමක් නැත්තේද, කිමෙක්ද? එහි මම වෙමියි යන මේ අදහස වන්නේදැයි" කියායි.

"ස්වාමීනි මේ කාරණය නොවේමය."

"ආනන්දය, එහෙයින් මෙහි මේ කාරණයෙන්ද වේදනාව මගේ ආත්මය නොවේමය. මගේ ආත්මය විඳින ස්වභාව නැත්තේයයි දැකීමට සුදුසු නොවේ

**31** "ආනන්දය, යම් ඒ කෙනෙක් මෙසේ කියයිද, විඳීම මගේ ආත්මය නොවෙයි. මගේ ආත්මය නොවිඳින ස්වභාවයද නොවේ. මගේ ආත්මය විඳිනු ලබයි. මගේ ආත්මය විඳීම ස්වභාවකොට ඇත්තේය' කියායි. ඔහු මෙසේ කියයුතු වන්නේය. ඇවැත්නි, විඳීම සියලු ස්වභාවයෙන්, සියලු ආකාරයෙන් සම්පූර්ණයෙන් නිරුද්ධ (නැති) වන්නේ නම් සියලු ආකාරයෙන් විඳීම නැති කල්හි වේදනා නිරොධයෙන් ඒ විඳීම කෙරෙහි මම වෙමියි යන දැකීමක් කිමෙක්ද වන්නේ දැයි විචාළේය.

"ස්වාමීනි, මේ කාරණය නොවේමය"

"ආනන්දය, එහෙයින් මේ කාරණයෙන්ද මෙහි විඳීම මගේ ආත්මය නොවෙයි. විඳින ස්වභාවයද මගේ ආත්මය නොවෙයි. මගේ ආත්මය විඳිනු ලබයි. මගේ ආත්මය විඳීම ස්වභාවකොට ඇත්තේයයි දැකීමට සුදුසු නොවේ.

**32.** "ආනන්දය, යම් හෙයකින් භික්ෂුතෙම වේදනාව ආත්මයයි නොදකීද, නොවිඳින ස්වභාව ආත්මයයි නොදකීද, ආත්මය විඳිනු ලබයි, 'මාගේ ආත්මය විඳීම ස්වභාවකොට ඇත්තේය' කියා නොදකීද, මෙසේ නොදක්නාවූ හෙතෙමේ ස්කන්ධ සමූහයක්වූත් මේ ලෝකයෙහි රූපාදී කිසිවක් ආත්මයයි වරදවා නොගනී. එසේ නොගන්නා තැනැත්තේ කිසිවක නොඇලෙයි. නොඇලෙන්නේ තමන්ම ක්ලේශයන්ගෙන් මිදිමකෙරේ. ජාතිය (උත්පත්තිය) නැතිවිය (මඟබඹසර) උතුම්

හැසිරීම වැස නිමවන ලද්දේය, කටයුතුකොට නිමවන ලද්දේය. මේ සඳහා මෙයින් මතු කළ යුත්තක් නැතැයි දැනගනී.

"ආනන්දය, මෙසේ ක්ලේශයන් කෙරෙන් මිදුනු සිත් ඇත්තාවූ භික්ෂුවට යමෙක් සත්වයා මරණින් මතු වේයයි මෙසේ කියන්නේද, එසේ ක්ලේශයන් කෙරෙන් මිදුනාවූ යම් අර්හත් කෙනෙක් වේද, උන්වහන්සේට මෙවැනි ඇදහිල්ලක් (දැකීමක්) වේයයි කියන්ට සුදුසු නොවෙයි,' කීවෝය. සත්වයා මරණින් මතු නොවේයයි ඒ රහතන් වහන්සේට මෙවැනි ඇදහීමක් (දැකීමක්) වේයයි කියන්ට සුදුසුනොවෙයි' කීවෝය. 'සත්වයා මරණින් මතු වන්නේද නොවන්නේද නොවේයයි, ඒ රහතන් වහන්සේට මෙවැනි ඇදහීමක් (දැකීමක්) වේයයි කියන්ට සුදුසු නොවේයයි' කීවෝය 'සත්වයා මරණින් මතු නොවේමය, නොවන්නේත් නොවේයයි, ඒ රහතන් වහන්සේට මෙවැනි ඇදහීමක් (දැකීමක් වේයයි කියන්ට සුදුසු නොවෙයි' කීවෝය. ඊට හේතු කවරේදයත්? ආනන්දය, ව්‍යවහාර යම් පමණ ඇත්තේද යම්පමණ ව්‍යවහාරයට හේතු ඇත්තේද, යම් පමණ අර්ථවත් වචන ඇත්තේද, යම් පමණ (අර්ථවත් වචනවලට) හේතු ඇත්තේද, යම්පමණ පැනවීම් ඇත්තේද යම්පමණ පැනවීම්වලට හේතු ඇත්තේද, යම්පමණ නුවණ ඇත්තේද, නුවණින් බැසගත යුතු කරුණු යම් පමණ ඇත්තේද යම් පමණ සංසාරය වේද යම් පමණ සංසාර චක්‍රය පවතීද, ඒ සියල්ල උසස් ඥානයෙන් දැනගෙන භික්ෂුතෙම ක්ලේශයන් කෙරෙන් මිදුනේද, එහෙයින් ඒ සියල්ල උසස් ඥානයෙන් දැනගෙන කෙලෙසුන් කෙරෙන් මිදුනු භික්ෂුතෙම නොදනී, නොදකී රහතන් වහන්සේට මෙවැනි ඇදහීමක් (දැකීමක්) වේයයි' කියන්නට සුදුසු නොවෙයි' කීවෝය.

33 'ආනන්දය, විඥාන පිහිටන තැන් හතක් වෙත්. ආයතන (සත්ව වාසස්ථාන) දෙකක් වෙත්. ඒ විඥාන පිහිටන තැන් හත නම්, ආනන්දය, නොයෙක් ශරීර ඇත්තාවූද නොයෙක් ප්‍රතිසන්ධිවිඤ්ඤාණ ඇත්තාවූද සත්වයෝ ඇත්තාහ. එනම්, මනුෂ්‍යයෝද සමහර දෙවියෝද සමහර (විනිපාතික) සැපයෙන්

අඩුවූ ප්‍රෙතයෝද යන මොව්හුය. මේ පළමුවෙනි විඥාන පිහිටන තැනයි. ආනන්දය නොයෙක් ශරීර ඇති එක සංඥාවක් (ප්‍රතිසන්ධි විඥානයක්) ඇත්තාවූ සත්වයෝද ඇත්තාහ. එනම් ප්‍රථම ධ්‍යානයෙන් උපන්නාවූ ප්‍රථමධ්‍යාන තළ වාසී දෙවියෝයි. මේ දෙවෙනි විඥාන පිහිටන තැනයි.

"ආනන්දය, සමාන ශරීර ඇත්තාවූ නොයෙක් සංඥා (ප්‍රතිසන්ධි විඤ්ඤාණ) ඇත්තාවූ සත්වයෝ ඇත්තාහ. එනම් ද්විතීයධ්‍යාන තල වාසීවූ ආභාශ්වර දෙවියෝයි, මේ තුන්වෙනිවූ විඥාන පිහිටන තැනයි. "ආනන්දය, සමාන ශරීර ඇත්තාවූද එකක්වූ සංඥා (ප්‍රතිසන්ධි විඤ්ඤාණ) ඇත්තාවූද සත්වයෝ ඇත්තාහ. එනම් තෘතීය ධ්‍යානතලවාසී පරිත්ත සුභ, අප්පමාණ සුභ, සුභකිණ්ණක යන ශුභකීර්ණක දෙවියෝයි. මේ හතරවෙනි විඥාන පිහිටන තැනයි. ආනන්දය, සියලු ආකාරයෙන් රූප සංඥාවන්ගේ ඉක්මවීමෙන් (ප්‍රතිඝ) ගැටීම් සහිත සංඥාවන්ගේ දුරලීමෙන් නොයෙක් ආකාර සංඥාවන්ගේ සිහි නොකිරීමෙන් ආකාශය අනන්තයයි ගෙන ආකාශානඤ්චායතන භූමියට පැමිණියාවූ සත්වයෝ ඇත්තාහ. මේ පස්වෙනි විඥාන පිහිටන තැනයි. ආනන්දය, සියලු ආකාශානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි වඩා විඤ්ඤාණඤ්චායතන භූමියට පැමිණි සත්වයෝ ඇත්තාහ. මේ හයවෙනිවූ විඥාන පිහිටන තැනයි. "ආනන්දය, සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි භාවනා වඩා ආකිඤ්චඤ්ඤායතනයට පැමිණියාවූ සත්වයෝ ඇත්තාහ. මේ සත්වෙනි විඥාන පිහිටන තැනයි. අසංඥසත්ව බ්‍රහ්ම ලොකය පළමුවෙනි (ආයතනය) සත්ව වාසයවෙයි. නෙවසංඥනාසංඥායතනය දෙවෙනි (ආයතනය) සත්ව වාසය වෙයි.

**24.** "ආනන්දය, ඒ විඥාන පිහිටන තැන් හත අතුරෙන් නොයෙක් ශරීර හා නොයෙක් සංඥා ඇත්තාවූ යම් මේ ප්‍රථම විඥාන පිහිටන තැනක් වේද ඒ නම් මනුෂ්‍යයෝද සමහර දෙවියෝද සමහර (විනිපාතික) සැපයෙන් අඩු ප්‍රෙතයෝද යන මොව්හුයි.

ii "ආනන්දය, යමෙක් ඒ පළමුවැනි විඥාන පිහිටන තැන් දනීද, ඒ විඥාන පිහිටන තැන පහළවීමට හේතුව දනීද, ඒ විඥාන පිහිටන තැනේ නැතිවීම දනීද, ඒ විඥාන පිහිටන තැනේ සැපය දනීද, ඒ විඥාන පිහිටන තැනේ දෝෂය දනීද, ඒ විඥාන පිහිටන තැනින් මිදීම දනීද ඔහු විසින් ඒ විඥානය පිහිටන තැන පිළිබඳව මමය මාගේයයි ගෙන සතුටුවීම කිමෙක යුතුදැයි ඇසුවෝය."

"ස්වාමීන් වහන්ස, මේ කාරණය නුසුදුසුමය"

"ආනන්දය, යමෙක් ඒ දෙවෙනි විඥාන පිහිටන තැන දනීද, ඒ විඥාන පිහිටන තැන පහළවීමට හෙතුව දනීද, ඒ විඥාන පිහිටන තැනේ නැතිවීම දනීද, ඒ විඥාන පිහිටන තැනේ සැපය දනීද, ඒ විඥාන පිහිටන තැනේ දෝෂය දනීද, ඒ විඥාන පිහිටන තැනින් මිදීම දනීද, ඔහු විසින් ඒ විඥානය පිහිටන තැන පිළිබඳවූ මමය මාගේයයි ගෙන සතුටුවීම කුමක යුතුදැයි" ඇසුවෝය.

"ස්වාමීන් වහන්ස, මේ කාරණය නුසුදුසුමය"

"ආනන්දය, යම් කෙනෙක් ඒ තුන්වෙනි විඥාන පිහිටන තැන දනීද, ඒ විඥාන පිහිටන තැන පහළවීමට හෙතුව දනීද, ඒ විඥාන පිහිටන තැනේ නැතිවීම දනීද, ඒ විඥාන පිහිටන තැනේ සැපය දනීද, ඒ විඥාන පිහිටන තැනේ දෝෂය දනීද, ඒ විඥාන පිහිටන තැනින් මිදීම දනීද, ඔහු විසින් ඒ විඥාන පිහිටන තැන පිළිබඳව මමය මාගේයයි ගෙන සතුටුවීම කුමක සුදුසුදැයි" ඇසුවෝය.

"ස්වාමීන් වහන්ස, මේ කාරණය නුසුදුසුමය."

"ආනන්දය, යමෙක් ඒ හතරවෙනි විඥාන පිහිටන තැන දනීද, ඒ විඥාන පිහිටන තැන පහළවීමට හේතුව දනීද, ඒ විඥාන පිහිටන තැනේ නැතිවීම දනීද, ඒ විඥාන පිහිටන තැනේ සැපය දනීද, ඒ විඥාන පිහිටන තැනේ දෝෂය දනීද, ඒ විඥාන පිහිටන තැනින් මිදීම දනීද, ඔහු විසින් ඒ විඥාන පිහිටන තැන

පිළිබඳව මමය මාගේයයි ගෙන සතුටුවීම කුමක සුදුසුදැයි” ඇසුවෝය.

“ස්වාමීන් වහන්ස, මේ කාරණය නුසුදුසුමය.”

“ආනන්දය, යමෙක් ඒ පස්වෙනි විඥාන පිහිටන තැන දනීද ඒ විඥාන පිහිටන තැන පහළවීමට හෙතුව දනීද, ඒ විඥාන පිහිටන තැනේ නැතිවීම දනීද, ඒ විඥාන පිහිටන තැනේ සැපය දනීද, ඒ විඥාන පිහිටන තැනේ දෝෂය දනීද, ඒ විඥාන පිහිටන තැනින් මිදීම දනීද, ඔහු විසින් ඒ විඥාන පිහිටන තැන පිළිබඳව මමය මාගේයයි ගනිමින් සතුටුවීම කුමක සුදුසුදැයි” ඇසුවෝය.

“ස්වාමීන් වහන්ස, මේ කාරණය නුසුදුසුමය.’

“ආනන්දය, යමෙක් ඒ හයවෙනි විඥාන පිහිටන තැන දනීද, ඒ විඥාන පිහිටන තැන පහළවීමට හෙතුව දනීද, ඒ විඥාන පිහිටන තැනේ විනාශය දනීද, ඒ විඥාන පිහිටන තැනේ සැපය දනීද, ඒ විඥාන පිහිටන තැනේ දෝෂය දනීද, ඒ විඥාන පිහිටන තැනින් මිදීම දනීද, ඔහු විසින් ඒ විඥාන පිහිටන තැන පිළිබඳව මමය මාගේයයි ගනිමින් සතුටුවීම කුමක සුදුසුදැයි” ඇසුවෝය.

“ස්වාමීන් වහන්ස, මේ කාරණය නුසුදුසුමය.”

“ආනන්දය, යමෙක් ඒ හත්වෙනි විඥාන පිහිටන තැන දනීද, ඒ විඥාන පිහිටන තැන පහළවීමට හෙතුව දනීද, ඒ විඥාන පිහිටන තැනේ විනාශය දනීද, ඒ විඥාන පිහිටන තැනේ සැපය දනීද, ඒ විඥාන පිහිටන තැනේ දෝෂ දනීද, ඒ විඥාන පිහිටන තැනින් මිදීම දනීද, ඔහු විසින් ඒ විඥාන පිහිටන තැන පිළිබඳව මමය මාගේයයි ගැනීම කුමක සුදුසුදැයි” ඇසුවෝය.

“ස්වාමීන් වහන්ස, මේ කාරණය නුසුදුසුමය.”

“ආනන්දය, ඒ විඥාන පිහිටන තැන් හත අතුරෙන් යම් මේ සත්වෙනි විඥාන පිහිටන තැනක්වේද, එනම් සියලු ආකාරයෙන් විඥානඤ්චායතන ධ්‍යානය ඉක්මවා කිසිවක්

නැතැයි නාස්තිභාව ප්‍රඥප්තිය වඩා ආකිඤ්චඤ්ඤායතන ලොකයට පැමිණියාවූ දෙවියෝ වෙත්ද,

"ආනන්දය, යමෙක් එය දනීද, ඊට හෙතුවත් දනීද එහි විනාශයත් දනීද, එහි සැපයත් දනීද, එහි දෝෂයත් දනීද, එයින් මිදීමක් දනීද, ඔහු විසින් එය මමය මාගේයයි ගෙන සතුටුවීම කුමක සුදුසුදැයි" ඇසුවෝය.

"ආනන්දය, ඒ සත්වාවාස අතුරෙන් අසඤ්ඤසත්තායතන නම්වූ යම් සිත නැති බඹලොවක් වේද, ආනන්දය, යමෙක් එය දනීද, ඊට හෙතුවත් දනීද, එහි විනාශයත් දනීද, එහි සැපයත් දනීද, එහි දෝෂයත් දනීද, එයින් මිදීමක් දනීද, ඔහු විසින් එය මමය මාගේයයි ගෙන සතුටුවීම කිමෙක සුදුසුදැයි" ඇසුවෝය.

"ස්වාමීන් වහන්ස, මේ කාරණය නුසුදුසුය."

"ආනන්දය, ඒ සත්වාවාසයන් අතුරෙන් නෙවසඤ්ඤා නාසඤ්ඤායතන නම් සිත ඇතැයිද නොකියයුතු නැතැයිද නොකියයුතු යම් බඹලොවක් ඇත්තේද ආනන්දය, යමෙක් එය දනීද ඊට හෙතුවත් දනීද, එහි විනාශයත් දනීද, එහි සැපයත් දනීද, එහි දෝෂයත් දනීද, එයින් මිදීමත් දනීද, ඔහු විසින් එය මමය මාගේයයි ගෙන සතුටුවීම කිමෙක යුතුදැයි" ඇසුවෝය.

"ස්වාමීන් වහන්ස, මේ කාරණය නුසුදුසුමය."

"ආනන්දය, යම් කලක භික්ෂු තෙම මේ විඥාන පිහිටි තැන් හතේද මේ දෙකක්වූ ආයතනයන්ගේද පහළවීමට හේතුවද, විනාශයද, සැපයද, මිදීමද, ඇතිසැටියෙන් දැන කෙලෙසුන් කෙරෙන් මිදුනේ වේද, ආනන්දය, මේ භික්ෂු තෙම ප්‍රඥාව හේතුකොටගෙන කෙලෙසුන් කෙරෙන් මිදුනේ යයි" කියනු ලැබේ.

**35.** "ආනන්දය, මේ විමොක්ෂ ධර්ම (සතුරු ධර්ම කෙරෙන් මිදීම්) අටක් වෙත්. කවර නම් අටක්ද යත් තමාගේ හිස කෙස්වල වර්ණාදියෙන් ලබනලද නීල කසිණාදියෙන් උපදවා ගත් රූප ධ්‍යාන ඇත්තෙක්ව බාහිර රූපයන් දකීද මේ පළමුවැනි

විමොක්ෂය (සතුරු ධර්මවලින් මිදීම) යි. තමාගේ හිස කෙස් ආදියේ වර්ණයෙන් උපදවාගත් රූප ධ්‍යාන නැත්තෙක්ව බාහිර රූපයන් දකීද මේ දෙවෙනි විමොක්ෂය (සතුරු ධර්මවලින් මිදීම) යි. පිරිසිදුවූ නීලාදී කසිණයක් අරමුණු කොට වාසය කරයිද මේ තුන්වැනි විමොක්ෂය (මිදීම) යි සියලු ආකාරයෙන් රූප හැඟීම් ඉක්මවා ගැටීම් සහිත හැඟීම් දුරු කිරීමෙන් නොයෙක් සංඥා නොමෙනෙහි කිරීමෙන් අනන්ත ආකාශය අරමුණුකොට ආකාසානඤ්චායතන ධ්‍යානයට පැමිණ වාසය කරයිද මේ සතරවැනි විමොක්ෂය (මිදීම) යි. සියලු ආකාරයෙන් අනන්ත ආකාශය ඉක්මවා එම අනන්තවිඤ්ඤාණය අරමුණුකොට විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයට පැමිණ වාසය කරයිද මේ පස්වැනි විමොක්ෂය (මිදීම) යි. සියලු ආකාරයෙන් අනන්තවිඤ්ඤාණය ඉක්මවා ඒ විඤ්ඤාණයාගේ කිසිවක් නැති බව අරමුණුකොට ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයට පැමිණ වාසය කරයිද මේ හයවැනි විමොක්ෂය (මිදීම) යි සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යානයට පැමිණ වාසයකරයිද, මේ සත්වැනි විමොක්ෂය (මිදීම) යි. සියලු ආකාරයෙන් නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය ඉක්මවා චිත්ත චෛතසිකයන්ගේ නිරොධයට (නිරොධ සමාපත්තියට) පැමිණ වාසය කරයි. මෙය අටවැනි විමොක්ෂය (මිදීම) යි. ආනන්දය, මේ වනාහි අටවැදෑරුම් විමොක්ෂයෝයි.

"ආනන්දය, භික්ෂුතෙමේ මේ විමොක්ෂ අටට මුල සිට අග දක්වාද සමවදියි (පැමිණ වාසය කරයි) අග සිට මුල දක්වාද සමවදියි. මුල සිට අග දක්වාද අග සිට මුල දක්වාද සමවදියි. කැමති තැනක කැමති සමාපත්තියකට කැමතිතාක් කල් සමවදින්නේද වෙයි. නැගිටින්නේද වෙයි. ආශ්‍රව ධර්මයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව නැති සමාධි සිතින් විදීමද ප්‍රඥාවෙන් මිදීම වන අර්හත්ඵලය ඉහාත්මයෙහිම තම විශෙෂ ඥානයෙන් අවබොධ කොට ඊට පැමිණ වාසයකරයි. ආනන්දය, මේ භික්ෂුව අරූප සමාපත්තිය කරණකොට ගෙන රූප කයින්ද මාර්ගය කරණකොට ගෙන නාම කයින්ද යන දෙකොටසින් මිදුණු

(උභතොභාග විමුක්ත) පුද්ගලයා යයි කියනුලැබේ. මේ නාම රූප දෙපසින් මිදීමට වඩා උතුම්වූද ප්‍රණීතවූද අන් මිදීමක් නම් නැත්තේය.

භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය දෙශනා කළෝය. සතුටු සිත් ඇත්තාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ දෙශනාව සතුටින් පිළිගත්තේය.

පසළොස් වෙනි වූ මහා නිදාන සූත්‍රය මෙයින් නිමියේය.

---

## 16 මහා පරිනිර්වාණ සූත්‍රය

1 මා විසින් මෙසේ අසනලදී. (මාගේ ඇසීම මෙසේය.) එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ගිජ්ජකූට නම් පර්වතයෙහි වාසය කරණසේක. ඒ කාලයෙහි මගධ රටට අධිපති වෙදෙහි නම් දේවියගේ පුත්‍රවූ අජාසත් රජතෙමේ වැදෑ රට රජුන් යටත් කර ගැනීමට යනු කැමැත්තේ වේ. ඒ අජාසත් රජතෙමේ මෙසේ කියයි. 'මම වනාහි මහත් ඍද්ධි ඇත්තාවූ මහත් ආනුභාව ඇත්තාවූ මේ වැදෑ රජුන් නැති කර දමන්නෙමියි යනුයි.'

2 එවිට මගධරට රජවූ විදෙහ දේවියගේ පුත්‍ර අජාසත් රජ මගධරට මහාමාත්‍යවූ වස්සකාර බ්‍රාහ්මණයාට කථාකර මෙසේ කීයේය. "බ්‍රාහ්මණය, මෙහි එනු, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට යව, ගොස් මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් හිසින් වඳුව. වැඳ, උන්වහන්සේගේ නිරොගි බවද, නිදුක් බවද, සැහැල්ලු පැවතුම් ඇතිබවද, ශරීර බලයද, පහසු විහරණයද විචාරව. නැවතද, "ස්වාමීන්වහන්ස, මගධරට රජවූ වෙදෙහ දේවියගේ පුත්‍ර අජාසත් රජතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ සිරිපා හිසින් වඳී. භාග්‍යවතුන් වහන්සේගේ නිරොගි බවද, නිදුක් බවද, සැහැල්ලු පැවතුම් ඇති බවද, ශරීර බලයද, පහසු විහරණයද, විචාරායයි" දන්වව. තවද මෙසේ කියව. "ස්වාමීන් වහන්ස, (මගධරට රජවූ වෙදෙහි දේවියගේ පුත්‍රවූ අජාසත් රජතෙමේ වැදෑරජුන් යටත්කරගන්නට

යනු කැමැත්තේ වේ. ඒ අජාසත් රජතෙමේ මෙසේ කියයි "මම මහත් සෘද්ධි ඇත්තාවූද, මහත් ආනුභාව ඇත්තාවූද මේ වැදැරජුන් සම්පූර්ණයෙන් සිඳ දමන්නෙමි. වැදැරජුන් වනසන්නෙමි. වැදැරජුන් නැතිකර දමන්නෙමි" යනුයි. භාග්‍යවතුන් වහන්සේ තොපට යම්පරිද්දෙකින් ප්‍රකාශකරන සේක්ද, ඒ ප්‍රකාශ කළ පරිදිම මනාකොට ඉගෙන මට කියව. තථාගතයන්වහන්සේලා අවැඩට හිතවූ හිස් වචනයක් නොවදාරන්නහුයයිද" කීයේය.

3 "පින්වතුන් වහන්ස, එසේ යහපතැයි' මගධ මහාමාත්‍ය වස්සකාර බ්‍රාහ්මණයා මගධරට රජවූ විදෙහ දේවියගේ පුත්‍රවූ අජාසත් රජහට උත්තරදී යහපත් යහපත් යානාවන් යොදවා යහපත් යහපත් යානාවකට නැගී යහපත් යහපත් යානාවලින් රජගහ නුවරින් පිටත්විය. පිටත්ව, ගිජ්ජකූට පර්වතය යම්තැනකද එතැනට ගියේය. යානාවෙන් යායුතු භූමිය දක්වා යානාවෙන් ගොස් යානාවෙන් බැස, එතැන් සිට පයින්ම භාග්‍යවතුන් වහන්සේ වැඩසිටින තැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ සමඟ සතුටු වූයේය. සතුටු වියයුතුවූද සිහිකටයුතුවූද කථාව නිමකොට එකපැත්තක උන්නේය. එකපැත්තක උන්නාවූ මගධ මහාමාත්‍යවූ වස්සකාර බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දැනුම්දුන්නේය. "පින්වත් ගෞතමයන්වහන්ස, මගධරට රජවූ වේදෙහි දේවියගේ පුත්‍රවූ අජාසත් රජතෙමේ පින්වත් ගෞතමයන් වහන්සේගේ පාදයන් හිසින් වඳී. වැඳ භාග්‍යවතුන් වහන්සේ දුක් නැතුව නිරොගිව, සැහැල්ලු පැවතුම් ඇතිව, ශරීර බල ඇතුව, සැප පහසු ඇතුව, වෙසේ දැයි" අසයි. "භවත් ගෞතමයන් වහන්ස, (මගධරට රජවූ වෙදෙහි දෙවියගේ පුත්‍රවූ අජාසත් රජතෙම වැදැරජුන් යටත් කර ගන්නට යනු කැමැත්තේවේ. ඒ රජතෙමේ මෙසේද කියයි. 'මහත් සෘද්ධි ඇත්තාවූද මහත් ආනුභාව ඇත්තාවූද මේ වැදැරජුන් සම්පූර්ණයෙන් සිඳ දමන්නෙමි. වැදැරජුන් නසන්නෙමි, වැදැරජුන් නැතිකර දමන්නෙමි' කියායි"

4 ඒ කාලයේදී ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට පවන් සලමින් භාග්‍යවතුන් වහන්සේගේ පිටිපස

වැඩ උන්නේය, එවිට භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට කථාකොට, 'ආනන්දය, වැදැරජහු නිතර රැස්වන්නාහුය, රැස්වීම් බහුලව ඇත්තාහුය යන මේ කාරණය කිමෙක තොප විසින් අසන ලදදැයි" ඇසූසේක. "ස්වාමීන් වහන්ස, වැදැරජහු නිතර රැස්වීම් ඇත්තාහුය. රැස්වීම් බහුලව ඇත්තාහුය යන මේ කාරණය මා විසින් අසනලදී.

"ආනන්දය යම්තාක් කල් වැදැරජහු නිතර රැස්වීම් ඇත්තාහු රැස්වීම් බහුලව ඇත්තාහුද, ආනන්දය, ඒ වැදැ රජුන්ගේ වැඩිදියුණුවම කැමැතිවිය යුතුයි. පිරිහීමක් නොවේමය.

"ආනන්දය වැදැරජහු සමගිව රැස්වෙත්ද, සමගිව නැගීසිටිත්ද, වැදැරජහු සමගිව කටයුතු කෙරෙත්ද යන මේ කාරණය තා විසින් කිමෙක අසනලදදැයි' ඇසූසේක. "ස්වාමීන් වහන්ස, වැදැරජහු සමගිව වෙසෙත්. සමගිව නැගී සිටිත්, වැදැරජහු සමගිව කටයුතු කරත් යන බව මා විසින් අසන ලද්දේය"

"ආනන්දය, යම්තාක් කල් වැදැ රජහු සමගිව රැස්වන්නාහුද, සමගිව නැගීසිටිත්නාහුද, වැදැරජහු සමගිව කටයුතු කරන්නාහුද ආනන්දය, ඒතාක් වැදැරජුන්ගේ වැඩිදියුණුවම කැමතිවිය යුතු, පිරිහීමක් නම් නොවේමයයි" වදාළසේක

"වැදැරජහු නොපණවන ලද අලුත් නීති නොපණවත්ද පණවනලද නීති කඩනොකරත්ද, පණවනලද පුරාණ වජ්ජි රාජධර්මයන් දැඩිසේ ගෙන පිළිපදිද්ද, යන මේ කාරණය තා විසින් කිමෙක අසන ලදදැයි" අසූසේක. "ස්වාමීන් වහන්ස, වැදැරජහු නොපණවන ලද්දක් නොපණවත්ය. පණවන ලද්දක් කඩ නොකෙරෙත්ය. පණවනලද වජ්ජිරාජ ධර්මයන් පිළිගෙන ඒ අනුව පිළිපදිත්ය, යන මේ කාරණය මා විසින් අසනලදී" "ආනන්දය, යම්තාක් කල් වැදැරජහු නොපණවනලද නීති නොපණවන්නාහුද පණවන ලද්දක් කඩ නොකරන්නාහුද පණවනලද වජ්ජි රාජධර්මයන් පිළිගෙන ඒ අනුව පවත්නාහුද, ආනන්දය, ඒ වැදැරජුන්ගේ වැඩි දියුණුවම කැමතිවිය යුතුය පිරිහීමක් නොවේයයි" කීවෝය. "ආනන්දය, වැදැරජහු ඔවුන්ගේ

යම් ඒ මහලු වැදැරජහු වෙත්ද, ඔවුන්ට සත්කාර ගරු බුහුමන් කෙරෙත්ය, ඔවුන් හට වඳින්නාහුය, ඔවුන්ගේ අනුශාසනාදිය ඇසිය යුතුම යයි සිතන්නාහුය, යන මේ කාරණය තා විසින් කිමෙක නම් අසනලද දැයි" ඇසූසේක. "ස්වාමීන්වහන්ස, වැදැරජහු වැදෑරජුන්ගේ යම් ඒ වැඩිමහලු අය වෙත්ද ඔවුන්හට සත්කාර කෙරෙත්ය, ගරු කෙරෙත්ය, බුහුමන් කෙරෙත්ය, ඔවුන් පුදත්ය, ඔවුන්ගේ අනුශාසනාදිය ඇසියයුතු කොටම සිතත්ය." යන මේ කාරණය මා විසින් අසන ලද්දේය.

"ආනන්දය, යම්තාක් කාලයක් වැදෑරජහු ඔවුන්ගේ ඒ වැඩිමහලු අය වෙත්ද ඔවුන්ට සත්කාර කරන්නාහුද ගරු කරන්නාහුද, බුහුමන් කරන්නාහුද, ඔවුන් පුදන්නහුද, ඔවුන්ගේ අනුශාසනාදියක් ඇසිය යුතු ලෙසම සිතන්නාහුද, ඒ තාක් වැදැරජුන්ගේ වැඩිදියුණුව බලාපොරොත්තු විය යුතුය. පිරිහීමක් නොවන්නේයයි" කීවෝය.

"ආනන්දය, වැදැරජහු පුරුෂාන්තර ගතවූ (විවාහවූ) යම් ඒ කුලස්ත්‍රීහු වෙත්ද, විවාහ නොවූ යම් ඒ කුල කුමරීහු වෙත්ද, ඔවුන්ට බලාත්කාරකම් නොකරත්ය යන මේ කාරණය තා විසින් කිමෙක නම් අසනලද්දේද?" 'ස්වාමීන් වහන්ස, වැදැරජවරු ඒ කුලයන් අතරට ගිය ස්ත්‍රීහු වෙත්ද, යම් ඒ කුල කුමරීහු වෙත්ද ඔවුන්හට බලාත්කාරකම් නොකරත්ය යන මේ කාරණය මා විසින් අසන ලද්දේය. ආනන්දය, යම්තාක් කල් ඒ වැදැරජහු යම් ඒ කුල ස්ත්‍රීහු වෙත්ද, යම් ඒ කුල කුමාරීහු ඇද්ද, ඔවුන්ට බලාත්කාරකම් නොකරන්නාහුද, ආනන්දය, ඒතාක් වැදැ රජුන්ගේ දියුණුවම කැමතිවිය යුතුය, පිරිහීමක් නොවේම යයි" කීවෝය.

"ආනන්දය, වැදැරජහු ඔවුන්ගේ නුවර ඇතුලතවූ හෝ නුවරින් පිටත්වූ හෝ දේවාලයයි සම්මත ඒ වජ්ජි චෛත්‍යයෝ ඇද්ද ඒ චෛත්‍යාදීන්ට සත්කාර කෙරෙත්ය. ගරු කෙරෙත්ය බුහුමන් කෙරෙත්ය. ඒ චෛත්‍යයන් පුදත්ය කියාද, ඒ චෛත්‍යාදීන්ට පෙර දුන්නාවූද, පෙර කරණ ලද්දාවූද, ධාර්මික බිලිපූජා නොපිරිහෙලා කරත්ය යන මේ කරුණ තා විසින්

කිමෙක අසන ලද්දේදැයි” ඇසූසේක. “ස්වාමීන්වහන්ස, වැදැරජවරු ඔවුන්ගේ නුවර ඇතුලත තිබෙන්නාවූද නුවරින් පිටත පිහිටියාවූද ඒ සියලුම වජ්ජි චෛත්‍යයයෝ වෙත්ද ඒ සියල්ලටම ඔවුන් උපකාර කෙරෙත්ය, ගරු කෙරෙත්ය, බුහුමන් කෙරෙත්ය, ඔවුහු ඒ චෛත්‍යයන්ට පුදත්ය ඉහතකී කාලයෙහි දුන්නාවූද එසේම කරණ ලද්දාවූද ඒ ධාර්මික බිලිපූජා කඩ නොකොට ඉෂ්ට කෙරෙත්ය යන මේ කරුණ මා විසින් අසනලදීයයි “උත්තර දුන්නේය” ආනන්දය, යම්තාක් මේ වැදැරජහු ඔවුන්ගේ නුවර ඇතුලත හෝ එයින් පිටත පිහිටියාවූ යම් ඒ චෛත්‍යාදීන්ට නොකඩකොට සත්කාර ගරු බුහුමන් කරන්නාහුද පූජාකෙරෙත්ද ඒ චෛත්‍යාදීන්ට පුරාණ කාලයෙහි රජුන් විසින් දෙනලද්දාවූද කරනලද්දාවූ ධාර්මික බිලි පූජාදිය නොපිරිහෙළා කරන්නාහුද, ආනන්දය, ඒ තාක් වැදැරජුන්ගේ දියුණුවම බලාපොරොත්තු විය යුතුය. පිරිහීමක් නොවේමයයි” කීවෝය.

“ආනන්දය, ඒ වැදැ රජුන්ගේ වැඳුම් පිදුම් කිරීමට සුදුසුවූ මහණ බමුණන් නිවැරදි අන්දමින් ආරක්ෂාව යහපත් ලෙස පිහිටුවන ලද්දේය කියාද, කිමෙක්ද නොපැමිණියාවූ, සිල්වත් ගුණවත් මහණ බමුණෝ තමන්ගේ රටට වන්නාහුයයි කියාද, පැමිණියාවූ මහණ බමුණෝ සැපසේ වාසය කරන්නාහුය කියාද, තාවිසින් අසන ලද්දේ දැයි” ඇසූසේක.

“ස්වාමීන් වහන්ස, වැදැ රජවරුන් සිල්වත් ගුණවත් මහණ බමුණන් කෙරෙහි නිවැරදි අන්දමින් ආරක්ෂාව මනාකොට පිහිටුවන ලද්දීයයිද පෙර නොපැමිණියාවූ මහණ බමුණෝ තම රටට එන්නාහුය කියාද, පැමිණියාවූ මහණ බමුණෝ තමන්ගේ රටෙහි සැපසේ වෙසෙත්යයි කියාද මේ කාරණය මා විසින් අසනලදීයයි” පිළිතුරු දුන්නේය.

“එසේ නම් ආනන්දය, යම්තාක් කාලයක් වැදැ රජුන්ගේ මහණ බමුණන් කෙරෙහි නිවැරදි ආරක්ෂාව පිහිටුවන ලද්දී වන්නීද කිමෙක්ද පෙර නොපැමිණියාවූ මහණ බමුණෝ සිය රටට එන්නාහුද, පැමිණියාවූ මහණ බමුණෝ තමන්ගේ රටෙහි

සැපසේ වසන්නාහුද, ආනන්දය ඒ වැදෑ රජවරුන්ගේ දියුණුවම කැමතිවිය යුත්තේය. පිරිහීමක් නොවේයයි" කීවෝය.

**5.** ඊට පසුව ටික වේලාවකින් භාග්‍යවතුන් වහන්සේ මගධ දෙශයෙහි මහාමාත්‍ය ධුරය දරණ වස්සකාර නම් බ්‍රාහ්මණයාට කථාකොට, "බ්‍රාහ්මණය, මම එක කාලයක විසාලා මහනුවර සාරන්දද නම් යක්ෂයාගේ වාසස්ථානයෙහි කළ චෛත්‍යයෙහි වාසය කෙළෙමි. මම එහිදී මේ වැදෑ රජුන්හට පිරිහීමක් නොවන කරුණු හතක් දේශනා කෙළෙමි. බ්‍රාහ්මණය, යම්තාක් කල් මේ නොපිරිහීමට හේතුවන කරුණු සත වැදෑ රජුන් අත තිබෙයිද වැදෑ රජහු මේ නොපිරිහෙන ධර්ම සතෙහි යහපත් ලෙස පිහිටත්ද පිහිටන බවක් දක්නා ලැබෙත්ද, බ්‍රාහ්මණය, ඒ වැදෑ රජුන්ගේ වැඩි දියුණුවම කැමතිවිය යුතුය. පිරිහීමක් නොවේයයි වදාළසේක. මෙසේ වදාළ කල්හි මගධ රටෙහි මහාමාත්‍යවූ වස්සකාර බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දැන්වූයේය. කිමෙක්දයත්? "භවත් ගෞතමයන් වහන්ස, ඒ එකි එකී නොපිරිහිමට හේතුවන කරුණින් යුක්තවූ වැදෑ රජුන්ගේ අභිවෘද්ධියම බලාපොරොත්තු විය යුත්තීය. පිරිහීමක් නොවෙයි. ඒ කරුණු හතෙන්ම යුක්ත නම් කියනුම් කවරේද? භවත් ගෞතමයන් වහන්ස, මගධ රට රජවූ වෙදෙහි දේවියගේ පුත්‍ර අජාසත් රජ විසින් වැදෑ රජුන් සමග රන්රිදී ආදී වස්තුව යවා සංග්‍රහ කිරීමක් නැතිව ඔවුනොවුන්ගේ සමගිය නොබිඳ යුද්ධ නොකටයුතුයි භවත් ගෞතමයන් වහන්ස අපි බොහෝ කටයුතු ඇත්තෝ වෙමු අවශ්‍ය කටයුතු ඇත්තම්හ එබැවින් දැන් අපි යම්හයි" කීයේය. එවිට භාග්‍යවතුන් වහන්සේ "බ්‍රාහ්මණය, දැන් තෝ යමක් පිළිබඳව සුදුසු කාල යයි දන්නෙහි නම් හෙවත් ඒ ගමන යන්නයයි අවසර දුන්සේක. ඊට පසුව මගධ මහාමාත්‍ය වස්සකාර බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනයට ප්‍රීතිය ප්‍රකාශ කොට අනුමෝදන්ව හුනස්නෙන් නැගිට යන්ට ගියේය

**6.** මගධ මහාමාත්‍ය වස්සකාර බ්‍රාහ්මණයා බැහැර ගිය නොබෝ වේලාවකින් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට කථාකළෝය.

කථාකර, "ආනන්දය, ඔබ යව, රජගහ නුවර ඇසුරු කොට යම් පමණ භික්ෂූහු වාසය කෙරෙත්ද ඒ සියලු භික්ෂූන් උපස්ථාන ශාලාවෙහි රැස්කරවයි" කීවෝය.

"ස්වාමීන් වහන්ස, එය යහපතැයි" කියා ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට උත්තර දී යම් පමණ භික්ෂූහු රජගහ නුවර ඇසුරුකොට වැඩ වෙසෙත්ද, ඒ සියලු භික්ෂූන් උපස්ථාන ශාලාවට රැස්කරවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතනට ගොස් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක සිටියේය. එකත් පසෙක සිටියාවූ ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීවේය. "ස්වාමීන් වහන්ස, භික්ෂු සංඝයා රැස් කරවන ලද්දේය. භාග්‍යවතුන් වහන්සේ දැන් යමක් සම්බන්ධව කල් දන්නාසේක් නම් ඊට සුදුසු කාලයයි සැල කළේය. ටිකවේලාවකින් භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටි ආසනයෙන් නැගිට උපස්ථාන ශාලාව යම් තැනෙක්හිද එතනට එළඹියෝය එළඹ පණවන ලද ආසනයෙහි වැඩ සිටියහ. වැඩහිඳ භික්ෂූන්ට කථාකර, "මහණෙනි, මේ අපරිහාණීය. (නොපිරිහෙන කරුණු) ධර්ම සතක් දෙශනා කරන්නෙමි. එය අසව්. යහපත් ලෙස සිත්හි දරාගනිව් කියන්නෙමියි" කීවෝය. ස්වාමීන් වහන්ස, එය යහපතැයි" භික්ෂූහු උන්වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය දෙශනා කළ සේක.

"මහණෙනි, යම්තාක් කල් භික්ෂූන් නිතර රැස්වන්නාහු වෙත්ද බොහෝ සෙයින් රැස්වන්නාහු වෙත්ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියක්ම කැමති විය යුතුයි. පිරිහීමක් නොවේයයි' කීවෝය, 'මහණෙනි, භික්ෂූහු යම්තාක් කාලයක් සමගිව රැස්වන්නාහු වෙත්ද සමගිව නැගී සිටින්නාහුද සමගිව සංඝයා විසින් කටයුතුවූ පොහෝකිරීම් ආදි කර්මකරන්නාහුද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩිදියුණුවක්ම කැමති විය යුත්තේය. පිරිහීමක් නොවේයයි" දේශනා කළෝය.

"මහණෙනි, යම්තාක් කාලයක් භික්ෂූන් තථාගතයන් වහන්සේ විසින් නොපණවණ ලද්දක් නොපණවයිද පණවන

ලද ශික්ෂා ධර්මය කඩ නොකරන්නාහුද පණවන ලද පරිදිවූ ශික්ෂා පදයන් සමාදන්ව නොපිරිහෙලා රක්නාහුද, මහණෙනි, ඒ භික්ෂුන්ගේ වැඩිදියුණුවක්ම කැමති විය යුත්තේය. පිරිහීමක් නොවේයයි" කීවෝය.

"මහණෙනි, බොහෝ දවස්ගැන දන්නාවූ පැවිදිවූ බොහෝ කල් ඇති සංඝයාගේ පිය තනතුරෙහි සිටියාවූ සංඝයා ඒ ඒ සාසන වැඩවලට පමුණුවන හෙයින් සංඝනායකවූ ඒ ස්ථවිර භික්ෂූහු වෙත්ද, උන්වහන්සේලාට සත්කාර ගරුබුහුමන් කරන්නාහුද උන්වහන්සේලා පුදන්නාහුද උන්වහන්සේලාගේ ධර්මානුසාසනාදිය ඇසිය යුතු ලෙසම සිතන්නාහුද, මහණෙනි, ඒ භික්ෂුන්ගේ වැඩි දියුණුව කැමති විය යුත්තේය. පිරිහීමක් නොවේයයි" කීවෝය.

"මහණෙනි, භික්ෂූහු යම්තාක් කල් නැවත ඉපදීම ඇති කරන්නාවූ උපන් තෘෂ්ණාවගේ වසඟයට නොපැමිණෙත්ද, මහණෙනි, ඒ භික්ෂුන්ගේ වැඩි දියුණුවම කැමති විය යුතුය. පිරිහීමක් නොවේයයි" දෙශනා කළෝය.

"මහණෙනි, භික්ෂූහු යම්තාක් කල් අරණ්‍යවල වාසයට කැමැත්තෙන් සිටින්නාහුද වෙද්ද, මහණෙනි ඒ භික්ෂූන්ගේ වැඩි දියුණුවක්ම වන්නේය. පිරිහීමක් නොවන්නේයයි" වදාළේය.

"මහණෙනි, භික්ෂුහු නොපැමිණියාවූ සිල්වත් සබ්‍රහ්මචාරීහු එන්නාහු නම් ඉතා යෙහෙකැයිද පැමිණියාවූ සබ්‍රහ්මචාරීහු පහසුසේ වාසයකරන්නාහුනම් ඉතා යහපතැයි තමතමන්ගේ සිත්තුළම සිහිය එළඹ සිටුවා වාසය කෙරෙත්ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියම කැමති විය යුත්තේය, පිරිහීමක් නොවන්නේයයි" කීවෝය.

"මහණෙනි, යම්තාක් කල් මේ පිරිහීම් නැති කරන ධර්ම හත භික්ෂූන් කෙරෙහි පවත්නාහුද මේ පිරිහීම නැති කරන ධර්ම හත කෙරෙහි භික්ෂූහු දක්නා ලැබෙද්ද, මහණෙනි ඒ භික්ෂූන්ගේ වැඩි දියුණුවම කැමති විය යුත්තේය. පිරිහීමක් නොවේයයි" කීවෝය.

7 "මහණෙනි, තවත් පිරිහීම නැතිකරන කරුණු සතක් දේශනා කරන්නෙමි. ඒ ධර්මයන් අසව්. යහපත් ලෙස සිත්හි දරාගනිව්. කියන්නෙමියි" කීවෝය.

"ස්වාමීන් වහන්ස, ඒ යහපතැයි" භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තරදුන්හ. උන්වහන්සේ මේ ධර්මය දෙශනා කළසේක, "මහණෙනි, භික්ෂූහු යම්තාක් කාලයක් සිවුරු පිරිකර මැසීම් හැදීම් ආදි කර්මාන්තයන්හි ඇලී වාසය නොකරද්ද, කර්මාන්තයන්හි වැඩි වශයෙන් යෙදී බැඳී වාසය නොකරද්ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩි දියුණුව කැමති විය යුත්තේය, පිරිහීමක් නොවේයයි" දේශනා කළෝය.

"මහණෙනි, භික්ෂූහු යම්තාක් කල් ස්ත්‍රීන්ගේ ගුණ කීම ආදිවූ වැරදිවූ බොහෝ කථායෙහි ඇලෙන්නාහු නොවෙද්ද, බොහෝ කථාවෙහි යෙදුනාහුවෙත්ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩි දියුණුවම කැමතිවිය යුතුය පිරිහීමක් නොවෙන්නේයයි" කිවෝය.

"මහණෙනි, භික්ෂූහු යම්තාක් කාලයක් බොහෝකොට නිදාගැනීම ඇත්තෝ නොවන්නාහුද, නින්දෙහි ඇලුනෝ නොවන්නාහුද නින්දෙහි නොයෙදුනෝවන්නාහුද මහණෙනි, ඒ භික්ෂුන්ගේ වැඩිදියුණුව කැමති විය යුත්තේය. පිරිහීමක් නොවේයයි" දේශනා කළෝය.

"මහණෙනි, භික්ෂූහු යම්තාක් කාලයක් සමූහයා පිරිවරා ගෙන (රංචුගැසී) වාසය කිරීමක් නැත්තෝ වන්නාහුද සමූහයා කෙරෙහි ඇලුනෝ නොවන්නාහුද ජන සමූහයා කෙරෙහි ඇලීම් වශයෙන් නොයෙදුනාහුද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩිදියුණුවම බලාපොරොත්තු විය යුතුයි. පිරිහීමක් නොවන්නේයයි" කීවෝය.

"මහණෙනි, භික්ෂූහු යම්තාක් කල් තමන්තුළ නැත්තාවූ ගුණ ඇඟවීම් වශයෙන් ලාමකවූ පව් අදහස් ඇත්තෝ නොවන්නාහුද පවුඅදහස් ඇත්තන්ගේ ආශ්‍රයට නොපැමිණියාහු වෙත්ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩි දියුණුවක්ම කැමැති විය යුත්තේය, පිරිහීමක් නොවන්නේයයි" දේශනා කළෝය.

"මහණෙනි, භික්ෂූහු යම්තාක් කල් පාප මිත්‍රයන්ඇත්තෝ නොවන්නාහුද, පාපී යහළුවන් ඇත්තෝ නොවන්නාහුද, පාපයන් කෙරෙහි නැමීම් (ඇලීම්) ඇත්තෝ නොවන්නාහුද මහණෙනි' ඒ භික්ෂූන්ගේ වැඩිදියුණුවම කැමති විය යුත්තේය. පිරිහීමක් නොවේයයි" කීවෝය.

"මහණෙනි, භික්ෂූහු යම්තාක් කල් අර්හත් ඵලයෙන් මෙහා ස්වල්ප මාත්‍රවූ විශෙෂ අධිගමයකින් අවසානයට නො පැමිණෙන්නාහුද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩිදියුණුවම කැමැති විය යුතුයි. පිරිහීමක් නොවේයයි" කීවෝය.

"මහණෙනි, මේ නොපිරිහෙන කරුණු හත යම්තාක් කාලයක් භික්ෂූන් අතර තිබෙයිද, මේ පිරිහීම නැතිකරන ධර්මයන් හත කෙරෙහි භික්ෂූන් පිළිපදිනු දක්නා ලැබෙද්ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩිදියුණුවම කැමතිවිය යුතුයි. පිරිහීමක් නොවේයයි" කීවෝය.

8 "මහණෙනි, තවත් නොපිරිහෙන ධර්ම හතක් දෙශනා කරන්නෙමි. ඒ අසව්, හොඳින් සිත්හි දරාගනිව්. කියන්නෙමියි" කීවෝය.

"ස්වාමීන්වහන්ස, එය යහපතැයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය දේශනා කළ සේක.

"මහණෙනි, භික්ෂූහු යම්තාක් කාලයක් ශ්‍රද්ධා ඇත්තෝ වන්නාහුද, පව්කිරීමෙහි ලජ්ජා ඇත්තෝ වන්නාහුද පාපයට භය ඇත්තෝ වන්නාහුද, බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තෝ වන්නාහුද, පටන්ගත් වීයර්‍ය ඇත්තෝ වන්නාහුද, එළඹ සිටි සිහි ඇත්තෝ වන්නාහුද, නුවණ ඇත්තෝ වෙද්ද, මහණෙනි ඒ භික්ෂූන්ගේ වැඩි දියුණුවම කැමැති විය යුත්තේය. පිරිහීමක් නොවන්නේයයි" කීවෝය.

"මහණෙනි, යම්තාක් කාලයක් මේ පිරිහීම නැති කරන ධර්ම හත භික්ෂූන් කෙරෙහි පවත්නාහුද මේ පිරිහීම නැති කරන ධර්ම හත කෙරෙහි භික්ෂූහු දක්නා ලැබෙද්ද, මහණෙනි,

ඒ භික්ෂූන්ගේ වැඩිදියුණුවම කැමැති විය යුතුය. පිරිහීමක් නොවන්නේයයි" දෙශනා කළෝය.

9 "මහණෙනි, පිරිහීම නැතිකරන (අපරිහාණිය) වෙනත් ධර්ම හතක් දෙශනා කරන්නෙමි. ඒ ධර්ම හත අසව්, හොඳින් සිතෙහි දරාගනිව්, කියන්නෙමියි" වදාළේය.

"ස්වාමීන්වහන්ස, එසේ යහපතැයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය දේශනා කළෝය.

"මහණෙනි, යම්තාක් කල් භික්ෂූහු සති සංබොජ්ජංගය (බොධියට අංගවන සිහිය) වඩන්නාහුද, ධම්මවිචය සංබොජ්ජංගය (බොධියට අංගවන නුවණ) වඩන්නාහුද, විරිය සංබොජ්ජංගය (බොධියට අංගවන වීයර්‍ය) වඩන්නාහුද, පීති සංබොජ්ජංගය (බොධියට අංගවූ ප්‍රීතිය) වඩන්නාහුද, පස්සද්ධි සංබොජ්ජංගය (බොධියට අංගවූ සංසිඳීම) වඩන්නාහුද, සමාධි සංබොජ්ජංගය (බොධියට අංගවූ සමාධිය) වඩන්නාහුද, උපෙක්ඛා සංබොජ්කඩංගය (බොධියට අංගවූ උපෙක්ෂාව) වඩන්නාහුද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩි දියුණුවම කැමති විය යුතුය. පිරිහීමක් නොවේයයි" දේශනා කළෝය

"මහණෙනි, යම්තාක් කල් මේ පිරිහීම නැතිකරන ධර්ම හත භික්ෂූන් කෙරෙහි පවත්නාහුද, මේ පිරිහීම නැති කරන ධර්ම හත කෙරෙහි භික්ෂූහු දක්නා ලැබෙත්ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩිදියුණුව කැමතිවිය යුතුයි පිරිහීමක් නොවේයයි" දේශනා කළෝය.

10 "මහණෙනි, වෙනත් පිරිහීම නැතිකරන ධර්ම හතක් දේශනා කරන්නෙමි, ඒ ධර්ම අසව් හොඳින් සිතෙහි දරා ගනිව්. කියන්නෙමියි" පැවසුවෝය

"ස්වාමීන්වහන්ස, එසේ යහපතැයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය දේශනා කළෝය.

"මහණෙනි, භික්ෂූහු යම්තාක් අනිත්‍ය සංඥාව (අනිත්‍ය දැකීම) වඩන්නාහුද, අනාත්ම සංඥාව (අනාත්ම දැකීම) වඩන්නාහු වෙත්ද, අසුභ සංඥාව (අසුභ දැකීම) වඩන්නාහු වෙත්ද, ආදීනව සංඥාව (සංස්කාරයන්ගේ දොස් දැකීම) වඩන්නාහු වෙත්ද, විරාග සංඥාව (භවයෙහි නොඇලීම) වඩන්නාහු වෙත්ද, නිරොධ සංඥාව (සංස්කාරයන්ගේ නැතිවීම දැකීම) වඩන්නාහු වෙත්ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩි දියුණුවක්ම කැමති විය යුතු පිරිහීමක් නොවේයයි" දේශනා කළෝය. මහණෙනි, යම්තාක් කල් මේ හත් ආකාර අපරිහාණිය ධර්මයෝ භික්ෂූන් කෙරෙහි පවත්නාහුද මේ හත් ආකාර අපරිහාණිය ධර්මයන් කෙරෙහි භික්ෂූහු දක්නා ලැබෙත්ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩිදියුණුවම කැමතිවිය යුතුයි. පිරිහීමක් නොවේයයි" දේශනා කළෝය.

11. "මහණෙනි, පිරිහීම නැති කරන වෙනත් ධර්ම හයක් දේශනා කරන්නෙමි. එය අසව් හොඳින් සිත්හි දරා ගනිව් කියන්නෙමියි" වදාළෝය.

"ස්වාමීන් වහන්ස, එසේ යහපතැයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය දේශනා කළෝය.

"මහණෙනි, භික්ෂූහු යම්තාක් කල් එකට මහණ දම් පුරන්නන් කෙරෙහි ඇති තැනද නැති තැනද මෛත්‍රියෙන් යුත් කාය කර්ම (කයේ පැවතුම්) ඇතිව සිටින්නාහුද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩිදියුණුව කැමති විය යුතුයි. පිරිහීමක් නොවේයයි" පැවසුවෝය.

"මහණෙනි, භික්ෂූහු යම්තාක් කල් එකට මහණ දම් පුරන්නන් කෙරෙහි ඇති තැනද නැති තැනද මෛත්‍රියෙන් යුත් වචන කියන්නාහුද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩි දියුණුව කැමතිවිය යුතුයි පිරිහීමක් නොවේයයි" දේශනා කළෝය.

"මහණෙනි, භික්ෂූහු යම්තාක් කල් එකට මහණ දම් පුරන්නන් කෙරෙහි ඇති තැනද නැති තැනද මෛත්‍රී සිත්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පිහිටුවා සිටින්නාහුද ඒ භික්ෂූන්ගේ වැඩිදියුණුව කැමති විය යුත්තේය. පිරිහීමක් නොවේයයි" දේශනා කළෝය.

"මහණෙනි, භික්ෂූහු යම්තාක් කල් යම් දැහැමින් ලබන ලද ධාර්මික ලාභ වෙත්ද යටත්පිරිසෙයින් පාත්‍රයට ලැබුණ දෙයක් වුවත් සිල්වත්වූ එකට මහණදම් පුරණ භික්ෂූන් වහන්සේලා සමග සාධාරණව බෙදාහදා ප්‍රයෝජන ගන්නෝ වන්නාහුද, ඒ භික්ෂූන්ගේ වැඩිදියුණුව කැමතිවිය යුතුයි. පිරිහීමක් නොවේයයි" දේශනා කළෝය.

"මහණෙනි, භික්ෂූහු යම්තාක් කල් කඩ නොවූ පැල්ලම් නැති කැලැල් නැති තණ්හාවට වාල් නොවූ නුවනැත්තන් විසින් ප්‍රශංසා කරන ලද වැරදි හැඟීම් නැති සමාධිය පිණිස පවත්නා යම් සීලයක් ඇත්තේද එවැනි සීලයෙන් සමානව එකට මහණ දම් පුරන්නන් සමග ඇතිතැනද නැතිතැනද වාසය කරත්ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩිදියුණුව කැමති වියයුතුයි පිරිහීමක් නොවේයයි" දේශනා කළෝය.

"මහණෙනි, භික්ෂූන්ගේ යම්තාක් කල් ක්ලේශ නැති කරන උතුම් නිර්වාණය පිණිස පවතින හරිදැකීමක් වේද එවැනි දැකීමෙන් සමානව ඇති තැනද නැති තැනද එකට මහණදම් පුරන්නන් සමග වාසය කරන්නාහුද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩිදියුණුවම කැමතිවිය යුතුයි. පිරිහීමක් නොවේයයි" දේශනා කළෝය.

"මහණෙනි, යම්තාක් කල් මේ පිරිහීම නැති කරන හය ආකාර ධර්මයෝ භික්ෂූන් කෙරෙහි පිහිටා සිටින්නහුද මේ පිරිහීම නැති කරන හය ආකාර ධර්මයන් කෙරෙහි භික්ෂූහු දක්නා ලැබෙත්ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩි දියුණුවම කැමතිවිය යුතුයි. පිරිහීමක් නොවේයයි" දේශනා කළෝය.

12. ඒ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ගිජ්ජකූට පර්වතයෙහි වාසය කරන්නේ බොහෝ කොට භික්ෂූන්ට මේ ධර්ම දෙශනා කරත්.

"මේ සීලයයි, මේ සමාධියයි, මේ ප්‍රඥාවයි. සීලයෙන් වඩනලද සමාධිය මහත් ඵල ඇත්තේ වේ. මහත් ප්‍රයෝජන

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇත්තේ වේ. සමාධියෙන් මනාකොට වඩනලද ප්‍රඥාව මහත්ඵල ඇත්තීවෙයි. මහත් ප්‍රයෝජන ඇත්තීය. ප්‍රඥාවෙන් වඩනලද හිත ආශ්‍රවයන් කෙරෙන් මිදෙයි. එනම් කාම ආශ්‍රවයෝය, භව ආශ්‍රවයෝය, දෘෂ්ටි ආශ්‍රවයෝය, අවිද්‍යා ආශ්‍රවයෝය, යන මොහුය."

13. එවිට භාග්‍යවතුන්වහන්සේ රජගහනුවර කැමති තාක් කාලයක් වාසයකොට ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට කථාකර මෙසේ කීවෝය. "ආනන්දය, මෙහි එනු අම්බලට්ඨිකා උයන යම් තැනෙක්හිද එතනට පැමිණෙමු යයි" කීවෝය.

"ස්වාමීන්වහන්ස, එය යහපතැයි" ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය. එවිට භාග්‍යවතුන්වහන්සේ මහත් භික්ෂු සංඝයා සමග අම්බලට්ඨිකා උයන යම් තැනකද එතැනට පැමිණියෝය.

14. එකල භාග්‍යවතුන් වහන්සේ අම්බලට්ඨිකා උයනෙහි රජුන් සඳහා කරනලද ශාලාවෙහි වාසය කළෝය. ඒ අම්බලට්ඨිකා උයනෙහි රාජ ශාලාවෙහි වාසයකරණ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට බොහෝකොට මේ ධර්මය දෙශනා කළේය.

"මේ සීලයයි, මේ සමාධියයි, මේ ප්‍රඥාවයි. සීලයෙහි පිහිටා පුරුදු කරනලද සමාධිය මහත් ඵල ඇත්තේය. මහත් අනුසස්ද ඇත්තේය. සමාධියෙහි පිහිටා පුරුදු කරන ලද ප්‍රඥාව මහත්ඵල ඇත්තීවෙයි. මහත් අනුසස් ඇත්තීද වෙයි. ප්‍රඥාවෙහි පිහිටා වඩනලද චිත්තය කාමාශ්‍රවය භවාශ්‍රවය, දෘෂ්ටි ආශ්‍රවය, අවිද්‍යා ආශ්‍රවය යන සතර ආශ්‍රවයන්ගෙන් මනාකොට මිදේයයි" වදාළසේක.

15. එවිට භාග්‍යවතුන්වහන්සේ අම්බලට්ඨිකා උයනෙහි කැමති පරිද්දෙන් වාසය කොට, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට කථාකොට මෙසේ කීවෝය.

"ආනන්දය, මෙහි එනු. නාලන්දා නුවර යම් තැනකද එතනට පැමිණෙන්නෙමු."

"ස්වාමීන් වහන්ස, එසේ යහතැයි" ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය. එකල භාග්‍යවතුන් වහන්සේ මහත් භික්ෂු සංඝයා සමග නාලන්දා නුවර යම් තැනකද, එතනට පැමිණියෝය. ඒ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ නාලන්දා පුරයෙහිවූ පාවාරික නම් අඹ වනයෙහි වාසය කළෝය.

**16** එවිට ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන්වහන්සේ යම් තැනකද එතැනට පැමිණියෝය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ හොඳින් වැඳ එකපැත්තක උන්නේය. එක පැත්තක උන්නාවූ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දැනුම් දුන්නේය.

"ස්වාමීන් වහන්ස, මේ සර්වඥතාඥානය කරණ කොට ගෙන භාග්‍යවතුන් වහන්සේට වඩා ඥානයෙන් උසස්වූ කිසියම් ශ්‍රමණයෙක් හෝ කිසියම් බ්‍රාහ්මණයෙක් හෝ අතීත කාලයෙහිද නොවූයේය. අනාගත කාලයෙහිද නොවන්නේය. දැන් මේ කාලයෙහිද නොවේයයි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ කෙරෙහි මෙසේ පැහැදුණෙමියි" කීවේය.

"සාරිපුත්තය, ඔබවිසින් උසස් නිර්භීත වචනයක් කියන ලද්දේය. ඒකාන්ත වචනයක් කියන ලද්දේය. සිංහනාදයක් පවත්වනැලද්දේයයි කීවෝය. එනම්, 'ස්වාමීන් වහන්ස, සර්වඥතාඥානය හෙතුකොට ගෙන භාග්‍යවතුන් වහන්සේට වඩා ප්‍රඥාවෙන් වැඩිවූ අන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ අතීතයෙහිද නොවීය, අනාගතයෙහිද නොවන්නේය, මේ කාලයෙහිද නොවේ යනුයි.

"සාරිපුත්තය, කිමෙක්ද? අතීත කාලයෙහි යම් අර්හත් සම්‍යක් සම්බුදු කෙනෙක් වූවාහුද, ඒ සියලු භාග්‍යවතුන් වහන්සේලා මෙසේ මෙවැනි සීලයෙන් යුක්ත වූවාහුයයි කියාද, මෙසේ මෙවැනි ධර්මයෙන් යුක්ත වූවාහුයයි කියාද, මෙසේ මෙවැනි ධර්මයෙන් යුක්ත වූවාහුයයි කියාද මෙසේ මෙවැනි ප්‍රඥාවෙන් යුක්ත වූවාහුයයි කියාද මෙසේ මෙවැනි (විහරණ) වාසය කිරීම් ඇත්තාහුයයි කියාද, ඒ භාග්‍යවතුන් වහන්සේලා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

මෙසේ මෙබඳු කෙලෙසුන් කෙරෙන් මිදීම් ඇත්තෝයයි කියාද ඔබ විසින් සිතින් සිත පිරිසිඳ බලා දක්නා ලද්දේදැයි" ඇසුවෝය.

"ස්වාමීන් වහන්ස, එය එසේ නොවේයයි" දැන්නුවේය.

"කිමෙක්ද? ශාරිපුත්තය, අනාගතකාලයෙහි යම් අර්හත් සම්‍යක් සම්බුදු කෙනෙක් උපදින්නාහු වෙත්ද, ඒ සියලු භාග්‍යවතුන් වහන්සේලා මෙසේ මෙවැනි සීලයෙන් යුක්ත වන්නාහුයයි කියාද, මෙසේ මෙවැනි ධර්මයෙන් යුක්ත වන්නාහුයයි කියාද, මෙසේ මෙවැනි ප්‍රඥාවෙන් යුක්ත වන්නාහුයයි කියාද, මෙසේ මෙවැනි පැවැත්මෙන් යුක්ත වන්නාහුයයි කියාද, ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙසේ මෙවැනි විමුක්ති (කෙලෙසුන් කෙරෙන් මිදීම්) ධර්මයෙන් යුක්ත වන්නාහුයයි කියාද ඔබ විසින් සිතින් සිත පිරිසිඳ දක්නා ලද්දේදැයි" කියා ඇසුවෝය.

"ස්වාමීන් වහන්ස, එසේ නොවේයයි" කීවේය.

"කිමෙක්ද? ශාරිපුත්තය, දැන් මේ කාලයෙහි, මම ඔබගේ අර්හත් සම්‍යක් සම්බුද්ධ වෙමි. මේ කාරණයෙන්ද භාග්‍යවත් තෙම මෙසේ මෙවැනි ශීලයෙන් යුක්තයයි කියාද මෙසේ මෙවැනි ධර්මයෙන් යුක්තයයි කියාද, මෙසේ මෙවැනි ප්‍රඥාවෙන් යුක්තයයි කියාද මෙසේවූ හැසිරීම් ඇතැයි කියාද මේ කාරණයෙන්ද භාග්‍යවත් තෙම මෙසේවූ විමුක්තියෙන් (කෙලෙසුන් කෙරෙන් මිදීමෙන්) යුක්ත වූයේයයි කියාද, ඔබ විසින් සිතින් සිත පිරිසිඳ දන්නා ලද්දේදැයි" ඇසුවෝය.

"ස්වාමීන් වහන්ස, නැත එය එසේ නොවේයයි" කීය.

"සාරිපුත්තය. තොපට මේ අතීත, අනාගත, වර්තමාන යන අර්හත් සම්‍යක් සම්බුදුවරයන් වහන්සේලාගේ සිත් දැන ගන්නා තරම් පරසිත් දැනගන්නා ඥානයක් නැත්තේද එසේ නැති කළ යම් 'මේ සර්වඥතාඥානය හෙතුකොටගෙන භාග්‍යවතුන් වහන්සේට වඩා උසස් ඥානයෙන් යුක්තවූ අන්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ අතීතයෙහිද නුවූයේය අනාගතයෙහිද නොවන්නේය, දැන් මේ කාලයෙහිද නැත්තේයයි මෙසේ

භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි පැහැදුණෙමි, යන නිර්භීත වචනය කෙසේ කියන ලද්දේද. ඒකාන්ත වචනය කෙසේ කියන ලද්දේද, සිංහ නාදය කරන ලද්දේද?

17 "ස්වාමීන් වහන්ස, අතීත අනාගත වර්තමාන කාලයෙහිවූ අර්හත් සම්‍යක් සම්බුදුන් වහන්සේලාගේ සිත මාගේ සිතින් පිරිසිඳ දන්නා ඥානයක් මට නොමැත්තේය. එවැනි ඥානයක් නැත්තේවී නමුත් ධර්මය අනුව ගොස් දැනගන්නා ලද්දෙමි" කීවෝය.

"ස්වාමීන් වහන්ස, ශක්තිමත් කොට බඳිනලද ප්‍රාකාර සහ තොරන් ඇති එක් දොරක් ඇති රජහුගේ පිටිසර නුවරක් වේද, එහි නුවණ ඇති සමත් ප්‍රඥාවන්ත දොරටුපාලයෙක් නොහඳුනන ජනයන් වළක්වා අඳුනන ජනයන් ඇතුල් කරන්නේද, ඔහු ඒ නුවර අවට ඔබ මොබ ඇවිද බලා ප්‍රාකාර සන්ධියක් හෝ (ප්‍රාකාරයේ) ඉඩ හැරුණු ස්ථානයක් හෝ බළලෙකුට ඇතුල්වීමට පමණවූ ස්ථානයක්වත් නො දකින්නේ නම් ඔහුට මේ අදහස ඇති වන්නේය. 'යම් ඒ මහත්වූ කිසියම් සත්වයෝ මේ නුවරට ඇතුල්වන්නාහු හෝ නුවරින් පිටවන්නාහු හෝ වෙද්ද, ඒ සියල්ලෝ මේ දොරින්ම පිටවන්නෝ හෝ නික්මෙන්නෝ වෙත්ය" කියායි.

"ස්වාමීන්වහන්ස, එසේම මා විසින් කරුණු අවබොධ කරගත් ඥාන වශයෙන් ධර්මානුගත බුද්ධියෙන් මේ කාරණය දැනගන්නා ලද්දේය. 'අතීත කාලයෙහි යම් ඒ අර්හත් සම්‍යක් සම්බුදුවරයන් වහන්සේලා වූවාහුද, ඒ සියලු භාග්‍යවතුන් වහන්සේලා සිත කිලුටු කරන්නාවූ ප්‍රඥාව දුර්වල කරන්නාවූ ස්වර්ග මොක්ෂය මුවහකරන පඤ්චනීවරණ ධර්මයන් දුරුකොට සතර සතිපට්ඨාන ධර්මයන්හි මනාකොට පිහිටවූ සිත් ඇතිව බොධ්‍යංග ධර්ම (බොධියට අංගවන කරුණු) සත වඩා උතුම්වූ සර්වඥතාඥානය අවබොධ කළාහුය කියාද, ස්වාමීන් වහන්ස, අනාගතයෙහි යම් ඒ අර්හත් සම්‍යක් සම්බුදු කෙනෙක් වන්නාහුද ඒ සියලු භාග්‍යවතුන් වහන්සේලාද සිත කිලුටු කරන්නාවූ ප්‍රඥාව

දුර්වල කරන්නාවූ පංචනීවරණ ධර්මයන් දුරු කොට සතර සතිපට්ඨාන ධර්මයන්හි මනාකොට පිහිටුවන ලද සිත් ඇතිව බොද්ධ්‍යංග ධර්ම සත වඩා ඇති හැටියෙන් වඩා ඉතා උතුම්වූ සර්වඥතාඥානය අවබොධ කරන්නාහුය' කියාද, 'ස්වාමීන් වහන්ස, දැන් මේ කාලයෙහි අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේද සිත කිලුටු කරන්නාවූ ප්‍රඥාව දුර්වල කරන්නාවූ පංච නීවරණ ධර්මයන් දුරුකොට සතර සතිපට්ඨාන ධර්මයන්හි මනා කොට පිහිටුවන ලද සිත් ඇතිව සප්ත බොද්ධ්‍යංග ධර්මයන් ඇති සැටියෙන් වඩා ඊට වැඩි උත්තම දෙයක් නැත්තාවූ සර්වඥතාඥානය අවබොධ කෙළේය' කියායි.

18 "ඒ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ නාලන්දා නගරයෙහි පාවාරික නම් අඹ වනයෙහි වාසය කරන්නේ බොහෝ භික්ෂූන් සඳහා මේ ධර්මකථාව දෙශනා කරති. කෙසේදයත්?" මේ චතුපාරි සුද්ධිශීලයම ශීලයයිද, මේ සිත එක අරමුණක පිහිටීම සමාධියයිද, මේ විදර්ශනාප්‍රඥාවට ප්‍රඥාවයයිද, චතුපාරිසුද්ධි ශීලයෙහි පිහිටා වඩනලද සමාධිය මහත් ඵල වන්නේය, බොහෝ ආනිසංස ඇත්තේය. සමාධියෙහි පිහිටා වඩනලද ප්‍රඥාව මහත් ඵල මහානිසංස ඇත්තේවේ. ප්‍රඥාවෙහි පිහිටා පුරුදු කරණ ලද සිත යහපත් ලෙසට ආශ්‍රවයන් ගෙන් එනම් කාමාශ්‍රවය, භවාශ්‍රවය, දෘෂ්ටි ආශ්‍රවය අවිද්‍යා ආශ්‍රවය යන මොවුන් කෙරෙන් සර්වප්‍රකාරයෙන් මිදේයයි" කීවෝය.

19 ඊට පසුව භාග්‍යවතුන් වහන්සේ නාලන්දාවෙහි කැමැති කාලයක් වාසය කොට ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට කථාකොට මෙසේ කීවෝය.

"ආනන්දය, එව පාටලීගම කොතනද එතනට යමුයි" කීවෝය. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීන්වහන්ස, ඒ මැනැවයි" පිළිතුරු දුන්හ. ටික වේලාවකින් භාග්‍යවතුන් වහන්සේ බොහෝ භික්ෂූන් වහන්සේලා සමග පාටලී නම් ගම යම් තැනකද එතනට පැමිණියෝය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**20.** පාටලී ගම් වැසි උපාසකයෝ භාග්‍යවතුන්වහන්සේ පාටලී ගමට වැඩියේයයි ඇසුවාහුය. එවිට පාටලී ගම් වැසි උපාසකවරු භාග්‍යවතුන් වහන්සේ යම් තැනක වැඩසිටියේද එතනට පැමිණියෝය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ හොඳින් වැඳ එක පැත්තක සිටියෝය. එක පැත්තක සිටියා වූ ඒ උපාසකයෝ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීවෝය. එනම් "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අපගේ ආගන්තුක ශාලාව පිළිගන්නා සේක්වායි" භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද භාවයෙන් එය පිළිගත්තේය

**21** ඊට පසුව පාටලී ගම් වැසි උපාසකයෝ භාග්‍යවතුන් වහන්සේගේ පිළිගැනීම දැන හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ පැදකුණුකොට හොඳින් වැඳ ආගන්තුක ශාලාව යම්තැනකද එතනට පැමිණියාහුය. පැමිණ ආගන්තුක ශාලාව සම්පූර්ණයෙන් වස්ත්‍ර අතුරා අසුන් පනවා පැන් භාජන තබවා සුවඳ තෙල් පහන් දල්වා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ හොඳින් වැඳ පැත්තක සිටියාහුය. පැත්තක සිටියාවූ පාටලී ගම් වැසි උපාසකවරු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දැන්වූවෝය.

"ස්වාමීන් වහන්ස, ආගන්තුක ශාලාව සම්පූර්ණයෙන් රෙදිවලින් අතුරණ ලද්දේය, පැන් භාජන තබන ලද්දේය, තෙල් පහන් දල්වන ලද්දේය. දැන් භාග්‍යවතුන් වහන්සේ යමක් සම්බන්ධව කාලයයි දන්නාසේක් නම් එය කරණු මැණවයි' දැන්වූවෝය.

**22** එවිට භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි හැඳ පොරවා පාත්‍රා සිවුරු ගෙන භික්ෂු සංඝයා සමග ආගන්තුක ශාලාව යම් තැනකද එතනට පැමිණියාහුය. වැඩ පාදයන් සෝදා ආගන්තුකශාලාවට ඇතුල්ව මධ්‍යයෙහිවූ කණුව ඇසුරු කොට පෙරදිගට මුහුණලා වැඩහුන්සේක. භික්ෂු සංඝයා පාදයන් සෝදා ආගන්තුක ශාලාවට ඇතුල්ව බස්නාහිර දෙස බිත්තිය ඇසුරු කොට පෙරදිගට මුහුණලා භාග්‍යවතුන් වහන්සේම පෙරටුකොට උන්නේය. පාටලී ගම් වැසි උපාසකයෝද පාදයන් සෝදා

ආගන්තුක ශාලාවට ඇතුල්ව නැගෙනහිර දෙස භිත්තිය ඇසුරුකොට බස්නාහිර දිගට මුහුණලා භාග්‍යවතුන් වහන්සේම පෙරටු කොට උන්නාහුය.

23 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පාටලී ගම්වැසි උපාසකයන්ට කථා කළහ. "ගෘහපතියෙනි, දුස්සීලයාගේ සීල විපත්තිය සම්බන්ධයෙන් මේ දෝෂ පහක් ඇත්තේ වේ. ඒ පස කවරහුදයත්, ගෘහපතියෙනි, මේ ශාසනයෙහි විපතට පැමිණි සිල් ඇත්තාවූ දුස්සීල තෙමේ ප්‍රමාදය කරණකොට ගෙන මහත්වූ සම්පත්තීන්ගේ හානියට පැමිණෙයි. දුස්සීලයාගේ සීල විපත්තිය සම්බන්ධවූ මේ පළමුවෙනි දෝෂයයි වදාළසේක. තවද ගෘහපතියෙනි, සීල විපත්තියට පැමිණියාවූ දුස්සීලයාගේ අපකීර්ති පවිටු ඝොෂාව අතිශයින් උස්ව පැනනගියි. මේ දුස්සීලයාගේ සීලවිපත්තිය පිළිබඳ දෙවැනි දොෂයයි" වදාළේය. "තවද ගෘහපතියෙනි, විපතට පැමිණි සිල් ඇති දුස්සීලතෙම ක්ෂත්‍රිය රාජාදීන් පිළිබඳ පිරිසකට හෝ බ්‍රාහ්මණ පිරිසකට හෝ ගෘහපතීන්ගේ පිරිසකට හෝ ශ්‍රමණ පිරිසකට හෝ යම් යම් පිරිසකට පැමිණේද සැක සහිතවම භය සහිතවම එළඹෙයි. මේ දුස්සීලයාගේ සීල විපත්තිය පිළිබඳව තුන්වෙනි දොෂයයි" කීවෝය. "තවද ගෘහපතියෙනි, විපතට පැමිණි සිල් ඇති දුස්සීලයා සිහිමුළාවට පැමිණ කාලක්‍රියා කෙරේ. දුස්සීලයාගේ සීල විපත්තිය පිළිබඳව මේ හතරවෙනි දෝෂයයි. තවද ගෘහපතියෙනි, නැවතද එකක් කියමි. එනම් විපතට පැමිණි සිල් ඇති දුස්සීලතෙමේ ශරීරය විනාශවී මරණින් මතු සැපයෙන් තොරවූ නපුරු ගති ඇත්තාවූ නරකයෙහි උපදී. මේ දුස්සීලයාගේ සීල විපත්තිය පිළිබඳව පස්වෙනි දෝෂයයි" කීවෝය. ගෘහපතියෙනි දුස්සීලයාගේ සීල විපත්තිය පිළිබඳ මේ දෝෂ පහ වන්නේ යයි" වදාළසේක.

24. "ගෘහපතියෙනි, සිල්වත්හුගේ සීල සම්පත්තිය පිළිබඳව මේ ආනිසංස පසක් වෙත්. ඒ පස කවරහුද යත්? ගෘහපතියෙනි, මේ ශාසනයෙහි සිල්වත්තෙම සීලයෙන් සම්පූර්ණවූයේ නොපමාවීම කරණ කොටගෙන මහත්වූ සම්පත් ලබයි.

සිල්වත්හුගේ සීල සම්පත්තිය පිළිබඳව මේ පළමුවෙනි ආනිසංසයයි” කීවෝය. “නැවතද අනිකක් කියමි, ගෘහපතියෙනි, හොඳින් සිල් ඇත්තාවූ සිල්වත්හුගේ උතුම්වූ යහපත් කීර්ති ඝොෂාව විශෙෂයෙන් උස්ව නැගේ. සීලවන්තයාගේ සිල්වත්කම පිළිබඳව මේ දෙවෙනි ආනිසංස යයි කීවෝය. නැවතද තව එකක් කියමි. ගෘහපතියෙනි, සම්පූර්ණවූ සිල් ඇති සිල්වත් තෙම ක්ෂත්‍රිය රාජාදීන්ගේ පිරිසකට හෝ බ්‍රාහ්මණයන්ගේ පිරිසකට හෝ ගෘහපතියන්ගේ පිරිසකට හෝ ශ්‍රමණයන්ගේ පිරිසකට හෝ යම් යම් පිරිසකට පැමිණේද, සැකයක් නැතුවම නිර්භයවම එළඹෙන්නේය. සිල්වත්හුගේ සීල සම්පත්තිය පිළිබඳව මේ තුන්වෙනි ආනිසංසයයි” කීවෝය. “නැවතද එකක් කියමි. ගෘහපතියෙනි, සම්පූර්ණවූ සිල් ඇති සිල්වත් තෙම සිහිමුළා නොවීම කාලක්‍රියා කෙරෙයි, සිල්වත්හුගේ සීල සම්පත්තිය පිළිබඳව මේ හතරවෙනි ආනිසංසයයි” කීවෝය. “ගෘහපතියෙනි, නැවතද එකක් කියමි, සම්පූර්ණවූ සිල් ඇති සිල්වත් තෙම ශරීරය විනාශවී මරණින් මතු හොඳ ගති ඇත්තාවූ, ස්වර්ග ලෝකයෙහි උපදී. සිල්වත්හුගේ සීල සම්පත්තිය පිළිබඳව මේ පස්වෙනි ආනිසංසයයි කීවෝය. ගෘහපතියෙනි, සීලවන්තයාගේ සිල්වත් භාවය පිළිබඳව මේ ආනිසංස පස වෙත්යයි” කීවෝය.

**25** ඊට පසුව භාග්‍යවතුන් වහන්සේ පාටලී ගම්වාසී උපාසකවරුන් රාත්‍රිය සම්බන්ධයෙන් බොහෝ වේලාවක් ධර්ම කථාවෙන් යහපත් ලෙස කරුණු දක්වා සමාදන් කරවා සිත් දියුණු කරවා පහදවා හැරිසේක. කෙසේද යත්, “ගෘහපතියෙනි, රාත්‍රිය ගතවී ගියාය. දැන් තොපි යමක් සම්බන්ධව කාලයයි දන්නාහුද” එය කරව්යයි, කීවෝය.

උපාසකවරුද, “ස්වාමීන්වහන්ස, ඒ මැනවයි” උත්තර දී හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ හොඳින් වැඳ (පැදකුණුකොට) ගෞරව සහිතව ගියාහුය. පාටලී ගම්වැසි උපාසකයන් බැහැරගිය නොබෝ වේලාවකින් භාග්‍යවතුන් වහන්සේ සූන්‍යාගාරයට (විවේක ගන්නා කාමරයට) පැමිණියෝය.

**26** ඒ කාලයෙහිදී සුනිධය, වස්සකාරය යන මගධ රට මහාමාත්‍යයෝ පාටලී නම් ගමෙහි වැදැරජුන්ගේ අයබදු නාස්ති කිරීම පිණිස නුවරක් කරවන්නාහුය. ඒ කාලයෙහිදී ඒ ඒ වර්ගයෙන් දහස දහස බැගින්වූ බොහෝ දෙවතාවෝ පාටලී ගමෙහි ගෘහ භූමිවලට අරක්ගෙන සිටිත්. යම් ප්‍රදෙශයක මහෙශාක්‍ය දෙවතාවෝ ගෘහ භූමිවලට අරක්ගෙන සිටිත්ද, එම ප්‍රදෙශයෙහි මහෙශාක්‍ය රජුන්ගේද රජමහ ඇමතියන්ගේද සිත් වාසස්ථාන කරවන්ට නැමෙත්. යම් ප්‍රදෙශයක මධ්‍යම දෙවතාවෝ ගෘහ භූමිවලට අරක්ගෙන සිටිත්ද, එම ප්‍රදෙශයෙහි මධ්‍යමවූ රජුන්ගේද රජමහ ඇමතියන්ගේද සිත් ගෘහසෑදීමට නැමෙත් යම් ප්‍රදෙශයක පහත් දෙවතාවෝ ගෘහවස්තූන් අරක්ගෙන සිටිත්ද? ඒ ප්‍රදෙශයෙහි වාසස්ථානයන් කරවන්ට පහත් රජුන්ගේද රජ මහා ඇමතියන්ගේද සිත් නැමෙත්.

**27.** භාග්‍යවතුන් වහන්සේ පිරිසිදුවූ මනුෂ්‍ය ඇසට උසස්ව පවතින දිව්‍යැසින් එක් එක් වර්ගයෙන් දහස දහස බැගින් පාටලී ගමෙහි භූමීන්ට අරක්ගෙන සිටින්නාවූ දේවතාවන් දුටුවේමය. එවිට භාග්‍යවතුන් වහන්සේ රාත්‍රියෙහි අලුයම් වේලෙහි නැගිට සිට ආයුෂ්මත්වූ ආනන්ද තෙරුන් වහන්සේට කථාකොට මෙසේ කීවෝය

"ආනන්දය, පාටලී ගමෙහි නුවරක් සාදවන්නේ කවරෙක්දැයි" ඇසුවෝය.

"ස්වාමීන් වහන්ස, සුනීධය, වස්සකාරය යන මගධ රට මහ ඇමතියෝ දෙදෙනා වැදැ රජ දරුවන්ගේ අයබදු වැළැක්වීම පිණිස, පාටලී ගමෙහි නුවරක් සාදවන්නාහුයයි" කීවේය.

**28.** "ආනන්දය, තව්තිසා දිව්‍යලොකයෙහි දෙවියන් හා සමග කථාවක් කොට මෙන් (සැලැස්මක් ලබාගෙන මෙන්) සුනීධ, වස්සකාර යන මගධ රට මහා ඇමතියෝ වැදැ රජදරුවන්ගේ අයබදු වැළැක්වීම පිණිස පාටලී ගමෙහි නුවරක් කරන්නාහුය.

"ආනන්දය, මම පාටලී ගමෙහි භූමීන්ට අරක්ගෙන වාසය කරන්නාවූ එක එක වර්ගයෙන් දහස බැගින් ඇති බොහෝ දේවතාවන් මාගේ පිරිසිදු මිනිස් ඇස ඉක්මවූ දිව්‍යැසින් දුටුවෙමි.

"යම් ප්‍රදේශයක භූමියට මහෙශාක්‍ය දෙවතාවෝ අරක්ගෙන වෙසෙත්ද, එහි මහෙශාක්‍යවූ රජදරුවන්ට හා රාජ මහා අමාත්‍යයන්ට වාසස්ථාන මවන්ට සිත් නැමෙන්නාහුය. යම් ප්‍රදේශයක භූමියට මධ්‍යම දේවතාවෝ අරක්ගෙන වෙසෙත්ද, ඒ ප්‍රදේශයෙහි මධ්‍යම රජදරුවන්ට හා රජ මහ ඇමතියන්ට වාසස්ථාන මවන්ට සිත් නැමෙන්නාහුය. යම් ප්‍රදේශයක භූමියට හීනවූ දේවතාවෝ අරක්ගෙන වෙසෙත්ද එතැන පහත් රජදරුවන් හා රජ මහ ඇමතියන්ට වාසස්ථාන ඇති කරන්ට සිත් නැමෙන්නාහුය.

"ආනන්දය, යම් පමණ උතුම් මිනිසුන් පැමිණෙන ස්ථාන ඇත්තේද, යම් පමණ වෙළඳුන් පැමිණෙන ස්ථාන ඇත්තේද, ඒ ස්ථාන අතුරෙන් විකිණීමට ගෙනෙන බොහෝ බඩු පොදි ලිහන තැනක්වූ මේ නගරය ප්‍රධානවූ නුවරක් වන්නේයයි" කීවෝය.

"ආනන්දය, මේ පාටලී නම් නුවරට ගින්නෙන් හෝ දියෙන් හෝ මිත්‍ර භෙදයෙන් හෝ වන්නාවූ අන්තරාය තුනක් ඇත්තාහුයයි" වදාළෝය.

**29.** එවිට සුනීධ, වස්සකාර යන මගධ රට මහා ඇමතියෝ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ හා සමග ප්‍රිය කථා කළාහුය සතුටු විය යුතු සිහි කටයුතුවූ කථාව අවසාන කර එකපැත්තක සිටියාහුය. එකපැත්තක සිටියාවූ සුනීධ වස්සකාර යන මගධ රට මහා ඇමතියෝ, භාග්‍යවතුන් වහන්සේට මෙසේ දැන්නුවෝය.

"භවත් ගෞතමයන්වහන්ස, භික්ෂු සංඝයා වහන්සේ හා සමග අද දවස අපේ භෝජනය ඉවසා වදාරණ සේක්වා (පිළිගන්නා මැනව) යි" දැන්වූහ.

භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම් භාවයෙන් (ආරාධනාව) පිළිගත්තෝය. එවිට සුනිධය වස්සකාරය යන මගධරට මහ

ඇමතියෝ භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම (පිළිගැනීම) දැන තමන්ගේ නිවස යම් තැනකද එතනට පැමුණුණෝය. පැමිණ තමන්ගේ නිවසෙහි මිහිරි ආහාරපාන ආදිය පිළියෙල කරවා, "භවත් ගෞතමයාණන් වහන්ස, භෝජනය සූදානම්ය. දැන් ඊට කාලය වේයයි" කියා භාග්‍යවතුන් වහන්සේට කාලය දැන්නුවාහුය.

එවිට භාග්‍යවතුන් වහන්සේ උදේවරු වේලෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන භික්ෂු සංඝයා සමග සුනීධය, වස්සකාරය යන මගධරට මහා ඇමතියන්ගේ නිවාස හා යම් තැනකද එතනට පැමිණියෝය. පැමිණ පනවනලද ආසනයෙහි වැඩ උන්නෝය. එවිට සුනීධය, වස්සකාරය යන මගධ රට මහ ඇමතියෝ බුදුන් ප්‍රධානකොට ඇති භික්ෂු සංඝයා මිහිරි ආහාරපාන ආදියෙන් සිය අතින් වැළඳෙව්වාහුය, කැමති තාක් වැළඳෙව්වාහුය.

එවිට සුනීධය වස්සකාරය යන මගධ රට මහා ඇමතියෝ වළඳා අවසානවූ භාග්‍යවතුන් වහන්සේ ලඟ එක්තරා පහත් ආසනයක් ගෙන එක පැත්තකින් උන්නාහුය. එකපැත්තක උන්නාවූ සුනීධය වස්සකාරය යන මගධ රට මහ ඇමතියන්ට භාග්‍යවතුන් වහන්සේ මේ අදහස ඇති ගාථාවලින් පින් අනුමෝදන් කළෝය.

"ප්‍රඥා ඇත්තෙක් යම් ප්‍රදේශයක වාසය කරන්නේවේද, එහි සන්සුන් ඉන්ද්‍රියයන් ඇත්තාවූ, උතුම් හැසිරීම් ඇත්තාවූ (බ්‍රහ්මචාරීවූ) සිල්වතුන් වහන්සේලා වළඳවා එතැන යම් දේවතා කෙනෙක් ඇත්තාහුද ඔවුන්ට පින් දෙන්නේ වේද, පුදනු ලැබූ ඒ දේවතාවෝ ඔවුන් පුදත්. සිතින් ගරු කරනු ලැබූ ඔව්හු, ඔවුන්ට සිතින් ගරු කරත්. යම්සේ මෑනියෝ තමන්ගේ ඖරස පුත්‍රයාට අනුකම්පා කරන්නේද, එමෙන්, දෙවියෝ පින් දුන් ඔවුන්ට අනුකම්පා කරන්නාහුය. මෙසේ දෙවියන් විසින් අනුකම්පා කරනලද පුද්ගලයා හැම කල්හිම යහපත් සැපයක්ම දකින්නේය" යනුයි.

එවිට භාග්‍යවතුන් වහන්සේ සුනීධ, වස්සකාර යන මගධ රට මහා ඇමතියන්ට මේ අදහසින් යුත් ගාථාවලින් පින් අනුමොදනාව කොට හුනස්නෙන් නැගිට ගියෝය.

ඒ කාලයෙහි සුනීධ, වස්සකාර යන මගධ රට මහ ඇමතියෝ ශ්‍රමණ භවත් ගෞතම තෙම අද යම් දොරටුවකින් නුවරින් පිටවෙන්නේ ද ඒ දොර 'ගෞතම දොරය' යන නම වන්නේය, යම් තොටකින් ගංගානම් ගඟින් එතර වන්නේද ඒ තොට 'ගෞතම තොට' නම් වන්නේයයි" භාග්‍යවතුන් වහන්සේ පසුපස්සෙහි අනුව ගියාහු වෙත්. එකල භාග්‍යවතුන් වහන්සේ යම් දොරකින් නුවරින් පිටතට ගියෝද ඒ දොරට 'ගෞතම දොර' යන නම වූයේය. එවිට භාග්‍යවතුන් වහන්සේ ගංගානම් ගඟ යම් තැනකද එතැනට පැමිණියෝය.

ඒ කාලයෙහි ගංගානම් ගඟ කවුඩන් විසින් පහසුවෙන් වතුර බියහැකි තරම් ඉවුරු දක්වා පිරී ඇත්තීය. එහි එතර මෙතර යනු කැමැත්තාවූ සමහරෙක් ඔරුවක් සොයන්නාහුය, සමහරෙක් පාරුවක් සොයන්නාහුය, ඇතැම් කෙනෙක් පහුරක් බඳින්නාහුය. එකල භාග්‍යවතුන් වහන්සේ යම්සේ බලවත් පුරුෂයෙක් හකුළුවනලද අත දිගු කරන්නේ හෝ දිගුකරනලද අත හකුළුවන්නේ හෝ යම්සේද, එපරිද්දෙන්ම භික්ෂු සංඝයා සමග ගංගානම් ගඟෙන් මෙතරදී නොපෙනී ගොස් එතරට පැමිණ වැඩ සිටියෝය. එතර මෙතර යනු කැමැත්තෙන් ඔරුවක් සොයන්නාවූ සමහර මිනිසුන්ද, පාරුවක් සොයන්නාවූ සමහර මිනිසුන්ද, පහුරක් බඳින්නාවූ සමහර මිනිසුන්ද භාග්‍යවතුන්වහන්සේ දැක්කෝය. එවිට භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැක එවේලෙහිම මේ තේරුම ඇති ප්‍රීති ගාථාව කීවෝය.

"මේ ලෝකවාසී සත්වයෝ ගංගානම් ගඟෙන් එතරවනු කැමතිව පහුරු බඳින්නාහුය, ඥානවන්තයෝ ආර්‍ය්‍ය මාර්ග පහුරු බැඳ පළල්වූද ගැඹුරුවූද තණ්හා ගංගාවෙන් එතර වූවාහුය"

පළමුවෙනි බණවර නිමියේය.

---

## 2.

1 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට ආමන්ත්‍රණය කළහ. "ආනන්දය, එන්න, කෝටි ග්‍රාමය නම් තැනකද එතැනට යමුයි" වදාළහ.

"එසේය පින්වතුන් වහන්සැයි," ආනන්ද ස්ථවිර තෙම උත්තර දුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහත්වූ භික්ෂු සංඝයා හා සමග කෝටි ග්‍රාමය යම් තැනකද එහි පැමිණියෝය එහිදී භාග්‍යවතුන් වහන්සේ කෝටිග්‍රාමයෙහි වැඩ වසන්නාහ එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට කථා කළෝය. "මහණෙනි, උතුම්වූ සත්‍ය කරුණු සතර (චතුරාර්‍ය්‍ය සත්‍යය) නොදැනීම නිසා, මෙසේ මේ බොහෝවූ දිගු කලක් මා විසිනුත් තොප විසිනුත් ඇවිදින ලද්දේය, සැරිසරන ලද්දේය. ඒ කවර නම් සතරක්ද යත්, මහණෙනි, දුක් ආර්‍ය්‍ය සත්‍යය නොදැනීම (ප්‍රතිවෙධ නොකිරීම) නිසා මෙසේ මේ බොහෝවූ දිගු කලක් මා විසින්ද තොප විසින්ද ගමන් කරන ලද්දේය, සැරිසරණ ලද්දේය.

"මහණෙනි, දුක් ඉපදීමට හේතුවවූ උතුම් සත්‍යය නොදැනීම (ප්‍රතිවෙධ නොකිරීම) නිසා මෙසේ බොහෝවූ දිගු කලක් මා විසින්ද තොප විසින්ද ගමන් කරන ලද්දේය. සැරිසරණ ලද්දේය.

"මහණෙනි, දුක් නැති කිරීම නම්වූ උතුම් සත්‍යය නොදැනීමෙන් (ප්‍රතිවෙධ නොකිරීමෙන්) මෙසේ මේ බොහෝවූ දිගු කලක් මා විසින්ද තොප විසින්ද ගමන් කරන ලද්දේය, සැරිසරන ලද්දේය. මහණෙනි, දුක් නැතිකිරීමේ මාර්ගය නම් උතුම් සත්‍යය නොදැනීම (ප්‍රතිවෙධ නොකිරීම) නිසා මෙසේ බොහෝවූ දිගු කලක් තොප විසින්ද මා විසින්ද ඇවිදින ලද්දේය, සැරිසරණ ලද්දේය.

"මහණෙනි, ඒ මේ දුක නම් වන උතුම් සත්‍යය තත්වූ පරිදි දැනගන්නා ලද්දේය. දුක් ඇතිවීමේ හේතුව නම්වූ උතුම් සත්‍යය තත්වූ පරිදි දැනගන්නා ලද්දේය. දුක් නැති කිරීම නම්වූ උතුම් සත්‍යයද ඇතිසැටියෙන් දැනගන්නා ලද්දේය. දුක් නැතිකිරීමේ

මාර්ගය නම් උතුම් සත්‍යයද ඇතිසැටියෙන් දැනගන්නා ලද්දේය. භව තණ්හාව මුලින් සිඳ නසන ලද්දේය. භව රැහැණ ගෙවී ගියේය. දැන් නැවත ඉපදීම නැතැයි" කියා භාග්‍යවතුන් වහන්සේ මෙසේ පැවසූහ. ඉන්පසු සුගතවූ සර්වඥයන්වහන්සේ මේ අදහස් ඇති ගාථා දෙක පැවසූහ.

"උතුම්වූ සත්‍ය සතර ඇති සැටියෙන් නොදැක්ම නිසා ඒ ඒ ජාතියෙහි බොහෝවූ දිගු කලක් එහා මෙහා සැරිසරන ලද්දේය. ඒ මේ උතුම් සත්‍ය සතර දක්නා ලද්දාහුය. තණ්හා නමැති රැහැන නසන ලදී. සසර දුකෙහි මුල උගුල්ලා හරින ලද්දේය. දැන් නැවත සසර ඉපදීමක් නැත" යනුයි.

**2** එතැන්හිද භාග්‍යවතුන් වහන්සේ කෝටිග්‍රාම නම් ගමෙහි වැඩ වසන සේක් භික්ෂූන්ට වැඩි වශයෙන් මේ ධර්ම කථාවම කරන්නේය. මේ උතුම්වූ ශීලයයි කියාද, මේ උතුම්වූ සමාධියයි කියාද, මේ උතුම් ප්‍රඥාවයයි කියාද, ශීලයෙහි සිට වඩන (පුරුදු කරන) ලද සමාධිය මහත් ඵල මහානිසංස වන්නේය. සමාධියෙහි සිට වඩනලද නුවණ මහත් ඵල මහානිසංස වන්නේය. නුවණින් පුරුදු කරනලද සිත ආශ්‍රවයන් (කෙලෙසුන්) ගෙන් මිදෙන්නේයයි පැවසූහ. ඒ ආශ්‍රව නම් කාමාශ්‍රවයෝය, භවාශ්‍රවයෝය, දෘෂ්ටි ආශ්‍රවයෝය, අවිද්‍යා ආශ්‍රවයෝය යන මොහුයි.

**3** එවිට භාග්‍යවතුන් වහන්සේ කෝටි ග්‍රාමයෙහි කැමති කලක් වාසය කොට ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේට කථාකර මෙසේ කීවෝය. "ආනන්දය, එන්න, නාදිකා නම් ගම යම් තැනකද එතැනට යමුයි" පැවසූහ.

"එසේය ස්වාමීනියි" ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහත්වූ භික්ෂු සංඝයා හා සමග නාදිකා නම් ගම යම් තැනකද එතැනට පැමිණියහ. එතැන්හිද භාග්‍යවතුන් වහන්සේ නාදිකා ගම ලඟවූ ගිඤ්ජකාවසථ නම් උළු ගෙයක වාසය කරති. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ, භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට

එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ හොඳින් වැඳ එක පැත්තක උන්හ. එක් පැත්තක උන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළහ.

'ස්වාමිනි, නාදිකා නම් ගමෙහි සිටි සාළ්හ නම් භික්ෂුව පරලොව ගියේය. ඔහුගේ උත්පත්තිය කුමක්ද? පරලොව කුමක්ද?"

'ස්වාමිනි, නාදිකා නම් ගමෙහි නන්දා නම් භික්ෂුණීය පරලොව ගියාය. ඇගේ උත්පත්තිය කුමක්ද? පරලොව කුමක්ද?"

'ස්වාමීනි, නාදිකා නම් ගමෙහි සුදත්ත නම් උපාසකයා මැරුණේය. ඔහුගේ උත්පත්තිය කුමක්ද? පරලොව කුමක්ද?

'ස්වාමීනි, නාදිකා නම් ගමෙහි සුජාතා නම් උපාසිකාව මැරුණාය. ඇගේ උත්පත්තිය කුමක්ද? පරලොව කුමක්ද?'

'ස්වාමීනි, නාදිකා නම් ගමෙහි කකුධ නම් උපාසකයා මැරුණේය. ඔහුගේ උත්පත්තිය කුමක්ද? පරලොව කුමක්ද?'

'ස්වාමීනි, නාදිකා නම් ගමෙහි කාලිංග නම් උපාසකයා මැරුණේය. ඔහුගේ උත්පත්තිය කුමක්ද? පරලොව කුමක්ද?'

'ස්වාමීනි, නාදිකා නම් ගමෙහි නිකට නම් උපාසකයා මැරුණේය. ඔහුගේ උත්පත්තිය කුමක්ද? පරලොව කුමක්ද?'

'ස්වාමීනි, නාදිකා නම් ගමෙහි කටිස්සභ නම් උපාසකයා මැරුණේය. ඔහු කොහි උපන්නේද? පරලොව කුමක්ද?'

'ස්වාමීනි, නාදිකා නම් ගමෙහි තුඪ නම් උපාසකයා මැරුණේය. ඔහු කොහි උපන්නේද? පරලොව කුමක්ද?'

'ස්වාමීනි, නාදිකා නම් ගමෙහි සන්තුඪ නම් උපාසකයා මැරුණේය. ඔහුගේ උත්පත්තිය කුමක්ද? පරලොව කුමක්ද?'

'ස්වාමීනි, නාදිකා නම් ගමෙහි භද්‍ර නම් උපාසකයා මැරුණේය. ඔහුගේ උත්පත්තිය කුමක්ද? පරලොව කුමක්ද?'

'ස්වාමීනි, නාදිකා නම් ගමෙහි සුභද්‍ර නම් උපාසකයා මැරුණේය. ඔහුගේ උත්පත්තිය කුමක්ද? පරලොව කුමක්ද?'

4 "ආනන්දය, සාළ්හ නම් භික්ෂුව (කාමාදි) කෙලෙස් නැති කිරීමෙන් අනාශ්‍රව චෙතො විමුක්ති නම්වූ අර්හත් ඵල ඥානය මේ ආත්මයේදීම තමන්ම නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඊට පැමිණ වාසය කළේය. ආනන්දය, නන්දා නම් භික්ෂුණිය පස් ආකාර ඔරම්භාගිය (සත්වයන් කාමලොකයෙහි රඳවන) සංයෝජනයන් නැතිකිරීම නිසා ඖපපාතිකව (බ්‍රහ්මලොකයෙහි) උපන්නීය. ඒ (බ්‍රහ්ම) ලොකයෙන් වෙනස් නොවන ස්වභාව ඇත්තේ එහිදීම පිරිනිවන් පාන්නීය.

"ආනන්දය, සුදත්ත උපාසකයා සංයෝජන තුනක් නැති කිරීමෙන් රාග ද්වෙෂ මොහයන් තුනීකිරීම නිසා සකෘදාගාමි වූයේ එක වරක්ම මේ (මනුෂ්‍ය) ලොකයට ඇවිත් සසර දුක් කෙළවර කරන්නේය. ආනන්දය, සුජාතා උපාසිකාව සංයෝජන තුනක් ක්ෂය කිරීම හේතුකොට ගෙන සෝවාන් ඵලයට පැමිණියාය. සතර අපායෙහි නොහෙළන ස්වභාව ඇතිව අර්හත් ඵල ඥානයට නියත වූවාය.

"ආනන්දය, කකුධ උපාසකයා ඔරංභාගිය සංයෝජන පහ නැති කිරීම නිසා ඖපපාතිකව (බ්‍රහ්ම ලොකයෙහි) උපන්නේය. එහිදීම (බඹලොවදීම) පිරිනිවන් පාන්නේය. ඒ (බ්‍රහ්ම) ලොකයෙන් නොපෙරලෙන ස්වභාව ඇත්තේය.

"ආනන්දය, කාලිංග උපාසකයා ඔරම්භාගිය සංයෝජන පහ නැති කිරීමෙන් ඖපපාතිකව (බඹලොව) උපන්නේය. එහිදීම පිරිනිවන් පාන්නේය. ඒ ලෝකයෙන් නොපෙරළෙන ස්වභාව ඇත්තේය. ආනන්දය, නිකට උපාසකයා ඔරම්භාගිය සංයෝජන පහ නැතිකිරීම නිසා ඖපපාතිකව උපන්නේය. එහිදීම පිරිනිවන් පාන්නේය. ඒ ලොකයෙන් නොපෙරළෙන ස්වභාව ඇත්තේය. ආනන්දය, කටිස්සභ උපාසකයා ඔරම්භාගිය සංයෝජන පහ නැතිකිරීමෙන් ඖපපාතිකව (බඹලොව) උපන්නේය. එහිදීම පිරිනිවන් පාන්නේය, ඒ ලොකයෙන් නොපෙරළෙන ස්වභාව ඇත්තේය. ආනන්දය, තුඪ උපාසකයා ඔරම්භාගිය සංයෝජන පහ නැතිකිරීමෙන් ඖපපාතිකව (බඹලොව) උපන්නේය. එහිදීම පිරිනිවන් පාන්නේය. ඒ ලොකයෙන් නොපෙරළෙන ස්වභාව

ඇත්තේය. ආනන්දය, සන්තුෂ්ඨ උපාසකයා ඔරම්භාගිය සංයෝජන පහ නැතිකිරීමෙන් ඔපපාතිකව (බඹලොව) උපන්නේය. එහිදීම පිරිනිවන් පාන්නේය. ඒ ලොකයෙන් නොපෙරළෙන ස්වභාව ඇත්තේය. ආනන්දය, භද්ද උපාසකයා ඔරම්භාගිය සංයෝජන පහ නැතිකිරීමෙන් ඔපපාතිකව (බඹලොව) උපන්නේය. එහිදීම පිරිනිවන් පාන්නේය. ඒ ලොකයෙන් නොපෙරළෙන ස්වභාව ඇත්තේය.

"ආනන්දය, නාදිකා ගමෙහි තවත් පණසකට වැඩිගණනක් උපාසකයෝ ඔරම්භාගිය සංයෝජන පහ නැතිකිරීමෙන් ඔපපාතිකව (බඹලොව) උපන්නාහුය. ඒ ලොකයෙන් නොපෙරළෙන ස්වභාව ඇත්තාහු එහිදීම පිරිනිවන් පාන්නාහුය. ආනන්දය, නාදිකා නම් ගමෙහි අනූවකට වැඩිදෙනෙක් කළුරිය කළාහු, සංයෝජන තුනක් නැතිකිරීම නිසා රාග ද්වෙෂ මොහයන් තුනීකිරීම හේතුකොටගෙන සකෘදාගාමි වූවාහු මේ ලොකයට එකවරක් පමණක් ඇවිත් දුක් කෙළවර කරන්නාහුය. ආනන්දය, නාදිකා නම් ගමෙහි පන්සියයකට වැඩිතරමක් උපාසකයෝ කලක්‍රියාකළාහු සංයෝජන තුනක් නැතිකිරීම හේතුකොටගෙන සෝවාන් ඵලයට පැමිණියාහු, (සතර) අපායට නොහෙළන ස්වභාව ඇත්තාහු අර්හත් ඵලයට නියත වූවාහුය.

5 "ආනන්දය, මිනිහෙක් මැරෙන්නේය යනු පුදුමයක් නොවේ. ඉදින් ඒ ඒ මිනිසුන් මැරුණු කල තථාගතයන් වහන්සේ වෙත පැමිණ, මේ කාරණය අසත් නම්, ආනන්දය, මේ ඇසීම තථාගතයන් වහන්සේට වෙහෙස වන්නේය. එහෙයින් ආනන්දය, 'ධර්මදාස' (ධර්ම කන්නාඩිය) නම් ධර්මක්‍රමයක් දෙශනා කරන්නෙමි.

"යම් ධර්මයකින් යුක්තවූ උතුම් ශ්‍රාවකයා ඉදින් කැමති වන්නේ නම්, නිරා දුක් නැති කෙළෙමි. තිරිසන් යොනියෙහි දුක නැති කෙළෙමි. ප්‍රෙත දුක් නැති කෙළෙමි. නපුරු ගති ඇති අපාය නැති කෙළෙමි. මම අපායෙහි නොහෙළන ස්වභාව ඇත්තාවූ රහත් බවට නියතවූ සෝවාන් ඵලයට පැමිණියෙක් වෙමියි තමන් විසින්ම තමන් ගැන ප්‍රකාශ කරන්නේද එවැනි ධර්ම ක්‍රමයකි.

"ආනන්දය, යම් ධර්මයකින් යුක්තවූ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම ඉදින් කැමතිවන්නේ නම් නිරාදුකින් මම නිදහස් වීමි. ප්‍රෙත දුකින් නිදහස් වීමි. තිරිසන් දුකින් නිදහස් වීමි. නපුරු ගති ඇති අපාය දුකින් නිදහස් වීමි. අපායට නොහෙළන ස්වභාව ඇත්තාවූ රහත් බවට නියතවූ සෝවාන් ඵලයට පැමිණියෙමියි' තමා ගැන තමා විසින්ම ප්‍රකාශ කරන්නේද? ඒ "ධර්මදාස" නම් ධර්ම ක්‍රමය කවරේද?

**6** ආනන්දය, මේ ශාසනයෙහි උතුම් ශ්‍රාවකතෙම (ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙන් අර්හත්ය, සම්‍යක් සම්බුද්ධය, විදර්ශනාඥාන ආදී විද්‍යා අට සීලසංවරය ආදී හසුරුවන ධර්ම පහළොව යන අෂ්ට විද්‍යා පසළොස්වරණ ධර්මයන්ගෙන් යුක්තය. යහපත් ගති ඇත්තාහ, සියලු ලොකයන් දන්නාහ, ශ්‍රෙෂ්ඨය, හික්මවියයුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනිය, දෙවිමිනිසුන්ට ගුරුවරයෙක්වූහ. සත්‍යවූ උතුම් ධර්ම සතර (චතුරාර්‍ය්‍ය සත්‍යය) අවබොධ කළසේක. භාග්‍යවත්වූසේකැයි බුදුරජාණන් වහන්සේ කෙරෙහි නොසෙල්වන පැහැදීමෙන් යුක්තවූයේද, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ධර්මය මනාකොට දෙශනා කරන ලද්දේය. මේ ආත්මයේදීම දැක්කහැකිවූ ඵල ඇත්තේය. කල් නොයවා ලැබියයුතු ඵල ඇත්තේය. 'එව, බලවයි' දැක්විය හැකිවූ ගුණ ඇත්තේය. නිර්වාණය කරා පමුණුවන්නේය. නුවණැත්තන් විසින් ඊට පැමිණ තම තමන්ගේ සිතින්ම දතයුතුවූ ගුණ ඇත්තේයයි ධර්මය කෙරෙහි නොසෙල්වෙන පැහැදීමෙන් යුක්තවේද භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ඍජුව (කෙළින්) පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ගරු බුහුමනට සුදුසු පරිදි පිළිපන්නේය. යම් මේ පුරුෂ යුගල සතරක් වන්නාහුද, (පුරුෂ පුද්ගල වශයෙන්) අටදෙනෙක් වන්නාහුද, භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවක සංඝයා සොයා ගොස් පිදිය යුතු භොජනය පිළිගැනීමට සුදුසුය, පරලොව අදහා දෙන දානය (දක්ෂිණාව) පිළිගැණීමට සුදුසුය (අංජලීකර්මයට) දෑත හිස මත තබා වැඳීමට සුදුසුය, ලොකයාට උතුම්වූ පින්

කෙතක් වැනියයි සංසරත්නය කෙරෙහි නොසෙල්වෙන ඇදහීමෙන් යුක්ත වේද, නොකැඩුනාවූ, සිදුරු නොවූ, පැල්ලම් නැති කැලැල් නොවූ, තණ්හාවට වාල් නොවූ නුවණ ඇත්තන් විසින් ප්‍රශංසා කරන්නාවූ, දොස් රහිතවූ සමාධිය පිණිස පවත්නාවූ උත්තමයන්ට ප්‍රිය මනාපවූ සීලයෙන් යුක්තවේද, ආනන්දය, යම් ධර්මයකින් යුක්තවූ උතුම් ශ්‍රාවක තෙම ඉදින් කැමතිවන්නේ නම්, 'නිරා දුකින් මිදුනෙමි. තිරිසන් දුකින් මිදුනෙමි. ප්‍රෙත දුකින් මිදුනෙමි. නපුරු ගති ඇති අපාය දුකින් මිදුනෙමි. මම අපායෙහි නොවැටෙන ස්වභාව ඇත්තාවූ රහත් බවට නියතවූ සෝවාන් ඵලයට පැමිණියෙමියි' තමාම තමන් ගැන ප්‍රකාශ කරන්නේද ඒ ධර්මදාසනම් ක්‍රමය මෙය වන්නේය.

7 එතැන්හිද භාග්‍යවතුන් වහන්සේ නාදිකා ගමෙහි එක් උළු ගෙයක වාසය කරන සේක්. බොහෝසෙයින් මේ ධර්මයම දෙශනා කරන්නාහ. මේ උතුම්වූ ශීලයයි කියාද, මේ උතුම්වූ සමාධියයි කියාද, මේ උතුම්වූ ප්‍රඥාවයයි කියාද, ශීලයෙහි සිට වඩන (පුරුදු කරන) ලද සමාධිය මහත් ඵල මහානිසංස වන්නේය. සමාධියෙහි සිට වඩන ලද නුවණ මහත්ඵල මහානිසංස වන්නේය. නුවණින් පුරුදු කරන ලද සිත ආශ්‍රවයන් (කෙලෙසුන්) ගෙන් මිදෙන්නේයයි" පැවසූහ. ඒ ආශ්‍රව (කෙලෙස්) නම්, කාමාශ්‍රවයෝය, භවාශ්‍රවයෝය, දෘෂ්ටි ආශ්‍රවයෝය, අවිද්‍යා ආශ්‍රවයෝය යන මොහුයි.

8 භාග්‍යවතුන් වහන්සේ නාදිකා නම් ගමෙහි කැමති කාලයක් වාසය කොට ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට කථා කළහ. "ආනන්දය එන්න, විසාලාමහනුවර යම් තැනකද එතැනට යමුයි" පැවසූහ. "එසේය ස්වාමීනියි" ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේ උත්තර දුන්හ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහත්වූ භික්ෂු සංඝයා හා සමග විශාලාමහනුවර යම් තැනෙක්හිද එතැනට පැමිණියෝය. එතැන්හි භාග්‍යවතුන් වහන්සේ විශාලාමහනුවර සමීපයෙහිවූ, අම්බපාලි නම් ගණිකාවගේ (දක්ෂ නාට්‍ය ගීත කලා දක්වන්නියගේ) අඹ උයනෙහි වාසය කරන සේක.

එකල භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට කථා කළහ. "මහණෙනි, භික්ෂුව සිහියෙන් යුක්තවූයේ, මනා නුවණින් යුක්තවූයේ වාසය කරන්නේය. මේ වනාහි අපගේ අනුශාසනාවයි. මහණෙනි, භික්ෂුව කෙසේ නම් සිහියෙන් යුක්තවේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව නුවණින් යුක්ත වූයේ සිහියෙන් යුක්ත වූයේ පඤ්චස් කන්ධ නමැති ලොකයෙහි ලොභයද නොසතුටු බවද දුරුකොට මේ කයෙහි කය අනුව බලමින් වාසය කරන්නේය. මේ ශාසනයෙහි භික්ෂුව කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, නුවණින් හා සිහියෙන් යුක්තවූයේ පඤ්චස්කන්ධය නමැති ලොකයෙහි ලොභයද, නොසතුටු බවද සංසිඳුවාගෙන විඳීම අනුව බලමින් වාසය කරන්නේය. මේ ශාසනයෙහි භික්ෂුව කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව ඥාණයෙන් යුක්තව, සිහියෙන් යුක්තව, පඤ්චස්කන්ධ නමැති ලොකයෙහි ලොභයද නොසතුටු බවද සංසිඳුවාගෙන සිත අනුව බලමින් වාසය කරන්නේය. මේ ශාසනයෙහි භික්ෂුව කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුතුව, ඤාණයෙන් යුතුව, සිහියෙන් යුතුව පඤ්චස්කන්ධය නමැති ලොකයෙහි ලොභයද නොසතුටු බවද සංසිඳුවාගෙන නීවරණාදී ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. මහණෙනි, භික්ෂුව මෙසේ සිහියෙන් යුක්තව වාසය කරන්නේ නම් වෙයි.

"මහණෙනි, භික්ෂුව කෙසේ නම් නො නුවණින් යුක්ත වන්නේද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව ඉදිරියට යාමෙහිද ආපසු යාමෙහිද නුවණින් දැන කරන්නේය. ඉදිරි බැලීමෙහිද වටපිට බැලීමෙහිද නුවණින් දැන කරන්නේය. අත් පා හැකිලීමෙහිද දිගු කිරීමෙහිද නුවණින් දැන කරන්නේය. දෙපොට සිවුරය, තනිපොට සිවුරය, පාත්‍රය යන මේ දේ දැරීමෙහිද නුවණින් දැන එසේ කරන්නේය. අනුභව කිරීමෙහිද, පානය කිරීමෙහිද, වැළඳීමෙහිද, රස විඳීමෙහිද, නුවණින් යෙදී කරන්නේය, මළ මුත්‍ර පහකිරීමෙහිද නුවණින් යුක්තව එසේ කරන්නේය.

"යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොර කිරීම්, කථා කිරීම්, නිශ්ශබ්දව සිටීම් යන මේ දේ නුවණින් දැන කරන්නේය.

මහණෙනි, මෙසේ වනාහි භික්ෂුව නුවණින් දැන කරන්නේ වේ. මහණෙනි, මහණතෙම මනා නුවණින් සහ සිහියෙන් යුක්තව වාසය කරන්නේය. මේ වනාහි අපගේ අනුශාසනාව නම් වන්නීය.

**9** අම්බපාලී නම් ගණිකාව (දක්ෂ නාට්‍ය ගීත දක්වන්නිය) "භාග්‍යවතුන් වහන්සේ වනාහි විශාලාමහනුවරට පැමිණ විශාලාමහනුවර සමීපයෙහිවූ මගේ අඹ උයනෙහි වැඩවසති" යන මේ ආරංචිය ඇසුවාය. එවිට අම්බපාලි නම් ගණිකාව (දක්ෂ නාට්‍ය ගීත කලා දක්වන්නිය) හොඳ හොඳ යානාවන් යොදවා විසිතුරු යානාවකට නැගී හොඳ හොඳ යානාවලින් විශාලාමහනුවරින් නික්මුණාය. තමාගේ අඹවන උයන යම් තැනෙකද එතැනට ගියාය. යානාවෙන් යායුතු තැන් එසේ ගොස් යානාවෙන් බැස පා ගමනින්ම භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එතනට පැමිණියාය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට හොඳින් වැඳ එක පැත්තක උන්නාය. එක පැත්තක උන්නාවූ අම්බපාලි නම් ගණිකාවට (දක්ෂ නාට්‍ය ගීත කලා දක්වන්නිය) භාග්‍යවතුන් වහන්සේ ධර්මයෙන් යුත් කථාවෙන් මෙලොව පරලොව යහපත දක්වා වදාළහ. එහි සමාදන් කරවූහ. සිත් දියුණු කරවූහ. සිත පැහැදවූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්ම කථාවෙන් මෙලොව පරලොව යහපත දක්වන ලද්දාවූ, එහි සමාදන් කරවන ලද්දාවූ එහි සිත් තියුණු කරවන ලද්දාවූ, සිත පහදවන ලද්දාවූ අම්බපාලි නම් ගණිකාව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවාය.

"ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ භික්ෂු සංඝයා සමග හෙට දවස මාගේ දානය පිළිගනිත්වා. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දව එය පිළිගත්හ. අම්බපාලි නම් ගණිකාව භාග්‍යවතුන් වහන්සේගේ පිළිගැනීම දැන උන් ආසනයෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ (ප්‍රදක්ෂිණාකොට) ගෞරවයෙන් ගියාය.

**10** විසාලාමහනුවර වසන්නාවූ ලිච්ඡවි රජදරුවෝද භාග්‍යවතුන් වහන්සේ වනාහි විසාලා මහනුවරට පැමිණ විසාලා

මහනුවර සමීපයෙහි අම්බපාලි උයනෙහි වාසය කරන්නාහයි ඇසූහ. එවිට ඒ ලිච්ඡවි දරජදරුවෝද හොඳ හොඳ යානාවන් යොදවා, හොඳ හොඳ යානා වලට නැගී හොඳ හොඳ යානාවලින් විසාලා මහනුවරින් නික්මුණාහුය. එහි සමහර ලිච්ඡවි රජදරු කෙනෙක් නිල්පාට ආභරණයෙන් සැරසුණාහු නිල්පාට වස්ත්‍ර ඇඳ, නිල්පාට වූහ. එහි සමහර ලිච්ඡවි රජදරු කෙනෙක් රත්‍රං පාටින් සැරසී, රත්‍රං පාට ඇඳුම් ඇඳ රත්‍රං පාට වූහ. ඇතැම් ලිච්ඡවි රජදරු කෙනෙක් රතුපාටින් සැරසී රතුපාට ඇඳුම් ඇඳ රතුපාට වූහ. ඇතැම් ලිච්ඡවි රජදරු කෙනෙක් සුදු පාටින් සැරසී සුදුපාට වස්ත්‍ර හැඳ සුදු වූහ.

එවිට අම්බපාලි නම් ගණිකාව (දක්ෂ නාට්‍ය ගීත කලා දක්වන්නිය) තරුණ තරුණ ලිච්ඡවි රජදරුවන්ගේ රථ තමාගේ රථවලින් හිසින් හිස, රොදයෙන් රොදය, වියගසෙන් වියගස හප්පමින් ඉක්මනින් යන්නීය. එවිට ඒ ලිච්ඡවීහු අම්බපාලි නම් ගණිකාව (දක්ෂ නාට්‍ය ගීත දක්වන්නියට) මෙසේ කීවාහුය. "අම්බපාලිය, තරුණ තරුණ ලිච්ඡවීන්ගේ රථ හිසින් හිස, රෝදයෙන් රෝදය, වියගසෙන් වියගස හප්පමින් යන්නේ මක්නිසාදැයි" ඇසූහ. "ඒ එසේමය, ආර්‍ය්‍ය පුත්‍රවූ රජ දරුවෙනි මා විසින් භික්ෂු සංඝයා සමග භාග්‍යවතුන් වහන්සේට හෙට දවස දානය පිණිස ආරාධනය කෙළෙමියි" කීවාය. "අම්බපාලිය මේ බත හෙවත් තොප විසින් කරන ලද ආරාධනය ඇති බත කහවනු ලක්ෂයක් ගෙන අපට දෙවයි" ඉල්ලූහ. "ආර්‍ය්‍ය පුත්‍රවූ රජදරුවෙනි, ජනපද සහිත විසාලා මහනුවර දුන්නේවී නමුත් මේ ආනිසංස ඇති බත නොදෙමියි" කීය. එවිට ඒ ලිච්ඡවීහු "පින්වත්නි, ඒකාන්තයෙන් ගැහැණියක විසින් අපි පරදවන ලදුම්හ. පින්වත්නි, ඒකාන්තයෙන් ගැහැණියක විසින් අපි වංචාකරන ලදුම්හයි" කියා ඇඟිලි එකට ගැසුවාය.

11 ඉක්බිති ඒ ලිච්ඡවීහු අම්බපාලි උයන යම් තැනකද එතැනට ගියාහුය. භාග්‍යවතුන් වහන්සේ දුරින්ම එන්නාවූ ඒ ලිච්ඡවීන් දුටහ. දැක, භික්ෂූන්ට කථාකළහ. "මහණෙනි, තොප අතුරෙන් යම් භික්ෂුකෙනෙක් තව්තිසා වැසි දෙවියන් නොදුටුවාහු වෙද්ද, මහණෙනි, ලිච්ඡවි රජ පිරිස් බලව්!

මහණෙනි මේ ලිච්ඡවී පිරිස නැවත නැවත බලව්. මහණෙනි, ලිච්ඡවි පිරිස තව්තිසා වැසි දෙව්පිරිස හා සමානකොට දැන ගනිව්යි" කීය.

ඉක්බිති ඒ ලිච්ඡවීහු යානාවෙන් යායුතු භූමිය යානාවෙන් ගොස් යානාවෙන් බැස, පයින්ම ගොස් භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එතැනට එළඹියාහුය. එළඹ භාග්‍යවතුන් වහන්සේට හොඳින් වැඳ එකපැත්තක උන්හ. එකපැත්තක උන්නාවූ ඒ ලිච්ඡවීන්ට භාග්‍යවතුන් වහන්සේ ධර්මයෙන් යුක්ත කථාවෙන් දෙලොව යහපත දක්වා එහි සිත් සමාදන් කරවා, සිත් තියුණු කරවා, ප්‍රසන්නකරවාලූහ.

එවිට භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මයෙන් යුක්ත කථාවෙන් යහපත දක්වන ලද්දාවූ, එහි සමාදන් කරවන ලද්දාවූ එහි සිත් තියුණු කරන ලද්දාවූ, ප්‍රසන්න කරවන ලද්දාවූ ඒ ලිච්ඡවීහු භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා හා සමග හෙට දවස අපගේ දානය ඉවසනු මැනව."

"ලිච්ඡවි රජදරුවෙනි, සෙට දවස අම්බපාලි නම් ගණිකාවගේ (දක්ෂ නාට්‍ය ගීත දක්වන්නියගේ) දානය මා විසින් පිළිගන්නා ලදී."

එවිට ඒ ලිච්ඡවීහු පින්වත්නි, ඒකාන්තයෙන් ගැහැණියක විසින් අප පරදවන ලදුම්හ. පින්වත්නි, ඒකාන්තයෙන් ගැහැණියක විසින් අප රවටනලදුම්හ" යි කියා ඇඟිලි එකට ගැසූහ.

ඉන්පසු ඒ ලිච්ඡවීහු භාග්‍යවතුන් වහන්සේගේ වචනයට විශෙෂයෙන් සතුටුව අනුමෝදන්ව ආසනයෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට හොඳින් වැඳ (ප්‍රදක්ෂිණාකොට) ගෞරවයෙන් ගියාහුය,

12 එවිට අම්බපාලි නම් ගණිකාව (දක්ෂ නාට්‍ය ගීත දක්වන්නිය) ඒ රාත්‍රිය පසුවූකල තමන්ගේ ගෙදර රසවත්වූ කැයුතු

දෙය බුදියයුතු දෙය පිළියෙල කරවා, "ස්වාමීන් වහන්ස, දානය (බත) සම්පාදනය විය. දැන් ඊට කාලයයි" දැන්වූවාය. එවිට භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරුගෙන භික්ෂු සංඝයා හා සමග අම්බපාලි නම් ගණිකාවගේ (දක්ෂ නාට්‍ය ගීත දක්වන්නියගේ) ගෙය යම්තැනකද එතැනට එළඹියේය. එළඹ පණවන ලද ආසනයෙහි වැඩ උන්හ. ඉක්බිති අම්බපාලි නම් ගණිකාව ((දක්ෂ නාට්‍ය ගීත දක්වන්නිය) බුදුන් ප්‍රධාන භික්ෂු සංඝයා රසවත්වූ කෑයුතු බුදියයුතු දෙයින් සියතින් වැළඳවූවාය. ඇතිතාක් වැළඳවූවාය. එවිට අම්බපාලි නම් ගණිකාව (දක්ෂ නාට්‍ය ගීත දක්වන්නිය) භාග්‍යවතුන් වහන්සේ වළඳා අවසන්ව පාත්‍රයෙන් අත ඉවතට ගත් බව දැන එක්තරා පහත් ආසනයක් ගෙන එකපැත්තක උන්නාය. එකපැත්තක උන්නාවූ අම්බපාලි නම් ගණිකාව (දක්ෂ නාට්‍ය ගීත දක්වන්නී) භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවාය. "ස්වාමීනි, මාගේ අඹඋයන බුදුන් ප්‍රධාන භික්ෂු සංඝයාට දෙමියි" භාග්‍යවතුන් වහන්සේ අඹඋයන පිළිගත්හ. ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ අම්බපාලි නම් ගණිකාවට (දක්ෂ නාට්‍ය ගීත දක්වන්නියට) ධාර්මික කථාවෙන් දෙලොව යහපත දක්වා එහි සිත සමාදන් කරවා සිත තියුණු කරවා, ප්‍රසන්න කරවා, ආසනයෙන් නැගිට වැඩියහ. එකල්හිද භාග්‍යවතුන් වහන්සේ විසාලාමහනුවර අම්බපාලි අඹවනයෙහි වාසයකරන සේක් භික්ෂූන්ට බොහෝකොට මේ ධර්ම කථාවම කරන්නාහ. "මේ උතුම්වූ ශීලයයිකියාද, මේ උතුම්වූ සමාධියයි කියාද, මේ උතුම්වූ ප්‍රඥාවයයි කියාද, ශීලයෙහි සිට වඩනලද සමාධිය මහත්ඵල මහා ආනිසංස වන්නේය. සමාධියෙහි සිට වඩනලද සිත ආශ්‍රවයන්ගෙන් මිදෙන්නේය. ඒ ආශ්‍රව (කෙලෙස්) නම් කාමාශ්‍රවයෝය, භවාශ්‍රවයෝය, දෘෂ්ටි ආශ්‍රවයෝය, අවිද්‍යා ආශ්‍රවයෝය යන මොහුයි."

13 එවිට භාග්‍යවතුන් වහන්සේ අම්බපාලි උයනෙහි කැමති කාලයක් වාසයකොට, ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේට කථාකළහ. "ආනන්දය, එන්න, බෙළුව නම් ගම යම්තැනෙක්හිද එහි යමු"යි කීහ. "එසේය ස්වාමීනි"යි ආයුෂ්මත්වූ

ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

භාග්‍යවතුන් වහන්සේ මහත්වූ භික්ෂු සංඝයා හා සමග බෙළුව නම් ගම යම්තැනකද එතැනට පැමිණියාහ. එතැන්හිද භාග්‍යවතුන් වහන්සේ බෙළුව නම් ගමෙහි වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට කථාකළහ. "මහණෙනි, (මෙහි) එව්! තොපි විසාලාමහනුවර හාත්පස මිත්‍රවූද, දැක පුරුදු ඇත්තාවූද, එකට අනුභවකොට පුරුදුවූද භික්ෂූහු ඇත්නම් ඔවුන් හා සමග වස් වසව්. මම වනාහි මේ බෙළුව නම් ගමෙහිම වස් එළඹෙමි"යි කීහ. "එසේය, ස්වාමීනියි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දී විසාලාමහනුවර අවට මිත්‍රවූද එකට දැක පුරුදු ඇත්තාවූද අනුභවකොට පුරුදුවූද ඒ භික්ෂූන් සමග වස් වැසූවාහ. භාග්‍යවතුන් වහන්සේ වනාහි ඒ බෙළුව ගමෙහි වස් වැසූහ.

එකල්හි වස්වැසුවාවූ භාග්‍යවතුන් වහන්සේට දරුණුවූ ආබාධයක් (රෝගයක්) උපන්නේය. මරණය පැමිණීමට තරම් ඉතා බලවත් වේදනාවෝ ඇතිවූහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ එහා මෙහා පෙරලීම් වශයෙන් දුකින් නොපෙළෙමින් සිහි එළවා නුවණින් පිරිසිඳ දැන බලවත්වූ ඒ දුක් වේදනාව ඉවසාගත්තෝය. එවිට භාග්‍යවතුන් වහන්සේට මෙබඳු අදහසක් ඇතිවිය. 'මම උපස්ථායකයන්ට කථා නොකොට භික්ෂු සංඝයාට නොදන්වා ධර්මානුශාසනා නොදී පිරිනිවන් පාන්නෙම් නම් එය මට සුදුසු නොවේමය. මම බලවත් දුක් වේදනා ඇති මේ රෝගය පූර්වභාගවීර්‍ය්‍ය, ඵලසමා පත්තිවීර්‍ය්‍ය යන දෙයාකාර වීර්‍ය්‍ය බලයෙන් මැඩපවත්වා ඵල සමාපත්ති ධර්මයයි කියූ ජීවිත සංස්කාරය යහපත්සේ පිහිටුවීම් වශයෙන් ජීවිතය තැබීමට සමර්ථවූ ඵලසමාපත්තීන්ගෙන් යුක්තව වාසය කරන්නෙම් නම් ඉතා හොඳයයි" සිතුවෝයි.

එකල භාග්‍යවතුන්වහන්සේ ඒ ආබාධය වීර්‍ය්‍යබලයෙන් මැඩපවත්වා ජීවිත සංස්කාරය අධිෂ්ඨානකොට වාසය කළ සේක. ඊටපසුව භාග්‍යවතුන් වහන්සේගේ ඒ ආබාධය

මැඩපැවැත්තේය. ඊට අනතුරුව භාග්‍යවතුන් වහන්සේ අසනීපයෙන් නැගී සිටි ගිලාන භාවයෙන් නැගී සිටී නොබෝකල් ඇත්තේ විහාරයෙන් නික්ම විහාර සෙවනෙහි පණවනලද ආසනයෙහි වැඩ සිටියෝය.

14 එකල භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැනට ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ පැමිණියෝය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ හොඳින් වැඳ එක පැත්තක උන්හ. එක පැත්තක උන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය කීවෝය.

"ස්වාමීන්වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ ආබාධය මඳක් පහසු බව දක්නා ලදී. ඉවසිය හැකි බව දක්නා ලදී.

"ස්වාමීන්වහන්ස, එහෙත් මාගේ ශරීරය ඉතා බරවූවක් තදවූවක් මෙන් විය. භාග්‍යවතුන් වහන්සේගේ අසනීපය නිසා මට උතුර දකුණ ආදී දිසාවන් නොවැටහෙන්නේය. සතර සතිපට්ඨානාදී ධර්මයෝද නොවැටහෙන්නාහුය. ස්වාමීන් වහන්ස, එහෙත් මට කිසියම් සැනසීමක් පහළවූයේය.

"එනම්, භාග්‍යවතුන් වහන්සේ යම්තාක් කාලයක් භික්ෂු සංඝයාට අන්තිම අවවාදයක් නොවදාරණසේක්ද ඒතාක් භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් නොපානාසේක යනුයි.

"ආනන්දය, කිමෙක්ද? භික්ෂු සංඝයා තෙමේ මා කෙරෙහි බලාපොරොත්තු වන්නේදැයි" ඇසූසේක. "ආනන්දය, මා විසින් පුද්ගල වශයෙන් හෝ ධර්මවශයෙන් හෝ ඇතුළත්ය පිටත්යයි වෙන්කොට ධර්ම දෙශනා නොකරණ ලද්දේය.

"ආනන්දය, ඒ ධර්මයන් කෙරෙහි තථාගතයන්වහන්සේගේ ගුරු මුෂ්ටියක් (නොකියා ඉතුරු කරගත් දෙයක්) නැත්තේය. ආනන්දය, යමෙකුට මෙබඳු අදහසක් වන්නේද කෙසේදයත්, මමම භික්ෂු සංඝයා පරිහරණය කෙරෙමි කියා හෝ භික්ෂු සංඝ තෙමේ මා උදෙසාම වාසය කරන්නේය කියායි. ආනන්දය ඒකාන්තයෙන් මෙබඳු අදහස් ඇත්තේ නම් භික්ෂු සංඝයා ගැන කිසියම් අන්තිම වචනයක් ගෙනහැර දක්වන්නේය. ආනන්දය,

තථාගතයාණන්ට මෙබඳු අදහසක්නොවෙයි. කෙසේද, ‘මමම භික්ෂු සංඝයා පරිහරණය කෙරෙමි කියා හෝ, භික්ෂු සංඝයා මා උදෙසාම වාසය කරන්නේය කියායි.’ ආනන්දය, ඒ තථාගත තෙමේ භික්ෂු සංඝයා අරබයා කුමක් ගෙනහැර දක්වන්නේද? ආනන්දය, මම දැන් ජරාවෙන් දිරුණේ වෙමි, වයසින් වැඩිසිටියේ වෙමි, ජාතියෙන් මහලු බවට පැමිණියේ වෙමි, බොහෝ කල් ඉක්මවූයෙමි, වයස්හුගේ කෙළවරට පැමිණියෙමි, මාගේ වයස දැන් අසූවක්ව පවතී. ආනන්දය, ජරාවට පැමිණි රථයක් පෑස්සීමාදියෙන් ප්‍රතිසංස්කරණ කිරීමෙන් යම්සේ පවතීද, ආනන්දය, එපරිද්දෙන්ම තථාගතයන් වහන්සේගේ ශරීරය අර්හත් ඵල වේගයෙන් බඳනාලදුව යැපේයයි සිතමි” කීවෝය. “ආනන්දය, යම් කලෙක්හි තථාගත තෙමේ සියලු නිමිති මෙනෙහි නොකිරීමෙන් සමහර වේදනාවන්ගේ නිරොධයෙන් චිත්ත සමාධියට පැමිණ වාසය කෙරේද, ආනන්දය, එකල්හි තථාගතයන්ගේ ශරීරය සමවත් සුව විහරණයෙන් පහසු කරණ ලද්දේ වෙයි. ආනන්දය, එහෙයින් මේ ශාසනයෙහි තමා පිහිටකොට ඇත්තෝව වාසය කරව්. තමාම පරම පිහිටකොට ඇත්තෝවව්. අනිකක් පිහිටකොට ඇත්තෝ නොවව්. ආනන්දය, භික්ෂුතෙමේ කෙසේ නම් තමාම තමහට එලියක් මෙන් පිහිටකොට ඇත්තේ ධර්මය උතුම් පිහිටකොට ඇත්තේ අනිකක් පිහිටකොට නැත්තෙක්ව වාසය කෙරේදයත්, ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව හොඳ නුවණ ඇතිව සිහියෙන් යුක්තව පඤ්චස්කන්ධ ලෝකයෙහි ලෝභය හා අසතුට දුරුකර කයෙහි කය අනුව බලමින් වාසය කරන්නේය. මේ ශාසනයෙහි භික්ෂුතෙම කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ස්කන්ධ ලෝකයෙහි ලෝභය හා දොම්නස මැඩපවත්වා වේදනා අනුව බලමින් වාසයකෙරේද, මේ ශාසනයෙහි භික්ෂුතෙම කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව හොඳ නුවණ ඇතිව සිහි කල්පනාවෙන් යුතුව පඤ්චස්කන්ධ ලොකයෙහි ලෝභය හා දොම්නස මැඩපවත්වාගෙන සිත නැවත නැවත දක්නා ස්වභාව ඇතිව වාසය කෙරේද, මේ ශාසනයෙහි භික්ෂු තෙම කෙලෙස් තවන

වීර්‍යයී ඇතිව යහපත් නුවණ ඇතිව හොඳ සිහියෙන් යුක්තව ස්කන්ධලෝකයෙහි ලෝභය හා සෝකය යන දෙක මැඩපවත්වා නීවරණාදී ධර්ම අනුව බලමින් වාසය කරයිද, ආනන්දය, මේ භික්ෂුතෙම තමාම තමහට පිහිට කොට ඇත්තේ තමාම තමහට උතුම් පිහිටකොට ඇත්තේ අනිකක් පිහිටකොට නැත්තේ ධර්මය පිහිටකොට ඇත්තේ ධර්මයම උතුම් පිහිටකොට ඇත්තේ අනිකක් පිහිටකොට නැත්තෙක්ව වාසය කෙරේයයි වදාළෝය. ආනන්දය, යම්කිසි භික්ෂුකෙනෙක් දැන් හෝ මා නැති කල හෝ තමාම තමාට එළියක් මෙන් පිහිටකොට ඇත්තෝව ධර්මය උතුම් පිහිට කොට ඇත්තෝව අනිකක් පිහිටකොට නැත්තෝව වාසය කරන්නාහු වෙත්ද, ධර්මය එළියක් මෙන් පිහිටකොට ඇත්තෝව ධර්මයම උතුම් පිහිටකොට ඇත්තෝව, අනිකක් පිහිටකොට නැත්තෝව වාසය කරන්නාහු වෙත්ද, ආනන්දය, ශික්ෂාකාමිවූ යම් භික්ෂු කෙනෙක් වෙත්ද, ඒ භික්ෂූහු මාගේ ශාසනයෙහි අතිශ්‍රෙෂ්ඨ භාවයෙහි පිහිටියෝ වෙත්යයි” වදාළෝය.

දෙවෙනි බණවර නිමියේය.

---

**3**

1 එවිට භාග්‍යවතුන් වහන්සේ උදෑසන කාලයෙහි මනාකොට හැඳ පොරවා සිවුරු හා පාත්‍රය ගෙන විශාලා මහනුවරට පිණ්ඩපාතය පිණිස ගියසේක. විසාලාමහනුවර පිඬු පිණිස හැසිර පිණ්ඩපාතයෙන් හැරී ආයේ සවස් කාලයෙහි ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේට කථාකර මෙසේ කීවෝය.

“ආනන්දය, නිසීදනය (හිඳගන්නා පත්කඩ) ගණුව. චාපාල චෛත්‍යස්ථානය යම් තැනෙක්හිද, එතැන්හි දිවා විහරණය (දවල් කාලයෙහි වාසය) පිණිස එලඹෙනු කැමැත්තෙමියි” කීවෝය.

“එසේය, ස්වාමීන්වහන්සැයි” කියා ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනයට උත්තරදී

භාග්‍යවතුන් වහන්සේගේ පසුපස්සෙහි ගියෝය. එවිට භාග්‍යවතුන් වහන්සේ චාපාල නම් චෛත්‍යස්ථානය යම් තැනෙක්හිද එතැනට පැමිණියෝය. පැමිණ පනවන ලද ආසනයෙහි වැඩ උන්නෝය. ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේද භාග්‍යවතුන් වහන්සේට මනාකොට වැඳ එක පැත්තක උන්නේය. එක පැත්තක උන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ මෙසේ කීවෝය.

"ආනන්දය, මේ විසාලා නුවර ප්‍රිය කරන්නේය. උදෙන නම් චෛත්‍යස්ථානයද සිත් ප්‍රිය කරන්නේය. ගොතමක නම් චෛත්‍යයද සිත් ප්‍රිය කරන්නේය. සත්තම්බක නම් චෛත්‍යයද සිත් ප්‍රිය කරන්නේය. බහුපුත්‍රක නම් චෛත්‍යයද සිත් ප්‍රිය කරන්නේය. සාරන්දද නම් චෛත්‍යයද සිත් ප්‍රිය කරන්නේය. මේ චාපාල නම් චෛත්‍යයද සිත් ප්‍රිය කරන්නේය.

3 "ආනන්දය, යම් කිසිවෙකු විසින් හතර ආකාරවූ ඍද්ධිපාද ධර්මයෝ යහපත් කොට වඩන ලද්දාහු වෙද්ද, නැවත නැවත පුරුදුකරන ලද්දාහු වෙද්ද, නැඟීයන යානාවක් මෙන් කරණ ලද්දාහු වෙද්ද පිහිටීමට වස්තුවක් මෙන් කරන ලද්දාහු වෙද්ද, මනාකොට පිහිටා සිටින ලද්දාහු වෙද්ද, යහපත් කොට වඩන ලද්දාහු වෙද්ද, මනාකොට පටන්ගන්නා ලද්දාහු වෙද්ද ඔහු ඉදින් කැමතිවූයේ නම් සම්පූර්ණ ආයුෂ කාලය හෝ ඊට වැඩියෙන් හෝ ජීවත්වසිටින්නේය. ආයුෂ්මත් ආනන්දය තථාගතයන් වහන්සේ විසින් සතර වැදෑරුම්වූ ඍද්ධිපාද ධර්මයෝ යහපත්කොට වඩන ලද්දාහුය. නැවත නැවත පුරුදු කිරීම් වශයෙන් බහුල කොට කරන ලද්දාහුය. නැඟීයන යානාවක් මෙන් කරණ ලද්දාහුය. පිහිටීමට වස්තුවක් මෙන් කරන ලද්දාහුය. මනාකොට පිහිටා සිටින ලද්දාහුය. මනාකොට වඩන ලද්දාහුය. යහපත්ව පටන් ගන්නා ලද්දාහුය. ආනන්දය, ඒ තථාගත තෙම ඉදින් කැමැත්තේ නම් සම්පූර්ණ ආයුෂ කාලය හෝ ඊට වැඩියෙන් හෝ ජීවත්ව සිටින්නේයයි" කීවෝය.

4 ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ ඇඟවීම් කර වදාරණලද කල්හිදු මහත්

ලකුණු කර වදාරණලද කල්හිදු මාරයා විසින් මඩනාලද සිත් ඇති බැවින් කාරණය තේරුම්ගත නොහැකි විය. එහෙයින් "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, බොහෝ ජනයාට හිතපිණිස, සැප පිණිස, ලොවට අනුකම්පා පිණිස, දිව්‍යමනුෂ්‍යයන්ට යහපත පිණිස, හා හිත සැප පිණිස භාග්‍යවතුන් වහන්සේ සම්පූර්ණ ආයුෂ කාලය මුළුල්ලෙහි ජීවත්ව වැඩසිටිනා සේක්වායි කියා භාග්‍යවතුන් වහන්සේට යාඥා නොකළේය.

4 දෙවෙනි වරද භාග්‍යවතුන්වහන්සේ මෙසේ කීවෝය. "ආනන්දය, මේ විසාලා නුවර සිත් ප්‍රිය කරන්නේය. උදෙන නම් චෛත්‍ය ස්ථානයද සිත් ප්‍රිය කරන්නේය. ගොතමක නම් චෛත්‍ය සිත් ප්‍රිය කරන්නේය. සත්තම්බක නම් චෛත්‍යයද සිත් ප්‍රිය කරන්නේය. බහුපුත්‍රක නම් චෛත්‍යයද සිත් ප්‍රිය කරන්නේය. සාරන්දද නම් චෛත්‍යයද සිත් ප්‍රිය කරන්නේය. චාපාල නම් චෛත්‍යයද සිත් ප්‍රිය කරන්නේය.

"ආනන්දය, යම් කිසිවෙකු විසින් හතර ආකාර ඍද්ධිපාද ධර්ම වඩනලද්දාහු වෙද්ද නැවත නැවත පුරුදුකරන ලද්දාහුද නැඟීයන යානාවක් මෙන් කරණ ලද්දාහු වෙද්ද, පිහිටීමට වස්තුවක් මෙන් කරන ලද්දාහු වෙත්ද, හොඳින් පිහිටන ලද්දාහු වෙද්ද, යහපත්කොට වඩන ලද්දාහු වෙද්ද, හොඳින් පටන්ගන්නා ලද්දාහු වෙද්ද, ඔහු ඉදින් කැමතිවූයේ නම් සම්පූර්ණ ආයුෂ හෝ ඊට වැඩියෙන් හෝ ජීවත්ව සිටින්නේය. ආනන්දය, තථාගතයන් වහන්සේ විසින් හතර ආකාරවූ ඍද්ධිපාද ධර්ම යහපත් කොට වඩන ලද්දාහුය. නැවත නැවත පුරුදු කරන ලද්දාහුය, නැඟීයන යනාවක් මෙන් කරණ ලද්දාහුය. පිහිටීමට වස්තුවක් මෙන් කරණ ලද්දාහුය. හොඳින් පිහිටා සිටින ලද්දාහුය. හොඳින් වඩන ලද්දාහුය, යහපත්ව පටන්ගන්නා ලද්දාහුය, ආනන්දය, ඒ තථාගතතෙම ඉදින් කැමතිවූයේ නම් සම්පූර්ණ ආයුෂ හෝ ඊට වැඩියෙන් හෝ ජීවත්ව සිටින්නේයයි" කීවෝය.

ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ මහත්වූ හැඟීම් කර වදාරන ලද කල්හිද මහත්වූ ලකුණු දක්වනලද කල්හිද මාරයා විසින් මඩනාලද

සිත් ඇතිවූ බැවින් තේරුම්ගන්ට නොහැකිවූයේය. එහෙයින් 'ස්වාමීනි, භාග්‍යවතුන්වහන්ස, බොහෝ ජනයාට හිත පිණිස, සැප පිණිස, ලෝකයාට අනුකම්පා පිණිස, දිව්‍ය මනුෂ්‍යයන්ට යහපත පිණිස හා හිත සැප පිණිස, භාග්‍යවතුන් වහන්සේ සම්පූර්ණ ආයුෂ කාලය මුළුල්ලෙහි ජීවත්ව වැඩ සිටිත්වායි, කියාද තථාගතයන් වහන්සේ සම්පූර්ණ ආයුෂ කාලය මුළුල්ලේ ජීවත්ව සිටිත්වායි කියාද භාග්‍යවතුන් වහන්සේට යාඥා නොකළේය.

තුන්වැනි වරද භාග්‍යවතුන් වහන්සේ මෙසේ කීවෝය. "ආනන්දය, මේ විසාලා නුවර සිත් ප්‍රිය කරන්නේය උදෙන නම් චෛත්‍ය ස්ථානයද සිත් ප්‍රිය කරන්නේය. ගොතමක නම් චෛත්‍යයද සිත් ප්‍රිය කරන්නේය. සත්තම්බක නම් චෛත්‍යයද සිත් ප්‍රිය කරන්නේය බහුපුත්‍රක නම් චෛත්‍යයද සිත් ප්‍රිය කරන්නේය. සාරන්දද නම් චෛත්‍යයද සිත් ප්‍රියකරන්නේය චාපාල නම් චෛත්‍යයද සිත් ප්‍රිය කරන්නේය.

"ආනන්දය, යම් කිසිවෙකු විසින් හතර ආකාර ඉර්ධිපාද ධර්ම වඩනාලද්දාහුවෙද්ද නැවත නැවත පුරුදුකරන ලද්දාහුද නැඟීයන යානාවක් මෙන් කරණ ලද්දාහුවෙත්ද, පිහිටීමට වස්තුවක් මෙන් කරන ලද්දාහු වෙත්ද, හොඳින් පිහිටන ලද්දාහු වෙද්ද, යහපත්කොට වඩන ලද්දාහු වෙද්ද, හොඳින් පටන්ගන්නා ලද්දාහු වෙද්ද, ඔහු ඉඳින් කැමතිවූයේ නම් සම්පූර්ණ ආයුෂ හෝ ඊට වැඩියෙන් හෝ ජීවත්ව සිටින්නේය. ආනන්දය, තථාගතයන් වහන්සේ විසින් හතර ආකාරවූ ඍද්ධිපාද ධර්ම යහපත්කොට වඩන ලද්දාහුය. නැවත නැවත පුරුදු කරන ලද්දාහුය, නැඟීයන යානාවක් මෙන් කරන ලද්දාහුය, පිහිටීමට වස්තුවක් මෙන් කරන ලද්දාහුය, හොඳින් පිහිටා සිටින ලද්දාහුය, හොඳින් වඩන ලද්දාහුය. යහපත්ව පටන්ගන්නා ලද්දාහුය. ආනන්දය, ඒ තථාගත තෙම ඉඳින් කැමතිවූයේ නම් සම්පූර්ණ ආයුෂ හෝ ඊට වැඩියෙන් හෝ ජීවත්ව සිටින්නේයයි" කීවෝය.

ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ මහත්වූ නිමිත්තයන් කර වදාරන කල්හිද

මහත්වූ ලකුණු දක්වන ලද කල්හිද මාරයා විසින් මඩනා ලද සිත් ඇතිවූ බැවින් දැනගන්ට නොහැකිවූයේය. 'එහෙයින් ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, බොහෝ ජනයාට හිත පිණිස, සැප පිණිස ලෝකයාට අනුකම්පා පිණිස, දිව්‍ය මනුෂ්‍යයන්ට යහපත පිණිස හා හිත පිණිස භාග්‍යවතුන් වහන්සේ සම්පූර්ණ ආයුෂ කාලය මුළුල්ලෙහි ජීවත්ව වැඩ සිටිත්වායි කියාද, තථාගතයන් වහන්සේ සම්පූර්ණ ආයුෂ කාලය මුළුල්ලේ ජීවත්ව සිටිත්වායි' කියාද භාග්‍යවතුන් වහන්සේට යාඥා නොකළේය.

**6** එවිට භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත්වූ ආනන්ද තෙරුන් වහන්සේට කථාකර මෙසේ කීවෝය.

"ආනන්දය, ඔබ යව. දැන් ඊට කාලය බව දැනගනුවයි" කීවෝය. "එසේය, ස්වාමීන් වහන්ස," කියා ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ වචනයට උත්තරදී හුනස්නෙන් නැගිට (පැදකුණුකොට) ගෞරව වශයෙන් ගොස් භාග්‍යවතුන් වහන්සේට නුදුරුවූ එක්තරා ගසක් මුල වැඩ උන්නේය.

**7** එවිට පාප සිත් ඇත්තාවූ මාරතෙමේ ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ ගොස් නොබෝ වේලාවකින් භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, එක පැත්තක සිටියේය. එක පැත්තක සිටි ඒ පාප සිත් ඇත්තාවූ මාරයා භාග්‍යවතුන් වහන්සේට මෙසේ දැනුම් දුන්නේය "ස්වාමීන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ දැන් පිරිනිවන් පෑම කරණු මැනවි. සුගතයන් වහන්සේ පිරිනිවන්පෑම කරනු මැනවි. ස්වාමීන් වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවන්පෑමට කාලය වේ" කියායි.

"ස්වාමීනී, භාග්‍යවතුන් විසින් මේ වචන කියන ලද්දේමය පාප සිත් ඇති මාරය, යම්තාක් කල් මාගේ භික්ෂු ශ්‍රාවකයෝ සමත් නොවෙද්ද, හික්මුනාහු නොවෙද්ද, මහත් දැනුමක් ඇත්තෝ නොවෙද්ද, බොහෝ දේ ගැන දැන ගත්තාහු නොවෙද්ද, ධර්මය දරන්නෝ නොවෙද්ද, ධර්මානුධර්ම පතිපන්න (ආර්‍ය්‍යධර්මයට අනුව පිළිපදින්නෝ) නොවෙද්ද, සුදුසු

පිළිවෙතෙහි පිළිපදින්නාහු නොවෙද්ද, අනුධර්මචාරී (ධර්මයට අනුව හැසිරෙන්නෝ) නොවෙද්ද, තමන්ගේ ආචාර්‍ය්‍ය මත ඉගෙන නොකියන්නාහු වෙද්ද, දේශනා නොකරන්නාහු වෙද්ද, පනවන්නාහු නොවෙද්ද, පිහිටුවන්නාහු නොවෙද්ද, විභාග නොකරන්නාහු වෙත්ද, ප්‍රකට නොකරන්නාහු වෙත්ද, උපන්නාවූ මිථ්‍යාවාදයන් (මත) හෙතු සහිතව නිග්‍රහකොට උත්තර සහිතකොට ධර්ම දෙශනා නොකරන්නාහු වෙත්ද ඒතාක් පිරිනිවන් නොපාන්නෙමි' යන මේ වචනයෝයි.

8 'ස්වාමීන් වහන්ස, දැන් මේ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේගේ භික්ෂු ශ්‍රාවකයෝ විනීත වූවාහුය, විසාරද වූවාහුය, (බහුශ්‍රැත වූවාහුය) බොහෝ දේ දැනගත්තාහුය, ධර්මධර වූවාහුය, ආර්‍ය්‍ය ධර්මයට අනුව පිළිපන්නාහුය, සුදුසු ප්‍රතිපත්තියෙහි පිළිපන්නාහුය. ධර්මයට අනුව හැසිරෙන බැවින් අනුධර්මචාරී වූවාහුය. ස්වකීය ආචාර්‍ය්‍යවාද ඉගෙණ ප්‍රකාශකොට කියන්නාහුවෙති. දෙශනා කරන්නෝ වෙති. පණවන්නාහු වෙති. පිහිටුවා තබන්නාහු වෙති විවෘතකොට දක්වන්නාහු වෙති. විභාග වශයෙන් බෙදන්නාහු වෙති. (උත්තානි) ප්‍රකට කරන්නාහු වෙති. උපන්නාහු අන්‍ය දෘෂ්ටික වාදයන් යහපත් වශයෙන් අතිශයින්ම නිග්‍රහකොට උත්තර සහිතවූ ධර්ම දෙශනාකරන්ට සමර්ථ වූවාහුය.

"ස්වාමීන් වහන්ස, දැන් වනාහි භාග්‍යවත්තෙම පිරිනිවන් පාන සේක්වා. සුගත තෙම පිරිනිවන් පාන සේක්වා. ස්වාමීන් වහන්ස දැන් භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවන් පෑමට කල් වන්නේයයි" කියා යාඥා කෙළේය.

"ස්වාමීන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ වචන වදාරණ ලද්දේමය. 'පවිටුවූ එම්බා මාරය, යම්තාක් මාගේ භික්ෂූණී ශ්‍රාවිකාවෝ සමත් නොවෙද්ද, හික්මෙන්නියෝ නොවෙද්ද මහත් දැනුමක් ඇත්තෝ නොවෙත්ද, බොහෝ දේ ගැන දැනගත්තාහු නොවෙද්ද, ධර්මය දරන්නියෝ නොවෙද්ද, ධර්මානුධර්ම ප්‍රතිපන්න (ආර්‍ය්‍ය ධර්මයට අනුව) පිළිපදින්නියෝ නොවෙද්ද, සුදුසු පිළිවෙතෙහි පිළිපදින්නියෝ නොවෙද්ද,

අනුධර්මචාරී (ධර්මයට අනුව හැසිරෙන්නියෝ) නොවෙද්ද, තමන්ගේ ආචාර්‍ය්‍යමත ඉගෙන කියන්නියෝ නොවෙද්ද, දේශනා කරන්නියෝ නොවෙද්ද, පනවන්නියෝ නොවෙද්ද, පිහිටුවන්නියෝ නොවෙද්ද, විභාග කරන්නියෝ නොවෙද්ද, ප්‍රකට කරන්නියෝ නොවෙත්ද, උපන්නාවූ මිථ්‍යාවාදයන් (මත) හෙතු සහිතව නිග්‍රහකොට උත්තර සහිතකොට ධර්මදේශනා කරන්නියෝ නොවෙත්ද ඒතාක් පිරිනිවන් නොපාන්නෙමි' යන මේ වචනයෝයි.

'ස්වාමීන් වහන්ස, දැන් මේ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේගේ භික්ෂුණී ශ්‍රාවිකාවෝ විනීතවූවාහුය. විසාරද වූවාහුය (බහුශ්‍රැත වූවාහුය), බොහෝ දේ දැනගත්තාහුය, ධර්මධර වූවාහුය, ආර්‍ය්‍ය ධර්මයට අනුව පිළිපන්නාහුය. සුදුසු ප්‍රතිපත්තියෙහි පිළිපන්නාහුය, ධර්මය අනුව හැසිරෙන බැවින් අනුධර්මචාරී වූවාහුය, ස්වකීය ආචාර්‍ය්‍යවාද ඉගෙණ ප්‍රකාශකොට කියන්නියෝ වෙති. දේශනා කරන්නියෝ වෙති. පනවන්නියෝ වෙති පිහිටුවා තබන්නියෝ වෙති. මතුකොට දක්වන්නියෝ වෙති විභාග වශයෙන් බෙදන්නියෝ වෙති. (උත්තානි) ප්‍රකට කරන්නියෝවෙති. උපන්නාවූ අන්‍ය දෘෂ්ටික වාදයන් යහපත් වශයෙන් අතිශයින්ම නිග්‍රහ කොට උත්තර සහිතවූ ධර්මදේශනා කරන්ට සමර්ථවූවාහුය. ස්වාමීන් වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවන් පෑමට කල් වන්නේයයි" කියා යාඥා කෙළේය.

"ස්වාමීන්වහන්ස, භාග්‍යවතුන්වහන්සේ විසින් මේ වචන වදාරණ ලද්දේමය. 'පාපිවූ එම්බා මාරය, යම්තාක් කල් මාගේ උපාසක ශ්‍රාවකයෝ සමත් නොවන්නාහු වෙද්ද, හික්මෙන්නාහු නොවෙද්ද, මහත් දැනුමක් ඇත්තෝ නොවෙද්ද, බොහෝ දේ ගැන දැන ගත්තාහු නොවෙද්ද, ධර්මය දරන්නෝ නොවෙද්ද, ධර්මානුධර්ම පතිපන්න නොවෙද්ද, සුදුසු ප්‍රතිපදාවෙහි පිළිපදින්නාහු නොවෙද්ද, තමන්ගේ ආචාර්‍ය්‍ය මත ඉගෙන කියන්නාහු නොවෙද්ද, දේශනා කරන්නාහු නොවෙද්ද, පනවන්නාහු නොවෙද්ද, ප්‍රකට කරන්නාහු නොවෙද්ද, උපන්නාවූ මිථ්‍යාවාදයන් (මත) හෙතු සහිතව නිග්‍රහකොට

උත්තර සහිතකොට ධර්ම දේශනා කරන්නාහු නොවෙද්ද, ඒතාක් පිරිනිවන් නොපාන්නෙමි’ යන මේ වචනයෝයි.

“ස්වාමීන් වහන්ස, දැන් මේ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේගේ උපාසක ශ්‍රාවකයෝ විනීතවූවාහුය, විසාරද වූවාහුය (බහුශ්‍රැත වූවාහුය, බොහෝ දේ දැනගත්තාහුය, ධර්මධර වූවාහුය, ආර්‍ය්‍ය ධර්මයට අනුව පිළිපන්නාහුය, සුදුසු පිළිවෙතෙහි පිළිපන්නාහුය. ධර්මය අනුව හැසිරෙන බැවින් අනුධර්මචාරී වූවාහුය, ස්වකීය ආචාර්‍ය්‍යවාද ඉගෙන ප්‍රකාශ කොට කියන්නෝ වෙති. දේශනා කරන්නෝ වෙති. පනවන්නාහු වෙති. පිහිටුවා තබන්නාහු වෙති. විවෘතකොට දක්වන්නාහුවෙති. විභාග වශයෙන් බෙදෙන්නාහු වෙති (උත්තානි) ප්‍රකට කරන්නාහු වෙති. උපන්නාවූ අන්‍ය දෘෂ්ටික වාදයන් යහපත් වශයෙන් අතිශයින්ම නිග්‍රහ කොට උත්තර සහිතවූ ධර්මදේශනා කරන්ට සමර්ථ වූවාහුය, දැන් භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවන් පෑමට කල් වන්නේයයි” කියා යාඥා කෙළේය.

‘ස්වාමීන්වහන්ස, භාග්‍යවතුන්වහන්සේ විසින් මේ වචන වදාරණ ලද්දේය. ‘පවිටුවූ මාරය, යම්තාක් මාගේ උපාසිකා ශ්‍රාවිකාවෝ සමත් නොවෙද්ද, හික්මෙන්නියෝ නොවෙද්ද, මහත් දැනුමක් ඇත්තෝ නොවෙද්ද, බොහෝ දේ ගැන දැන ගත්තාහු නොවෙද්ද ධර්මය දන්නියෝ නොවෙද්ද, ධර්මානුධර්ම පතිපන්න නොවෙද්ද, සුදුසු පිළිවෙතෙහි පිළිපදින්නාහු නොවෙද්ද, අනුධර්මචාරිණී (ධර්මයට අනුව හැසිරෙන්නියෝ) නොවෙද්ද, තමන්ගේ ආචාර්‍ය්‍යමත ඉගෙනගෙන කියන්නියෝ නොවෙද්ද, දේශනා කරන්නාහු නොවෙද්ද, පනවන්නියෝ නොවෙද්ද, පිහිටුවන්නියෝ නොවෙද්ද, විභාග කරන්නියෝ නොවෙද්ද, ප්‍රකට කරන්නියෝ නොවෙද්ද, උපන්නාවූ මිථ්‍යා වාදයන් (මත) හේතු සහිතව නිග්‍රහකොට උත්තර සහිත කොට ධර්ම දේශනා කරන්නියෝ නොවෙද්ද, ඒතාක් පිරිනිවන් නොපාන්නෙමි’ යන මේ වචනයෝයි.

“ස්වාමීන් වහන්ස, දැන් මේ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේගේ උපාසිකා ශ්‍රාවිකාවෝ විනීත වූවාහුය, විසාරද

වූවාහුය, බොහෝ දේ දැනගත්තාහුය, ධර්මධර වූවාහුය, ආචාර්‍ය්‍ය ධර්මයට අනුව පිළිපන්නාහුය, සුදුසු පිළිවෙතෙහි පිළිපන්නාහුය. ධර්මයට අනුව හැසිරෙණ බැවින් අනුධර්මචාරිණී වූවාහුය. ස්වකීය ආචාර්‍ය්‍ය වාද ඉගෙණ ප්‍රකාශකොට කියන්නියෝ වෙති. දේශනා කරන්නියෝ වෙති. පණවන්නියෝ වෙති. පිහිටුවා තබන්නියෝ වෙති. මතුකොට දක්වන්නියෝ වෙති. විභාග වශයෙන් බෙදන්නියෝ වෙති (උත්තානි) ප්‍රකට කරන්නියෝ වෙති. උපන්නාවූ අන්‍ය දෘෂ්ටික වාදයන් යහපත් වශයෙන් අතිශයින් නිග්‍රහකොට උත්තර සහිතවූ ධර්මදේශනා කරන්ට සමර්ථ වූවාහුය. ස්වාමීන් වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවන් පෑමට කල් වන්නේ යයි" කියා යාඥා කෙළේය.

"ස්වාමීන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ වචන වදාරණ ලද්දේමය. 'පවිටුවූ මාරය, යම්තාක් කල් මාගේ මේ සකල ශාසන මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව සමෘද්ධ භාවයට නොපැමිණෙන්නේ වේද, දියුණු නොවන්නේ වේද, නොපැතිරෙන්නේ වේද, බොහෝදෙනා විසින් දැන ප්‍රතිවේධ නොකරන ලද්දේ වේද, මහත් බවට නොපැමිණියේ වේද, දෙව් මිනිසුන් විසින් ප්‍රකාශිත නොවන්නේ වේද ඒ තාක් කල් පිරිනිවන් නොපාන්නෙමි' යන වචනයි. ස්වාමීන් වහන්ස, දැන් වනාහි භාග්‍යවතුන් වහන්සේගේ (ශික්ෂාත්‍රය සංගෘහිතවූ) සකල ශාසන මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව සමෘද්ධි වූයේය. දියුණුවට පැමිණියේය. පැතිර පවත්නේය. බොහෝදෙනා විසින් දැනගන්නා ලද්දේය. මහත් බවට පැමිණියේය. දිව්‍ය මනුෂ්‍යයන් විසින් ප්‍රකාශිත වූයේය. ස්වාමීන් වහන්ස එහෙයින් දැන් භාග්‍යවත් බුදුරජ තෙම පිරිනිවන් පා වදාරණසේක්වා, සුගත තෙම පිරිනිවන්පා වදාරණසේක්වා, ස්වාමීන් වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවන් පෑමට කල් වන්නේයයි" කියා යාච්ඤා කෙළේය.

**9.** ඒ පාපිම නම්වූ මාරයා විසින් සර්වඥයන්වහන්සේගේ පිරිනිවන් පෑමට මෙසේ ආරාධනා කළ කල්හි භාග්‍යවතුන් වහන්සේ පාපිම නම්වූ මාරයාට මෙසේ කීයේය. 'එම්බල, පාපිම මාරය, තෝ මාගේ පිරිනිවන් පෑම ගැන මහන්සි නොගන්නෙක්

වෙව. තථාගතයන් වහන්සේගේ පිරිනිවන් පෑම තව නොබෝ කලකින් වන්නේය. මෙතැන් සිට තුන් මාසයක් ගිය කල තථාගතයන් වහන්සේ පිරිනිවන් පාන්නේයයි" වදාළෝය.

10. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ චාපාල චෛත්‍ය ස්ථානයෙහි සිහියෙන් යුක්තව නුවණින් පිරිසිඳ දැන ආයු සංස්කාරය අත්හැරියෝය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ ආයුසංස්කාරය හැර වදාළ කල්හි අතිශය භයජනකවූ ලොමු ඩැහැ ගැනීම සහිත මහත් භූමිකම්පාවක් විය. අහස ගිගුරුම් සහ විදුලි කෙටීම් සහිත අකල් වැසිද වැස්සාහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන වදාරා ඒ වේලාවෙහි මේ ප්‍රීතිවාක්‍යය ප්‍රකාශ කෙළේය.

"කාමාවචර රූපාවචර, අරූපාවචරාදී වශයෙන් එකිනෙකට සමානවූද, එකිනෙකට අසමානවූද, ස්කන්ධලොකය පහළ කරන්නාවූ භවය සාදන්නාවූ කර්මය, මුනින්ද්‍රයන් වහන්සේ මාර්ග ඥානයෙන් දුරුකළෝය. විදර්ශනාවෙහි ඇලුණාවූ සමාධියෙන් යුත් සර්වඥ මුනීන්ද්‍රයන් වහන්සේ තමා තුළ පැවති ක්ලේශ සමූහය සන්නාහයක් මෙන් සිඳ දමනලදී" යනුයි

11. ඊට පසුව ආනන්ද ස්ථවිරයන් වහන්සේට මේ අදහස ඇතිවිය. 'පින්වත්නි, ඒකාන්තයෙන් මේ කාරණය පුදුමය ඒකාන්තයෙන් මේ කාරණය අද්භූතය. එනම් මේ මහාපොළොව කම්පාවීමකි. මේ පොළොව කම්පාවීම ඒකාන්තයෙන් ඉතා මහත් වෙයි. ඉතා භයජනකයි. ලොමු දැහැ ගැනීම් සහිත වෙයි අහස ගුගුරයි. මහත්වූ මේ පෘථිවි කම්පාව පිණිසද මේඝ ගර්ජනාව පිණිසද හේතු ප්‍රත්‍ය කවරේදැයි' කියායි.

12. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැනට එළඹියේය. එළඹ, භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක උන්නේය. එකත්පසෙක උන්නාවූ ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ සර්වඥයන්වහන්සේට මේකාරණය දැන්වීය. "ස්වාමීන් වහන්සේ, මේ කාරණය ආශ්චය්‍ය්‍යවත් වෙයි. ස්වාමීන්වහන්ස, මේ කාරණය අද්භූතයි. මේ පොළොව කම්පාවීම ඒකාන්තයෙන් ඉතා

මහත්වෙයි. බිහිසුණු වෙයි, ලොමුදැහැගැනුම් සහිත වෙයි ආකාශයෙහි මේඝ ගර්ජනාද ඇතිවිය. ස්වාමීන්වහන්ස, මේසා විශාලවූ මහපොළව කම්පාවීමට හේතු ප්‍රත්‍යය කුමක්දැයි" භාග්‍යවතුන් වහන්සේගෙන් විචාළේය.

13. "ආනන්දය, මහත්වූ පෘථිවි කම්පාහුගේ පහළවීම පිණිස මේ හේතු අටක් වෙත්. ප්‍රත්‍යය අටක් වෙත් ඒ අට කවරේදයත්? ආනන්දය, මේ මහාපොළොව ජලයෙහි පිහිටියේය. ජලය වාතයෙහි පිහිටියේය. වාතය ආකාශයෙහි පිහිටියේ වෙයි. ආනන්දය, යම් කලෙක්හි මහා සුළං හමයිද, ඒ මහා හුළං හමන්නාහු ජලය කම්පා කෙරෙත් ජලය කම්පා කරන කල්හි පෘථිවිය කම්පාවෙයි. මහත් භූමිචලනයක් ඇතිවීමට මේ පළමුවෙනි හේතුවයි, ප්‍රත්‍යයයි.

14 "ආනන්දය, නැවතද අනිකක් කියමි. මහත් ඍද්ධි ඇති සිත වසඟ භාවයට පැමිණියාවූ මහණෙක් හෝ බමුණෙක් හෝ වේද, මහත් ඍද්ධි ඇත්තාවූ මහත් ආනුභාව ඇත්තාවූ දෙවි කෙනෙක් වෙත්ද, ඔවුන් අතුරෙන් යමෙකු විසින් ස්වල්ප මාත්‍රවූ (ඉතා කුඩාවූ) පෘථිවි සංඥාව වඩන ලද්දීද, අප්‍රමාණවූ ආපො සංඥාව වඩන ලද්දීද, ඒ ඍද්ධ්‍යානුභාව ඇති පුද්ගල තෙමේ මේ මහපොළොව කම්පා කෙරේ. වැඩියමක් කම්පා කෙරේ. වැඩි වැඩියමක්ම කම්පාකෙරේ. වෙව්ලවයි. මහත් භූමි චලනයක් ඇතිවීමට මේ දෙවෙනි හේතුවයි, ප්‍රත්‍යයයි

15 "ආනන්දය, නැවතද කියමි යම් කලෙක්හි බෝධි සත්වයන් වහන්සේ තුෂිත දිව්‍ය ලෝකයෙන් චුතවී සිහියෙන් යුක්තවූයේ යහපත් ප්‍රඥා ඇත්තේ මව්කුස පිළිසිඳ ගනීද, එකල්හි මේ පොළොව කම්පාවෙයි. වැඩියක් වෙව්ලයි. මේ මහපොළොව කම්පාවීමේ තුන්වෙනි හේතුවයි කාරණයයි.

16 "ආනන්දය, නැවතද අනික් කරුණක් කියමි, යම් කලෙක්හි බොධිසත්වයන් වහන්සේ සිහි ඇත්තේ යහපත් ප්‍රඥා ඇතුවම මව්කුසින් බිහිවේද, එකල්හි මහපොළොව කම්පාවෙයි. වැඩියක් කම්පාවෙයි. වැඩියක් වෙව්ලයි. මහත්වූ භූමි චලනයට මේ හතරවෙනි හේතුවයි, ප්‍රත්‍යයයි.

17. "නැවතද ආනන්දය, යම් කලෙක්හි තථාගතතෙමේ නිරුත්තරවූ (උතුම්වූ) සම්‍යක් සම්බොධිය අවබොධ කෙරේද, එකල්හි මේ මහපොළොව කම්පා වෙයි. වැඩියක් කම්පාවෙයි. වැඩියක් වෙව්ලයි. මේ මහපොළොව කම්පාවීමේ පස්වැනි හේතුවයි, ප්‍රත්‍යයයි

18 "ආනන්දය, නැවතද කියමි. යම් කලෙක්හි තථාගතයන්වහන්සේ නිරුත්තරවූ ධර්මචක්‍රය දෙශනා කරයිද, එකල්හි මේ මහපොළොව කම්පාවෙයි වැඩියක් කම්පාවෙයි. වෙව්ලයි. මේ මහ පොළව කම්පාවීමේ හයවෙනි හේතුවයි, කාරණයයි.

19. "ආනන්දය, නැවතද යම් කාලයක තථාගත තෙමේ සිහියෙන් යුක්තවූයේ නුවණින් පිරිසිඳ ආයුසංස්කාරය අත්හරියිද එකල්හි මහපොළොව කම්පාවෙයි, වැඩියක් කම්පාවෙයි, වැඩියක් වෙව්ලයි, මේ මහපොළොව කම්පාවීමේ හත්වෙනි කාරණයයි, ප්‍රත්‍යයයි.

20 "ආනන්දය, නැවතද යම් කලෙක්හි තථාගතතෙම අනුපාදිශෙෂ (ඉතිරිවූ ස්කන්ධයක් නැති) නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පාන්නේද, එකල්හි මේ මහා පෘථිවිය කම්පා වන්නීය. උඩට උස්වෙමින් කම්පාවෙයි. උස්වෙමින් හා පාත්වෙමින් වෙව්ලයි, වැඩිය කම්පාවෙයි. මහත්වූ පොළොව කම්පාවීමේ මේ අටවැනි කාරණයයි. ප්‍රත්‍යයයි.

"ආනන්දය, මහත්වූ පෘථිවි චලනයාගේ පහළවීමට මේ කරුණු අට හේතු වන්නේයයි වදාළේය.

21. "ආනන්දය, මේ පිරිස් අට දෙනෙක් වෙත්. ඒ කවරහුද යත්? ක්ෂත්‍රිය පිරිසය, බ්‍රාහ්මණ පිරිසය, ගෘහපති පිරිසය, ශ්‍රමණ පිරිසය, චාතුර්මහාරාජික දෙව් පිරිසය, තව්තිසා වැසි දෙව් පිරිසය, මාර පිරිසය, බ්‍රහ්ම පිරිසය යන මේ අට පිරිසය.

22. "ආනන්දය, මම වනාහි නොයෙක් සියගණන් ක්ෂත්‍රිය පිරිස් වෙත ගියෙමි. ඒ ක්ෂත්‍රිය පිරිස්වල මා පෙර උන් බවද, ඔවුන් හා සමග කථාකරමින් සිටි බවද, ධර්මාන්විත කථාකළ

බවද, මනාකොට දනිමි. ඒ පිරිස්වල ඔවුන්ගේ යම්කිසි ශරීර සටහණක් වේද මාගේ සටහණද එබඳුම වෙයි. ඔවුන්ගේ යම්බඳුවූ භාෂාවක් වේද, මාගේ භාෂාවද එබඳුම වෙයි. ධර්මයෙන් සමන්විතවූ කථාව දක්වන්නෙමි. සමාදන් කරවමි. සිත් තියුණු කරවමි. මේ කථා කරන්නේ දෙවියෙක්ද මනුෂ්‍යයෙක් දැයි කථාකරන්නාවූ මා නොදැන ගත්තාහුය. ධර්මාන්විත කථාවෙන් මෙලොව පරලොව වැඩ දක්වා එහි සමාදන් කරවා එහි සිත් තියුණුකරවා අන්තර්ධාන වෙමි. අන්තර්ධානවූ මා දෙවි කෙනෙකැයි කියා හෝ මිනිස් කෙනෙකැයි කියා හෝ නොදන්නාහුය.

23. "ආනන්දය, මම වනාහි නොයෙක් සිය ගණන් බ්‍රාහ්මණ පිරිස් වෙතද, නොයෙක් සිය ගණන් ශ්‍රමණ පිරිස් වෙතද, නොයෙක් සියගණන් චාතුර්මහාරාජික දෙව් පිරිස් වෙතද, නොයෙක් සියගණන් තව්තිසා වාසී දෙව් පිරිස් වෙතද, නොයෙක් සියගණන් මාර පිරිස් වෙතද, නොයෙක් සියගණන් බ්‍රහ්ම පිරිස් වෙතද ගියෙමි. ඒ බ්‍රාහ්මණ ශ්‍රමණාදි පිරිස්වල මා පෙර උන් බවද, ඔවුන් හා සමග කථාකරමින් උන්බවද මනාකොට දනිමි. ඒ පිරිස්වලදී ඔවුන්ගේ සටහණ යම්සේද මාගේ සටහණද එබඳුම වන්නේය. ඔවුන්ගේ යම් බඳුවූ භාෂාවක් වේද, මාගේ භාෂාවද එබඳුම වන්නේය. ධර්මාන්විත කථාවෙන් දෙලොව වැඩ දක්වන්නෙමි. සිත් සමාදන් කරවමි. සිත් දියුණු කරවමි. ප්‍රසන්න කරවමි. කථාකරන්නාවූ මා දෙවියෙක්ද මිනිසෙක්දැයි නොම දැන ගන්නාහුය. ධර්මාවවාද කථාවෙන් මෙලොව පරලොව වැඩ දක්වා සිත සමාදන් කරවා සිත තියුණු කරවා ප්‍රසන්න කරවා අන්තර්ධානවෙමි. අන්තර්ධානවූ මෙතෙම දෙවියෙකැයි කියා හෝ, මනුෂ්‍යයෙකැයි කියා හෝ මා කවර කෙනෙකැයි කියාවත් නොදැන ගන්නාහුමය. ආනන්දය, මේ අට පිරිස්නම වන්නාහුයයි" වදාළසේක

24 "ආනන්දය, වීරුද්ධ ධර්මයන්ද ආරම්මණයන්ද අභිභවනය කරන හෙයින් අභිභායතන නම් වූ කරුණු අටක් වෙති. ඒ කරුණු අට (අභිභායතන) කවරේද යත්.

**25** "ඇතැම් යොගාවචරයෙක් තෙමේ අධ්‍යාත්ම රූප සංඥා ඇත්තේ ස්වල්පවූද යහපත් වර්ණ ඇත්තාවූද අයහපත් වර්ණ ඇත්තාවූද බාහිරවූ රූපයන් දක්නේය. ඒ රූප ධර්මයන් අභිභවනය කොට ඒ මම දනිමි, දකිමි, යන මෙබඳු සංඥාවක් ඇතිවන්නේය. මේ පළමුවැනිවූ අභිභායතන නම් සමාපත්තිය වන්නේය.

**26** සමහර යොගාවචරයෙක් අධ්‍යාත්මයෙහි රූප සංඥා ඇත්තේ අප්‍රමාණවූ යහපත් වර්ණ ඇත්තාවූද යහපත් වර්ණ නැත්තාවූද බාහිර රූපයන් දකින්නේය. ඒ අප්‍රමාණ රූපධර්මයන් අභිභවනය කොට ඒ මම දනිමි දකිමි, යන මෙබඳු සංඥාවක් ඇතිවන්නේය. මේ දෙවැනිවූ අභිභායතන සමාපත්ති ධර්මය නම් වන්නේය.

**27** "සමහර යොගාවචරයෙක් අධ්‍යාත්මයෙහි අරූපසංඥා ඇත්තේ යහපත් වර්ණ ඇත්තාවූද අයහපත් වර්ණ ඇත්තාවූද බාහිරවූ රූපයන් දක්නේය. ඒ රූප ධර්මයන් අභිභවනය කොට ඒ මම දනිමි, දකිමි යන මෙබඳු සංඥාවක් ඇති වන්නේය. මේ තුන්වැනිවූ අභිභායතන සමාපත්ති ධර්මය වන්නේය.

**28** "ඇතැම් යොගාවචරයෙක් අධ්‍යාත්මයෙහි අරූපසංඥා ඇත්තේ යහපත් වර්ණ ඇත්තාවූද අයහපත් වර්ණ ඇත්තාවූද අප්‍රමාණවූ බාහිර රූපයන් දක්නේය. ඒ රූප ධර්මයන් අභිභවනය කොට ඒ මම දනිමි, දකිමි. යන මෙබඳු සංඥාවක් ඇතිවන්නේය. මේ හතර වැනිවූ අභිභායතන සමාපත්තිය වන්නේය.

**29** "අධ්‍යාත්මික අරූප සංඥා ඇත්තාවූ සමහර යොගාවචරයෙක් නිල්වූ, නීල වර්ණවූ පෙනීමෙන් නිල දර්ශනවූ නිල්වූ ස්වභාව ඇත්තාවූ දියබෙරළිය මලක් මෙන්, නිල්වන්වේද, නිල වර්ණමවේද නිල දර්ශනම වේද, නිල් බැබලීම් ඇත්තේවේද දෙපැත්තම සිනිඳුව (බරණැසෙහි උපන් බැවින්) බාරාණ සෙය්‍යක නම් වූ වස්ත්‍රය යම්සේ නිල්වන්වේද, නීල වර්ණම වේද, නීලොභාසමවේද, එපරිද්දෙන්ම නිල්වූ, නීල වර්ණවූ, නීල දර්ශනවූ, නීල ප්‍රභා ඇති, බාහිරවූ රූපයන් දක්නේය. ඒ නීල

රූප ධර්මයන් අභිභවනය කොට ඒ මම දනිමි දකිමි යන මෙබඳු සංඥාවක් ඇතිවන්නේය. මේ පස්වැනි අභිභායතනයයි.

30 "අධ්‍යාත්මික අරූප සංඥා ඇත්තාවූ සමහර යොගාවචරයෙක් පීතවර්ණවූ රන්වන් ප්‍රභා ඇත්තාවූ යම්සේ කිණිහිරි මල රන්වන් වන්නේ වේද, එමෙන් පිතවර්ණවූ පීත නිදර්ශනවූ ස්වර්ණවර්ණ ප්‍රභා ඇත්තාවූද දෙපාර්ශවයෙන්ම මටවූ, බාරාණසෙය්‍යක නම්වූ ඒ වස්ත්‍රය වනාහි යම්සේ රන්වන් වන්නේද, පීතවර්ණවේද පීත නිදර්ශනවේද ස්වර්ණවර්ණ ප්‍රභා ඇත්තේද, එපරිද්දෙන්ම රන්වන්වූ, ස්වර්ණවර්ණවූ, පීත නිදර්ශනවූ, ස්වර්ණවර්ණ ප්‍රභා ඇත්තාවූ, (පීතකසිණාරම්මණ) රූපයන් දක්නේය. ඒ පීත කසිණාරම්මණ රූපයන් අභිභවනය කොට (මෙයට වඩා අතිකූත් ආරම්මණ රූපධර්ම කෙනෙක් ඇත්තේය). ඒ මම දනිමි, දකිමි යන මෙබඳු සංඥාවන් ඇති වන්නේය. මේ හයවැනිවූ අභිභායතන සමාපත්ති නම් වන්නේය.

31 "අධ්‍යාත්මික අරූප සංඥා ඇත්තාවූ සමහර යොගාවචරයෙක් තෙම රක්ත වර්ණවූ වර්ණ වශයෙන් ලොහිතක වර්ණවූ ලොහිතක නිදර්ශනවූ රක්තවර්ණ ප්‍රභා ඇත්තා වූ යම්සේ බඳු වදමල රක්ත වර්ණ වන්නේද, ලොහිතක වර්ණවේද ලොහිතක නිදර්ශන වේද, රක්ත වර්ණ ප්‍රභා ඇත්තේ වේද දෙපාර්ශවයෙන්ම මට වූ බාරාණසෙය්‍යයක නම් වූ ඒ වස්ත්‍රය යම්සේ රක්ත වර්ණ වේද, ලොහිතක වර්ණ වේද, ලෝහිතක නිදර්ශන වේද, රක්ත වර්ණ ප්‍රභා ඇත්තේ වේද, එපරිද්දෙන්ම රක්ත වර්ණවූ, ලොහිතක වර්ණවූ ලොහිතක නිදර්ශනවූ රක්ත වර්ණ ප්‍රභා ඇත්තාවූ බාහිර රූපයන් දක්නේය. ඒ රූප ධර්මයන් අභිභවනය කොට ඒ මම දනිමි, දකිමි යන මෙබඳු සංඥාවක් ඇති වන්නේය. මේ සත් වැනිවූ අභිභායතන සමාපත්තිය නම් වන්නේය.

32 "අධ්‍යාත්මික අරූප සංඥා ඇත්තාවූ සමහර යොගාවචරයෙක් තෙම සුදුවූ (ශ්වෙතවූ) වර්ණ වශයෙන් ශුභ වර්ණවූ ඕදාත නිදර්ශනවූ (ඕභාස වශයෙන්) ශුභ වර්ණ ප්‍රභා ඇත්තාවූ යම්සේ ඖෂධි තාරකාව (පහන් තරුව) ශ්වෙතවර්ණ

වන්නේ වේද ශුභවර්ණ වන්නේ වේද, ඕදාතනිදර්ශන වන්නේ වේද, දෙපාර්ශවයෙන් මටවූ බාරාණසෙය්‍යක නම්වූ ඒ වස්ත්‍රය වනාහි යම්සේ ශ්වෙතවර්ණ වන්නේද, ඕදාත වර්ණවන්නේද, ඕදාත නිදර්ශන වන්නේද සුදුවර්ණ ප්‍රභා ඇතිවන්නේද, එපරිද්දෙන්ම ශ්වෙත වර්ණවූ, ශුභ්‍රවර්ණ ප්‍රභා ඇත්තාවූ, බාහිර වූ රූපයන් දක්නේය. ඒ ඕදාත කසිණාරම්මණ රූපයන් අභිභවනයකොට ඒ මම දනිමි, දකිමි, යන මෙබඳු සංඥාවක් ඇතිවන්නේය. මේ අටවැනිවූ අභිභායතන සමාපත්තිය නම් වන්නේය

"ආනන්දය, මේ අභිභායතන සමාපත්ති අට නම් වන්නේයයි" වදාළසේක.

38 "ආනන්දය, (විශෙෂයෙන් මනා කොට මිදීමෙන් පැමිණෙන්නාවූ) විමොක්ෂය සමාපත්ති ධර්මයෝ අට දෙනෙක් වන්නාහුය. ඒ අටදෙනා කවරහුද යත්?

"රූප සහිතවූයේ රූපයන් ධ්‍යාන චක්ෂුසින් දක්නේය. මේ පළමුවෙනි විමොක්ෂ සමාපත්ති ධර්ම වන්නේය. අධ්‍යාත්මික අරූප සංඥා ඇත්තේ බාහිරවූ රූපයන් දක්නේය. මේ දෙවැනිවූ විමොක්ෂය සාමපත්ති ධර්මය නම් වන්නේය සුභ කසිණයක් අරමුණුකොට වාසය කරන්නේය. මේ තුන්වැනිවූ විමොක්ෂ සමාපත්ති ධර්මය නම් වන්නේය. සියලු ආකාරයෙන් රූප සංඥාවන්ගේ ඉක්මීම හේතුකොට ගෙන හැඟීම් සහිත රූප සංඥාවන්ගේ විනාශයෙන්ද, නානත්ත සංඥාවන්ගේ සිහි නොකිරීමෙන්ද අනන්තාකාසයයි කියා ආකාසානඤ්චායතන සමාපත්තියට පැමිණ වාසය කරන්නේය. මේ හතර වැනිවූ විමොක්ෂ සමාපත්ති ධර්මය නම් වන්නේය. සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතන සමාපත්තිය ඉක්මවා අනන්තවූ විඤ්ඤාණයයි කියා විඤ්ඤානඤ්චායතන සමාපත්තියට පැමිණ වාසය කරන්නේය. මේ පස්වැනි විමොක්ෂ සමාපත්ති ධර්මය නම් වන්නේය. සියලු ආකාරයෙන්ම විඤ්ඤානඤ්චායතන සමාපත්තිය ඉක්ම කිසිවක් නැතැයි කියා ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට පැමිණ වාසය කරන්නේය. මේ හයවැනි විමොක්ෂ

සමාපත්ති ධර්ම නම් වන්නේය. සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ඉක්ම නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියට පැමිණ වාසය කරන්නේය මේ සත්වැනි විමොක්ෂ සමාපත්ති ධර්මය නම් වන්නේය. සියලු ආකාරයෙන් නෙවසඤ්ඤායතන සමාපත්තිය ඉක්ම සඤ්ඤා වෙදයිත නිරොධ සමාපත්තියට පැමිණ වාසය කරන්නේය. මේ අට වැනිවූ විමොක්ෂ සමාපත්ති ධර්මය වන්නේය. ආනන්දය, මේ විමොක්ෂ සමාපත්ති අට වන්නේයයි" දේශනා කළෝය.

34 "ආනන්දය, මම බුදුවූ පළමු අටවැනි සතියෙහි එක්තරා කාලයක උරුවෙල් දනව්වෙහි නෙරංජරා නම් ගංගා තීරයෙහිවූ (සමීපයෙහි) අජපාල නම් නුග (ගස මුල) සිටියෙමි. එකල්හි ආනන්දය, පවිටුවූ මාරයා මම යම් තැනෙක්හිද එතැනට ආවේය. ඇවිත් එකත්පසෙක සිටියේය. ආනන්දය, එකත්පසෙක උන්නාවූ පවිටු මාරයා මට මෙසේ කීවේය. 'ස්වාමීන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ දැන් පිරිනිවන් පානසේක්වා, සුගතයන් වහන්සේ පිරිනිවන් පානසේක්වා. ස්වාමීන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවන් පෑමට දැන් කාලය වන්නේයයි' දැන්වීය.

35 "මෙසේ කී කල්හි ආනන්දය, මම පවිටුවූ ඒ මාරයාහට මෙසේ කීවෙමි. 'පවිටුවූ මාරය, යම්තාක් කල් මාගේ භික්ෂු ශ්‍රාවකයෝ දක්ෂ නොවන්නාහු වෙද්ද, නොහික්මෙද්ද, විශාල දැනුමක් ඇති නොවෙද්ද, බොහෝ දේ ගැන ඇසුවාහු (දන්නෝ) නොවන්නාහුද, ධර්මධර නොවන්නාහුද, ලොකොත්තර ධර්මයට අනුව පිළිපදින්නෝ නොවන්නාහුද, යහපත්ව පිළිපදින්නෝ නොවෙද්ද, ධර්මයට අනුව හැසිරෙන්නෝ නොවෙද්ද, තමන්ගේ ආචාර්‍ය්‍ය මත ඉගෙන නොකියත්ද, දෙශනා නොකෙරෙත්ද, නොපණවත්ද, නොපිහිටත්ද විවෘත නොකරන්නාහුද විභාග නොකරන්නාහුද ප්‍රකට නොකරන්නාහුද, උපන්නාවූ අන්‍ය වාදයන් හේතු සහිතව කරුණු සහිතව හොඳින් නිග්‍රහ කොට නිවනට පමුණුවන ධර්මයක් කොට දෙශනා නොකරන්නාහු වෙද්ද, ඒතාක් මම පිරිනිවන් නොපාන්නෙමියි" කීවෙමි.

"මාගේ භික්ෂුණී ශ්‍රාවිකාවෝ යම්තාක් කල් දක්ෂ නොවන්නාහු වෙද්ද, නොහික්මෙද්ද විශාල දැනුමක් ඇත්තෝ නොවන්නාහුද, බොහෝ දේ ගැන ඇසුවාහු (දන්නියෝ) නොවන්නාහුද, ධර්මය දරන්නියෝ නොවන්නාහුද, ධර්මානුධර්මයන්හි පිළිපදින්නියෝ නොවෙත්ද, යහපත්ව පිළිපදින්නියෝ නොවෙද්ද, ධර්මයට අනුව හැසිරෙන්නියෝ නොවෙද්ද, තමන්ගේ ආචාර්‍ය්‍යී මත ඉගෙන නොකියද්ද, දෙශනා නොකෙරෙද්ද, නොපණවද්ද, නොපිහිටද්ද, විවෘත නොකරද්ද, විභාග නොකෙරෙද්ද, ප්‍රකට නොකෙරෙද්ද, උපන්නාවූ අන්‍ය වාදයන් හේතු සහිතව සකාරණ වශයෙන් හොඳින් නිග්‍රහ කොට නිවනට පමුණුවන ධර්මයක් කොට දෙශනා නොකරද්ද ඒතාක් මම පිරිනිවන් නොපාන්නෙමියි' කීවෙමි. 'යම්තාක් කල් මාගේ උපාසක ශ්‍රාවකයෝ දක්ෂ නොවෙද්ද, නොහික්මෙද්ද, විශාල දැනුමක් ඇත්තෝ නොවෙද්ද, බොහෝ දේ ගැන ඇසූ ඇත්තෝ (දන්නෝ) නොවෙද්ද, ධර්මධර නොවෙද්ද, ධර්මානුධර්මයෙහි යුක්ත නොවෙද්ද, යහපත්ව පිළිපදින්නෝ නොවෙද්ද, ධර්මයට අනුව හැසිරෙන්නෝ නොවෙද්ද, ස්වකීය ආචාර්‍ය්‍යී මත ඉගෙන නොකියද්ද, දෙශනා නොකෙරෙද්ද, නොපණවද්ද, නොපිහිටද්ද, විවෘත නොකරද්ද, විභාග නොකරද්ද, ඒතාක් මම පිරිනිවන් නොපාන්නෙමියි' කීවෙමි. 'යම්තාක් කාලයක් මාගේ උපාසිකා ශ්‍රාවිකාවෝ දක්ෂ නොවන්නාහුද, නොහික්මෙද්ද, විශාල දැනුමක් ඇත්තියෝ නොවන්නාහුද, බොහෝ දේ ගැන ඇසුවාහු (දන්නියෝ) නොවෙද්ද, ධර්මය දරන්නියෝ නොවන්නාහුද, ධර්මානුධර්මයන්හි පිළිපදින්නියෝ නොවෙද්ද, යහපත්ව පිළිපදින්නියෝ නොවෙද්ද, ධර්මයට අනුව හැසිරෙන්නියෝ නොවෙද්ද, තමන්ගේ ආචාර්‍ය්‍යී මත ඉගෙන නොකියද්ද, දෙශනා නොකෙරෙද්ද, නොපනවද්ද, නොපිහිටද්ද, විවෘත නොකරද්ද, ප්‍රකට නොකෙරෙද්ද, උපන්නාවූ මිථ්‍යාවාදයන් හේතු සහිතව කරුණු සහිතව නිග්‍රහකොට උත්තර සහිත කොට ධර්ම දෙශනා කරන්නියෝ නොවෙද්ද, ඒතාක් කල් මම පිරිනිවන් නොපාන්නෙමි' යි කීවෙමි 'යම්තාක් කල් මාගේ මේ සියලුම ශාසන මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව සම්පූර්ණ භාවයට නොපැමිණියේද,

දියුණුවට නොපැමිණියේද, ඒ ඒ දිශාභාගයෙහි පැතිර නොපවත්නේවේද, බොහෝ දිව්‍ය මනුෂ්‍යයන් විසින් ප්‍රකාශකරනලද බවට නොපැමිණේද, ඒතාක් කල් පිරිනිවන් නොපාන්නෙමියි' කීයෙමි.

**36** "ආනන්දය, දැන් අද චාපාල නම් චෛත්‍යයෙහිදී පවිටුවූ මාරතෙම මම යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ එකත්පසෙක සිටියේය. ආනන්දය, එකත්පසෙක සිටියාවූ පාපීවූ මාරයා මට මෙසේ කීයේය. "ස්වාමීන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ දැන් පිරිනිවන් පා වදාරන සේක්වා සුගතයන් වහන්සේ පිරිනිවන් පා වදාරන සේක්වා ස්වාමීන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවන් පෑමට දැන් කල් වන්නේය. ස්වාමීන්වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ වචනය වදාරණ ලද්දේමය.

'පවිටුවූ මාරය, මාගේ භික්ෂු ශ්‍රාවකයෝ යම්තාක් කල් දක්ෂ නොවෙද්ද, නොහික්මුණාහු වෙද්ද, විශාල දැනුමක් ඇත්තෝ නොවෙද්ද, බොහෝ දේ ගැන (දන්නෝ) ඇසූ ඇත්තෝ නොවෙද්ද, ධර්මය දරන්නෝ නොවෙද්ද, ධර්මයට අනුව පිළිපදින්නෝ නොවෙද්ද, යහපත් පිළිවෙතින් යුක්ත නොවෙද්ද, ධර්මයට අනුව හැසිරීම් ඇත්තෝ නොවෙද්ද, ස්වකීය ආචාර්‍ය්‍ය ධර්මය ඉගෙන නොකියද්ද, දෙශනා නොකරද්ද, නොපණවද්ද, නොපිහිටුවද්ද, විවෘත නොකෙරෙද්ද, විභාග නොකෙරෙද්ද, ප්‍රකට නොකෙරෙද්ද උපන්නාවූ අන්‍ය වාදයන් හේතු සහිතව සකාරණ වශයෙන් හොඳින් නිග්‍රහ කොට නිවන් මග පෙන්වන ධර්මය දෙශනා නොකරද්ද, ඒතාක් කල් පිරිනිවන් නොපාන්නෙමි.

'ස්වාමීන් වහන්ස දැන් මේ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේගේ භික්ෂු ශ්‍රාවකයෝ විනීත වූවාහුය. විසාරද වූවාහුය, (බහුශ්‍රැත වූවාහුය) බොහෝ දේ දැනගත්තාහුය, ධර්මධර වූවාහුය, ආර්‍ය්‍ය ධර්මයට අනුව පිළිපන්නාහුය. සුදුසු ප්‍රතිපත්තියෙහි පිළිපන්නාහුය. ධර්මයට අනුව හැසිරෙන බැවින් අනුධර්මචාරී වූවාහුය. ස්වකීය ආචාර්‍ය්‍යවාද ඉගෙණ ප්‍රකාශකොට කියන්නාහු

වෙති. දෙශනා කරන්නෝ වෙති පණවන්නාහු වෙති පිහිටුවා තබන්නාහු වෙති. විවෘතකොට දක්වන්නාහු වෙති. විභාග වශයෙන් බෙදන්නාහු වෙති (උත්තානි) ප්‍රකට කරන්නාහු වෙති. උපන්නාවූ අන්‍ය දෘෂ්ටික වාදයන් යහපත් වශයෙන් අතිශයින්ම නිග්‍රහකොට උත්තර සහිතවූ ධර්ම දෙශනාකරන්ට සමර්ථ වූවාහුය.

'ස්වාමීන් වහන්ස, දැන් වනාහි භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පාන සේක්වා. සුගතයන් වහන්සේ පිරිනිවන්පාන සේක්වා. ස්වාමීන්වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවන්පෑමට කල් වන්නේයයි' කියා යාඥා කෙළේය.

'යම්තාක් කල් මාගේ භික්ෂුණී ශ්‍රාවිකාවෝ දක්ෂ නොවෙද්ද, නොහික්මුණාහු වෙද්ද, විශාල දැනුමක් ඇත්තියෝ නොවෙද්ද, බොහෝ දේ ගැන (දන්නෝ) ඇසූ ඇත්තියෝ නොවෙද්ද, ධර්මය දරන්නියෝ නොවෙද්ද, ධර්මයට අනුව පිළිපදින්නියෝ නොවෙද්ද, යහපත් පිළිවෙතින් යුක්ත නොවෙද්ද, ධර්මයට අනුව හැසිරීම් ඇත්තියෝ නොවෙද්ද, තමන්ගේ ආචාර්‍ය්‍ය ධර්මය ඉගෙන නොකියද්ද, දේශනා නොකෙරෙත්ද, නොපණවද්ද, නොපිහිටුවද්ද, විවෘත නොකෙරෙද්ද, විභාග නොකෙරෙද්ද, ප්‍රකට නොකෙරෙද්ද, උපන්නාවූ අන්‍ය වාදයන් හේතු කවර කාරණ වශයෙන් හොඳින් නිග්‍රහකොට නිවන්මග පෙන්වන ධර්මය දෙශනා නොකරද්ද, ඒතාක් කල් පිරිනිවන් නොපාන්නෙමි' යන වචනය කීහ.

'ස්වාමීන් වහන්ස, දැන් මේ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේගේ භික්ෂුණී ශ්‍රාවිකාවෝ විනීතවූවාහුය, විසාරද වූවාහුය (බහුශ්‍රැත වූවාහුය, බොහෝ දේ දැනගත්තාහුය, ධර්මධර වූවාහුය, ආර්‍ය්‍ය ධර්මයට අනුව පිළිපන්නාහුය, සුදුසු ප්‍රතිපත්තියෙහි පිළිපන්නාහුය. ධර්මය අනුව හැසිරෙන බැවින් අනුධර්මචාරී වූවාහුය, ස්වකීය ආචාර්‍ය්‍යවාද ඉගෙණ ප්‍රකාශ කොට කියන්නියෝ වෙති. දේශනා කරන්නියෝ වෙති. පනවන්නියෝ වෙති. පිහිටුවා තබන්නියෝ වෙති. මතු කොට දක්වන්නියෝ වෙති. විභාග වශයෙන් බෙදන්නියෝ වෙති (උත්තානි)

ප්‍රකටකරන්නියෝ වෙති. උපන්නාවූ අන්‍ය දෘෂ්ටික වාදයන් යහපත් වශයෙන් අතිශයින්ම නිග්‍රහ කොට උත්තර සහිතවූ ධර්මදෙශනා කරන්ට සමර්ථ වූවාහුය. ස්වාමින් වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවන් පෑමට කල් වන්නේයයි' කියා යාඥා කෙළේය

'යම්තාක් කල් මාගේ උපාසක ශ්‍රාවකයෝ දක්ෂ නොවෙද්ද, නොහික්මුණාහු වෙද්ද, විශාල දැනුමක් ඇත්තෝ නොවෙද්ද, බොහෝ දේ දන්නෝ ඇසූ ඇත්තෝ නොවෙද්ද, ධර්මය දරන්නෝ නොවෙද්ද, ධර්මයට අනුව පිළිපදින්නෝ නොවෙද්ද, යහපත් පිළිවෙතින් යුක්ත නොවෙද්ද, ධර්මයට අනුව හැසිරීම් ඇත්තෝ නොවෙද්ද, තමන්ගේ ආචාර්‍ය්‍ය ධර්මය ඉගෙන නොකියද්ද, දේශනා නොකරද්ද, නොපණවද්ද, නොපිහිටුවද්ද, විවෘත නොකෙරෙද්ද, විභාග නොකෙරෙද්ද, ප්‍රකට නොකෙරෙද්ද, උපන්නාවූ අන්‍ය වාදයන් සහේතුකව සකාරණ වශයෙන් හොඳින් නිග්‍රහකොට නිවන් මාර්ගය පෙන්වන ධර්මය දෙශනා නොකරද්ද, ඒතාක් කල් පිරිනිවන් නොපාන්නෙමියි' යන වචනය කීහ.

'ස්වාමීන් වහන්ස, දැන් මේ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේගේ උපාසක ශ්‍රාවකයෝ විනීතවූවාහුය, විසාරද වූවාහුය (බහුශ්‍රැත වූවාහුය), බොහෝ දේ දැනගත්තාහුය, ධර්මධර වූවාහුය. ආර්‍ය්‍ය ධර්මයට අනුව පිළිපන්නාහුය. සුදුසු පිළිවෙතෙහි පිළිපන්නාහුය. ධර්මය අනුව හැසිරෙන බැවින් අනුධර්මචාරී වූවාහුය. ස්වකීය ආචාර්‍ය්‍යවාද ඉගෙන ප්‍රකාශ කොට කියන්නෝ වෙති. දේශනා කරන්නෝ වෙති. පනවන්නාහු වෙති. පිහිටුවා තබන්නාහු වෙති. විවෘතකොට දක්වන්නාහු වෙති. විභාග වශයෙන් බෙදන්නාහු වෙති. (උත්තානි) ප්‍රකට කරන්නාහු වෙති. උපන්නාවූ අන්‍ය දෘෂ්ටික වාදයන් යහපත් වශයෙන් අතිශයින්ම නිග්‍රහ කොට උත්තර සහිතවූ ධර්මදෙශනා කරන්ට සමර්ථවූවාහුය. දැන් භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවන් පෑමට කල් වන්නේයයි' කියා යාඥා කෙළේය.

"යම්තාක් කල් මාගේ උපාසිකා ශ්‍රාවිකාවෝ දක්ෂ නොවෙද්ද, නොහික්මුණාහුවෙද්ද, විශාල දැනුමක් ඇත්තියෝ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොවෙද්ද, බොහෝ දේ දන්නියෝ (ඇසූ ඇත්තියෝ) නොවෙද්ද, ධර්මය දරන්නියෝ නොවෙද්ද, ධර්මයට අනුව පිළිපදින්නියෝ නොවෙද්ද, යහපත් පිළිවෙතින් යුක්ත නොවෙද්ද, ධර්මයට අනුව හැසිරීම් ඇත්තියෝ නොවෙද්ද, තමන්ගේ ආචාර්‍ය්‍ය ධර්මයන් ඉගෙන නොකියද්ද, දේශනා නොකරද්ද, නොපණවද්ද, නොපිහිටුවද්ද, විවෘත නොකෙරෙද්ද, විභාග නොකෙරෙද්ද, ප්‍රකට නොකෙරෙද්ද, උපන්නාවූ අන්‍ය වාදයන් සහේතුකව සකාරණ වශයෙන් හොඳින් (නිග්‍රහකොට) ධර්මය දෙශනා නොකරද්ද, ඒතාක් කල් පිරිනිවන් නොපාන්නෙමි' යන වචනය කීහ.

'ස්වාමීන් වහන්ස, දැන් මේ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේගේ උපාසිකා ශ්‍රාවිකාවෝ විනීත වූවාහුය, විසාරද වූවාහුය, බොහෝ දේ දැනගත්තාහුය, ධර්මයර වූවාහුය, ආර්‍ය්‍ය ධර්මයට අනුව පිළිපන්නාහුය, සුදුසු පිළිවෙතෙහි පිළිපන්නාහුය. ධර්මයට අනුව හැසිරෙණ බැවින් අනුධර්මචාරිණී වූවාහුය, ස්වකීය ආචාර්‍ය්‍යවාද ඉගෙණ ප්‍රකාශකොට කියන්නියෝ වෙති. දෙශනා කරන්නියෝ වෙති. පණවන්නියෝ වෙති. පිහිටුවා තබන්නියෝ වෙති. මතුකොට දක්වන්නියෝ වෙති. විභාග වශයෙන් බෙදන්නියෝ වෙති (උත්තානි) ප්‍රකට කරන්නියෝ වෙති. උපන්නාවූ අන්‍ය දෘෂ්ටික වාදයන් යහපත් වශයෙන් අතිශයින් නිග්‍රහකොට උත්තර සහිතවූ ධර්මදේශනා කරන්ට සමර්ථ වූවාහුය. ස්වාමීන් වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවන් පෑමට කල් වන්නේයයි' කියා යාඥා කෙළේය.

'යම්තාක් කල් මාගේ මේ සියලු ශාසන මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව සමෘද්ධ භාවයට නොපැමිණියේ වේද, දියුණු නොවූයේවේද, පැතිර නොගියේවේද, බොහෝ දෙනා විසින් නොදැන ගන්නාලද්දේ වේද, මහත්බවට නොපැමිණියේ වේද, දෙව් මිනිසුන් විසින් සුප්‍රකාශිත නොවූයේ වේද, ඒතාක් කල් පිරිනිවන් නොපාන්නෙමි' යන වචනය කීහ. ස්වාමීන්වහන්ස, දැන් වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ශාසන මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව සමෘද්ධ වූයේය. දියුණුවට පැමිණියේය. පැතිර පවත්නේය. බොහෝදෙනා

විසින් දැනගන්නාලදුව සර්වප්‍රකාරයෙන්ම මහත්බවට පැමිණියේය. දිව්‍ය මනුෂ්‍යාදීන් විසින් සුප්‍රකාශිත වූයේය ස්වාමීන්වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පා වදාරණ සේක්වා, ස්වාමීන්වහන්ස, සුගතයන් වහන්සේ පිරිනිවන්පා වදාරණසේක්වා, ස්වාමීන් වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවන්පෑමට කල් වන්නේයයි' කීවේය.

37 "මෙසේ කී කල්හි ආනන්දය, මම ඒ පාපිවූ මාරයාට මෙසේ කීවෙමි. 'පවිටුවූ මාරය, තෝ මන්දෝත්සාහී වෙව. තථාගතයන් වහන්සේගේ පිරිනිවන්පෑම නොබෝ කලකින් වන්නේය. මෙතැන් සිට තුන් මාසයක් ගිය කල්හි තථාගතතෙම පිරිනිවන් පාන්නේයයි' කීවෙමි. "ආනන්දය, දැන් අද මේ චාපාල නම් චෛත්‍යයෙහිදී තථාගතයන් වහන්සේ විසින් සිහිනුවණින් යුක්තව ආයු සංස්කාරය කරන ලද්දේ යයි' කීවෝය.

38 මෙසේ කී කල්හි ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේය.

"ස්වාමීනි බොහෝ ජනයාට හිතපිණිස බොහෝ ජනයාට සැප පිණිස ලොවට අනුකම්පා පිණිස දෙව් මිනිසුන්ට යහපත පිණිස හා හිත සැප පිණිස භාග්‍යවතුන් වහන්සේ සම්පූර්ණ ආයුෂ කාලය මුළුල්ලෙහි පිරිනිවන්නොපා වැඩසිටින සේක්වායි" කියා යාඥා කෙළේය. "ආනන්දය, තථාගතයන් වහන්සේට යාඥා නොකරව, ආනන්දය, තථාගතයන් වහන්සේට යාඥා කිරීමට දැන් මේ කාලය නොවන්නේයයි" කීවෝය.

39 දෙවැනි වරද ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, බොහෝ ජනයාට හිත සැප පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙව් මිනිසුන්ගේ යහපත පිණිස හා හිත සැප පිණිස සම්පූර්ණ ආයුෂ කාලය මුළුල්ලෙහි වැඩ සිටින සේක්වා"යී යාඥා කෙළේය. "ආනන්දය, දැන් යාච්ඥා කිරීමෙන් කම් නැත. තථාගතයන් වහන්සේට යාච්ඤා නොකරව, ආනන්දය. තථාගතයන් වහන්සේට යාච්ඤා කිරීමට දැන් කාලය නොවන්නේයයි" කීවෝය. තුන්වෙනි වරද. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම

භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. 'ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, බොහෝ ජනයාට හිත සැප පිණිස, ලොවට අනුකම්පා පිණිස, දිව්‍ය මනුෂ්‍යයන්ගේ සියලු යහපත හා හිත සැප පිණිස භාග්‍යවතුන් වහන්සේ සම්පූර්ණ ආයුෂ කාලය මුළුල්ලෙහි ජීවත්ව වැඩ සිටින සේක්වා. සුගතයන් වහන්සේ සම්පූර්ණ ආයුෂ කාලය මුළුල්ලෙහි වැඩ සිටින සේක්වා" යි කීවේය.

"ආනන්දය, තෙපි තථාගතයන් වහන්සේගේ සම්‍යක් සම්බොධිය අදහන්නාහුදැයි ඇසුවෝය." "එසේය, ස්වාමීනි" කියා උත්තර දුන්හ "ආනන්දය, තෝ දැන් එසේ අදහන්නේ නම් තුන්වෙනි වර දක්වා කුමක් නිසා තථාගතයන් වහන්සේට අතිශයින් පීඩා කරන්නේදැයි" ඇසුවෝය.

40 "ස්වාමීන් වහන්ස, භාග්‍යවතුන්වහන්සේගේ සම්මුඛයෙන්ම මා විසින් මේ කාරණය අසන ලද්දේය. බුදුරජාණන් වහන්සේගේ සම්මුඛයෙන්ම යහපත් ලෙස මේ කාරණය පිළිගන්නා ලද්දේය. 'ආනන්දය, යම්කිසිවෙකු විසින් ඍද්ධිපාද ධර්මයෝ හතර වඩන ලද්දාහු වෙද්ද, බහුල වශයෙන් කරණ ලද්දාහු වෙද්ද, යානාවක් මෙන් කරන ලද්දාහු වෙද්ද, පිහිටීමට වස්තුවක් මෙන් කරන ලද්දාහු වෙද්ද, හොඳින් පිහිටා සිටින ලද්දාහු වෙද්ද, යහපත්කොට වඩන ලද්දාහු වෙද්ද. මනාකොට පටන්ගන්නා ලද්දාහුවෙද්ද, ඒ පුද්ගලතෙම ඉදින් කැමතිවන්නේවීනම් සම්පූර්ණ ආයුෂ කාලය හෝ ඊට වැඩියක් හෝ ජීවත්ව සිටින්නේය. ආනන්දය, තථාගතයන් වහන්සේ විසින් මේ ඍද්ධිපාද ධර්ම හතර වඩනලද්දාහුය. බහුල වශයෙන් කරන ලද්දාහුය. යානාවක් මෙන් කරන ලද්දාහුය. පිහිටීමට වස්තුවක් මෙන් කරන ලද්දාහුය. මනාකොට පිහිටනලද්දාහුය. යහපත්කොට වඩනලද්දාහුය. ඒ තථාගතයන් වහන්සේ සම්පූර්ණ ආයුෂ කාලය හෝ ඊට වැඩියෙන් ජීවත්ව වැඩ සිටින්නේය' කියායි."

"ආනන්දය, තෝ (මෙසේ වදාළ බව) අදහන්නෙහිදැයි කියා ඇසුවෝය. "ස්වාමීන් වහන්ස, එසේය, අදහන්නෙමියි" කියා දැන්නුවේය. "ආනන්දය, එසේ අදහන්නෙහි නම් මේ

කාරණය තොප විසින් නපුරුකොට කරන ලද්දේය, මේ කාරණය තොප විසින් වරදවන ලද්දේය. ඉදින් තෙපි තථාගතයන් වහන්සේ විසින් මෙබඳුවූ මහත් නිමිත්තයන් කර වදාරණ කල්හිදු මහත් ලකුණුකර වදාරණ කල්හිදු දැනගන්ට නොහැකි වූවාහුය. බොහෝ ජනයාට හිත සැප පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙව් මිනිසුන්ට යහපත පිණිස හා හිතසැපපිණිස භාග්‍යවතුන්වහන්සේ ආයුෂකාලය මුළුල්ලෙහි ජීවත්ව වැඩ සිටිනා සේක්වායි’ සුගතයන් වහන්සේ ආයුෂ කාලය මුළුල්ලෙහි ජීවත්ව වැඩ සිටින සේක්වායි’ කියාද තථාගතයන් වහන්සේට යාච්ඤා නොකෙළේය. ආනන්දය, තෙපි තථාගතයන් වහන්සේට යාච්ඤාකෙළේ නම් තොපගේ වචනය දෙවරක්ම තථාගතතෙම ප්‍රතික්ෂෙප කරන්නේය. තුන්වෙනි වචනය පිළිගන්නේය. ආනන්දය, එසේහෙයින් තොප විසින්ම නපුරුකොට කරන ලද්දේය, මේ කාරණය තොප විසින්ම වරදවන ලද්දේය.

41 ආනන්දය, මම එක්තරා කාලයෙක්හි රජගහ නුවර සමීපයෙහි ගිජ්ජකූට පර්වතයෙහි වාසය කෙළෙමි. එතැන් හිද ආනන්දය, මම තොපට කථා කොට කීවෙමි. “ආනන්දය, රජගහ නුවර සිත්කලු වන්නේය. ගිජ්ජකූට පර්වතය සිත්කලු වන්නේය. ආනන්දය, යම්කිසි කෙනෙකුන් මේ ඍද්ධි පාද සතර වඩන ලද්දාහු වෙද්ද. බහුල වශයෙන් කරන ලද්දාහු වෙද්ද යානාවක් මෙන් කරන ලද්දාහු වෙද්ද, ගෘහ වස්තුවක් මෙන් කරන ලද්දාහු වෙද්ද, මනාකොට පිහිටන ලද්දාහු වෙද්ද, යහපත්කොට වඩන ලද්දාහු වෙද්ද, ඒ පුද්ගල තෙම ආයුෂ කාලය හෝ ඊට වැඩියෙන් හෝ ජීවත්ව සිටින්නේය. ආනන්දය, තථාගතයන් වහන්සේ විනාහි ඍද්ධි පාද ධර්ම හතර වඩන ලද්දාහුය. බහුල වශයෙන් කරන ලද්දාහුය, යානාවක් මෙන් කරන ලද්දාහුය, ගෘහ වස්තුවක් මෙන් කරන ලද්දාහුය, යහපත් කොට වඩන ලද්දාහුය, ඒ තථාගත තෙමේ ආයුෂ කාලය හෝ ඊට වැඩියෙන් හෝ ජීවත්ව සිටින්නේයයි” කීවෙමි. ආනන්දය, තෙපි තථාගතයන් වහන්සේ විසින් මෙබඳු මහා නිමිත්තයන් කර කියන කල්හිදු මහත් (ඕභාෂයන්) ලකුණු කර කියන කල්හිදු දැනගන්ට නොහැකි

වූයෙහිය, බොහෝ ජනයාට හිත සැප පිණිස, ලෝකයාට අනුකම්පා පිණිස, දෙව් මිනිසුන්ගේ සුහසිද්ධිය පිණිස හා හිත සැප පිණිස, භාග්‍යවතුන් වහන්සේ ආයුෂ කාලය මුළුල්ලෙහි ජීවත්ව සිටින සේක්වා, සුගතයන් වහන්සේ ආයුෂ කාලයම ජීවත්ව වැඩ සිටින සේක්වායි' කියා යාච්ඤා නොකෙළෙහිය. ආනන්දය, ඉදින් තෝ තථාගතයන් වහන්සේට යාච්ඤා කෙළෙහි නම් තොපගේ වචනය දෙවරක්ම තථාගතයන් වහන්සේ ප්‍රතික්ෂෙප කර නැවත තුන්වෙනි වචනය ඉවසන්නේය. ආනන්දය, එසේ හෙයින් මේ කාරණය තොප විසින්ම නපුරුකොට කරණ ලද්දේය, මේ කාරණය තොප විසින්ම වරදවන ලද්දේය.

**42** "ආනන්දය, මම එක්තරා කාලයෙක්හි ඒ රජගහ නුවර සමීපයෙහිවූ ගොතම නම් නිග්‍රොධාරාමයෙහි වාසය කරමි. එම රජගහ නුවර ආසන්නයෙහිවූ චොර ප්‍රපාතයෙහි වාසය කරමි. එම රජගහ නුවරට ආසන්නයෙහිවූ වේභාර පර්වත බෑවුමෙහිවූ සප්තපර්ණි ගුහාවෙහි වාසය කෙරෙමි. එම රජගහ නුවරට ළඟාවූ ඉසිගිලි පර්වත බෑවුමෙහිවූ (කළුගලෙහි) කාළසිලායෙහි වාසය කරමි.

'එම රජගහ නුවරට සමීපවූ සීත වනයෙහිවූ සප්ප සොණ්ඩික නම් ප්‍රදෙශයෙහි වාසය කෙරෙමි. එම රජගහ නුවරට ආසන්නවූ තපොදාරාමයෙහි වාසය කෙරෙමි. එම රජගහ නුවරට ආසන්නවූ කලන්දක නිවාප නම්වූ වෙළුවනාරාමයෙහි වාසය කෙරෙමි එම රජගහ නුවරට කිට්ටුවූ ජීවකම්බ වනයෙහි වාසය කෙරෙමි. එම රජගහ නුවරටආසන්නවූ මද්දකුච්ඡි නම් මිගදායෙහි වාසය කෙරෙමි.

**43.** "ආනන්දය, එකල්හිද මම තොපට මෙසේ ආමන්ත්‍රණය කෙළෙමි. ආනන්දය රජගහ නුවර ඉතා ලක්ෂණ වන්නේය. ගිජ්ජකූට නම් පර්වතය සිත් ප්‍රිය කරන්නේය. ගෞතම නම් නිග්‍රොධාරාමය සිත් ප්‍රිය කරන්නේය. චොර ප්‍රපාතය සිත් ප්‍රිය කරන්නේය. වේභාර පර්වත ආසන්නයෙහි සප්ත පර්ණිගුහාව සිත් ප්‍රියකරන්නීය. ඉසිගිලි පර්වත ආසන්නයෙහි කළුගල සිත්

ප්‍රිය කරන්නේය. සීත වනයෙහිවූ සප්ප සොණ්ඩික නම් ගුහාව සිත් ප්‍රිය කරන්නීය. තපොදාරාමය රමණීයයි. වේළුවනයෙහි කලන්දක නිවාපය රමණීයයි ජීවකම්බවනය රමණීයයි මද්දකුච්ඡි නම් මිගදාය රමණීය වන්නේය

44. "ආනන්දය, යම් කිසි කෙනෙකු විසින් හතර ආකාරවූ ඍද්ධිපාද ධර්මයෝ වඩන ලද්දාහු වෙද්ද, බහුල වශයෙන් වඩන ලද්දාහු වෙද්ද, යානාවක් මෙන් කරණ ලද්දාහු වෙද්ද, ගෘහ වස්තුවක් මෙන් කරණ ලද්දාහු වෙත්ද, හොඳින් පිහිටා සිටින ලද්දාහු වෙත්ද, යහපත් කොට වඩන ලද්දාහු වෙත්ද, යහපත් කොට පටන්ගන්නා ලද්දාහු වෙත්ද, ඒ පුද්ගල තෙම ඉදින් කැමතිවන්නේ වී නම් ආයුෂ කාලය හෝ ඊට වැඩියෙන් ජීවත්ව සිටින්නේය.

"ආනන්දය, තථාගතයන් වහන්සේ විසින් මේ සතර ඍද්ධිපාද ධර්මයෝ වඩන ලද්දාහුය. බහුල වශයෙන් වඩන ලද්දාහුය. යානාවක් මෙන් කරණ ලද්දාහුය. ගෘහ වස්තුවක් මෙන් කරණ ලද්දාහුය. හොඳින් පිහිටා සිටින ලද්දාහුය. යහපත් කොට වඩන ලද්දාහුය. යහපත් කොට පටන් ගන්නා ලද්දාහුය. ඒ තථාගතතෙම ඉදින් කැමැති වීනම් ආයුෂ කාලය හෝ ඊට වැඩියෙන් හෝ ජීවත්ව සිටින්නේයයි' කීවෙමි.

"ආනන්දය, තෙපි තථාගතයන් වහන්සේ මෙසේ වදාළ බව අදහන්නාහුදැයි" ඇසූසේක.

"එසේය ස්වාමීන් වහන්ස, අදහන්නෙමියි" කීය. "ආනන්දය, එසේ අදහන්නේ වීනම් තොප විසින්ම මේ කාරණය නපුරු කොට කරණ ලද්දේය. තොප විසින්ම මේ කාරණය වරදවන ලද්දේය.

45. "ආනන්දය, මම එක්තරා කාලයක වෙශාලී නම් නගරයෙහිවූ උදෙන චෛත්‍යයෙහි වාසය කරමි. එතැන්හිද ආනන්දය, මම තොපට කථාකොට මෙසේ කීවෙමි "ආනන්දය, මේ වේශාලී නම් නුවර රමණීය වන්නේය ආනන්දය, යම්කිසි කෙනෙකු විසින් හතර ආකාර ඍද්ධිපාද ධර්මයෝ වඩන ලද්දාහු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වෙත්ද, බහුල වශයෙන් වඩන ලද්දාහු වෙත්ද, යානාවක් මෙන් කරණ ලද්දාහු වෙත්ද, ගෘහ වස්තුවක් මෙන් කරණ ලද්දාහු වෙත්ද, හොඳින් පිහිටා සිටින ලද්දාහු වෙත්ද, යහපත් කොට වඩන ලද්දාහු වෙත්ද, යහපත් ලෙස පටන්ගන්නා ලද්දාහු වෙත්ද, ඒ පුද්ගල තෙම ඉදින් කැමැති වන්නේ වීනම් ආයුෂ කාලය හෝ ඊට වැඩියෙන් හෝ ජීවත්ව සිටින්නේය.

"ආනන්දය, තථාගතයන් වහන්සේ විසින් වනාහි මේ සතර ඍද්ධිපාද ධර්මයෝ වඩන ලද්දාහුය, බහුල වශයෙන් වඩන ලද්දාහුය, යානාවක් මෙන් කරණ ලද්දාහුය, ගෘහ වස්තුවක් මෙන් කරණ ලද්දාහුය, මනාකොට පිහිටා සිටින ලද්දාහුය, යහපත් කොට වඩන ලද්දාහුය, යහපත් කොට පටන් ගන්නා ලද්දාහුය, ඒ තථාගත තෙම ඉදින් කැමති වීනම් ආයුෂ හෝ ඊට වැඩියෙන් හෝ ජීවත්ව සිටින්නේ යයි' කීවෙමි. ආනන්දය, තොපි තථාගතයන් වහන්සේ එසේ කී බව අදහන්නහුදැයි" ඇසූසේක "එසේය, ස්වාමීන් වහන්ස, අදහන්නෙමියි" කීය. "ආනන්දය, එසේ අදහන්නෙහි නම් තොප විසින්ම මේ කාරණය නපුරු කොට කරණ ලද්දේය. තොප විසින්ම මේ කාරණය වරදවන ලද්දේය.

**46.** "ආනන්දය, මම එක්තරා කාලයෙක්හි මේ වේශාලී නගරයෙහිවූ ගෞතම නම් චෛත්‍යයෙහි වාසය කරමි. ආනන්දය, මම තොපට එහිදීද ආමන්ත්‍රණය කෙළෙමි. මේ වෙශාලී නම් නුවර සිත් ප්‍රිය කරන්නේය. ආනන්දය, යම්කිසි කෙනෙකු විසින් මේ චතුර්විධවූ ඍද්ධිපාද ධර්මයෝ වඩන ලද්දාහු වෙද්ද, බහුල වශයෙන් වඩන ලද්දාහු වෙද්ද, යානාවක් මෙන් කරන ලද්දාහු වෙද්ද, ගෘහවස්තුවක් මෙන් කරණ ලද්දාහු වෙද්ද, මනාකොට පිහිටා සිටින ලද්දාහු වෙද්ද, යහපත්කොට වඩනලද්දාහු වෙද්ද, යහපත් ලෙස පටන් ගන්නා ලද්දාහු වෙද්ද, ඒ පුද්ගලතෙමේ ඉදින් කැමැති වී නම් ආයුෂ කාලය හෝ ඊට වැඩියෙන් හෝ ජීවත්ව සිටින්නේය. ආනන්දය, තථාගතයන් වහන්සේ විසින් වනාහි මේ ඍද්ධිපාද ධර්මයෝ වඩන ලද්දාහුය. බහුල වශයෙන් වඩන ලද්දාහුය. යානාවක් මෙන් කරන ලද්දාහුය.

ගෘහ වස්තුවක් මෙන් කරන ලද්දාහුය. මනාකොට පිහිටා සිටින ලද්දාහුය. යහපත් කොට පටන් ගන්නා ලද්දාහුය. ඒ තථාගත තෙමේ ඉදින් කැමැතිවී නම් ආයුෂ කාලය හෝ ඊට වැඩියෙන් හෝ ජීවත්ව සිටින්නේයයි' කීවෙමි. ආනන්දය, තොපි එසේ වදාළ බව අදහන්නහුදැයි" ඇසූසේක. 'එසේය, ස්වාමීන්වහන්ස, අදහන්නෙමියි" කිය. "ආනන්දය, එසේ අදහන්නෙහි නම් තොප විසින්ම මේ කාරණය නපුරුකොට කරණ ලද්දේය. තොප විසින්ම මේ කාරණය වරදවන ලද්දේය.

"ආනන්දය, මම එක්තරා කාලයක වෙසාලී නම් නගරයෙහිවූ ගොතමක නම් චෛත්‍යයෙහි වාසය කෙරෙමි. මේ වෙසාලී නම් නගරයෙහිවූ සත්තම්බක නම් චෛත්‍යයෙහි වාසය කෙරෙමි. මේ වෙසාලී නම් නගරයෙහි බහුපුත්තක නම් චෛත්‍යයෙහි වාසය කෙරෙමි. මේ වෙසාලී නම් පුරයට ආසන්න වූ සාරන්දද නම් චෛත්‍යයෙහි වාසය කෙරෙමි. ආනන්දය, මම තොපට එහිදීද ආමන්ත්‍රණය කෙළෙමි. 'මේ විසාලා නුවර සිත් ප්‍රිය කරන්නේය. ආනන්දය, යම්කිසි කෙනෙකු විසින් මේ හතර ආකාරවූ ඍද්ධිපාද ධර්මයෝ වඩනලද්දාහු වෙද්ද, බොහෝ සෙයින් වඩන ලද්දාහු වෙද්ද, ගෘහවස්තුවක් මෙන් කරන ලද්දාහු වෙද්ද, හොඳින් පිහිටා සිටින ලද්දාහු වෙද්ද. යහපත්කොට වඩනලද්දාහු වෙද්ද, ඒ පුද්ගලතෙමේ ඉදින් කැමතිවී නම් ආයුෂ කාලය හෝ ඊට වැඩි කාලයක් හෝ ජීවත්ව සිටින්නේය, ආනන්දය, තථාගතයන් වහන්සේ විසින් වනාහි මේ සතර ඍද්ධිපාද ධර්මයෝ වඩන ලද්දාහුය. බොහෝකොට වඩන ලද්දාහුය. යානාවක්මෙන් කරන ලද්දාහුය, ගෘහවස්තුවක් මෙන් කරන ලද්දාහුය, හොඳින් පිහිටා සිටින ලද්දාහුය, යහපත් කොට පටන්ගන්නා ලද්දාහුය, ඒ තථාගත තෙමේ ඉදින් කැමැති වන්නේ නම් ආයුෂ කාලය හෝ ඊට වැඩියෙන් හෝ ජීවත්ව සිටින්නේයයි' කීවෙමි. ආනන්දය, එසේ වදාළබව තෙපි අදහන්නහුදැයි" ඇසූහ. "ස්වාමීනි, අදහන්නෙමියි" කීය. "ආනන්දය, එසේ අදහන්නෙහි නම් තොපම මේ කාරණය නපුරුකොට කරන ලද්දේය. තොපම මේ කාරණය වරදවන ලද්දේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

47 "දැන් වනාහි ආනන්දය, මම මේ චාපාල නම් චෛත්‍යයෙහිදී තොපට ආමන්ත්‍රණය කෙළෙමි. 'ආනන්දය, මේ වෙසාලි නම් පුරය සිත් ගන්නේය. ආනන්දය, යම්කිසි කෙනෙකුන් විසින් චතුර්විධ ඍද්ධිපාද ධර්මයෝ වඩනලද්දාහු වෙද්ද, බහුල වශයෙන් කරණ ලද්දාහු වෙද්ද, යානාවක් මෙන් කරණ ලද්දාහු වෙද්ද, ගෘහ වස්තුවක් මෙන් කරණ ලද්දාහු වෙද්ද, මනාකොට පිහිටා සිටිනලද්දාහු වෙද්ද, යහපත් කොට වඩන ලද්දාහු වෙද්ද, මනාකොට පටන්ගන්නා ලද්දාහු වෙද්ද, ඒ පුද්ගල තෙමේ ඉදින් කැමැතිවූයේවී නම් ආයුෂ කාලය හෝ ඊට වැඩියෙන් හෝ ජීවත්ව සිටින්නේය. ආනන්දය, තථාගතයන් වහන්සේ විසින් වනාහි චතුර්විධ ඍද්ධිපාද ධර්මයෝ වඩන ලද්දාහුය. නැවත නැවත වඩන ලද්දාහුය. යානාවක් මෙන් කරන ලද්දාහුය. මනාකොට පිහිටා සිටින ලද්දාහුය. මනාකොට වඩන ලද්දාහුය. යහපත්ව පටන්ගන්නා ලද්දාහුය. තථාගතතෙම ඉදින් කැමැතිවූයේවී නම් ආයුෂ කාලය හෝ ඊට වැඩියෙන් හෝ ජීවත්ව සිටින්නේයයි' කියෙමි. ආනන්දය, තෙපි තථාගතයන් වහන්සේ විසින් මෙබඳුවූ ඖදාරික නිමිත්තයන් වදාරණ කල්හිද, මෙබඳුවූ මහත් ලකුණු දක්වන කල්හිද, දැනගන්ට නොහැකිවූවාහුය. බොහෝ ජනයාට හිත සැප පිණිස ලොවට අනුකම්පාව පිණිස දෙවිමිනිසුන්ගේ යහපත පිණිස හා හිත සැප පිණිස භාග්‍යවතුන් වහන්සේ ආයුෂ කාලය මුළුල්ලෙහි ජීවත්ව වැඩසිටින සේක්වායි කීයාද සුගතතෙම ආයුෂ කාලය මුළුල්ලෙහි ජීවත්ව වැඩසිටින සේක්වායි කියාද, තථාගතයන් වහන්සේට යාච්ඤා නොකෙළෙහිය. ආනන්දය, ඉදින් තෙපි යාච්ඤා කෙළෙහි නම් තොපගේ වචන දෙවරක්ම තථාගතතෙම ප්‍රතික්ෂෙප කරන්නේය. නැවත තුන්වෙනි වර යාච්ඤාව ඉවසන්නේය. ආනන්දය, එහෙයින් මේ කාරණය තොප විසින්ම නපුරු කොට කරණ ලද්දේයයි තොප විසින්ම මේ කාරණය වරදවන ලද්දේයයි" කියා වදාළසේක.

48 "ආනන්දය, මා විසින් සියලුම ප්‍රිය මනාප වස්තුවලින් වෙන්වන බව අන්‍ය තත්වයකට පැමිණෙන බව කලින්ම කියනලද්දේ නොවේද, ඒ කාරණය (අනිත්‍යයට නොපැමිණෙන

බව) දැන් මෙතැන්හි කොහින් ලබමෝද, ජාත (උපදින්නාවූද) භූත (පහළවන්නාවූද) සංඛතාදීවූ (ප්‍රත්‍යයන් විසින් සාදනු ලබන) යම් ඒ බිඳෙනසුලු ධර්ම කෙනෙක් ඇද්ද, ඒ බිඳෙනසුලු දේ ඒකාන්තයෙන්ම විනාශ නොවේවායි, නොනසීවායි යන යමෙක් ඇද්ද මේ කාරණය වනාහි විද්‍යාමාන නොවන්නේය. ආනන්දය, තථාගතයන් වහන්සේ විසින් ආයු සංස්කාරය හරනලද්දේය තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණය නොබෝ කලකින් වන්නේය. මෙයින් තුන් මාසයක් ගිය කල තථාගතයන් වහන්සේ පිරිනිවන් පාන්නේයයි කියා තථාගතයන් වහන්සේ ඒකාන්තයෙන් නියමකොට වදාරණ ලද්දේය. 'ඒ වචනය අත්හරින ලද්දකි. වමාරන ලද්දකි, සිඳිනලද්දකි, පහරන ලද්දකි. තථාගතයන් වහන්සේ විසින් ඒකාන්තයෙන් නියමකොට වදාරණලද ඒ වචනය තථාගතයන් වහන්සේ විසින් ජීවිතය රක්නා පිණිසද නැවත වෙනස් කිරීමය' යන යමෙක් ඇද්ද මේ කාරණය වනාහි විද්‍යාමාන නොවන්නේය.

**49** "ආනන්දය, එව, යන්න, මහා වනයෙහි කූටාගාර ශාලාව යම් තැනෙක්හිද එතැනට යමුයි" කියා වදාළ කල්හි "එසේය, ස්වාමීන්වහන්සැ" යි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නේය. ඊට පසුව භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සමග මහාවන නම් කූටාගාර ශාලාව යම් තැනෙක්හිද එතැනට එළඹියහ. එළඹ, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට අඬගැසූසේක "ආනන්දය, තෝ යව (ගොස්) යම් පමණ භික්ෂූහු විශාලා මහනුවර ආශ්‍රයකොට වාසයකරන්නාහු වෙද්ද, ඒ සියලුම භික්ෂූන් උපස්ථාන ශාලාවට රැස්කරවයි" වදාළසේක. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ "එසේය, ස්වාමීන් වහන්සැයි," භාග්‍යවතුන් වහන්සේට පිළිතුරුදී යම් පමණ භික්ෂූහු විශාලාමහනුවර ආශ්‍රයකොට සිටිද්ද, ඒ සියලු භික්ෂූන් උපස්ථාන ශාලාවට රැස්කරවා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියේය. පැමිණ වැඳ, එකත්පසෙක උන්නේය. එකත් පසෙක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේය. "ස්වාමීන් වහන්ස, භික්ෂු සංඝයා රැස්කරවන

ලද්දේය. දැන් ස්වාමීන් වහන්සේ යම් කිසිවක් සම්බන්ධව කාලය දන්නා සේක්වා”යි සැළ කෙළේය.

**50** ඊට පසුව භාග්‍යවතුන් වහන්සේ උපස්ථාන ශාලාව යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ පනවන ලද ආසනයෙහි වැඩසිටිසේක. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණයකර වදාළසේක. “මහණෙනි, තොපට මා විසින් යම් ධර්මකෙනෙක් අවබොධකොට දෙශනා කරණ ලද්දාහුද, තොප විසින් ඒ ධර්මයෝ මනාකොට ඉගෙන සේවනය කළ යුත්තාහ. (වර්ධනය) වැඩිය යුත්තාහුය. බහුල වශයෙන් කළ යුත්තාහුය. යම් සේ මේ ශාසන බ්‍රහ්මචය්‍ය්‍ාව දීර්ඝකාලයක් පවත්නේවේද බොහෝ කලක් පැවතීම වශයෙන් චිරස්ථායිවේද, එසේ වීම බොහෝ ජනයාට හිත සැප පිණිසද, ලොවට අනුකම්පා පිණිසද, දෙවි මිනිසුන්ට වැඩ පිණිසද, ලොවට අනුකම්පා පිණිසද, දෙවි මිනිසුන්ට වැඩ පිණිස හිත සැප පිණිසද වන්නේය.

“මහණෙනි, මා විසින් අවබොධකොට දෙශනාකරන ලද්දාවූ ඒ ධර්මයෝ කරවහුද, යම් ධර්ම කෙනෙක් වනාහි යම්සේ මේ ශාසන මාර්ග බ්‍රහ්මචය්‍ය්‍ාව සමෘද්ධභාවයට පැමිනෙන්නේද, චිරස්ථායීව පවත්නේ වේද, බොහෝ ජනයාට හිත සැප පිණිස පවත්නේද, ලොවට අනුකම්පාව පිණිස පවත්නේද, දෙවි මිනිසුන්ගේ අර්ථසිද්ධිය හා සිත සැප පිණිස, පවත්නේද එසේ තොප විසින් මනාකොට ඉගෙන සේවනය කටයුත්තාහුද, නැවත නැවත, පුහුණු කිරීම් වශයෙන් බහුල කටයුත්තාහුද, ඒ ධර්මයෝ කවරහුද යත්? සතර සතිපට්ඨාන ධර්මයෝය, සතර සම්‍යක් ප්‍රධාන ධර්මයෝය, සතර ඍද්ධිපාද ධර්මයෝය, පඤ්චෙන්ද්‍රිය ධර්මයෝය, පඤ්ච බලයෝය, සප්ත බොද්ධ්‍යංග ධර්මයෝය, ආය්‍ය්‍ා අෂ්ටාංගික මාර්ගය යන මේ ධර්මයෝ මා විසින් අවබොධකොට දෙශනා කරණ ලද්දාහුය.

“මහණෙනි, යම්සේ මේ ශාසන මාර්ග බ්‍රහ්මචර්යාව බොහෝ කල් පවත්නේද, චිරස්ථායි වන්නේවේද, බොහෝ ජනයාට හිත සැප පිණිස, ලොවට අනුකම්පා පිණිස, දිව්‍ය

මනුෂ්‍යයන්ට වැඩ පිණිස, හිත සැප පිණිස පවත්නේද එසේ ඒ සතර සතිපට්ඨානාදී ධර්මයෝ තොප විසින් යහපත් ලෙස ඉගෙන සේවනය කටයුත්තාහුය. වැඩිය යුත්තාහුය. බහුල වශයෙන් කටයුත්තාහුය" කියා වදාළසේක.

51. ඉක්බිතිව භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කර වදාළසේක "දැන් වනාහි තොපට ආමන්ත්‍රණය කරමි. සියලු සංස්කාර ධර්මයෝ විනාශ වන්නාහ. අප්‍රමාද වීමෙන් (ශ්‍රමණ ධර්මය) සම්පාදනය කරව්. තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණය නොබෝ කලකින්ම වන්නේය. මෙයින් තුන් මාසයක් ගිය කල තථාගතයන් වහන්සේ පිරිනිවන් පානසේකැයි' කියා වදාළසේක භාග්‍යවතුන් වහන්සේ මේ වචනය වදාළසේක මේ වචනය වදාරා සුගත නම්වූ ශාස්තෘන්වහන්සේ නැවතද මෙසේ වදාළසේක.

"මාගේ වයස මුහුකුරා ගියේය. මාගේ ජීවිත්වීම ස්වල්ප කාලයක්ම වන්නේය. මා විසින් මගේ පිහිට කරණ ලද්දේය. මහණෙනි, තොප හැර තොප කෙරෙන් වෙන්ව නිවන් පුර යෙමි" කියා වදාළසේක.

"මහණෙනි, යහපත් සිහියෙන් යුක්තව අප්‍රමාදව යහපත් සිල් ඇතියෝව මනාකොට සංසිඳුනාවූ සිත් ඇතිව තම තමන්ගේ චිත්තය, සුරක්ෂිතව මනාකොට රක්ෂාකරව්" කියා වදාළසේක.

"යම් පුද්ගලයෙක් තෙම මාගේ මේ ධර්ම විනය දෙක්හි අප්‍රමාදව වාසය කරන්නේද හෙතෙම ජාතියයි කියන ලද භවොත්පත්තිය (නොහොත්) සසර හැසිරීමද හැර සංසාර දුඃඛයාගේ කෙළවර කරන්නේයයි" කියා වදාළසේක.

තුන්වෙනි බණවර නිමවන ලදී.

---

## 4

1. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන විසාලා මහනුවරට පිඬු පිණිස පැමිණියේය. වෙසාලි පුරයෙහි පිඬු පිණිස හැසිර සවස්

කාලයෙහි පිණ්ඩපාතයෙන් හැරී ආයේ ඇතෙක් මෙන් මුළු ශරීරයෙන් හැරී විශාලා නුවර දෙස බලා ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේට කථාකර මෙසේ කීවෝය "ආනන්දය, තථාගතයන් වහන්සේගේ මේ වෙසාලී නම් පුරය අන්තිම දැකීම නම් වන්නේය. ආනන්දය, භණ්ඩ නම් ගම යම් තැනෙක්හිද එතැනට එළඹෙම්හයි" කීවෝය. "එසේය, පින්වතුන් වහන්සැයි" කියා ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මහත්වූ භික්ෂු සංඝයා හා සමග භණ්ඩ නම් ග්‍රාමය යම් තැනෙක්හිද එතැනට පැමිණියෝය භාග්‍යවතුන් වහන්සේ ඒ භණ්ඩ නම් ග්‍රාමයෙහි වැඩ වාසය කරන්නාහ. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට කථාකර මෙසේ කීවෝය.

2. "මහණෙනි, චතුර්විධ ධර්මයක් නොදැනීම හෙතු කොටගෙන, අවබොධ නොකිරීම හෙතුකොටගෙන මෙසේ මේ දීර්ඝ කාලයක් මා විසින්ද තොප විසින්ද ඇවිදින ලදී. සසර සැරිසරනලදී. කවර නම් චතුර්විධ ධර්මයක්ද? මහණෙනි, උතුම්වූ ශීලය නොදැනීම නිසා ප්‍රතිවෙධ නොකිරීම නිසා මා විසින්ද, තොප විසින්ද මේසා දිගු කලක් සසර ඇවිදින ලදී. සැරිසරන ලදී. මහණෙනි, උතුම් සමාධිය නොදැනීම නිසා, ප්‍රතිවෙධ නොකිරීම නිසා මා විසින්ද, තොප විසින්ද මේ දිගු කලක් සසර ඇවිදිනලදී. සැරිසරනලදී. මහණෙනි, මේ උතුම් ප්‍රඥාව නොදැනීම නිසා, අවබොධ නොකිරීම නිසා මා විසින්ද, තොප විසින්ද මේ දිගුකලක් සසර ඇවිදිනලදී, සැරිසරනලදී. මහණෙනි, මේ උතුම්වූ විමුක්තිය (නිවන) නොදැනීම නිසා, ප්‍රතිවෙධ, නොකිරීම නිසා මා විසින්ද, තොප විසින්ද මේ දිගුකලක් සසර ඇවිදිනලදී, සැරිසරනලදී. මහණෙනි, ඒ මේ උතුම්වූ ශීලය දනගතිමි. අවබොධ කෙළෙමි. උතුම්වූ සමාධිය දැනගතිමි අවබොධ කෙළෙමි. උතුම්වූ ප්‍රඥාව දැනගතිමි. අවබොධ කෙළෙමි. උතුම්වූ ප්‍රඥාව දැනගතිමි, අවබොධ කෙළෙමි උතුම්වූ විමුක්තිය (නිවන) දැනගතිමි, අවබොධ කෙළෙමි භවතණ්හාව මුලින් සිඳ දැමුවෙමි. භවනෙත්තිය (භවයෙන් භවයට ගෙන

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

යන කර්මය) නැතිකරනලදී. දැන් නැවත උත්පත්තියක් නැතැයි" වදාළහ.

3 මේ ධර්මය භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. මෙසේ වදාරා සුගත නම්වූ ශාස්තෘන් වහන්සේ මේ (අදහස් ඇති) ගාථා දෙක වදාළහ.

"උතුම්වූ ශීලයද, උතුම්වූ සමාධියද, උතුම්වූ ප්‍රඥාවද, අනුත්තරවූ, උතුම්වූ විමුක්තියද යන මේ සතර ආකාර ධර්මයෝ යසස් ඇත්තාවූ ගෞතමයන් වහන්සේ විසින් අවබොධ කරන ලද්දාහුය"

සර්වඥයන් වහන්සේ මෙසේ තමන්ම (ස්වයම්භූ ඥානයෙන්) දැන භික්ෂූන්ට ධර්ම දෙශනා කළහ. සසර දුක් කෙළවර කළාවූ, පසැස් ඇත්තාවූ, ශාස්තෘවූ බුදුරජතෙම ක්ලේශ පරිනිර්වාණය කළෝය."

4 එකල්හිද භාග්‍යවතුන් වහන්සේ භණ්ඩ නම් ගම වැඩවසනසේක් බොහෝසෙයින් මේ ධර්ම කථාවම කරන සේක. (කෙසේද?) මේ සීලයයි. මේ සමාධියයි. මේ ප්‍රඥාවයි. සීලයෙහි සිට වඩනලද සමාධිය මහත්ඵල ඇත්තේය. මහත් අනුසස් ඇත්තේය. සමාධියෙහි සිට වඩනලද ප්‍රඥාව මහත් ඵල ඇත්තීය. මහත් අනුසස් ඇත්තීය. ප්‍රඥාවෙහි පිහිටා වඩනලද සිත මනාකොට ආශ්‍රවයන් කෙරෙන් මිදෙන්නේය. ඒ කවරේදයත්? කාමාශ්‍රවයෝය, භවාශ්‍රවයෝය, දිට්ඨි ආශ්‍රවයෝය, අවිද්‍යා ආශ්‍රවයෝය.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භණ්ඩ නම් ගම කැමති කාලයක් වාසයකොට ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේට කථාකළහ. "ආනන්දය, එන්න, හත්ථි නම් ගම යම් තැනකද, අම්බ නම් ගම යම් තැනකද, ජම්බු නම් ගම යම්තැනකද, භොග නම් ගම යම් තැනකද එතැනට යමුයි" වදාළහ.

6. "එසේය, ස්වාමීනි"යි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය. ඉක්බිති

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

භාග්‍යවතුන් වහන්සේ මහත්වූ භික්ෂු සංඝයා සමග භොග නුවර යම් තැනකද එතැනට වැඩියහ.

7. එතැන්හිද, භාග්‍යවතුන්වහන්සේ භොග නගරයෙහි ආනන්ද නම් චෛත්‍ය ස්ථානයෙහි වැඩවෙසෙති. එකල්හිද භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට කථාකළහ. "මහණෙනි, මේ සතර ආකාරවූ "මහාපදෙශ" ධර්මයන් කියන්නෙමි. එය හොඳින් අසව්. යහපත්ව මෙනෙහිකරව් කියන්නෙමියි" වදාළහ. "එසේය, ස්වාමීනි"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

8. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම මෙසේ කියන්නේද, 'ඇවැත්නි, මෙය භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරිපිටදීම අසනලදී. මෙය භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරිපිටදීම පිළිගන්නාලදී. මේ ධර්මයයි, මේ විනයයි, මේ ශාස්තෲන් වහන්සේගේ අනුශාසනයයි' කියායි. මහණෙනි, මෙසේ කියනලද ඒ මහණහුගේ වචනයට පළමුවෙන්ම (එක්වරටම) සතුටු නොවිය යුත්තේය. (ආක්‍රොශ වශයෙන්) අහක නොදැමිය යුත්තේය. සතුටුද නොවී, ප්‍රතික්ෂෙපද නොකොට ඒ පද ව්‍යංජනයන් හොඳින් ඉගෙන සූත්‍ර ධර්මයෙහි බහා සසඳා බැලිය යුතුය. විනය ධර්මය හා සංසන්දනයකොට (එක්කර) බැලිය යුතුය. ඉදින් ඒ ධර්මයෝ සූත්‍ර ධර්මය හා සම නොවන්නාහු නම්, විනය ධර්මය හා සංසන්දනය (එක්වීම) නොවන්නාහු නම්, ඒකාන්තයෙන් මේ වචනය ඒ භාග්‍යවතුන් වහන්සේගේ වචනයක් (ධර්මයක්) නොවේ. මේ වචනය මේ භික්ෂූව විසින්ම වරදවා ගන්නා ලද්දකැයි තීරණයට පැමිණිය යුත්තේය. මෙසේ මේ වචනය දුරුකට යුත්තේය.

"සූත්‍ර ධර්මය හා සමකර බලන්නේ, විනය ධර්මය හා සංසන්දනයකර බලන්නේ, සූත්‍ර ධර්මය හා සම වෙද්ද, විනය ධර්ම හා සංසන්දනය වෙද්ද, මේ වචනය ඒකන්තයෙන් භාග්‍යවතුන් වහන්සේගේ වචනයක්මයයිද, මේ භික්ෂූව විසින්ද ඒ වචනය මනාකොට ගන්නා ලද්දේයයි තීරණයට පැමිණිය

යුත්තේය. මහණෙනි, මේ පළමුවැනි මහාපදෙශ ධර්මයයයි සිත්හි දරා ගනිත්වා.

**9** මහණෙනි, මේ ශාසනයෙහි යම් භික්ෂුවක්, 'අසවල් ආවාසයෙහි ප්‍රධානවූ ස්ථවිරයන් සහිත භික්ෂු සංඝයා වාසය කරයි මේ ධර්මයයිද, මේ විනයයයිද, මේ ශාස්තෘන්වහන්සේගේ අනුශාසනාවයයිද, ඒ සංඝයාගේ ඉදිරිපිටදීම අසන ලද්දේය ඒ සංඝයා ඉදිරියේදීම පිළිගන්නා ලද්දේයයි' මෙසේ කියන්නේ වේද, මහණෙනි, මෙසේ කියනලද ඒ මහණහුගේ වචනයට එක්වරම සතුටුනොවිය යුතුයි අත්හැර දැම්මද නොකළ යුතුය. සතුටුත් නොවී, අත්හැර දැම්මත් නොකොට ඒ ව්‍යංජන සහිත පදයන් හොඳින් ඉගෙන සූත්‍ර ධර්මයෙහි බහාලිය යුත්තේය, විනය නීතිය හා සංසන්දනය කළ යුතුය. ඉදින් ඒ වචනය සූත්‍ර ධර්මය හා සම නොවන්නේද, විනය නීතිය හා එක් නොවන්නේද ඒකාන්තයෙන් මේ වචනය භාග්‍යවතුන් වහන්සේගේ වචනයක් නොවන්නේය. ඒ සංඝයාද මේ වචනය වරදවාගන්නා ලද්දකැයි තීරණයට පැමිණිය යුත්තේය. මහණෙනි, මෙසේ මෙය දුරුකට යුත්තේය ඉදින් ඒ වචනය සූත්‍ර ධර්මය හා සමකරන්නේ, විනය නීතිය හා සංසන්දනය කරන්නේ, සූත්‍ර ධර්මය හා සමවේද විනය නීතිය හා සංසන්දනය වේද ඒකාන්තයෙන් මේ වචනය භාග්‍යවතුන් වහන්සේගේම වචනයක්යයි කියාද, ඒ සංඝයාද මනාකොට ගන්නා ලද්දකැයි කියාද තීරණයටපැමිණිය යුත්තේය. මහණෙනි මේ දෙවැනි මහපදෙශ ධර්මයයි සිත්හි දරාගනිව්

**10** මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම මෙසේ කියන්නේද, අසවල් නම් ආවාසයෙහි බහුශ්‍රුතවූ (බොහෝ උගත්) ආගතාගමවූ, (පැමිණි පිටකත්‍රය ඇති) ධර්මය දන්නාවූ විනය දන්නාවූ, මාතෘකා පාලිය දන්නාවූ, බොහෝවූ ස්ථවිර භික්ෂුහු වසන්නාහ. මා විසින් මේ ධර්මයයි කියාද මේ විනයයයි කියාද, මේ ශාස්තෘන් වහන්සේගේ අනුශාසනාවයයි කියාද, ඒ තෙරුන්ගේ ඉදිරියේදීම අසනලදී. ඒ තෙරුන්ගේ ඉදිරියේදීම පිළිගන්නා ලදී.' මෙසේ කියනලද ඒ මහණහුගේ වචනයට සතුටු

නොවිය යුත්තේය. අහක දැමීමද නොකට යුත්තේය. එසේ සතුටුත් නොවී, ප්‍රතික්ෂෙපද නොකොට පද ව්‍යංජනයන් හොඳින් ඉගෙන සූත්‍ර ධර්මය හා සම කළ යුත්තේය. විනය නීතිය හා සංසන්දනය කළ යුත්තේය සූත්‍ර ධර්මය හා සම කරන කල්හිද, විනය නීතිය හා සංසන්දනය කරන කල්හිද සූත්‍ර ධර්මය හා නොගැළපේද විනය නීතිය හා සංසන්දනය නොවේද, ඒකාන්තයෙන් මේ වචනය භාග්‍යවතුන් වහන්සේගේ වචනයක් නොවන්නේ යයි තීරණයට යා යුත්තේය. ඒ තෙරුන් විසින්ද මේ වචනය වරදවා ගන්නා ලද්දකැයිද කියා, මහණෙනි, ඒ වචනය දුරු කට යුත්තේය.

"ඉදින් ඒ වචන සූත්‍ර ධර්මය හා සම කරන ලද්දේ විනය නීතිය හා සමකරන ලද්දේ, සූත්‍ර ධර්මය හා සමවේද්ද, විනය නීතිය හා සමවේද්ද, ඒකාන්තයෙන් මේ වචනය භාග්‍යවතුන් වහන්සේගේ වචනයෙකැයි තීරණයට පැමිණිය යුත්තේය. ඒ තෙරුන් වහන්සේ විසින්ද මනාකොට ගන්නා ලද්දකැයි තීරණයට පැමිණිය යුත්තේය. මහණෙනි, මේ තුන්වැනිවූ මහාපදෙස ධර්මයයි. හොඳින් (සිත්හි) දරාගනිව්.

11 "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම මෙසේ කියන්නේද, 'අසවල් ආවාසයෙහි බහුශ්‍රැතවූ (බොහෝ උගත්) ආගතාගමවූ, (පැමිණි පිටකත්‍රය ධර්මය ඇති) ධර්මය දන්නාවූ විනය දන්නාවූ, මාතෘකාපාලිය දන්නාවූ එක් ස්ථවිර භික්ෂුවක් වසයි. මා විසින් මේ ධර්මයයි කියාද, මේ විනය නීතිය යයි කියාද, මේ ශාස්තෘන් වහන්සේගේ අනුශාසනාවයයි කියාද, ඒ තෙරුන්ගේ ඉදිරියේදීම අසන ලදී. ඒ තෙරුන්ගේ ඉදිරියේදීම පිළිගන්නාලදී' කියායි. මහණෙනි, ඒ මහණහුගේ වචනයට සතුටු නොවිය යුත්තේය. අහක දැමීමද නොකට යුත්තේය. සතුටුද නොවී අහකද නොදමා පද ව්‍යංජන වශයෙන් හොඳින් ඉගෙන සූත්‍ර ධර්මය හා සමකළ යුත්තේය. විනය නීතිය හා සංසන්දනය කළ යුත්තේය. ඉදින් ඒ වචන සූත්‍ර ධර්මය හා සමකරන කල්හිද, විනය නීතිය හා සංන්දනය කරන කල්හිද, ඉදින් සූත්‍රධර්මය හා නොගැළපේද, විනය නීතිය හා නොසැසඳේද, එකාන්තයෙන් මේ වචනය භාග්‍යවතුන් වහන්සේගේ වචනයක් නොවන්නේයයි

තීරණයට පැමිණිය යුත්තේය. ඒ තෙරුන් විසින්ද මේ වචනය වරදවා ගන්නා ලද්දකැයිද තීරණයට පැමිණිය යුත්තේය. මහණෙනි, ඒ නිසා මේ වචනය දුරු කට යුත්තේය.

"ඉදින් ඒ වචනය සූත්‍ර ධර්මය හා සමකරන ලද්දේ, විනය නීතිය හා සංසන්දනය කරනලද්දේ, සූත්‍ර ධර්මය හා ගැළපේද විනය නීතිය හා ගැළපේද, මේ වචනය ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේගේ වචනයකැයි කියාද, ඒ තෙරුන් විසින්ද මනාකොට ගන්නා ලද්දකැයි කියාද තීරණයට පැමිණිය යුත්තේය. මහණෙනි, මේ වනාහි මේ සතර වැනිවූ මහාපදෙශ ධර්මයයි. මහණෙනි, මේ වනාහි ඒ සතර මහාපදෙශ ධර්මයෝයයි හොඳින් දරාගනිව්.

"එතැනින් භාග්‍යවතුන් වහන්සේ භොග නම් නුවර ආනන්ද නම් චෛත්‍යයෙහි වැඩ වාසය කරන්නේ භික්ෂූන්ට බොහෝසෙයින් මේ ධර්මයෙන් යුක්ත කථාවම කරන්නාහ. මේ ශීලයයි මේ සමාධියයි, මේ ප්‍රඥාවයි.' සීලයෙහි පිහිටා වඩනලද සමාධිය මහත්ඵල මහානිසංස ඇත්තේය. සමාධියෙහි පිහිටා වඩනලද ප්‍රඥාව මහත්ඵල මහානිසංස ඇත්තීය. ප්‍රඥාවෙන් වඩනලද සිත ආශ්‍රවයන් කෙරෙන් මිදෙයි. ඔව්හු නම් කාමාශ්‍රව, භාවශ්‍රව, දෘෂ්ටි ආශ්‍රව අවිද්‍යා ආශ්‍රව යනුයි."

**12** එවිට භාග්‍යවතුන් වහන්සේ භොග නම් නුවර කැමති කාලයක් වාසය කොට ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේට කථා කළෝය. "ආනන්දය, පාවා නම් නුවර යම් තැනෙක්හිද එතැනට පැමිණෙම්හයි" කියා කීවෝය. "එසේය, ස්වාමීන් වහන්සැයි" කියා ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනයට උත්තර දුන්නේය. එවිට භාග්‍යවත්තෙම මහත්වූ භික්ෂු සංඝයා වහන්සේ හා සමග පාවා නම් නුවර යම් තැනකද එතනට පැමිණියෝය. එහි භාග්‍යවතුන් වහන්සේ පාවා නම් නුවර චුන්ද නම් කර්මාර පුත්‍රයාගේ අඹවනයෙහි වාසය කරති.

චුන්ද නම් කර්මාර පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේ පාවා නම් නුවර සමීපයෙහිවූ මාගේ අඹවනොද්‍යානයෙහි වාසය කරන්නේයයි ඇසුයේමය.

එවිට චුන්ද නම් කර්මාර පුත්‍රතෙම භාග්‍යවතුන්වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට මනාකොට වැඳ, එකපැත්තක උන්නේය. එක පැත්තක උන්නාවූ චුන්ද නම් කර්මාර පුත්‍රයාට භාග්‍යවතුන් වහන්සේ ධර්මයෙන්යුත් කථාවෙන් මෙලොව පරලොව වැඩ දක්වා දේශනා කළෝය. සිත් පහදවා දේශනා කළෝය. සිත තියුණු කළාහුය. එවිට භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මයෙන් යුක්තවූ කථාවෙන් මෙලොව පරලොව වැඩ දක්වා දේශනා කරන ලද්දාවූ, සිත් පහදවන ලද්දාවූ සිත තියුණු කරනලද්දාවූ චුන්දනම් කර්මාර පුත්‍රතෙම "ස්වාමීවූ භාග්‍යවතුන් වහන්ස, භික්ෂු සංඝයා වහන්සේ හා සමග සෙට දවස මාගේ භෝජනය පිළිගනු මැනවැයි" ආරාධනා කෙළේය. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද භාවයෙන් ආරාධනාව පිළිගත්තෝය. එවිට චුන්ද නම් කර්මාර පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන උන් ආසනයෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ (ප්‍රදක්ෂිණා කොට) ගෞරව වශයෙන් ගියේය.

13. එවිට චුන්ද නම් කර්මාර පුත්‍ර තෙම ඒ රාත්‍රිය ගතවූ කල තමන්ගේ ගෙදර මිහිරි කෑම් බීම්ද බොහෝවූ මෘදු සූකර මාංශද (පස්ගෝ රස යෙදූ මොලොක් බතක් නොහොත් රසායන බෙහෙතක්) මනාකොට පිළියෙල කරවා "ස්වාමීන් වහන්ස, සූදානම් කරන ලද භෝජනය ඇත්තේය. ඊට කාලයයි" කියා, භාග්‍යවතුන් වහන්සේට කාලය දැන්වූයේය එවිට භාග්‍යවතුන් වහන්සේ උදය වරුවෙහි හොඳින් හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන භික්ෂු සංඝයා හා සමග චුන්ද නම් කුමාර පුත්‍රයාගේ ගෙදර යම් තැනකද එතැනට පැමිණියෝය. පැමිණ, පනවනලද ආසනයෙහි වැඩහුන්නේය. වැඩහිඳ භාග්‍යවත් තෙම චුන්ද නම් කර්මාර පුත්‍රයාට කථාකර මෙසේ කීවෝය. "චුන්දය, තා විසින් මෘදු සූකර මාංසයක් (පස් ගෝ රස යෙදූ මොලොක් බතක් නොහොත් රසායන බෙහෙතක්) පිළියෙලකරනලද්දේ වේද, ඒ මෘදු ශූකරමාංසයෙන් (පස් ගෝ රස යෙදූ මොලොක් බතින් නොහොත් රසායන බෙහෙතින්) මා අනුභව කරව. යම්බඳුවූ අනිකුත් කෑම් බීම් ආදියක් පිළියෙලකරන ලද්දේ වේද ඒ අනිකුත්

කෑම් බීම් ආදියෙන් භික්ෂු සංඝයා අනුභව කරවයි" කීවෝය. "එසේය, ස්වාමීන් වහන්ස," කියා චුන්ද නම් කර්මාර පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනයට උත්තර දී, යම් ශූකරමාංසයක් (පස්ගෝ රස යෙදූ මොලොක් බතක් නොහොත් රසායන බෙහෙතක්) පිළියෙළ කරණ ලද්දේ වේද, ඒ ශූකර මාංසයෙන් (පස්ගෝ රස යෙදූ මොලොක් බතින් නොහොත් රසායන බෙහෙතින්) භාග්‍යවතුන්වහන්සේ වැළඳවූයේය. යම්බඳුවූ අනිකුත් කෑම්බීම් ආදියක් පිළියෙළ කරණ ලද්දේවීද, ඒ අනිකුත් කෑම්බීම් ආදියෙන් භික්ෂු සංඝයා වැළඳවූයේය. එවිට භාග්‍යවත් තෙම චුන්ද නම් කර්මාර පුත්‍රයාට කථාකොට මෙසේ කීවෝය. "චුන්දය, මා වළඳවා ඉතිරිවූ යම් ශූකර මාංසයක් (පස්ගෝ රස යෙදූ මොලොක් බතක් නොහොත් රසායන බෙහෙතක්) ඇද්ද, ඒ ශූකර මාංසය (පස්ගෝ රස යෙදූ මොලොක් බත නොහොත් රසායන බෙහෙත) වළක් හාරා එහි දමන්න යයි" කීවෝය. "චුන්දය, දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බඹුන් සහිතවූ මහණ බමුණන් සහිතවූ දෙව් මිනිසුන් සහිත වූ සත්ව සමූහයා ඇති මේ සත්ව ලෝකයෙහි තථාගතයන් වහන්සේ හැර ඒ ශූකර මාංසය (පස්ගෝ රස යෙදූ මොලොක් බත නොහොත් රසායන බෙහෙත) යමකු අනුභවකොට හොඳින් දිරීමට පැමිණේද එබඳු පුද්ගලයෙකු මම නොදක්නෙමියි" කීවෝය. "එසේය, ස්වාමීන්වහන්ස," කියා චුන්ද නම් කර්මාර පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනයට උත්තර දී බුදුරජාණන් වහන්සේ වළඳවා යම් ශූකර මාංසයක් ඉතිරිවූයේ වේද, ඒ මාංශය වළලවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට හොඳින් වැඳ, එකපැත්තක උන්නේය. එකපැත්තක උන්නාවූ චුන්ද නම් කර්මාර පුත්‍රයාට භාග්‍යවතුන් වහන්සේ ධර්මයෙන් යුක්තවූ කථාවෙන් කරුණු දක්වා සිත් පහදවා සිත තියුණු කරවා වදාරණ ලදුව උන් ආසනයෙන් නැගිට ගියෝය.

14. එවිට චුන්ද නම් කර්මාර පුත්‍රයාගේ බත වැළඳූ භාග්‍යවතුන් වහන්සේට ලොහිත පක්ඛන්දිකා (රක්ත අතිසාරය) නම්වූ කෲරවූ අසනීපයක් හටගත්තේය. මරණය ළංව බලවත්වූ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

වේදනා ඇතිවූයේය. භාග්‍යවතුන් වහන්සේ සිහියෙන් යුක්තව දැනම වේදනා නැවැත්වීම වශයෙන් ඔබිමොබ නොහැරෙමින් ඒ වේදනාව ඉවසා සිටියෝය. එවිට භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන්ට කථාකර මෙසේ කීවෝය. 'එව, යම්හ කුසිනාරා නම් නුවර යම් තැනෙකද එතැනට යමුයයි" කීවෝය. "එසේය, ස්වාමීන් වහන්ස," කියා ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය. 'චුන්ද නම් කර්මාර පුත්‍රයාගේ ආහාර වළඳා උත්සාහවන්තවූ බුදුරජ තෙම මරණය ළංවූ ඉතා බලවත්වූ අසනීපය දැනුනේයයි' කියා මා විසින් අසනලද්දේය. වළඳා වදාරණ ලද ශූකර මාංසය හේතුකොටගෙන බුදුරජානන් වහන්සේට ඉතා බලවත්වූ රෝගයක් හටගත්තේය. නිතර පවත්නා විරේචන රෝගය ඇත්තාවූ භාග්‍යවතුන් වහන්සේ කුසිනාරා නුවරට යනු කැමැත්තෙමි" කීය.

එවිට භාග්‍යවත් බුදුරජානන් වහන්සේ මගින් ඉවත්ව එක්තරා ගසක් මුලකට පැමිණියේය. පැමිණ, ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේට කථාකර මෙසේ කීවෝය. "ආනන්දය, තෙපි මගේ සඟල සිවුර සතරට නවා ආසනයක් කොට පනවව, ආනන්දය, ක්ලාන්තවූයෙමි හිඳගනිමියි" කීවෝය.

"එසේය, ස්වාමීන්වහන්සැයි" කියා ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට උත්තර දී සඟල සිවුර සතරට නවා ආසනයක් කොට පැනවීය. භාග්‍යවතුන් වහන්සේ පනවනලද ඒ ආසනයෙහි වැඩ උන්හ. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේට කථාකර මෙසේ කීවෝය. "ආනන්දය, තෙපි මට පැන් ගෙනව. ආනන්දය, පිපාසිතයෙම් පැන් බොන්නෙමියි" කීවෝය.

මෙසේ කී කල ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ දැන්නුවේය. "ස්වාමීන් වහන්ස, දැන් පන්සියයක් පමණ ගැල් ඉක්ම ගියාහුය. ගැල් රෝදවලින් කැඩීගිය ස්වල්පවූ ඒ ජලය කැළඹී බොරව ගලා යන්නේය. ස්වාමීන් වහන්ස, පැහැදි දිය ඇත්තාවූ රසවත්වූ මිහිරි වතුර ඇත්තාවූ

ඉතා සිහිල් වතුර ඇත්තාවූ මනාවූ තොට ඇති සිත් ප්‍රිය කරන්නාවූ මේ කකුත්ථා නම් ගඟ ඉතා නුදුරු වන්නීය. එහි භාග්‍යවතුන් වහන්සේ පැන්ද පානය කරන්නේය. ශරීරයද සිහිල් කරන්නේයයි" කියා දැන්නුවේය. දෙවෙනි වරද තුන්වෙනි වරද භාග්‍යවත්තෙම ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන්ට කථාකර මෙසේ කීවෝය.

"ආනන්දය, තෙපි මට පැන් ගෙනෙව. ආනන්දය, පිපාසිත යෙමි. පැන් පානය කරන්නෙමියි" කීවෝය. "එසේය ස්වාමීන් වහන්ස, කියා ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට උත්තර දී පාත්‍රය ගෙන ඒ කුඩා ගංගාව යම් තැනකද එතැනට පැමිණියේය. එකල්හි ගැල් රෝදවලින් කැපෙන ලද්දාවූ කැළඹී බොරව ගලා යන්නාවූ ඒ ඉතා කුඩා ගංගාව ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේ සමීපයට එළඹෙන කල්හි ප්‍රසන්නව විශෙෂයෙන්ම ප්‍රසන්නව නොකැළඹී පැහැදී ගලා යන්නීය.

**15.** එවිට ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙසේවූ සිතෙක් වූයේය. "තථාගතයන් වහන්සේගේ මහත්වූ ඍද්ධි ඇති බව මහත්වූ ආනුභාව ඇති බව ඒකාන්තයෙන් පුදුම වන්නේය. ඒකාන්තයෙන් ඉතා පුදුම වන්නේ මය. 'ගැල් රෝදවලින් කැපී ගියාවූ කැළඹී බොරව ගලා යන්නාවූ කුඩාවූ ගංගාව මා පැමිණි කල්හි ප්‍රසන්නව පැහැදී ගලා යන්නේයයි' කියා පාත්‍රයෙන් පැන ගෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට මෙසේ දැනුම් දුන්නේය. 'ස්වාමීන් වහන්ස, තථාගතයන් වහන්සේගේ මහත්වූ ඍද්ධි ඇති බව, මහත්වූ ආනුභාව ඇතිබව පුදුම වන්නේය. ස්වාමීන් වහන්ස, ඉතා පුදුම වන්නේමය. ස්වාමීන් වහන්ස, ගැල් රෝද වලින් කැපෙන ලද්දාවූ කැළඹී බොරව ගලන්නාවූ ඉතා කුඩාවූ ගංගාව දැන් මා පැමිණි කල ප්‍රසන්නව නොකැළඹී පැහැද ගලා යන්නීය. භාග්‍යවතුන් වහන්ස, පැන් වැළඳුව මැනව, තථාගතයන්වහන්ස, පැන් වැළඳුව මැනවයි" කීවේය. එවිට භාග්‍යවතුන් වහන්සේ පැන් වැළඳුවෝය.

**16.** එකල ආළාරකාලාම නම් තවුසාගේ ශ්‍රාවකවූ පුක්කුස නම් මල්ල රාජ පුත්‍රයෙක් කුසිනාරා නුවරින් පාවා නම් නුවරට යන දීර්ඝ මාර්ගයට පැමිණියේ වෙයි. පුක්කුස නම් මල්ලරාජ පුත්‍ර තෙම එක්තරා ගසක්මුල වැඩ උන්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුටුයේය. දැක, භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ පුක්කුස නම් මල්ල රාජ පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේය.

**17.** "ස්වාමීන්වහන්ස, පුදුමයකි, ස්වාමීන් වහන්ස, පෙර නුවූ දෙයකි, ස්වාමීන් වහන්ස, ඒකාන්තයෙන් ප්‍රව්‍රජිතයෝ (මහණවූ තැනැත්තෝ) මෙවැනි ශාන්තවූ හැසිරීමෙන් යුක්තව වාසය කරන්නාහු වෙති. පෙර මෙබන්දෙක් වූයේය. ස්වාමීන් වහන්ස, ආළාරකාලාම නම් තාපසතෙම දීර්ඝමාර්ගයක ගමන් කරන්නේ මඩින් ඉවත්ව මාර්ගයට නුදුරු එක්තරා ගසක් මුල දවල් වාසය කරමින් උන්නේය. එවිට ස්වාමීනි ගැල් පන්සියයක් පමණ ආළාරකාලාම නම් තාපයන්ගේ සමීපයෙන්ම ගියාහුය. එවිට ස්වාමිනි, එක්තරා පුරුෂයෙක් ඒ ගැල් පන්සියයගේ පසුපස්සෙහි එන්නේ ආළාරකාලාම නම් තාපස තෙම යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, ආළාරකාලාම නම් තාපසයන්ට මෙසේ කීයේය. "කිමෙක්ද? ස්වාමීනි, පන්සියයක් පමණ ගැල් යන්නා දුටුවේදැයි" ඇසුවේය. "ඇවැත, නුදුටුයෙමියි" කීයේය" කිමෙක්ද? ස්වාමීනි, එහි ශබ්ද ඇසුවේදැයි" ඇසීය. ඇවත, මම ශබ්දයද නොඇසුවෙමියි" කීයේය. "කිමෙක්ද? ස්වාමීනි, එකල්හි නිදාගෙන සිටියේදැයි" ඇසුවේය. "ඇවත, මම නිදාගෙන නොසිටියෙමියි" කීයේය "කිමෙක්ද? ස්වාමීනි, සිත ඇතිව සිටියේදැයි" ඇසුවේය. "එසේය, ඇවතැයි" කීයේය. ස්වාමීන් වහන්ස, නිදා නොගෙන සිත් ඇතිව විසුවාවූ ඒ නුඹවහන්සේ සමීපයෙන් ගියාවූ පන්සියයක් පමණවූ ඒ ගැල් නුදුටුයෙහිද? ඒ ගැල් හඬද නොඇසුයෙහිද? එසේද වුවත් ස්වාමීනි නුඹවහන්සේගේ සඟළ සිවුර දූවිල්ලෙන් ගැවසීගත්තේදැයි" ඇසුවේය. "ඇවත එසේයයි" කීයේය. එවිට

ස්වාමීන් වහන්ස, ඒ පුරුෂයාහට මෙසේවූ සිතෙක් වූයේය" පින්වත්නි, ඒකාන්තයෙන් පුදුමයෙක.

"පින්වත්නි, ඒකාන්තයෙන් ඉතා පුදුමයක් වන්නේය. පින්වත්නි, ඒකාන්තයෙන් ප්‍රව්‍රජිතයෝ මෙබඳු ශාන්තවූ සිහියෙන් යුක්තව වාසය කරන්නාහුය. යම් බඳුවූ නිදානොගෙන සිතින් යුක්තව විසුවාවූ ඒ නුඹවහන්සේගේ සමීපයෙන් ගියාවූ පන්සියයක් පමණවූ ඒ ගැල් නොදක්නේය ගැල් හඬද නොඅසන්නේයයි කියා ආලාරකාලාම නම්වූ තවුසා කෙරෙහි මහත්වූ පැහැදීම ප්‍රකාශ කිරීමෙන් ප්‍රශංසාකොට ගියේය,

18 'පුක්කුස නම් මල්ලරාජ පුත්‍රය, යමෙක්තෙම සිතින් යුක්තව නොනිදා හිඳම තමන්ට සමීපව ගියාවූ පන්සියයක් පමණ ගැල් නොදක්නේ වේද, එහි පවත්නා ගැල් හඬ නොඅසන්නේ වේද, අනිකුත් යමෙක් සිතින් යුක්තව නොනිදා හිඳම මහත්වූ වර්ෂාව වස්නා කල්හි එසේ වස්නාලද වර්ෂා ජලය පෘථිවියෙහි පැතිර එකලාව ගළා යන කල්හි මහත්වූ ඒ වර්ෂාවන්ගේ අතරින් අතර විදුලිය පැහැර පවත්නා කල්හි භයානකවූ සෙනහඬ පවත්නා කල්හි නොදක්නේවේද? ඒ මේඝ ගර්ජනාදි ශබ්දය නොඅසන්නේ වේද, ඒ කුමකැයි සිතන්නෙහිද? මේ දෙයාකාරයෙන් කවර කාරණයක් ඉතා දුෂ්කර හෝ වේද, අපහසුවෙන් හෝ වන්නේ වේදැයි" ඇසුවෝය. "ස්වාමීන් වහන්ස, කියනලද ගැල් පන්සියයක් හෝ ගැල් හයසියයක් හෝ ගැල්හත්සියයක් හෝ ගැල් අටසියයක් හෝ ගැල් නවසියයක් හෝ ගැල් දහසක් හෝ කුමක් කරන්නාහුද යම් ප්‍රව්‍රජිතයෙක් (මහණෙක්) සිත් ඇත්තෙක්ව නොනිඳා හිඳ මහත් වැසිවසින කල්හි අහස ගොරවන කල්හි විදුලිකොටන කල්හි නොදක්නේද, ශබ්දය නොඅසන්නේ වේද, යන දෙයාකාරයෙන් එසේ වස්නා ලද වර්ෂා මේඝ ගර්ජනාදීන්ගේ නොදැක්ම හා එහි පවත්නා ශබ්ද නොඇසීම යයි කියනලද මේ කාරණයම ඉතා දුක්ෂර වන්නේය. අපහසු වන්නේයයි" කීයේය.

19 'පුක්කුස නම් මල්ලරාජ පුත්‍රය, මම් එක්තරා කාලයෙක්හි ආතුමා නම් නුවර සමීපයෙහිවූ භුසාගාර (ගොයම් පාගන

ගෙයක-කමතක) වාසය කෙරෙමි. එකල මහත් වර්ෂාව වසින කල්හි අතරතුර විදුලිය පැහැර පවත්නා කල්හි, මහත් හෙන පුපුරන කල්හි භූසාගාර නම් මා වසන ස්ථානය සමීපයෙහිවූ කුඹුරෙහි සීසාන්නාවූ ගොවියන් දෙදෙනෙකු හා ගොන් සතර දෙනෙක්ද ගෙන වැදීමෙන් නැසුණාහුය. එවිට පුක්කුස නම් මල්ලරාජ පුත්‍රය, ආතුමා නුවරින් මහාජන සමූහයා නික්ම ගොවියන් දෙදෙන හා ගොන් සතර දෙන යම් තැනක නැසුනාහු වෙද්ද, එතැනට පැමිණියෝය. එකල පුක්කුස නම් මල්ලරාජ පුත්‍රය, මම භූසාගාරයෙන් (කමතෙන්) පිටතට නික්ම කමතෙහි දොරටුව සමීපයෙහි අවකාශ ඇති ස්ථානයේ සක්මන් කෙරෙමි. එවිට පුක්කුස නම් මල්ලරාජ පුත්‍රය, එක්තරා පුරුෂයෙක් ඒ මහත්වූ ජන සමූහයා කෙරෙන් නික්ම මම යම් තැනකද එතැනට පැමිණියේය, පැමිණ, මට හොඳින් වැඳ එකපැත්තක සිටියේය. පුක්කුස නම් මල්ලරාජ පුත්‍රය, එකපැත්තක සිටියාවූ ඒ පුරුෂයාට මම මෙසේ කීයෙමි.

**20** 'ඇවත, මේ මහාජන සමූහයා රැස්වූයේ කුමක් පිණිසදැයි' කියා ඇසුවෙමි 'ස්වාමීන්වහන්ස, දැන් වනාහි මහත් වැසිවසින කල්හි විදුලිකොටමින් හෙන පුපුරන කල්හි හෙණ වැදීමෙන් ගොවියන් දෙදෙනෙකු හා ගොන් සතර දෙනෙක්ද නැසුණාහුය. ඒ කාරණයෙන් මෙතැන්හි මේ මහජන සමූහයා රැස්වූයේයයි' කීයේය 'ස්වාමීන්වහන්ස, නුඹවහන්සේ කොතන සිටියේදැයි?" ඇසුවේය 'ඇවැත්නි, මම මෙහි උන්නෙමි කීමි' කිමෙක්ද? 'ස්වාමීන්වහන්ස, ඒ මහත් වර්ෂාව හා විදුලිකෙටීම ආදිය දුටුවේදැයි' ඇසුවේය. 'ඇවැත්නි, මම නුදුටුවෙමි කීමි කිමෙක්ද? ස්වාමීන් වහන්ස, එහි පවත්නාලද ශබ්දය ඇසුණේදැයි' ඇසුවේය. 'ඇවැත්නි, මම ඒ ශබ්දයද නොඇසූයෙමියි' කීමි 'කිමෙක්ද ස්වාමීනි, නිදාගෙන සිටියේදැයි' ඇසුවේය. 'ඇවැත්නි, මම නිදාගෙන නොසිටියෙමි' කීමි. කිමෙක්ද? ස්වාමීනි, සිතින් යුක්තව සිටියේදැයි' ඇසුවේය. 'එසේය, ඇවැත්නියි' කීයෙමි. ස්වාමීන් වහන්ස, නුඹවහන්සේ ඒ මහත් වැසිවසින කල්හි විදුලි කොටමින් හෙන පුපුරන කල්හි ඒ විදුලිකෙටීම ආදිය නොමදුටුවේද? එහි පවත්නාලද ශබ්දයද

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොඇසුවේදැයි' ඇසුවේය. 'එසේය, ඇවැත්නි කීවෙමි. එවිට ඒ පුරුෂයාහට මෙවැනි කල්පනාවක් වූයේය. 'පින්වත්නි ඒකාන්තයෙන් පුදුමයෙක පින්වත්නි, ඒකාන්තයෙන් ඉතා පුදුම වන්නේය. පින්වත්නි, මහත්වූ වැසිවසිද්දී විදුලි කොටද්දී හෙනපුපුරද්දී ඒ නොදැක නොඅසා ඒකාන්තයෙන් මහණවූ තැනැත්තෝ එවැනි ශාන්තවූ විහරණයෙන් යුක්තව වාසයකරන්නාහුය' කියා මා කෙරෙහි මහත්වූ පැහැදීම ප්‍රකාශකොට මට මනාකොටවැඳ (ප්‍රදක්ෂිණාකොට) ගෞරව දැක්වීමෙන් ගියේයයි" කීවෝය.

21 මෙසේ කී කල පුක්කුස නම් මල්ලරාජ පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ දැන්නුවේය. "ස්වාමීවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්ස, ඒ මම ආළාරකාලාම නම් තාපසයන් කෙරෙහි මාගේ යම් පැහැදීමක් ඇද්ද ඒ පැහැදීම මහත්වූ සැඩසුළඟෙහි හෝ හරිමි. ශීඝ්‍රවූ වතුරසැඩපාර ඇති ගංගාවක හෝ හරිමියි" කියා මෙසේ දැන්නුවේය. "ස්වාමීවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්ස, ඉතා යහපත, ස්වාමී වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්ස, ඉතා යහපත, ස්වාමීන්වහන්ස, යටිකුරු කොට තබනලද භාජනයක් යම්සේ උඩුකුරුකොට තබන්නේ හෝ වේද, යටපත් වූවක් යම්සේ එළිදරව්කොට තබන්නේ වේද, මංමුළාවූවෙකුහට යම්සේ මාර්ගය කියන්නේ හෝ වේද, 'අන්ධකාරයෙහි ඇස් ඇත්තෝ රූපාදී අරමුණු දකිත්වා' යි තෙල් පහනක් යම්සේ දල්වා තබන්නේ හෝ වේද, එමෙන් භාග්‍යවතුන්වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය, වදාරණ ලද්දේය ඒ මම භාග්‍යවතුන් වහන්සේද ධර්මයද මහාසංඝයාද සරණකොටයෙමි. ස්වාමීන්වහන්ස අද පටන් ජීවිතාන්තය දක්වා සරණ ගියාවූ උපාසකයෙකුකොට මා භාග්‍යවතුන් වහන්සේ දරාගනීත්වායි" කීවේය.

22 එවිට පුක්කුස නම් මල්ලරාජ පුත්‍රතෙම එක්තරා පුරුෂයෙකුහට කථාකර මෙසේ කීවේය. "පුරුෂය, තෝ යව මාගේ පෙරවීමට සුදුසුවූ රන්වන්වූ සියුම්වූ සිනිඳු වස්ත්‍රදෙක ගෙන එවයි" කීයේය. "එසේය, වහන්සැයි" කියා ඒ පුරුෂ තෙම

පුක්කුස නම් මල්ලරාජ පුත්‍රයාගේ වචනයට උත්තරදී ඒ රන්වන් වස්ත්‍රදෙක ගෙනවුත් දුන්නේය. එවිට පුක්කුස නම් මල්ලරාජ පුත්‍රතෙම ඒ රන්වන්වූ සියුම්වූ සිනිඳුවූ වස්ත්‍ර දෙක භාග්‍යවතුන් වහන්සේ වෙතට ගෙනගොස් "ස්වාමීන් වහන්ස, මාගේ මේ පෙරවීමට සුදුසුවූ රන්වන්වූ සියුම්වූ සිනිඳුවූ වස්ත්‍රදෙකය ස්වාමීන් වහන්සේ, මට අනුකම්පා පිණිස එය පිළිගනිත්වායයි කීවේය. "පුස්කුස නම් මල්ලරාජ පුත්‍රය, එසේවී නම් එක් වස්ත්‍රයකින් මා හැඳවීම කරව. එකකින් ආනන්දයන් හන්දව" කියා දැන්නුවේය. "එසේය, ස්වාමීන්වහන්සැ"යි කියා පුක්කුස නම් මල්ලරාජ පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනයට උත්තර දී එක් වස්ත්‍රයකින් බුදුරජාණන් වහන්සේද එකකින් ආනන්ද ස්ථවිරයන් වහන්සේද හැන්දවිය. එවිට භාග්‍යවතුන් වහන්සේ විසින් පුක්කුස නම් මල්ලරාජ පුත්‍රයාට දැහැමි කථාවකින් කරුණු දැක්වූහ, සමාදන් කරවූහ, සිත තියුණු කරවූහ, සිත පැහැද වූහ භාග්‍යවතුන් වහන්සේ විසින් කරුණු දක්වන ලද්දාවූ සමාදන් කරවන ලද්දාවූ සිත තියුණු කරවන ලද්දාවූ පුක්කුස නම් මල්ලරාජ පුත්‍රතෙම උන් ආසනයෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ (ප්‍රදක්ෂිණාකොට) ගෞරවයෙන් ගියේය.

23. එවිට ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම පුක්කුස නම් මල්ලරාජ පුත්‍රයා ගිය නොබෝ වේලාවකින් ඒ සියුම් සිනිඳු රත්රන් පාට වස්ත්‍ර දෙක භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශරීරයට එළවූයේය. භාග්‍යවතුන් වහන්සේගේ ශරීරයට පලඳවනලද ඒ රන්පාටවූ වස්ත්‍රදෙක ගිනිදැල් නැති ගිනි අඟුරුමෙන් ඇතුලත දීප්තියෙන් බබලන්ට විය. එවිට ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ දැන්නුවේය. "ස්වාමීන් වහන්ස, පුදුමයකි, ස්වාමීන් වහන්ස, ඉතා පුදුමයක්මය. ස්වාමීන් වහන්ස, තථාගතයන් වහන්සේගේ හමේ පාට සෑම කල්හි ඉතා පිරිසිදුවන්නේය, ස්වාමීන් වහන්ස මේ රත්රන් පාටවූ සියුම් සිනිඳු වස්ත්‍ර දෙක භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශරීරයට පැලඳවූයෙමි, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශරීරයට පලඳවන ලද්දාවූ ඒ වස්ත්‍ර දෙක (වීතච්චිකංගාරයක්මෙන්) ගිනිදැල් නැති ගිනි අඟුරුමෙන් දීප්තිමත්ව බබළන්නේයයි" දැන්නුවේය.

'ආනන්දය, ඒ කාරණය එසේමය, ආනන්දය, කල්දෙකක්හිම තථාගතයන් වහන්සේගේ හමේපාට බොහෝ පිරිසිදුව බබළන්නේය. ඒ කවර නම් කාලදෙකකද? ආනන්දය, තථාගත තෙම යම් රාත්‍රියෙක්හි ඉතා උතුම්වූ සම්‍යක් සම්බොධිය මනා කොට අවබොධ කරන්නේ වේද, යම් රාත්‍රියෙක්හි අනුපාදිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පාන්නේ වේද ආනන්දය මේ කාල දෙකෙහි තථාගතයන් වහන්සේගේ හමේ පාට අතිශයින්ම පිරිසිදුව බබළන්නේය. ආනන්දය, අද රාත්‍රියේ අන්තිම යාමයෙහි (කාල කොටසේදී) කුසිනාරා පුරය අසලවූ මල්ල රජ දරුවන්ගේ උපවර්තන නම් සල් වනයෙහි යමක සල් ගස් දෙක අතරෙහි තථාගතයන් වහන්සේගේ පිරිනිවන් පෑම වන්නේයයි" කීවෝය. 'ආනන්දය, එව, යම්හ කකුත්ථා නම් ගඟ යම් තැනකද එතනට පැමිණෙම්හයි" කීවෝය. "එසේය, ස්වාමීන්වහන්ස, යයි" කියා ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනයට උත්තර දුන්නේය.

රත්රන් පාටවූ සිනිඳු වස්ත්‍ර දෙකක් පුක්කුස නම් මල්ල රාජ පුත්‍රයෙක් පිලිගැන්විය. ඒ රත්රන් පාටවූ වස්ත්‍ර දෙකෙන් පොරවන ලද්දාවූ ශාස්තෲන් වහන්සේ රත්රන් පාටින් දීප්තිමත්ව අතිශයින් බබළන්නාහ.

**24.** එවිට භාග්‍යවතුන් වහන්සේ මහත්වූ භික්ෂු සංඝයා වහන්සේ හා සමග කකුත්ථා නම් ගංගාව යම් තැනකද එතනට පැමිණියෝය. පැමිණ, කකුත්ථා නම් ගඟට බැස පැන් නහා පැන් පානයකොට එයින් ගොඩ නැඟී අඹවනය යම් තැනකද එතනට පැමිණියෝය. පැමිණ, ආයුෂ්මත් චුන්දක ස්ථවිරයන් වහන්සේට කථාකර මෙසේ කීවෝය. "චුන්දකය, තෙපි මාගේ සඟළ සිවුර සතර පටක් කොට ආසනයක් පනවව, චුන්දකය, ක්ලාන්තවෙමි, සයනය කරන්නෙමියි" කීවෝය. "එසේය, ස්වාමීන්වහන්ස," කියා ආයුෂ්මත්වූ චුන්දක ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ වචනයට උත්තරදී සඟළ සිවුර සතර පටක් කොට ආසනයක් පැනවූයේය. එවිට භාග්‍යවතුන් වහන්සේ දකුණු ශ්‍රීපාදය උඩ වාම ශ්‍රීපාදය තබා සිහිනුවණින් යුක්තව

නැගිටින වේලාව සිතා දකුණැලයෙන් උතුම්වූ සිංහසෙය්‍යාවෙන් (සිංහයෙකුගේ නිදීමට බඳු ආකාරයෙන්) සැතපුණෝය. ආයුෂ්මත්වූ චුන්දක ස්ථවිරයන්වහන්සේද එහිම භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි හුන්නේය.

මේ සත්ව ලොකයෙහි කිසිවෙකු හා සම කළ නොහැකි තථාගතවූ දෙවි මිනිසුන්ට ගුරුවූ බුදු රජ තෙම ක්ලාන්ත ස්වභාවය ඇත්තේ පැහැදි දිය ඇත්තාවූ රසවත්වූ, මිහිරි වතුර ඇත්තාවූ කකුත්ථ නම් ගංගාවට පැමිණ ගඟට බැස ගත්තෝය.

පැන් නහා, පැන් පානයකොට, භික්ෂුසංඝයා වහන්සේගේ මධ්‍යයෙහි දෙවි මිනිසුන්ට ගුරුවූ බුදුරජ තෙම ගඟින් ගොඩ නැඟී මේ සූවාසුදහසක් ධර්මස්කන්ධයන් දෙශනා කිරීම් වශයෙන් පවත්වන්නාවූ මහාඍෂිවූ භාග්‍යවතුන් වහන්සේ අඹවනයට පැමිණියෝය.

චුන්දක ස්ථවිරයන්වහන්සේට කථාකොට, "මට සයනය කිරීම පිණිස සඟළ සිවුර සතර පටක් කොට ආසනයක් අතුරවයි" කීවෝය. සර්වඥයන් වහන්සේ විසින් මෙහෙයන ලද ඒ චුන්දක ස්ථවිර තෙම වහාම සඟළ සිවුර සතර පටක් කොට ආසනයක් පැනවූයේය. ඉතා ක්ලාන්ත ස්වභාවය ඇති ශාස්තෘන් වහන්සේ පනවන ලද ඒ ආසනයෙහි සයනය කළෝය. චුන්දක ස්ථවිරයන් වහන්සේද බුදුරජාණන් වහන්සේගේ ඉදිරියෙහිම හුන්නේය.

**25.** එවිට භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන්වහන්සේට කථාකර මෙසේ කීවෝය. "ආනන්දය, චුන්ද නම් කර්මාර පුත්‍රයාහට "යම් බඳුවූ තාගේ අන්තිම පිණ්ඩපාතය වදාළ තථාගතයන් වහන්සේ පිරිනිවන් පා වදාළ සේකැයි' කිසි පසුතැවිල්ලක් වන්නේ නම් ඒ ඔහුට අලාභයක් වන්නේය. ඔහු විසින් අයහපතක් ලබන ලද්දේය. එහෙයින් ආනන්දය, චුන්ද නම් කර්මාර පුත්‍රයාගේ පසු තැවිල්ල මෙපරිද්දෙන් දුරු කටයුත්තේය. "චුන්දය යම් බඳුවූ තාගේ අන්තිම පිණ්ඩපාතය වළඳා තථාගතයන් වහන්සේ පිරිනිවන්පා වදාළ සේක් වේද, එය තොපට ලාභයෙක් වන්නේය. එයින් තොප විසින් යහපතක්ම ලබන ලද්දේය. ඇවත්වූ චුන්ද නම් කර්මාර පුත්‍රය, සමවූ සමවිපාක ඇත්තාවූ අනිකුත් පිණ්ඩපාත

යන්ට වඩා ඉතා මහත් ඵල මහානිසංස ඇත්තාවූ පිණ්ඩපාත දෙකක් වන්නාහුයයි කියා භාග්‍යවතුන් වහන්සේගේ සම්මුඛයෙන්ම අසනලදී. සම්මුඛයෙන්ම පිළිගන්නා ලද්දේය. ඒ පිණ්ඩපාත දෙක නම් කවරේද? තථාගත තෙම යම් පිණ්ඩපාතයක් වළඳා ඊට වඩා උතුම් දෙයක් නැතිවූ සම්‍යක් සම්බොධිය මනාකොට අවබොධ කිරීම් වශයෙන් ලොවුතුරා බුදුවනසේක්ද, යම් බඳු පිණ්ඩපාතයක් වළඳා තථාගතයන් වහන්සේ අනුපාදිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පා වදාරණසේක්ද යන මේ පිණ්ඩපාත දෙක සම සමවූ ඵල ඇති වන්නාහුය. සෙසු පිණ්ඩපාතයන්ට වඩා අතිශයින් මහත්ඵල මහානිසංස වන්නාහුය කියායි ආයුෂ්මත්වූ චුන්ද නම් කර්මාර පුත්‍රයා විසින් ආයුෂය පිණිස පවත්නා කුසල කර්මයක් රැස් කරන ලද්දේය. ආයුෂ්මත් චුන්ද නම් කර්මාර පුත්‍රයා විසින් ශරීර වර්ණය පිණිස පවත්නාවූ කුශල කර්මයක් රැස් කරණ ලද්දේය ආයුෂ්මත් චුන්ද නම්වූ කර්මාර පුත්‍රයා විසින් දිව්‍ය මනුෂ්‍යාදි සැප පිණිස පවත්නාවූ කුසල කර්මයක් රැස්කරන ලද්දේය. ආයුෂ්මත් චුන්ද නම් කර්මාර පුත්‍රයා විසින් යස පිරිවර සම්පත්තිය පිණිස පවත්නාවූ කුසල කර්මයක් රැස්කරන ලද්දේය. ආයුෂ්මත් චුන්ද නම් කර්මාර පුත්‍රයා විසින් ස්වර්ග සම්පත්තිය පිණිස පවත්නාවූ කුශල කර්මයක් රැස් කරන ලද්දේය. ආයුෂ්මත් චුන්ද නම් කර්මාර පුත්‍රයා විසින් අධිපති භාවය පිණිස පවත්නාවූ කුශල කර්මයක් රැස්කරන ලද්දේය.' යනුවෙන් චුන්ද නම් කර්මාර පුත්‍රයාගේ පසුතැවිල්ල මෙසේ දුරු කටයුත්තේයයි" කීවෝය. එවිට භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය පහළ කළසේක.

"දන් දෙන්නාහට පිං වැඩෙන්නේය. ශීල සංවරයෙන් සංවරවූවහුට පස් ආකාරවූ වෛර නොවැඩෙන්නාහුය. ඥාණ සම්පන්න පුද්ගලතෙම ලාමකවූ අකුසලය දුරු කරන්නේය. රාග ද්වෙෂ මොහාදිය ක්ෂයකිරීම හේතුකොටගෙන ඒ තථාගත තෙම පරිනිර්වාණයෙන් පිරිනිවියේය" කියා වදාළසේක.

හතරවෙනි බණවර නිමියේය.

---

# 5.

1 එවිට භාග්‍යවතුන් වහන්සේ, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට කථාකර මෙසේ කීවෝය. "ආනන්දය, එව, යම්හ, හිරඤ්ඤවතී නම් ගංගාවගේ එගොඩ ඉවුර යම් තැනෙක්හිද කුසිනාරා නුවර මල්ලව රජුන්ගේ උපවර්තන නම්වූ සල්වනය යම්තැනකද එතනට පැමිණෙම්හයි' කීවෝය "එසේය, ස්වාමීන් වහන්ස" කියා ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය. එවිට භාග්‍යවතුන් වහන්සේ මහත්වූ භික්ෂු සංඝයා හා සමග හිරඤ්ඤවතී නම් ගංගාවගේ එගොඩ ඉවුර යම්තැනකද කුසිනාරා නුවර මල්ලව රජුන්ගේ උපවර්තන නම් සල් වනය යම් තැනකද එතැනට පැමිණියෝය. පැමිණ, ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේට කථාකර මෙසේ කීවෝය. "ආනන්දය, තෙපි මට යමක සල් ගස් දෙදෙන අතුරෙහි හිස උතුරට තබා ආසනයක් පනවව, ආනන්දය, ඉතා ක්ලාන්තයෙමි, සයනය කරමියි" කීවෝය. "එසේය, ස්වාමීන් වහන්සැයි" කියා ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට උත්තරදී යමක සල්ගස් අතුරෙහි උතුරට හිස තබා ආසනයක් පැණවූයේය. එවිට භාග්‍යවතුන් වහන්සේ දකුණු ශ්‍රීපාදය උඩ වම් ශ්‍රීපාදය තබා සිහි නුවණින් යුක්තව දකුණැලයෙන් සිංහසෙය්‍යාවෙන් (සිංහයෙකුගේ නිදීමට බඳු නිදීමෙන්) සැතපුණෝය.

2 එකල යමක සල්ගස්දෙක සැමතැනම අකාලයට පිපුන මල්වලින් ගැවසීගත්හ. ඒ ගස් දෙවියන් විසින් සොලවන ලදුව තථාගතයන් වහන්සේට පූජා පිණිස තථාගතයන් වහන්සේගේ ශරීරය මත මල් වගුරුවන්නාහුය. බොහෝසෙයින්ම මල් අතුලාක් මෙන් වගුරුවන්නාහුය. නිරන්තරයෙන් හාත්පස මල් වගුරුවන්නාහුය දිව්‍යමය වූ පරසතු මදාරා මල්ද අහසින් වැටෙන්නාහුය. ඒ අහසින් එන්නාවූ දිව්‍ය මල්ද තථාගතයන් වහන්සේගේ ශරීරය මත වැගිරෙන්නාහුය. බොහෝසෙයින් මල් අතුලාක් මෙන් වගුරුවන්නාහුය. නිරන්තරයෙන් හාත්පස වගුරුවන්නාහුය. තථාගතයන් වහන්සේට පූජා පිණිස දිව්‍යමයවූ සඳුන්

කුඩුද අහසින් වැටෙන්නාහුය. ඒ දිව්‍ය සඳුන් කුඩුද තථාගතයන් වහන්සේගේ ශරීරය මත විසිරෙන්නාහුය. බොහෝ සෙයින්ම සඳුන් සුණු අතුලාක් මෙන් වගුරුවන්නාහුය. නිරන්තරයෙන්ම භාත්පස වගුරුවන්නාහුය. තථාගතයන් වහන්සේට පූජා පිණිස දිව්‍යමයවූ පංචතූර්‍ය්‍ය නාදයෝද ආකාශයෙහි පවත්වන්නාහුය. තථාගතයන් වහන්සේට පූජා පිණිස දිව්‍යමය ගීතිකාද අහසෙහි පවත්නාහුය.

3 එවිට භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට කථාකර මෙසේ කීවෝය. "ආනන්දය, යමක සල්ගස් දෙදෙන අකාලයට පිපුන මල් වලින් ගැවසී ගත්හ. ඒ ගස් තථාගතයන් වහන්සේට පූජා පිණිස තථාගතයන් වහන්සේගේ ශරීරය මත මල් වගුරුවන්නාහුය. බොහෝ සෙයින්ම මල් අතුලාක් මෙන් වගුරුවන්නාහුය. දිව්‍යමය පරසතු මදාරා මල්ද අහසින් වැටෙන්නාහුය. තථාගතයන් වහන්සේගේ ශරීරය මත විසුරුවන්නාහුය. බොහෝ සෙයින් මල් අතුලාක් මෙන් වගුරුවන්නාහුය. නිරන්තරයෙන් නැවත නැවත වගුරුවන්නාහුය. තථාගතයන් වහන්සේට පූජා පිණිස දිව්‍යමයවූ සඳුන් කුඩුද අහසින් වැටෙන්නාහුය. ඒ දිව්‍ය සඳුන් කුඩුද තථාගතයන් වහන්සේගේ ශරීරය මත වැගිරෙන්නාහුය. බොහෝසෙයින්ම සඳුන් සුණු අතුලාක් මෙන් වගුරුවන්නාහුය. නිරන්තරයෙන්ම නැවත නැවත වගුරුවන්නාහුය. තථාගතයන් වහන්සේට පූජා පිණිස දිව්‍යමය ගීතිකාද අහසෙහි පවත්නාහුය ආනන්දය, මෙතෙක්වූ පූජාවෙන් තථාගත තෙම සත්කාර කරන ලද්දේ නම් නොවන්නේය. ගරු කරන ලද්දේද නොවන්නේය සිතින් බුහුමන් කරන ලද්දේත් නොවන්නේය. පූජා කරන ලද්දේත් නොවන්නේය. උපස්ථාන කිරීම් වශයෙන් පුදන ලද්දේත් නොවන්නේය. ආනන්දය, යම්කිසි භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ උපාසකයෙක් හෝ උපාසිකාවක් හෝ නව විධවූ ලොකෝත්තර ධර්මයට අනුව පිළිපදිමින් වාසය කරන්නේ වේද, සුදුසු මාර්ගයෙහි ධර්මයට අනුකූලව හැසිරෙන්නේ වේද, ඒ පුද්ගලතෙම තථාගතයන් වහන්සේට සත්කාර කරන්නේ වෙයි, ගරු කරන්නේද වෙයි, සිතින් බුහුමන් කරන්නේද වෙයි. පූජා

කරන්නේද වෙයි, උතුම්වූ පූජාවෙන්ද පුදන්නේ වෙයි. ආනන්දය, එහෙයින් ධර්මානුධර්ම හැසිරීමෙන් යුක්තව වාසය කරම්හ. නිවනට සුදුසු ප්‍රතිපත්තියෙහි යෙදී අනුධර්මචාරීව වාසය කරම්හයි කියා ආනන්දය තොප විසින් මෙසේ හික්මිය යුතු වන්නේයයි" දේශනා කළෝය.

4. එසමයෙහි ආයුෂ්මත්වූ උපවාන ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට පවන් සලමින් භාග්‍යවතුන්වහන්සේ ඉදිරියේ සිටියේ වෙයි.

එවිට භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත්වූ උපවාන ස්ථවිරයන්ට "මහණ තෝ මාගේ ඉදිරියෙහි නොසිට ඉවත් වෙවයි" කීවෝය. එවිට ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙසේවූ සිතිවිල්ලෙක් වූයේය. "මේ ආයුෂ්මත්වූ උපවාන ස්ථවිරතෙම ඉතා බොහෝ කාලයක් භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරනලද කෙනෙක. සමීපයෙහි කිට්ටුව හැසුරුණේය. එසේද වුවත් භාග්‍යවතුන් වහන්සේ දැන් මේ අන්තිම කාලයෙහි "මහණ, මාගේ ඉදිරියෙහි නොසිට ඉවත්වෙවයි" ආයුෂ්මත්වූ උපවාන ස්ථවිරයන් ඉවත් කළෝය. ඊට හේතු කවරේද? ඊට කාරණය කවරේද? භාග්‍යවතුන් වහන්සේ 'මහණ, මාගේ ඉදිරියෙහි නොසිට ඉවත් වෙවයි' කියා යම්බඳුවූ මේ ආයුෂ්මත් උපවාන ස්ථවිරයන් ඉවත්කළෝදැයි" කියා සිතුයේය.

5 එවිට ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළසේක. "ස්වාමීන් වහන්ස, මේ ආයුෂ්මත්වූ උපවාන ස්ථවිර තෙම ඉතා බොහෝ කාලයක් භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කළ කෙනෙක. සමීපයෙහි කිට්ටුව හැසුරුණේය. එසේද වුවත් භාග්‍යවතුන් වහන්සේ 'මහණ, මාගේ ඉදිරියෙහි නොසිට ඉවත්වෙවයි' කියා ආයුෂ්මත්වූ උපවාන ස්ථවිරයන් ඉවත්කර වදාළසේක්ද, ඊට හේතුව කවරේද, ඊට කාරණය කවරේදැයි" ඇසුවේය. "ආනන්දය, බොහෝ සෙයින් දසදහසක් සක්වල දෙවියෝ තථාගතයන් වහන්සේ දක්නා පිණිස රැස්වූවාහුය. ආනන්දය,

කුසිනාරා නුවර පටන් මල්ල රජුන්ගේ උපවර්තන නම් සාලවනය දක්වා හාත්පසින් දොළොස් යොදුනක් පමණ තන්හි අස්ලොම් අගක් හෙලාලන පමණ තැනකුදු මහෙශාක්‍ය (උසස්) දෙවියන්ගෙන් හිස් ප්‍රදෙශයක් නැත්තේය. ආනන්දය, දෙවියෝ මෙසේ අගුණ කියන්නාහුය. 'තථාගතයන් වහන්සේ දක්නා පිණිස දුර සිට එන ලදුම්හ. මේ ලොකයෙහි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතවරයෝ යම්කිසි දීර්ඝ කාලයකින්ම උපදනාහුය. අද රාත්‍රියේ අන්තිම යාමයෙහි (කාල කොටසෙහි) තථාගතයන් වහන්සේගේ පිරිනිවන් පෑම වන්නේය. මේ මහා බලසම්පන්න භික්ෂුවද භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි අවුරාගෙන සිටියි. අපි අවසාන කාලයෙහි තථාගතයන් වහන්සේ දක්නට නොලබම්හයි' දෙවියෝ අගුණ කියත්යයි" කීවෝය.

**6** "ස්වාමීවූ භාග්‍යවතුන් වහන්ස, ඒ දෙවියෝ ඔබ වහන්සේ ගැන කුමක් සිතව්දැයි" ඇසුවෝය. "ආනන්දය, අහසෙහි පොළොවක් මවා එය පොළවයයි හඟින්නාවූ දෙව් කෙනෙක් ඇත්තාහුය, ඒ දෙවියෝ 'භාග්‍යවතුන් වහන්සේ ඉතා වහාම පිරිනිවන් පා වදාරණ සේකැයි' කියා හිසකෙස් විසුරුවාගෙන හඬන්නාහුය. 'සුගතයන් වහන්සේ ඉතා වහාම පිරිනිවන් පා වදාරණ සේකැයි' කියා හිස අත් බැඳගෙන මහා සෝකයෙන් හඬන්නාහුය. ලොකයෙහි පසැස් ඇත්තාවූ බුදුරජාණන් වහන්සේ ඉතා වහාම අතුරුදහන් වන්නේ යයි කියා මැදින් කැඩුනාක් මෙන් එතැන මෙතන වැටෙන්නාහුය. පෘථිවියෙහි වැටෙන්නාහුය, හැපෙන්නාහුය, පෙරළෙන්නාහුය. ආනන්දය, පෘථිවියෙහි දෙවියන්ට පිහිටිය හැකිසේ පොළොව මවාගත් දෙව්කෙනෙක් ඇත්තාහුය. ඒ දෙවියෝ 'භාග්‍යවතුන් වහන්සේ ඉතා වහාම පිරිනිවන් පා වදාරණ සේකැයි' කියා හිසකෙස් විසුරුවාගෙන හඬන්නාහුය. 'සුගතයන් වහන්සේ ඉතා වහාම පිරිනිවන් පා වදාරණසේකැයි' කියා හිස අත් බැඳගෙන මහා සෝකයෙන් හඬන්නාහුය. 'පසැස් ඇත්තාවූ බුදුරජාණන් වහන්සේ වහා අතුරුදහන් වන්නේයයි' කියා මැදින් කැඩුනාක් මෙන් එතන මෙතන වැටෙන්නාහුය. පෘථිවියෙහි වැටෙමින් හැපෙන්නාහුය, පෙරළෙන්නාහුය. යම් අනාගාමී රහත්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දෙවිකෙනෙක් ඇද්ද ඒ දෙවියෝ 'සියලු සංස්කාරයෝම අනිත්‍ය වන්නාහුය, ඒ මෙතැන්හි නිත්‍ය බවක් කොයින් ලබමෝදැයි' කියා සිහි නුවණින් යුක්තව ඉවසන්නාහුය.

7. එවිට ආනන්ද ස්ථවිරයන් වහන්සේ, "ස්වාමීන් වහන්ස, මීට ඉහත ඒ ඒ දිසාවෙහි වස්වැසුවාවූ භික්ෂුහු තථාගතයන් වහන්සේ දක්නා පිණිස එන්නාහුය. අපි සිතින් වඩනලද මෛත්‍රී භාවනාදිය ඇති ඒ භික්ෂූන් දකින්ටද සේවනය කරන්ටද ලබම්හ. භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ ඇවෑමෙන් මෛත්‍රී භාවනාදියෙහි යෙදී වාසය කරන්නාවූ ඒ භික්ෂූන් වහන්සේලා දැකීමටද සේවනය කිරීමටද අපි නොලබම්හයි" කියා දැන්නුවේය.

8 "ආනන්දය, ශ්‍රද්ධාවන්ත පුද්ගලයාහට දැකීමට සුදුසුවූ දැකීමෙන් සංවේගය උපදවන්නාවූ ස්ථාන සතරක් වෙත්. ඒ ස්ථාන සතර නම් කවරහුද? ආනන්දය, 'මෙහි තථාගත තෙම උපන්නේයයි' ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයාහටදැකීමට සුදුසුවූ සංවේග උපදවන්නාවූ මේ ස්ථානය වන්නේය. 'මෙහි තථාගත තෙම අනුත්තරවූ සම්‍යක් සම්බොධිය අවබෝධ කෙළේයයි ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයාහට දැකීමට සුදුසුවූ සංවේග උපදවන්නාවූ ස්ථානයයි ආනන්දය මෙහි තථාගත තෙම ඉතා උතුම්වූ ධර්ම චක්‍රය පැවැත්වූයේයැයි ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයාහට දැකීමට සුදුසුවූ සංවේග උපදවන්නාවූ ස්ථානයයි. ආනන්දය, මෙහි තථාගත තෙම අනුපාදිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පා වදාළේයයි' ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයාහට දැකීමට සුදුසුවූ සංවේග උපදවන්නාවූ ස්ථානයයි. ආනන්දය, ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයාහට දැකීමට සුදුසුවූ සංවේග උපදවන්නාවූ මේ සතර ස්ථාන නම් වන්නාහුය. ආනන්දය, මෙහි තථාගතතෙම ලොව උපන්නේයයි කියාද, මෙහි තථාගත තෙම ඉතා උතුම්වූ සම්‍යක් සම්බෝධිය අවබෝධ කෙළේයයි කියාද, මෙහි තථාගතයන් විසින් ඉතා උතුම්වූ ධර්ම චක්‍රය පවත්වන ලද්දේයයි කියාද, මෙහි තථාගත තෙම අනුපාදිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පෑවේයයි කියාද, ශ්‍රද්ධාවන්ත භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකාවෝ පැමිණෙන්නාහුය. ආනන්දය, බෝධි චෛත්‍යාදිය වඳිමින්

චෛත්‍යයන් වෙත ගමන් කරමින් ඇවිදින්නාවූ යම්කිසි කෙනෙක් පැහැදි සිතින් කාලක්‍රියා කරන්නාහු වෙද්ද ඔහු සියල්ලෝම ශරීර භෙදයෙන් මරණින් පසු සැපයෙන් යුත් දිව්‍යලෝකයෙහි උපදින්නාහුයයි" වදාළේය.

9. "ස්වාමීන් වහන්ස, අපි ස්ත්‍රීන් කෙරෙහි කෙසේ පිළිපදිමෝද්‍යයී?" ඇසුවේය "ආනන්දය, යම් මේ ස්ත්‍රීන්ගේ නොදැක්මෙක් ඇද්ද ඒ නොදැක්මම උතුම්වූ ප්‍රතිපත්තියයි" කීවෝය "භාග්‍යවතුන් වහන්ස, දැකීමක් ඇති කල්හි කෙසේ පිළිපදිමෝද්‍යයි" ඇසුවේය. "ආනන්දය කථා නොකිරීමම උතුමැයි" කීවෝය. "ස්වාමීන්වහන්ස, කථා කරන්නහු විසින් කෙසේ පිළිපැද්ද යුත්තේද්‍යයි" ඇසුවේය. "ආනන්දය, සිහියෙන් යුක්ත විය යුතුයයි" කීවෝය.

10 "ස්වාමීන් වහන්ස, අපි තථාගතයන් වහන්සේගේ මෘත ශරීරයට කෙසේ පිළිපදිමෝද්‍යයි" ඇසුවේය. "ආනන්දය, තථාගතයන් වහන්සේගේ ශරීර පූජාව පිණිස තෙපි වෙහෙස නොවව්. ආනන්දය, තෙපි වහාම උත්තමාර්ථයවූ අර්හත්වය පිණිස උත්සාහ කරව්. අර්හත්වය පිණිස යෙදී වාසය කරව්, වීර්‍ය්‍ය ඇතිව අර්හත්වයෙහි අප්‍රමාදව වාසය කරව්. කාය ජීවිත දෙක්හි ආශාව අත්හැර වාසය කරව්යයි" දේශනා කළෝය.

"තථාගතයන් වහන්සේ කෙරෙහි පැහැදුනාවූ ක්ෂත්‍රිය පණ්ඩිතයෝද, බ්‍රාහ්මණ පණ්ඩිතයෝද, ගෘහපති පණ්ඩිතයෝද ඇත්තාහුය. ඔව්හු තථාගතයන් වහන්සේගේ ශරීර පූජාව කරන්නාහුයයි" වදාළේය.

11. "ස්වාමීන් වහන්ස, තථාගතයන් වහන්සේගේ ශරීරයෙහි කෙසේ පිළිපැද්ද යුත්තේ දැයි" ඇසුවේය,

"ආනන්දය, චක්‍රවර්ති රජහුගේ ශරීරයෙහි යම්සේ පිළිපදින්නාහුද තථාගතයන් වහන්සේගේ මෘතශරීරයෙහිද එපරිද්දෙන්ම පිළිපැද්ද යුත්තේයයි" කීවෝය.

"ස්වාමීන් වහන්ස, චක්‍රවර්ති රජහුගේ මෘත ශරීරයෙහි කෙසේ පිළිපදින්නාහු දැයි?" ඇසුවේය.

"ආනන්දය, චක්‍රවර්ති රජහුගේ මෘත ශරීරය අලුත්වූ කසී වස්ත්‍රයෙන් වෙළන්නාහුය. අලුත්වූ කසී වස්ත්‍රයෙන් වෙළා මනාකොට නගා හදනලද කපු පුලුනෙන් වෙළන්නාහුය. නගා සාදනලද කපු පුලුනෙන් වෙළා අලුත්වූ කසී වස්ත්‍රයෙන් වෙළන්නාහුය මෙම ක්‍රමයෙන් පන්සියයක් පමණ පුළුන් වස්ත්‍ර දෙකෙන් දෙක සක්විති රජහුගේ මෘත ශරීරය වෙළා රත්තරනින් සැදූ තෙල්දැමූ දෙණක තබා අනික් රන් පියනකින් වසා සියලු සුවඳ දරින් දරසෑයක් කොට චක්‍රවර්ති රජහුගේ ශරීරය දවන්නාහුය. සතරමංසන්ධියක චක්‍රවර්ති රජහුගේ ථූපයක් (සොහොනක්) කරන්නාහුය. ආනන්දය, සක්විති රජහුගේ ශරීරයෙහි, යම් ආකාරයකින් පිළිපදින්නාහු වෙද්ද, එපරිද්දෙන්ම තථාගතයන් වහන්සේගේ ශරීරයෙහිද පිළිපැද්ද යුත්තේය. සතරමංසන්ධියක තථාගතයන් වහන්සේගේ චෛත්‍යය කටයුත්තේය. ඒ සර්වඥ චෛත්‍යයෙහි යම් සත්වකෙනෙක් මල් පහන් සුවඳ ආදිය පූජා කරන්නාහු වෙද්ද, හොඳින් වඳින්නාහු වෙද්ද, සිත හෝ පහදවන්නාහු වෙද්ද, ඒ කුසලය ඔවුන්ට ඉතා බොහෝ දීර්ඝ කාලයක් හිත සැප පිණිස වන්නේයයි" කීවෝය.

12. "ආනන්දය, චෛත්‍යයට සුදුසුවූ පුද්ගලයෝ මොහු සතර දෙනෙක් වෙත්, ඒ සතරදෙන නම් කවුරුහුද? අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගත තෙම චෛත්‍යයට සුදුසු වන්නේය. පසේබුදු රජතෙම චෛත්‍යයට සුදුසු වන්නේය. සර්වඥ ශ්‍රාවක තෙම චෛත්‍යයට සුදුසු වන්නේය. සක්විති රජතෙම චෛත්‍යයට සුදුසු වන්නේය. ආනන්දය, කවර නම් අර්ථ සිද්ධියක් පිණිස අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගත තෙම චෛත්‍යයට සුදුසු වන්නේදැයි යතහොත් 'මේ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධ සර්වඥයන් වහන්සේගේ චෛත්‍යයයි" කියා, ආනන්දය, බොහෝ ජනයෝ සිත් පහදවත්. ඔව්හු ඒ චෛත්‍යය කෙරෙහි සිත් පහදවාගෙන ශරීර විනාශවී මරණින් මත්තෙහි සැපයෙන් යුත් ස්වර්ගලෝකයෙහි උපදනාහුය.

'ආනන්දය, මේ අර්ථසිද්ධිය පිණිස අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගත තෙම චෛත්‍යයට සුදුසුයයි" කීවෝය.

"ආනන්දය, කවරනම් අර්ථ සිද්ධියක් හේතුකොට ගෙන පසේබුදු රජතෙම චෛත්‍යයට සුදුසු වන්නේද? 'මේ ඒ භාග්‍යවත්වූ පසේ බුදුරජාණන් වහන්සේගේ චෛත්‍යයයි' කියා ආනන්දය, බොහෝ ජනයෝ සිත් පහදවා ගන්නෝය. ඒ සත්වයෝ ඒ චෛත්‍යය කෙරෙහි සිත් පහදවාගෙන ශරීරය විනාශවී මරණින් මත්තෙහි සැප ඇත්තාවූ ස්වර්ග ලොකයෙහි උපදනාහුය. ආනන්දය, මේ අර්ථසිද්ධිය පිණිස පසේබුදු රජතෙම චෛත්‍යයට සුදුසුයයි" කීවෝය.

"ආනන්දය, කවර නම් අර්ථ සිද්ධියක් සඳහා තථාගත ශ්‍රාවක තෙම චෛත්‍යයට සුදුසු වන්නේද? 'මේ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ ශ්‍රාවකයන්ගේ චෛත්‍යයයි' කියා, ආනන්දය, බොහෝ ජනයෝ සිත් පහදවා ගන්නෝය. ඔව්හු ඒ චෛත්‍යය කෙරෙහි සිත් පහදවා ගෙන ශරීරය විනාසවී මරණින් මත්තෙහි සැප ඇති ස්වර්ග ලොකයෙහි උපදනාහුය, මේ අර්ථසිද්ධිය සඳහා තථාගත ශ්‍රාවකතෙම චෛත්‍යයට සුදුසු වන්නේයයි කියා වදාළේය. ආනන්දය, කවරනම් අර්ථසිද්ධියක් පිණිස චක්‍රවර්ත්ති රජතෙම චෛත්‍යයට සුදුසු වන්නේද? 'මේ ඒ ධාර්මිකවූ ධර්මරාජවූ සක්විති රජහුගේ චෛත්‍යයයි' කියා ආනන්දය, බොහෝ ජනයෝ සිත් පහදවා ගන්නෝය, ඒ සත්ත්වයෝ ඒ චෛත්‍යය කෙරෙහි සිත් පහදවාගෙන ශරීරය විනාශවී මරණින් මත්තෙහි ස්වර්ගලොකයෙහි උපදනාහුය ආනන්දය, මේ අර්ථසිද්ධිය සඳහා සක්විති රජතෙම චෛත්‍යයට සුදුසු වන්නේය. ආනන්දය, හතර ආකාරවූ චෛත්‍යයට සුදුසුවූ පුද්ගලයෝ මොහු සතරදෙන නම් වන්නාහුයයි" කීවෝය.

13 එවිට ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරතෙම විහාරයට ඇතුල්වී දොර අගුල් කණුවෙහි එල්ලීගෙන "මම එකාන්තයෙන් කටයුතු සහිතවූ ශෛක්ෂ පුද්ගලයෙක් වීමි. මට අවවාද කරන්නාවූ මාගේ ශාස්තෲන් වහන්සේ පිරිනිවන් පාන්නෝයයි" කියමින් හඬ හඬා උන්නේය. එවිට භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් කැඳවා, "මහණෙනි, ආනන්ද කොහිදැයි" ඇසුවෝය.

"ස්වාමීන්වහන්ස, මේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම විහාරයට පැමිණ අගුළු කණුවෙහි එල්ලීගෙන 'එකාන්තයෙන් මම කටයුතු සහිතවූ ශෛක්ෂ පුද්ගලයෙක්මි. මට අනුශාසනා කරන්නාවූ මාගේ ශාස්තෘන් වහන්සේ පිරිනිවන් පාන්නෝය. කියා හඬමින් වැඩසිටීයයි" දැනුම් දුන්නෝය. එවිට භාග්‍යවතුන් වහන්සේ එක්තරා භික්ෂු නමකට අඬගා මෙසේ කීවෝය. "මහණ, තෝ මෙහි එව මාගේ වචනයෙන් 'ඇවැත්වූ ආනන්ද ස්ථවිරය, ශාස්තෘන් වහන්සේ තොප කැඳවන්නේයයි' කියා ආනන්දයන් කැඳවාගෙන එවයි" කීවෝය. 'එසේය, ස්වාමීන් වහන්සැයි" කියා ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනයට උත්තරදී, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන්ට මෙසේ දැන්නුවේය. "ඇවැත්වූ ආනන්ද ස්ථවිරය, භාග්‍යවතුන්වහන්සේ ඔබ කැඳවන්නාහයි" කීයේය. "එසේය, ඇවැත" කියා ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම ඒ භික්ෂුවට උත්තරදී භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට හොඳින් වැඳ එකපැත්තක උන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්වහන්සේට භාග්‍යවතුන්වහන්සේ මෙසේ කීවෝය.

14 "ආනන්දය, නොහඬව, ශෝක නොකරව, ආනන්දය, සියලුම ප්‍රිය මනාප වස්තුවෙන් වෙන්වන බව තොරවන බව අන් බවකට පැමිණෙන බව මා විසින් පළමු කොටම කියන ලද්දේ නොවේද, ආනන්දය, ඒ කාරණය දැන් මෙතැන්හි කොයින් ලැබේද? යම් දෙයක් හටගත්තේද පහළ වූයේද, ප්‍රත්‍යයන් එක්ව කරණ ලද්දේද, විනාශවන ස්වභාව ඇත්තේද, එය තථාගත ශරීරය වුවත් විනාශ නොවේවායි සිතුවත් එසේවීමට හේතුවක් කරුණක් නැත්තේය.

"ආනන්දය, තොප විසින් බොහෝ කාලයක් මුළුල්ලෙහි ඉදිරිපිටය නොඉදිරිපිටය කියා වෙනසක් නැතිව හිතවත්වම සතුටින්ම මෛත්‍රියෙන් යුක්තව අප්‍රමාණවූ කායික කටයුතු වලින්ද, ඉදිරිපිටය නොඉදිරිපිටය කියා වෙනසක් නැතිව

හිතවත්වම සතුටින්ම මෛත්‍රියෙන් යුක්තව අප්‍රමාණවූ වචනයෙන්ද, ඉදිරිපිටය නොඉදිරිපිටය කියා වෙනසක් නැතිව හිතවත්වම සතුටින්ම මෛත්‍රියෙන් යුක්තව අප්‍රමාණවූ මනො කර්මවලින්ද තථාගතයන් වහන්සේට උපස්ථාන කරන ලදී. ආනන්දය, තෙපි කරණ ලද බොහෝ පින් ඇත්තාහුය. උත්සාහ කරව, වහා රහත් බවට පැමිණෙන්නෙහියයි" කීවෝය.

**15** එවිට භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්ට අඬගා මෙසේ කීවෝය. "මහණෙනි, ඉකුත්ව ගියාවූ දීර්ඝවූ අතීතකාලයෙහි යම් ඒ අර්හත් සම්‍යක්සම්බුද්ධ කෙනෙක්වූවාහුද, ඒ භාග්‍යවතුන් වහන්සේලාගේ උපස්ථායකයෝද මට ආනන්දයන් මෙනි. මහණෙනි, මතුවන්නාවූ දීර්ඝවූ අනාගත කාලයෙහි යම් ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධ කෙනෙක් උපදින්නාහු වෙද්ද, ඒ භාග්‍යවතුන් වහන්සේලාගේ උපස්ථායකයෝද මට ආනන්දයන් මෙනි. මහණෙනි, ආනන්ද පණ්ඩිතය (දක්ෂය), මහණෙනි, ආනන්ද ප්‍රඥාවන්තය, තථාගතයන් වහන්සේ දැක්වීමට භික්ෂූන්ගේ පැමිණීමට මේ කල් වන්නේයයි කියා දන්නේය. භික්ෂුණීහුගේ පැමිණීමට තවම කල් වන්නේයයි කියා දන්නේය. උපාසකයන්ගේ පැමිණීමට මේ කල් වන්නේයයි කියා දන්නේය. උපාසිකාවන්ගේ පැමිණීමට මේ කල් වන්නේයයි කියා දන්නේය. රජදරුවන්ගේද රාජ මහාමාත්‍යාදීන්ගේද පැමිණීමට මේ කල් වන්නේයයි කියා දන්නේය. තීර්ථකයන් හා තීර්ථක ශ්‍රාවකයන්ගේ පැමිණීමට මේ කල් වන්නේයයි කියා දන්නේය.

**16** "මහණෙනි, ආනන්දයන් කෙරෙහි ආශ්චර්‍ය්‍ය අද්භූත පුදුම කරුණු හතරක් ඇත්තේය. කවර සතරක්ද යත්? මහණෙනි, ඉදින් භික්ෂු පිරිස ආනන්දයන් දක්නා පිණිස පැමිණෙයිද, ඒ භික්ෂු පිරිස ආනන්දයන් දැකීමෙන් සතුටු වන්නීය. ඉදින් ඒ භික්ෂු පිරිසෙහි ආනන්ද කථාකරයිද කථාවෙන්ද ඒ පිරිස සතුටු වන්නීය. මහණෙනි, භික්ෂු පිරිස කථාව අසා ඇතිවීමක් නැති කල්හිම ආනන්ද නිශ්ශබ්ද වන්නේය.

"මහණෙනි, ඉදින් භික්ෂුණී පිරිසද, උපාසක පිරිසද, උපාසිකා පිරිසද, ආනන්දයන් දක්නා පිණිස පැමිණෙයිද, ඒ

පිරිස ආනන්දයන්ගේ දැකීමෙන් සතුටු වන්නීය, ඉදින් ඒ පිරිසෙහි ආනන්ද කථාකරන්නේවේද, කථාවෙන්ද ඒ උපාසිකා පිරිස සතුටු වන්නීය. මහණෙනි, උපාසිකා පිරිසට කථාව අසා ඇතිවීමක් නැති කල්හිම ආනන්ද නිශ්ශබ්ද වන්නේය. මහණෙනි, ආනන්දයන් කෙරෙහි මේ පුදුම කරුණු සතර වන්නාහුය.

"මහණෙනි, චක්‍රවර්ති රජ කෙරෙහි මේ පුදුම කරුණු හතර ඇත්තාහුය. ඒ කරුණු හතර නම් කවරහුද? ඉදින් මහණෙනි, ක්ෂත්‍රිය පිරිස සක්විති රජුන් දැකීම පිණිස පැමිණේද, සක්විති රජුන් දැකීමෙන් ඒ පිරිස සතුටුවන්නීය ඒ පිරිසෙහි සක්විති රජ කථාකරයිද කථාවෙන්ද ඒ පිරිස සතුටු වන්නීය. ඒ පිරිසට කථාව අසා ඇතිවීමක් නැතිකල්හිම සක්විති රජ නිශ්ශබ්ද වන්නේය. ඉදින් මහණෙනි, බ්‍රාහ්මණ පිරිසද, ගෘහපති පිරිසද, ශ්‍රමණ පිරිසද චක්‍රවර්ති රජ්ජුරුවන් දක්නා පිණිස පැමිණෙයිද දැකීමෙන්ම ඒ පිරිස සතුටු වන්නීය, ඉදින් ඒ පිරිසෙහි ඒ චක්‍රවර්ති රජ ගැන කථාකරන්නේද කථාවෙනුද ඒ පිරිස සතුටු වන්නීය. මහණෙනි, ඒ ශ්‍රමණ පිරිස කථාව අසා ඇතිවීමට නොපැමිණි කල්හිම චක්‍රවර්ති රජතෙම නිශ්ශබ්ද වන්නේය. මහණෙනි එපරිද්දෙන්ම ආනන්දයන් කෙරෙහිද මේ පුදුම කරුණු සතර ඇත්තාහුය."

17 මෙසේ කී කල ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන්වහන්සේට මෙසේ දැන්නුවේය. 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කුඩා නුවරක්වූ සම නගරයක් නොවූ ශාඛා නගරයක්වූ මේ කුසිනාරානුවරදී පිරිනිවන්පෑම නොකරත්වා. ස්වාමීන් වහන්ස, මෙයින් අන්‍යවූ මහා නුවරවල් ඇත්තාහුය ඒ කවරහුද? චම්පා නම් නුවරය, රජගහ නුවරය, සැවැත් නුවරය, සාකෙත නම් නුවරය, කොසැඹෑ නම් නුවරය, බරණැස් නුවරය, මේ නුවරවල් අතරෙන් යම්කිසි නුවරක්හිදී භාග්‍යවතුන්වහන්සේ පිරිනිවන්පෑම කරත්වා. ඒ නගරයන්හි තථාගතයන් වහන්සේ කෙරෙහි ඉතා පැහැදුණාවූ මහත් ධන ඇති බොහෝවූ ක්ෂත්‍රියයෝද, මහත් ධන ඇති බොහෝවූ බ්‍රාහ්මණයෝද, මහත් ධන ඇති බොහෝවූ ගෘහපතීහුද ඇත්තාහ.

ඔව්හු තථාගතයන් වහන්සේගේ ශරීර පූජා කරන්නාහුයයි” දැනුම් දුන්නේය.

“මේ නුවර කුඩා නුවරෙක, විසම නුවරෙක, ශාඛා නුවරෙකැයි, ආනන්දය එසේ නොකියව, ආනන්දය එසේ නොකියව.

18 ආනන්දය, පෙර කාලයෙහි සාගර පරියන්තකොට ඇති සතර මහාද්වීපය ජයගත්තාවූ ජනපදයන්ගේ ස්ථිර භාවයට පැමිණියාවූ ධාර්මිකවූ ධර්මරාජවූ රත්න හතෙන් යුක්තවූ මහා සුදර්ශන නම්වූ සක්විති රජෙක් වූයේය. ආනන්දය, ඒ මහා සුදර්ශන නම් රජහුගේ මේ කුසිනාරා නුවර කුසාවතී නම් රාජධානිය වූයේය. ආනන්දය. ඒ මේ කුසාවතී නම් රාජධානිය නැගෙනහිර පටන් බස්නාහිර දක්වා දිගින් දොළොස් යොදුනක් වූයේය. උතුරේ පටන් දකුණ දක්වා පුළුලින් සත් යොදුනක් පමණ වූයේය. ආනන්දය, කුසාවතී නම් රාජධානිය සියල්ලෙන් සම්පූර්ණ වූවාය. ප්‍රීතිමත් බොහෝ ජනයන් ඇත්තීය. බොහෝ මනුෂ්‍යයන්ගෙන් ගැවසීගත්තීය. බොහෝ ආහාර පාන ඇත්තීය.

“ආනන්දය, යම්සේ දෙවියන්ගේ ආලකමන්දා නම් රාජධානිය සමෘද්ධද සියල්ලෙන් සම්පූර්ණද ප්‍රීතිමත්වූ බොහෝ ජනයන් ඇත්තීද, සෙසු දෙවියන් හා දිව්‍යාංගනාවන්ගෙන් ගැවසී ගත්තීද ආනන්දය, එපරිද්දෙන්ම කුසාවතී නම් රාජධානිය සමෘද්ධ වූවාය. ප්‍රීතිමත්වූ බොහෝ ජනයන් ඇත්තීය. බොහෝ මනුෂ්‍යයන්ගෙන් ගැවසී ගත්තීය. බොහෝ ආහාර පාන ඇත්තීය. ආනන්දය, කුසාවතී නම් රාජධානිය රෑ දාවල් දෙක්හි දශවිධ ශබ්දයෙන් නොවෙනස්ව එකනින්නාද වූයේය. ඒ දශවිධ ශබ්ද නම් කවරේද? ඇතුන්ගේ කුංචනාද (ඇතුන් ගේ හඬින්ද) ශබ්දයෙන්ද, අසුන්ගේ හෙසාරවයෙන්ද, (අශ්ව හඬින්ද) රථ ශබ්දයෙන්ද, බෙර ශබ්දයෙන්ද, මුදිංග (බෙර විශෙෂයක්) ශබ්දයෙන්ද, වීණා ශබ්දයෙන්ද ගීතිකා (ගී හඬ) ශබ්දයෙන්ද, තාල (කයිතාලම්) ශබ්දයෙන්ද කන්න බොන්න අඩගාන ශබ්දයෙන්ද මේ දශවිධ ශබ්දයන්ගෙන් අතුරු නැත්තේය.

19 "ආනන්දය, තෙපි යව, ගොස් කුසිනාරා නුවරට පැමිණ, කුසිනාරා නම් නුවර වාසය කරන්නාවූ මල්ල රජ දරුවන්ට මෙසේ කියව, 'වාසෙට්ඨ ගොත්‍රයෙහිවූ මල්ල දරුවෙනි, අද රාත්‍රියේ අන්තිම යාමයෙහි (කාල කොටසෙහි) තථාගතයන් වහන්සේගේ පිරිනිවීම වන්නේය. වාසෙට්ඨ ගොත්‍රයෙහිවූ මල්ල රජදරුවෙනි, වහාම පිටත්වව්. ගොත්‍රයෙන් වාසෙට්ඨ නම්වූ එම්බා මල්ල රජදරුවෙනි, වහා පිටත්වව්, 'අපගේ ගමෙහි අප තථාගතයන් වහන්සේගේ පිරිනිවන්පෑම වූයේය. අන්තිම කාලයෙහි තථාගතයන් වහන්සේගේ දැකීම අපි නොලද්දෙමුයයි' කියා පසුව පසුතැවිලි නොවව්" කියායි.

"එසේය පින්වතුන් වහන්සැයි" කියා ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනයට උත්තරදී, හැඳ පොරවා පාත්‍රා සිවුරු ගෙන තමන්වහන්සේ දෙවෙනිකොට ඇතිව කුසිනාරා නම් පුරයට පැමිණියේය.

20 එකල කුසිනාරා වැසි මල්ල රජදරුවෝ යම්කිසි කාර්‍ය්‍යයක් සඳහා රැස්වීම් ශාලාවෙහි රැස්ව උන්නාහුය. එවිට ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිර තෙම කුසිනාරා නුවර වැසි මල්ල රජදරුවන්ගේ රැස්වීම් ශාලාව යම් තැනකද එතනට පැමිණියේය. පැමිණ කුසිනාරා නුවර වැසි මල්ලරජදරුවන්ට මෙසේ කීයේය. "වාසෙට්ඨ නම්වූ මල්ල රජදරුවෙනි, අද මේ රාත්‍රියගේ අන්තිම යාමයෙහි තථාගතයන් වහන්සේගේ පිරිනිවන් පෑම වන්නේය. මල්ල රජදරුවෙනි, වහා පිටත්වව්, වාසෙට්ඨ ගොත්‍රයෙහිවූ මල්ල රජදරුවෙනි, වහාම පිටත්වව්, අපගේ ගමෙහිම අප තථාගතයන් වහන්සේගේ පිරිනිවන් පෑම වූයේය. අන්තිම කාලයෙහි තථාගතයන් වහන්සේගේ දැකීම අපි නොලද්දෙමුයයි' කියා පසුතැවිලි නොවව්යයි" කීවේය.

21 ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ මේ වචනය අසා මල්ල රාජ පුත්‍රයෝද මල්ල රජුන්ගේ ලේලිවරුද, මල්ල රජුන්ගේ භාර්‍ය්‍යාවෝද හටගත් දුක් ඇතිව දුකින් යුක්තව සිතේ හටගත් බලවත් දුකින් යුක්තව 'භාග්‍යවතුන් වහන්සේ ඉතා වහාම පිරිනිවන් පාන්නෝය. ඉතා ඉක්මනින් තථාගතයන්

වහන්සේ පිරිනිවන් පාන්නෝය, ඉතා ඉක්මනින් පසැස් ඇති බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාන්නෝයයි' සමහර කෙනෙක් කෙස් විසුරුවා හඬත්, හිස අත් බැඳගෙන හඬත්, මැදින් කැඩුනාක් මෙන් ඇදවැටෙත්, පෙරලෙත්, විශෙෂයෙන් පෙරලෙත්.

එවිට මල්ල රජුන් හා මල්ල රාජ පුත්‍රයෝද මල්ල රජුන්ගේ ලේලියෝද මල්ල රජුන්ගේ භාර්‍ය්‍යාවෝද හටගත් දුක් ඇතිව නොසතුටු සිත් ඇතිව සිතේ දුකින් යුක්තව මල්ල රජදරුවන්ගේ උපවර්තන නම් සල්වනය යම් තැනකද ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිර තෙම යම් තැනකද එතැනට පැමිණියාහුය.

22 එවිට ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙසේවූ කල්පනාවක් වූයේය. "ඉදින් මම කොසිනාරක නම්වූ මල්‍ල රජදරුවන් වෙන වෙනම එක රජක්හු බැගින් භාග්‍යවතුන් වහන්සේට දක්වා වැන්දවූයෙම් නම් එකල්හි මේ රාත්‍රිය ගතවන්නීය. කුසිනාරාවාසී මල්‍ල රජදරුවන් විසින් භාග්‍යවතුන්වහන්සේ නොවඳින ලද්දේනම් වන්නේය. මම කොසිනාරක නම් මල්‍ල රජදරුවන් එකි එකී (පවුල්) කුල පිළිවෙලින් වෙන වෙනම සිටුවා "ස්වාමීන්වහන්ස, මෙනම් නමක් ඇති මල්‍ල රජතෙම, පුත්‍ර භාර්‍ය්‍යා පිරිවර අමාත්‍යාදීන් හා සහිතව භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාද දෙක හිස තබා වඳින්නේයයි කියා භාග්‍යවතුන් වහන්සේට වැන්දවූයෙම් නම් ඉතා යහපතැයි" කියා සිතුවේය. මෙසේ සිතා එවිට ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම කුසිනාරා වැසි මල්‍ල රජ දරුවන් එක එක කුල (පවුල්) පිළිවෙලින් වෙන වෙනම සිටුවා "ස්වාමීන්වහන්ස, මෙනම් මල්‍ල රජතෙම, පුත්‍ර භාර්‍ය්‍යා, පිරිවර අමාත්‍යාදීන් සමග භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාද දෙක හිස තබා වඳින්නේයයි" කියා භාග්‍යවතුන් වහන්සේට වැන්දවූයේය. එවිට ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම මේ ක්‍රමයෙන් ප්‍රථම යාමයෙහිම කුසිනාරා වැසි මල්‍ල රජදරුවන් භාග්‍යවතුන් වහන්සේට වැන්දවූයේය.

23 එකල සුභද්‍ර නම්වූ පරිබ්‍රාජකයෙක් (ශාසනයෙන් පිට මහණ තැනැත්තෙක්) කුසිනාරා නම් නුවර වාසය කරන්නේය.

ඒ සුභද්‍ර නම් පරිබ්‍රාජක තෙම 'අද රාත්‍රියගේ පශ්චිම යාමයෙහි ශ්‍රමණ භවත් ගෞතමයාණන් වහන්සේගේ පරිනිර්වාණය වන්නේයයි' කියා ඇසුයේය. එවිට සුභද්‍ර නම් පරිබ්‍රාජකයාහට මෙබඳු සිතක් වූයේය. 'වයස් ගතවූ මහළුවූ ආචාර්‍ය්‍යවරයන් විසින්ද ආචාර්‍ය්‍යයන්ගේ ආචාර්‍ය්‍යවරයන් විසින්ද කියනලද "අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතවරයෝ ඉතා බොහෝවූ දීර්ඝ කාලයකින් ලොව උපදනාහුය.' යන මේ වචනය මා විසින් අසන ලද්දේය. 'අද රාත්‍රියේ අන්තිම යාමයෙහි ශ්‍රමණ භවත් ගෞතමයාණන් වහන්සේගේ පිරිනිවන් පෑම වන්නේය. මට උපන්නාවූ සැකයක්ද ඇත්තේය. යම්සේ මම මේ සැකය දුරු කෙරෙම්ද එපරිද්දෙන් ධර්මදෙශනා කරන්ට ශ්‍රමණභවත් ගෞතමතෙම පොහොසත් වන්නේයයි කියා මම ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ කෙරෙහි මෙසේ පැහැදුනෙමි' යන සිතිවිල්ලය.

**24** එවිට සුභද්‍ර නම් පරිබ්‍රාජකතෙම මල්ල රජදරුවන්ගේ උපවර්තන නම් සල් වනය යම් තැනකද ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන්ට මෙසේ කීයේය. "පින්වත්වූ ආනන්ද ස්ථවිරය, මහළුවූ වයස්ගතවූ ආචාර්‍ය්‍යවරයන් විසින්ද ආචාර්‍ය්‍යවරයන්ගේ ආචාර්‍ය්‍යවරයන් විසින්ද කියනලද 'අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතවරයෝ ඉතා බොහෝවූ දීර්ඝ කාලයකින් ලොව උපදනාහුය' යන මේ වචනය මා විසින් අසන ලද්දේය. 'අද රාත්‍රියේ අන්තිම යාමයෙහි ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේගේ පිරිනිවන් පෑමවන්නේය.' මට උපන්නාවූ සැකයක්ද ඇත්තේය. යම්සේ මම් මේ සැකය දුරු කෙරෙම්ද, එසේ ධර්මදෙශනා කරන්ට ශ්‍රමණ භවත් ගෞතම තෙම පොහොසත් වන්නේයැයි කියා, ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ කෙරෙහි පැහැදුනෙමි. පින්වත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්ස, ශ්‍රමණ භවත් ගෞතමයාණන් වහන්සේ දැකීමට ලබන්නෙම් නම් යහපතැයි" යාච්ඤා කෙළේය.

සුභද්‍ර පරිබ්‍රාජකයා විසින් මෙසේ කී කල ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම සුභද්‍ර නම් පරිබ්‍රාජකයාහට මෙසේ කීවේය.

"ඇවැත්වූ සුභද්‍රය, දැන් එය කළ නොහැකිය. තථාගතයන් වහන්සේ නොවෙහෙසව. භාග්‍යවතුන් වහන්සේ ක්ලාන්තවූ සේකැ" යි කීවේය. දෙවෙනි වරද ආනන්ද ස්ථවිරයන්ට මෙසේ කීවේය.

"පින්වත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්ස, වයස්ගතවූ වැඩිමහලුවූ ආචාර්‍ය්‍යවරයන් විසින්ද ආචාර්‍ය්‍යවරයන්ගේ ආචාර්‍ය්‍යවරයන් විසින්ද කියනලද 'අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතවරයෝ ඉතා බොහෝවූ දීර්ඝ කාලයකින් ලොව උපදුනාහුය' යන මේ වචනය මා විසින් අසන ලද්දේය. අද රාත්‍රියේ අන්තිම යාමයෙහි ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේගේ පිරිනිවන් පෑම වන්නේය. මට උපන්නාවූ සැකයක්ද ඇත්තේය. යම්සේ මම මේ සැකය දුරුකෙරෙම්ද, එසේ ධර්මදෙශනා කරන්ට ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ පොහොසත් වන්නේය. ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ කෙරෙහි මෙසේ ප්‍රසන්නයෙමි. පින්වත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්ස, ශ්‍රමණ භවත් ගෞතමයාණන් වහන්සේ දැකීමට ලබන්නෙම් නම් යහපත්ය" කියා යාච්ඤා කළේය.

සුභද්‍ර පරිබ්‍රාජකයා විසින් මෙසේ කී කල ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම, සුභද්‍ර නම් පරිබ්‍රාජකයාහට මෙසේ කීවේය. "ඇවැත්වූ සුභද්‍රය, දැන් එය කළ නොහැකිය. තථාගතයන් වහන්සේ නොවෙහෙසව, භාග්‍යවතුන්වහන්සේ ක්ලාන්ත වූසේකැ" කීවේය. තුන්වෙනි වරද ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙසේ කීවේය.

"පින්වත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්ස, වයස්ගතවූ මහළුවූ ආචාර්‍ය්‍යවරයන් විසින්ද ආචාර්‍ය්‍යවරයන්ගේ ආචාර්‍ය්‍යවරයන් විසින්ද කියනලද 'අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතවරයෝ ඉතා බොහෝවූ දීර්ඝ කාලයකින් ලොව උපදනාහුය' යන මේ වචනය මා විසින් අසන ලද්දේය. අද රාත්‍රියේ අන්තිම යාමයෙහි ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේගේ පිරිනිවන් පෑම වන්නේය. මට උපන්නාවූ සැකයක්ද ඇත්තේය. යම්සේ මම මේ සැකය දුරුකෙරෙම්ද, එසේ ධර්ම දේශනා කරන්ට ශ්‍රමණ භවත්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ගෞතමයන් වහන්සේ පොහොසත් වන්නේය. ශ්‍රමණ භවත් ගෞතමයන්වහන්සේ කෙරෙහි මෙසේ ප්‍රසන්නයෙමි. පින්වත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්ස, ශ්‍රමණ භවත් ගෞතමයාණන් වහන්සේ දැකීමට ලබන්නෙම් නම් යහපති" කියා යාච්ඤා කළේය.

සුභද්‍ර පරිබ්‍රාජකයා විසින් මෙසේ කී කල ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම සුභද්‍ර නම් පරිබ්‍රාජකයාහට මෙසේ කීවේය. "ඇවැත්වූ සුභද්‍රය, දැන් එය කළ නොහැකිය, තථාගතයන් වහන්සේ නොවෙහෙසව, භාග්‍යවතුන් වහන්සේ ක්ලාන්තවූ සේකැයි" කීවේය.

**25** භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ සුභද්‍ර නම් පරිබ්‍රාජකයා හා සමග කළාවූ මේ කථා සල්ලාපය ඇසුවෝය. එවිට භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේට කථාකර මෙසේ කීවෝය. "ආනන්දය, නුසුදුසුය, සුභද්‍රයා නොවළක්වව. සුභද්‍ර පරිබ්‍රාජක තෙම තථාගතයන් වහන්සේගේ දැකීම ලබාවා. සුභද්‍ර තෙම මාගෙන් යම් කිසිවක් විචාරන්නේ වේද ඒ සියල්ල දැනගන්ට කැමතිවම විචාරන්නේය. මා වෙහෙසනු කැමතිව නොවන්නේය. ඔහු විසින් යමක් විචාරණ ලදුව මම ඔහුට ප්‍රකාශ කෙරෙම්ද, ඒ ප්‍රකාශ කොට කියන ලද කාරණය වහාම ඔහු දැනගන්නේයයි" කීවෝය. එවිට ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරතෙම සුභද්‍ර නම් පරිබ්‍රාජකයාහට මෙසේ කීවේය.

"ඇවැත්වූ සුභද්‍රය යව, තට භාග්‍යවතුන් වහන්සේ අවසර දුන්නෝයයි" කීයේය.

**26** එවිට සුභද්‍ර නම් පරිබ්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටුවූයේය. සතුටු විය යුතුවූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා එකපැත්තක උන්නේය. එක පැත්තක උන්නාවූ සුභද්‍ර නම් පරිබ්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීයේය. "භවත් ගෞතමයන් වහන්ස, සංඝ සමූහ ඇත්තාවූ ශිෂ්‍ය සමූහ ඇත්තාවූ බොහෝ ශ්‍රාවකයන්ට ආචාර්‍ය්‍යවූ ලොක

ප්‍රසිද්ධවූ යස පිරිවර ඇත්තාවූ තීර්ථකරවූ බොහෝ ජනයා පණ්ඩිතයයි පිළිගත්තාවූ යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් ඇත්තාහු වෙද්ද ඔහු කවුරුද යත්? පූරණ කාශ්‍යපය, මක්ඛලීගොසාලය, අජිතකෙශකම්බලය, පකුධකාත්‍යායනය, සංජය නම් බෙල්ලට්ඨි පුත්‍රය, නිගණ්ඨ නාත පුත්‍රය යන මොහු වෙත්. ඔහු සියල්ලෝම ඔවුන්ගේ ප්‍රකාශය යම්සේද, එපරිද්දෙන්ම දැනගත්තාහුද නැතහොත් සියල්ලෝම නොදැන ගත්තාහුද නොහොත් ඇතැම්කෙනෙක් දැනගත්තාහුද ඇතැම් කෙනෙක් නොදැනගත්තාහුද?" කියා ඇසීය.

"සුභද්‍රය, ඔහු සියල්ලෝම තම තමන්ගේ ප්‍රකාශය පරිදි දැනගත්තාහුයයි කියාද සියල්ලෝම දැනනොගත්තාහුයයි කියාද නොහොත් සමහර කෙනෙක් දැනගත්තාහුයයි කියාද සමහර කෙනෙක් නොම දැනගත්තාහුය කියාද යන තාගේ ඒ වචනය තිබේවා. සුභද්‍රය, තට ධර්මදෙශනා කරන්නෙමි. ඒ ධර්මය මනාකොට අසව, යහපත්කොට සිත්හි කරව, දෙශනා කරන්නෙමි" කීවෝය. "එසේය, ස්වාමීන්වහන්සැයි" කියා සුභද්‍ර නම් පරිබ්‍රාජක තෙම භාගවතුන් වහන්සේගේ වචනයට උත්තර දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ දේශනා කළෝය.

**27** "සුභද්‍රය, යම් ධර්ම විනයෙක්හි වනාහි උතුම් අෂ්ටාංගික මාර්ගය නොලැබෙන්නේ වේද, ඒ ධර්ම විනයෙහි ශ්‍රමණයෙකුදු නොලැබෙන්නේය. ඒ ධර්මවිනයෙහි දෙවෙනි ශ්‍රමණ තෙමේද නොලැබෙන්නේය. ඒ ධර්මවිනයෙහි තුන් වෙනි ශ්‍රමණ තෙමේද නොලැබෙන්නේය. ඒ ධර්ම විනයෙහි සතරවෙනි ශ්‍රමණ තෙමේද නොලැබෙන්නේය. සුභද්‍රය, යම් ධර්ම විනයෙක්හි වනාහි උතුම් අෂ්ටාංගික මාර්ගය ඇත්තේ වේද ඒ ධර්ම විනයෙහි ශ්‍රමණ තෙමේද ඇත්තේ වෙයි. ඒ ධර්ම විනයෙහි දෙවෙනි ශ්‍රමණ තෙමේද ඇත්තේ වෙයි. ඒ ධර්ම විනයෙහි තුන්වෙනි ශ්‍රමණ තෙමේද ඇත්තේ වෙයි. ඒ ධර්ම විනයෙහි සතරවෙනි ශ්‍රමණ තෙමේද ඇත්තේ වෙයි. සුභද්‍රය, මාගේ මේ ධර්ම විනයෙහි උතුම් අෂ්ටාංගික මාර්ගය ඇත්තේය. එම්බා සුභද්‍රය, මාගේ මේ ශාසනයෙහි පළමුවෙනි ශ්‍රොතාපන්න ශ්‍රමණ තෙමේද ඇත්තේ

වෙයි. මේ ශාසනයෙහි දෙවෙනිවූ සකෘදාගාමි ශ්‍රමණ තෙමේද ඇත්තේ වෙයි. මාගේ මේ ශාසනයෙහි තුන්වෙනිවූ අනාගාමි ශ්‍රමණ තෙමේද ඇත්තේ වෙයි. මෙහි සතරවැනිවූ අර්හත් ඵලයට පැමුණුන ශ්‍රමණ තෙමේද ඇත්තේ වෙයි. අන්‍ය වාදයෝ ශ්‍රමණයන් කෙරෙන් සූන්‍ය වන්නාහුය. සුභද්‍රය, මාගේ මේ ශාසනයෙහි භික්ෂූහු යහපත් හැසිරීමෙන් යුක්තව වාසය කරන්නාහුවීනම් මේ ලොකය රහතුන්ගෙන් හිස්නොවන්නේය.

"සුභද්‍ර නම් පරිබ්‍රාජකය, වයසින් එකුන්විසි වයස් වූයේම සර්වඥතාඥානය සොයමින් පැවිදි වූයෙම්ද එතැන් පටන් පනස් පස් අවුරුද්දකට වැඩි මේ කාලය තුළ මාගේ මේ ශාසනයෙන් පිටත්වූ අන්‍ය වාදයෙක්හි උතුම් මාර්ග ධර්මයෙහි කොටසක්වත් පවතින විදර්ශක ශ්‍රමණයෙකුත් නැත්තේය. දෙවෙනි ශ්‍රමණයෙකුත් නැත්තේය. තුන්වෙනි ශ්‍රමණයෙකුත් නැත්තේය. සතරවෙනි ශ්‍රමණයෙකුත් නැත්තේය. අන්‍යවාදයෝ ශ්‍රමණයන්ගෙන් හිස්වන්නාහුය. සුභද්‍රය, මාගේ මේ ශාසනයෙහි භික්ෂූහු යහපත් හැසිරීමෙන් යුක්තව වාසය කරන්නාහු වීනම් මේ ලොකය රහතුන්ගෙන් හිස් නොවන්නේයයි" කීවෝය.

28 මෙසේ වදාළ කල සුභද්‍ර නම් පරිබ්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේය. "ස්වාමීන්වහන්ස, ඉතා යහපත්ය. ස්වාමීන්වහන්ස, ඉතා යහපත්ය. ස්වාමීන්වහන්ස, උඩපැත්ත යටකර තබන ලද භාජනයක් උඩුකුරුකොට තබන්නේ යම්සේද, තණ පත් ආදියෙන් වැසීතිබෙන යම්කිසි වස්තුවක් එළිදරව්කොට දක්වන්නේ යම්සේද, මංමුළාවූ පුරුෂයෙකුහට මාර්ගය දක්වන්නේ යම්සේද අන්ධකාරයෙහි 'ඇස් ඇත්තෝ රූපයන් දකිත්වායි පහනක් දරන්නේ යම්සේද එපරිද්දෙන්ම භාග්‍යවතුන්වහන්සේ විසින් නොයෙක් කාරණයෙන් ධර්මය ප්‍රකාශකරන ලද්දේය. ස්වාමීන්වහන්ස, ඒ මම සියලු ලොකයාට ප්‍රධානවූ භාග්‍යවතුන් වහන්සේද ලෝකයේ උතුම් ධර්ම නවයවූ ශ්‍රී සද්ධර්මරත්නයද අෂ්ටායඞ පුද්ගල භික්ෂු සංඝයාද සරණයෙමි. මම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි ප්‍රව්‍රජ්‍යාව හා උපසම්පදාව ලබන්නෙමියි" කීවේය. "සුභද්‍රය, පෙර

අන්‍ය තීර්ථකවූ යම් පුද්ගලයෙක් තෙම මේ ධර්ම විනය සංඛ්‍යාත ශාසනයෙහි පැවිදිවීම කැමති වන්නේ වේද උපසම්පදාව කැමතිවන්නේ වේද, ඒ පුද්ගල තෙම සාර මසක් භික්ෂු සංඝයා වෙත විසිය යුතු වන්නේය. සාරමසක්හුගේ ඇවෑමෙන් ඔහුගේ හික්මීම දැක සතුටුවූ භික්ෂූහු භික්ෂුභාවය පිණිස පැවිදි කරන්නාහුද උපසම්පදා කරන්නාහුද වෙති. එහෙත් මෙහිදී පුද්ගල විශෙෂය දැන ගන්නා ලද්දේයයි" වදාළේය.

**29** "ස්වාමීන්වහන්ස, ඉදින් පෙර අන්‍ය තීර්ථකවූ යම් පුද්ගල කෙනෙක් මේ ශාසනයෙහි මහණකම හා උපසම්පදාව කැමතිවන්නාහු නම් සාරමසක් භික්ෂු සංඝයා වෙත විසිය යුත්තාහු වෙද්ද, සාරමක්හුගේ ඇවෑමෙන් ඔවුන්ගේ හික්මීම දැක සතුටුවූ භික්ෂූහු භික්ෂුභාවය පිණිස පැවිදි කරද්ද උපසම්පදා කරද්ද මම හතර අවුරුද්දක් භික්ෂූ සංඝයා වහන්සේ වෙත උපස්ථානකරමින් වාසය කරන්නෙමි. සතර හවුරුද්දක්හුගේ ඇවෑමෙන් සතුටුවූ භික්ෂු සංඝයා වහන්සේ භික්ෂුභාවය පිණිස මා මහණකරත්වා, උපසම්පදා කරත්වායි" කියා භාග්‍යවතුන් වහන්සේට දැන්නුවේය. මෙසේ සැල කළ ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේට කථාකර "ආනන්දය, සුභද්‍ර පැවිදි කරවයි" කීවෝය. "එසේය, ස්වාමීන්වහන්සැයි" කියා ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනයට උත්තර දුන්නේය.

**30** එවිට සුභද්‍ර නම් පරිබ්‍රාජක තෙම ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙසේ කීයේය. "ඇවැත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්ස, නුඹවහන්සේලාට මහත්වූ ලාභයක් වූයේය. ඇවැත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්ස, නුඹවහන්සේලා විසින් යහපත් දෙයක් ලබන ලද්දේය. යම්බඳුවූ නුඹවහන්සේලා මේ ශාසනයෙහි ශාස්තෲන් වහන්සේගේ සමීපයෙන් අතවැසි බව නමැති අභිෂෙකයෙන් අභිෂෙක කරණ ලද්දාහු වෙතියි" කීය. සුභද්‍ර නම් පරිබ්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙන් ප්‍රව්‍රජ්‍යාව හා උපසම්පදාවද ලබන ලද්දේය. උපසම්පදාවූ නොබෝ කලකින්ම ආයුෂ්මත්වූ සුභද්‍ර ස්ථවිරතෙම තනිව විවේක

ස්ථානයකට පැමිණ අප්‍රමාද භාවයෙන් යුක්තව කායික චෛතසික වීර්‍ය්‍ය ඇතිව දුරුකරනලද ආත්ම ස්නේහ ඇතිව වාසයකර නොබෝ කලකින්ම යම් අර්හත් ඵලයක් පිණිස කුලපුත්‍රයෝ ගිහිගෙයින් නික්ම ආර්‍ය්‍ය සංඛ්‍යාතවූ ශාසනයෙහි මනාකොට පැවිදි වන්නාහු වෙද්ද, ඒ ඉතා උතුම්වූ ශාසන මාර්ග බ්‍රහ්මචරියාව කෙළවරකොට ඇති අර්හත්ඵල ඤාණය මේ ආත්මභාවයෙහිම තමන්ම ඇතිකරගත් ඥානයෙන් දැන අවබෝධකොට වාසය කෙළේය. ඉපදීම කෙළවර වූයේය. මාර්ග බ්‍රහ්මචරියාව වැස නිමවන ලදී. කළයුතු දෑ කරන ලදී. මින්මතු කළ යුත්තක් නැතැයි දැනගත්තේය. සුභද්‍ර ස්ථවිර තෙම වනාහි රහතන් වහන්සේලා අතුරෙන් එක්තරා රහත් නමක් විය. ඒ සුභද්‍ර ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ අන්තිම ශාක්ෂි ශ්‍රාවක (භාග්‍යවතුන් වහන්සේ ජීවත්වන කල්හි මහණව පසුව රහත්වූ ශ්‍රාවකයා) නම් විය.

(පස්වැනිවූ හිරඤ්ඤවතිය බණවර නිමි.)

---

## 6

1 එවිට භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත්වූ ආනන්ද තෙරුන් වහන්සේට කථාකර මෙසේ කීවෝය. "ආනන්දය, ශාසනය ශාස්තෲන් වහන්සේගෙන් පහව ගියේය. දැන් අපට අනුශාසනා කරන ශාස්තෲවරයෙක් නැතැයි යන අදහස ඉපදිය හැක්කේය. මේ කාරණය එසේ නොදත යුත්තේය. ආනන්දය, මා විසින් තොපට යම් ධර්මයක් දේශනා කරන ලද්දේ වේද, යම් විනයක් පනවන ලද්දෙ වේද, ඒ ධර්මය සහ විනය මාගේ ඇවෑමෙන් තොපට ගුරුවරයා (ශාස්තෘ) වන්නේයයි" කීවෝය.

2 "ආනන්දය, යම් පරිද්දකින් දැන් භික්ෂූහු ඔවුනොවුන් ආවුසොවාදයෙන් (ඇවැත්නි කියා) කථාකරන්නාහුද මාගේ ඇවෑමෙන් තොප විසින් එසේ කථා නොකොට යුත්තේය. ආනන්දය, වැඩිමහළුවූ (ථෙරවූ) මහණහු විසින් (නවකතරවූ) බාලවූ භික්ෂුවට නමින් හෝ ගොත්‍රයෙන් හෝ 'ඇවැත්නි' කියා හෝ කථා කළ යුත්තේය. බාලවූ භික්ෂුව විසින් වැඩිමහල් (ථෙර)

භික්ෂුවට, ස්වාමීනි, කියා හෝ ආයුෂ්මතුන් වහන්සැයි කියා හෝ කථා කළ යුත්තේය.

3 "ආනන්දය, සංඝතෙම ඉදින් කැමැත්තේවී නම් මාගේ ඇවෑමෙන් ඉතා සුලුවූ කුඩාවූ ශික්ෂා පදයන් සමූහනය (ඉදිරීම) කෙරෙත්වා.

4 "ආනන්දය, ඡන්න නම් භික්ෂුවට මාගේ ඇවෑමෙන් බ්‍රහ්මදණ්ඩය' නම් දඬුවම කළ යුත්තේයයි" කීවෝය. "ස්වාමීන්වහන්ස, බ්‍රහ්මදණ්ඩනය නම් කුමක්දැයි" ඇසුවෝය.

"ආනන්දය, ඡන්න භික්ෂුතෙම තමාට යමක් කැමැත්තේද, එය කියන්නේය. භික්ෂූන් විසින් ඔහුට කිසිවක් නොකිය යුත්තේය, අවවාද නොකට යුත්තේය. අනුශාසනා නොකට යුත්තේයයි" කීවෝය.

5 එවිට භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට කථාකර මෙසේ කීවෝය. "මහණෙනි, එක භික්ෂුවක්හටද බුදුන් කෙරෙහිද ධර්මය කෙරෙහිද සංඝයා කෙරෙහිද මාර්ගය කෙරෙහිද ප්‍රතිපත්තිය කෙරෙහිද සැකයක් හෝ විමතියක් වීනම්, විචාරව්. මහණෙනි, ශාස්තෲවූ භාග්‍යවතුන් වහන්සේ අපට සම්මුඛවූ වූයේය. අපි භාග්‍යවතුන් වහන්සේගෙන් විචාරන්ට නොහැකිවූවෝ වෙමුයි කියා පසුව පසුතැවිලි නොවව්යයි' කීවෝය. මෙසේ කී කල ඒ භික්ෂුහු නිශ්ශබ්දවූහ. භාග්‍යවතුන් වහන්සේ දෙවෙනි වරද, තුන්වෙනි වරද, භික්ෂූන්ට කථා කොට මෙසේ කීවෝය. "මහණෙනි, එක භික්ෂුවකටද බුදුන් කෙරෙහිද ධර්මය කෙරෙහිද සංඝයා කෙරෙහිද මාර්ගය කෙරෙහිද ප්‍රතිපත්තිය කෙරෙහිද සැකයක් හෝ විමතියක් හෝ වූයේ නම් විචාරව්. 'ශාස්තෲවූ භාග්‍යවතුන්වහන්සේ අපට සම්මුඛවූයේය. අපි භාග්‍යවතුන්වහන්සේ විචාරන්ට නොහැකි වූවෝ වෙමු' කියා පසුව පසුතැවිලි නොවව්යයි" කියා දේශනා කළෝය.

තුන්වෙනි වාරයෙහිද ඒ භික්ෂූහු නිශ්ශබ්ද වූවාහුය. එවිට භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට කථාකොට මෙසේ දෙශනා කළෝය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරවයෙනුත් ඉදින් නොවිචාරන්නේ වීනම්, මහණෙනි, යහළු මහණෙක් යහළු මහණෙක්හට කියාවායි" කීවෝය.

මෙසේ කීකල ඒ භික්ෂූහු නිශ්ශබ්දව සිටියාහුය.

**6** එවිට ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවෝය. "ස්වාමීන් වහන්ස, පුදුමයක්ය. ස්වාමීන් වහන්ස, ඉතා පුදුමයක්ය. ස්වාමීන් වහන්ස, මේ භික්ෂු සංඝයා කෙරෙහි එක් භික්ෂු නමකටද බුද්ධ, ධර්ම, සංඝ, මාර්ග, ප්‍රතිපත්තියෙහි සැකයක් හෝ විමතියක් නැත්තේයයි කියා, මම මෙසේ පැහැදුනෙමි" කීවේය.

"ආනන්දය, තොපි පැහැදීම හේතුකොට ගෙන කියන්නෙහිය. මෙහි තථාගතයන් වහන්සේගේ ඥානය කියයුතුය. තථාගතයන් වහන්සේගේ මේ භික්ෂු සංඝයා කෙරෙහි එක භික්ෂු නමකටද, බුද්ධ, ධර්ම, සංඝ, මාර්ග, පැවතුම් ආදියෙහි සැකයක් හෝ විමතියක් හෝ නැත.

ආනන්දය, මේ පන්සියයක් පමණ භික්ෂූන් අතරෙහි අන්තිමවූ යම් භික්ෂුවක් වේද ඔහු සතර අපායෙහි නොහෙළන ස්වභාව ඇත්තාවූ නියතවූ අර්හත්ඵල ඥාණයෙන් යුක්තවූ සෝවාන් ඵලයට පැමිණි භික්ෂුවකැයි" කීවෝය.

**7** එවිට භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට කථාකර මෙසේ කීවෝය. "මහණෙනි, දැන් තොපට කියමි. 'සියලු සංස්කාර ධර්මයෝ විනාශවන ස්වභාව ඇත්තාහුය. ප්‍රමාද නොවී (කළයුතු දේ) සම්පාදනය කරව්.' මේ තථාගතයන්ගේ අන්තිම බුද්ධ වචනයයි වදාළෝය.

**8** එවිට භාග්‍යවතුන් වහන්සේ ප්‍රථම ධ්‍යාන සමාපත්තියට සමවැදුණේය. ප්‍රථම ධ්‍යානයෙන් නැගී දෙවෙනි ධ්‍යානයට සමවැදුණෝය. දෙවෙනි ධ්‍යාන සමාපත්තියෙන් නැගී තුන්වෙනි ධ්‍යානයට සමවැදුණේය. තුන්වෙනි ධ්‍යාන සමාපත්තියෙන් නැගී හතරවෙනි ධ්‍යාන සමාපත්තියට සම වැදුණෝය. හතරවෙනි ධ්‍යාන සමාපත්තියෙන් නැගී ආකාසානඤ්චායතන

සමාපත්තියට සමවැදුණෝය. ආකාසානඤ්චායතන සමාපත්තියෙන් නැගී විඤ්ඤාණඤ්චායතන සමාපත්තියට සමවැදුණෝය. විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙන් නැගී ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට සමවැදුණෝය. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙන් නැගී නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය සමවැදුණෝය.

නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙන් නැගී සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියට සමවැදුණෝය. එවිට ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් වහන්සේගෙන් මෙසේ ඇසුවේය. "ස්වාමීනි, අනුරුද්ධ තෙරුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑවෝද?"

"ඇවැත් ආනන්දය, භාග්‍යවතුන් වහන්සේ තව පිරිනිවන් නොපෑවෝය. සඤ්ඤාවෙදයිත නිරොධසමාපත්තියට සමවැදුණෝයයි" කීවෝය.

**9** එවිට භාග්‍යවතුන්වහන්සේ සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියෙන් නැගී නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියට සමවැදුනෝය. නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියෙන් නැගී ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට සමවැදුනෝය. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙන් නැගී විඤ්ඤානඤ්චායතන සමාපත්තියට සමවැදුනෝය. විඤ්ඤානඤ්චායතන සමාපත්තියෙන් නැගී ආකාසානඤ්චායතන සමාපත්තියට සමවැදුනෝය. ආකාසානඤ්චායතන සමාපත්තියෙන් නැගී හතරවෙනි ධ්‍යාන සමාපත්තියට සමවැදුනෝය. හතර වෙනි ධ්‍යාන සමාපත්තියෙන් නැගී තුන්වෙනි ධ්‍යාන සමාපත්තියට සමවැදුනෝය. තුන්වෙනි ධ්‍යාන සමාපත්තියෙන් නැගී දෙවෙනි ධ්‍යාන සමාපත්තියට සමවැදුනෝය. දෙවෙනි ධ්‍යාන සමාපත්තියෙන් නැගී පළමුවැනි ධ්‍යාන සමාපත්තියට සමවැදුණෝය. පළමුවැනි ධ්‍යාන සමාපත්තියෙන් නැගී දෙවෙනි ධ්‍යාන සමාපත්තියට සමවැදුනෝය. දෙවෙනි ධ්‍යාන සමාපත්තියෙන් නැගී තුන්වෙනි ධ්‍යාන සමාපත්තියට සමවැදුනෝය. තුන්වෙනි ධ්‍යාන

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සමාපත්තියෙන් නැගී හතරවෙනි ධ්‍යාන සමාපත්තියට සමවැදුනෝය. හතරවෙනි ධ්‍යාන සමාපත්තියෙන් නැගී ඒ හතරවෙනි ධ්‍යාන සමාපත්තියෙන් නැගීම හා සමගම භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑවෝය.

10 භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑකල ඒ පිරිනිවන් පෑම හා සමගම ලොම් ඩැහැගන්වන ඉතා භයානකවූ මහා භූමිකම්පාවක් වූයේය. අහස ගුගුරන්ට විය. භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑකල ඒ පිරිනිවන්පෑම හා සමග සහම්පතී නම් මහා බ්‍රහ්මයා මේ ගාථාව කීයේය. "සත්ව ලොකයෙහි සියලු සත්වයෝම යම් පරිද්දකින් ජීවිතෙන්ද්‍රිය (ජීවිතය පැවැත්මට උපකාරවන ප්‍රධාන අවයවය) යෙන් ශරීර ඉවත් කිරීම කරන්නාහු වෙද්ද එපරිද්දෙන්ම මේ ලොකයෙහි කිසිවෙකුට සමකළ නොහැකිවූ, ශාස්තෘවූ තථාගතවූ දසවිධ ඤාණ බලයෙන් යුක්තවූ සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජොත්තමයාණන් වහන්සේ පිරිනිවන් පෑවාහුයයි' කීයේය.

භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පෑ කල්හි ඒ පිරිනිවන් පෑම හා සමග ශක්‍ර දිව්‍ය රාජතෙම මේ ගාථාව කීයේය.

"සියලු සංස්කාර ධර්මයෝ ඒකාන්තයෙන් අනිත්‍ය වන්නාහුය. ඉපිද නැසීම ස්වභාවකොට ඇත්තාහුය. ඉපිද නිරුද්ධ වන්නාහුය. ඔවුන්ගේ සංසිඳීමයයි කියනලද නිර්වාණයම සැපයයි."

භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පෑ කල පිරිනිවන්පෑම හා සමගම ආයුෂ්මත්වූ අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ මේ ගාථා කීවේය.

"ස්ථිර සිත් ඇති කම්පානොවන්නාවූ ස්වාමිදරුවූ බුදුරජාණන් වහන්සේගේ ආශ්වාස ප්‍රශ්වාසය නොපවත්නේය. තණ්හාව නැතිකළාවූ ඒ මුනීන්ද්‍රොත්තමවූ බුදු රජාණන් වහන්සේ ශාන්තියයි කියනලද නිර්වාණය අරබයා කාලක්‍රියා කළෝය."

"මනාකොට ප්‍රබොධවූ චිත්තයෙන් (හොඳ සිහියෙන්) මරණාන්ත වේදනාව ඉවසීම කළෝය. පහනක් නිවීගියාක් මෙන් පිරිනිවන් පෑවෝය."

භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑකල ඒ පිරිනිවන් පෑම හා සමගම ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිර තෙම මේ ගාථාව කීවේය.

"සියලු ආකාරයෙන් උතුම්වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ පිරිනිවන් පෑකල මහත්වූ ලොමු දැහැගැණීමෙක් වූයේය. එකල මෙසේ මහත් භයානකවූ පෘථිවි චලනයක් වූයේයයි" කීවේය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑකල එතනට රැස්වූ භික්ෂු සංඝයා අතුරෙහි පහනොකළ රාගය ඇත්තාවූ යම් ඒ පෘථග්ජන භික්ෂු කෙනෙක් වූවාහුද, ඒ භික්ෂූහු "ඉතා ඉක්මනින්ම භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑවෝය. සුගතයන් වහන්සේ වහා පිරිනිවන් පෑවෝය. පසැස් ඇත්තාවූ බුදුරජාණන් වහන්සේ ඉතා ඉක්මනින් පිරිනිවන් පෑවෝයයි" කියමින් සමහර භික්ෂූහු හිස අත් බැඳගෙන මහා ශොකීව හඬන්නාහුය. මැදින් කැඩුනාක් මෙන් ඇද වැටෙන්නාහුය, පෙරළෙන්නාහුය, රාගයෙන් දුරුවූ, යම් රහත් අනාගාමි භික්ෂු කෙනෙක් වූවාහුද ඒ රහත් අනාගාමි භික්ෂූහු 'සියලු සංස්කාර ධර්මයෝම අනිත්‍ය වන්නාහුය. ඒ මෙතැන්හි කොයින් ලබමෝදැයි' කියා සිහි නුවණින් යුක්තව ඉවසන්නාහුය.

11 එවිට ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ භික්ෂූන්ට කථාකර මෙසේ කීවේය. "ඇවැත්නි, හැඬීමෙන් කම් නැත, එහෙයින් සොක නොකරව්, විලාප නොකියව්, නොහඬව්. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් සියලු ප්‍රිය මනාප වස්තුවෙන් වෙන්වන බව අන්‍ය තත්වයකට පැමිණෙන බව කලින්ම දේශනා කරන ලද්දේ නොවේද? ඉපදීම ආදිය ස්වභාවකොට ඇත්තාවූ යම් ඒ පලුජ්ජන (බිඳෙන) ධර්මයක් ඇද්ද, ඒ පලුජ්ජන ධර්මය ඒකාන්තයෙන් විනාශ නොවේ වයි යන යමක් ඇද්ද, ඊට හෙතු නැත්තේය. ඇවැත්නි, ඒ කාරණය දැන් කොයින් ලබමෝද? ඇවැත්නි, දෙවියෝ අගුණ කියන්නාහුයයි" කීවේය.

"ස්වාමීවූ ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්ස, දෙවියෝ කුමක් සිතන්නාහුදැයි" කියා ඇසුවෝය.

"ආනන්දය, ආකාශයෙහි පෘථිවි සංඥා ඇත්තාවූ දෙවි කෙනෙක් ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ ඉතා වහාම පිරිනිවන් පෑවෝය.' සුගතයන් වහන්සේ වහා පිරිනිවන් පෑවෝයයි' ඒ දෙවියෝ හිස අත් බැඳගෙන හඬත්, ඇද වැටෙත්, පෙරළෙත්.

"ආනන්දය, පොළොවෙහි පොළව යන හැඟීම ඇත්තාවූ දෙවියෝ ඇත්තාහ. ඔව්හු 'වහා තථාගතයන් වහන්සේ පිරිනිවන් පෑහ. සුගතයන් වහන්සේ වහා පිරිනිවියහ'යයි හිස අත් බැඳගෙන හඬත්, ඇදවැටෙත්, පෙරළෙත්.

"ආනන්දය, රාගයෙන් දුරුවූ යම් අනාගාමි රහත් දෙවි කෙනෙක් වූවාහුද, ඔව්හු 'සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍ය වන්නාහුය. ඒ මෙතැන්හි කොයින් ලබමෝදැයි' කියා සිහි නුවණින් යුක්තව ඉවසන්නාහුය.

12. එවිට ආයුෂ්මත්වූ අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේද ධර්මයෙන් යුත් කථාවෙන් ඒ රාත්‍රියගේ ඉතිරි කොටස ගත කළාහුය. එවිට ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේට කථාකර මෙසේ කීවේය.

"ඇවැත්වූ ආනන්දය, තොපි යව, ගොස් කුසිනාරා නම් නුවරට පැමිණ කුසිනාරා වැසි මල්ල රජදරුවන්ට 'වාසෙට්ඨ ගොත්‍රයෙහිවූ මල්ල රජදරුවෙනි, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑවෝය. යම් ගමනකට කල් දනුවයි කියව්' යනුයි. "එසේය, ස්වාමීන්වහන්සැයි" කියා ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම ආයුෂ්මත්වූ අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේගේ වචනයට උත්තරදී පෙරවරු කාලයෙහි හොඳින් හැඳ පොරවා පා සිවුරු ගෙන තමන් වහන්සේ දෙවෙනි කොට ඇතිව කුසිනාරා නුවරට පැමුණුනේය. එකල කුසිනාරා වැසි මල්ල රජ දරුවෝ ඒ පරිනිර්වාණය කරුණු කොටගෙනම රැස්වීම් සාලාවෙහි රැස්ව උන්නාහු වෙති. එවිට ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරතෙම කුසිනාරානුවර මල්ල රජදරුවන්ගේ රැස්වීම් සාලාව යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, කුසිනාරා වැසි මල්ලරජදරුවන්ට

'වාසෙට්ඨ ගොත්‍රයෙහිවූ මල්ල රජදරුවෙනි, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑවෝය. යම් ගමනකට කල් දනුවයි" කීවේය ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ මේ වචනය අසා මල්ල රජුන් හා මල්ලරාජ පුත්‍රයෝද මල්ල රජුන්ගේ ලේලියන් හා මල්ල රජුන්ගේ භාර්‍ය්‍යාවෝද හටගත් දුක් ඇතිව දුකෙන් යුක්තව සිතෙහි හටගත් දුකෙන් පීඩිතව 'භාග්‍යවතුන් වහන්සේ ඉතා වහාම පිරිනිවන් පෑවෝයයි' කියා හිස අත්බැඳගෙන හඬත්. හිසකෙස් විසුරුවාගෙන හඬත්, බිම ඇදවැටෙත්, පෙරළෙත්, යම්පමණ රාගයෙන් දුරුවූ අනාගාමි මල්‍ල රජදරුවෝ වූවාහුද, ඔව්හු සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍ය වන්නාහුය, මෙතැන්හි එය කොයින් ලබමෝදැයි, කියා සිහි නුවණින් යුක්තව ඉවසන්නාහුය.

13 ඉක්බිත්තෙන් කුසිනාරා වැසි මල්‍ල රජදරුවෝ "කොල එසේවීනම් අපගේ මේ කුසිනාරානුවර ඇති ගඳ මල්ද සියලුම තූර්‍ය්‍ය භාණ්ඩයන්ද රැස්කරවයි" කියා පුරුෂයන්ට ආඥා කළාහුය. එවිට කුසිනාරාවැසි මල්‍ල රජදරුවෝ ගඳ මල්ද සියලුම තූර්‍ය්‍ය භාණ්ඩයන්ද, දෙක බැගින්වූ වස්ත්‍ර පන්සියයක්ද ගෙන මල්‍ල රජදරුවන්ගේ උපවර්තන නම් සල්වනය යම් තැනකද භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශරීරය යම් තැනකද එතැනට පැමිණියාහුය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශරීරයට නෘත්‍යයෙන්ද ගීතයෙන්ද වාදිතයෙන්ද මලින්ද ගඳින්ද සත්කාර ගරුකාර වන්දන මානනාදි වශයෙන් පූජාකෙරෙමින් උඩුවියන් බඳිමින් මණ්ඩප පිළියෙල කරමින් ඒ දවස හෙවත් ඒ පිරිනිවන්පෑ පළමුවෙනි දවස ගතකළාහුය.

එවිට කුසිනාරා මල්ල රජදරුවන්ට මෙසේවූ කල්පනාවෙක් වූයේය. 'අද භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශරීරය ආදාහන කරන්ට කල් මදිය. දැන් අපි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශරීරයට සෙට ආදාහනය කරම්හයි කියා සිතුවාහුය. එවිට කුසිනාරා මල්‍ල රජදරුවෝ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශරීරය නෘත්‍යයෙන්ද ගීතයෙන්ද වාදිතයෙන්ද මලින්ද ගඳින්ද සත්කාර කරමින් ගරු කරමින් බුහුමන් කරමින් පූජා කරමින් දෙවෙනි දවසද ගත කළාහුය. නෘත්‍යයෙන්ද ගීතයෙන්ද වාදිතයෙන්ද මලින්ද ගඳින්ද

සත්කාර කරමින් ගරු කරමින් බුහුමන් කරමින් පූජා කරමින් තුන්වෙනි දිනයද ගතකළාහුය නෘත්‍යයෙන්ද ගීතයෙන්ද වාදිතයෙන්ද මලින්ද ගඳින්ද සත්කාර කරමින් ගරු කරමින් බුහුමන් කරමින් පූජාකරමින් සතරවෙනි දිනයද ගතකළාහුය. නෘත්‍යයෙන්ද ගීතයෙන්ද වාදිතයෙන්ද මලින්ද ගඳින්ද සත්කාර කරමින් ගරු කරමින් බුහුමන් කරමින් පූජා කරමින් පස්වෙනි දිනයද ගතකළාහුය. නෘත්‍යයෙන්ද ගීතයෙන්ද වාදිතයෙන්ද මලින්ද ගඳින්ද සත්කාර කරමින් ගරු කරමින් බුහුමන් කරමින් පූජා කරමින් සවෙනි දිනයද ගතකළාහුය.

14 එවිට සත්වෙනි දවසෙහි කුසිනාරා මල්‍ල රජ දරුවන්ට මෙසේවූ කල්පනාවක් වූයේය. "අපි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී දෙහය නැටුම්වලින්ද, ගී කීම්වලින්ද, මල්වලින්ද, සුවඳවලින්ද සත්කාර ගරුකාර කරමින් සිතින් බුහුමන් කරමින් පූජාකරමින් නුවරට දකුණු දිගින් දකුණු දිගට ගෙන ගොස් පිටිනගරයෙන්ම පිටිනගරයට පමුණුවා නුවරට දකුණු දිග් භාගයෙහි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී දෙහය ආදාහනය කරම්හයි' සිතුවාහුය. එසමයෙහි මැදි වයස් ඇති ශක්තිමත් මල්ල රජදරුවන් අටදෙනෙක් සුවඳ පැනින් ඉස් සෝදා නහාගෙන අලුත්වූ වස්ත්‍රයන් ඇඳගෙන 'අපි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීදෙහය උසුලම්හයි' කියා උත්සාහ කොටත් උසුලන්ට නොහැකි වූවාහුය. එවිට කුසිනාරා වැසි මල්ල රජදරුවෝ ආයුෂ්මත්වූ අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේට මෙසේ සැල කළාහුය. "යම් හෙයකින් මේ ශක්තිමත් මධ්‍යම වයස් ඇති මල්ල රජදරුවෝ අටදෙනෙක් හිස් සෝදා නාගෙන අලුත් වස්ත්‍රයන් අඳනාලදුව අපි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී දෙහය උසුලම්හයි කියා උත්සාහකොට උසුලන්ට නොහැකි වන්නාහුද ස්වාමීවූ අනුරුද්ධ ස්ථවිරයන් වහන්ස, ඊට හේතු කවරේද? ඊට කරුණු කවරේද?" "වාසෙට්ඨ නම්වූ එම්බා මල්ල රජදරුවෙනි, තොපගේ අදහස අනිකක් වන්නේය. දෙවියන්ගේ අදහස අනිකෙකැයි" කීහ.

15 'ස්වාමීනි, දෙවියන්ගේ අදහස කෙසේදැයි" ඇසූහ. "වාසෙට්ඨ නම්වූ මල්ල රජදරුවෙනි, තොපගේ අදහස නම්

භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී දෙහය නැටුම්වලින්ද ගී කීම්වලින්ද, වාදනවලින්ද, මල්වලින්ද, සුවඳවලින්ද, සත්කාර ගරුකාර කරමින් සිතින් බුහුමන් කරමින් පූජා කරමින් නුවරට දකුණු දිසාවෙන්ම දකුණු දිශාවට ගෙන ගොස් ඇතුළුනුවරට ඇතුල් නොකොට පිටිනුවරින් පිටි නුවරට පැමිණ නුවරට දකුණු දිග් භාගයෙහි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී දෙහය ආදාහනය කරම්හයි' කියාය. එම්බා මල්ල රජදරුවෙනි, දෙවියන්ගේ අදහස නම් අපි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී දෙහය දිව්‍යමය නැටුම්වලින්ද, ගී කීම්වලින්ද, වාදනවලින්ද, මල්වලින්ද, සුවඳවලින්ද, සත්කාර කරමින් ගරුකාර කරමින් සිතින් බුහුමන් කරමින් පූජාකරමින් නුවරට උතුරු දිග්භාගයෙන්ම උතුරු දිග් භාගයට වඩා ගෙණ ගොස් උතුරු වහසල් දොරින් නගරය ඇතුළට ඇතුල්කොට නුවර මැදින් නුවර මැදට පමුණුවා නැගෙනහිර වහසල් දොරින් පිටතට නික්මවා නුවරට නැගෙනහිර දෙසවූ මල්ල රජ දරුවන්ගේ මකුටබන්ධන නම්වූ ප්‍රධාන මංගල ශාලාව නම් තැනෙක්හිද මේ ස්ථානයෙහි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශරීරය ආදාහනය කරම්හයි කියායි. 'ස්වාමීන්වහන්ස දෙවියන්ගේ අදහස යම් පරිද්දෙකින් වන්නේ වේද එපරිද්දෙන්ම වේවයි' කියා සැළකළාහුය.

**16.** එසමයෙහි කුසිනාරා නුවර යම්තාක් ගෘහසන්ධි වැසිකිලි කාණු කුණු කසළ ඇති තැන් වෙත්ද ඒ සැම තැනම දණක් පමණ ඝනකමට මදාරා මලින් අතුරණ ලද්දේ වූයේය. එවිට දෙවියෝද කුසිනාරා වැසි මල්ල රජ දරුවෝද භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී දෙහය දෙවියන්ට අයිතිවූද, මනුෂ්‍යයන්ට අයිතිවූද, නැටුම්වලින්ද, ගී කීම්වලින්ද, වැයීම්වලින්ද, මල්වලින්ද, සුවඳවලින්ද සත්කාර ගරුකාර කරමින් සිතින් බුහුමන් කරමින් පූජාකරමින් නුවරට උතුරු දිග් භාගයෙන් උතුරු දිසා භාගයට වැඩමවාගෙන ගොස් උතුරු වහසල්දොරින් නුවරට ඇතුල් කරවා නුවර මැදින් නුවර මැදට වැඩමවාගෙන ගොස් නැගෙනහිර වහසල් දොරින් පිටතට නික්මවා නුවරට නැගෙනහිර දෙසෙහිවූ මල්ල රජදරුවන්ගේ මකුටබන්ධන නම්වූ

මංගල ශාලාව යම් තැනෙක්හිද භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී දෙහය එතැන්හි තැබුවාහුය.

17. එවිට කුසිනාරා මල්ල රජදරුවෝ ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන්වහන්සේට මෙසේ සැලකළාහුය. "ස්වාමීවූ ආනන්ද ස්ථවිරයන් වහන්ස, අපි තථාගතයන් වහන්සේගේ ශ්‍රී දෙහයෙහි කෙසේ නම් පිළිපදින්නමෝදැයි" විචාළහ. "මල්ල රජදරුවෙනි, චක්‍රවර්ති මහරජහුගේ ශ්‍රී ශරීරයෙහි යම් ආකාරයකින් පිළිපදින්නාහුද ඒ ආකාරයෙන්ම තථාගතයන් වහන්සේගේ ශ්‍රී ශරීරයෙහිද පිළිපැද්ද යුත්තේයයි' කීහ. "ස්වාමීවූ ආනන්ද ස්ථවිරයන් වහන්ස, සක්විති රජහුගේ ශරීරයෙහි කෙසේ පිළිපදින්නාහුදැයි" විචාළහ. "මල්ල රජදරුවෙනි චක්‍රවර්ති රජහුගේ ශරීරය අලුත්වූ කසී වස්ත්‍රයෙන් වෙළන්නාහුය. අලුත්වූ වස්ත්‍රයෙන් වෙළා මනාකොට නගා නෙලනලද කපු පුළුනෙන් වෙළන්නාහුය' නගා නෙලනලද කපු පුළුනෙන් වෙළා අලුත්වූ කසීවස්ත්‍රයෙන් වෙළන්නාහුය. මෙම ක්‍රමයෙන් පන්සියයක් පමණ කපු පුළුන් වස්ත්‍ර යන දෙකින් සක්විති රජහුගේ ශරීරය වෙළා රනින් කළ තෙල් දෙණක තබා එබඳුමවූ අනික් රන් දෙණකින් වසා සියලු සුවඳ දරින් දරසෑයක් කොට චක්‍රවර්ති රජහුගේ ශරීරය ආදාහනය කරන්නාහුය. සතරමංසන්ධියක චක්‍රවර්ති රජහුගේ චෛත්‍යය කරන්නාහුය. එම්බා මල්ල රජදරුවෙනි, සක්විති රජහුගේ ශරීරයෙහි යම් ආකාරයකින් පිළිපදින්නාහුද, තථාගතයන් වහන්සේගේ ශ්‍රී දෙහයෙහිද එසේම පිළිපැද්ද යුත්තේය. සතර මංසන්ධියක තථාගතයන් වහන්සේගේ චෛත්‍යය කටයුත්තේය. ඒ සර්වඥ චෛත්‍යයෙහි යම් සත්ව කෙනෙක් මල් ගඳ විලවුන් ආදිය පූජා කරන්නාහු වෙද්ද, මනාකොට වඳින්නාහු වෙද්ද, සිත හෝ පහදවන්නාහු වෙද්ද, ඔවුන්ට ඒ කුසල ධර්මය ඉතා බොහෝවූ දීර්ඝ කාලයකට හිත සැප පිණිස වන්නේ යයි" කීහ.

18. එවිට කුසිනාරා මල්ල රජදරුවෝ 'කොල, එසේ නම් මල්ල රජදරුවන්ගේ මනාකොට නගා පාදනලද කපු පුළුන් රැස්කරව්යයි' කියා පුරුෂයන්ට නියම කළහ. එවිට කුසිනාරා

වැසි මල්ල රජදරුවෝ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී දෙහය අළුත්වූ කසී වස්ත්‍රයෙන් වෙළුවාහුය. අලුත්වූ කසී වස්ත්‍රයෙන් වෙළා මනාකොට නගා පාදනලද කපු පුළුනෙන් වෙළුවාහුය. නගා පාදනලද කපු පුළුනෙන් වෙළා අළුත්වූ කසී වස්ත්‍රයෙන් වෙළුවාහුය. මේ ක්‍රමයෙන්ම පන්සියයක් පමණ වස්ත්‍ර, කපු පුළුන් යන දෙකින් භාග්‍යවතුන් වහන්සේගේ ශරීරය වෙළා රනින් කළ රන්දෙණක තැන්පත්කොට එබඳුවූ අනිකුත් රන්දෙණකින් වසා සියළු සුවඳ දරින් දරසෑයක් කොට භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී දෙහය ඒ දරසෑයට නැගුවාහුය.

**19.** ඒ කාලයෙහි ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ පන්සියයක් පමණ භික්ෂූන්වූ මහත් භික්ෂු සංඝයා හා සමග පාවා නම් නුවර සිට කුසිනාරා නුවර අතර දීර්ඝ මාර්ගයට පැමිණියේ වෙයි. එවිට ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ මගින් ඉවත්ව එක්තරා ගසක් මුල වැඩ උන්සේක. ඒ කාලයෙහි එක්තරා ආජීවකයෙක් මදාරා මලක් ගෙන කුසිනාරා නුවරින් පාවා නුවරට යන දීර්ඝ මාර්ගයට පැමිණියේය. ආයුෂ්මත් මහාකාශ්‍යප තෙරුන්වහන්සේ එන්නාවූ ඒ ආජීවකයා දුරදීම දැක්කේය. දැක, "ඇවැත්නි, අපගේ ශාස්තෘන් වහන්සේ දන්නෙහිදැයි" කියා ඒ ආජීවකයාගෙන් ඇසුවේය. "එසේය, ඇවැත්නි, දනිමි, ශ්‍රමණ භවත් ගෞතම තෙම පිරිනිවන්පා අදට සත් දවසක් වූයේය. එතනින් මා විසින් මේ මදාරා මල ගන්නා ලද්දේය"යි කීයේය.

එහි රාගය පහනොකළාවූ යම් භික්ෂු කෙනෙක් වූවාහුද ඉන් ඇතැම් කෙනෙක් හිස අත්බැඳගෙන අඬත්, මැදින් කැඩුනාක් මෙන් ඇදවැටෙත්, පෙරළෙත්, එහා මෙහා පෙරළෙත් 'භාග්‍යවතුන් වහන්සේ ඉතා ඉක්මනින් පිරිනිවි සෙයක සුගතයන්වහන්සේ ඉතා ඉක්මනින් පිරිනිවිසෙයක ලොකයෙහි පසැස් ඇති බුදුරජානන් වහන්සේ ඉතා ඉක්මනින් අතුරුදන් වූසෙයක' කියායි. යම් පමණ ආශාව දුරු කළාවූ අනාගාමි රහත් භික්ෂූහුවූවාහුද, ඒ භික්ෂූහු 'සියලු සංස්කාර ධර්මයෝම අනිත්‍ය වන්නාහුය. එය කොයින් ලැබෙන්නේදැයි' සිහි නුවණින් යුක්තව ඉවසන්නාහුය.

**20.** ඒ කාලයෙහි සුභද්‍ර නම් බුඩ්ඪ පබ්බජිතයෙක් (මහලුවූ පසු මහණවූවෙක්) ඒ භික්ෂු පිරිසෙහි උන්නේය. සුභද්‍ර නම් බුඩ්ඪ පබ්බජිත තෙම ඒ භික්ෂූන්ට මෙසේ කීය. "ඇවැත්නි, තොප හැඬීමෙන් කම් නැත, සෝක නොකරව්. විලාප නොකියව. ඒ මහාශ්‍රමණයා කෙරෙන් අපි හොඳින් මිදුණෝ වෙමු. තොපට මේ දෙය කැපවන්නේය. මේ දෙය තොපට කැප නොවන්නේයයි අපි පීඩා ලබමින් සිටියෙමු. දැන් අපි යමක් කැමති වෙමුද ඒ දෙය කරම්හ, යමක් නොකැමැති වෙමුද ඒ දෙය නොකරම්හ" යනුවෙනි. එවිට ආයුෂ්මත් මහාකාශ්‍යප තෙරුන්වහන්සේ භික්ෂූන්ට කථාකර මෙසේ කීවෝය. "තොප හැඬීමෙන් කම් නැත. තොපි ශෝක නොකරව් විලාප නොකියව්. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් සිතට ප්‍රිය සියලු දෙයින් වෙන් වන බව දුරුවන බව අන් බවකට පෙරළෙන බව කලින්ම දේශනා කරන ලද්දේ නොවේද? ඇවැත්නි, හටගත්තාවූද පහළවූද ප්‍රත්‍යයෙන් උපදනාවූද විනාශවන ස්වභාවය ඇති සියල්ල ඒකාන්තයෙන්ම විනාශ නොවේවයි යන මේ කාරණයසිදු නොවෙන්නේයයි" කීවේය.

**21.** එසමයෙහි වනාහි මැද වියෙහිවූ ශක්තිමත් මල්ලරජ දරුවන් සතර දෙනෙක් ඉස් සෝදා නහාගෙන අලුත් වස්ත්‍රයන් හැඳගෙන "අපි භාග්‍යවතුන් වහන්සේගේ මෘතදෙහය තබා කරනලද දරසෑය ගිනි දල්වම්හයි" කියා උත්සාහකොට ගිනි දල්වා ගත නුහුනුවාහුය. එවිට කුසිනාරා මල්ල රජදරුවෝ ආයුෂ්මත්වූ අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේට මෙසේ සැලකළාහුය "ස්වාමීවූ අනුරුද්ධ ස්ථවිරයන් වහන්ස, යම් හෙයකින් මේ මැද වියෙහිවූ ශක්තිමත් මල්ල රජදරුවෝ සතර දෙන ඉස් සෝදා නාගෙන අලුත්වූ වස්ත්‍රයන් හැඳගෙන අපි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී දේහය තබා කරනලද දර සෑය ගිනි දල්වම්හයි කියා උත්සාහ කොට ගිනි දල්වාගත නොහැකි වන්නාහුය. ඊට හේතු කවරේද, ඊට කරුණු කවරේදැයි" කියා විචාළාහුය "එම්බා මල්ල රජ දරුවෙනි, දෙවියන්ගේ අදහස අන් පරිද්දෙකැයි වදාළහ." "ස්වාමීන් වහන්ස, දෙවියන්ගේ අදහස කෙබඳු වන්නේදැයි" විචාළාහුය. "එම්බා මල්ල

රජදරුවෙනි, ආයුෂ්මත්වූ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ පන්සියයක් පමණ මහත් භික්ෂු සංඝයා හා සමග පාවා නම් නුවර සිට කුසිනාරා නම් නුවරට යෙම්යි සිතා දීර්ඝ මාර්ගයට පිළිපන්නේ වෙයි. 'ආයුෂ්මත්වූ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී පාදයන් යම්තාක් සිරසින් නොවඳින්නාහුද, ඒතාක් කල් භාග්‍යවතුන් වහන්සේගේ දරසෑය ගිනි නොදැල්වේවායි' කියා දෙවියන්ගේ අදහස වන්නේයයි" කීවෝය. "ස්වාමීන් වහන්ස, දෙවියන්ගේ අදහස යම්සේද එසේම වේවායි" කීවාහුය.

22. ඉක්බිත්තෙන් ආයුෂ්මත්වූ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ කුසිනාරා නුවර මල්ල රජ දරුවන්ගේ මකුට බන්ධන නම් චෛත්‍ය ස්ථානය යම් තැනෙක්හිද භාග්‍යවතුන් වහන්සේගේ දර සෑය යම් තැනෙක්හිද එතැනට පැමිණියහ. පැමිණ, සිවුර එකාංශකොට පොරවාගෙන නමස්කාර කොට තුන්වරක් දර සෑය වට ප්‍රදක්ෂිණා කොට ඇවිද සිරි පතුල් පිහිටි පැත්තෙන් (චිතකය) විවෘත කොට ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේගේ සිරිපා යුවල වැන්දහ. ඒ පන්සියයක් පමණවූ භික්ෂු සංඝයාද සිවුරු එකාංශකොට පොරවා ගෙන ඇඳිලි බැඳගෙන තුන් යළක් දර සෑය ප්‍රදක්ෂිණාකොට භාග්‍යවතුන් වහන්සේගේ සිරිපතුල් දෙක වැන්දාහුය. ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ විසින්ද ඒ පන්සියයක් පමණ භික්ෂු සංඝයා විසින්ද භාග්‍යවතුන් වහන්සේගේ සිරි පතුල් වැන්ද කල්හි භාග්‍යවතුන් වහන්සේගේ දර සෑය තෙමේම හාත්පසින් ගිනිදැල්වී ගියේය.

23 මෙසේ දැවෙන්නාවූ භාග්‍යවතුන් වහන්සේගේ ශරීරයාගේ සිවියයි කියා හෝ සමයයි කියා හෝ මාංසයයි කියා හෝ නහරයයි කියා හෝ සඳ මිදුළුයයි කියා හෝ යම් කොටසක් වූයේ වේද, ඒ කොටස්වල අළු නොපෙනුණේද දැලිද ඉතිරි නුවූවාහුය. ශාරීරික ධාතුහුම ඉතිරි වූවාහුය. දවනලද ගිතෙල්වල හෝ තලතෙල්වල යම්සේ අළු නොපෙනේද, දැලි නොපෙනේද, එපරිද්දෙන්ම භාග්‍යවතුන්වහන්සේගේ දැවෙන ශරීරයාගේ සිවියයි කියා හෝ සමයයි කියාහෝ මසයයි කියා හෝ නහරයයි කියා හෝ සඳමිදුලුයයි කියාහෝ යම් කොටසක්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වූයේද ඒ කොටස්වල අළුද නොපැනෙයි, දැලිද නොපැනෙයි. ශරීරික ධාතු පමණක් ඉතිරි වූවාහුය.

ඒ පන්සියයක්වූ වස්ත්‍ර, පුලුන් යුගලයන්ගෙන් දෙකක් පමණක් දැවුණේය. යම් වස්ත්‍රයක් සියල්ලට යටින්ම වීද, එයත්, යම් වස්ත්‍රයක් සියල්ලටම උඩින් වීද, එයත් දැවුණේය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශරීරය ආදාහනය වූ කල්හි ආකාශයෙන් ජල ධාරාවක් පහළවී භාග්‍යවතුන් වහන්සේගේ දර සෑයෙහි ගිනි නිවුවාය. පිරිවරා සිටි සල්ගස් වලින්ද, ජලධාරා ගලා අවුත් ස්වාමීදරුවන් වහන්සේගේ දර සෑයෙහි ගිනි නිවාවුහුය. කුසිනාරාවාසී මල්ල රජදරුවෝද සියලු සුවඳ පැනින් භාග්‍යවතුන් වහන්සේගේ දර සෑයෙහි ගිනි නිවුවාහුය.

ඉක්බිත්තෙන් කුසිනාරා වැසි මල්ල රජදරුවෝ භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතුන් සන්ථාගාර ශාලාවෙහි තැන්පත් කොට කඩු ගත් අත් ඇති යොධ පුරුෂයන් ලවා හාත්පසින්ම වටකොට ආරක්ෂා පිහිටුවා දුනු කෙළවරින් දුනු කෙළවර පහරමින් සිටියාවූ දුනු ගත් ධනුර්ධරයන්ගේ දුනු පවුරකින් වටකොට සත් දවසක් මුළුල්ලෙහි නැටුම් ගී කීම් වාදනය කිරීම් ආදියෙන්ද මලින් හා සුවඳවලින්ද සත්කාර කළාහුය, ගරු කළාහුය, වන්දනා කළාහුය, පූජා කළාහුය.

**24** විදෙහ පුත්‍රවූ මගධ දෙශාධිපතිවූ අජාසත් නම් රජ භාග්‍යවතුන් වහන්සේ වනාහි කුසිනාරා නම් නුවර පිරිනිවන්පා වදාළසේකැයි ඇසුයේමය, එවිට මගධරටට අධිපතිවූ විදෙහ පුත්‍රවූ අජාසත් මහරජ තෙම 'භාග්‍යවතුන් වහන්සේද ක්ෂත්‍රිය වන සේක මමද ක්ෂත්‍රිය වෙමි. භාග්‍යවතුන් වහන්සේගේ ශරීර ධාතු කොටසක් ලබන්නට මමද සුදුසු වෙමි. මමද සර්වඥයන්වහන්සේගේ ශ්‍රීශාරීරික ධාතුන්වහන්සේලාට චෛත්‍යයක් කරවා පූජාසත්කාර කරනු කැමැත්තෙමියි" කියා කුසිනාරා නුවර නිවාසීවූ මල්ල රජ දරුවන්ට දූතයෙකු යැවුයේය.

විසාලා නුවර වැසි ලිච්ඡවී රජදරුවෝද "භාග්‍යවතුන් වහන්සේ වනාහි කුසිනාරා නම් පුරයෙහි පිරිනිවන් පා වදාළසේකැයි කියා ඇසුවාහුය. එවිට විසාලා නුවර වැසි ලිච්ඡවී

රජදරුවෝද "භාග්‍යවතුන් වහන්සේද ක්ෂත්‍රිය සේක. අපිද ක්ෂත්‍රියයෝ වම්හ. භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතු කොටසක් ලබන්නට අපිද සුදුසු වම්හ. අපිද භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේලාට චෛත්‍යයක් කරවා පූජා සත්කාර කරනු කැමැත්තම්හයි" කියා කුසිනාරා වැසි මල්ලරජදරුවන්ට දූතයෙකු යැවූවාහුය. කිඹුල්වත් පුරයෙහි වාසය කරන්නාවූ ශාක්‍ය රජදරුවෝද භාග්‍යවතුන්වහන්සේ වනාහි කුසිනාරා නම් පුරයෙහි පිරිනිවන්පා වදාළසේකැයි ඇසුවාහුය. එවිට කිඹුල්වත් පුර වාසී ශාක්‍ය රජදරුවෝද "භාග්‍යවතුන් වහන්සේද අපගේ ඥාති ශ්‍රෙෂ්ඨ වන සේක. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශාරීරි ධාතු කොටසක් ලබන්නට අපිද සුදුසු වන්නෙමු. අපිද සර්වඥයන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේලාට චෛත්‍යයක් කරවා පූජාසත්කාර කරනු කැමැත්තෙමුයි" කියා කුසිනාරා වැසි මල්ලරජ දරුවන්ට දූතයෙකු යැවුවාහුය.

අල්ලකප්ප නම් නුවර වාසය කරන්නාවූ බුලය නම් ක්ෂත්‍රිය රජහුද භාග්‍යවතුන් වහන්සේ වනාහි කුසිනාරා නම් පුරයෙහි පිරිනිවන් පා වදාළ සේකැයි ඇසුවාහුමය. එවිට අල්ලකප්ප නම් නුවර වාසය කරන්නාවූ බුලය නම් ක්ෂත්‍රිය රජදරුවෝද 'භාග්‍යවතුන් වහන්සේද ක්ෂත්‍රිය සේක. අපිද, ක්ෂත්‍රියයෝ වම්හ. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීශාරීරික ධාතු කොටසක් ලබන්නට අපිද සුදුස්සෝ වම්හ. අපිද භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතූන්වහන්සේලාට චෛත්‍යයක් කරවා පූජා සත්කාර කරනු කැමැත්තෙමුයි" කියා කුසිනාරා වැසි මල්ල රජදරුවන්ට දූතයෙකු යැවූවාහුය.

රාම ග්‍රාමයෙහි වාසය කරන්නාවූ කොලිය රජදරුවෝද භාග්‍යවතුන් වහන්සේ වනාහි කුසිනාරා නම් පුරයෙහි පිරිනිවන් පා වදාළ සේකැයි ඇසුවාහුමය. එවිට රාමග්‍රාමයෙහි වාසය කරන්නාවූ කොලිය රජදරුවෝද "භාග්‍යවතුන් වහන්සේද ක්ෂත්‍රිය සේක. අපිද ක්ෂත්‍රියයෝ වම්හ. භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතුකොටසක් ලබන්නට අපිද සුදුසු වම්හ. භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේලාට අපිද

චෛත්‍යයක්කොට පූජාසත්කාර කරනු කැමැත්තෙමුයි” කියා කුසිනාරා වැසි මල්ල රජ දරුවන්ට දූතයෙකු යැවූවාහුය.

වෙඨදීප නම් බ්‍රාහ්මණ තෙමේද භාග්‍යවතුන් වහන්සේ වනාහි කුසිනාරා නම් පුරයෙහි පිරිනිවන් පා වදාළ සේකැයි කියා ඇසුයේමය එවිට වෙඨදීපක නම් බ්‍රාහ්මණතෙම ‘භාග්‍යවතුන් වහන්සේද ක්ෂත්‍රියවූ සේක. මමද බ්‍රාහ්මණ වූයෙමි. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීශාරීරික ධාතු කොටසක් ලබන්නට මමද සුදුස්සෙක් වෙමි. භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේලාට මමද චෛත්‍යයක් කරවා පූජාසත්කාර කරනු කැමැත්තෙමි” කියා කුසිනාරා වැසි මල්ල රජදරුවන්ට දූතයෙකු යැවූයේය.

පාවා නම් නුවර වාසය කරන්නාවූ මල්ල රජදරුවෝද භාග්‍යවතුන් වහන්සේ වනාහි කුසිනාරා නම් පුරයෙහි පිරිනිවන්පා වදාළ සේකැයි ඇසුවාහුමය. එවිට පාවා නම් නුවර වැසි මල්ල රජදරුවෝද “භාග්‍යවතුන් වහන්සේද ක්ෂත්‍රිය වූසේක. අපිද ක්ෂත්‍රියයෝ වම්හ. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශාරීරික ධාතු කොටසක් ලබන්නට අපිද සුදුස්සෝ වම්හ අපිද භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේලාට චෛත්‍යයක් කරවා පූජාසත්කාර කරනු කැමැත්තෙමුයි” කියා කුසිනාරා වැසි මල්ල රජදරුවන්ට දූතයෙකු යැවූවාහුය.

**25** මෙසේ කී කල්හි කුසිනාරා වැසි මල්ල රජදරුවෝ ඒ සත් නගරයෙන් පැමිණ සිටි ජනසමූහයාට මෙසේ කීවාහුය. “භාග්‍යවතුන් වහන්සේ අපගේ ග්‍රාම ක්ෂෙත්‍රයෙහි පිරිනිවන්පා වදාළ සේක. අපි භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතු කොටසක් නොදෙම්හයි” කීවාහුය. මෙසේ කීකල්හි ද්‍රොණනම් බ්‍රාහ්මණතෙම රජදරුවන් සමූහයාට මේ (අදහස් ඇති) ගාථා දෙකකින් මෙසේ කීය.

“පින්වත්වූ රජදරුවෙනි, මා කියන්නාවූ මේ එක් වචනයක් අසත්වා, අපගේ බුදු රජාණන් වහන්සේ ක්ෂාන්තිවාදී වූසේක. ලොකොත්තම ස්වාමිදරුවන්ගේ ධාතු කොටසක් නිසා ආයුධවලින් පහරදී ගැනීමක් වූයේ නම් ඒ යහපත් නොවේමය.

"සියලු පින්වත්හුම එක්ව සමගිව සතුටුවෙමින් (ධාතූන්) අට කොටසක් කරම්හ. ඒ ඒ දිසාවල චෛත්‍යයෝ පැතිරෙත්වා. පසැස් ඇත්තාවූ බුදු රජාණන් වහන්සේට පැහැදුණ ජනයෝ බොහෝ වන්නාහුය" කියායි.

"එසේනම් බ්‍රාහ්මණය, තෙපිම භාග්‍යවතුන්වහන්සේගේ ශාරීරික ධාතූන් මනාකොට සමව අට කොටසක් කොට බෙදවයි" කීවාහුය. "එසේය, පින්වත්නියි" ඒ ද්‍රොණනම් බ්‍රාහ්මණ තෙම ඒ රාජ සමූහයාගේ වචනයට උත්තර දී භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතූන් මනාකොට සමව අට කොටසක් කොට බෙදා ඒ රජදරු සමූහයාට මෙසේ කීය. "පින්වත්නි, මටද මේ ධාතු බෙදන ලද නැලිය දෙත්වා. මමද ධාතු බෙදන ලද නැළිය තබා චෛත්‍යයක් කොට පූජා සත්කාර කෙරෙමියි" කීය. ඒ රජදරුවෝ ද්‍රොණනම් බ්‍රාහ්මණයාහට ධාතු බෙදූ නැලිය දුන්නාහුය.

**26.** පිප්ඵලිවනිය නම් මොරිය රජ දරුවෝද භාග්‍යවතුන් වහන්සේ වනාහි කුසිනාරා නුවර පිරිනිවන් පා වදාළ සේකැයි ඇසුවාහුය. එවිට පිප්ඵලිවනිය නම් මොරිය රජ දරුවෝ "භාග්‍යවතුන් වහන්සේද ක්ෂත්‍රිය වූසේක. අපිද ක්ෂත්‍රියයෝ වම්හ. භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතු භාගයක් ලබන්ට අපිද සුදුස්සෝ වම්හ. අපිද භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතූන්වහන්සේලාට චෛත්‍යයක් කරවා පූජා සත්කාර කරනු කැමැත්තම්හයි" කියා කුසිනාරා වැසි මල්ල රජදරුවන්ට දූතයෙකු යැවූහ. "භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතු කොටසක් නැත්තේය. භාග්‍යවතුන් වහන්සේගේ ශරීර ධාතු බෙදන ලද්දාහුය. මේ ආදාහන ස්ථානයෙන් අඟුරු ගෙන යෙත්වයි" කීවාහුය. ඒ මොරිය රජදරුවෝ භාග්‍යවතුන්වහන්සේගේ ආදාහන ස්ථානයෙන් අඟුරු හැරගෙන ගියාහුය.

එවිට වෛදෙහි පුත්‍රවූ මගධ රටට අධිපති අජාසත් මහරජතෙම රජගහනුවර භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශාරීරික ධාතූන් වහන්සේලාට චෛත්‍යයක් කරවා පූජාසත්කාර කෙළේය. විසාලා මහනුවර වාසීවූ ලිච්ඡවි රජ දරුවෝද විසාලා නම්

නුවර භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශාරීරික ධාතූන් වහන්සේලාට චෛත්‍යයක් කරවා පූජා සත්කාර කළාහුය. කිඹුල්වත් නම් නුවර වාසීවූ ශාක්‍ය රජ දරුවෝද කිඹුල්වත් නම් පුරයෙහි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශරීරික ධාතූන් වහන්සේලාට චෛත්‍යයක් කරවා පූජා සත්කාර කළාහුය. අල්ලකප්ප නම් නුවර වාසීවූ බූලය නම් රජදරුවෝද, අල්ලකප්ප නම් නුවර භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේලාට චෛත්‍යයක් කරවා පූජාසත්කාර කළාහුය. රාම ග්‍රාමයෙහි වාසය කරන්නාවූ කොලිය රජහුද රාම නම් ගමෙහි භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේලාට චෛත්‍යයක් කරවා පූජා සත්කාර කළාහුය. වෙඨදීප නම් නුවර වාසීවූ බ්‍රාහ්මණ තෙමේද, වෙඨදීපයෙහි භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේලාට චෛත්‍යයක් කරවා පූජා සත්කාර කළේය. පාවා නම් නුවර වාසීවූ මල්ල රජ දරුවෝද පාවා නම් පුරයෙහි භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේලාට චෛත්‍යයක් කරවා පූජා සත්කාර කළාහුය. කුසිනාරා වැසි මල්ල රජ දරුවෝද කුසිනාරා නුවර භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශාරීරික ධාතූන් වහන්සේලාට චෛත්‍යයන් කරවා පූජා සත්කාර කළාහුය. ද්‍රොණ නම් බ්‍රාහ්මණතෙමේද ධාතු මැන බෙදන ලද නැළිය තබා චෛත්‍යයක් කරවා පූජා සත්කාර කෙළේය. පිප්ඵලිවනිය නම් මොරිය රජහුද පිප්ඵලි වන නම් පුරයෙහි අංගාර ථූප නම්වූ දාගැබක් කරවා පූජා සත්කාර කළාහුය. මෙසේ ශාරීරික චෛත්‍යයෝ අටක් වූවෝය. කුම්භථූප චෛත්‍යය නව වැනි වූයේය. අංගාර චෛත්‍යය දසවැනි වූයේය. (මේ ආකාරයෙන් ධාතු බෙදීමත් දස චෛත්‍යයන් කිරීමත් වූයේයයි සංගීති කාරක ස්ථවිරයෝ කීහ)

**27** පසැස් ඇත්තාවූ බුදුරජාණන් වහන්සේගේ ශාරීරික ධාතු අට ද්‍රොණයක් වූහ. එයින් සත් ද්‍රොණයක් දඹදිව වාසීහු පුදත්. පුරුෂොත්තමවූ බුදුරජාණන් වහන්සේගේ එක් ධාතු ද්‍රොණයක් රාම ග්‍රාමයෙහි නා රජ පුදයි. එක් දන්තධාතූන් වහන්සේ නමක් දෙව් ලොව දෙවියන් විසින් පුදන ලද්දේය එක් දන්ත ධාතූන්වහන්සේ නමක් වනාහි ගන්ධාර දෙශයෙහි

පුදන ලද්දේය. එක් දන්ත ධාතූන් වහන්සේ නමක් වනාහි කාලිංග නම් රජහුගේ රාජ්‍යයෙහි (කලිඟු රට දන්ත නම් පුරයෙහි) පුදන ලද්දේය. එක් දන්ත ධාතූන් වහන්සේ නමක් නා ලොව නා රජහු පුදත්. ඒ සතර දළදා වහන්සේගේ තෙජානුභාවයෙන් යාග යයි කියන ලද පූජනීය වස්තු පරිත්‍යාගයෙන් කරනලද පූජා උත්සව මංගලයෙන් මේ මුළු පොළොව අලංකාර වූවාය (සැරසෙන ලද්දි වූවාය) සත්කාර කරනු ලබන්නවුන් විසින් සත්කාර කරන ලද්දාවූ මනාකොට විශෙෂයෙන්ම සත්කාර කරන ලද්දාවූ පසැස් ඇත්තාවූ බුදුරජාණන් වහන්සේගේ මේ සර්වඥ ශාරීරික ධාතූන් වහන්සේ මෙපරිද්දෙන්ම දෙව් රජුන්, මිනිස් රජුන් විසින් පුදන ලද්දේය. එසේම මනුෂ්‍ය උත්තමයන් විසින් පුදන ලද්දේය. ඇදිලි බැඳගෙන ඒ සර්වඥ ශාරීරික ධාතූන් වහන්සේලාට නමස්කාර කෙරෙත්වා. සර්වඥ වරොත්තමයාණන් වහන්සේ ඒකාන්තයෙන් කල්ප සියයකිනුදු දුර්ලභ වන්නෝයි.

(දහසය වෙනි මහා පරිනිර්වාණ සූත්‍රය නිමියේය.)

---

## 17. මහා සුදස්සන සූත්‍රය.

1 මා විසින් මෙසේ අසනලදී (මාගේ ඇසීම මෙසේය) එක්කලක භාග්‍යවතුන් වහන්සේ කුසිනාරා නුවර උපවත්තන නම්වූ මල්ල රජුන්ගේ සල්වනයෙහි සල්ගස් දෙකක් අතරෙහි පිරිනිවන්පාන කාලයෙහි වාසය කළෝය.

2 එවිට ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පැත්තක උන්නේය. එක් පැත්තක උන්නාවූ ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කුඩා නුවරක්වූ විසම නුවරක්වූ ශාඛානගරයක්වූ මේ කුසිනාරා නුවරෙහි පිරිනිවන් නොපානසේක්වා. ස්වාමීන් වහන්ස, මෙයින් අන්‍යවූ මහ

නුවරවල් ඇත්තාහ. එනම් චම්පා නුවරය, රජගහනුවරය, සැවැත් නුවරය, කොසඹෑ නුවරය, බරණැස් නුවරය, යන මොහුය. මෙයින් එක් නුවරකදී භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පාන සේක්වා. එහි බොහෝවූ ක්ෂත්‍රිය මහාසාර කුලයෝද, බ්‍රාහ්මණ මහාසාර කුලයෝද, ගෘහපති මහාසාර කුලයෝද ඇත්තාහ. ඔව්හු තථාගතයන් වහන්සේ කෙරෙහි ඉතා පැහැදුනෝ වෙත්, ඔව්හු තථාගතයන් වහන්සේගේ ශරීර පූජාව කරන්නාහුයයි” දැන්නුවේය.

3 “ආනන්දය, කුඩා නුවරය, නොසම නුවරය, ශාඛා නුවරයයි, මෙසේ නොකියව. ආනන්දය, පෙර එක් කාලයක අභිෂෙක ලැබුවාවූ, ක්ෂත්‍රිය වංශයෙහි උපන්නාවූ සාගරය කෙළවර කොට ඇති සතර මහාද්වීපයට නායකවූ, (ආවුද නොගෙන) සතුරන් ජයගත්තාවූ ජනපදයන්හි ස්ථිරබවට පැමිණියාවූ, මහාසුදර්ශන නම් රජෙක් විය. ආනන්දය, ඒ මහාසුදර්ශන රජුට මේ කුසිනාරා නුවර කුසාවතී නමින් රාජධානිය වී. ආනන්දය, ඒ කුසාවතී නම් නගරය වනාහි නැගෙනහිරින්ද, බටහිරින්ද දිගින් දොළොස් යොදුන් විය. උතුරු දිගින්ද දකුණු දිගින්ද පළලින් සත් යොදුන් විය. ආනන්දය, කුසාවතී රාජධානිය සියලු සම්පත්තියෙන් සමෘද්ධ විය. සියල්ලෙන් සම්පූර්ණ විය. බොහෝ ජනයා ඇත්තී විය. මනුෂ්‍යයන්ගෙන් ගැවසී ගත්තීය. කෑම් බීම් ආදියෙන්ද ඉතා සුලභ විය. ආනන්දය, යම්සේ දෙවියන්ගේ ආළකමන්දා නම් රාජධානිය සියලු සම්පත්තියෙන් සමෘද්ධද සම්පූර්ණද බොහෝ ජනයන් ඇත්තීද, යක්ෂයන්ගෙන් ගැවසී ගත්තීද, ආනන්දය, එමෙන්ම කුසාවතී රාජධානිය සියලු සම්පත්තියෙන් සමෘද්ධ විය සම්පූර්ණද විය. බොහෝ ජනයා ඇත්තීය, මනුෂ්‍යයන්ගෙන් ගැවසී ගත්තීය. කෑම් බීම් ආදියෙන්ද සුලභ විය. ආනන්දය, කුසාවතී රාජධානිය රෑ දාවල් දෙක්හිම දස ආකාර ශබ්දයෙන්ද, ඝොෂා සහිත විය ඒ කවරේදයත්? ඇතුන්ගේ කුඤ්ච නාදයෙන්ද, අසුන්ගේ හෙසාරවයෙන්ද, රථ ශබ්දයෙන්ද බෙර ශබ්දයෙන්ද මුතිංග (නම් බෙර) ශබ්දයෙන්ද, වීණා ශබ්දයෙන්ද, ගීතශබ්දයෙන්ද, සම්ම (ගී) ශබ්දයෙන්ද, තාල (කයිතාලම්,

ශබ්දයෙන්ද, 'කන්න, බොන්න' යන මේ දස වැනි වූ ශබ්දයෙන්ද (යන මෙයිනි)

4. "ආනන්දය, කුසාවතී රාජධානිය ප්‍රාකාර සතකින් වටවූවාය. එනම් එකක්රත්‍රනින්ද, එකක් රිදියෙන්ද, එකක් වෛඩූර්‍ය මැණික්වලින්ද, එකක් පළිඟු මැණික් වලින්ද එකක් රතු මැණික්වලින්ද, එකක් මසාර ගල්ලයෙන්ද එකක් සියලුම රත්නයන්ගෙන්ද කරවනලදී.

5 "ආනන්දය, කුසාවතී රාජධානියෙහි සතර වර්ගයක දොරටු වූවාහුය, එනම් එකක් රනින්විය, එකක් වෛරෝඩි මැණිකෙන් විය, එකක් පළිඟු මැණිකෙන් විය. එක් එක් දොරටුවක එසිකාස්ථම්භ (අගුළු කණු) සත බැගින් හිඳුවන ලද්දාහුය. මිනිසුන් තුන් හතරදෙනෙකුගේ උස පමණ හිඳුවන ලද්දාහ. උසින් මිනිසුන් දසදෙනෙකුගේ උස පමණ විය. එක් කණුවක් රත්‍රනින් විය, එකක් රිදියෙන් විය. එකක් වෛරෝඩි මැණිකෙන් විය. එකක් පළිඟු මැණිකෙන් විය එකක් රතු මැණිකෙන් විය. එකක් මැසිරි ගලින් විය. එකක් සියලු රත්නයන්ගෙන් විය.

6 "ආනන්දය, කුසාවතී නම් රාජධානිය තල්ගස් පේළි සතරකින් වට වූයේය එක් තල්ගස් පෙළක් රත්‍රනින් විය. එක් තල්ගස් පෙළක් රිදියෙන් විය. එක් තල්ගස් පෙළක් වෛරෝඩි මැණිකෙන් විය. එක් තල්ගස් පෙළක් පලිඟු මැණිකෙන් විය. එක් තල්ගස් පෙළක් රතු මැණික්වලින් විය. එක් තල්ගස් පෙළක් මැසිරි ගල්වලින් විය. එක් තල් ගස් පෙළක් සියලු රත්නයන්ගෙන් විය. රත්‍රනින් කළ තල් ගසේ කඳ රත්‍රන් විය. කොළ හා ගෙඩි රිදියෙන් විය රිදියෙන් කළ තල් ගසේ කඳ රිදියෙන් විය. කොළ හා ගෙඩි රත්‍රනින් විය. වෛරෝඩියෙන් කළ තල් ගසේ කඳ වෛරෝඩියෙන් විය කොළ හා ගෙඩි පළිඟු මාණික්‍යමය විය. පළිඟු මැණිකෙන් කළ තල් ගසෙහි කඳ පළිඟු වලින් විය. කොළ හා ගෙඩි වෛරෝඩි මැණිකෙන් විය. රතු මැණිකෙන් කළ තල් ගසෙහි කඳ රතු මැණික්වලින් විය. කොළ හා ගෙඩි මැසිරි ගලින් විය මරකත මැණික්වලින් කළ තල් ගසෙහි කඳ

මරකත මැණිකෙන්ම විය. කොළ හා ගෙඩි රතු මැණිකෙන් විය. සියලු රත්නයන්ගෙන් කළ තල් ගසෙහි කඳ සියලු රත්නයන්ගෙන්ම විය. කොළ හා ගෙඩි සියලු රත්නයන්ගෙන් විය.

"ආනන්දය, ඒ තල්ගස් පේළි සුලඟින් සෙලවෙන විට මිහිරිවූද, සිත් අලවන්නාවූද, ප්‍රිති කරන්නාවූද, ප්‍රීතියෙන් මත් කරන්නාවූද, ශබ්ද ඇති වූයේය. ආනන්දය, විශෙෂයෙන් හික්මුණාවූ වාදනයෙහි දක්ෂයෙකු විසින් වාදනය කරන ලද්දාවූ පංචාංගික තූර්‍ය්‍යයාගේ මිහිරිවූද. සිත් අලවන්නාවූද, ප්‍රීති කරන්නාවූද, විශෙෂයෙන් සිත පිත වන්නාවූද ශබ්දය ඇතිවේද, ආනන්දය එපරිද්දෙන් සුලඟින් සෙලවෙන ඒ තල් ගස් පන්තිවලින් මිහිරිවූද, සිත් අලවන්නාවූද. ප්‍රීති කරන්නාවූද, ප්‍රීතියෙන් මත්කරන්නාවූද ශබ්ද ඇතිවූහ. ආනන්දය, ඒ කාලයෙහි කුසාවතී රාජධානියෙහි ස්ත්‍රී ධූර්තාදීහුද සුරාපානයෙහි ලොල්වූ පිපාසා ඇති සුරාසොඬුන් ආදීහුද වාසය කළහ. ඔව්හු සුළඟට සෙලවෙන ඒ තල්ගස් පන්තිවලින් එන ශබ්දයේ තාලයට අනුව නටමින් සතුටුවන්නාහ.

7 "ආනන්දය, මහාසුදර්ශන රජ රත්න හතකින්ද ඍද්ධි සතරකින්ද සමන්විත වූයේය. කවර රත්න හතක්දයත්? ආනන්දය ඒ පුණුපෝය දිනයෙහි ඉස්නානය කොට අටසිල් සමාදන්ව උඩුමහල් තලයට පැමිණ සිටි සුදර්ශන මහරජුට දැති දහසකින් යුක්තවූ නිම් වලලු සහිතවූ නැබ මඩුලු (බොස් ගෙඩිය) සහිතවූ සියලු ආකාරයෙන් සම්පූර්ණවූ දිව්‍ය චක්‍ර රත්නය පහළ වූයේය. ඒ දැක මහා සුදර්ශන රජුට මෙවැනි අදහසක් ඇති විය. 'මා විසින් මෙබන්දක් අසා තිබේ. පසළොස්වක් පෝය දිනයෙහි ස්නානය කොට අටසිල් සමාදන්ව (ප්‍රාසාදයෙහි) උඩුමහල් තලයට පැමිණියාවූ ක්ෂත්‍රිය වංශයෙහිවූ, මුදුනෙහි අභිෂේක ලැබුවාවූ යම් රජෙකුට දහසක් අර (ගරාදි) සහිතවූ, නිම් වලලු (වක් අතු) සහිතවූ, නැබ මඩුලු සහිතවූ, සියලු ආකාරයෙන් සම්පූර්ණවූ දිව්‍යමයවූ චක්‍ර රත්නයක් පහළවේද ඔහු සක්විති රජ වේයයි' කියායි. මම සක්විති රජ වෙම්දෝයි යනුවෙනි.

8 "ආනන්දය, ඉක්බිති මහා සුදර්ශන රජ උන් ආසනයෙන් නැඟිට සලුවක් ඒකාංශකොට පොරවා වම් අතින් රන් කෙන්ඩිය ගෙන 'පින්වත් චක්‍රරත්නය, (මාගේ අණසක) පවත්වාවා! පින්වත් චක්‍රරත්නය, (සතර මහත් දිවයින) ජය ගෙනදේවායි' කියමින් දකුණු අතින් පැන් ඉස්සේය. ආනන්දය, එවිට ඒ චක්‍රරත්නය මහා සුදර්ශනරජ, සහ සිවුරඟ සෙනඟ කැටුවම පෙරදිගට ගමන්ගති. ආනන්දය යම් පෙදෙසක චක්‍රරත්නය පිහිටියේද එහි සුදර්ශන රජ සිවුරඟ සෙනග සමග වාසයට පැමිණියේය.

9. "ආනන්දය, නැගෙනහිර දිසාවෙහි යම් විරුද්ධ රජ කෙනෙක් වූවාහුද ඔවුහු මහා සුදර්ශන රජු වෙතට පැමිණ මෙසේ දැන්වූහ 'මහ රජ්ජුරුවන් වහන්ස, එනු මැනව, මහරජ්ජුරුවන් වහන්ස ඔබගේ ගමන ඉතා යහපත් වේමය. මහරජ්ජුරුවන් වහන්ස, (මේ මහා ද්වීපය) ඔබ සන්තකය මහරජ්ජුරුවන් වහන්ස, අපට අනුශාසනා කළ මැනව'යි යනුවෙනි මහා සුදර්ශන රජ (ඔවුන්ට) මෙසේ අනුශාසනා කළහ 'සතුන් නොමැරිය යුතුය. නොදුන් දෙය සොර සිතින් නොගත යුතුය. (සොරකම් නොකළ යුතුය) කාමයන්හි වරදවා නොහැසිරිය යුතුය. බොරු නොකිය යුතුය. සුරාපානය නොකළ යුතුය. (තොප) අනුභව කළ අයබදුම අනුභව කරව්යයි' (ඒ ඒ රජවරුන්ටම ඒ ඒ රටවල් පාවා දෙයි) ආනන්දය නැගෙනහිර දිශාවෙහි යම් විරුද්ධ රජ කෙනෙක් ඇද්ද ඔවුහු මහා සුදර්ශන රජුට අනුව පැවැත්තාහුය (යටත්වූහ.)

10. "ආනන්දය, ඉක්බිති ඒ චක්‍රරත්නය පෙරදිග සමුද්‍රයට බැසගෙන එයින් නැගී මහා සුදර්ශන රජ සහ සිවුරඟ සෙනග කැටුවම දකුණු දිශාවට (අහසින්) ගමන් ගත්තේය. ආනන්දය, යම් පෙදෙසක චක්‍රරත්නය පිහිටියේද එහි සුදර්ශන රජ සිවුරඟ සෙනග සමග වාසයට පැමිණියේය. ආනන්දය, දකුණු දිශාවෙහි යම් විරුද්ධ රජ කෙනෙක් වෙද්ද ඔවුහු මහා සුදර්ශන රජු වෙතට පැමිණ මෙසේ දැන්වූහ. 'මහ රජ්ජුරුවන් වහන්ස, එනුමැනව. මහ රජ්ජුරුවන් වහන්ස, ඔබගේ ගමන ඉතා යහපත්ය. මහ රජ්ජුරුවන් වහන්ස, මේ මහා ද්වීපය ඔබ

සන්තකය. මහ රජ්ජුරුවන් වහන්ස, අපට අනුශාසනා කළ මැනවයි” යනුවෙනි. මහා සුදර්ශන රජ (ඔවුන්ට) මෙසේ අනුශාසනා කළහ. ‘සතුන් නොමැරිය යුතුය, සොරකම් නොකළ යුතුය, කාමයන්හි වරදවා නොහැසිරිය යුතුය. බොරු නොකිය යුතුය. සුරාපානය නොකළ යුතුය. (තොප) අනුභව කළ අයබදුම අනුභව කරව්’යි (ඒ ඒ රටවල් ඒ ඒ රජවරුන්ට) පාවා දෙයි. ආනන්දය, දකුණු දිශාවෙහි යම් විරුද්ධ රජ කෙනෙක් වෙද්ද ඔවුහු මහා සුදර්ශන රජුට අනුව පැවැත්තාහුය. (යටත්වූහ.) ආනන්දය, ඉක්බිති ඒ චක්‍ර රත්නය දකුණු මුහුදට බැසගෙන එයින් නැගී බස්නාහිර දිශාවට ගමන් ගත්තේය. බටහිර මුහුදට බැස ගෙන මහා සුදර්ශන රජු හා සිවුරඟ සෙනඟ කැටුවම එයින් නැගී උතුරු දිශාවට ගමන් ගත්තේය. ආනන්දය, යම් පෙදෙසක චක්‍ර රත්නය පිහිටියේද සුදර්ශන රජ සිවුරඟ සෙනඟ සමග එහි වාසයට පැමිණියේය. ආනන්දය, උතුරුදිග යම් විරුද්ධ රජ කෙනෙක් වූවාහුද ඔවුහු මහා සුදර්ශන රජු වෙතට පැමිණ මෙසේ කීහ.

‘මහරජාණනි, මෙහි වඩිනු මැනව මහරජාණනි, ඔබගේ ගමන ඉතා යහපති. මහ රජාණෙනි, අපට අනුශාසනා කළ මැනව’ යනුයි. මහා සුදර්ශන රජ මෙසේ කීය. ‘සතුන් නොමැරිය යුතුය, සොරකම් නොකළ යුතුය, කාමයන්හි වරදවා නොහැසිරිය යුතුය, බොරු නොකිය යුතුය, සුරාපානය නොකළ යුතුය. (තොපි) තම තමන්ගේ රජ සැපය සුවසේ විඳිව් කියායි. ආනන්දය, උතුරුදිග යම් විරුද්ධ රජ කෙනෙක් වූවාහුද ඔවුහු මහා සුදර්ශන රජහට යටත් වූහ.

11. “ආනන්දය, ඉක්බිති ඒ චක්‍රරත්නය මුහුද කෙළවර කොට ඇති මුළු පොළොව ජයගෙන කුසාවතී රාජධානියට ආපසු ඇවිත් මහා සුදර්ශන රජුගේ ඇතුළු නුවර වාසල් දොර නඩු ශාලාව ඉදිරියෙහි, මහා සුදර්ශන රජුගේ ඇතුළු නුවර අන්තඃපුරය) වැඩියක් හොබවමින් රථ අලවංගුවේ ඇතුළත් කරන ලද්දක් මෙන් සිටියේය. ආනන්දය, මහා සුදර්ශන රජහට මෙබඳු (ආනුභාව ඇති) චක්‍රරත්නය පහළ වූයේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

12. "ආනන්දය, නැවතද සර්වාංගයම සුදුවූ ස්ථාන හතකින් පොළොව ස්පර්ශ කරන්නාවූ, ඍද්ධි ඇත්තාවූ අහසින් යන්නාවූ, උපොසථ නම් හස්තිරාජ රත්නයක් පහළවූයේය. ඒ දැක මහා සුදර්ශන රජුගේ සිත පැහැදුනේය. "පින්වත්නි ඒකාන්තයෙන් හස්ති යානය ඉදින් නික්මීමට පැමිණේ නම් ඉතා යහපතැයි' කියායි. ආනන්දය, එවිට ඒ හස්තිරත්නය ඉතා නොබෝ කලක් යහපත්ව දමනය කරන ලද උතුම් අජානීය හස්තිරාජයෙක් යම්සේද එමෙන්ම දමනයට පැමිණ ඉතා හොඳින් හික්මුනේය

"ආනන්දය, පෙරවූ දෙයක් කියමි. ඒ මහා සුදර්ශන රජ හස්ති රත්නය විමසන්නේ උදේ කාලයෙහි හස්ති යානාවට නැගී මුහුද කෙළවරකොට ඇති මුළු පොළොවම අනුශාසනා කොට කුසාවතී රාජධානියට ආපසු ඇවිත් උදේ ආහාරය නිම වූයේය. ආනන්දය, මහා සුදර්ශන රජහට මෙබඳු හස්ති රත්නයක් පහළ වූයේය.

13 "නැවතද ආනන්දය මහාසුදර්ශන රජහට, මුළු ශරීරය සුදුවූ කාක ශිර්ෂවූ (කවුඩෙකුගේ හිසට සමාන හිසක් ඇති) දකුණට කැරකුන කෙස කලාපයක් ඇති. ඍද්ධිමත්වූ අහසින් යන්නාවූ වලාහක අශ්වරාජවූ අශ්වරත්නයක් පහළවූයේය. ඒ දැක මහා සුදර්ශන රජුගේ සිත පැහැදුනේය 'පින්වත්නි, ඒකාන්තයෙන් ඉදින් අශ්ව යානාව දමනය වූයේ නම් ඉතා යහපතැයි' සිතුවේය. ඉක්බිති බොහෝ කලක් යහපත්ව දමනය කරන ලද්දාවූ උතුම් ආජානිය සෛන්ධවයෙක් (අශ්වයෙක්) යම්සේද එමෙන්ම ඒ අශ්ව රත්නය හොඳින් හික්මුණේය. ආනන්දය පෙරවූ දෙයක් කියමි මහා සුදර්ශන රජ ඒ අශ්ව රත්නය විමසනුයේ උදය කාලයෙහි අසුපිටට නැගී සමුද්‍රය කෙළවර කොට ඇති මුළු පොළොවෙහි ඇවිද කුසාවතී රාජධානියට ආපසු ඇවිත් පෙරවරු ආහාරය නිම වූයේය. ආනන්දය, මහා සුදර්ශන රජහට මෙබඳු අශ්වරත්නයක් පහළවූයේය.

14 "තවද අනිකක් නම්, ආනන්දය, ඒ මහා සුදර්ශන රජහට මාණික්‍ය රත්නයක් පහළ වූයේය. ඒ මිණිරුවන වෛඩූර්‍ය්‍ය

මැණිකක්වීය, ඉතා සුන්දරවූයේය. ජාතිසම්පන්න වූයේය, අටැස් වූයේය, මනා කොට ඔප කරන ලද්දේය, නිර්මල වූයේය. විශෙෂයෙන් ප්‍රසන්න වූයේය. සියලු ආකාරයෙන් සම්පූර්ණ වූයේය. ආනන්දය, ඒ මාණික්‍ය රත්නයේ ආලොකය හාත්පසින් යොදුනක් තැන පැතිර සිටියේය. ආනන්දය, පෙරවූ දෙයක් නම් මහාසුදර්ශන රජ ඒ මිණිරුවන විමසනුයේ සිව්රඟ සේනාව සරසා ඒ මාණික්‍යරත්නය කොඩියෙහි අගට නංවා ඇස් අඳුරු කරන තද කළුවර රාත්‍රියෙහි (නුවර) සැරිසරයි. ආනන්දය, ඒ කුසාවතී නගරය අවට ගම් වාසීහු ඒ මාණික්‍යයේ ආලෝකයෙන් දවාලයයි සිතා කර්මාන්ත ආරම්භ කළහ. ආනන්දය, මහා සුදර්ශන රජහට මෙබඳු මාණික්‍ය රත්නයක් පහළ වූයේය.

15 "නැවතද අනිකක් නම්, ආනන්දය, මහා සුදර්ශන රජහට ස්ත්‍රීරත්නයක් පහළ වූයේය. ඕතොමෝ මනා රූඇත්තීය, දැකුම් කටයුත්තීය. උතුම්වූ වර්ණ සෞන්දර්‍ය්‍යයෙන් යුක්ත වූවාය. ඉතා උස්ද නොවීය, ඉතා මිටිද නොවීය, ඉතා කෙට්ටුද නොවීය, ඉතා මහත්ද නොවීය, ඉතාකළුද නොවීය, ඉතාසුදුද නොවීය, මිනිස් වර්ණය ඉක්මුනාවූ දිව්‍ය වර්ණයට නොපැමිණියාවූ (දෙවඟනක් සමාන) ස්ත්‍රියක් වූවාය. ආනන්දය, ඒ ස්ත්‍රී රත්නයාගේ මෙබඳුවූ ශරීරස්පර්ශයක්වේ. ඉඹුල්පුළුන්වල හෝ කපු පුළුන්වල යම්බඳු ස්පර්ශයක් ඇද්ද, එබඳු ස්පර්ශයක් ඇත්තීය, ආනන්දය, ශීත කාලයේ ඒ ස්ත්‍රී රත්නයගේ ශරීරය උණුසුම් වෙයි. උණුසුම් කාලයේදී සිත වෙයි. ආනන්දය, ඒ ස්ත්‍රී රත්නයගේ ශරීරයෙන් සඳුන් සුවඳ විහිදෙයි, කටින් මහනෙල් මල්සුවඳ විහිදෙයි. ආනන්දය, ඒ ස්ත්‍රී රත්නය වනාහි මහා සුදර්ශනරජුට පළමුකොටම නැගිටින්නියක් වූවාය. පසුව සැතපෙන්නිය. දාසියක් මෙන් හැසිරෙන්නීය. ප්‍රිය මනාපව හැසිරෙන්නීය. ප්‍රිය වචන කියන්නීය ආනන්දය, ඒ ස්ත්‍රී රත්නය වනාහි මහා සුදර්ශන රජු ඉක්මවා සිතින්වත් නොහැසිරෙන්නීය. ශරීරයෙන් කියනුම කවරේද? ආනන්දය, මහා සුදර්ශන රජුට මෙබඳුවූ ස්ත්‍රී රත්නයක් පහළවූයේය.

16 "නැවතද අනිකක් නම්, ආනන්දය, මහා සුදර්ශන රජහට ගෘහපති රත්නයක් පහළ වූයේය. ඒ ගෘහපති රත්නයට කුශල

විපාකයෙන් දිවැස් පහළවිය. යමකින් අයිතිකාරයන් ඇතිවූද, නැතිවූද නිධාන දකීද එබඳු දිවැසකි. ඒ ගෘහපති රත්නය මහා සුදර්ශන රජු වෙත පැමිණ මෙසේ කීවේය. දෙවයන් වහන්ස, උත්සාහ නොකළ මැනව, මම ඔබ වහන්සේගේ ධනයෙන් වුවමනා කටයුතු කරන්නෙමියි" ධනයෙන් පැවරීය. ආනන්දය පෙරවූවක් කියමි. මහා සුදර්ශන රජ ඒ ගෘහපති රත්නය විමසනු පිණිස නැවකට නැගී ගංගානම් ගඟ මැද දිය පාරට පැමිණ ගෘහපති රත්නයට මෙසේ කීය 'ගෘහපතිය, මට රත්රනින් ප්‍රයෝජන ඇත්තේය' යනුයි 'මහ රජාණෙනි, එහෙනම් නැව එක් ගොඩකට (තෙරකට) පමුණුවනු මැනවැයි' කීය. 'ගෘහපතිය, මට මෙහිදීම රන් රුවනින් ප්‍රයෝජන ඇත්තේය'යි කීය.

"ආනන්දය, එවිට ඒ ගෘහපතිරත්නය දෝතින් දියදෙබෑ කොට රන්රුවනින් පිරි ඇති නිධිකුම්භයක් (නිධාන කළයක්) ඔසවා මහා සුදර්ශන රජුට මෙසේ කීය. 'මහ රජාණෙනි, මෙපමණකින් ප්‍රමාණද, මහ රජාණෙනි, මෙපමණකින් (කටයුතු) කරන ලද්දේද, මහරජාණෙනි, මෙපමණකින් (ඔබවහන්සේ) පුදන ලද්දේදැයි' ඇසීය. මහාසුදර්ශන රජ තෙමේ ගෘහපතිය, මෙපමණකින් ප්‍රමාණය, ගෘහපතිය, මෙපමණකින් (කටයුතු) කරන ලද්දේය. ගෘහපතිය, මෙපමණකින් පුදන ලද්දේයයි' කීය ආනන්දය, මහා සුදර්ශන රජුට මෙබඳු ගෘහපති රත්නයක් පහළ වූයේය.

17 නැවතද අනිකක් නම් ආනන්දය, මහා සුදර්ශන රජුට පරිනායක රත්නයක් පහළ වූයේය. ඔහු පණ්ඩිත වූයේය. කීමෙහි බිණීමෙහි දක්ෂ වූයේය. ඥාණවන්තවූයේය. මහා සුදර්ශන රජු වෙතට පැමිණ විය යුත්තන් පැමිණවීමටද, නොපැමිණවිය යුත්තන් නොපැණවීමටද සමර්ථ වූයේය. ඔහු මහා සුදර්ශන රජු වෙත පැමිණ, 'දේවයන් වහන්ස, ඔබ වහන්සේ වෙහෙස නොවනු මැනව. මම අනුශාසනා කරන්නෙමි' කීය. ආනන්දය, මහා සුදර්ශන රජුට මෙබඳු පරිනායක රත්නයක් පහළවූයේය. ආනන්දය, මහා සුදර්ශන රජු මේ සත් ආකාර රත්නයෙන් යුක්ත වූයේය.

18 "ආනන්දය, නැවතද අනිකක් නම්, මහා සුදර්ශන රජ සතර ඍද්ධියකින් යුක්ත වූයේය, කවර නම් සතර ඍද්ධියකින්ද යත්? ආනන්දය, මේ මනුෂ්‍ය ආත්ම භාවයෙහි මහා සුදර්ශන රජ අන්‍ය මනුෂ්‍යයන්ට වඩා අතිශයින් මනාවූ රූප සොභා ඇති දැකීමට ප්‍රියවූ සතුට ගෙනදෙන්නාවූ උතුම් වර්ණ සම්පත්තියෙන් යුක්තවිය. ආනන්දය, මහා සුදර්ශන රජ මේ පළමුවැනි ඍද්ධියෙන් යුක්ත විය.

19 "ආනන්දය, නැවතද අනිකක්නම්, මහා සුදර්ශන රජු සෙසු මනුෂ්‍යයන්ට වඩා බොහෝ කල් ජීවත්වන්නෙක් විය. දීර්ඝායු ඇත්තෙක් විය. ආනන්දය, මහා සුදර්ශන රජු මේ දෙවැනි ඍද්ධියෙන් යුක්ත විය.

20 "නැවතද අනිකක් නම් ආනන්දය, මහා සුදර්ශන රජ අන්‍ය මනුෂ්‍යයන්ට වඩා ආබාධ අඩු කෙනෙක් වීය. රොග අඩු කෙනෙක් විය. ඉතා මඳද නොවූ වැඩිද නොවූ, සමව ආහාර දිරවන ගින්නෙන් යුක්තවිය. ආනන්දය, මහාසුදර්ශන රජ මේ තුන්වැනි ඍද්ධියෙන් යුක්ත විය.

21 "තවත් කරුණක් නම් ආනන්දය, මහා සුදර්ශන රජු බ්‍රාහ්මණ ගෘහපතීන්ට ප්‍රියවූයේද, මනාප වූයේද, ආනන්දය, යම්සේ පුත්‍රයන්ට පියා ප්‍රියවේද, මනාප වේද එමෙන්ම ආනන්දය, මහාසුදර්ශනරජු බ්‍රාහ්මණ ගෘහපතීන්ට ප්‍රිය වූයේද, මනාපද වූයේද, ආනන්දය, මහා සුදර්ශන රජුටද බ්‍රාහ්මණ ගෘහපතීහු ප්‍රිය වූවාහුය. මනාප වූවාහුය. ආනන්දය, යම්සේ පියාට පුත්‍රයෝ වෙද්ද, මනාප වෙද්ද එමෙන් ආනන්දය, මහාසුදර්ශන රජුට බ්‍රාහ්මණ ගෘහපතීහු ප්‍රිය වූවාහුය, මනාප වූවාහුය. ආනන්දය, පෙර මෙවැනි දෙයක් විය. මහාසුදර්ශන රජ සිව්රඟ සෙනග සමග උයනට ගියේය. ආනන්දය, එවිට බ්‍රාහ්මණ ගෘහපතීහු මහාසුදර්ශන රජු ළඟට පැමිණ මෙසේ කීවාහුය.' දේවයන් වහන්ස, ඔබ වහන්සේ යම් පරිද්දකින් ඉතා බොහෝ වේලාවක් දක්නෙමුද, එසේ ඉක්මන් නොවී වැඩිය මැනවැයි' කීහ. ආනන්දය, මහාසුදර්ශන රජුද රියැදුරාට කථා කළේය. 'එම්බා රියැදුර, ඉක්මන් නොව හෙමින් රථය ගමන් කරව. මම යම් ලෙසකින් බ්‍රාහ්මණ ගෘහපතීන් බොහෝ

වේලාවක් දක්නෙම්ද එසේ පදවයි’ කීය. ආනන්දය, සුදර්ශන මහරජු මේ සතර වැනිවූ ඍද්ධියෙන් යුක්ත වූයේය. ආනන්දය මහා සුදර්ශන රජ මේ සතර වැදෑරුම් ඍද්ධියෙන් යුක්ත විය.

22 “ආනන්දය, ඉක්බිති ඒ මහාසුදර්ශන රජුට මෙවැනි අදහසක් ඇතිවිය. ‘මම මේ තල්ගස් පේළි මැද දුනු සියයකින් දුනු සියයකින් අතර පොකුණු සාදවන්නෙම් නම් ඉතා යෙහෙකැයි’ කියාය.

“ආනන්දය මහාසුදර්ශන රජු ඒ තල්ගස් පේළි මැද දුනු සියයකින් දුනු සියයකින් අතර පොකුණු සෑදෙව්වේය. ආනන්දය, ඒ පොකුණු ජාති හතරකින් යුත් ගඩොල්වලින් සාදවන ලද්දාහුය. එක් ගඩොලක් රනින්ද, එක් ගඩොලක් රිදියෙන්ද එක් ගඩොලක් වෛරෝඩියෙන්ද, එක් ගඩොලක් පලිගුම්ණියෙන්ද නිම විය. ආනන්දය, ඒ පොකුණුවල ජාති හතකින් යුත් පඩි පේළි සතර සතර විය. එක් පඩි පෙළක් රනින්ද, එකක් රිදියෙන්ද, එකක් වෙරළු මිණෙන්ද, එකක් පළිඟු මිණෙන්ද නිමවිය. රත්‍රන් පඩිපෙලෙහි රනින් කණුවූහ. රිදී පඩි හා පඩිහිස වීය. රිදී පඩිපෙළෙහි රිදී කණු වූහ. රත්‍රන් පඩී හා පඩිහිස වූයේය. වෛරෝඩි පඩිපෙළෙහි වෛරෝඩි කණුවූහ. පලිගුම්ණි පඩි හා පඩිහිස වූයේය. පළිඟු මිණි පඩි පෙළෙහි පළිඟුම්ණි කණුවූහ. වෛරෝඩි පඩි හා පඩිහිස වූයේය. ආනන්දය, ඒ පොකුණු වේදිකා දෙකකින් වටවූවාහුය. එක් වේදිකාවක් රත්රනින් විය. එකක් රිදීවිය. රත්රන් වේදිකාවෙහි රත්රන් පඩිවූහ. රිදී පඩිහිස වූයේය. රිදී වේදිකාවෙහි රිදී කණු විය. රත්රන් පඩි හා පඩිහිස වූයේය.

23 “ආනන්දය, ඉක්බිති ඒ මහා සුදර්ශන රජුට මෙබඳු අදහසක් ඇති විය. ‘මම මේ පොකුණුවල හැම ඍතුවටම පිපෙන හැමදෙනාටම පෙනෙන සේ මෙබඳුවූ මල් සිටවූයෙම් නම් ඉතා යෙහෙකැ’යී කියායි. (එනම්) නිල් මහනෙල්ය. පියුම්ය, කුමුදුය, හෙල පියුම්ය යන මේවාය.

ආනන්දය, මහා සුදර්ශන රජ ඒ පොකුණුවල හැම ඍතුවටම පිපෙන හැමදෙනාටම පෙනෙනසේ මෙබඳුවූ මල්

සිටුවූයේය. නිල්මානෙල්ය, පියුම්ය, කුමුදුය, හෙළ පියුම්ය යන මේවාය. ආනන්දය, ඉක්බිති මහා සුදර්ශන රජුට මෙබඳු අදහසක් විය. 'මම මේ පොකුණු අද්දර පැමිණි පැමිණි ජනයන් නාවන්න, වූ නහාපක (නාවන) පුරුෂයන් තබන්නෙම් නම් ඉතා යෙහෙකැ" යි කියායි. ආනන්දය, ඒ මහා සුදර්ශන රජ පොකුණු අද්දර පැමිණි පැමිණි ජනයන් නාවන්නාවූ නහාපක (නාවන) පුරුෂයන් තැබ්බවූයේය. තවද ආනන්දය, ඒ මහා සුදර්ශන රජුට මෙබඳු අදහසක් ඇතිවිය. 'මම ආහාර කැමති අයට ආහාරද, බොන දේ කැමති අයට බොන දේද, ඇඳුම් කැමති අයට ඇඳුම්ද, යානා කැමති අයට යානාද, සයන කැමති අයට සයනාසනද, ස්ත්‍රීන් කැමති අයට ස්ත්‍රීන්ද, අමුරන් කැමති අයට අමුරන්ද, රත්රන් කැමති අයට රත්රන්ද, යන මෙබඳු දානයක් මේ පොකුණු අද්දර තැබ්බවූයෙම් නම් ඉතා යෙහෙකැ'යි කියායි. ආනන්දය, මහා සුදර්ශන රජ ඒ පොකුණු ඉවුරු වල ආහාර කැමැත්තන්ට ආහාරද, පාන වර්ග කැමැත්තන්ට පාන වර්ගද, යානා කැමැත්තන්ට යානාද, සයන කැමැත්තන්ට සයනද, ස්ත්‍රීන් කැමැත්තන්ට ස්ත්‍රීන්ද, අමුරන් කැමැත්තන්ට අමුරන්ද, රත්රන් කැමැත්තන්ට රත්රන්ද තැබ්බවූයේය.

**24** 'ආනන්දය, ඉන්පසු බ්‍රාහ්මණ ගෘහපතියෝ බොහෝ වස්තුව ගෙණ මහාසුදර්ශන රජු ලඟට පැමිණ මෙසේ කීහ.

'දෙවයන් වහන්ස, බොහෝ වූ මේ වස්තුව දෙවයන් වහන්සේ උදෙසාම ගෙණඑන ලද්දේය. එය දේවයන්වහන්සේ පිළිගන්නා සේක්වා' යි කීහ. 'පින්වත්නි, වුවමනා නැත. මාගේ ධාර්මික අයවලින් රැස්කරනලද මේ බොහෝවූ වස්තුවද ඇත. එයද තොපට වේවා. මෙයින්ද බොහෝ වූ වස්තුව ගෙණයව්යයි' කීය. රජු විසින් ප්‍රතික්ෂෙප කරනලද බැවින් ඒ මිනිස්සු එක පැත්තක සිට මෙසේ සිතූහ. 'යම්බඳුවූ අපි මේ වස්තුව නැවතත් අපේ ගෙවලට ගෙන යන්නාහු නම් එය අපට සුදුසු නොවන්නේය. මහා සුදර්ශන රජුට ගෙයක් සාදමු නම් යෙහෙකැ' යි කියායි. ඔවුහු මහාසුදර්ශන රජු ලඟට පැමිණ 'දේවයන් වහන්ස, අපි ඔබවහන්සේට ගෙයක් කරම්හ'යි කීහ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ආනන්දය, මහාසුදර්ශන රජ ඒ කාරණය නිශ්ශබ්ද වීමෙන් ඉවසුවේය.

**25** "තවද, ආනන්දය, සක්දෙවිඳු මහා සුදර්ශන රජුගේ සිතිවිල්ල තමාගේ සිතින් දැන විශ්වකර්ම දිව්‍යපුත්‍රයාට කථා කළේය. 'මෙහි එව, තොපි මහා සුදර්ශන රජුට විසීමට "ධම්ම" නම් ප්‍රාශාදයක් මවව"යි කීය ආනන්දය, ඒ විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා 'ස්වාමීනි, ඒ මැනවැ"යි සක් දෙවිඳුට උත්තරදී යම්සේ බලවත් පුරුෂයෙක් හකුළුවනලද අතක් දිගහරින්නේ හෝ දිගහරිනලද අතක් හකුළුවන්නේ හෝ යම්සේද එමෙන් තව්තිසා වැසි දෙවියන් කෙරෙන් අතුරුදන්ව මහාසුදර්ශන රජුගේ ඉදිරියෙහි පහළවූයේය. ආනන්දය, ඉක්බිති විස්කම් දෙව්පුත්‍ර මහා සුදර්ශන රජුට මෙසේ කීවේය.

'දේවයන් වහන්ස, ඔබ වහන්සේට 'ධර්ම' නම් ප්‍රාසාදයක් (ගෙයක්) කරවන්නෙමි'යි කීය. ආනන්දය, මහා සුදර්ශන රජ නිශ්ශබ්දවීමෙන් ඉවසුයේය. ආනන්දය, විශ්වකර්ම දිව්‍යපුත්‍ර තෙමේ "ධර්ම" නම්වූ ප්‍රාසාදයක් මැවූයේය.

**26** "ආනන්දය, ඒ "ධර්ම" නම්වූ ප්‍රාසාදය නැගෙනහිර සිට බස්නාහිරට දිගින් යොදුනක් විය. උතුරේ සිට දකුණට පළලින් යොදුන් බාගයක් වූයේය. ආනන්දය, ධර්මප්‍රාසාදයේ භූමිය උසින් මිනිසුන් තුන් දෙනෙකුගේ උස පමණ වූයේය. සතර වර්ගයක ගලින් කරන ලද්දේය. එක් වර්ගයක් රත්රන්ද, එක් වර්ගයක් රිදීද, එක්වර්ගයක් වෛරෝඩිද, එක්වර්ගයක් පළිඟු මැණික්ද විය. ආනන්දය, ධර්මප්‍රාසාදයේ හතර වර්ගයක කුළුණු අසූහාරදහසක් විය. එක් කුළුණක් රනින්ද, එකක්රිදීයෙන්ද, එකක් වෙරළු මිණියෙන්ද, එකක් පළිඟු මිණියෙන්ද විය. ආනන්දය, ධර්මප්‍රාසාදයෙහි සතර වර්ගයක තහඩු අතුරන ලද්දේය. එක් තහඩුවක් රනින්ද, එකක් රිදියෙන්ද, එකක් වෙරළුමිණියෙන්ද, එකක් පළිඟුමිණෙන්ද විය. ආනන්දය, ධර්මප්‍රාසාදයේ සතර වර්ගයක සොපාණ (තරප්පු) විසිහතරක් විය. එකක් රනින්ද, එකක් රිදියෙන්ද, එකක් වෛරෝඩියෙන්ද, එකක් පළිඟුමිණියෙන්ද විය. රත්රන් තරප්පුවේ රත්රන් කණු වූහ. රිදී

පඩි හා හිස විය. රිදී තරප්පුවෙහි රිදී කණු වූහ. රත්රන් පඩි හා හිස වීය. වෛරෝඩි තරප්පුවෙහි වෛරෝඩි කණු වූහ. පළිගුමිණි පඩි හා හිස වීය පළිගුමිණි තරප්පුවෙහි පළිගුමිණි කණු වූහ. වෛරෝඩි පඩි හා හිස වීය ආනන්දය, ධර්මප්‍රාසාදයෙහි සතර වර්ගයක අසූහාරදහසක් කුළු ගෙවල් වූහ. එක් කුළු ගෙයක් රනින්ද, එකක් රිදියෙන්ද, එකක් වෛරෝඩි මැණිකෙන්ද, එකක් පළිගු මැණිකෙන්ද විය. රත්රන් කුළුගෙයි රිදියෙන් කළ ආසනයක් (පර්යංකයක්) පණවන ලද්දේ වීය. රිදී කුළුගෙයි රත්රනින් කළ ආසනයක් පණවන ලද්දේ වීය. වෛරෝඩි කුළුගෙයි දලින් කළ ආසනයක් පණවන ලද්දේ විය. පළිගුමිණි කුළුගෙයි මැසිරිගලින් කළ ආසනයක් පණවනලද්දේ විය. රත්රන් කුළුගෙයි දොරටුව ළඟ රිදියෙන් කළ තල් ගසක් පිහිටියේ වීය. එහි කඳ රිදියෙන් කළේ වීය. රනින් කළ කොළ හා ගෙඩි වූහ. රිදී කුළුගෙයි දොරටුව ළඟ රනින් කළ තල්ගසක් පිහිටියේ විය. එහි කඳ රත්රන් වීය රිදියෙන් කළ කොළ හා ගෙඩි වූහ. වෛරෝඩි මැණික් කුළුගෙයි දොරටුව ළඟ පළිගු මිණියෙන්කළ තල්ගසක් වීය. එහි කඳ පළිගුවෙන් හා කොළ හා ගෙඩි වෛරෝඩි මැණිකෙන් වූහ. පළිගුමිණි කුළුගෙයි දොරටුව ළඟ වෛරෝඩියෙන් කළ තල්ගසක් විය. එහි කඳ වෛරෝඩි මැණිකෙන් විය කොළ හා ගෙඩි පළිගුවෙන් වූහ.

27 "ආනන්දය, ඉක්බිති මහා සුදර්ශන රජුට මෙබඳු අදහසක් ඇතිවිය 'මම යම් තැනක දවාල ගතකරමින් හිඳිම්ද ඒ 'මහාවියූහ' නම් කුළුගෙයි දොරටුව කෙලින් සම්පූර්ණ රනින්කළ 'තල් වනයක් කරවන්නෙම්නම් ඉතා යෙහෙකැයි' කියායි. ආනන්දය, මහා සුදර්ශන රජ යම් තැනෙක්හි දවල් කාලය ගතකරමින් හිඳීද, ඒ "මහාවියූහ" නම් කුළුගෙයි දොරටුවෙහි සියල්ල රනින් කළ තල් වනයක් කරවූයේය.

28. "ආනන්දය, ඒ ධර්මප්‍රාසාදය වේදිකා දෙකතින් වට විය. එක් වේදිකාවක් රත්රන්ද එකක් රිදීද විය. රනින් කළ වේදිකාවෙහි රත්රන් කණු වූහ. රිදියෙන් කළ පඩි හා හිස විය. රිදියෙන් කළ වේදිකාවෙහි රිදියෙන් කළ කුළුණු වූහ. රනින් කළ පඩි හා හිස විය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**29.** "ආනන්දය, ධර්මප්‍රාසාදය කිකිණි දැල් දෙකකින් වට කරණ ලද්දේය. රනින් කළ එක දැලක්ද, රිදියෙන් කළ එක් දැලක්ද, විය. රනින් කළ දැලෙහි රිදියෙන් කළ කිකිණි වූහ. රිදියෙන් කළ දැලෙහි රනින් කළ කිකිණි වූහ. සුළඟින් සෙලවෙන විට මනරම්වූද, සිත් අලවන්නාවූද, ප්‍රීති කරන්නාවූද, සිත සතුටු කරන්නාවූද නාදයක් වූයේය. ආනන්දය, යම්සේ විශෙෂයෙන් හික්මුනාවූ බෙර ආදිය වාදනයෙහි (ගැසීමෙහි) දක්ෂවූ වාද්‍යකාරයෙකු විසින් වාදනය කරන ලද්දාවූ පංචාංගික තූර්‍ය්‍යනාදයාගේ මනරම්වූද, සිත් අලවන්නාවූද, සිත වඩාත් සතුටු කරන්නාවූද නාදයක්වේද, එමෙන්ම ආනන්දය, සුළඟින් සෙලවෙන ඒ කිකිණි දැල්වලින් මනරම්වූද, සිත් අලවන්නාවූද, ප්‍රීති කරන්නාවූද, සිත වඩාත් සතුටු කරන්නාවූද නාදයක් වූයේය. ඒ කාලයෙහි කුසාවතී රාජධානියෙහි ස්ත්‍රී ධූර්තාදීහුද සුරා පිපාසයෙන් යුත් සුරා පිපාසයෙන් යුත් සුරා සොඬහුද වාසය කරති. ඔවුහු වාතයෙන් සෙලවෙන්නාවූ ඒ කිකිණි දැල්වල නාදයෙන් තාලයට අනුව නටත්.

**30.** "ආනන්දය, වැඩ අවසන් කළ ධර්මප්‍රාසාදය නොබැලිය හැකිය. ඇස් අඳුරුවන්නේය. ආනන්දය, වර්ෂා ඍතුවෙහි අන්තිම මාසයෙහි සරත් කාලයෙහි වළාකුල් නැති අහසෙහි පැනනැංගාවූ සූර්‍ය්‍යයා යම්සේ නොබැලිය හැක්කේද, ඇස් අඳුරුවන්නේද, එමෙන්ම ආනන්දය, ඒ ධර්ම ප්‍රාසාදය බැලිය නොහැක්කේය. ඇස් අඳුරුවන්නේ වීය

**31.** "ආනන්දය, ඉන්පසු මහා සුදර්ශන රජුට මෙවැනි අදහසක් විය. 'මම ධර්මප්‍රාසාදය ඉදිරියෙහි 'ධර්මා' නම් පොකුණක් කරවන්නෙම් නම් ඉතා යෙහෙකැයි' කියායි. ආනන්දය මහා සුදර්ශන රජ ධර්මප්‍රාසාදය ඉදිරියෙහි 'ධර්මා' නම් පොකුණක් කරවීය.

"ආනන්දය, 'ධර්ම' නම් පොකුණ නැගෙනහිර සිට බස්නාහිරට දිගින් යොදුනක් වූයේය. උතුරේ සිට දකුණට පළලින් යොදුන් බාගයක් වූයේය ආනන්දය, 'ධර්මා' පොකුණ සතර වර්ගයක ගඩොලින් නිම කරන ලද්දේවිය. එක් ගඩොලක් රනින් විය. එකක් රිදියෙන්ද, එකක් වෛඩූර්‍ය්‍යයෙන්ද, එකක්

පළිඟුයෙන්ද විය. ආනන්දය, 'ධර්මා' පොකුණෙහි වර්ග හතරකින් පඩි පේළි විසි හතරක් විය. එක් පඩි පෙළක් රනින්ද එකක් රිදියෙන්ද, එකක් වෛරෝඩියෙන්ද, එකක් එකක් පළිඟුයෙන්ද විය. රනින් කළ පඩි පෙළෙහි රනින් කළ කණු වූහ. රිදියෙන් කළ පඩි හා හිස විය. රිදියෙන් කළ පඩි පෙළෙහි රිදියෙන් කළ කණු වූහ රනින් කළ පඩි හා හිස විය. වෛරෝඩි මැණිකෙන් කළ පඩිපෙළෙහි වෛරෝඩි මැණිකෙන් කළ කණු වූහ. පළිඟුවෙන් කළ පඩි හා හිස විය. පළිඟුයෙන් කළ පඩිපෙළෙහි පළිඟු කණු වූහ. වෛරෝඩියෙන් කළ පඩි හා හිස වීය ආනන්දය, 'ධර්මා' නම් පොකුණ වේදිකා දෙකකින් වට විය. එක් වේදිකාවක් රනින් විය අනික රිදියෙන් විය රනින් කළ වේදිකාවෙයි රනින් කළ කුළුණු වූහ. රිදියෙන් කළ පඩි හා හිස විය. රිදියෙන් කළ වේදිකාවෙහි රිදියෙන් කළ කුළුණු වූහ. රනින් කළ පඩි හා හිස වීය.

32. "ආනන්දය, 'ධර්මා' නම් පොකුණ තල්ගස් පේළි සතකින් වට කරන ලද්දේ විය. රනින් කළ එක් තල් ගස් පෙළක්ද දිරියෙන් කළ එකක්ද, වෛරෝඩියෙන් කළ එකක්ද පළිඟුයෙන් කළ එකක්ද, රතු මැණිකෙන් කළ එකක්ද, මැසිරි ගලින් කළ එකක්ද, සියලු රත්නයන්ගෙන් කළ එකක්ද වූහ. රනින් කළ තල්ගසෙහි පළිඟුවෙන් කළ කඳක් විය. රිදියෙන් කළ කොළ හා ගෙඩි වූහ රිදියෙන් කළ තල් ගසෙහි රිදී කඳක් විය. රනින් කළ කොළ හා ගෙඩි වූහ. වෛරෝඩිමැණිකෙන් කළ තල් ගසෙහි වෛරෝඩියෙන් කළ කඳක් විය. පළිඟුවෙන් කළ කොළ හා ගෙඩි වූහ. පළිඟුයෙන් කළ තල් ගසෙහි පළිඟුවෙන් කළ කඳක් විය. රතු මැණිකෙන් කළ කොළ හා ගෙඩි වූහ. සියලු රත්නයෙන් කළ තල්ගසෙහි සියලු රත්නයෙන් කළ කඳක් විය සියලු රත්නයෙන් කළ කොළ හා ගෙඩි වූහ. ආනන්දය, සුළඟින් සෙලවෙන ඒ තල් ගස් පෙළින් එන ශබ්දය සිත් අලවන්නේද, මන වඩන්නේද, සතුටින් මත් කරන්නේද වෙයි ආනන්දය, යම්සේ විශෙෂයෙන් හික්මුනාවූ බෙර ආදිය වැයීමෙහි (ගැසීමෙහි) දක්ෂවූ වාදකයෙකු විසින් වයන ලද්දාවූ පංචාංගික තූර්‍ය්‍යනාදයෙහි මනරම්වූද, සිත් අලවන්නාවූද, සතුටින් මත් කරන්නාවූද, නාදයක් වේද, එමෙන්ම ආනන්දය, සුළඟින්

සෙලවෙන තල්ගස් පෙළින් එන නාදය මනරම්ද විය, සිත් අලවන්නේද විය, මන වඩන්නේද විය, සිත ප්‍රීතියෙන් මත්කරන්නේද විය. ආනන්දය, ඒ කාලයෙහි කුසාවතී රාජධානියෙහි ස්ත්‍රී ධූර්තාදිහුද පිපාසයෙන් යුක්තවූ සුරා සොඬහුද වාසය කරති. ඔවුහු, සුළඟින් සෙලවෙන ඒ තල් ගස් පෙළින් එන නාදයේ තාලයට අනුව නටන්නාහ.

33. 'ආනන්දය, "ධර්මප්‍රාසාදය" ද, 'ධර්මා' නම් පොකුණද කර අවසානවූ කල්හි මහා සුදර්ශන රජ ඒ කාලයෙහි යම් කෙනෙක් ශ්‍රමණයන් අතරෙහි ශ්‍රමණයයි සම්මත වූවාහුද බ්‍රාහ්මණයන් අතරෙහි බ්‍රාහ්මණයයි සම්මත වූවාහුද ඒ සියල්ලන් කැමති කැමති සියලු දෙයින් සතුටු කොට (සන්තර්පණය කොට) ධර්මප්‍රාසාදයට නැංගේය.

(මෙතෙකින් පළමුවෙනි බණවර නිමියේය.)

---

## 2.

1. "ආනන්දය, ඊට පසුව මහාසුදර්ශන රජහට මෙබඳු අදහසක් ඇති විය. 'එනම් යම් හෙයකින් මම දැන් මහත් ඍද්ධි ඇත්තේ මහත් ආනුභාව ඇත්තේ වෙම්ද, මාගේ මේ සම්පත්තිය කිනම් කුසල කර්මයක්හුගේ ඵලයක්ද, කවර කර්මයක්හුගේ විපාකයෙක්ද?' කියායි. ඉක්බිති මහාසුදර්ශන රජහට මෙබඳු අදහසක් ඇතිවිය, 'මාගේ මේ සම්පත්තිය ත්‍රිවිධ කුසලකර්මයාගේ ඵලය වෙයි. ත්‍රිවිධ කර්මයන්ගේ විපාකය වෙයි. යම් හෙයකින් මම මේ ආත්මයෙහි මෙබඳුවූ මහත් ඍද්ධි ඇත්තෙම්ද මෙබඳුවූ මහත් ආනුභාව ඇත්තෙම්ද යනුයි ඒ කවරේද යත්, දානයේද, උපොසථ සීලයේද, කය හා වචනය සංවර කිරීමේද, යන ත්‍රිවිධ කුසල කර්මයේ ඵල විපාකය යනුයි.'

2. තවද ආනන්දය, ඒ මහාසුදර්ශන රජතෙම 'මහා ව්‍යුහ' නම් කූටාගාරය යම් තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ, 'මහාව්‍යුහ' නම් කූටාගාරයෙහි දොරටුව ළඟ සිට ප්‍රීති වාක්‍යයක් කීයේය. 'කාම සිතිවිලි සිටුව, ක්‍රොධ සිතිවිලි සිටුව, හිංසා සිතිවිලි සිටුව, කාම සිතිවිලි මෙපමණකින් සිටීවා, ක්‍රොධ සිතිවිලි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මෙපමණකින් සිටීවා, හිංසා සිතිවිලි මෙපමණකින් සිටීවා’ කියායි.

3. “තවද ආනන්දය, මහාසුදර්ශන රජ තෙමේ ‘මහා ව්‍යුහ’ නම් කූටාගාරයෙහි රනින් කළ පර්යංකයෙහි (ආසනයෙහි) හුන්නේ කාම තෘෂ්ණාවෙන් වෙන්වම අකුසල ධර්මයන්ගෙන් වෙන්වම, විතර්ක (සිත අරමුණක නංවන චෛතසිකය) සහිතවූ, විචාර (අරමුණු පිරිමැදිම) සහිතවූ විවේකයෙන් හටගත්තාවූ ප්‍රීතිය හා සැප ඇති ප්‍රථම ධ්‍යානය උපදවා විසුයේය. විතර්ක, විචාර යන දෙදෙනාගේ නැතිවීම හේතුකොටගෙන තමන්ගේ සිත් තුළ පැහැදීම ඇති කරන්නාවූ සිතේ එකඟ බව ඇති විතර්ක විචාර රහිතවූ සමාධියෙන් උපන්නාවූ ප්‍රීතිය හා සැප ඇති දෙවැනි ධ්‍යානය උපදවා වාසය කෙළේය. ප්‍රීතිය දුරුකිරීම හේතුකොටගෙනද උපෙක්ෂා සහගතව සිහියෙන් යුත්තවූයේ සම්‍යක් ප්‍රඥාවෙන් කයින් සැපය විඳින්නේද උපෙක්ෂාවෙන් යුක්තවූයේ, සිහියෙන් යුක්තවූයේ, සැපවිහරණ ඇත්තේයයි, යමක් ආයර්‍යයෝ කියත්ද, එබඳුවූ තුන්වෙනි ධ්‍යානය උපදවා විසුයේය. සැප දුරු කිරීමෙන්ද දුක් දුරුකිරීමෙන්ද පළමුකොටම දුක් වේදනා සැප වේදනා දුරලීමෙන් දුක් නැත්තාවූ සැප නැත්තාවූ උපෙක්ෂාවෙන් යුත් සිහිය හා පිරිසිදු භාවය ඇති සතරවෙනි ධ්‍යානය උපදවා විසුයේය.

4 නැවතද ආනන්දය, මහා සුදර්ශන රජ තෙම මහා ව්යූහ කූටාගාරයෙන් නික්ම රත්රන් කූටාගාරයට ඇතුල්ව රිදී ආසනයෙහි හුන්නේ මෛත්‍රී සහගත සිතින් එක් දිශාභාගයක් පතුරුවා විසුයේය. එසේම දෙවැනි දිශාභාගයද, එසේම තුන්වැනි දිශාභාගයද, එසේම හතරවැනි දිශාභාගයද මේ ආකාරයෙන් උඩ, යට, හරහ සෑම තන්හි සියලුම ප්‍රාණීන් සහිතවූ සියලුම ලෝකය විශාලවූ මහත් බවට ගියාවූ අප්‍රමාණවූ වෛර නැති හිංසා රහිතවූ මෛත්‍රී සිතින් පතුරුවා විසුයේය. කරුණා සහගත සිතින්, මුදිතා සහගත සිතින් උපෙක්ෂා සහගත සිතින් එක් දිශාභාගයක් පතුරුවා විසුයේය. එසේම දෙවැනි දිශාවද, එසේම තුන්වෙනි දිශාවද, එසේම හතරවැනි දිශාවද, එසේම උඩද, යටද, හරහද යන සෑම තන්හි සියලු සත්වයින් සහිතවූ සියලු

ලෝකය, මහත් බවට ගියාවූ අප්‍රමාණවූ වෛර නැති හිංසා රහිතවූ උපෙක්ෂා සහගත සිතින් පතුරුවා විසුයේය.

5 "ආනන්දය, මහා සුදර්ශන රජහට කුසාවතී රාජධානිය ප්‍රධාන කොට ඇති සුවාසූ දහසක් නගරයෝ වූවාහුය. ධර්මප්‍රාසාදය ප්‍රමුඛ කොට ඇති සුවාසූ දහසක් ප්‍රාසාද වූවාහුය. මහාව්‍යූහ කූටාගාරය ප්‍රධාන කොට ඇති සුවාසූ දහසක් කූටාගාර වූවාහුය. රනින් කළාවූද රිදියෙන් කළාවූද ඇත්දළින් කළාවූද දැවයෙන් කළාවූද එක් පිට ලොම් ඇති එළු ලොමින් කළ ඇතිරියෙන් යුක්තවූද, දෙපිට ලොම් ඇති එළු ලොමින් කළ ඇතිරියෙන් යුක්තවූද, රන් වැඩ දැමූ දික් දහවලු ඇති ඇතිරියෙන් යුක්තවූද, කෙසෙල්මුව (මුවන් වර්ගයක්) සමින් කළ ඇතිරිලිවලින්යුක්තවූද, මත්තෙහි බඳනාලද රන්වියන් සහිතවූද ඉස්දොර සහ පාමුල රතුකොට්ට සහිතවූ සුවාසූදහසක් පර්යංකවූවාහුය. රත්රන් ආභරණයෙන්සරසන ලද්දාවූ රන් කොඩි සහිතවූ රන් දැලින් වසන ලද්දාවූ උපොසථ ඇත්රාජයා ප්‍රධානකොට සුවාසූදහසක් ඇත්රජහු වූවාහුය. රත්රන් ආභරණයෙන් සරසන ලද රන් කොඩි සහිතවූ රන් දැලින් වසන ලද්දාවූ වලාහක අශ්ව රාජයා ප්‍රධාන සුවාසූ දහසක් අශ්වයෝ වූවාහුය. සිංහ සමින් වට කරණ ලද්දාවූ ව්‍යාඝ්‍ර සමින් වටකරන ලද්දාවූද දිවි සමින් වටකරන ලද්දාවූද, රත් කම්බලයෙන් වටකරන ලද්දාවූද රත්රනින් අලංකාරවූද රන්ධජ නංවන ලද්දාවූද රන් දැලින් වසන ලද්දාවූද වෛජයන්ත රථය ප්‍රධාන කොට සුවාසූ දහසක් රථ වූවාහුය. මාණික්‍ය රත්නය ප්‍රධාන කොට ඇති සුවාසූ දහසක් මාණික්‍ය රත්න වූවාහුය. සුභද්‍රා දෙවි ප්‍රධානකොට ඇති සුවාසූ දහසක් ස්ත්‍රීහු වූවාහුය. ගෘහපති රත්නය ප්‍රධානකොට ඇති සුවාසූ දහසක් ගෘහපතීහු වූවාහුය. පරිනායක රත්නය ප්‍රධානවූ, අනුව හැසිරෙන්නාවූ සුවාසූ දහසක් ක්ෂත්‍රිය රජහු වූවාහුය. එල්ලාහැලෙන බුරුළු ඇති රන් සැට්ටයෙන් සැරසූ සුවාසූ දහසක් කිරිදෙන්නු වූවාහුය. සියුම්වූ කොමු පිළිද සියුම්වූ කපු පිළිද සියුම්වූ කොසෙය්‍ය වස්ත්‍රද සියුම්වූ කම්බල වස්ත්‍රද යන මෙයින් සම්පූර්ණවූ කෝටි අසූසාරදහසක් වස්ත්‍ර වූවාහුය. උදය සවස ආහාරය පිණිස එළවන බත් තලි අසූ සාර දහසක් වූවාහුය.

6 "ආනන්දය, ඒ කාලයේදී මහාසුදර්ශන රජහට සුවාසූ දහසක් නාගරාජයෝ උදය සවස උපස්ථානයට එන්නාහ. ආනන්දය, ඉක්බිතිව මහා සුදර්ශන රජහට මේ අදහස ඇති විය. 'මේ අසූහාරදහසක් නාගරාජයෝ උදය සවස මට උපස්ථානයට එන්නාහ. යම්හෙයකින්, දෙසාළිස්දහසක් දෙසාළිස් දහසක් නාගයෝ අවුරුදු සියයකට අවුරුදු සියයකට එක වරක් මට උපස්ථානයට එන්නාහු නම් ඉතා යෙහෙකැයි' කියායි. ඊටපසුව ආනන්දය, මහා සුදර්ශන රජතෙම පරිනායක රත්නයට ආමන්ත්‍රණය කොට 'මිත්‍රවූ පරිනායක රත්නය, මට මේ සුවාසූදහසක් නාගයෝ උදය සවස උපස්ථානය පිණිස එන්නාහ. එසේහෙයින් මිත්‍රවූ පරිනායක රත්නය, සියක් අවුරුදු සියක් අවුරුදු ඇවෑමෙන් වෙන් වෙන්ව දෙසාලිස් දහසක් දෙසාලිස් දහසක් නාගයෝ උපස්ථානයට එත්වායි'කීය. ආනන්දය, පරිනායක රත්නය 'එසේය දේවයන් වහන්සැයි' මහාසුදර්ශන රජහට පිළිතුරු දුන්නේය. ආනන්දය, ඊටපසුව මහාසුදර්ශන රජුට එයින් මෑතභාගයෙහි සියක් අවුරුද්දක් ඇවෑමෙන් වරක් දෙසාළිස් දහසක් දෙසාළිස් දහසක් නාගයෝ උපස්ථානයට ආවාහුය.

7 "ඊටපසුව ආනන්දය, සුභද්‍රාදේවියට බොහෝ වර්ෂයන්ගේද බොහෝ දහස් වර්ෂයන්ගේද ඇවෑමෙන් මෙසේ සිතිවිල්ලක් ඇතිවිය. 'මා විසින් මහා සුදර්ශන රජ දැක බොහෝ කාලයක් ගතවිය. එහෙයින් මම මහාසුදර්ශන රජ්ජුරුවන් දක්නා පිණිස යන්නෙම් නම් ඉතා යහපතැයි' කියායි. එවිට, ආනන්දය, සුභද්‍රා දේවිය අන්තඃපුර ස්ත්‍රීන්ට ආමන්ත්‍රණයකර 'තොපි මෙහෙ එව්, ස්නානය කරව්, රන්වන් වස්ත්‍ර අඳිව්. අපගේ මහා සුදර්ශන රජතෙම බොහෝ කලකින් නොදක්නා ලද්දේය. මහා සුදර්ශන රජ්ජුරුවන් දක්නා පිණිස යන්නෙමුයයි' කීවාය. ආනන්දය, එසේය ආර්‍ය්‍යාවෙනි, කියා ඒ ස්ත්‍රීහු සුභද්‍රා දේවියට පිළිතුරුදී ස්නානය කොට රන්වන්වූ වස්ත්‍ර ඇඳගෙන සුභද්‍රා දේවී වෙත ගියහ. එවිට ආනන්දය, සුභද්‍රා දේවී තොමෝ පරිනායක රත්නයට ආමන්ත්‍රණය කළාය. 'යහලු පරිනායක රත්නය, සිව්රඟ සෙනග පිළියෙල කරව. අපගේ මහාසුදර්ශන රජ දැක බොහෝ කල් ගතවිය. මහා සුදර්ශන රජුන් දක්නා පිණිස යම්හයි' කීවාය.

'එසේය, දේවීනි' කියා 'ආනන්දය, පරිනායක රත්නය සුභද්‍රා දේවියට පිළිතුරුදී සිව්රඟ සෙනග පිළියෙල කරවා සුභද්‍රා දේවියට කල් දැන්නුවේය. 'දේවීන්වහන්ස, සිව්රඟ සෙනග පිළියෙල කරන ලද්දේය. දැන් ඊට කල් දැනගනු මැනවයි' දැන්වීය.

8 "එකල්හි, ආනන්දය, සුභද්‍රා දේවිය සිව්රඟ සෙනගද අන්තඃපුර ස්ත්‍රීන්ද සමග ධර්මප්‍රසාදය යම් තැනකද එතැනට එළඹියේය. එළඹ, ධර්මප්‍රාසාදයට නැඟී මහාවියූහ කූටාගාරය යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, මහාවියූහ කූටාගාරයාගේ දොරබාව අල්වාගෙන සිටියාය. ඉක්බිති, ආනන්දය, මහා සුදර්ශන රජතෙම ශබ්දය ඇසී කිමෙක්ද? මේ මහත් සේනාවක්හුගේ ශබ්දයෙක් මෙනැයි සිතා මහාවියූහ කූටාගාරයෙන් නික්මුනේ, දොරබාව අල්වාගෙන සිටි සුභද්‍රා දේවිය දුටුවේය. දැක, සුභද්‍රා දේවියට මෙසේ කීයේය. 'එම්බා දේවිය, මෙතැන්හිම සිටුව, කූටාගාරයට ඇතුල් නොවෙවයි' කීයේය.

9 ඉක්බිති මහා සුදර්ශන රජතෙම එක්තරා පුරුෂයෙකුට කථා කෙළේය. "පින්වත් පුරුෂය, තෝ මෙහි එව, මහාවියූහ කූටාගාරයෙන් රත්රන් පර්යංකයක් නිකුත් කොට සියල්ලම රත්රනින් නිමියාවූ තල් වනයෙහි පනවවයි' කීයේය. ආනන්දය, "එසේය, දේවයන් වහන්සැ'යි කියා ඒ පුරුෂතෙම මහා සුදර්ශන රජහට උත්තරදී මහාවියූහ කූටාගාරයෙන් රත්රන් ආසනයක් නිකුත්කොට සියල්ල රත්රනින් නිමියාවූ තල් වනයෙහි පැනවූයේය. ආනන්දය, ඊටපසුව මහාසුදර්ශන රජතෙම පාදයක් උඩ පාදය තබා සිහි නුවණින් යුක්තව දකුණැලයෙන් සිංහසෙය්‍යාව (සිංහයෙක් මෙන් හාන්සිවීම) කෙළේය.

10 ආනන්දය, අනතුරුව සුභද්‍රාදේවියට මෙබඳුවූ අදහසක් ඇතිවිය. 'මහා සුදර්ශන රජහුගේ ඉන්ද්‍රියයෝ ඉතා ප්‍රසන්නයහ. ශරීර වර්ණය පිරිසිදුය. විශෙෂයෙන් බබලන්නේය. මහා සුදර්ශන රජතෙම කාලක්‍රියා නොකෙරේවායි' සිතා මහා සුදර්ශන රජහට මෙසේ කීවාය. 'දේවයන් වහන්ස, නුඹවහන්සේගේ කුසාවතී රාජධානිය ප්‍රධාන කොට ඇති මේ සුවාසූ දහසක් නගරයෝ

වෙත්. දේවයන්වහන්ස, මෙහි ආසාව උපදවනු මැනව. ජීවිතයෙහි බලාපොරොත්තුව ඇතිකරනු මැනව. දේවයන් වහන්ස, නුඹවහන්සේගේ ධර්මප්‍රාසාදය ප්‍රධානකොට ඇති මේ සුවාසූ දහසක් ප්‍රාසාදයෝ වෙත්. දේවයන් වහන්ස, මෙහි ආසාව උපදවනු මැනව. ජීවිතයෙහි කැමැත්ත ඇතිකරනු මැනව, දේවයන් වහන්ස, නුඹවහන්සේගේ මහාවියූහ කූටාගාරය ප්‍රධාන කොට ඇති මේ සුවාසූ දහසක් කූටාගාරයෝ වෙත්. දේවයන් වහන්ස, මෙහි ආසාව උපදවනු මැනව, ජීවිතයෙහි කැමැත්ත ඇති කරනු මැනව.

"දේවයන් වහන්ස, නුඹවහන්සේගේ රත්රනින් කළාවූද රිදියෙන් කළාවූද ඇත් දළින් කළාවූද දැවහරයෙන් කළාවූද එලුලොම්වලින් කළ ඇතිරියෙන් යුක්තවූද ඝන මල් ඇතිරියෙන් යුක්තවූද රන් වැඩ දැමූ ඇතිරියෙන් යුක්තවූද කෙසෙල් මුව (මුවන්වර්ගයක්) සමින්කළ ඇතිරියෙන් යුක්තවූද මතුයෙහි බඳනාලද රන්වියන් සහිතවූද ඉස්දොර හා පාමුල තබනලද රතු කොට්ට සහිතවූද සුවාසූදහසක් පර්යංක වෙති. දේවයන් වහන්ස, මෙහි ආසාව උපදවනු මැනවි. ජීවිතයෙහි කැමැත්ත ඇතිකරනු මැනවි. රත්රන් ආභරණයෙන් සරසනලද කොඩි එල්වනලද රන් දැලින් වසනලද උපොසථ ඇත් රාජයා ප්‍රධානකොට ඇති සුවාසූ දහසක් ඇත්තු ඇත්තාහ. දේවයන් වහන්ස, මෙහි ආසාව උපදවනු මැනවි. ජීවිතයෙහි කැමැත්ත උපදවනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේගේ රනින් සරසන ලද රන් කොඩි එල්වනලද රන් දැලින් වසනලද වළාහක අශ්ව රාජයා ප්‍රධානකොට ඇති මේ අසූහාර දාහක් අශ්වයෝ වෙත්. දේවයන් වහන්ස, මෙහි ආසාව උපදවනු මැනව. ජීවිතයෙහි කැමැත්ත ඇති කරනු මැනව. දේවයන් වහන්ස, නුඹවහන්සේට සිංහ සමින් වටකරන ලද්දාවූද, ව්‍යාඝ්‍ර සමින් වටකරන ලද්දාවූද දිවි සමින් වටකරන ලද්දාවූද රත් කම්බලයෙන් වටකරන ලද්දාවූද රත්රන් අලංකාර ඇත්තාවූද රත්රන් ධජ ඇත්තාවූද රුවන් දැලෙන් වසන ලද්දාවූද වෛජයන්ත රථය ප්‍රධානකොට ඇති අසූහාර දහසක් රථ වෙත්. දේවයන් වහන්ස, මෙහි ආසාව උපදවනු මැනව. ජීවිතයෙහි බලාපොරොත්තුව ඇතිකරනු මැනවි. දේවයන්වහන්ස, නුඹවහන්සේගේ මාණිකා

රත්නය ප්‍රධාන කොට ඇති අසූහාරදාහක් මාණික්‍යයෝ වෙත්. මෙහි ආසාව උපදවනු මැනවි. ජීවිතයෙහි බලාරොත්තුව ඇති කරනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේගේ ස්ත්‍රී රත්නය ප්‍රධානකොට ඇති අසූහාර දාහක් ස්ත්‍රීහු වෙත්. දේවයන් වහන්ස, මෙහි ආසාව උපදවනු මැනවි. ජීවිතයෙහි බලාපොරොත්තු ඇතිකරගනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේගේ ගෘහපති රත්නය ප්‍රධාන කොට ඇති මේ අසූහාර දහසක් ගෘහපතීහු වෙත්. මෙහි ආසාව උපදවනු මැනවි ජීවිතයෙහි බලාපොරොත්තු ඇතිකරනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේගේ පරිනායක රත්නය ප්‍රධාන කොට ඇති අනුව යන්නාවූ අසූහාර දහසක් ක්ෂත්‍රියයෝ වෙත්. දේවයන් වහන්ස, මෙහි ආශාව උපදවනු මැනවි. ජීවිතයෙහි බලාපොරොත්තුව ඇතිකරගනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේගේ එල්ලෙන කිරිබුරුළු ඇත්තාවූ රත්රන් ආභරණයන් දරණ මේ අසූහාර දහසක් කිරිදෙන්නු වෙත්. දේවයන් වහන්ස, මෙහි ආසාව උපදවනු මැනවි. ජීවිතයෙහි බලාපොරොත්තු වෙනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේගේ සියුම්වූ කොමු පිළිද, සියුම්වූ කපු පිළිද, සියුම්වූ කොසෙය්‍ය වස්ත්‍රද, සියුම්වූ කම්බල වස්ත්‍රද යන මෙයින් යුක්තවූ වස්ත්‍ර කෝටි අසූහාරදහසක් වෙත්. දේවයන්වහන්ස, මෙහි ආසාව උපදවනු මැනවි. ජීවිතයෙහි බලාපොරොත්තු ඇතිකරගනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේගේ උදය සවස අනුභවය පිණිස එළවන ලද මේ අසූහාර දහසක් බත් තලි වෙත්. දේවයන් වහන්ස, මෙහි ආශාව උපදවනු මැනවි. ජීවිතයෙහි බලාපොරොත්තු ඇති කරනු මැනවැයි' කීවාය.

11 "ආනන්දය, මෙසේ කීකල මහා සුදර්ශන රජ තෙම සුභද්‍රා දේවියට මේ කාරණය කීයේය. 'දේවියනි, තී බොහෝ කලක් මට යහපත්වූ කැමති වන්නාවූ ප්‍රියවූ මන වඩන්නාවූ වචන වලින් කථා කෙළෙහිය. එසේ නමුත් දැන් මට මේ අන්තිම කාලයෙහි අනිෂ්ටවූ අකැමැතිවූ අප්‍රියවූ අමනාපවූ වචන වලින් කථා කෙරෙහිය. 'දේවයන් වහන්ස. දැන් නුඹවහන්සේට කෙසේ කථා කරම්දැයි' ඇසුවාය. 'දේවියනි, මෙසේ මට කථා කරව. දේවයන් වහන්ස, ප්‍රියවූ මනවඩන්නාවූ සියල්ලෙන්ම වෙන්වීම ස්වභාවකොට ඇත්තේය. තොරවන බව ස්වභාවකොට

ඇත්තේය. අන්‍ය තත්වයට පැමිණීම ස්වභාවකොට ඇත්තේය. දේවයන්වහන්ස, නුඹවහන්සේ ආසාවක් නැතුව කාලක්‍රියා කරනු මැනවි. ආසාවක් ඇත්තහුගේ කාලක්‍රියාව දුක් වන්නීය. ආසා ඇත්තහුගේ කාලක්‍රියාව නින්දා කටයුතුමය. ii දේවයන් වහන්ස, නුඹවහන්සේගේ කුසාවතී රාජධානිය ප්‍රධාන කොට ඇති මේ අසූහාර දහසක් නගරයෝ වෙත්. දේවයන් වහන්ස, මෙහි ආසාව අත්හරිනු මැනව. ජීවිතය පිළිබඳ බලාපොරොත්තු අත්හරිනු මැනව. දේවයන් වහන්ස නුඹවහන්සේගේ මහාවියූහ කූටාගාරය ප්‍රධානකොට ඇති අසූහාර දහසක් කූටාගාරයෝ වෙත්. දේවයන් වහන්ස, මෙහි ආසාව අත්හරිනු මැනවි. ජීවිතයෙහි බලාපොරොත්තුව අත් හරිනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේගේ රත්රන් වූද, රිදීවූද, දන්තමයවූද, සාරමයවූද, එක් පිට හා දෙපිට ලොම් ඇති එලුලොමින් කළ ඇතිරියෙන් යුක්තවූද, කෙසෙල් මුව සමින් කළ ඇතිරියෙන් යුක්තවූද, මත්තෙහි බඳනාලද රන් වියන් සහිතවූද ඉස්දොර හා පාමුල තබනලද රතුකොට්ට සහිතවූද, අසූහාරදහසක් ආසන වෙත්. දේවයන් වහන්සේ මේවා පිළිබඳව ආසා නොකළ මැනව. ජීවිතයෙහි බලාපොරොත්තුව අත්හරිනු මැනව. දේවයන් වහන්ස, රත්රන් ආභරණ ඇති රත්රන් ධජ ඇති රත්රන් දැලින් වසනලද උපොසථ ඇත්රජ ප්‍රධානකොටඇති මේ අසූහාරදාහක් ඇත්තු වෙත්. මෙහි ආසාව නොකල මැනවි. ජීවිතයෙහි බලාපොරොත්තුව අත්හරිනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේට රත්රන් අලංකාර ඇති රත්රන් ධජ ඇති රන්දැලින් වසනලද වළාහක අශ්ව රාජයා ප්‍රධාන කොට ඇති මේ අසූහාරදාහක් අශ්වයෝ වෙති. මෙහි ආසාවද ජීවිතයෙහි බලාපොරොත්තුවද අත්හරිනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේට සිංහ සමින් වසන ලද්දාවූද, ව්‍යාඝ්‍ර සමින් වසන ලද්දාවූද, දිවිසමින් වසන ලද්දාවූද රත් කම්බිලි වස්ත්‍රයෙන් වසන ලද්දාවූද, රත්රන් අලංකාර ඇත්තාවූ, රත්රන් ධජ ඇත්තාවූද, රන් දැලින් වසන ලද්දාවූ වෛජයන්ත රථය ප්‍රධාන කොට ඇති මේ අසූහාරදාහක් රථයෝ වෙත්. දේවයන් වහන්ස, මෙහි කැමැත්ත අත්හරිනු මැනවි. ජීවිතය පිළිබඳ කැමැත්ත අත්හරිනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේට මේ

මාණික්‍ය රත්නය ප්‍රධානකොට ඇති අසූහාරදාහක් මාණික්‍යයෝ වෙත්. දේවයන් වහන්ස, මෙහි ආසාව දුරුලනු මැනවි. ජීවිතයෙහි බලාපොරාත්තුව අත්හරිනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේට සුභද්‍රා දේවිය ප්‍රධාන කොට අසූහාර දාහක් ස්ත්‍රීහු වෙත්. මෙහි ආසාව දුරලනු මැනවි. ජීවිතයෙහි බලාපොරොත්තුව අත්හරිනු මැනව. දේවයන් වහන්ස, නුඹ වහන්සේට ගෘහපති රත්නය ප්‍රධාන කොට ඇති මේ අසූහාර දහසක් ගෘහපතීහු වෙත්. දේවයන් වහන්ස මෙහි ආසාව අත්හරිනු මැනවි. ජීවිතයෙහි බලාපොරොත්තුව දුරලනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේට අනුව යන්නාවූ පරිනායක රත්නය ප්‍රධානකොට ඇති මේ අසූහාරදාහක් ක්ෂත්‍රියයෝ වෙති. දේවයන් වහන්ස, මෙහි ආසාව දුරලනු මැනවි. ජීවිතය පිළිබඳ බලාපොරොත්තුව අත්හරිනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේට දුහුලින් අතුරනලද රනින් කළ සැට්ට පොරවන ලද මේ අසූහාර දහසක් කිරි දෙන්නු වෙති. මෙහි ආසාව අත්හරිනු මැනවි. ජීවිතයෙහි බලාපොරොත්තුව අත්හරිනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේට සියුම් කොමු පිළිද, කපු පිළිද, කොසෙය්‍ය වස්ත්‍රද යන මේ වස්ත්‍ර කෝටි අසූහාර දහසක් වෙත්. දේවයන් වහන්ස, මේ පිළිබඳව ආසාව දුරුකරනු මැනවි. ජීවිතය පිළිබඳ බලාපොරොත්තුව දුරුකරනු මැනවි. දේවයන් වහන්ස, නුඹ වහන්සේට උදය සවස ආහාර පිණිස මේ අසූහාර දහසක් බත් තලි වෙත්. දේවයන් වහන්ස, මෙහි ආසාව දුරුකරණු මැනවි. ජීවිතයෙහි බලාපොරොත්තුව දුරුකරණු මැනවැයි' කියායි.

12 "ආනන්දය, (රජු) මෙසේ කී කල්හි සුභද්‍රාදේවී හැඬුවාය, ඇසින් කඳුලු හෙලුවාය. ඊටපසුව ආනන්දය, සුභද්‍රා දේවී තොමෝ කඳුලු පිසදමා, මහා සුදර්ශන රජහට මෙසේ කීවාය. 'දේවයන් වහන්ස, ප්‍රියවූ මනාපවූ සියල්ලන්ගේ නානා භාවය වන්නේය. වෙන් වන්නාවූ ස්වභාවය ඇත්තේය. අන්‍ය ගතියකට යන ස්වභාව ඇත්තේය. දේවයන් වහන්ස, නුඹවහන්සේ ආසාවක් නැතුවම කාලක්‍රියා කළ මැනව. ආසාව ඇත්තහුගේ කාලක්‍රියාව දුක්වන්නේය. නින්දා වන්නේය. දේවයන් වහන්ස, නුඹවහන්සේගේ කුසාවතී රාජධානිය ප්‍රධාන කොට මේ සුවාසූ

දහසක් නගර වෙත්ද, දේවයන් වහන්ස, මෙහි ආසාව දුරුකරනු මැනව. ජීවිතයෙහි බලාපොරොත්තුව අත්හරිනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේට ධර්මප්‍රාසාදය ප්‍රධාන කොට ඇති අසූහාර දහසක් ප්‍රාසාදයෝ වෙත්. දේවයන්වහන්ස, මෙහි ආසාව දුරලනු මැනවි. ජීවිතය පිළිබඳව බලාපොරොත්තුව අත්හරිනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේට මහාවියූහ කූටාගාරය ප්‍රධාන කොට ඇති මේ අසූහාර දහසක් කූටාගාර වෙත්. දේවයන් වහන්ස, මෙහි ආසාව දුරලනු මැනවි. ජීවිතය ගැන බලාපොරොත්තුව අත්හරිනු මැනවි. දේවයන් වහන්ස, නුඹ වහන්සේට රත්රන්වූද, රිදීවූද, ඇත් දළමයවූද, සාරමයවූද, එලුලොම් අතුරණ ලද්දාවූද සුදු එලුලොම් අතුරණ ලද්දාවූද, කෙසෙල් මුව සමින් කළ ඇතිරියෙන් යුක්තවූද, මත්තෙහි බඳනලද රන්වියන් සහිතවූද අසූහාර දහසක් ආසන වෙත්. දේවයන්වහන්ස, මෙහි ආසාව දුරලනු මැනවි. ජීවිතයෙහි බලාපොරොත්තුව දුරලනු මැනවි දේවයන් වහන්ස, රත්රන් ආභරණ ඇති රත්රන් ධජ ඇත්තාවූ රත්රන් දැලෙන් වසනලද උපොසථ ඇත්රාජයා ප්‍රධානකොට ඇති මේ අසූහාර දහසක් ඇත්තු වෙත්. දේවයන් වහන්ස, මෙහි ආසාව අත්හරිනු මැනව. ජීවිතය ගැන බලාපොරොත්තුව අත්හරිනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේට රත්රන් ආභරණ ඇති රන් දැලින් වසනලද රත්රන් ධජ ඇති වළාහක අශ්ව රාජයා ප්‍රධානකොට ඇති මේ අසූහාර දහසක් අශ්වයෝ වෙත්. දේවයන් වහන්ස, මේ පිළිබඳව ආසාව දුරුකරනු මැනවි. ජීවිතයෙහි බලාපොරොත්තුව අත්හරිනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේට සිංහසමින් වසනලද්දාවූද ව්‍යාඝ්‍රසමින් වසන ලද්දාවූද, දිවිසමින් වසනලද්දාවූද රත් කම්බල වස්ත්‍රයෙන් වසනලද්දාවූද. රත්රන් අලංකාර ඇත්තාවූ රත්රන් ධජ ඇත්තාවූ රන් දැලින් වසන ලද්දාවූ වෛජයන්ත රථය ප්‍රධානකොට ඇති මේ අසූහාර දහසක් රථයෝ වෙත්. දේවයන් වහන්ස, නුඹවහන්සේ මෙහි ආසාව නැතිකරනු මැනවි. ජීවිතයෙහි ආසාව දුරලනු මැනවි. දේවයන්වහන්ස, නුඹවහන්සේට මාණික්‍ය රත්නය ප්‍රධාන කොට ඇති අසූහාර දහසක් මාණික්‍යයෝ වෙත්. දේවයන් වහන්ස, මෙහි ආසාව අත් හරිනු මැනවි. ජීවිතයෙහි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ආසාව අත්හරිනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේට ස්ත්‍රී රත්නය ප්‍රධාන කොට ඇති මේ ස්ත්‍රීහු අසූහාර දහසක් වෙත්. දේවයන් වහන්ස, මෙහි ආසාව දුරුකරනු මැනවි. ජීවිතය පිළිබඳව බලාපොරොත්තුව අස්කර ගනු මැනවි. දේවයන්වහන්ස, නුඹවහන්සේට ගෘහපති රත්නය ප්‍රධාන කොට ඇති මේ අසූහාරදහසක් ගෘහපතීහු වෙත්. මෙහි ආසාව හරිනු මැනවි. ජීවිතයෙහි ආසාව නොකරනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේට අනුව යන්නාවූ පරිනායක රත්නය ප්‍රධාන කොට ඇති මේ අසූහාර දහසක් ක්ෂත්‍රියයෝ වෙත්. මෙහි ආසාව හරිනු මැනවි. ජීවිතයට ආසාව නොකරනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේට එල්බෙන කිරිබුරුළු ඇත්තාවූ රත්රන් සැට්ට පොරවනලද මේ අසූහාරදහසක් කිරිදෙන්නු වෙත්. දේවයන් වහන්ස, මෙහි ආසාව හරිනු මැනවි. ජීවිතයට ආසාව නොකරනු මැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේට සියුම් කොමු පිළිද සියුම් කපු පිළිද සියුම් කොසෙය්‍ය වස්ත්‍රද, යන මේ වස්ත්‍ර කෝටි අසූහාරදහසක් වෙත්. දේවයන්වහන්ස මෙහි ආසාව හරිනු මැනවි. ජීවිතයට ආසාව නොකරනුමැනවි. දේවයන් වහන්ස, නුඹවහන්සේට උදය සවස ආහාර පිණිස එළවන අසූහාරදහසක් බත් තලි වෙත්. දේවයන් වහන්ස, මෙහි ආසාව හරිනු මැනවි. ජීවිතයෙහි බලාපොරොත්තුව නොකරනු මැනවැයි' කීවාය.

13 "එවිට ආනන්දය, මහාසුදර්ශන රජතෙම නොබෝ වේලාවකින්ම කාලක්‍රියා කළේය. ආනන්දය. යම්සේ මිහිරිවූ ආහාරයක් අනුභව කළාවූ ගෘහපතියෙකුට හෝ ගෘහපති පුත්‍රයෙකුට හෝ බත් මතය ඇතිවේද, එපරිද්දෙන්ම ආනන්දය, මහාසුදර්ශන රජහට මරණාන්තික වේදනාව ස්වල්පවිය. ආනන්දය, කාලක්‍රියාකළාවූ මහාසුදර්ශන රජතෙම මනා ගති ඇතිහෙයින් සුගති නම්වූ බ්‍රහ්මලොකයෙහි උපන්නේය. ආනන්දය, මහාසුදර්ශන රජතෙම අසූහාරදහසක් අවුරුදු කුමාර ක්‍රීඩා කෙළේය. අසූහාරදහසක් අවුරුදු යුවරජකම් කළේය. අසූහාරදහසක් අවුරුදු රජකම් කෙළේය. අසූහාර දහසක් අවුරුදු ගිහිව සිටියේම ධර්මප්‍රාසාදයෙහි බ්‍රහ්මචය්‍ර්‍යාව කෙළේය. ඒ

රජතෙම සතර බ්‍රහ්ම විහරණ ධර්මයන් වඩා ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු බඹලොව උපන්නේය.

14 "ආනන්දය, ඒ කාලයෙහිදී ඒකාන්තයෙන් වෙන කෙනෙක් මහාසුදර්ශන රජවීයයි තොපට මෙබඳු සිතක් වන්නේද? ආනන්දය, ඒ කාරණය එසේ නොදත යුතුය, මම ඒ කාලයේදී මහාසුදර්ශන රජවීමියි වදාළසේක. මා සම්බන්ධව කුසාවතී රාජධානිය ප්‍රධාන කොට ඇති අසූහාර දහසක් නගරද, ධර්මප්‍රාසාදය ප්‍රධානකොට ඇති අසූහාරදහසක් ප්‍රාසාදයෝද, මහාව්‍යුහ කූටාගාරය ප්‍රධානකොට ඇති අසූහාර දහසක් කූටාගාරද, ස්වර්ණමයවූද රිදීමයවූද දන්තමයවූද සාරමයවූද එක් පිට හා දෙපිට ලොම් ඇති එලුලොම් මුවා ඇතිරිද, රන් වැඩකළ දික්දහවලු ඇතිරිද, කෙසෙල් මුවසමින් කළ ඇතිරියෙන්ද මතුයෙහි බඳනාලද රත් වියන් සහිතවූ අසූහාරදහසක් ආසනද රත්රනින් අලංකාරවූ රත්රන් ධජ ඇත්තාවූ රත්රන් දැලෙන් වසනලද උපොසථ ඇත්රජ ප්‍රධාන කොට ඇති අසූහාර දහසක් ඇත්තුද, රත්රන් අලංකාර ඇත් රත්රන් ධජ ඇති රන් දැලින් වසනලද වළාහක අශ්ව රාජයා ප්‍රධානකොට ඇති අසූහාර දහසක් අශ්වයෝද, සිංහ සමින් වෙළන ලද්දාවූද ව්‍යාඝ්‍ර සමින් වෙළන ලද්දාවූද, දිවිසමින් වසන ලද්දාවූද රත් කම්බල වස්ත්‍රයෙන් වසනලද්දාවූද අසූහාර දහසක් රථද, මාණික්‍ය රත්නය ප්‍රධානකොට ඇති අසූහාරදාහක් මාණික්‍යද, සුභද්‍රාදේවී ප්‍රධාන අසූහාරදහසක් ස්ත්‍රීහුද, ගෘහපති රත්නය ප්‍රධාන අසූ හාරදහසක් ගෘහපතීහුද, පරිනායක රත්නය ප්‍රධාන අනුව හැසිරෙන්නාවූ අසූහාරදහසක් ක්ෂත්‍රියයෝද, එල්බෙන කිරි බුරුළු ඇත්තාවූ රත්රන් සැට්ට දරන්නාවූ අසූහාරදහසක් ගවදෙන්නුද වූහ. සියුම්වූ කොමු පිළිද, සියුම්වූ කපු පිළිද, කොසෙය්‍ය පිළිද යන මේ වස්ත්‍ර කෝටි අසූහාරදහසක්ද සවස උදය ආහාර පිණිස එළවනලද සූවාසුදහසක් බත් තලිද මා සම්බන්ධ වූවාහුමය.

15 "ආනන්දය, ඒ අසූහාර දහසක් නගර අතුරෙන් යම් කුසාවතී රාජධානියෙක්වීද එසමයෙහි ඒ එකම කුසාවතී නුවර වාසයකෙළෙමි. ආනන්දය, ඒ අසූහාරදහසක්ප්‍රාසාදයන් අතුරෙන්

යම් ඒ ධර්මප්‍රාසාදයක් වූයේද ඒ එකම ධර්ම ප්‍රාසාදයෙහි වාසය කෙළෙමි. ආනන්දය, ඒ අසූහාරදහසක් කූටාගාරයන් අතුරෙන් යම් ඒ 'මහාව්‍යූහ' නම් කූටාගාරයෙක් වූයේද එසමයෙහි ඒ එකම මහාවියූහ නම් කූටාගාරයෙහි වාසය කෙළෙමි. ආනන්දය, ඒ සුවාසූදහසක් ආසන අතුරෙන් යම් ඒ රත්රන්වූ හෝ රිදීවූ හෝ දන්තමයවූ හෝ සාරමයවූ හෝ ආසනයක් වූයේද, ඒ එකම ආසනයක හිඳගත්තෙමි. ආනන්දය, ඒ අසූහාරදහසක් ඇතුන් අතුරෙන් යම් උපොසථ හස්ති රාජයෙක් වීද, එසමයෙහි ඔහුම වාහණයකොට ගත් තෙමි. ආනන්දය, ඒ අසූහාරදහසක් අශ්වයන් අතුරෙන් යම් ඒ වළාහක අශ්වරාජයෙක් වූයේද එසමයෙහි ඔහුම වාහණයකොට ගත්තෙමි. ආනන්දය, ඒ අසූහාරදහසක් රථයන් අතුරෙන් යම් ඒ වෛජයන්ත නම් රථයක් වූයේද එසමයෙහි ඒ රථයම වාහණයකොට ගත්තෙමි. ආනන්දය, ඒ අසූහාර දහසක් ස්ත්‍රීන් අතුරෙන් ක්ෂත්‍රියවූ හෝ වෛශ්‍යාවූ හෝ යම් එකම ස්ත්‍රියක් මට උපස්ථායිනීව සිටියාය. ආනන්දය, සියුම් කොමු පිළිවූ හෝ සියුම් කපු පිළිවූ හෝ සියුම් කෝසෙය්‍ය වස්ත්‍රවූ හෝ සියුම් කම්බල වස්ත්‍රවූ හෝ යම් ඒ වස්ත්‍ර කෝටි අසූහාරදහසක් වූයේද එයින් වස්ත්‍ර දෙකක් පමණක් හැන්දෙමි. ආනන්දය, ඒ අසූහාරදහසක් බත් තලි අතුරෙන් යම් ඒ එක් බත් තලියක් වේද එයින් නැළියක් පමණ බත් ඊට ප්‍රමාණ සූපව්‍යඤ්ජන සහිතව අනුභව කෙළෙමි.

16 "ආනන්දය, සංස්කාරයන්ගේ අනිත්‍යතාව බලව, සියලුම ඒ සංස්කාර ධර්මයෝ ඉකුත්වූහ. නිරුද්ධවූහ, විනාශ වූහ. ආනන්දය, මෙසේ සංස්කාරයෝ අනිත්‍ය වන්නාහුය. ආනන්දය, සංස්කාරයෝ මෙසේ අස්ථිර වන්නාහුය. ආනන්දය, සංස්කාරයෝ මෙසේ අස්වැසීමක් නැත්තාහුමය. ආනන්දය, යම් මේ සියලු සංස්කාර ධර්මයන් කෙරෙහි කලකිරෙන්ට සුදුසු වන්නේය. නොඇලෙන්නට සුදුසු වන්නේමය. මිදෙන්ට සුදුසු වන්නේමය.

17 ආනන්දය, මම වනාහි මේ ප්‍රදෙශයෙහි හය වාරයක්ම ශරීර නික්ෂෙපය (ශරීරය දැමීම) කළ බව දනිමි. ඒ වනාහි ධාර්මිකවූ ධර්මරාජන්වූ චක්‍රවාළය කෙළවරකොට ඇති සතර

මහාද්වීපය ජයගත්තාවූ ජනපදයන්හි ස්ථිර භාවයට පැමිණියාවූ සප්තවිධ රත්නයෙන් යුක්තවූ සක්විති රජ කාලයන්හිමය. මේ සත්වෙනි සරීර නික්ෂෙපය (ශරීරය දැමීම) වන්නේය. ආනන්දය, දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ ලෝකයෙහි යම් තැනෙක්හි තථාගත තෙම අටවැනිවර ශරීර නික්ෂෙපය කරන්නේද එබඳුවූ ප්‍රදෙශයක් මම නොදක්නෙමියි වදාළසේක. භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය මෙසේ වදාරා එයින් මත්තෙහි සුගත නම්වූ ශාස්තෘන් වහන්සේ මෙසේද වදාළසේක.

"ඉපිද නැසෙන සුලුවූ සංස්කාර ධර්මයෝ ඒකාන්තයෙන් අනිත්‍යයහ. ඉපිද නැති වෙත්. ඔවුන්ගේ සංසිඳීම සැප වන්නේය" යනුයි.

(දහහත්වෙනි මහාසුදර්ශන සූත්‍රය නිමියේය.)

---

## 18. ජනවසභ සූත්‍රය

1 මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ නාදික නම් ගමෙහි ගිංජකාවසථ නම් විහාරයෙහි වසන සේක. එකල භාග්‍යවතුන් වහන්සේ නාදික ගම අවට අවට ජනපදයන්හි සමීප අතීත කාලයෙහි මැරුණාවූ උපාසකයන් පිළිබඳ උත්පත්ති ප්‍රකාශ කරන සේක. (කවර නම් අවට දනව්ද යත්) කාසි කොසල ජනපදද, වජ්ජි මල්ල ජනපදද, චෙතිය වංස ජනපදද, කුරු පංචාල ජනපදද, මච්ඡසූරසේන ජනපදද, වෙත්. අසවල් තැනැත්තා අසවල් තැන උපන්නේය. අසවල් තැනැත්තා අසවල් තැන උපන්නේය යනුවෙනි. සමීප අතීත කාලයෙහි මැරුණාවූ නාදික ගමෙහි විසූ ඔරම්භාගිය සංයෝජන (යට කාම ලෝකයෙහි බඳින බන්ධන) පස ක්ෂය කිරීමෙන් ඖපපාතිකවූ බඹලොව පිරිනිවන් පාන ස්වභාව ඇත්තාවූ ඒ ලෝකයෙන් නැවත එන ස්වභාව නැත්තාවූ උපාසකවරු පණසකට වැඩි වෙත්. ළඟ අතීත කාලයෙහි මැරුණ සංයෝජන (කෙලෙස් රැහැන්) තුනක් නැති කිරීමෙන් රාග ද්වෙෂ මෝහයන් තුනීකිරීම හේතු කොටගෙන සකෘදාගාමී වූවාහු මේ මිනිස් ලොවට එක් වරක් පමණක් අවුත් දුක් කෙළවර කරන්නාවූ

නාදික ගම විසූ උපාසකවරු අනූවකට වැඩි වෙත්. ළඟ ඉකුත් කාලයේ මැරුණාවූ නාදික ගම් වැසි සංයෝජන (කෙලෙස් රැහැන්) තුනක් නැති කිරීමෙන් සෝවාන් ඵලයට පැමිණියාවූ (සතර) අපායට නොවැටෙන ස්වභාව ඇත්තාවූ අර්හත් ඵලයට නියතවූ උපාසකයෝ පන්සියයකට වැඩි වෙත්.

2 නාදික ගම් වැසි උපාසකයෝ මේ කාරණය ඇසුවාහුය. 'භාග්‍යවතුන් වහන්සේ හාත්පස හාත්පස ජනපදවල ළඟ ඉකුත් කාලයේ මැරුණාවූ උපාසකයන්ගේ උත්පත්ති වදාරණ සේක. (කවර දනව්හිද යත්) කාසි කොසල දනව්හිද, වජ්ජ මල්ල දනව්හිද, චෙතිය වංස දනව්හිද, මච්ඡ සූරසේන දනව්හිද වෙත්. අසවල් තැනැත්තා අසවල් තැන උපන්නේය. අසවල් තැනැත්තා අසවල් තැන උපන්නේය යනුවෙනි. ළඟ ඉකුත් කාලයෙහි මැරුණාවූ නාදික ගම් වැසි ඔරම්භාගිය සංයෝජන (යට කාම ලෝකයෙහි බන්ධන) පහ නැතිකිරීමෙන් ඔපපාතිකවූ ඒ බ්‍රහ්ම ලොකයෙන් නොඑන ස්වභාව ඇත්තාවූ එහිදීම පිරිනිවන්පාන්නාවූ උපාසකයෝ පණහකට වැඩි වෙත්.

"ළඟ ඉකුත් කාලයෙහි මැරුණාවූ නාදික ගම් වැසි සංයෝජන තුනක් නැති කිරීමෙන්, රාග ද්වෙෂ මෝහයන් තුනිකිරීම නිසා සකෘදාගාමිවූ එක් වරක් පමණක් මේ මිනිස් ලොවට අවුත් සසර දුක් කෙළවර කරන්නාවූ උපාසකයෝ අනූවකට වැඩිවෙත්.

"ළඟ ඉකුත් කාලයෙහි මැරුණාවූ නාදික ගම් වැසි සංයෝජන තුනක් නැතිකිරීම හේතුකොට ගෙන සෝවාන් ඵලයට පැමිණියාවූ (සතර) අපායට නොවැටෙන ස්වභාව ඇත්තාවූ අර්හත් ඵලයට නියතවූ උපාසකයෝ පන්සීයකට වැඩි වෙත්." භාග්‍යවතුන් වහන්සේගේ මේ ප්‍රශ්න විසඳීම අසා නාදික නම් ගම්වැසි උපාසකයෝ සතුටු සිත් ඇත්තෝ ප්‍රමුදිත සිත් ඇත්තෝ, හටගත් ප්‍රීති සොම්නස් ඇත්තෝ වූහ.

3 ආයුෂ්මත්වූ ආනන්ද තෙරුන් වහන්සේ මේ කාරණය ඇසුයේය. "භාග්‍යවතුන් වහන්සේ නාදික ගමට හාත්පස හාත්පස ජනපදවල ළඟ ඉකුත් කාලයෙහි මැරුණාවූ උපාසකයන් පිළිබඳ උත්පත්ති ප්‍රකාශ කරන සේක. (කවර දනව්හිද යත්) කාසි

කොසල ජනපදවලද වජ්ජි මල්ල ජනපදවලද, චෙතිය වංස ජනපදවලද, කුරු පංචාල ජනපද වලද, මච්ඡ සූරසේන ජනපදවලද වෙත්. අසවල් නම් ඇත්තා අසවල් තැන උපන්නේය. අසවල් නම් ඇත්තා අසවල් තැන උපන්නේය යනුවෙනි. ළඟ ඉකුත් කාලයෙහි මැරුණ නාදික ගම්වැසි ඔරම්භාගය සංයෝජන පහ නැතිකිරීමෙන් ඔපපාතිකවූ ඒ බ්‍රහ්ම ලෝකයෙන් නොඑන ස්වභාව ඇත්තාවූ එහිදීම පිරිනිවන් පාන්නාවූ උපාසකයෝ පණහකට වැඩි වෙත්. ළඟ ඉකුත් කාලයෙහි මැරුණාවූ නාදික ගම් වැසි සංයෝජන තුනක් නැති කිරීමෙන් රාග ද්වෙෂ මෝහයන් තුනී කිරීමෙන් සකෘදාගාමිවූ (එක් වරක් පමණක් මේ මිනිස් ලොවට අවුත් සසර දුක් කෙළවර කරන්නාවූ) උපාසකයෝ අනූවකට වැඩි වෙත්.

"ළඟ ඉකුත් කාලයෙහි මැරුණාවූ නාදික නම් ගම් වැසි සංයෝජන තුනක් නැතිකිරීම හේතුකොට ගෙන සෝවාන් ඵලයට පැමිණියාවූ (සතර) අපායට නොවැටෙන ස්වභාව ඇත්තාවූ අර්හත් ඵලයට නියතවූ උපාසකයෝ පන්සීයකට වැඩි වෙත්. භාග්‍යවතුන් වහන්සේගේ මේ ප්‍රශ්න විසඳීම අසා නාදික ගම්වැසි උපාසකයෝ සතුටුසිත් ඇත්තෝ. ප්‍රීතිය හා සොම්නස ඇත්තෝ වූහ" කියායි.

4 එකල්හි ආයුෂ්මත්වූ, ආනන්ද තෙරුන් වහන්සේට මේ අදහස වූයේය. "ළඟ ඉකුත්වූ කාලයෙහි මැරුණාවූ මේ මගධ ජනපද වාසී උපාසකයෝ බොහෝ වූහ. චිර රාත්‍රි (බොහෝ දවස්) දන්නෝද වූහ. ළඟ ඉකුත්වූ කාලයෙහි කළුරිය කළාවූ මගධ ජනපද වාසී උපාසකයන්ගෙන් අඟු මගධ දෙරට වැස්සෝ නැත්තාහයි (සූන්‍යයයි) සිතමි. මේ අඟු මගධ දෙරට වැසි උපාසකයෝද බුදුන් කෙරෙහි පැහැදුනෝ ධර්මය කෙරෙහි පැහැදුනෝ වෙත්. සංඝයා කෙරෙහි පැහැදුනෝ වෙත්. සීලයන් සම්පූර්ණ කරන්නෝ වෙත්. ළඟ ඉකුත් කාලයෙහි මැරුණාවූ ඒ උපාසකයෝ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ නොකරන ලද්දාහුය. ඒ උපාසකයන් ගැනද යහපත් විසඳීමක් වන්නේ නම් බොහෝ ජනයා පැහැදෙන්නේය. ඒ හේතුවෙන් සුගතියට යන්නේය. තවද මගධ ජනපදයට අධිපතිවූ, සේනා ඇත්තාවූ.

ඒ බිම්බිසාර රජද ධාර්මික වෙයි. ධර්මයෙන් (ජනයන්) සතුටු කරන්නේ වෙයි. බ්‍රාහ්මණ ගෘහපතියන්ටද, නියම්ගම් වැස්සන්ටද, ජනපද වැස්සන්ටද, වැඩ කැමැත්තේය. තවද මනුෂ්‍යයෝ මේ කාරණය වර්ණනාකරමින් වාසය කරත්. ධාර්මිකවූ ඒ ධර්ම රාජයා අප මෙසේ සැපයට පමුණුවා කළුරිය කෙළේය. මෙසේ අපි ධාර්මිකවූ ඒ ධර්මරාජයාගේ රටෙහි පහසුවෙන් වාසය කෙළෙමු කියායි.

"ඒ රජුද බුදුන් කෙරෙහි පැහැදුනේය, ධර්මය කෙරෙහි පැහැදුනේය. සංඝයා කෙරෙහි පැහැදුනේය, සීලයන් සම්පූර්ණ කරන්නෙක් වූයේය. තවද මිනිස්සු මෙසේ කියත්. "මරණ කාලය දක්වාත් මගධ රට අධිපතිවූ සේනා ඇති බිම්බිසාර රජ භාග්‍යවතුන් වහන්සේගේ ගුණ වර්ණණා කරන්නෙක්වම මැරුණේය." ළඟ අතීතයේ මැරුණාවූ ඒ රජු ගැන භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ නොකරන ලද්දේය. ඒ රජු ගැනත් හොඳ ප්‍රකාශ කිරීමක් වන්නේ නම් බොහෝ ජනයා පැහැදෙන්නේය, ඒ හෙතුකොටගෙන සුගතියට යන්නේය. භාග්‍යවතුන් වහන්සේ බුදුවූයේ මගධයේදීය. භාග්‍යවතුන් වහන්සේගේ බුදුවීම මගධ ජනපදයෙහි වූයේද, භාග්‍යවතුන් වහන්සේ ඒ මගධ ජනපද වාසීවූ ළඟ ඉකුත් කාලයෙහි මැරුණාවූ උපාසකයන් උපන්තැන් කෙසේ නම් ප්‍රකාශ නොකරන්නේද? ඉදින් භාග්‍යවතුන් වහන්සේ ළඟ ඉකුත් කාලයෙහි මැරුණාවූ මගධ ජනපද වාසී උපාසකයන් උපන්තැන් ප්‍රකාශ නොකරන්නේ නම් ඒ නිසා මගධ ජනපද වාසී උපාසකයෝ බැගෑපත් සිත් ඇත්තෝ වන්නාහ. යමක් හෙතුකොටගෙන මගධ ජනපද වාසී උපාසකයෝ බැගෑපත් සිත් ඇත්තෝ වෙත්ද, භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය කෙසේ නම් ප්‍රකාශ නොකරන සේක්දැයි" කියායි.

**5.** ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ, මගධ ජනපද වැසි උපාසකයන් අරබයාවූ මේ කාරණය, තනියම රහසිගතව නැවත නැවත සිතා ඒ රාත්‍රියේ අළුයම් කාලයෙහි නැගිට භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට හොඳින් වැඳ එක පැත්තක

උන්නේය. එක පැත්තක උන්නාවූ ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දැන්වූහ. "ස්වාමීනී, මා විසින් මේ කාරණය අසන ලදී. "භාග්‍යවතුන් වහන්සේ නාදික ගමට හාත්පස හාත්පස ජනපදවල ළඟ ඉකුත් කාලයෙහි මැරුණාවූ උපාසකයන් උපන් තැන් ප්‍රකාශ කරනසේක. (කවර ජනපදවලද යත්) කාසි කොසල ජනපදවලද, වජ්ජි මල්ල ජනපදවලද, චෙතිය වංස ජනපදවලද, කුරු පංචාල ජනපදවලද, මච්ඡ සූරසේන ජනපදවලද වෙත් අසවල් නමැත්තා අසවල් තැන් උපන්නේය. අසවල් තැනැත්තා අසවල් තැන උපන්නේය. යනුවෙනි. ළඟ ඉකුත් කාලයෙහි මැරුණාවූ ඕරම්භාගිය සංයොජන පහ නැති කිරීමෙන් ඕපපාතිකව (බඹලොව) උපන්නාවූ ඒ ලොකයෙන් නැවත නොඑන ස්වභාව ඇත්තාවූ එහිදීම පිරිනිවන් පාන්නාවූ නාදික ගම් වැසි උපාසකයෝ පණහකට වැඩි වෙත්.

"ළඟ ඉකුත් කාලයෙහි මැරුණාවූ සංයොජන තුනක් නැතිකොට රාග ද්වෙෂ මොහයන් තුනීකිරීමෙන් සකෘදාගාමිවූ එක් වරක් පමණක් මේ ලොකයට අවුත් සසර දුක් කෙළවර කරන්නාවූ නාදික ගම්වැසි උපාසකයෝ අනූවකට වැඩිවෙත්.

"ළඟ ඉකුත් කාලයෙහි මැරුණාවූ සංයෝජන තුනක් නැති කිරීමෙන් සොවාන් ඵලයට පැමිණියාවූ (සතර) අපායෙහි නොවැටෙන ස්වභාව ඇත්තාවූ අර්හත් ඵලයට නියතවූ නාදික ගම්වාසිවූ උපාසකයෝ පන්සීයයකට වැඩි වෙත්.

"භාග්‍යවතුන් වහන්සේගේ මේ ප්‍රශ්න විසඳීම අසා නාදික ගම් වැසි උපාසකයෝ සතුටු සිත් ඇත්තෝ, ප්‍රමුදිත සිත් ඇත්තෝ, ප්‍රීති සහගත සිත් ඇත්තෝ වූහ" කියායි.

**6.** "ස්වාමීනි, ළඟ ඉකුත් කාලයෙහි මැරුණාවූ මගධ ජනපද වාසී මේ උපාසකයෝද බොහෝ වූහ. චිර රාත්‍රී දන්නෝද වූහ. ළඟ ඉකුත් කාලයෙහි මැරුණාවූ මගධ ජනපද වාසී උපාසකයන්ගෙන් අඟු මගධ දෙරට වැස්සෝ නැත්තාහයි (ශූන්‍යයයි) සිතමි. මේ අඟු මගධ දෙරට වැසි උපාසකයෝද බුදුන් කෙරෙහි පැහැදුනෝ වූහ. ධර්මය කෙරෙහි පැහැදුනෝ වූහ. සංඝයාකෙරෙහි පැහැදුනෝවූහ. සීලයන් සම්පූර්ණ

කළෝවූහ. ළඟ ඉකුත් කාලයෙහි මැරුණාවූ ඒ උපාසකයෝ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ නොකරන ලද්දාහුය. ඒ උපාසකයන් ගැනද යහපත් විසඳීමක් වන්නේ නම් බොහෝ ජනයා පහදින්නේය. ඒ හේතුවෙන් සුගතියට යන්නේය.

"තවද මගධ ජනපදයට අධිපතිවූ සේනා ඇත්තාවූ මේ බිම්බිසාර රජුද ධාර්මික වීය. ධර්මයෙන් (ජනයන්) සතුටු කෙළේය. බ්‍රාහ්මණ ගෘහපතියන්ටද, නියම් ගම්වැස්සන්ටද, ජනපද වැස්සන්ටද වැඩ කැමැත්තේ විය. තවද මනුෂ්‍යයෝ මේ කාරණය වර්ණණා කරමින් වාසය කරත්. ධාර්මිකවූ ඒ ධර්මරාජයා අප මෙසේ සැපයට පමුණුවා මැරුණේය. මෙසේ අපි ධාර්මිකවූ ඒ ධර්මරාජයාගේ රටෙහි සැපසේ වාසය කරමු" කියායි.

"ඒ රජුද බුදුන් කෙරෙහි පැහැදුනේය, ධර්මය කෙරෙහි පැහැදුනේය, සංඝයා කෙරෙහි පැහැදුනේය, සීලයන් සම්පූර්ණ කරන්නෙක් වූයේය. තවද මිනිස්සු මෙසේ කීහ. "මරණ කාලය දක්වාත් මගධ රටට අධිපතිවූ, සේනා ඇති බිම්බිසාර රජතුමා භාග්‍යවතුන් වහන්සේගේ ගුණ වර්ණණා කරන්නෙක්වම මැරුණේය" යනුයි.

"ළඟ අතීතයේදී මැරුණු ඒ රජු ගැන භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ නොකරන ලද්දේය. ඔහු ගැනත් හොඳ ප්‍රකාශ කිරීමක් වන්නේ නම් බොහෝ ජනයා පහදින්නේය. ඒ හේතුකොට ගෙන සුගතියට යන්නේය.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ බුදුවීම සිදුවූයේ මගධ ජනපදයේදීය. ඒ ප්‍රදෙශයෙහි මගධ ජනපද වාසීවූ ළඟ අතීතයේ මැරුණාවූ උපාසකයන් උපන්තැන් කෙසේ නම් ප්‍රකාශ නොකරන්නෝද? භාග්‍යවතුන් වහන්සේ ළඟ ඉකුත් කාලයෙහි මැරුණාවූ මගධ ජනපද වැසි, උපාසකයන් උපන් තැන් ඉදින් ප්‍රකාශ නොකරන්නෝ නම්, එයින් මගධ දනව් වැසි උපාසකයෝ බැගෑපත් සිත් ඇත්තෝ වන්නාහ. ස්වාමීනි මගධ දනව් වැසි උපාසකයෝ යමක් කරණකොටගෙන බැගෑපත් සිත් ඇත්තෝ වෙද්ද. එය භාග්‍යවතුන්වහන්සේ කෙසේ නම් ප්‍රකාශ නොකරන්නෝදැයි" කියායි. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්

වහන්සේ මගධ ජනපද වැසි උපාසකයන් ගැනවූ විස්තර කථාව භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියේදී මෙසේ ප්‍රකාශ කොට උන් ආසනයෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට හොඳින් වැඳ පැදකුණුකොට ගියේය.

7. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ බැහැර ගොස් ටික වේලාවකින් පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍රය හා සිවුරු ගෙන නාදික ගමට පිණ්ඩපාතය පිණිස පැමිණියහ. නාදික ගමෙහි පිඬු පිණිස හැසිර පසුබත් කාලයෙහි පිණ්ඩපාත භොජනයෙන් පසු ආපසු වැඩිසේක් පතුල් සෝදා ගිඤ්ජකාවසථ නම් විහාරයට ඇතුල්ව මගධ ජනපද වැසි උපාසකයන් අරබයා කරුණු සලකා, මෙනෙහිකොට සියල්ල ප්‍රඥාවෙන් පිරිසිඳ දැන පැණවූ ආසනයෙහි වැඩ උන්සේක. 'ඒ පින්වත්හු යම් ඥානයකට පැමිණීමක් ඇත්තෝද, යම්බඳු පරලොවක් ඇත්තෝද, ඔවුන්ගේ ඒ ඥානයට පැමිණීමත්, ඔවුන්ගේ පරලොවත් දැනගන්නෙමියි" ඒ පින්වත්හු යම් ඥානගතියක් ඇත්තෝ වූවාහුද, යම් පරලොවක් ඇත්තෝ වූවාහුද, ඒ ඥානගතිය ඇත්තාවූ ඒ පරලොවට පැමිණියාවූ ඒ උපාසකයෝ භාග්‍යවතුන් වහන්සේ විසින් දක්නා ලදහ' ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි ඵල සමාපත්තියෙන් නැගීසිට, ගිඤ්ජකාවසථ විහාරයෙන් නික්ම විහාර සෙවනැල්ලෙහි පණවනලද ආසනයෙහි වැඩ උන්සේක

8. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට හොඳින් වැඳ එක පැත්තක උන්නේය එක් පසෙක උන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය දැන්වූහ. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ඉතාම සාන්ත (සංසිඳුනු) දැකුම් ඇත්තේය. ඉන්ද්‍රියයන්ගේ ප්‍රසන්න භාවය හේතු කොට ගෙන භාග්‍යවතුන් වහන්සේගේ මුහුණේ ශොභාව බොහොසෙයින් බබලන්නේය. භාග්‍යවතුන් වහන්සේ අද ඒකාන්තයෙන් ශාන්ත විහරණයකින් යුක්තව වාසය කළ සේකැයි හඟිමි" යනුයි

9. "ආනන්දය, තොප මගධ ජනපද වැසි උපාසකයන් අරබයා මා ඉදිරියේදී යම් විස්තර කථාවක් කොට උන්

ආසනයෙන් නැගිට බැහැර ගියෙහිද, ඉන්පසු මම ඒ නාදික ගමෙහිම පිඬු පිණිස හැසිර පිණ්ඩපාත භෝජනයෙන් ආපසු පැමිණියේ පසුබත් කාලයෙහි පතුල් සෝදා ගිඤ්ජකාවසථ විහාරයටවී, මගධ ජනපද වැසි උපාසකයන් අරබයා හොඳින් සලකා මෙනෙහිකොට සියල්ල ප්‍රඥාවෙන් පිරිසිඳ දැන, පණ වනලද ආසනයෙහි උන්නෙමි.

"ඒ පින්වත්හු යම් (මාර්ග) ඥාන ගතියක් ඇත්තෝද යම්බඳු පරලොවක් ඇත්තෝද, ඔවුන්ගේ ඒ ඥාන ගතියත් දනගන්නෙමි. ඔවුන්ගේ පරලොව ගතියත් දැනගන්නෙමි කියායි.

"ආනන්දය, ඒ පින්වත්හු යම් ඥාන ගතියක් ඇත්තෝද යම් පරලොව ගතියක් ඇත්තෝද මගධ දනව් වැසි ඒ උපාසකයන් මම (නුවණැසින්) දුටුවෙමි.

"ආනන්දය, එවිට නොපෙනෙන දෙවියෙක්, 'භාග්‍යවතුන් වහන්ස, මම ජනවසභ නම් වෙමි. සුගතයන් වහන්ස, මම ජනවසභ නම් වෙමි' යි මුරගා කීය. ආනන්දය, ජනවසභ යන මේ නම යම්සේද, මින් පෙර මෙබඳු නමක් අසා ඇති බව දන්නෙහිදැයි" ඇසුවෝය. "ස්වාමීනි, මම මීට පෙර ජනවසභ යන මෙබඳු නමක් ඇසූ බවක් නොදනිමි. එහෙත් ජන වසභ යන මේ නම අසා මාගේ ලොම් කෙලින් සිටියේය. ස්වාමීනි, ඒ මට මේ අදහස විය. යමෙකුට මේ ජනවසභ යන නම වී ද ඒකාන්තයෙන් ඒ දෙවි තෙමේ ලාමකයෙක් (සුලු කෙනෙක්) නොවන්නේයයි" කියායි.

10 "ආනන්දය, ශබ්දය පහළ වීමෙන් පසු මහත් ශරීර වර්ණයක් ඇති (ලක්ෂණ) සොම නම් දෙවියෙක් මා ඉදිරියෙහි පහළ වූයේය. දෙවැනි වරද ශබ්දය ඇස්විය.

'භාග්‍යවතුන් වහන්ස, මම බිම්බිසාර වෙමි. සුගතයන් වහන්ස, මම බිම්බිසාර වෙමි. ස්වාමීනි, මම මේ සත්වෙනි ජාතියෙහි වෙසමුණු මහරජුගේ සහ භාවයට පැමිණියෙමි. මම එයින් චුතව මනුෂ්‍ය රජෙක් හෝ දිව්‍ය රජෙක් හෝ වන්නෙමි.'

'මේ දෙව් ලොවින් චුතව සත් වරක්ද, ඒ මිනිස් ලොවින් චුතව සත්වරක්දැයි ජාති දාහතරක් (දෙව් මිනිස් දෙගතියෙහි)

සැරිසරමි. මම පෙර කාලයෙහි යම් තැනක වාසය කෙළෙම්ද, ඒ පෙර විසූ ජාති පිළිවෙල මනාසේ දනිමි.

'ස්වාමීනි, මම බොහෝ කලක පටන් සෝවාන් ඵලයට පැමිණියේ සසර අපායෙහි නොවැටෙන්නෙකු බව දනිමි. (එහෙත්) සකෘදාගාමී මාර්ග ලාභය සඳහා මාගේ බලාපොරොත්තුව ඇත්තේය.'

"ආයුෂ්මත් ජනවසභ දෙවියාගේ මේ කාරණය පුදුමයක් වෙයි. ආයුෂ්මත් ජනවසභ දෙවියාගේ මේ කාරණය ඉතා පුදුමයක් වෙයි, 'ස්වාමීනි, මම බොහෝ කලක පටන් අපායෙහි නොවැටෙන ස්වභාව ඇත්තෙමි. අපායෙහි නොවැටෙන ස්වභාවය හොඳින් දනිමියි" කියන්නෙහිය මාගේ ආසාව සකෘදාගාමි මාර්ග ලාභය පිණිස හොඳින් පිහිටා ඇත්තේයයි' කියන්නෙහිය. "කුමක් හෙයින් ආයුෂ්මත් ජනවසභ දෙවි තෙම මෙබඳු මහත් විශෙෂ අධිගමයක් දනී දැයි" ඇසීය

11. 'භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේගේ සසුනෙන් පිටත් වෙන සසුනකින් නොලබන ලද්දේය. සුගතයන් වහන්ස, ඔබ වහන්සේගේ සසුනෙන් පිට වෙන සසුනකින් නොලබන ලද්දේය ස්වාමීනි, මම යම් දවසක පටන් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ඒකාන්තයෙන් මනාකොට පැහැදුනෙම්ද, ස්වාමීනි, එදා පටන් කොට ඇති මේ දිර්ඝ කාලයක් අපායෙහි නොවැටෙන ස්වභාව ඇත්තෙක් වීමි අවිනිපාතවූ (සෝවාන් මාර්ගය) මාර්ගය හොඳින් දනිමි. මගේ ආසාවද සකෘදාගාමි මාර්ග ලාභය පිණිස එළඹ සිටී ස්වාමීනි, මේ මම වෙසමුණු මහරජු විසින් විරූළ්හක මහරජු ලඟට කිසියම් කටයුත්තක් සඳහා යවන ලද්දෙමි.

ගිඤ්ජකාවසථ විහාරයට පැමිණ මගධ රට වැසි උපාසකයන් අරබයා කරුණු සලකා, හොඳින් මෙනෙහිකොට, සියල්ල ප්‍රඥාවෙන් පිරිසිඳ ඒ පින්වත්හු යම් ඥානගතියක් ඇත්තෝ වෙද්ද, ඔවුන්ගේ ඒ ඥානගතිය මනාකොට දැනගන්නෙමි. ඔව්හු යම් පරලොව ගති ඇත්තෝ වෙද්ද ඔවුන්ගේ ඒ පරලොව ගතිද හොඳින් දැනගන්නාමෙයි වැඩ උන් භාග්‍යවතුන් වහන්සේ ඒ අතරමගදී දුටුවෙමි"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ස්වාමීනි, ඒ පින්වත්හු යම් ගතියක් ඇත්තාහුද යම් පරලොවක් ඇත්තාහුදැයි වෛශ්‍රවණ දෙවියන්ගේ පිරිසෙහි වූවෙකුගේ සමීපයෙන්ම අභිමුඛයෙන්ම (ඔහුගෙන්ම) ඇසීමී පුදුමයකි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේද දක්නෙමි. මේ කාරණයද භාග්‍යවතුන් වහන්සේට සැලකරන්නෙමියි යන අදහස මට ඇති විය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ දක්නා පිණිස ඒ මට මේ කරුණු දෙක හේතුවූහයි" කීය.

12 "ස්වාමීනි, දවස් කීපයකට පෙර, පසළොස්වක් පෝය පවත්නා කල්හි වස් එළඹීම් ඇති සම්පූර්ණවූ සඳ ඇති රාත්‍රී මෙහි සියලු තව්තිසා වැසි දෙවියෝ සුධර්මා නම් (දිව්‍ය) සභායෙහි එක්රැස්ව උන්නාහුවෙත්. මහත් දිව්‍යපිරිසක්ද අවටින් උන්නේ වෙයි. සතරවරම් මහරජහුද සතරදිගින් උන්නාහු වෙත්. නැගෙනහිරදිග ධෘතරාෂ්ට්‍ර නම් දෙව් මහරජ බටහිරට මුහුණ ලා දෙවියන් පෙරටුකොට උන්නේවේ. දකුණු දිග විරූළ්හක නම් දෙව් මහරජ උතුරට මුහුණලා දෙවියන් පෙරටුකොට උන්නේවේ. බටහිර දෙස විරූපාක්ෂ නම් දෙව් මහරජ පෙරදිගට මුහුණ ලා දෙවියන් පෙරටුකොට උන්නේ වේ. උතුරුදෙස වෛශ්‍රවන (වෙසමුණු) දෙව් මහරජ දකුණු දිගට මුහුණලා දෙවියන් පෙරටුකොට උන්නේ වේ.

"ස්වාමීනි, යම් කලෙක්හි සියලු තව්තිසා වැසි දෙවියෝ සුධර්මා නම් (දිව්‍ය) සභාවෙහි රැස්ව එක්ව උන්නාහු වෙත්ද, මහත් දිව්‍ය පිරිසද හාත්පසින් එක්ව උන්නාහු වෙත්ද සතරවරම් දෙව් මහ රජවරුද සතරදිග එක් රැස්ව උන්නාහු වෙද්ද මේ ඔවුන්ගේ ආසනය ඉදිරියෙන් වේ. එවිට අපගේ ආසනය පසුපසින් වේ.

"ස්වාමීනී, යම් ඒ දෙවි කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බ්‍රහ්මචය්‍යීාව රැක තව්තිසා දිව්‍යලෝකයෙහි අලුත උපන්නාහු වෙද්ද, ඔවුහු ශරීර වර්ණයෙන්ද, යසසින්ද අනිකුත් දෙවියන්ට වැඩියෙන් බබළත්. ස්වාමීනි, ඒ කාරණයෙන් තව්තිසා වැසි දෙවියෝ සතුටු සිත් ඇත්තෝ වෙත්. ප්‍රමුදිත සිත් ඇත්තෝ වෙත්. හටගත් ප්‍රීති ඇත්තෝ වෙත්. 'පින්වත්නි, දිව්‍ය සමූහයා දියුණු වෙත්. අසුර සමූහයා පිරිහෙත්යයි' කියායි.

13 "ස්වාමීනි, එකල්හි සක්‍රදෙවෙන්ද්‍ර තෙමේ තව්තිසා වැසි දෙවියන්ගේ උතුම්වූ පැහැදීම දැනගෙන මේ (අදහස් ඇති) ගාථාවලින් සතුට ප්‍රකාශ කෙළේය.

"පින්වත්නි, ඉන්ද්‍රයා (ශක්‍රයා) සහිතවූ තව්තිසා වැසි දෙවියෝ තථාගතයන් වහන්සේටද, ධර්මයටද, සංඝයාටද නමස්කාර කෙරෙමින් සතුටු වෙත්."

"සුගතයන් වහන්සේ කෙරෙහි උතුම් හැසිරීමෙහි හැසිර මේ දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) පැමිණියාවූ උතුම්වූ ශරීරවර්ණ ඇත්තාවූ, යසස් ඇත්තාවූ අලුත් දෙවියන් දක්නාහුය

'ඒ දෙවියෝ ශරීර වර්ණයෙන්ද, යසසින්ද, ආයුෂයෙන්ද අන්‍ය දෙවියන්ට වැඩියෙන් බබලත්. මහත්වූ ප්‍රඥාවෙන් යුත් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෝ මේ දෙව් ලොවෙහි විශෙෂ බවට පැමිණියාහුය"

"ඉන්ද්‍රයා (ශක්‍රයා) සහිතවූ තව්තිසා වැසි දෙවියෝ බොහෝසෙයින්ම සතුටු සිත් ඇත්තෝ තථාගතයන් වහන්සේටද, ධර්මයටද, සංඝයාටද නමස්කාර කෙරෙත්."

"ස්වාමීනි, ඒ කාරණය නිසා බොහෝසෙයින්ම තව්තිසා වැසි දෙවියෝ සතුටු සිත් ඇත්තෝ, ප්‍රමුදිත සිත් ඇත්තෝ හටගත් ප්‍රීති ඇත්තෝ වෙත්.

"පින්වත්නි ඒකාන්තයෙන් දිව්‍ය සමූහයා දියුණුවෙත්. අසුර සමූහයා පිරිහෙත්"යි කියායි.

14 "තවද, ස්වාමීනි, යම් ප්‍රයෝජනයක් නිසා තව්තිසා වැසි දෙවියෝ සුධර්මා නම් දිව්‍ය සභාවෙහි රැස්වූවාහුද එක්වූවාහුද, (වස් එළඹීම් පිණිස රැස්වන හෙයින්) "ඒ කාරණය සිතා (වනවාසී සංඝයාට ආරක්ෂාව පිණිස) ඒ කාරණය මන්ත්‍රණය කොට (කථාකර) ගෙන කියනලද වචන ඇත්තෝ ඒ සතර වරම් රජවරුද ඒ කාරණය පිණිස පවතිත්. නැවත අනුශාසනා කරනලද සතරවරම් රජවරුද බැහැර නොගොස් ඒ කාරණය පිණිස තමන්ගේ ආසනවලම සිටියාහුය.

"ඒ සතරවරම් රජහු අනුශාසනා පිළිගෙන (මෙනෙහි කොට) අතිශයින් පැහැදුනු සිත් ඇත්තෝ තමන්ගේ ආසනයෙහිම සිටියාහුය.

15 "එවිට උතුරු පැත්තෙන් මහත්වූ ආලෝකයක් හටගත්තේය. මහත් බැබලීමක් පහළවූයේය (කෙසේද) දෙවියන්ගේ දෙවානුභාවය (ආලොකය) මැඩපවත්වා පහළ වූයේය. ස්වාමීනි, එවිට සක්දෙව් තෙමේ තව්තිසා වැසි දෙවියන්ට කථාකළේය. 'නිදුකාණනි, යම් හෙයකින් (යම් දිගකින්) පෙරනිමිති දක්නා ලැබෙද්ද, ආලෝකයක් හටගනීද, මහත් බැබලීමක් පහළවේද (ඒ දිගින්) බ්‍රහ්මතෙමේ පහළ වන්නේය. මහාබ්‍රහ්මයාගේ පහළවීමට මේ පෙරනිමිත්තයයි' කීයේය. එනම් යම් ඒ ආලෝකයක් හටගනීද බැබලීමක් පහළවේද යනුයි.

"පෙර කී පරිදි නිමිති දක්නා ලැබෙත් නම් බ්‍රහ්මයා පහළ වන්නේය. පැතිර පවත්නාවූ මහත් ආලෝකය යම්සේ පහළවේද, එයම බ්‍රහ්මයාගේ පහළවීමට පෙරනිමිති වන්නේය.

16 "ස්වාමීනි, ඉක්බිති තව්තිසා වැසි දෙවියෝ තම තමන්ගේ ආසනවලම උන්නෝය 'මේ බැබලීම (ආලෝකය) දැනගන්නෙමු එයින් යම් විපාකයක් වන්නේ නම් එයත් හොඳින් දැනගෙනම යමු කියායි සතර වරම් මහරජහුද තම තමන්ගේ ආසනවලම උන්නාහුය. මේ ආලොකය දැන ගන්නෙමු. ඉන් යම් විපාකයක් වන්නේ නම් එයද හොඳින් දැනගෙනම යන්නෙමු' කියායි මේ අසා තව්තිසා වැසි දෙවියෝ එකඟ බවට පැමිණියාහුය. 'මේ ආලෝකය දැන ගන්නෙමු ඉන් යම් විපාකයක් වන්නේ නම් එයද හොඳින් දැනගෙනම යන්නෙමුයි' කියායි.

17 'ස්වාමීනි, සනන් කුමාර බ්‍රහ්ම තෙමේ තව්තිසා වැසි දෙවියන් අතර පහළ වන්නේද, එකල්හි ඔළාරික (සියල්ලටම පෙනෙන මහත්) ශරීරයක් මවාගෙන පහළ වෙයි. ස්වාමීනි, මහබඹුගේ යම් ඒ ප්‍රකෘති ශරීර වර්ණයක්වේද එය තව්තිසා වැසි දෙවියන්ගේ ඇසට හමු නොවෙයි (නොපෙනෙයි) ස්වාමීනි, යම් කලෙක සනන් කුමාර බ්‍රහ්ම තෙමේ තව්තිසා වැසි දෙවියන් අතර පහළවේද, ඒ බ්‍රහ්ම තෙමේ තමාගේ ශරීරවර්ණයෙන්ද යසසින්ද අනිකුත් දෙවියන් මැඩපවත්වා වැඩියක් බබළයි. ස්වාමීනි, රත්රන් රූපය මනුෂ්‍ය රූපය ඉක්මවා වැඩියක් බබළයිද, ස්වාමීනි, එමෙන්යම් කලෙක සනන් කුමාර බ්‍රහ්ම තෙමේ තව්තිසා දෙව්ලොව පහළ වෙයිද එකල ශරීර වර්ණයෙන්ද, යසසින්ද අන් දෙවියන් මැඩපවත්වා වැඩියක් බබලයි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

"ස්වාමීනි, යම් කලෙක්හි සනන් කුමාර බ්‍රහ්මතෙමේ තව්තිසා වැසි දෙවියන් අතර පහළවේද, ඒ පිරිසෙහි කිසි දෙවතාවෙක් ඔහුට නොවඳියි. උන් ආසනයෙන් නොනැගිටියි. (වාඩිවීමට) ආසනයක් හෝ නොපවරයි. සනන් කුමාර බ්‍රහ්ම තෙම යම් දෙවියෙකුගේ ආසනයක් කැමති වන්නේද, ස්වාමීනි, ඒ දෙවියාගේ ආසනයෙහි සනන් කුමාර බ්‍රහ්ම තෙමේ හිඳගන්නේයයි ඒ සියලු දෙවියෝම නිශ්ශබ්දව ඇඳිලිබැඳගෙන (දෑත් හිසෙහි තබා වැඳගෙන) ආසනයන්හි හිඳිත්.

"ස්වාමීනි, ඒ සනන් කුමාර බ්‍රහ්මතෙමේ දෙවියෙකුගේ ආසනයෙහි හිඳගන්නේද? ඒ දෙවියා මහත්වූ සතුටක් මහත්වූ සොම්නසක් ලබයි. ස්වාමීනි, යම්සේ අලුත රාජ්‍යය ලැබූ මුදුනෙහි අභිෂෙක කරන ලද්දාවූ ක්ෂත්‍රිය රජෙක් වේද, ඔහු මහත් වූ ප්‍රීතියක් ලබන්නේද, මහත්වූ සතුටක් ලබන්නේද, ස්වාමීනි, එසේම සනන් කුමාර බ්‍රහ්මතෙම යම් දෙවියෙකුගේ ආසනයක හිඳ ගනීද, ඒ දෙවියා මහත්වූ ප්‍රීතියක් ලබන්නේය, මහත් සතුටක් විඳින්නේය.

18. "ස්වාමීනි, එකල්හි සනන් කුමාර බ්‍රහ්මතෙම ඖදාරික (මහත්) ශරීරයක් මවාගෙන පංචසිඛ දිව්‍ය පුත්‍රයා මෙන් කුමාර වෙසයෙන් තව්තිසා වැසි දෙවියන් අතරෙහි පහළ වූයේය. ඔහු අහසට නැඟී පිහිටීමක් නැති ආකාශයෙහි පලක්බැඳ උන්නේය. කෙසේදයත් ස්වාමීනි, බලවත් පුරුෂයෙක් මනාකොට වස්ත්‍රාදියෙන් අතුරනලද ආසනයෙක්හි හෝ සමවූ භූමියක හෝ පලක් බැඳ හිඳින්නේද, ස්වාමීනි එපරිද්දෙන්ම සනන් කුමාර බ්‍රහ්ම තෙමේ අහසට පැනනැඟී පිහිටීමක් නැති අහසෙහි පලක් බැඳ, තව්තිසා වැසි දෙවියන්ගේ යහපත් පැහැදීම දැනගෙන මේ (අදහස් ඇති) ගාථාවලින් සතුට ප්‍රකාශ කෙළේය.

"පින්වත්නි, ඉන්ද්‍රයා (ශක්‍රයා) ප්‍රධානකොට ඇති තව්තිසා වැසි දෙවියෝ තථාගතයන් වහන්සේටද, ධර්මයටද, සංඝයාටද නමස්කාර කරමින් ඉතා ප්‍රීතිමත් වෙත්මය."

"(ජනයෝ) සුගතයන් වහන්සේ කෙරෙහි බඹසර (උතුම් හැසිරීම) රැක මේ දෙව්ලොවට (ඉපදීම් වශයෙන්) පැමිණියාවූ වර්ණවත්වූද යසස් ඇත්තාවූද අලුත් දෙවියන් දක්නාහුය.

"ඒ දෙවතාවෝ වර්ණයෙන් (පාටින්) ද, යසසින්ද ආයුෂයෙන් වෙන දෙවියන් ඉක්මවා බබළත්. මහා ප්‍රඥා ඇති තථාගතයන් වහන්සේගේ ශ්‍රාවකයෝ මේ දිව්‍ය ලොකයෙහි විශෙෂ බවට පැමිණියාහුය."

"ඉන්ද්‍රයා (ශක්‍රයා) ප්‍රධානකොට ඇති තව්තිසා වැසි දෙවියෝ මේ කාරණය දැක තථාගතයන් වහන්සේටද, ධර්මයටද, සංඝයාටද නමස්කාර කරමින් වඩාත් සතුටුවෙත්."

**19.** "ස්වාමීනි, සනන් කුමාර බ්‍රහ්මතෙමේ මේ කාරණය කීයේය. "ස්වාමීනි, මේ කාරණය කියන්නාවූ සනත් කුමාරයාගේ ශබ්දය මේ අංග අටෙන් යුක්තවේ (පීඩාවක් නැතිව හොඳින් නික්මෙන) විස්සට්ඨ නම් ස්වරයද (වහාම අදහස තේරුම් යන) විඤ්ඤෙය්‍ය නම් ස්වරයද, (ඉතා මොලොක්වූ) මඤ්ජුස නම් ස්වරයද, (ඇසීමට කණට මිහිරිවූ) ස්වර්ණය නම් ස්වරයද, (එකට සම්බන්ධවූ) බින්දු නම් ස්වරයද, (නොවිසිර පවත්නාවූ) අවිසාරී නම් ස්වරයද, (ගැඹුරුව නික්මෙන) ගම්භීර නම් ස්වරයද, (මිහිරි රාවය පවත්නාවූ) නින්නාදී නම් ස්වරයද යන අටයි

"ස්වාමීනි, සනන් කුමාර බ්‍රහ්මතෙම පිරිසට ප්‍රමාණවූ ස්වරයෙන් අඟවයි ඒ ඝොෂාව (හඬ) පිරිසෙන් පිටතට නොයයි. ස්වාමීනි, යමෙකුගේ ස්වරය මේ අංග අටින් යුක්තවේද එය බ්‍රහ්ම ස්වරයයි කියනු ලැබේ.

**20** "ස්වාමීනි, ඉන්පසු සනන් කුමාර බ්‍රහ්මතෙමේ ආත්මභාව (ශරීර) තිස්තුනක් මවාගෙන, තව්තිසා වැසි දෙවියන්ගේ වෙන වෙනම ආසනයන්හි පලක් බැඳ හිඳ තව්තිසා වැසි දෙවියන් කථාකර මෙසේ කීවේය. 'පින්වත්නි, තව්තිසා වැසි දෙවියෝ ඒ කුමකැයි සිතත්ද? ඒ භාග්‍යවතුන් වහන්සේ යම්තාක් බොහෝදෙනාට වැඩ පිණිසද, බොහෝ දෙනාට සැප පිණිසද, ලොවට අනුකම්පා පිණිසද, දෙවි මිනිසුන්ගේ ප්‍රයෝජනය පිණිසද, වැඩ පිණිසද, සැප පිණිසද පිළිපන්සේක්ද, එහෙයින් පින්වත්නි, යම්කෙනෙක් බුදුන් සරණ ගියාහුද ධර්මය සරණ ගියාහුද, සඟ සරණ ගියාහුද, සීලයන් සම්පූර්ණ කරන්නාහුද, ඒ සත්වයෝ ඇතැම් කෙනෙක් කය බිඳීමෙන් මරණින් මතු පරනිර්මිත වසවත්තී නම් දෙවියන් සමග එක්වීමට පැමිණෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇතැම් කෙනෙක් නිර්මාන රතී දෙවියන් සමග එක්වීමට පැමිණෙත්. ඇතැම් කෙනෙක් තුසිත දෙවියන් සමග එක්වීමට පැමිණෙත්. ඇතැම් කෙනෙක් යාම දෙවියන් සමග එක්වීමට පැමිණෙත්. ඇතැම් කෙනෙක් තාවතිංස දෙවියන් සමග එක්වීමට පැමිණෙත්. ඇතැම් කෙනෙක් චාතුර්මහාරාජික නම් දෙවියන් සමග එක්වීමට පැමිණෙත්. යම් කෙනෙක් සියල්ලන්ටම පහත්වූ ශරීරයක් (උත්පත්තියක්) සම්පූර්ණ කෙරෙද්ද (ලබත්ද) ඔවුහු ගන්ධර්ව නම් කොටසෙහි උපදිත්.'

21 "ස්වාමීනි, සනත් කුමාර බ්‍රහ්ම තෙමේ මේ කාරණය කීයේය. ස්වාමීනි, සනත් කුමාර බ්‍රහ්මයා විසින් කියන කල්හි ඒ ඒ දෙවියා මෙසේ සිතයි. 'යම් මේ දෙවි කෙනෙක් මාගේ ආසනයෙහි හිඳීද, ඒ මේ දෙවියාම කථා කරන්නේය' කියායි.

"එක් දෙවියෙකු කථාකරන කල්හි මවනලද සියලු දෙවියෝම කථාකරත්. එක් දෙවියෙකු නිශ්ශබ්දව සිටින කල්හි (අනිකුත්) සියලු දෙවියෝම නිශ්ශබ්ද වෙත්.

"එකල්හි සක්දෙවි ප්‍රධාන තව්තිසා වැසි දෙවියෝ මෙසේ සිතත්. 'යමෙක් මාගේ ආසනයේ සිටීද ඒ මේ දෙවියාම කථා කරන්නේය" කියායි.

22. "ස්වාමීනි, ඉක්බිති සනත් කුමාර බ්‍රහ්මතෙම එක් කොටසක් ශරීරය හැකුලුවේය. එක් කොටසක් ශරීරය අකුලුවා සක් දෙවිඳුගේ ආසනයෙහි හිඳ තව්තිසා වැසි දෙවියන්ට කථාකළේය. 'පින්වත්වූ තව්තිසා වැසි දෙවියෝ ඒ කුමකැයි සිතන්නාහුද (ඥානයෙන්) දන්නාවූ, දක්නාවූ, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් යම් පමණවූ මේ සතර ආකාර ඍද්ධිපාද කෙනෙක් ඉතා හොඳින් පණවන ලද්දාහුද, (කුමක් පිණිසද යත්) බොහෝවූ ඍද්ධිමත් භාවය පිණිසද, ඍද්ධි සෙවනය සඳහාද, නොයෙක් ආකාර ඍද්ධි දැක්වීම පිණිසද වෙත්. ඒ සතර කවරහුද යත්? පින්වත්නි, මේ ශාසනයෙහි යම් භික්ෂු කෙනෙක් ඡන්ද සමාධි ප්‍රධාන සංස්කාරයෙන් යුක්තවූ ඍද්ධිපාදය වඩාද, වීය්‍ර්‍ය සමාධි ප්‍රධාන සංස්කාරයෙන් යුක්තවූ ඍද්ධිපාදය වඩාද, චිත්ත සමාධි ප්‍රධාන සංස්කාරයෙන් යුක්තවූ ඍද්ධිපාදය වඩාද, විමංසා සමාධි ප්‍රධාන සංස්කාරයෙන් යුක්තවූ

ඍද්ධිපාදය වඩාද, පින්වත්නි, ඥානයෙන් දන්නාවූද, දක්නාවූද, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මේ ඍද්ධිපාද හතර බොහෝ ඍද්ධිමත් භාවය පිණිසද, ඍද්ධියගේ ආසේවනය පිණිසද, නොයෙක් ආකාර ඍද්ධි දැක්වීම පිණිසද පණවන ලද්දාහුය.

"පින්වත්නි, අතීතකාලයෙහි යම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ඍද්ධි විධිවලින් ප්‍රයෝජන ගත්තාහුද ඒ සියලු මහණ බමුණෝ මේ හතර ආකාර ඍද්ධිපාදයන් වැඩූ බැවින්ද, බොහෝසෙයින් පුරුදු කරනලද බැවින්ද (ඒ ඍද්ධි විධි දැක්වූහ.)

"පින්වත්නි, අනාගත (මතු) කාලයෙහි යම්කිසි ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් නොයෙක් ආකාරවූ ඍද්ධි විධිවලින් ප්‍රයෝජන ලබන්නාවූද ඒ සියල්ලෝම මේ හතර ආකාර ඍද්ධිපාදයන් වැඩූ බැවින්ද, බහුල කළ බැවින්ද ඒ ඍද්ධිවලින් ප්‍රයෝජන ලබන්නාහුය.

'පින්වත්නි, මේ කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ නොයෙක් ආකාර ඍද්ධි විධිවලින් ප්‍රයෝජන ලබත්ද, ඒ සියල්ලෝම මේ හතර ආකාර ඍද්ධිපාදයන් වැඩූ බැවින්ද, බහුල කළ බැවින්ද ඒ ඍද්ධිවලින් ප්‍රයෝජන ලබත්.

"පින්වත්නි, අපගේ තව්තිසා වැසි දෙවියෝද මාගේත් එබඳුමවූ ඍද්ධි මහිමයක් දක්නාහුදැයි" ඇසුවේය. "බ්‍රහ්මය ඒ එසේයයි" දැන්වූහ. 'දෙවතාවෙනි, මමද මේ හතර ආකාර ඍද්ධිපාදයන් වැඩූ බැවින්ද බහුල කළ බැවින්ද මෙබඳු මහත් ඍද්ධි ඇත්තෙක්ද මෙබඳු මහත් ආනුභාව ඇත්තෙක්ද වෙමියි" කීය.

23 "ස්වාමීනි, ඒ සනන් කුමාර බ්‍රහ්ම තෙමේ මේ කාරණය කීයේය. 'ස්වාමීනි, ඒ සනන් කුමාර බ්‍රහ්මතෙමේ මේ කාරණය කියා තව්තිසා වැසි දෙවියන්ට කථාකර මෙසේ කීවේය.

'පින්වත්නි, තව්තිසා වැසි දෙවියන් නුවණින් දන්නාවූ දක්නාවූ, අර්හත්වූ ඒ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින්

(ධ්‍යාන මාර්ගාදී) සැප ලැබීම පිණිස මේ ඔකාසාධිගම තුණක් අවබොධ කරන ලද්දාහුය. ඒ කවර තුනක්ද යත්.

"පින්වත්නි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් කාමයන් සමග යෙදුනු සිත් ඇතිව, අකුශල ධර්මයන් සමග යෙදුනු සිත් ඇතිව වාසය කෙරේද, ඉදින් ඒ පුද්ගලතෙම නොබෝ කලකදී උතුම් ධර්මය අසාද, නුවණින් මෙනෙහි කෙරේද, ධර්මයට අනුව පිළිපදීද, ඔහු උතුම් ධර්මය ඇසීමටද, නුවණින් මෙනෙහි කිරීමටද, ධර්මානුධර්ම ප්‍රතිපත්තියටද පැමිණ, කාමයන් සමග යෙදුනු සිත් නැතිව, අකුශල ධර්මයන් සමග යෙදුනු සිත් නැතිව වාසය කෙරේද, කාමයන් සමග නොයෙදුනු සිත් ඇත්තාවූද අකුශල ධර්මයන් සමග නොයෙදුනු සිත් ඇත්තාවූද, ඒ පුද්ගලයාහට සැපයක් උපදී. සැපයෙන් පසුව සතුට උපදී. පින්වත්නි, යම්සේ සන්තෝසයට පසුව ප්‍රමුදිත භාවය උපදින්නේද, පින්වත්නි, එපරිද්දෙන්ම කාමයන් සමග නොයෙදුන සිත් ඇත්තාවූද, අකුශල ධර්මයන් සමග නොයෙදුන සිත් ඇත්තාවූද, ඔහුට සැපයක් උපදී. සැපයෙන් මත්තෙහි සොම්නස උපදී. පින්වත්නි, නුවණින් දන්නාවූද, දක්නාවූද අර්හත්වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මේ පළමුවැනි (ප්‍රථම ධ්‍යානය) ඔකාසාධිගමය (ධ්‍යාන මාර්ගාදීවූ) සැප පිණිස දැනගන්නා ලද්දාහුය.

**24** "නැවතද අනිකක් නම්, පින්වත්නි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙකුගේ ඖදාරික කාය සංස්කාර (ආශ්වාස ප්‍රශ්වාස) නොසන්සිඳෙව්වාහු වෙත්ද, ඖදාරික වාක් සංස්කාර (විතර්ක විචාර) නොසන්සිඳෙව්වාහු වෙත්ද, ඖදාරික වූ මනො සංස්කාර (සිතිවිලි) නොසන්සිඳෙව්වාහු වෙත්ද, ඒ පුද්ගලයා පසු කලකදී උතුම්වූ ධර්මය අසාද නුවණින් මෙනෙහි කෙරේද ධර්මයට අනුව පිළිපදීද, ඔහුගේ ඖදාරික කාය සංස්කාර (ආශ්වාස ප්‍රශ්වාස) සංසිඳෙත්. ඖදාරික වාක් සංස්කාර (විතර්ක විචාර) සංසිඳෙත්. ඖදාරික මනො සංස්කාර (සිතිවිලි) සංසිඳෙත්.

"ඖදාරික කාය සංස්කාර සංසිඳීම් නිසාද, ඖදාරික වාක් සංස්කාර සංසිඳීම නිසාද, ඖදාරික මනො සංස්කාර සංසිඳීම නිසාද සැපයක් උපදී. සැපයෙන් මත්තෙහි සතුට උපදී.

"පින්වත්නි, යම්සේ සන්තෝෂයට පසුව ප්‍රමුදිත භාවය උපදීද, පින්වත්නි, එපරිද්දෙන්ම ඖදාරික කාය සංස්කාරයන්ගේ සංසිඳීමෙන්ද, ඖදාරික වාක්සංස්කාරයන්ගේ සංසිඳීමෙන්ද, ඖදාරික මනො සංස්කාරයන්ගේ සංසිඳීමෙන්ද සැපයක් උපදී. සැපයට පසුව සතුට උපදී.

"පින්වත්නි, නුවණින් දන්නාවූද, දක්නාවූද අර්හත්වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් දෙවැනිවූ මේ ඔකාසාධිගමය (චතුර්ථධ්‍යානය) සැප ලැබීම පිණිස අවබොධ කරන ලද්දේය.

**25** "තවද අනිකක් නම්, පින්වත්නි, මේ ලෝකයෙහි සමහර පුද්ගලයෙක් මේ කුසල්යයි ඇති සැටියෙන් නොදනීද, මේ අකුසල්යයි ඇතිසැටියෙන් නොදනීද, මෙය වරද සහිතය, මෙය වරද රහිතය, මෙය සේවනය කළ යුතුය, මෙය සෙවනය නොකළ යුතුය, මෙය ලාමකය, මෙය උතුම්ය, මේ කුසල් අකුසල්වලට සමාන ධර්මයෝ යයි ඇති සැටියෙන් නොදනීද, ඒ පුද්ගලයා පසු කලකදී උතුම්වූ ධර්මය අසාද නුවණින් මෙනෙහි කෙරේද, ධර්මයට අනුව පිළිපදීද, ඒ පුද්ගලයා ඇසීමටද, නුවණින් මෙනෙහි කිරීමටද, ධර්මයට අනුව පිළිපැදීමටද පැමිණ මේ කුසල් යයි ඇතිසැටියෙන් දැන ගනී. මේ අකුසල්යයි ඇතිසැටියෙන් දැනගනී. මෙය වරද සහිතය, මෙය වරද රහිතය, මෙය සේවනය කළ යුතුය. මෙය සේවනය නොකළ යුතුය. මෙය ලාමකය, මෙය උතුම්ය, මෙය කුසල් අකුසල් දෙකට සමානය කියා ඇතිසැටියෙන් දැනගනී. මෙසේ දන්නාවූද, දක්නාවූද, ඔහුගේ අවිද්‍යාව (නොදැනීම්) නැතිවෙයි. විද්‍යාව (දැනීම) ඇතිවෙයි.

"ඒ පුද්ගලයාගේ අවිද්‍යාව නැතිවීමෙන්ද විද්‍යාව ඉපදීමෙන්ද සැපයක් උපදී. සැප ලැබීමට පසුව සතුට උපදී. පින්වත්නි, යම්සේ සන්තෝෂයට පසුව ප්‍රමුදිත භාවය උපදීද, පින්වත්නි, එපරිද්දෙන්ම අවිද්‍යාව නැතිවීමෙන් විද්‍යාව ඉපදීමෙන් සැපයක් උපදී. සැපයට මත්තෙහි සතුට උපදී. පින්වත්නි, නුවණින් දන්නාවූ දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් සැප ලැබීම පිණිස මේ ඔකාසාධිගම තුණ අවබෝධ කරන ලද්දාහුයයි" කීය.

**26.** "ස්වාමීනි, සනන් කුමාර බ්‍රහ්ම තෙම මේ කාරණය කීයේය. සනන් කුමාර බ්‍රහ්ම තෙමේ මේ කාරණය කියා තව්තිසා වැසි දෙවියන්ට කථාකර මෙසේ කීවේය.

"පින්වත්නි, තව්තිසා වැසි දෙවියෝ ඒ කුමකැයි සිතත්ද? නුවණින් දන්නාවූ, දක්නාවූ, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් කුසල් (මාර්ග කුසල්) ලැබීම පිණිස මේ සතර සතිපට්ඨානයක් පණවන ලද්දාහුය. කවර සතරක්ද යත්? පින්වත්නි, මේ ශාසනයෙහි යම් මහණෙක් අධ්‍යාත්මික (තමන්ගේ) කයෙහි කය අනුව දක්නා ස්වභාව ඇත්තේ, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ මනා නුවණ ඇත්තේ, සිහි ඇත්තේ, කය නම්වූ ලෝකයෙහි ආසාව සහ සිතේ දුක මැඩ පවත්වා වෙසේද, තමන්ගේ කයෙහි කය අනුව බලමින් වාසය කරන්නාවූ (භික්ෂුව) එහි හොඳින් සිත එකඟ කරයි. මනාකොට වෙසෙසින් පහදී. ඒ භික්ෂුව එහි හොඳින් එකඟවූ සිත් ඇත්තේ, මනාකොට වැඩියක් පැහැදුනේ පිටත අනුන්ගේ කය පිළිබඳවද හොඳ නුවණින් දැකීම (බැලීම) හොඳින් උපදවයි.

"තමා තුළවූ වේදනාව (විඳීම) කෙරෙහි විඳීම අනුව දක්නා ස්වභාවය ඇත්තේ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, හොඳ නුවණ ඇත්තේ, සිහි ඇත්තේ, විඳීම නම්වූ ලෝකයෙහි ආසාව සහ සිතේ දුක (දොම්නස) මැඩ පවත්වා වාසය කෙරේද, තමන් තුළවූ විඳීම කෙරෙහි විඳීම අනුව බලමින් වාසය කරන්නාවූ (භික්ෂුව) එහි හොඳින් සිත එකඟ කරයි. මනාකොට වැඩියෙන් පහදී. ඒ භික්ෂුව එහි හොඳින් එකඟවූ, සිත් ඇත්තේ, මනාකොට වැඩියක් පැහැදුනේ පිටත අනුන්ගේ විඳීම පිළිබඳවද හොඳ නුවණින් දැකීම උපදවයි.

"තමාගේ සිත කෙරෙහි සිත අනුව දක්නා ස්වභාව ඇත්තේ, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, හොඳ නුවණ ඇත්තේ, සිහි ඇත්තේ, සිත නම්වූ ලොකයෙහි ආශාව හා සිතේ දුක මැඩ පවත්වා වාසය කෙරේද, තමාගේ සිත කෙරෙහි සිත අනුව බලමින් වසන්නාවූ (භික්ෂුව) එහි හොඳින් සිත එකඟ කරයි. මනාකොට වැඩියෙන් පහදී. ඒ භික්ෂුව එහි හොඳින් එකඟවූ සිත් ඇත්තේ මනාකොට වැඩියක් පැහැදුනේ, පිටත අනුන්ගේ සිත පිළිබඳවද හොඳ නුවණින්දැකීම (බැලීම) උපදවයි.

"තමා තුළවූ ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව දක්නා ස්වභාවය ඇත්තේ, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, හොඳ නුවණ ඇත්තේ, සිහි ඇත්තේ, ධර්ම නම්වූ ලෝකයෙහි ආසාව හා සිතේ දුක මැඩපවත්වා වාසය කෙරේද, තමන් තුළවූ ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වසන්නාවූ (භික්ෂුව) එහි හොඳින් සිත එකඟ කෙරෙයි. මනාකොට වැඩියෙන් පහදී. ඒ භික්ෂුව එහි හොඳින් එකඟවූ සිත් ඇත්තේ, මනාකොට වැඩියක් පැහැදුනේ පිටත අනුන්ගේ ධර්මයන් පිළිබඳවද හොඳ නුවණින් දැකීම (බැලීම) උපදවයි.

"පින්වත්නි, නුවණින් දන්නාවූ, දක්නාවූ, අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මේ සතර සතිපට්ඨාන ධර්මයෝ කුසල ලාභය පිණිස පණවන ලද්දාහුය.

**27.** "ස්වාමීනි, සනත් කුමාර බ්‍රහ්ම තෙම මේ කාරණය කීයේය. ස්වාමීනි, සනත් කුමාර බ්‍රහ්ම තෙම මේ කාරණය කියා තව්තිසා වැසි දෙවියන්ට කථාකර මෙසේ කීවේය. පින්වත්නි, තව්තිසා වැසි දෙවියෝ මේ කුමකැයි සිතත්ද? නුවණින් දන්නාවූ, දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් යහපත් සමාධියක් වැඩීම පිණිසද, යහපත් සමාධියක් සම්පූර්ණ කිරීම පිණිසද මේ පිරිවර ධර්ම සතක් පණවන ලද්දාහුය. ඒ සත කවරහුද යත්? යහපත් දැකීමය, (සම්‍යක් දෘෂ්ටිය) යහපත් කල්පනාවය, (සම්‍යක් සංකල්පනා) යහපත් වචනය, (සම්‍යක් වචනය) යහපත් කර්මාන්තය, සම්‍යක් කර්මාන්ත) යහපත් ජීවිත්වීමය, (සම්‍යක් ආජීව) යහපත් උත්සාහය (සම්‍යක් ව්‍යායාම) යහපත් සිහිය (සම්‍යක් ස්මෘති) යන මොවුහුයි.

"පින්වත්නි, මේ අංග (කරුණු) සතෙන්, සිතේ යම් එකඟ බවක් (සමාධියක්) පිරිවරණ ලද්දේද, ඒ සමාධිය ආර්‍ය්‍ය සම්‍යක් සමාධියයයිද, පිරිවර සහිත සම්‍යක් සමාධිය යයිද කියනු ලැබේ.

"පින්වත්නි, යහපත් දැකීම ඇත්තාහට යහපත් සංකල්පනාව පවතී. යහපත් කල්පනාව ඇත්තාහට යහපත් වචනය පවතී. යහපත් වචනය ඇත්තාහට යහපත් කර්මාන්තය පවතී යහපත් කර්මාන්තය ඇත්තාහට යහපත් ආජීවය (ජීවත්වීම) පවතී.

යහපත් ආජීවය ඇත්තාහට යහපත් උත්සාහය පවතී. යහපත් උත්සාහය ඇත්තාහට යහපත් සිහිය (ස්මෘතිය) පවතී. යහපත් සිහිය ඇත්තාහට යහපත් සමාධිය (සිත එකඟ බව) පවතී. යහපත් සමාධිය ඇත්තාහට යහපත් නුවණ පවතී. යහපත් නුවණ ඇත්තාහට යහපත් විමුක්තිය (කෙලෙසුන්ගෙන් මිදීම) පවතී.

'පින්වත්නි, යම් ඒ කාරණයක් ගැන මනාකොට කියන්නාවූ කෙනෙක් භාග්‍යවතුන්වහන්සේ විසින් ධර්මය මනාකොට ප්‍රකාශ කරණ ලද්දේය. මේ ආත්මයේදීම ලැබිය යුතු ඵල ඇත්තේය. කල් නොයවා ලැබියයුතු ඵල ඇත්තේය එව, බලවයි දැක්වීමට සුදුසු ගුණ ඇත්තේය. නුවණැත්තන් විසින් තම තමන් කෙරෙහිලා දත යුත්තේය. 'නිවන් දොරටුව විවෘතකරන ලද්දේයයි' කියන්නේද, ඒ මේ කාරණය ගැන භාග්‍යවතුන්වහන්සේ විසින් ධර්මය මනාකොට දේශනා කරන ලද්දේය. කල් නොයවා ලැබිය යුතු ඵල ඇත්තේය 'එව, බලවයි පෙන්වීමට සුදුසු ගුණ ඇත්තේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දතයුත්තේය. නිවන් දොරටුව විවෘත කරන ලද්දේයයි' කියන්නේය.

"පින්වත්නි, බුදුන් වහන්සේ කෙරෙහි නොසෙල්වෙන පැහැදීමෙන් යුක්තවූද, ධර්මය කෙරෙහි නොසෙල්වෙන පැහැදීමෙන් යුක්තවූද, සංඝයා කෙරෙහි නොසෙල්වෙන පැහැදීමෙන් යුක්තවූද, උත්තමයන් විසින් හොඳයයි සම්මත කරනලද සීලයන්ගෙන් යුක්තවූද, උතුම් ධර්මයෙහි හික්මුනාවූ මේ ඕපපාතිකවූද ළඟ ඉකුත් කාලයෙහි මැරුණාවූ මගධ ජනපද වැසි උපාසකයෝ සංයෝජන තුනක් නැති කිරීමෙන් සෝවාන් ඵලයට පැමිණියාවූ අපායෙහි නොවැටෙන ස්වභාව ඇත්තාවූ අර්හත් ඵලයට නියතවූ පුද්ගලයෝ විසිහතර දාහකට වැඩි වෙත්.

'තවද සකෘදාගාමී පුද්ගලයෝ ඇත්තාහුය. මේ අනිකුත් පිරිසද කුසල් කළ ඇත්තෝය යනු මගේ අදහසයි. මුසාවාදයට බිය නිසා ඒ ගණන නියම කරන්ට නොහැක්කෙමි."

28. "ස්වාමීනි, සනන් කුමාර බ්‍රහ්මතෙම මේ කාරණය කීය. ස්වාමීනි, සනන් කුමාර බ්‍රහ්මතෙම මේ කාරණය කියද්දී වෙසමුණු මහරජහුට මෙබඳු කල්පනාවක් උපන්නේය. 'පින්වත්නි

ඒකාන්තයෙන් පුදුමයෙකි, පින්වත්නි, ඒකාන්තයෙන් ඉතා පුදුමයෙකි. මෙබඳුවූම මහත්වූ (උදාරවූ) ශාස්තෲන් වහන්සේ කෙනෙක් වන්නේද, මෙබඳුවූ මහත්වූ ධර්ම දේශනාවක් වන්නේද, මෙබඳුවූ මහත්වූ මාර්ගඵල පෙණෙන්නාහුදැයි' කියායි.

"ස්වාමීනි, එවිට සනන් කුමාර බ්‍රහ්මතෙම වෙසමුණු මහ රජුගේ සිතේ පැවති අදහස තමන්ගේ සිතින් දැනගෙන වෙසමුණු මහරජුහට මෙසේ කීය. "පින්වත් වෙසුමුණු මහ රජ, මේ කාරණය කුමකැයි සිතන්නේද? අතීත කාලයෙහිද මෙබඳු මහත් ශාස්තෲ කෙනෙක් වූහ. මෙබඳු මහත් ධර්ම දේශනාවක් විය. මෙබඳු මහත් මාර්ගඵල පෙණුනාහුය. මතු කාලයෙහිද මෙබඳු ශාස්තෲ කෙනෙක් වන්නාහුය. මෙබඳු මහත් ධර්මදෙශනාවක් වන්නේය. මෙබඳු මහත් මාර්ගඵල පෙණෙන්නේය' කියායි.

**29** 'සනන් කුමාර බ්‍රහ්මතෙමේ මේ කරණය තව්තිසා වැසි දෙවියන්ට කියේය. තව්තිසා වැසි දෙවියන්ට කියන්නාවූ සනත් කුමාර බ්‍රහ්මයාගේ ඉදිරිපිටදී මේ කාරණය වෙසමුණු මහරජු අසා, ඔහුගේ ඉදිරියේදීම පිළිගෙන තමන්ගේ පිරිසෙහිදී කීයේය."

තමන්ගේ පිරිසෙහිදී කියන්නාවූ වෙසමුණු මහරජුගේ ඉදිරිපිටදීම මේ කාරණය ජනවසභ දෙවිතෙම අසා ඔහුගේ ඉදිරිපිටදී පිළිගෙන භාග්‍යවතුන් වහන්සේට කීවේය. මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ ජනවසභ දෙවියාගෙන් අසා ඔහු ඉදිරිපිටදී පිළිගෙන ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට වදාළේය. භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරිපිටදී අසා, උන්වහන්සේගේ ඉදිරිපිටදී පිළිගෙන ආනන්දස්ථවිරයන් වහන්සේ භික්ෂූන්ට හා භික්ෂුණීයන්ටද, උපාසකයන්ට හා උපාසිකාවන්ටද කීවෝය.

"ඒ මේ ශාසන මාර්ගයවූ උතුම් හැසිරීම යම් පමණ දෙවි මිනිසුන් විසින් හොඳින් ප්‍රකාශ කරන ලද්දේද, ඒ තරමට වැඩෙයි. දියුණුවෙයි, පතළවූයේ වෙයි. බොහෝ ජනපද අතර ප්‍රසිද්ධියට පැමිණියේ වෙයි. ස්ථිරභාවයට පැමිණියේද වේයයි" වදාළෝය.

(18 වැනි වූ ජනවසභ සූත්‍රය නිමියේය.)

---

## 19. මහා ගොවින්ද සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ගිජ්ජකූට පර්වතයෙහි වැඩ වසනසේක. ඉක්බිති පඤ්චශිඛ නම් ගාන්ධර්ව දිව්‍යපුත්‍රයා රාත්‍රියේ මධ්‍යම යාමයෙහි නොයෙක් පාටින් මුලු ගිජ්ජකූට පර්වතය බබුලුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන්වහන්සේ හොඳින් වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටියාවූ පඤ්චශිඛ ගාන්ධර්ව දිව්‍යපුත්‍රයා භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දැන්නුවේය. "ස්වාමීන් වහන්ස, මා විසින් තව්තිසා වැසි දෙවියන්ගේ සම්මුඛයෙන් යමක් අසන ලද්දේද, පිළිගන්නා ලද්දේද, ස්වාමීන් වහන්ස, ඒ කාරණය භාග්‍යවතුන්වහන්සේට කියමියි' දැන්වීය. 'පඤ්චශිඛය, තෝ මට ඒ කාරණය දන්වවයි" භාග්‍යවතුන් වහන්සේ වදාළේය.

2 "ස්වාමීන් වහන්ස, දවස් කීපයකට පෙර පැමිණි පසළොස්වක් පෝය ඇති වස් පවාරණය කරන සම්පූර්ණවූ හඳ ඇති රාත්‍රියෙහි සියලු තව්තිසා වැසි දෙවියෝ සුධර්මා සභාවෙහි රැස්ව එක්ව උන්නාහු වෙත්. මහත් දිව්‍ය පිරිසක් හාත්පසින් උන්නාහු වෙත්. සතර වරම් මහ රජවරු සතර දිගින් උන්නාහ. නැගෙනහිර දෙසින් ධෘතරාෂ්ට්‍ර මහරජ තෙමේ බස්නාහිර දෙසට මූණලා දෙවියන් පෙරටුකොට උන්නේය. දකුණුදිග විරූළ්හක මහරජ තෙමේ, උතුරුදිගට මූණලා දෙවියන් පෙරටුකොට උන්නේය. බස්නාහිර දෙසින් විරූපාක්ෂ රජතෙමේ නැගෙනහිර දිගට මූණලා දෙවියන් පෙරටුකොට උන්නේය. උතුරුදිග වෛශ්‍රවණ රජතෙමේ දකුණුදිගට මුහුණ ලා දෙවියන් පෙරටුකොට උන්නේය. ස්වාමීන් වහන්ස, යම් කලෙක්හි සියලු තව්තිසා වාසී දෙවියෝ සුධර්මා නම් දිව්‍ය සභාවෙහි රැස්ව එක්වසිටියෝ වෙත්ද, මහා දෙව් පිරිසක් හාත්පසින් එක්ව උන්නාහු වෙත්ද, මෙසේ ඔවුන්ගේ ආසන වේ. අනතුරුව පසුභාගයෙහි අපගේ ආසන වේ. ස්වාමීන්වහන්ස, යම් ඒ දෙව් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේගේ බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර තව්තිසා දිව්‍ය ලෝකයෙහි අලුත උපන්නාහුද, ඔව්හු ශරීර වර්ණයෙන් හා යසසින්ද අනික් දෙවියන්ට වැඩිය බබලන්නේය.

ස්වාමීන් වහන්ස, ඒ කාරණයෙන් තව්තිසා වැසි දෙවියෝ සතුටු සිත් ඇත්තෝ වෙත්, ප්‍රමුදිත සිත් ඇත්තෝ වෙත්, හටගත් ප්‍රීති හා සොම්නස් ඇත්තෝ වෙත්.”

“පින්වත්නි, ඒකාන්තයෙන් දිව්‍ය සමූහයා දියුණුවෙත්. අසුර සමූහයා පිරිහෙත්ය” කියායි

3 ‘ස්වාමීන්වහන්ස, එකල්හි සක්දෙව්ඳු තෙමේ තව්තිසා වාසී දෙවියන්ගේ පැහැදීම දැනගෙන මේ ගාථාවලින් සතුටු විය. ‘පින්වත්නි, ඒකාන්තයෙන් ඉන්ද්‍රයා (ශක්‍රයා) සහිතවූ තව්තිසා වැසි දෙවියෝ තථාගතයන් වහන්සේටද ධර්මයටද සංඝයාටද නමස්කාර කරමින් ප්‍රීති වෙත්. උසස් ශරීර වර්ණ ඇත්තාවූද, යසස් ඇත්තාවූද අලුත් දෙවියන් දැක්කාහ. සුගතයන් වහන්සේ කෙරෙහි උතුම් හැසිරීම කොට මේ දෙව්ලොවට පැමිණියාවූ ඒ දිව්‍යපුත්‍රයෝ ශරීරයේ පාටින්ද යසසින් හා ආයුෂයෙන්ද අන්‍ය දෙවියන් ඉක්මවා බබලන්නාහ. විශාල ප්‍රඥා ඇති භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෝ මේ දිව්‍යලෝකයෙහි විශෙෂ බවට පැමිණියාහුය. සක්‍රයා සහිතවූ තව්තිසා වැසි දෙවියෝ මේ කාරණය දැක තථාගතයන් වහන්සේටද ධර්මයටද සංඝයාටද වඳිමින් ප්‍රීති වෙත්.

“ස්වාමීන් වහන්ස, ඒකාරණය හේතුකොටගෙන තව්තිසා දෙවියෝ බොහෝසෙයින්ම සතුටු සිත් ඇත්තෝ ප්‍රමුදිත සිත් ඇත්තෝ හටගත් සතුට ඇත්තෝ වෙත්.”

“පින්වත්නි, ඒකාන්තයෙන් දිව්‍ය සමූහයා දියුණු වෙත්. අසුරයෝ පිරිහෙත්ය” කියායි.

4 “ස්වාමීන් වහන්ස, නැවත සක්‍ර දෙවෙන්ද්‍ර තෙමේ තව්තිසා වැසි දෙවියන්ගේ යහපත් පැහැදීම් දැනගෙන ඒ තව්තිසා වැසි දෙවියන්ට කථාකර මෙසේ කීවේය “දෙව්වරුනි, ඒ භාග්‍යවතුන් වහන්සේගේ සත්‍ය ගුණ අට අසන්නට කැමැත්තාහුදැයි” ඇසීය.

“නිදුකාණෙනි, අපි ඒ භාග්‍යවතුන් වහන්සේගේ සත්‍ය ගුණ අට අසන්නට කැමැත්තෙමුයි” කීවාහුය. ස්වාමීන් වහන්ස, එකල්හි, සක්‍රදෙවේන්ද්‍රතෙමේ තව්තිසා වැසි දෙවියන්ට භාග්‍යවතුන් වහන්සේගේ සත්‍යවූ ගුණ අට ප්‍රකාශ කෙළේය.”

5 "පින්වත්නි, තව්තිසා වැසි දෙවියෝ ඒ කුමක්දැයි සිතත්ද, ඒ භාග්‍යවතුන් වහන්සේ බොහෝ දෙනාට වැඩ පිණිසද බොහෝ දෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද, දෙව් මිනිසුන්ගේ ප්‍රයෝජනය පිණිසද වැඩ පිණිසද, සැප පිණිසද පවතින්නේ වේද, මෙසේ බොහෝ දෙනාට වැඩ පිණිසද, බොහෝ දෙනාට සැප පිණිසද, ලොවට අනුකම්පා පිණිසද, දෙව් මිනිසුන්ගේ ප්‍රයෝජනය පිණිසද, වැඩ පිණිසද, සැප පිණිසද, පවතින්නාවූ, මේ අංගයෙන් යුක්තවූ ශාස්තෘ කෙනෙකු ඒ භාග්‍යවතුන් වහන්සේ හැර අතීතයෙහි නොමදක්නෙමු. මේ කාලයෙහිද නොම දක්නෙමු.

6 "ඒ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය වූකලී මනාකොට ප්‍රකාශ කරන ලද්දේය. මේ ආත්ම භාවයෙහි ලැබිය යුතු ඵල ඇත්තේය, කල් නොයවා ලැබියහැකි ඵල ඇත්තේය. එව බලවයි පෙන්විය හැකි ගුණ ඇත්තේය. නුවනැත්තන් විසින් තම තමන් කෙරෙහි ලා දත යුත්තේය. නුවණින් එළඹ බැලියයුතුවූ ධර්මයක් දේශනා කරන්නාවූ මේ අංගයෙන් යුක්තවූ ශාස්තෘ කෙනෙකු භාග්‍යවතුන් වහන්සේ හැර අතීත කාලයෙහිද නොම දැක්කෙමු. මේ කාලයෙහිද නොම දක්නෙමු

7 "මේ කුසලයයි ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් හොඳින් ප්‍රකාශ කරන ලද්දේය. මේ අකුසලයයි හොඳින් ප්‍රකාශකරන ලද්දේය මේ වරදය, මේ නිවරදය, මේ සේවනය කළයුතු ධර්මය, මේ සේවනය නොකටයුතු ධර්මය, මේ හීන (ලාමක) ධර්මය. මේ උතුම් ධර්මය, මේ කුසලාකුසල ධර්මයන්ට සමාන ධර්මයෝයයි කියා හොඳින් ප්‍රකාශ කරන ලද්දේය. මේ කුසල්ය, මේ අකුසල්ය, මේ වරදය, මේ නිවරදය, මේ සේවනය කටයුත්තය, මේ සේවනය නොකටයුත්තය, මේ හීනය, මේ උත්තමය, මේ කුසලාකුසල ධර්මයන්ට සමාන ධර්මය යන මේ ධර්මයන් ප්‍රකාශ කරන්නාවූ මේ අංගයෙන් යුක්තවූ ශස්තෘ කෙනෙකු තථාගතයන් වහන්සේ හැර අතීතයෙහිද නොදන්නෙමු, මේ වර්තමානයෙහිද නොමදක්නෙමු

8. "ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ශ්‍රාවකයන්ට නිර්වාණයට පැමිණෙන පිළිවෙත හොඳින් ප්‍රකාශ කරන

ලද්දේය. ඒ නිර්වාණයත් මාර්ගයත් දෙක හොඳින් සංසන්දනයවේ. (ගැළපේ) යම්සේ ගංගානම් ගඟෙහි ජලය යමුනා ගඟෙහි ජලය හා එකතු වේද එසේම භාග්‍යවතුන් වහන්සේ විසින් ශ්‍රාවකයන්ට නිවන් යන ප්‍රතිපදාව මනාකොට ප්‍රකාශ කරන ලද්දීය. ඒ නිර්වාණය හා පිළිවෙත හොඳින් ගැළපේ මෙසේ නිර්වාණයට පැමිණෙන පිළිවෙතක් ප්‍රකාශ කරන්නාවූ මේ අංගයෙන් යුක්තවූ ශාස්තෘ කෙනෙකු ඒ භාග්‍යවතුන් වහන්සේ හැර අතීතයෙහිද නොමදක්නෙමු. මේ වර්තමානයෙහිද නොම දක්නෙමු.

**9** "ඒ භාග්‍යවතුන් වහන්සේ මාර්ගඵල ලාභීන්ගේද වැස නිමවන ලද උතුම් හැසිරීම ඇත්තාවූ රහතුන් වහන්සේලාගේද ලබනලද සහයෝගය ඇත්තේමය. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒ ආයුෂ්මත් පුද්ගලයන් සිතින් දුරු නොකොට එක්ව වාසය කිරීමෙහි කැමැත්ත ඇතිව වාසය කරනසේක. මෙසේ ඒකාරාමතාවයෙහි යෙදුනාවූ මේ අංගයෙන් යුක්තවූ ශාස්තෘ කෙනෙකු තථාගතයන් වහන්සේ හැර අතීතයෙහිද නොම දක්නෙමු මේ වර්තමානයෙහිද නොමදක්නෙමු.

**10** "ඒ භාග්‍යවතුන්වහන්සේට කීර්තියද මනාලෙස උපන්නේය. බොහෝවූ ලාභ උපන්නේය. ක්ෂත්‍රියයන්ගේ පටන් සියල්ලෝම උන්වහන්සේට ප්‍රියවෙමින් සතුටුවෙමින් වාස කරත්. පහවූ මාන මදාදිය ඇතුව ඒ භාග්‍යවතුන් වහන්සේ ආහාර ගනිත්. මෙසේ මාන මදාදිය නැතිව ආහාර ගන්නාවූ මේ අංගයෙන් යුක්තවූ ශාස්තෘ කෙනෙකු තථාගතයන් වහන්සේ හැර අතීත කාලයෙහිද නොම දක්නෙමු. මේ කාලයෙහිද නොම දක්නෙමු.

**11.** "ඒ භාග්‍යවතුන් වහන්සේ යම් පරිද්දෙකින් (ධර්මානු ශාසනා) කියත්ද, එසේම කරන්නාහ. යම්සේ කටයුතු කරන සේක්ද එසේම කියනසේක. යම්සේ කියන්නේද එසේ කරන්නාවූ යම්සේ කරන්නේද එසේ කියන්නාවූදැයි මෙසේ ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙන් යුක්තවූ මේ අංගය ඇති ශාස්තෘවරයෙකු ඒ භාග්‍යවතුන් වහන්සේ හැර අතීත කාලයෙහිද නොම දක්නෙමු. මේ කාලයෙහිද නොම දක්නෙමු

12. "ඒ භාග්‍යවතුන් වහන්සේ පහ කරණලද සැක ඇත්තේය. පහවූ "කෙසේද කෙසේදැ" යි පැවති සැක ඇත්තේය. සම්පූර්ණවූ සියලු අදහස් ඇත්තේය. ආර්‍ය්‍ය මාර්ගයෙන් සියලු කෙලෙස් වැනසූසේක. මෙසේ දුරු කළ සැක ඇත්තාවූ පහව ගිය 'කෙසේද කෙසේදැ' යි පැවති සැක ඇත්තාවූ සම්පූර්ණ මනොරථ ඇත්තාවූ ආර්‍ය්‍ය මාර්ගයෙන් කෙලෙස් දුරු කළාවූ මේ අංගයෙන් යුක්තවූ ශාස්තෘ කෙනෙකු භාග්‍යවතුන් වහන්සේ හැර අතීත කාලයෙහිද නොම දක්නෙමු. මේ වර්තමානයෙහිද නොම දක්නෙමු.

"ස්වාමීන් වහන්ස, සක්දෙවිඳු තව්තිසා වැසි දෙවියන්ට භාග්‍යවතුන්වහන්සේගේ මේ සත්‍යගුණ අට ප්‍රකාශ කෙළේය. ස්වාමීන්වහන්ස, මේ කාරණයෙන් තව්තිසා වැසි දෙවියෝ භාග්‍යවතුන් වහන්සේගේ සත්‍ය ගුණ අට අසා බොහෝ සෙයින්ම සතුටු සිත් ඇත්තෝවෙත්, ප්‍රමුදිත සිත් ඇත්තෝ වෙත්, හටගත් ප්‍රීතිසහගත සිත් ඇත්තෝ වෙත්.

13 "ස්වාමීන් වහන්ස, ඒ දෙව සමාගමයෙහි සමහර දෙවි කෙනෙක් මෙසේ කීහ "නිදුකාණෙනි, ගෞතම භාග්‍යවතුන් වහන්සේ මෙන් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේලා හතර නමක් ලෝකයෙහි උපදින්නාහු නම් ධර්මයත් දෙශනා කරන්නාහු නම් ඉතා යහපත්ය. ඒ භාග්‍යවතුන් වහන්සේලාගේ පහළවීම බොහෝදෙනාට වැඩ පිණිසද, සැප පිණිසද, ලොවට අනුකම්පා පිණිසද, දෙවි මිනිසුන්ගේ ප්‍රයෝජනය පිණිසද, වැඩ පිණිසද, සැප පිණිසද වන්නේයයි" කීවාහුය. සමහර දෙවිකෙනෙක් මෙසේ කීහ. 'නිදුකානෙනි, සම්‍යක් සම්බුද්ධයන් වහන්සේලා සතර නමක් සිටිත්වා! නිදුකානෙනි ගෞතම භාග්‍යවතුන් වහන්සේ මෙන් භාග්‍යවතුන් වහන්සේලා තුන් නමක් ලෝකයෙහි උපදින්නාහු නම් ධර්මයත් දේශනා කරන්නාහු නම් ඒ සම්මා සම්බුදුන් වහන්සේලාගේ පහළවීම බොහෝදෙනාට වැඩ පිණිසද, බොහෝදෙනාට සැප පිණිසද, ලොවට අනුකම්පා පිණිසද, දෙවි මිනිසුන්ගේ ප්‍රයෝජනය පිණිසද, වැඩ පිණිසද, සැප පිණිසද වන්නේයයි' කීහ. සමහර දෙවිකෙනෙක් මෙසේ කීහ. "නිදුකානෙනි, සම්මා සම්බුදුන් වහන්සේලා තුන් නම සිටිත්වා! නිදුකානෙනි, මේ කාලයෙහි ගෞතම භාග්‍යවතුන් වහන්සේ මෙන් සම්මා සම්බුදුන් වහන්සේලා දෙනමක්

ලෝකයෙහි උපදින්නාහු නම් ධර්මයත් දේශනා කරන්නාහු නම්, ඉතා හොඳය. බුදුරජාණන් වහන්සේලාගේ ඒ පහළ වීම බොහෝදෙනාට වැඩ පිණිසද සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙව් මිනිසුන්ගේ ප්‍රයෝජනය පිණිසද, වැඩ පිණිසද සැප පිණිසද වන්නේය' කියායි.

14. "ස්වාමීන්වහන්ස, මෙසේ කීකල්හි සක් දෙවිඳු තෙමේ තව්තිසා වැසි දෙවියන්ට මේ කාරණය කීවේය 'නිදුකානෙනි, එක් ලෝක ධාතුවෙක්හි, අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේලා දෙනමක් එක් කාලයේදී උපදින්නාහුය යන මීට හෙතුවක් අවකාශයක් නැත්තේමය. 'නිදුකාණෙනි, ඒ භාග්‍යවතුන් වහන්සේ ආබාධයක් නැතිව රොගයක් නැතිව බොහෝ දිගු කාලයක් වැඩ සිටින්නේ නම් ඉතා යෙහෙක. ඒ කාරණය බොහෝදෙනාට සැප පිණිසද බොහෝදෙනාට වැඩ පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙව් මිනිසුන්ගේ ප්‍රයෝජනය පිණිසද, වැඩ පිණිසද, සැප පිණිසද පවත්නේය, කියායි. ස්වාමීන්වහන්ස, ඊට පසුව යම් කාරණයක් නිසා තව්තිසා වැසි දෙවියෝ සුධර්මා දිව්‍ය සභාවෙහි රැස්වූවාහුද එක්වූවාහුද, ඒ කාරණය සිතා ඒ කාරණය කථාකොට කියන ලද වචන කරන්නාවූ අනුශාසනා කරනලද අනුශාසනා කරන්නාවූ ඒ සතරවරම් මහරජහු ඒ කාරණයෙහි පවතින්නාහු නැගිට නොගොස් ස්වකීය ආසනයන්හිම සිටියාහුය

"ඒ කියනලද වචන ඇත්තාවූ ඒ සතරවරම් මහරජහු අනුශාසනාව භාරගෙන අතිශයින් පැහැදුන සිත් ඇතුවම තමන්ගේ ආසනයෙහිම සිටියාහුය."

15. "එකල්හි ස්වාමීන්වහන්ස, දෙවියන්ගේ දේවානුභාවය ඉක්මවා උතුරු දිසාවෙහි මහත් එළියක් හටගත්තේය. මහත් දීප්තිමත් භාවයක් පහළ විය. ස්වාමීන් වහන්ස, එකල්හි සක්දෙවිඳු තෙමේ තව්තිසා වැසි දෙවියන්ට කථාකර මෙසේ කීවේය. 'නිදුකානෙනි, යම් දිශාවකින් පෙරනිමිති දක්නා ලැබෙත්ද, ආලෝකයක් හටගනීද, මහත් දීප්තියක් හටගනීද, ඒ දිසාවෙන් බ්‍රහ්ම තෙමේ පහළ වන්නේය. මහාබ්‍රහ්මයාගේ පහළවීමට මේ පූර්ව නිමිත්තයයි' කීයේය. එනම්, යම් මේ ආලෝකයක් හටගනී

නම් බැබලීමක් පහළවේ නම් එයයි. යම්සේ නිමිති දක්නා ලැබේ නම් එය බ්‍රහ්ම රාජයාගේ පහළවීම වන්නේය. ඒ පැතිර පවත්නාවූ මහත් ආලෝකය මහාබ්‍රහ්මයාගේ පහළවීමට පූර්වනිමිත්ත වන්නේය.'

"ස්වාමීනි, ඊට පසුව තව්තිසා වැසි දෙවියෝ 'මේ ආලෝකය දැනගන්නෙමු. ඒ සම්බන්ධව යම් ඵලයක් වන්නේ නම් එය ප්‍රත්‍යක්ෂකොට දැනගෙන යන්නෙමුයි' කියා තම තමන්ගේ ආසනවලම සිටියාහුය. සතරවරම් මහරජවරුද එසේම මේ ආලෝකය දැනගන්නෙමු. මේ සම්බන්ධව යම් ප්‍රතිඵලයක් වන්නේ නම් එය හොඳින් දැනගෙනම යන්නෙමුයි' සිතා තම තමන්ගේ ආසනවලම සිටියාහුය. මේ කාරණය අසා තව්තිසා වැසි දෙවියෝ 'මේ ආලෝකය දැනගන්නෙමු. යම් ඵලයක් වන්නේ නම් එයත් ප්‍රත්‍යක්ෂකොටම දැනගෙනම යන්නෙමුයි' කියා එකඟවූහ.

**16.** "ස්වාමීන්වහන්ස, යම් කලෙක්හි සනන් කුමාර බ්‍රහ්මතෙමේ තව්තිසා දිව්‍ය ලෝකයෙහි පහළ වන්නේද, එකල්හි මහත් ශරීරයක් මවාගෙන පහළ වෙයි. ස්වාමීනි, බඹහුගේ යම් ඒ ප්‍රකෘති ශරීරයක් වේද, එය තව්තිසා වැසි දෙවියන්ගේ ඇස්වලින් දක්නට නොහැකි වෙත්. ස්වාමීන් වහන්ස, යම් කලෙක්හි සනන් කුමාර බ්‍රහ්මතෙමේ තව්තිසා වැසි දෙවියන් අතර පහළවේද, ඒ බ්‍රහ්මතෙමේ අන් දෙවියන් තමාගේ ශරීරයේ පාටින්ද යසසින්ද මැඩපවත්වා වැඩියක් බබලයි. ස්වාමීනි, රත්රන් රූපය යම්සේ මනුෂ්‍ය රූපය ඉක්මවා වැඩියක් බබලාද, ස්වාමීන්වහන්ස, එපරිද්දෙන්ම යම් කලෙක්හි සනත් කුමාර බ්‍රහ්මතෙමේ ශරීර පාටෙන් යසසින් අනිත් දෙවියන් මැඩපවත්වා වැඩියක් බබලයි

"ස්වාමීන් වහන්ස, යම් කලෙක්හි සනන් කුමාර බ්‍රහ්ම තෙමේ තව්තිසා වැසි දෙවියන් අතර පහළවේද, එකල්හි, ඒ පිරිසෙහි කිසි දෙව් කෙනෙක් ඔහුට වැඳීමක් හෝ දැක හුනස්නෙන් නැගී සිටීමක් නොකෙරේ ආසනයක් හෝ නොදෙයි. සනන් කුමාර බ්‍රහ්මතෙමේ යම් දෙවියෙකුගේ ආසනයක හිඳීමට කැමැති වන්නේද ඒ දෙවිහුගේ ආසනයෙහි

සනත් කුමාර බ්‍රහ්මතෙමේ හිඳිනේයයි ඒ සියලු දෙවියෝම නිශ්ශබ්දවූවෝ අත්දෙක එකට තබා වැඳගත්තෝ ආසනවලම හිඳිත්. ස්වාමීන් වහන්ස, සනත් කුමාර බ්‍රහ්ම තෙමේ යම් දෙවියෙකුගේ ආසනයෙහි හිඳගන්නේද, ඒ දෙවි තෙමේ මහත්වූ සතුටක් ලබන්නේය. ස්වාමීන් වහන්ස, අලුත රාජ්‍යයෙන් අභිෂෙක කරනලද ඔටුණු පළන් ක්ෂත්‍රිය රජෙක් මහත්වූ ප්‍රීතියක් ලබන්නේද, මහත්වූ සැපයක් විඳින්නේද, ස්වාමීන් වහන්ස, එපරිද්දෙන්ම සනත් කුමාර බ්‍රහ්මතෙමේ යම් දෙවියෙකුගේ ආසනයෙහි හිඳීද, ඒ දෙවිතෙමේ මහත්වූ ප්‍රීතියක් ලබන්නේය, මහත්වූ සැපයක් විඳින්නේය.

17. "ස්වාමීන් වහන්ස, එකල්හි සනත් කුමාර බ්‍රහ්ම තෙමේ තව්තිසා වැසි දෙවියන්ගේ යහපත් පැහැදීම දැනගෙන අතුරුදහන්වී, මේ ගාථාවලින් අනුමෝදන් කෙළේය.

'පින්වත්නි, සක්දෙවිඳු ප්‍රධාන කොට ඇති දෙවියෝ තථාගතයන් වහන්සේටද ධර්මයටද සුප්‍රතිපන්න සංඝයාටද වඳිමින් සතුටුවෙත්.

"සුගතයන් වහන්සේ කෙරෙහි බ්‍රහ්මචය්‍ය්‍යාව කොට මේ දෙව්ලොවට උත්පත්ති වශයෙන් පැමිණියාවූ වර්ණවත්වූ යසස් ඇත්තාවූ අලුත් දෙවියන් දක්නාහුය.

"ඒ දේවතාවෝ වර්ණයෙන්ද, යසසින්ද, ආයුෂයෙන්ද, අනික් දෙවියන් ඉක්මවා බබලත්, මහත් ප්‍රඥා ඇති ශාස්තෲන් වහන්සේගේ ඒ ශ්‍රාවකයෝ මේ දෙව්ලොව විශෙෂ භාවයට පැමිණියාහුය.

"ඉන්ද්‍රයා (ශක්‍ර) ප්‍රධානකොට ඇති දෙවියෝ මේ කාරණය දැක තථාගතයන් වහන්සේටද ධර්මයටද සුප්‍රතිපන්න සංඝයාටද වඳිමින් සතුටුවෙත්" කියායි.

18. "ස්වාමීන් වහන්ස, සනත් කුමාර බ්‍රහ්මතෙමේ මේ කාරණය කීයේය. ස්වාමීන් වහන්ස, මේ වචන කියන්නාවූ සනත් කුමාර බ්‍රහ්මයාගේ ශබ්දය අංග අටකින් යුක්තවේ. පීඩාවක් නැතුව මනාකොට නික්මෙන විස්සට්ඨ නම් ස්වරයද වහා අර්ථය අවබෝධ කරන්නාවූ විඤ්ඤෙය්‍ය නම් ස්වරයද, මෘදු ගුණ යුක්තවූ

මඤ්ජු නම් ස්වරයද, ඇසීමට මිහිරිවූ ස්වර්ණය නම් ස්වරයද, එක ඝනවූ බින්දු නම් ස්වරයද, නොවිසිර පවත්නාවූ අවිසාරී නම් ස්වරයද, ගම්භීර නම් ස්වරයද, මිහිරිවූ නින්නාදී නම් ස්වරයද යන අටයි. ස්වාමීනි, සනත් කුමාර බ්‍රහ්මතෙමේ පිරිසේ ප්‍රමාණයට ශබ්ද නගයි. බ්‍රහ්ම රජහුගේ ඝෝෂාව පිරිසෙන් පිටත නොයයි. ස්වාමීන්වහන්ස, යමෙකුගේ ස්වරය මෙසේ අංග අටකින් සමන්විත වේද ඒ ස්වරය බ්‍රහ්ම ස්වරයයි කියනු ලැබේ.

19. "ස්වාමීන් වහන්ස අනතුරුව තව්තිසා වැසි දෙවියෝ සනන් කුමාර බ්‍රහ්මයාට මේ කාරණය කීයේය "මහා බ්‍රහ්මය, හොඳයි, අපි මේ මතු කියනු ලබන කාරණය දැනගෙනම සතුටුවෙමු. ශක්‍රදේවේන්ද්‍රයා විසින් කියනලද ඒ භාග්‍යවතුන් වහන්සේගේ සත්‍යවූ ගුණ අටක් ඇත්තාහුය අපි ඒ ගුණ දැනගෙණම ප්‍රීතිවෙමුයි" කීවාහුය. ස්වාමීන් වහන්ස, ඊට පසුව සනන් කුමාර බ්‍රහ්මතෙමේ සක්දෙවිඳු හට මේ කාරණය කීවේය. "දේවේන්ද්‍රය, අපිද ඒ භාග්‍යවතුන් වහන්සේගේ සත්‍යවූ ගුණ අට අසන්නෙමු නම් යහපත්ය මහා බ්‍රහ්මය ඒ මැනවැයි' සක්දෙවිඳු තෙමේ සනන් කුමාර බ්‍රහ්මයාට භාග්‍යවතුන් වහන්සේ පිළිබඳවූ සත්‍ය ගුණ අට ප්‍රකාශ කෙළේය.

20 "පින්වත් මහා බ්‍රහ්මතෙමේ ඒ කුමකැයි සිතාද ඒ භාග්‍යවතුන් වහන්සේ දීර්ඝ කාලයක් බොහෝ දෙනාට වැඩ පිණිසද බොහෝදෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවි මිනිසුන්ගේ ප්‍රයෝජනය පිණිසද වැඩ පිණිසද, සැප පිණිසද යම්සේ පිළිපැද්දෝද, මෙසේ බොහෝදෙනාට වැඩ පිණිසද, බොහෝදෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවි මිනිසුන්ගේ ප්‍රයෝජනය පිණිසද, වැඩ පිණිසද පිළිපන්නාවූ මේ අංගයෙන් යුක්තවූ ශාස්තෘ කෙනෙකු ඒ භාග්‍යවතුන් වහන්සේ හැර අතීත කාලයෙහිද මේ කාලයෙහිද නොම දක්නෙමු

21. "ඒ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය මනාකොට ප්‍රකාශ කරන ලද්දේය. මේ ආත්ම භාවයෙහි ලැබියයුතු ඵල ඇත්තේය කල් නොයවා ලැබිය හැකි ඵල ඇත්තේය. 'එව, බලවයි' පෙන්විය හැකි ගුණ ඇත්තේය. නුවණැත්තන් විසින් තම තමන් කෙරෙහි

ලා දත යුත්තේය. මෙසේ නුවණින් එළඹ බැලිය යුතුවූ ධර්මයක් දේශනා කරන්නාවූ මේ අංගයෙන් යුක්තවූ ශාස්තෘ කෙනෙකු ඒ භාග්‍යවතුන් වහන්සේ හැර වෙන කෙනෙක් අතීත කාලයෙහිත් මේ වර්තමාන කාලයෙහිත් නොම දක්නෙමු.

22 "මේ කුසලයයි, ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට ප්‍රකාශ කරන ලද්දේය. මේ අකුසලයයි මනා කොට ප්‍රකාශ කරන ලද්දේය මේ වරදය, මේ නිවරදය, මේ සේවනය කළයුතු ධර්මය, මේ සේවනය නොකළයුතු ධර්මය, මේ ලාමක ධර්මය, මේ උතුම් ධර්මය, මේ කුසලාකුසල ධර්මයන්ට සමාන ධර්මයෝයයි යහපත් ලෙස ප්‍රකාශ කරන ලද්දේය. මෙසේ කුසල්, අකුසල්, වරද, නිවරද, සේවනය කටයුත්ත, සේවනය නොකටයුත්ත, හීන, උත්තම කුසලා කුසල ධර්මයන්ට සමාන ධර්මය යන මේ ධර්මයන් ප්‍රකාශ කරන්නාවූ මේ අංගයෙන් යුක්තවූ ශාස්තෘ කෙනෙකු ඒ භාග්‍යවතුන් වහන්සේ හැර අතීතයෙහිද දැන් කාලයෙහිද නොම දක්නෙමු.

23. "ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ශ්‍රාවකයන්ට නිර්වාණ ගාමිණී ප්‍රතිපදාතොමෝ මනාකොට පණවන ලද්දීය. ඒ ප්‍රතිපදාවද නිර්වාණයට ගැළපේ ගංගා නම් ගඟෙහි ජලය යම්සේ යමුනා ගඟෙහි ජලය හා එකතු වේද එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ විසින් ශ්‍රාවකයන්ට යහපත් ලෙස ප්‍රකාශ කරනලද නිර්වාණගාමිණී ප්‍රතිපදාවත් නිර්වාණයත් යන දෙක සංසන්දනය වේ. (ගැළපේ) මෙසේ නිර්වාණගාමිණී මාර්ගය ප්‍රකාශ කරන්නාවූ මේ අංගයෙන් යුක්තවූ ඒ භාග්‍යවතුන් වහන්සේ හැර අන්‍ය ශාස්තෘවරයෙකු අතීත කාලයෙහිද මේ වර්තමානයෙහිද නොම දක්නෙමු

24. "ඒ භාග්‍යවතුන් වහන්සේ ශෛක්ෂයන්ගේද (සෝවාන් සකෘදාගාමි අනාගාමි පුද්ගලයන්ගේද) වැස නිමවන ලද බඹසර ඇති රහතුන්ගේද ලබනලද සහාය ඇත්තේය. භාග්‍යවතුන් වහන්සේ ඒ ශෛක්ෂාදීන් (සෝවාන් සකෘදාගාමි අනාගාමි ආදින්) සිතින් පවා දුරු නොකොට ඵල සමාපත්තියෙහි යෙදී වාසය කරනසේක. මෙසේ ඵල සමාපත්තියෙහි යෙදුනාවූ මේ අංගයෙන් යුක්තවූ ඒ භාග්‍යවතුන් වහන්සේ හැර අන්‍ය

ශාස්තෘන් වහන්සේ කෙනෙකු අතීතයෙහිද, මේ වර්තමානයෙහිද නොම දක්නෙමු.

**25** "ඒ භාග්‍යවතුන් වහන්සේට මහත් ලාභය උපන්නේය. කීර්තියද උපන්නේය, ක්ෂත්‍රියාදි සියල්ලෝ භාග්‍යවතුන් වහන්සේට ප්‍රිය කරමින් වාසය කෙරෙත්. ඒ භාග්‍යවතුන්වහන්සේ පහවූ මාන මද ආදිය ඇතිව ආහාර ගන්නා සේක. මෙසේ පහවූ මාන මද ඇතිව ආහාර ගන්නාවූ මේ අංගයෙන් යුක්තවූ ශාස්තෘකෙනෙකු ඒ භාග්‍යවතුන්වහන්සේ හැර අතීත කාලයෙහිද මේ වර්තමාන කාලයෙහිද නොම දක්නෙමු

**26** "ඒ භාග්‍යවතුන් වහන්සේ යම්සේ කියන සේක්ද එසේම කරන සේක. යම්සේ කරන සේක්ද එසේම කියන සේක. යම්සේ කියන සේක්ද එසේම කරන සේක. යම්සේ කරනසේක්ද එසේම කියනසේකැයි මෙසේ ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙන් යුක්තවූ මේ අංගයෙන් සමන්විතවූ ඒ භාග්‍යවතුන් වහන්සේ හැර වෙන කෙනෙකු අතීත කාලයෙහිද මේ වර්තමානයෙහිද නොම දක්නෙමු.

**27** "ඒ භාග්‍යවතුන් වහන්සේ නැති කරණ ලද සැක ඇත්තේමය. දුරුවූ කෙසේ කෙසේදැයි පැවති සැක ඇත්තේය. ආර්‍ය්‍ය මාර්ගයෙහි පිළිපැදීමෙන් සම්පූර්ණකරණලද අදහසඇති සේක. මෙසේ ප්‍රහාණය කළ සැක ඇති පහවීගිය කෙලෙස් කෙසේදැයි පැවති සැක ඇති උතුම් මාර්ගයෙහි පිළිපැදීමෙන් සම්පූර්ණවූ අභිප්‍රාය ඇති බව යන මේ අංගයෙන් යුක්තවූ ඒ භාග්‍යවතුන් වහන්සේ හැර අන්‍ය ශාස්තෘ කෙනෙකු අතීත කාලයෙහිද මේ වර්තමානයෙහිද නොමදක්නෙමු.

"ස්වාමීන් වහන්ස, සක්‍ර දෙවෙන්ද්‍ර තෙමේ සනං කුමාර බ්‍රහ්මයාට භාග්‍යවතුන් වහන්සේගේ මේ සත්‍යවූ ගුණ අට කීයේය. ඒ කාරණයෙන් සනං කුමාර බ්‍රහ්ම තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ සත්‍යවූ මේ ගුණ අට අසා සතුටු සිත් ඇත්තේ වැඩියක් සතුටු සිත් ඇත්තේ හටගත් ප්‍රීති හා සොම්නස් ඇත්තේ වීය.

**28** "ස්වාමීන්වහන්ස, එකල්හි සනං කුමාර බ්‍රහ්ම තෙමේ මහත් ආත්මභාවයක් මවාගෙන පඤ්චශිඛ දිව්‍යපුත්‍රයා මෙන්

කුමාර වෙස්ගෙන තව්තිසා වැසි දෙවියන් අතර පහළ වූයේය ඒ බ්‍රහ්ම රජ තෙමේ අහසට නැගී පලක් බැඳ උන්නේය කෙසේදයත්? ස්වාමීන්වහන්ස, බලවත් පුරුෂයෙක් මනාකොට වස්ත්‍රාදියෙන් අතුරණලද ආසනයෙක්හි හෝ සමවූ භූමිභාගයෙක්හි යම්සේ පර්යංකයෙන් ඉඳින්නේද, ස්වාමීන්වහන්ස, එපරිද්දෙන්ම සනං කුමාර බ්‍රහ්ම තෙමේ අහසට පැන නැඟී පර්යංකයෙන් හිඳ තව්තිසා වැසි දෙවියන්ට කථාකෙළේය.

**29** 'පින්වත්නි, තව්තිසා වැසි දෙවියෝ ඒ කුමක්දැයි කියත්ද? ඒ භාග්‍යවතුන් වහන්සේ ඉතා දීර්ඝ කාලයක් මුළුල්ලෙහි මහත් ප්‍රඥා ඇති සේක. පින්වත්නි, පෙර කාලයෙහි දිසම්පතිනම් රජෙක් සිටියේය. දිසම්පතිනම් රජහට ගොවින්ද නම් පුරෝහිත බමුණෙක් විය. දිසම්පතිනම්රජහට රේණුනම් කුමරෙක් පුත්වූයේය. ගොවින්ද නම් පුරොහිත බ්‍රහ්මණයාට ජොතිපාල නම් මානවකයෙක් (තරුණයෙක්) පුත් වූයේය මෙසේ රේණු නම් රජ පුත් තෙමේද, ජොතිපාල නම් තරුණ තෙමේද අන්‍යවූ ක්ෂත්‍රිය කුලෙයහි උපන් කුමරුවෝ සදෙනෙක්දැයි යන මොහු අටදෙනෙක් යහලුවෝ වූහ. ඉක්බිති දීර්ඝ කාලයක් ගිය පසු ගොවින්ද බ්‍රාහ්මණයා මළේය. ගොවින්ද බමුණා මැරුණුකල්හි දිසම්පති රජ හැඬුවේය. පින්වත්නි, යම්කලෙක්හි අපි සියලුකටයුතු ගොවින්ද බ්‍රාහ්මණයාට පවරා පස්කම් සැපෙන් යුක්තව වාසය කරන්නෙමුද, ඒ කාලයෙහි ගොවින්ද බ්‍රාහ්මණතෙම මැරුණේයි' (කියායි). පින්වත්නි මෙසේ කී කල්හි රේණු නම් රාජ පුත්‍රතෙම දිසම්පති රජහට මේ කාරණය දැන්නුවේය 'දේවයන්වහන්ස, ගොවින්ද බ්‍රාහ්මණයා මැරුණේයයි' දැඩිසේ නොහඬනු මැනවි. දේවයන් වහන්ස, ගොවින්ද බ්‍රාහ්මණයාට ජෝතිපාල නම් තරුණ පුත්‍රයෙක් ඇත්තේය. ඒ තරුණ තෙමේ පියාට වඩා අතිශයින් පණ්ඩිතද වෙයි. පියාට වඩා සුදුසු නුවණ ඇත්තේද වෙයි. ඔහුගේ පිය තෙමේ යම්බඳු අර්ථානුශාසනා කෙළේද, ඒ අර්ථානුශාසනාද ජෝතිපාල තරුණයා විසින් කරනු ලැබේ.' 'කුමාරය, එසේද?' 'දේවයනි, එසේමයි'

30 'පින්වත්නි, ඉක්බිත්තෙන් දිසම්පති රජ තෙමේ එක්තරා පුරුෂයෙකුට කථා කෙළේය. 'එම්බල පුරුෂය, තෝ මෙහි එව්. ජොතිපාල මාණවක තෙමේ යම් තැනෙක්හිද එතැනට පැමිණෙව, පැමිණ ජොතිපාල තරුණයාට මෙසේ කියව. 'පින්වත් ජොතිපාල තරුණයාට ශුභ වේවා. දිසම්පති රජ තෙමේ පින්වත් ජොතිපාල තරුණයා දැකීමට කැමැත්තේය' කියායි. 'දේවයන් වහන්ස, ඒ මැනවයි' ඒ පුරුෂ තෙම දිසම්පති රජහට උත්තර දී ජොතිපාල මාණවක තෙමේ යම්තැනෙක්හිද එතනට පැමිණියේය පැමිණ ජොතිපාල තරුණයාට මේ කාරණය කීයේය. 'පින්වත් ජොතිපාල තරුණය, (ඔබට) යහපත් වේවා. දිසම්පති රජතෙමේ ජොතිපාල මාණවකයාගේ දැකීම කැමැත්තේය.' 'පින්වත, ඒ මැනවයි' ජොතිපාල මාණවක තෙමේ ඒ පුරුෂයාට උත්තරදී, දිසම්පති රජ තෙම යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, දිසම්පති රජු සමග සතුටුවූයේය. සතුටු වියයුතුවූ සිහි කටයුතුවූ කථාව නිම කොට එකපැත්තක උන්නේය. එක් පැත්තක හුන්නාවූ ජොතිපාල තරුණ බමුණාට දිසම්පති රජ තෙමේ මේ කාරණය කීයේය. 'පින්වත, ජොතිපාල තරුණ තෙමේ අපට අනුශාසනා කෙරේවා. ජොතිපාල මාණවක තෙමේ අනුශාසනාව ප්‍රතික්ෂෙප නොකෙරේවා. ගොවින්ද බ්‍රාහ්මණයාගේ තනතුරෙහි ඔබ තබන්නෙමි. ගොවින්ද බ්‍රාහ්මණයාට අයිති තනතුරෙහි අභිෂෙක කරන්නෙමි' යි කීයේය. 'පින්වතුන් වහන්ස, එසේයයි' ඒ ජොතිපාල බ්‍රාහ්මණතෙම දිසම්පති රජහට උත්තර දුන්නේය.

31 "පින්වත්නි, ඊට පසුව දිසම්පති රජ තෙමේ ජොතිපාල තරුණ බ්‍රාහ්මණයා පියාවූ ගොවින්ද බ්‍රාහ්මණයාට අයිති තනතුරෙහි අභිෂෙක කළේය. පියාවූ ගොවින්ද බ්‍රාහ්මණයාට අයත් තනතුරෙහි අභිෂෙකකරණ ලද්දාවූ ජොතිපාල තරුණ බ්‍රාහ්මණයා ඔහුගේ පියා යම් අර්ථයක් අනුශාසනා කළේද, ඒ අර්ථය අනුශාසනා කරයි. ඔහුගේ පිය තෙම යම් අර්ථයක් අනුශාසනා නොකෙළේද, ඒ අර්ථය අනුශාසනා නොකරයි. ඔහුගේ පිය තෙමේ යම්කර්මාන්තයක් පිහිටෙව්වේද, ඒ කර්මාන්ත පිහිටුවයි ඔහුගේ පිය තෙමේ යම් කර්මාන්තයක් නොපිහිටෙව්වේද, ඒ කර්මාන්ත නොපිහිටුවයි. ඒ ජොතිපාල

තරුණයාට මනුෂ්‍යයෝ මෙසේ කීහ. 'පින්වත්නි, ඒකාන්තයෙන් ගොවින්ද බ්‍රාහ්මණයාය. පින්වත්නි, ඒකාන්තයෙන් මහා ගොවින්ද බ්‍රාහ්මණයාය කියායි. මේ කාරණයෙන් ජොතිපාල තරුණයාට ගොවින්දය මහා ගොවින්දය යන නාමයම ඇතිවිය.

32 "පින්වත්නි, ඊට පසුව මහා ගොවින්ද බ්‍රාහ්මණ තෙමේ ඒ ක්ෂත්‍රියයෝ සදෙන යම් තැනෙක්හිද එතනට පැමිණියේය. පැමිණ ඒ ක්ෂත්‍රියයන් සදෙනාට මේකාරණය කීවේය. 'පින්වත්නි, දිසම්පති රජ තෙම ජරාවට පැමිණියේය. වැඩිවයසට පැමිණියේය. මහලු වූයේය. ඉක්ම ගිය කල් ඇත්තේය. පින්වත්නි, කවරෙක් නම් ජීවිතයාගේ පැවැත්ම දන්නේද, මේ (මතු) කියනු ලබන කාරණය ඇත්තේය. යම් හෙයකින් දිසම්පති රජ මැරුණ කල්හි ඇමතියෝ රේණු කුමාරයා රාජ්‍යයෙහි අභිෂෙක කරන්නාහුය. පින්වත්නි, මෙහි එත්වා, පින්වත්, රේණු රාජකුමාර තෙම යම් තැනෙක්හිද එතනට පැමිණෙව්. පැමිණ රේණු රාජ පුත්‍රයාට මෙසේ කියව්. 'අපි පින්වත්වූ රේණු රාජපුත්‍රයාගේ ප්‍රියවූ මනාපවූ යහළුවෝවෙමු. ඔවුනොවුන් කෙරෙහි පිළිකුල් නොකරන්නෝ වෙමු. පින්වත් ඔබට යම් සැපයක් ඇත්තේද, අපටද ඒ සැපය ඇත්තෙමු. පින්වත් ඔබට යම් දුකක් ඇත්තේද අපිද ඒ දුක ඇත්තම්හ. පින්වත්නි, දිසම්පති රජ තෙම ජරාවට පත්වූයේය, වැඩි වයසට පැමිණියේය, කල් ඉක්ම ගියේය, වයසට පැමිණියේය. පින්වතුනි කවරෙක් නම් ජීවිතයාගේ පැවැත්ම දනීද? මේ (මතු) කියනු ලබන කාරණය විද්‍යාමාන වේමය. යම් හෙයකින් දිසම්පති රජ මැරුණු කල්හි රජ ඇමතියෝ පින්වත් රේණු කුමරු රාජ්‍යයෙහි අභිෂෙක කරන්නාහුය. පින්වත් රේණු කුමාරතෙමේ ඉදින් රාජ්‍යය ලබන්නේ නම් අපටද රාජ්‍යය බෙදා දෙන්නේද කියා අසව්යයි' කීය.

33. "පින්වත්නි, ඒ යහපතැයි ඒ ක්ෂත්‍රිය කුමාරයෝ සදෙන මහා ගොවින්ද බ්‍රාහ්මණයාට පිළිතුරු දී රේණු රාජ පුත්‍රයා යම් තැනෙක්හිද එතනට පැමිණියෝය. පැමිණ රේණු රාජපුත්‍රයාට මේ කාරණය දැන්වූහ. "අපි පින්වත් රේණු කුමාරයාගේ ප්‍රියවූ මන වඩන්නාවූ යහළුවෝ වෙමු. පින්වත් ඔබට යම් සැපයක් ඇත්තේද, අපටද ඒ සැපය ඇත්තේමය. පින්වත් ඔබට යම් දුකක් ඇත්තේද, අපටද ඒ දුක ඇත්තේමය පින්වත, පින්වත්

දිසම්පති රජතෙමේ ජරාවට පැමිණියේය. වැඩි වයසට පැමිණියේය. මහලුය, කාලය ඉක්ම ගියේය. වයසට පැමිණියේය. පින්වත, කවරෙක් නම් ජීවිතයාගේ පැවැත්ම දනීද? මේ කාරණය ඇත්තේය. යම් හෙයකින් දිසම්පති රජහු මැරුණු කල්හි රජ ඇමතියෝ පිනවත් රෙණු කුමාරයා රාජ්‍යයෙහි අභිෂෙක කරන්නාහුද, ඉදින් පින්වත් රාජ කුමාරතෙමේ රාජ්‍යය ලබන්නේ නම්, අපටද රාජ්‍යය බෙදා දෙන්නේදැයි' ඇසූහ. 'පින්වත්නි, පින්වතුන් හැර අන් කවරෙක් මාගේ රටෙහි සැපයට පැමිණෙන්නාහුද, පින්වත්නි, ඉදින් මම රාජ්‍යය ලබන්නෙම් නම් ඔබලාටද රාජ්‍යය බෙදා දෙන්නෙමි' යි කීය.

34 "පින්වතුනි ඊටපසු රැයක් සහ දවාලක් පසුවීමෙන් දිසම්පති රජතෙමේ මැරුණේය. දිසම්පති රජ මැරුණු කල රජ ඇමතියෝ රෙණු රාජ පුත්‍රයා රාජ්‍යයට පත් කළාහුය. රජකමට පත් කරණලද රෙණු කුමාරයා පඤ්චකාම සම්පත් විඳිමින් වාසය කරයි. පින්වත්නි, ඉක්බිති, මහා ගොවින්ද බ්‍රාහ්මණතෙමේ ඒ ක්ෂත්‍රියයෝ සදෙන යම් තැනෙක්හිද එතනට පැමිණියේය. පැමිණ ඒ ක්ෂත්‍රිය කුමාරයන් සදෙනාට මේ කාරණය කීයේය. 'පින්වත්නි, දිසම්පති රජතුමා මැරුණේය. රෙණු නම් කුමාරතෙම රජකමට පත්කරණ ලද්දේය. හෙතෙම පඤ්චකාම සම්පත් විඳිමින් වාසය කරයි. පින්වත්නි, කවරෙක් නම් දනීද? කාමයෝ නම් මත් කරන්නෝය. පින්වත්නි, මෙහි එව්, රෙණු රජ තෙම යම් තැනෙක්හිද එතැනට පැමිණෙව් පැමිණ මෙසේ කියව්.

'පින්වතුන් වහන්ස, දිසම්පති රජ මැරුණේය. පින්වත් රෙණු කුමාර තෙමේ රජ කමට පත් කරණ ලද්දේය. පින්වත් රේණු කුමාරතෙමේ ඒ වචනය සිහි කරන්නේදැයි?' අසව් පින්වත මැනවැයි' ඒ ක්ෂත්‍රිය කුමරුවෝ සයදෙන මහා ගොවින්ද බ්‍රාහ්මණයාට පිළිතුරු දී රේණු රජතෙමේ යම් තැනෙක්හිද එතනට පැමිණියෝය. පැමිණ රේණු රජ හට මේ කාරණය කීවාහුය. 'පින්වතුන් වහන්ස දිසම්පති රජතෙමේ මැරුණේය. පින්වත් රේණු කුමාරතෙමේ රජ කමට පත්කරණ ලද්දේය පින්වතුන් වහන්ස, ඒ වචනය සිහි කෙරේදැයි' ඇසුවෝය.

35 'මම ඒ වචනය සිහිකරමි. පින්වතුනි, කවරෙක්නම් මේ මහා පෘථිවිය උතුරෙන් දිගටද, දකුණෙන් ගැල් මුඛයක් ලෙසටද,

සත් කොටසකට සමව බෙදීමට සමර්ථ වන්නේදැයි' ඇසීය. 'පින්වතුන් වහන්ස, මහා ගොවින්ද බ්‍රාහ්මණයා හැර අන් කවරෙක් සමර්ථ වන්නේදැයි' කීහ ඉක්බිති රේණු රජතෙමේ එක්තරා පුරුෂයෙකුට ආමන්ත්‍රණය කෙළේය 'පින්වත් පුරුෂය, මෙහි එව, මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ යම් තැනෙක්හිද එතැනට යව. ගොස්, මහා ගොවින්ද බ්‍රාහ්මණයාට මෙසේ කියව. රජතෙමේ ඔබට කථාකරන්නේ යයි කියවයි' කීය 'දේවයන් වහන්ස එසේයයි' ඒ පුරුෂ තෙමේ රේණු රජහට උත්තර දී මහා ගොවින්ද බ්‍රාහ්මණ තෙමේ යම් තැනෙක්හිද එතනට පැමිණ 'පින්වත ඔබ රේණු රජතෙමේ කැඳවායයි' කීය 'පින්වත, එසේයයි' මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ ඒ පුරුෂයාට උත්තර දී රේණු රජතෙමේ යම් තැනෙක්හිද එතැනට පැමිණ, රේණු රජු සමග සතුටු විය සතුටු වියයුතු කථාව නිමිකොට එකපැත්තක උන්නේය. එක පැත්තක උන්නාවූ මහා ගොවින්ද බ්‍රාහ්මණයාට රේණු රජතෙමේ මේ කාරණය කීයේය. 'පින්වත් ගොවින්ද තෙමේ මෙහි ඒවා. මේ මහපොළොව උතුරු පැත්තෙන් දිගටද, දකුණු පැත්තෙන්, ගැල් මුඛයක් ලෙසටද සත් කොටසක් කොට එක හා සමව බෙදා දෙත්වායි' කීයේය.

'පින්වත, ඒ මැනවයි' මහා ගොවින්ද බ්‍රාහ්මණතෙමේ රේණු රජහට උත්තර දී මේ මහා පොළොව උතුරු පසින් දිගටද දකුණු පසින් ගැල් මුඛයක් ලෙසටද සත් කොටසක් කොට එක හා සමව බෙදුයේය. සියලු නගරයන්ම ගැල් මුඛයක ආකාර කොට තැබීය.

**36.** "එහි සියලු නගරයන්ගේ මධ්‍යයෙහි රේණු රජහුගේ ජනපදය පිහිටියේ වේ. කලිඟු රජුන්ගේ දන්ත පුරයද අස්සක නම් රජුන්ගේ පොතන නම් නගරයද, අවන්ති රජුන්ගේ මහෙසය නගරයද සුචි රජුන්ගේ රොරුක නම් නගරයද, විදෙහ රජුන්ගේ මිථිලා නම් නගරයද, අඟු රජුන් විසින් මවන ලද චම්පා නගරයද, කසී රජුන්ගේ බාරාණසී නගරයද, යන මේ නගර හත ගොවින්ද බ්‍රාහ්මණයා විසින් (බෙදා) දෙන ලද්දේය. පින්වත්නි එවිට ඒ ක්ෂත්‍රියයෝ සදෙන විධිවූ පරිද්දෙන් තමහට අයිතිවූ රාජ්‍ය ලාභයෙන් සතුටු සිත් ඇත්තෝ වූහ. සම්පූර්ණවූ කැමැත්ත ඇත්තෝද වූහ (කෙසේදයත්) "ඒකාන්තයෙන් අප විසින් යමක්

කැමතිවන ලද්දේද, යමක් ආසා කරණ ලද්දේද, ඒ යමක් අදහස් කරණ ලද්දේද, යමක් පතන ලද්දේද, කාරණය අප විසින් ලබන ලදැයි" කියා (සතුටුවූහ.) සත්තභූය, බ්‍රහ්මදත්තය, වෙස්සභූය, භරතය, රේණුය, ධතරට්ඨය, යන රජුන් සත් දෙන ඒ කාලයෙහි රාජ්‍ය භාරය ඉසුලූහ.

පළමුවැනි බණවර නිමවන ලදී.

---

## 2.

37. "පින්වත්නි, ඒ ක්ෂත්‍රියයෝ සයදෙන 'මහාගොවින්ද බ්‍රාහ්මණ තෙමේ යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ, මේ කාරණය කීවාහුය. 'පින්වත් ගොවින්ද තෙමේ රේණු රජහට යම්සේ ප්‍රියවූ මන වඩන්නාවූ පිළිකුල් නොකරන්නාවූ මිත්‍ර වේද, එපරිද්දෙන්ම පින්වත් ගොවින්ද තෙමේ අපගේද ප්‍රියවූ මනවඩන්නාවූ පිළිකුල් නොකරන්නාවූ මිත්‍ර වෙයි. පින්වත් ගොවින්ද බ්‍රාහ්මණතෙමේ අපටද අනුශාසනා කෙරේවා භවත් ගොවින්දතෙමේ අනුශාසනාවෙන් බැහැර නොයේවා.' 'පින්වත්නි, ඒ මැනවැයි' භවත් මහා ගොවින්ද බ්‍රාහ්මණතෙමේ ඒ ක්ෂත්‍රිය රජුන් සයදෙනාට පිළිතුරු දුන්නේය. පින්වත්නි, ඊටපසු භවත් මහා ගොවින්ද බ්‍රාහ්මණතෙමේ, මුදුනෙහි පැන් වත්කිරීමෙන් අභිෂෙක කරන ලද්දාවූ ඒ ක්ෂත්‍රිය රජුන් සත්දෙනාටම අනුශාසනා කෙළේය. මහාසාර බ්‍රාහ්මණයන් සත් දෙනෙකුටද අනුශාසනා කෙළේය. නහාතක යන නම් ඇති බ්‍රාහ්මණයන් සත් සියයකටද මන්ත්‍ර කියෙව්වේය.

38. "ඉක්බිතිව මෑත කාලයකදී භවත් මහා ගොවින්ද බ්‍රාහ්මණයාගේ මෙසේවූ යහපත්වූ කීර්ති ඝෝෂාවක් ඉතා උස්ව නැංගේය. කෙසේද? මහා ගොවින්ද තෙම ප්‍රත්‍යක්ෂ වශයෙන් මහ බඹහු දකී, සත්‍ය වශයෙන් මහා ගොවින්ද බ්‍රාහ්මණතෙමේ මහා බ්‍රහ්මයා සමග කථා කෙරෙයි, එක්ව කථා කෙරෙයි. ඔහු හා මන්ත්‍රණය කෙරෙයි' කියායි. පින්වත්නි එකල්හි මහා ගොවින්ද බ්‍රාහ්මණයාට මෙබඳු අදහසක් ඇතිවිය. 'මාගේ මෙබඳු යහපත් කීර්ති ඝෝෂාවක් උස්ව නැංගේය මහා ගොවින්ද බ්‍රාහ්මණතෙමේ (සිය ඇසින්) සත්‍යලෙසම මහාබ්‍රහ්මයා දකී.

මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ ප්‍රත්‍යක්ෂව බ්‍රහ්මයා සමග කථා කෙරෙයි, එක්ව කථාකෙරෙයි. ඔහු හා මන්ත්‍රණය කෙරෙයි' කියායි. මම වනාහි බ්‍රහ්මයා නොදක්නෙමි. එසේම බ්‍රහ්මයා සමග සාකච්ඡාද නොකරමි. බ්‍රහ්මයා සමග කථා නොකරමි බ්‍රහ්මයා සමග මන්ත්‍රණයද නොකරමි. එහෙත් වැඩි වයසට පැමිණියාවූ මහලුවූ ආචාර්‍ය්‍යවූද ආචාර්‍ය්‍යයන්ගේ ආචාර්‍ය්‍යවූද බ්‍රාහ්මණයන් විසින් කියන්නාවූ මේ කාරණය මවිසින් අසන ලද්දේමය. එනම්, යමෙක් වර්ෂා ඍතුවට අයත් සාර මාසයෙහි තනිව වාසය කරන්නේද කරුණාධ්‍යානය භාවනා කෙරේද, හෙතෙම බ්‍රහ්මයා දකී. බ්‍රහ්මයා සමග සාකච්ඡා කරයි. එක්ව කථා කෙරෙයි. ඔහු හා මන්ත්‍රණය කෙරේය යනුයි. මම ඒකාන්තයෙන් වර්ෂා ඍතුවට අයත් සාර මාසයෙහි තනිව වාසය කරන්නෙම් නම් කරුණා බ්‍රහ්ම විහාර භාවනාව කරන්නෙම් නම් ඉතා යෙහෙකැයි සිතීය.

39 "පින්වත්නි, ඉක්බිති මහා ගොවින්ද බ්‍රහ්මණතෙම රේණු රජු යම් තැනකද එතනට පැමිණියේය. පැමිණ, රේණු රජහට මේ කාරණය දැන්විය. 'පින්වතුන් වහන්ස, මගේ මෙවැනි යහපත් කීර්ති ඝොෂාවක් ඉතා උස්ව නැංගේය. කෙසේදයත්? මහා ගොවින්ද බ්‍රාහ්මණතෙමේ සත්‍ය ලෙසම මහා බඹුහු දකී මහා ගොවින්ද බ්‍රාහ්මණ තෙමේ සත්‍යලෙසම මහාබ්‍රහ්මයා සමග සාකච්ඡා කෙරෙයි. එක්ව කථා කෙරෙයි. මන්ත්‍රණය කෙරේයයි' කියායි. 'පින්වත මම බ්‍රහ්මයා නොම දකිමි. බ්‍රහ්මයා සමග සාකච්ඡාද නොකරමි. බ්‍රහ්මයා සමග එක්ව කථාද නොකරමි. බ්‍රහ්මයා සමග මන්ත්‍රණයද නොකරමි. එහෙත් වැඩිවයසට පැමිණියාවූ මහලු ආචාර්‍ය්‍යවූද ආචාර්‍ය්‍යයන්ගේ ආචාර්‍ය්‍යවූද බ්‍රාහ්මණයන්ගේ සම්මුඛයෙන් මා විසින් මේ කාරණය අසන ලද්දේය. යමෙක් වර්ෂා ඍතුවට අයත් සාරමාසයෙහි විවේකයට පැමිණ වාසයකෙරේද, කරුණා බ්‍රහ්ම විහාරය වඩන්නේද හෙතෙම බ්‍රහ්මයා දකී, බ්‍රහ්මයා සමග සාකච්ඡා කරයි. එක්ව කථාකෙරේ. ඔහු හා සමග මන්ත්‍රණය කෙරේය' යනුයි පින්වත, මම වර්ෂා ඍතුවට අයිති සාර මාසයෙහි විවේකයෙන් කල් ගතකරන්ටද කරුණාධ්‍යානය වඩන්ටද කැමැත්තෙමි. ඒ කාලය ඇතුලත බත් ගෙනඑන්නාවූ එක් කෙනෙකු හැර අන් කිසිවෙක්

නොපැමිණිය යුතුයි' 'පින්වත් ගොවින්ද බ්‍රාහ්මණතෙමේ දැන් යමක් ගැන කාලය යයි සිතන්නේ නම් එය කරනු මැනව' යි කියායි.

40 "ඊට පසු භවත් ගොවින්ද බ්‍රාහ්මණතෙමේ ඒ ක්ෂත්‍රිය රජුන් සදෙනා යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ඒ ක්ෂත්‍රිය රජුන් සයදෙනාට මේ කාරණය කීයේය. පින්වත්නි, මා සම්බන්ධව මෙසේ යහපත්වූ කීර්ති ඝොෂාවක් ඉතා උස්ව නැංගේය. 'මහා ගොවින්ද බ්‍රාහ්මණතෙමේ සත්‍ය ලෙසම බ්‍රහ්මයා දකී මහා ගොවින්ද බ්‍රාහ්මණතෙමේ සත්‍ය වශයෙන්ම මහා බ්‍රහ්මයා සමග සාකච්ඡා කෙරෙයි. එසේම කථා කෙරෙයි ඔහු හා සමග මන්ත්‍රණය කෙරෙයි' කියායි. පින්වත්නි, මම බ්‍රහ්මයා නොමදකිමි. බ්‍රහ්මයා සමග සාකච්ඡා ද නොකරමි. බ්‍රහ්මයා සමග කථාද නොකරමි. බ්‍රහ්මයා සමග මන්ත්‍රණයද නොකරමි. වැඩි වයසට පැමිණියාවූ මහලුවූ ආචාර්‍ය්‍ය ප්‍රචාර්‍ය්‍යවූ බ්‍රාහ්මණයන්ගේ සම්මුඛයෙන් මා විසින් මේ කාරණය අසන ලද්දේය. එනම් යමෙක් වර්ෂා ඍතුවට අයත් හාරමාසයෙහි විවේකව වාසය කෙරේද, කරුණා බ්‍රහ්ම විහාරය වඩන්නේද, ඒ තැනැත්තා මහා බ්‍රහ්මයා දකී. බ්‍රහ්මයා සමග සාකච්ඡාද කෙරේ ඔහු හා එක්ව කථා කෙරේ ඔහු හා සමග මන්ත්‍රණයද කෙරේ යනුයි, පින්වතුනි, මේ වර්ෂා ඍතුවට අයත්වූ හාර මාසයෙහි විවෙකව වාසය කරන්නටද කරුණා බ්‍රහ්ම විහාරය භාවනා කරන්ටද කැමැත්තෙමි ඒ කාලයෙහිදී බත් ගෙන එන්නාවූ එක් කෙනෙකු හැර අන් කිසිවෙකු නොපැමිණිය යුත්තේ යයි' දැන්වීය. 'භවත් ගොවින්දතෙමේ දැන් යමක් සම්බන්ධව සුදුසු කලය්'යි දන්නේ නම් එය කරණු මැනවයි' කියායි.

41 'ඊට පසුව භවත් ගොවින්ද බ්‍රාහ්මණතෙම මහාසාර බ්‍රාහ්මණයන් සත්දෙන යම් තැනෙක්හිද, නහාතක බ්‍රාහ්මණයන් සත් සියදෙනා යම් තැනෙක්හිද එතැනට පැමිණියේය පැමිණ බමුණු මහාසාර බ්‍රාහ්මණයන් සත්දෙනාටද නහාතක බ්‍රාහ්මණයන් සත්සිය දෙනාටද මේ කාරණය දැන්විය. 'පින්වතුනි, මා පිළිබඳව මෙසේ යහපත්වූ කීර්ති ඝොෂාවක් ඉතා උස්ව නැංගේය. කෙසේද 'මහා ගොවින්ද බ්‍රහ්මණ තෙම

සත්‍ය වශයෙන්ම බ්‍රහ්මයා දකී. බ්‍රහ්මයා සමග සාකච්ඡා කරයි. එක්ව කථාකරයි. ඔහු හා මන්ත්‍රණය කරයි' කියායි. පින්වතුනි මම මහා බ්‍රහ්මයා නොම දකිමි. බ්‍රහ්මයා සමග සාකච්ඡාද නොකරමි. බ්‍රහ්මයා සමග එක්වී කථාද නොකරමි. බ්‍රහ්මයා සමග මන්ත්‍රණයද නොකරමි. එහෙත් වැඩි වයසට පැමිණියාවූ මහලුවූ ආචාර්‍ය්‍යවූද ආචාර්‍ය්‍යයන්ගේ ආචාර්‍ය්‍යවූ බ්‍රාහ්මණයන්ගේ සම්මුඛයෙන් මා විසින් මේ කාරණය අසනලදී'. යමෙක් වර්ෂා කාලය පිළිබඳ හාරමාසයෙහි විවේකව වාසය කෙරේද, කරුණා බ්‍රහ්ම විහාරය වඩයිද, ඒ පුද්ගල තෙම මහා බ්‍රහ්මයා දකී බ්‍රහ්මයා සමග සාකච්ඡා කෙරෙයි. එක්ව කථාකරයි, ඔහු හා සමග මන්ත්‍රණය කරයි' කියා අසන ලද්දේය.

'පින්වතුනි, එබැවින් තොපි ඇසූ පරිදිද පුහුණු කළ පරිදිද, මන්ත්‍රයන් විස්තර වශයෙන් පාඩම් කියව්. ඔවුනොවුන්ටද ඒ මන්ත්‍ර කියවව්. පින්වත්නි, මම වර්ෂාඍතුවට අයිති හාර මාසයෙහි විවේකව වාසය කරන්ටද, කරුණා ධ්‍යානය වඩන්ටද කැමැත්තෙමි. (ඒ කාලය තුළ) බත් ගෙනඑන්නාවූ එක්කෙනෙකු හැර අන් කවරෙක්වත් නොපැමිණිය යුතුයි.' 'පින්වත් ගොවින්ද තෙමේ යමක් ගැන කාලයයි දන්නේ නම් එය කරනු මැනව' යි කියායි.

**42** "පින්වත්නි, ඊට පසු මහාගොවින්ද බ්‍රාහ්මණතෙම සමානවූ සතළිසක් භාර්‍ය්‍යාවෝ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, සමානවූ සතළිසක් භාර්‍ය්‍යාවන්ට මේ කාරණය කීයේය. 'පින්වතියනි, මාගේ මෙබඳු යහපත් කීර්ති ඝොෂාවක් ඉතා උස්ව නැංගේය. කෙසේද? මහා ගොවින්ද බ්‍රාහ්මණතෙම සත්‍ය වශයෙන්ම මහා බ්‍රහ්මයා දකී. සත්‍ය ලෙසම බ්‍රහ්මයා සමග සාකච්ඡා කරයි. එක්ව කථාකරයි. මන්ත්‍රණය කරයි' කියායි.

'පින්වතියෙනි, මම වනාහි බ්‍රහ්මයා නොම දකිමි. බ්‍රහ්මයා සමග සාකච්ඡා නොකරමි. එක්ව කථා නොකරමි. බ්‍රහ්මයා සමග මන්ත්‍රණයද නොකරමි. එහෙත් වැඩි වයයට පැමිණියාවූ මහලුවූ ආචාර්‍ය්‍යවූද, ආචාර්‍ය්‍යයන්ගේ ආචාර්‍ය්‍යවූද බ්‍රාහ්මණයන්ගෙන් මේ කාරණය ඇසූයෙමි. යමෙක් වර්ෂා කාලය

පිළිබඳ හාරමාසයෙහි විවෙකව වාසය කෙරේද, කරුණා ධ්‍යානය වඩාද, හෙතෙම මහාබ්‍රහ්මයා දකින්නේය. ඔහු සමග සාකච්ඡා කරන්නේය. බ්‍රහ්මයා සමග කථා කරන්නේය. ඔහු හා මන්ත්‍රණය කරන්නේය' කියායි. 'පින්වතියෙනි, මම වර්ෂා කාලය පිළිබඳ හාර මාසයෙහි විවේකීව වාසය කරන්ටද කරුණා ධ්‍යානය භාවනාකරන්ට ද කැමැත්තෙමි. (ඒ කාලයෙහි) "බත් ගෙණ එන්නාවූ එක් කෙනෙකුන් හැර අන් කිසිවෙක් නොපැමිණිය යුතුයයි' කීහ. 'පින්වත් ගොවින්ද තෙමේ යමක් සම්බන්ධව කාලයයි සිතන්නේ නම් දැන් එය කෙරේවායි' කියායි.

43 "ඊට පසුව භවත් මහා ගොවින්ද බ්‍රාහ්මණතෙම නුවරට පූර්ව දිසාවෙහි අළුත් සන්ථාගාරයක් කරවා වර්ෂාඍතුව පිළිබඳ හාරමාසයෙහි විවේකව වාසය කළේය. කරුණාබ්‍රහ්ම විහාරය වැඩුයේය. බත් ගෙන එන්නාවූ එක්කෙනෙකු හැර අන් කිසිවෙක් ඔහු වෙතට නොපැමිණියේය. තවද පින්වත් ගොවින්ද බ්‍රාහ්මණයාට සාර මසක් ගියකල බ්‍රහ්මයා දැකීමට ආශාවක් ඇතිවිය වැඩිවයසට ගියාවූ මහලුවූ ආචාය්‍ර්‍යවූද ආචාය්‍ර්‍යයන්ගේ ආචාය්‍ර්‍යවූද, බ්‍රාහ්මණයන්ගෙන්ද මම මේ කාරණය ඇසුවෙමි. 'යමෙක් වර්ෂා කාලය පිළිබඳ හාරමාසයෙහි විවේකයට පැමිණ වාසය කරද්ද, කරුණා ධ්‍යානය වඩාද ඒ පුද්ගලතෙම මහාබ්‍රහ්මයා දකී. බ්‍රහ්මයා සමග සාකච්ඡාකරයි. එක්ව කථාකරයි. ඔහු හා සමග මන්ත්‍රණය කරයි' කියායි. මම බ්‍රහ්මයා නොමදකිමි බ්‍රහ්මයා සමග සාකච්ඡාද නොකරමි. බ්‍රහ්මයා සමග එක්ව කථාද නොකරමි. බ්‍රහ්මයා සමග මන්ත්‍රණයද නොකරමි' කියායි.

44 'පින්වත්නි, එවිට සනං කුමාර බ්‍රහ්ම තෙමේ මහාගොවින්ද බ්‍රාහ්මණයාගේ සිත පිළිබඳවූ අදහස් තමන්ගේ සිතින් දැනගෙන යම්සේ ශක්තිමත් පුරුෂයෙක් හකුළුවනලද අතක් දිගහරින්නේ හෝ දිගුකළ අතක් හකුළුවන්නේ යම්සේද, එපරිද්දෙන්ම බඹලොවින් අන්තර්ධානවී මහාගොවින්ද බ්‍රාහ්මණයාගේ ඉදිරියෙහි (පහළ විය) පෙනී සිටියේය. පින් වත්නි, ඊට පසුව මහා ගොවින්ද බ්‍රාහ්මණයාගේ හිතේ භයක් ඇතිවිය. තැතිගැන්මක්ද වූයේය. ලොමු දැහැගැනීමක්ද විය. පෙර නොදක්නාලද රූපයක් දැක යම්සේ භය වෙයිද,

(එපරිද්දෙන්ම භය විය) ඉක්බිතිව මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ භය වූයේ තැති ගැනීමට, පැමිණියේ හටගත් ලොමු දැහැගැනුම් ඇත්තේ සනං කුමාර බ්‍රහ්මයාට ගාථාවකින් (මෙසේ) කීයේය.

'නිදුකාණෙනි, ශරීරවර්ණ ඇත්තාවූ යසස් ඇත්තාවූ ශ්‍රීමත්වූ නුඹ කවරෙක් වෙහිද? නොදන්නාවූ අපි ඔබගෙන් අසමු. අපි ඔබ කෙසේ දැනගනිමුද?'

'මා බ්‍රහ්ම ලෝකයෙහි සනං කුමාරයයි ඒකාන්තයෙන්ම දනිත්. සියලු දෙවියෝ සනං කුමාර බ්‍රහ්මයයි මා මෙසේ දැනගනිත්. ගෝවින්දය, එසේ දැනගනුම්.'

'මේ ආසනයද, පිරිසිදු ජලයද (පාදයට හිතවූ) තෙලද, මේ ජලයෙන් සේදූ පළා කොළද යන මේ සියල්ල ඔබ ඉදිරියෙහි වේ. පින්වතුන් විචාරමු. පින්වත් තෙමේ අපගේ මේ ආගන්තුක සංග්‍රහය පිළිගන්නා සේක්වා.'

"එම්බා ගොවින්ද (පණ්ඩිතය) නුඹ යමක් කියන්නේද, තාගේ එම ආගන්තුක සංග්‍රහය පිළිගනිමු. මේ ආත්ම භාවයෙහි වැඩ පිණිසද, පරලොව සැප පිණිසද, පවත්නාවූ යම් කිසිවක් මනාකොට පතන ලද්දේද, ඒ කාරණය විචාරව. පින්වත් තෙමේ කරනලද අවකාශ ඇත්තේය.'

45. "පින්වත්නි, ඊට පසුව මහාගොවින්ද බ්‍රාහ්මණයාට මේ අදහස විය. 'මම වූකලී සනං කුමාර බ්‍රහ්මයා විසින් කරනලද අවකාශ ඇත්තෙමි. මේ ආත්මභාවය පිළිබඳවූ අර්ථය හෝ, පරලොව පිළිබඳවූ අර්ථය හෝ කුමක් ගැන මම සනං කුමාර බ්‍රහ්මයාගෙන් විචාරන්නෙම්දෝයි' සිතීය.

"ඊට පසුව, මහාගොවින්ද බ්‍රාහ්මණයාට මේ අදහස විය. 'මම මේ ලෝකය පිළිබඳව අර්ථයන්ට දක්ෂවෙමි. අන්‍යයෝද දෘෂ්ටධාර්මික අර්ථය කවරේදැයි මගෙන් අසත්. ඒකාන්තයෙන්ම පරලෝකාර්ථය කෙබඳුදැයි, සනං කුමාර බ්‍රහ්මයාගෙන් අසන්නෙම් නම් ඉතා යෙහෙකැයි' සිතීය. පින්වත්නි ඊට පසුව මහාගොවින්ද බ්‍රාහ්මණ තෙමේ සනං කුමාර බ්‍රහ්මයාට ගාථාවකින් මෙසේ කීයේය.

'සැක ඇත්තාවූ මම අනුන් විසින් සකස් කරනලද ප්‍රශ්න විෂයෙහි සැක නැත්තාවූ සනං කුමාර බ්‍රහ්මයා විචාරමි කවර

ප්‍රතිපදාවෙහි සිටියාවූ කවර නම් ධර්මයෙක්හි හික්මෙන්නාවූ මනුෂ්‍යතෙම උතුම් බඹලොවට පැමිණේදැයි කියා අසමි.'

'එම්බා ශ්‍රෙෂ්ඨය, මනුෂ්‍යයන් අතර යම් කිසිවෙක් මමත්වය හෙවත් තෘෂ්ණාව අත්හැර හුදකලාව කරුණා ධ්‍යානය උපදවා කෙලෙසුන්ගෙන් මිදුනේද කාම ක්‍රොධාදීවූ ආමගන්ධ (පිළිගඳ) නැත්තේ මෛථුන ධර්මයෙන් වැළකුනේද හෙවත් බ්‍රහ්මචාරී වූයේ වේද, ඒ මනුෂ්‍ය තෙම මේ ධර්මයන් කෙරෙහි හික්මෙන්නේ උත්තම බ්‍රහ්ම ලෝකයට පැමිණේ.

**46.** "පින්වතුන් වහන්සේ කියන්නාවූ මමය, මාගේය, යන මමත්වය හැර යන කාරණය මම දනිමි. මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් ස්වල්පවූ හෝ භොග රාශිය හැර මහත්වූ හෝ භෝග රාශිය හැර ස්වල්පවූ හෝ ඥාති සමූහය හැර මහත්වූ හෝ ඥාති සමූහය හැර කෙස් දැළි රැවුල් කපා කාෂාය වස්ත්‍රයන් හැඳ ගිහි ගෙයින් නික්ම පැවිදි වෙයි. මෙසේ පින්වතුන් වහන්සේ කියන්නාවූ මමත්වය හැරය යන මේ කාරණය මම දනිමි ඒකීභූත වූයේය යන මේ කාරණයද, මම දනිමි. මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් ජනයන් නැත්තාවූ සෙනසුන් ආශ්‍රය කෙරෙයි, අරණ්‍යය, වෘක්ෂ මූලය, පර්වතය, කඳුරැළිය, පර්වත ගුහාව, සොහොන, ඉතා දුර සෙනසුන අවකාශ ස්ථාන, පිදුරු රැසය යන මෙහි වාසය කරයි. මෙසේ විවෙකව වෙසේ යන මේ කාරණයද මම දනිමි. කරුණා සහගත සිතින් යුක්තව විසීම යනුද, මම දනිමි. ඇතැම් කෙනෙක් කරුණාව සමග පැවති සිතින් එක්දිශාවක් පතුරුවා වාසය කරත්, එසේම දෙවන දිසාවද, එසේම තුන්වන දිසාවද, එසේම සතරවන දිසාවදැයි මෙසේ සියලු කල්හි සියලු තන්හි පැතිර පවතින බැවින් සියල්ල ඇත්තාවූ ලෝකය, කරුණාව සමග පැවැති සිතින් පතුරුවා වාසය කෙරෙත්, මෙසේ කරුණා සිතින් යුක්තව වාසය කරයි, යන මේ කාරණයද මම දනිමි පින්වතුන් විසින් කියන්නාවූ ආමගන්ධය යන කාරණයන් (පිළී ගඳ හමණ කරුණු) මම නොදනිමි

'පින්වත් බ්‍රහ්මය, මනුෂ්‍යයන් විෂයෙහි කවර නම් කාරණයෝ ආමගන්ධය යන මේ ඇත්තාහුදැයි" මේ කාරණය

මම නොදනිමි. නුවණැති බ්‍රහ්මරාජය, එහෙයින් මට මෙහිදී ඒ කාරණයන් කියනු මැනව කවර නම් ක්ලේශාවරණයකින් ආවරණය කරනලද සත්ව සමූහය දුර්ගන්ධය වහනය කෙරේද අපායට පමුණුවන ක්ලෙශ ධර්ම ඇත්තෝ වෙත්ද හෙවත් කවර නම් අකුශලයක් කරණ කොටගෙන සත්වයෝ බඹලොවට නොපැමිණෙත්ද?'

"ක්‍රොධ කිරීමද, බොරු කීමද, වඤ්චාවද, මිත්‍රද්‍රොහී භාවයද, තද මසුරු බවද, අධික මානයද, ඊර්ෂ්‍යා කිරීමද, තෘෂ්ණාවද සැකයද, අනුන්ට හිංසා කිරීමද, ද්වෙෂයද, මදයද, මොහයද යන මේ ක්ලේශ ධර්මවල යෙදුනාවූ පුද්ගල තෙම දුගඳ ඇත්තේම වෙයි. අපායට යන්නෝ හෙවත් බ්‍රහ්මලෝකයට නොයන්නෝ වෙත්.

'පින්වතුන් විසින් කියනලද ආමගන්ධ කාරණයන් මම යම් පරිද්දෙකින් දනිම්ද, ඒ දුර්ගන්ධ වහනයවන කාරණයන් ගිහිගෙයි වාසය කරන්නවුන් විසින් සුවසේ බැහැරලීම දුෂ්කර වෙයි.'

'පින්වත, මම ගිහිගෙයින් නික්ම පැවිදි වන්නෙමියි' කීය. 'දැන් ගොවින්ද පණ්ඩිත තෙමේ යමක් ගැන කාලයයි දන්නේ නම් ඒ කාරණය කෙරේවායි කීයේය.'

47. "ඉක්බිතිව මහා ගොවින්ද බ්‍රාහ්මණ තෙමේ රේණු රජ යම් තැනෙක්හිද එතනට පැමිණියේය. පැමිණ, රේණු රජහට මේ කාරණය දැන්වීය. 'යමෙක් පින්වත්හුගේ රාජ්‍යයට අනුශාසනා කරන්නේද පින්වත් තෙමේ දැන් එබඳු පෙරවි බමුණෙකු සොයන සේක්වා. පින්වත, මම ගිහිගෙයින් නික්ම පැවිදිවන්නට කැමැත්තෙමි. සනං කුමාර බ්‍රහ්මයා විසින් කියන ලද ඒ ආමගන්ධ කරුණු මා විසින් අසනලදී ගිහිගෙයි වාසය කරන්නහු විසින් ඒ ආමගන්ධ කාරණයන් සුවසේ දුරු කළ නොහැක. හෙවත් ඉතා දුකසේ බැහැර කටයුත්තේය. පින්වත්නි, මම ගිහිගෙයින් නික්ම මහණ වන්නෙමියි' කීයේය. 'මම පෘථිවිය පාලනය කරන්නාවූ රෙණු රජහු ආමන්ත්‍රණය කරමි රාජ්‍යය පිළිබඳව කටයුතු දැනගනු මැනව. මම පෙරවි බැව්හි කැමති

නොවෙමි හෙවත් මහණ වෙමි.' 'එවිට රේණු රජ තෙමේ මෙසේ කියයි.

'ඉදින් ඔබට කාමයන්ගෙන් කිසි අඩුවක් වීනම් ඒ සියල්ල මම ඔබට සම්පූර්ණ කරමි. යම් කෙනෙක් ඔබට හිංසා කරයිද මම එය වළක්වමි. මම පොළවෙහි ජනයාගේ අධිපතිවෙමි (රජවෙමි.)

'නුඹ පිය තෙමේය. මම පුත්‍රවෙමි. පින්වත් ගොවින්ද පණ්ඩිතය, අප අත්නොහැරිය යුතුය. කිසියම් කාම සැපයකින් අඩුවක් නැත්තේය. එසේම අපට හිංසා කරන්නෙක්ද නැත්තේය.

'එහෙයින් අමනුෂ්‍යයෙකුගේ කථාව අසා 'මම ගිහිගෙයි නොඇලෙමියි' කීයේය. යමෙකුගේ යමක් අසා අපද ගෙයි වැසි සියල්ල හා සියලු දඹදිව වැස්සන් හරින්නෙහිද, ඒ අමනුෂ්‍යතෙම කෙබඳු වෙසයක් ඇත්තේද, ඒ තෙම ඔබට කිනම් කාරණයක් කීයේදැ'යි ඇසුවේය.

'මින් පෙර කාය විවේකය වැඩීම් වශයෙන් එකී භාවයට පැමිණ තාපස භාවයෙන් යුක්තව වාසය කෙළෙමි. යාග කරනු කැමැත්තාවූ මා විසින් මොණර පිල්වලින් අතුරණ ලද්දේ ගිණි දල්වන ලද්දේ විය. එකල්හි සනං කුමාර බ්‍රහ්ම තෙමේ බ්‍රහ්ම ලෝකයෙන් මාගේ ඉදිරියෙහි පහළ වූයේය.

'ඒ සනං කුමාර බ්‍රහ්ම තෙමේ මාගේ ප්‍රශ්න විසඳූයේය. ඒ අසා ගිහිගෙයි සිත් නොඅලවමි. පින්වත් ගොවින්ද පණ්ඩිතය, නුඹ යම් කථාවක් කීයෙහිද එය මම අදහමි.'

'බ්‍රහ්මයාගේ වචනය අසා කෙසේ නම් අන් ආකාරයකින් පවත්නහුද? අපිද ඔබ අනුව පැවිදිවෙමු.'

ගොවින්ද පණ්ඩිතය, ඔබ අපට අනුශාසනා කරන්නා වනු මැනව. කර්කශ නොවූ නිර්මලවූ යහපත්වූ වෛඩූර්‍ය මාණික්‍යයක් යම්සේද එපරිද්දෙන්ම ගොවින්ද පණ්ඩිතයන්ගේ අනුශාසනාවෙහි පිරිසිදු ලෙස හැසිරෙන්නෙමුයි' කීහ.

'ඉදින් පින්වත් ගොවින්දතෙමේ ගිහිගෙයින් නික්ම පැවිදි වන්නේ නම් අපිත් ගිහිගෙයින් නික්ම පැවිදිවන්නෙමු. ඔබගේ

යම් පරලොව ගතියක් වේද ඒ ගතිය අපගේද පරලොව ගතිය වන්නේයයි' රේණු රජ තෙමේ කීයේය.

48 'පින්වත්නි, ඊට පසුව ගොවින්ද බ්‍රාහ්මණ තෙමේ ඒ ක්ෂත්‍රියයෝ සය දෙන යම් තැනෙක්හිද එතනට පැමිණියේය. පැමිණ, ඒ ක්ෂත්‍රියයන් සයදෙනාට මේ කාරණය දැන්විය. යමෙක් පින්වතුන්ගේ රාජ්‍යයෙහි අනුශාසනා කරයිද දැන් පින්වත්හු එබඳු අන්‍ය පුරෝහිතයෙකු සොයත්වා. පින්වතුනි, මම ගිහිගෙයින් නික්ම පැවිදි වන්නට කැමැත්තෙමි බ්‍රහ්මයා විසින් කියනලද ආමගන්ධ කරුණු යම් පරිද්දෙකින් මා විසින් අසන ලද්දේද, ගිහිගෙයි වාසය කරන්නහු විසින් ඒ කාරණයෝ ඉතා දුකසේ බැහැරලියයුතුවෙත්. පින්වතුනි, එහෙයින් මම ගිහිගෙන් නික්ම පැවිදි වන්නෙමියි' කීය.

'පින්වතුනි, ඊටපසු ඒ ක්ෂත්‍රියයෝ සයදෙන එක පැත්තකට පැමිණ මෙසේ සිතූහ. 'මේ බ්‍රාහ්මණයෝ නම් ධන ලෝභීහු වෙත්. එකාන්තයෙන් අපි මහා ගොවින්ද බ්‍රාහ්මණයා ධනයෙන් සතුටු කරන්නෙමු නම් ඉතා යෙහෙකැයි සිතූහ. ඔවුහු මහාගොවින්ද බ්‍රාහ්මණයා වෙතට පැමිණ මෙසේ කීවෝය. 'පින්වත, මේ අපගේ රාජ්‍ය හතෙහි බොහෝ ධනය ඇත්තේය. ඒ ධනයෙන් පින්වතාට යම් පමණ ධනයෙන් ප්‍රයෝජන ඇත්තේ නම් එපමණ ගනු මැනවයි', කීහ. 'පින්වතුනි, මට ධනයෙන් කම්නැත. මටද බොහෝ ධනය ඇත්තේය. ඒ සියල්ල පින්වතුන්ට වේවා. මම ඒ යසස හැර ගිහිගෙයින් නික්ම පැවිදි වන්නෙමි. බ්‍රහ්මයා විසින් කියනලද ආමගන්ධ මා විසින් යම් පරිද්දෙකින් අසන ලද්දේද, ගිහිගෙයි වාසය කරන්නහු විසින් ඒ ආමගන්ධ කාරණයෝ දුකසේ අත්හැරිය යුතු වෙත්. පින්වතුනි, එම නිසා මම ගිහිගෙයින් නික්ම පැවිදි වන්නෙමි" කීය.

49 "පින්වත්නි, ඉක්බිතිව ඒ ක්ෂත්‍රියයෝ සයදෙන එක පැත්තකට රැස්ව මෙසේ සිතූහ. 'මේ බ්‍රාහ්මණයෝ නම් ස්ත්‍රීන් කෙරෙහි ආසා ඇත්තෝය. ඒකාන්තයෙන් අපි මහා ගොවින්ද බ්‍රාහ්මණයා ස්ත්‍රීන්ගෙන් සිත්ගන්නෙමු නම් යෙහෙකැයි කියා සිතූහ.' ඔවුහු මහා ගොවින්ද බ්‍රාහ්මණයා වෙතට පැමිණ මෙසේ කීහ. 'පින්වත, මේ රාජ්‍ය හතෙහි බොහෝ ස්ත්‍රීහු ඇත්තාහ. ඒ

ස්ත්‍රීන් අතුරෙන් පින්වතාට යම් පමණ ස්ත්‍රීන්ගෙන් ප්‍රයෝජන ඇත්තේද එපමණ ස්ත්‍රීහු ගෙන යනු මැනවැයි' කීහ. 'පින්වත්නි, කම් නැත. මට සමාන (ජාති ඇති) සතළිසක් ස්ත්‍රීහු වෙත්. මම ඒ සියල්ලන්ද අත්හැර ගිහිගෙයින් නික්ම පැවිදි වන්නෙමි.' ආමගන්ධ කාරණයෙන් කියන්නාවූ බ්‍රහ්මයාගේ කථාව මා විසින් අසන ලදී. ඒ ආමගන්ධ කාරණයෝ ගිහිගෙයි වසන්නහු විසින් ඉතා දුකසේ දුරුකටයුතු වෙත්. පින්වත්නි, මම ගිහිගෙයින් නික්ම පැවිදි වන්නෙමියි' කීයේය.

50 'ඉදින් භවත් ගොවින්ද තෙමේ ගිහිගෙයින් නික්ම පැවිදිවන්නේ නම් අපිත් ගිහිගෙයින් නික්ම පැවිදි වන්නෙමු.' එසේ ඇති කල්හි ඔබගේ පරලොව යම් ගතියක් වේද අපගේද ඒ පරලොව ගතිය වන්නේය 'යම්බඳු කාමයන් කෙරෙහි පෘථග්ජන තෙම ඇලුනේද ඉදින් ඒ කාමයන් දුරු කිරීමට කැමත්තහු නම් වීර්‍ය්‍ය කරව්. ඉවසීමෙන් යුක්ත දැඩි වීර්‍ය්‍යකරව්. මේ ඍජු (කෙළින්) මාර්ගය වේ. මේ අතිශයින් උතුම් මාර්ගය වේ. බ්‍රහ්ම ලොකයෙහි ඉපදීම පිණිස සත්පුරුෂයන් විසින් මේ ධර්මය ආරක්ෂා කරන ලද්දේය.'

51 'එසේ නම් පින්වත් ගොවින්ද තෙමේ අවුරුදු හතක් බලාපොරොත්තු වේවා. අවුරුදු හතක් ගිය කල්හි අපිද ගිහිගෙයින් නික්ම පැවිදි වන්නෙමු. එසේ ඇති කල්හි ඔබගේ පරලොව යම් ගතියක් වේද, එය අපගේද පරලොව ගතිය වන්නේයයි' කීහ.

'පින්වතුනි, අවුරුදුහත ඉතා බොහෝ කල් වන්නේය. මට අවුරුදු හතක් පින්වතුන් සඳහා සිටීමට නොහැකිය. පින්වතුනි, කවරෙක් නම් ජීවිතයන්ගේ පැවතීම දනීද ඒකාන්තයෙන් පරලොව යා යුත්තේ වෙයි. ඥාණයෙන් දැන අවබොධ කටයුත්තේ වෙයි. කුසල් කටයුතුයි. බ්‍රහ්මචර්‍ය්‍යාව රැකිය යුතුයි. උපන්නාවූ සත්වයාට නොමැරී සිටීමක් නැත්තේය. ආමගන්ධ කාරණයන් කියන්නාවූ සනං කුමාර බ්‍රහ්මයාගේ කථාව මා විසින් යම්පරිද්දෙකින් අසන ලද්දේද ඒ ආමගන්ධ කාරණයෝ ගිහිගෙයි වසන්නාහු විසින් දුකසේ අත්හැරිය යුතුවෙත්යයි' කීවේය.

**52** 'එසේ නම්, පින්වත් ගොවින්ද තෙමේ, අවුරුදු සයක් බලාපොරොත්තු වේවා. අවුරුදු හයක් ගිය කල අපිද ගිහිගෙයින් නික්ම පැවිදි වන්නෙමු. එසේ ඇති කල්හි ඔබගේ පරලොව යම් ගතියක් වේද, එය අපගේද පරලොව යම් ගතියක් වේද, එය අපගේද පරලොව ගතිය වන්නේයයි' කීය.

'පින්වතුනි, අවුරුදු හය බොහෝ කල් වන්නේය. මට පින්වතුන් සඳහා අවුරුදු හයක් සිටීමට නොහැකිය. පින්වතුනි, කවරෙක් නම් ජීවිතයන්ගේ පැවතීම දනීද, ඒකාන්තයෙන් පරලොව යා යුත්තේ වෙයි. කුසල් කළ යුතුයි, ඥාණයෙන් දැන අවබොධ කටයුතුයි. බ්‍රහ්මචර්‍ය්‍යාව රැකිය යුතුයි උපන්නාවූ සත්වයාට නොමැරී සිටීමක් නැත්තේය. ආමගන්ධ කාරණයෙන් කියන්නාවූ බ්‍රහ්මයාගේ කථාව මා විසින් අසන ලදී. ඒ ආමගන්ධ කාරණයෝ ගිහිගෙයි වසන්නහු විසින් දුකසේ අත්හැරිය යුතුවෙත්යයි' කීවේය.

'එසේනම්, පින්වත් ගොවින්ද තෙමේ, අවුරුදු පහක් බලාපොරොත්තු වේවා. අවුරුදු පහක් ගියකල අපිද ගිහිගෙයින් නික්ම පැවිදි වන්නෙමු එසේ ඇතිකල්හි ඔබගේ යම් පරලොව ගතියක් වේද, එය අපගේද පරලොව ගතිය වන්නේයයි' කීහ. 'පින්වතුනි, අවුරුදු පහ බොහෝ කල් වන්නේය. මට පින්වතුන් සඳහා අවුරුදු පහක් සිටීමට නොහැකිය. පින්වතුනි, කවරෙක් නම් ජීවිතයන්ගේ පැවතීම දනීද, ඒකාන්තයෙන් පරලොව යා යුත්තේ වෙයි. ඥාණයෙන් අවබොධ කටයුතුයි. කුසල් කළ යුතුයි. බ්‍රහ්මචර්‍ය්‍යාව රැකිය යුතුයි. උපන්නාවූ සත්වයාට නොමැරී සිටීමක් නැත්තේය. ආමගන්ධ කාරණයන් කියන්නාවූ බ්‍රහ්මයාගේ කථාව මා විසින් අසන ලදී. ඒ ආමගන්ධ කාරණයෝ ගිහිගෙයි වසන්නාහු විසින් දුකසේ අත්හැරිය යුතු වෙත්යයි' කීවේය.

'එසේ නම් පින්වත් ගොවින්ද තෙමේ, අවුරුදු හතරක් බලාපොරොත්තු වේවා, අවුරු හතරක් ගිය කල අපිද ගිහිගෙයින් නික්ම පැවිදි වන්නෙමු. එසේ ඇති කල්හි ඔබගේ පරලොව යම් ගතියක් වේද, එය අපගේද පරලොව ගතිය වන්නේයයි' කීහ.

'පින්වතුනි, අවුරුදු හතර බොහෝ කල් වන්නේය. මට පින්වතුන් සඳහා අවුරුදු හතරක් සිටීමට නොහැකිය, පින්වතුනි, කවරෙක් නම් ජීවිතයන්ගේ පැවැතීම දනිත්ද, ඒකාන්තයෙන් පරලොව යායුත්තේ වෙයි. ඥාණයෙන් අවබොධ කටයුතුයි. කුසල් කටයුතුයි, බ්‍රහ්මචර්‍ය්‍යාව රැකිය යුතුයි, උපන්නාවූ සත්වයාට නොමැරී සිටීමක් නැත්තේය. ආමගන්ධ කාරණයෙන් කියන්නාවූ බ්‍රහ්මයාගේ කථාව මා විසින් අසන ලදී. ඒ ආගමන්ධ කාරණයෝ ගිහිගෙයි වසන්නහු විසින් දුකසේ අත්හැරිය යුතු වෙත්යයි' කීය.

'එසේනම්, පින්වත් ගොවින්දතෙමේ අවුරුදු තුනක් බලාපොරොත්තු වේවා. අවුරුදු තුනක් ගියපසු අපිද ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නෙමු එසේ ඇතිකල්හි ඔබගේ පරලොව යම් ගතියක් වේද, එය අපගේද පරලොව ගතිය වන්නේයයි' කීහ.

'පින්වතුනි, අවුරුදු තුන බොහෝ කල් වන්නේය, මට පින්වතුන් සඳහා අවුරුදු තුනක් සිටීමටද නොහැකිය. පින්වතුනි, කවරෙක් නම් ජීවිතයන්ගේ පැවැත්ම දනීද. ඒකාන්තයෙන් පරලොව යා යුත්තේ වෙයි. ඥාණයෙන් අවබොධ කටයුතුයි, කුසල් කටයුතුයි, බ්‍රහ්මචර්‍ය්‍යාව රැකිය යුතුයි. උපන්නාවූ සත්වයාට නොමැරී සිටීමක් නැත්තේය. ආමගන්ධ කාරණයන් කියන්නාවූ බ්‍රහ්මයාගේ කථාව මා විසින් අසන ලදී. ඒ ආමගන්ධ කාරණයෝ ගිහිගෙයි වසන්නහු විසින් දුකසේ අත්හැරිය යුතුයි' කීය

'එසේනම්, පින්වත් ගොවින්ද තෙමේ අවුරුදු දෙකක් බලාපොරොත්තුවේවා. අවුරුදු දෙකක් ගියකල අපිද ගිහිගෙයින් නික්ම පැවිදි වන්නෙමු. එසේ ඇතිකල්හි ඔබගේ පරලොව යම් ගතියක් වේද, එය අපගේද පරලොව ගතිය වන්නේයයි' කීහ 'පින්වතුනි, අවුරුදු දෙක බොහෝ කල් වන්නේය පින්වතුන් සඳහා අවුරුදු දෙකක් සිටීමට නොහැක්කෙමි. පින්වතුනි, කවරෙක් නම් ජීවිතයන්ගේ පැවැත්ම දනිත්ද, ඒකාන්තයෙන් පරලොව යා යුත්තේය. ඥාණයෙන් අවබොධ කටයුතුයි කුසල් කටයුතුයි. බ්‍රහ්මචර්‍ය්‍යාව රැකිය යුතුයි. උපන්නාවූ සත්වයාට නොමැරී සිටීමක් නැත්තේය. ආමගන්ධ කාරණයන් කියන්නාවූ බ්‍රහ්මයාගේ කථාව මා විසින් අසන ලදී. ඒ ආගමන්ධ කාරණයෝ

ගිහිගෙයි වාසය කරන්නහු විසින් දුකසේ අත්හැරිය යුත්තාහුයයි' කීහ. 'එසේනම් පින්වත් ගොවින්ද තෙමේ එක අවුරුද්දක් බලාපොරොත්තු වේවා. එක අවුරුද්දක් ගිය කල අපිද ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නෙමු එසේ ඇතිකල්හි ඔබගේ පරලොව යම් ගතියක් වේද, එය අපගේද පරලොව ගතිය වන්නේයයි' කීහ.

53 'පින්වතුනි, එක අවුරුද්දක් බොහෝ කල්ය. එක අවුරුද්දක් පින්වතුන් සඳහා බලාපොරොත්තු වන්නට නොහැක්කෙමි. පින්වත්නි, කවරෙක් ජීවිතයන්ගේ පැවැතීම දනීද, ඒකාන්තයෙන් පරලොව යා යුත්තේ වෙයි. සියල්ල ඤාණයෙන් දැන අවබොධ කටයුතුයි. කුසල් කටයුතුයි, බ්‍රහ්මචර්‍ය්‍යාව කටයුතුයි. උපන් සත්වයාට මරණයෙන් නිදහස් වීමක් නැත්තේය. ආමගන්ධ කාරණයන් කියන්නාවූ සනං කුමාර බ්‍රහ්මයාගේ කථාව මා විසින් අසනලදී. ඒ කාරණයත් ගිහිගෙයි වසන්නහු විසින් ඉතා දුකසේ අත්හැරිය යුතුයයි කීවේය.

'එසේනම් පින්වත් ගොවින්ද තෙමේ මාස හතක් බලාපොරොත්තු වේවා. මාස හතක් ගිය කල්හි අපිද ගිහි ගෙයින් නික්ම පැවිදිවන්නෙමු. එසේ ඇති කල්හි ඔබගේ පරලොව යම් ගතියක් වන්නේද, ඒ අපගේද පරලොව ගතිය වන්නේ යයි" කීහ.

54 'පින්වත්නි, මාස හත ඉතා වැඩිය. මාස හතක් දක්වා පින්වතුන් සඳහා සිටීමට නොහැක්කෙමි. පින්වත්නි, කවරෙක් නම් ජීවිතයන්ගේ පැවැත්ම දනීද, ඒකාන්තයෙන් පරලොව යා යුත්තේ වෙයි. යන මේ සියල්ල ඥාණයෙන් දැන අවබොධ කටයුතුයි, කුසල් කටයුතුයි. බ්‍රහ්මචර්‍ය්‍යාව රැකිය යුතුයි. උපන් සත්වයාට නොමැරීමක් නැත්තේය. ආමගන්ධ කාරණයන් කියන්නාවූ බ්‍රහ්මයාගේ කථාව මා විසින් අසන ලදී. ඒ කාරණයෝ ගිහිගෙයි වසන්නවුන් විසින් ඉතා දුකසේ අත්හැරිය යුතු වෙත්යයි' කීය.

'එහෙනම්, පින්වත් ගොවින්දතෙමේ මාස හයක් බලාපොරොත්තුවේවා. මාස හයක් ගියකල අපිද ගිහිගෙයින් නික්ම මහණ වන්නෙමු. එසේ කල ඔබගේ පරලොව යම් ගතියක් වන්නේද, අපගේ පරලොව ඒ ගතිය වන්නේය' යි කීහ.

'පින්වත්නි, මාස හය බොහෝ කල් වන්නේය, පින්වතුන් නිසා මාස හයක් ඉවසීමට බැරිය පින්වතුනි, කවරෙක් නම් ජීවිතයන්ගේ පැවැතීම දනීද, ඒකාන්තයෙන් පරලොව යා යුත්තේ වෙයි යන මේ සියල්ල ඥානයෙන් දැන අවබොධ කටයුතුයි. කුසල් කළ යුතුයි. බ්‍රහ්මචය්‍ය‍්‍යාව රැක්ක යුතුයි. උපන් සත්වයාගේ නොමැරී සිටීමක් නැත්තේය. ආමගන්ධ කාරණයන් කියන බ්‍රහ්මයාගේ කථාව මවිසින් අසන ලදී. එම කාරණයෝ ගිහිගෙයි වසන්නහු විසින් ඉතා දුකසේ අත්හැරිය යුතු වෙත්ය' යි කීය.

'එහෙනම්, පින්වත් ගොවින්දතෙමේ මාස පහක් සිටිවා මාස පහක් ගියකල අපිද ගිහිගෙයින් නික්ම මහණවන්නෙමු. එසේ කල ඔබගේ පරලොව යම් ගතියක් වේද? අපගේද පරලොව ඒ ගතිය වන්නේය' යි කීය.

'පින්වතුනි, මාස පහ බොහෝ කල් වන්නේය. මට පින්වතුන් නිසා මාස පහක් සිටීමට බැරිය, පින්වතුනි, කවරෙක් නම් ජීවිතයන්ගේ පැවැතීම දනීද, ඒකාන්තයෙන් පරලොව යායුත්තේ වෙයි. මේ සියල්ල ඥානයෙන් දැන අවබොධ කළ යුතුයි. කුසල් කළ යුතුයි බ්‍රහ්මචය්‍ය‍්‍යාව රැක්ක යුතුයි. උපන් සත්වයාට නොමැරීසිටීමක් නැත්තේය. ආමගන්ධ කාරණයන් කියන බ්‍රහ්මයාගේ කථාව මා විසින් අසනලදී. එම කාරණයෝ ගිහිගෙයි වසන්නහු විසින් ඉතා දුකසේ අත්හැරියයුතු වෙත්යයි' කීය.

'එහෙනම්, පින්වත් ගොවින්ද තෙමේ මාස හතරක් සිටීවා. මාස හතරක් ගිය කල්හි අපිද ගිහිගෙයින් නික්ම මහණ වන්නෙමු. එසේ කල ඔබගේ පරලොව යම් ගතියක් වන්නේද එය අපගේද පරලොව ගතිය වන්නේයයි' කීහ.

'පින්වත්නි, මාස හතර ඉතා බොහෝ කල් වන්නේය. මට පින්වතුන් නිසා මාස හතරක් සිටීමට බැරිය. පින්වත්නි, කවරෙක් නම් ජීවිතයන්ගේ පැවතීම දනීද, ඒකාන්තයෙන පරලොව යා යුත්තේවෙයි. සියල්ල ඥානයෙන් දැන අවබොධ කළ යුතුයි. කුසල් කල යුතුයි. බ්‍රහ්මචය්‍ය‍්‍යාව රැක්ක යුතුයි. උපන් සත්වයාට නොමැරීමක් නැත්තේය. ආමගන්ධ කාරණයන් කියන්නාවූ

බ්‍රහ්මයාගේ කථාව මා විසින් අසන ලදී. එම කාරණයෝ ගිහිගෙයි වසන්නහු විසින් ඉතා දුකසේ අත්හැරිය යුත්තේ වෙයි.'

'එහෙනම් පින්වත් ගොවින්ද තෙමේ මාස තුනක් බලාපොරොත්තු වේවා. මාස තුනක් ගිය කල්හි අපිද ගිහි ගෙයින් නික්ම, මහණවන්නෙමු. එසේ කල ඔබගේ පරලොව යම් ගතියක් වේද, අපගේද පරලොව ඒ ගතිය වන්නේයයි' කීහ.

'පින්වතුනි, මාස තුන ඉතා බොහෝකල් වන්නේය. මට පින්වතුන් නිසා මාස තුනක් සිටීමට බැරිය. පින්වතුනි කවරෙක් නම් ජීවිතයාගේ පැවතීම දනීද, ඒකාන්තයෙන් පරලොව යා යුත්තේ වෙයි. සියල්ල ඥානයෙන් දැන අවබොධ කළ යුතුය. කුසල් කළ යුතුය. බ්‍රහ්මචර්‍ය්‍යාව රක්ක යුතුයි. උපන් සත්වයාට මරණයෙන් බේරීමක් නැත්තේය. ආමගන්ධ කාරණයන් කියන්නාවූ බ්‍රහ්මයාගේ කථාව මා විසින් අසනලදී. එම කාරණයෝ ගිහිගෙයි වසන්නහු විසින් දුකසේ අත්හැරිය යුතු වෙත්යයි' කීය.

'එහෙනම්, පින්වත් ගොවින්ද තෙමේ මාස දෙකක් සිටීවා. මාස දෙකක් ගිය කල අපිද ගිහිගෙයින් නික්ම මහණ වන්නෙමු. එසේ කල ඔබගේ පරලොව යම් ගතියක් වේද, අපගේද පරලොව ඒ ගතිය වන්නේයයි' කීහ.

'පින්වතුනි, මාස දෙක ඉතා බොහෝ කල් වන්නේය. මට පින්වතුන් සඳහා මාස දෙකක් ඉඳීමට බැරිය පින්වතුනි, කවරෙක් නම් ජීවිතයන්ගේ පැවතීම දනීද, ඒකාන්තයෙන් පරලොව යා යුත්තේවෙයි. සියල්ල ඥානයෙන් දැන අවබොධ කළ යුතුය. කුසල් කළයුතුය. බ්‍රහ්මචර්‍ය්‍යාව කළ යුතුය. උපන්නාවූ සත්වයාට මරණයෙන් ගැලවීමක් නැත්තේය. ආමගන්ධ කාරණා කියන බ්‍රහ්මයාගේ කථාව මවිසින් අසන ලදී. එම කාරණයෝ ගිහිගෙයි වසන්නහු විසින් ඉතා දුකසේ අත්හැරිය යුතුවෙත්යයි' කීහ.

'එසේනම් පින්වත් ගොවින්ද තෙමේ මාසයක් බලාපොරොත්තු වේවා. මාසයක් ගිය කල අපිද ගිහිගෙයින් නික්ම පැවිදි වන්නෙමු. එසේ කල ඔබගේ පරලොව යම් ගතියක් වේද අපගේද පරලොව ඒ ගතිය වන්නේය.'

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

'පින්වතුනි, මාසයක් ඉතා බොහෝ කල් වන්නේය. මට පින්වතුන් උදෙසා මාසයක් ඉවසීමට නොහැකිය. පින්වතුනි, කවරෙක් නම් ජීවිතයාගේ පැවැතීම දනිද, ඒකාන්තයෙන් පරලොව යායුත්තේ වෙයි සියල්ල ඥානයෙන් දැන අවබොධ කළ යුතුයි. කුසල් කළ යුතුය. බ්‍රහ්මචර්‍ය්‍යාව රැක්ක යුතුය. උපන්නාවූ සත්වයාට මරණයෙන් ගැලවීමක් නැත්තේය. ආමගන්ධ කාරණයන් කියන්නාවූ බ්‍රහ්මයාගේ කථාව මා විසින් අසනලදී. එම කාරණයෝ ගිහිගෙයි වසන්නහු විසින් ඉතා දුකසේ අත්හැරිය යුතු වෙත්.'

'එසේනම්, පින්වත් ගොවින්ද තෙමේ මාස බාගයක් බලාපොරොත්තු වේවා. මාස බාගයක් ගිය කල අපිද ගිහිගෙයින් නික්ම මහණ වන්නෙමු. එසේ කල ඔබගේ පරලොව යම් ගතියක් වේද අපගේද පරලොව ඒ ගතිය වන්නේයයි' කීහ.

55. 'පින්වත්නි, මාස බාගයක් ඉතා වැඩිය. පින්වතුන් සඳහා මාස බාගයක් බලාපොරොත්තු වන්නට මට බැරිය. කවරෙක් නම් ජීවිතයන්ගේ පැවැතීම දනීද, උපන්නහු විසින් පරලොව යායුත්තේම වෙයි. මේ සියල්ල ඥානයෙන් දැනගෙන අවබෝධ කළ යුතුයි. කුසල් කළ යුතුයි. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරිය යුතුයි. උපන්නාවූ සත්වයාට ජරා මරණ රහිත බවක් නැත්තේය ආමගන්ධ කාරණයන් කියන්නාවූ බ්‍රහ්මයාගේ කථාව මා විසින් අසන ලදී. ඒ ක්ලෙශයෝ ගිහිගෙයි වසන්නහු විසින් ඉතා දුකසේ අත්හැරිය යුතු වෙත්යයි' කීය.

'පින්වතුනි, මම ගිහිගෙයින් නික්ම පැවිදි වන්නෙමි' කීයේය.

'එසේනම් ගොවින්දයෙනි, සත් දවසක් බලාපොරොත්තු වේවා. යම්තාක් අපි තම තමන්ගේ පුත්‍රයන් හා සොහොයුරන් රාජ්‍යයන්හි අනුශාසනා කරමුද ඒ සඳහායි, සත් දවසක් ගිය කල අපිද ගිහිගෙයින් නික්ම පැවිදිවන්නෙමු. එසේ ඇති කල්හි ඔබගේ පරලොව යම් ගතියක් වේද එය අපගේද පරලොව ගතිය වන්නේයයි' කීහ

'පින්වතුනි, සත්දවස ඉතා බොහෝ කලක් නොවෙයි පින්වතුනි මම සත්දවසක් බලාපොරොත්තු වන්නෙමියි' කීයේය.

**56** "පින්වත්නි, ඉක්බිතිව මහාගොවින්ද බ්‍රාහ්මණ තෙමේ ඒ මහාසාර බ්‍රාහ්මණයන් සත්දෙන යම් තැනෙක්හිද නහාතකයෝ සත්සියය යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ, මාහාසාර බ්‍රාහ්මණයන් සත්දෙනටද, නහාතකයන් සත්සියයටද මේ කාරණය කීයේය. දැන් යමෙක් පින්වතුන්ට මන්ත්‍රයන් කියන්නේද, පින්වත්හු එබඳු අන්‍ය ආචාර්‍ය්‍යයෙකු සොයත්වා. පින්වතුනි, මම ගිහිගෙන් නික්ම පැවිදි වන්නට කැමැත්තෙමි. ආමගන්ධ කාරණයන් කියන්නාවූ බ්‍රහ්මයාගේ කථාව මා විසින් අසන ලදී. ඒ කාරණයෝ ගිහිගෙයි වසන්නහු විසින් දුකසේ අත්හැරිය යුතු වෙත්. පින්වත්නි, මම ගිහිගෙයින් නික්ම පැවිදි වන්නෙමියි කීයේය.'

'පින්වත් තෙමේ ගිහිගෙයින් නික්ම පැවිදි නොවේවා. පින්වත, මහණකම ස්වල්පවූ යසස් ඇත්තේද ස්වල්පවූ ලාභ ඇත්තේද වෙයි. බ්‍රාහ්මණභාවය මහත් යසස් ඇත්තේද මහත් ලාභ ඇත්තේද වේයයි' කීහ.

"පින්වතුනි, එසේ නොකියව්. මහණකම ස්වල්ප යසස් ඇත්තේද වෙයි. ස්වල්පවූ ලාභ ඇත්තේද වෙයි. බ්‍රාහ්මණ භාවය මහත් යසස් ඇත්තේ වෙයි. මහත් ලාභ ඇත්තේද වෙයි කියා නොකියව්. පින්වතුනි, අන් කවරෙක් නම් මට වඩා මහත් යසස් ඇත්තේ හෝ මහත් ලාභ ඇත්තේදැයි ඇසුවේය. පින්වතුනි, දැන් මම රජවරුන්ගේ රජවෙමි. බ්‍රාහ්මණයන්ගේ බ්‍රාහ්මණ වෙමි. ගෘහපතියන්ගේ දේවතා වෙමි. මම ඒ සියල්ලද හැර ගිහිගෙයින් නික්ම පැවිදි වන්නෙමි. ආමගන්ධ කාරණයන් කියන්නාවූ සනං කුමාර බ්‍රහ්මයාගේ කථාව මවිසින් අසන ලදී. ගිහිගෙයි වසන්නහු විසින් ඒ ක්ලේශ ධර්මයෝ දුකසේ බැහැරලිය යුත්තෝ වෙත්. පින්වත්නි, මම ගිහිගෙයින් නික්ම පැවිදි වන්නෙමියි' කීයේය.

'ඉදින් පින්වත් ගොවින්ද තෙමේ ගිහිගෙයින් නික්ම මහණ වන්නේ නම් අපිද ගිහිගෙයින් නික්ම මහණ වන්නෙමු. එසේ ඇති කල්හි ඔබගේ පරලොව යම් ගතියක් වන්නේද එය අපගේද පරලොව ගතිය වන්නේයයි කීහ.

**57** "පින්වත්නි, ඊටපසුව මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ සමාන ජාතිගොත්‍ර ඇති සතලිසක් භාර්‍ය්‍යාවෝ යම්තැනෙක්හිද

එතැනට පැමිණියේය. පැමිණ සමාන ජාතිගොත්‍ර ඇති සතලිසක් භාර්‍ය්‍යාවන්ට මේ කාරණය කීයේය. 'යම් පින්වතියක් නොකැමැත්තී නම් ඕ තොමෝ තමාගේ ඥාති කුලයට හෝ යේවා. අන්‍ය ස්වාමියෙකු හෝ සොයාවා. පින්වතියනි, මම ගිහිගෙයින් නික්ම පැවිදි වන්නට කැමැත්තෙමි. ආමගන්ධ කාරණයන් කියන්නාවූ බ්‍රහ්මයාගේ කථාව මා විසින් අසන ලදී. ඒ ක්ලේශ ධර්මයෝ ගිහිගෙයි වසන්නහු විසින් ඉතා දුකසේ අත්හැරිය යුතුවෙත්. පින්වතියෙනි, මම ගිහිගෙයින් නික්ම පැවිදි වන්නෙමියි' කීයේය.

'ඔබම නෑයන් කැමැත්තාවූ අපගේ ඥාතිවෙහි. ඔබම ස්වාමීන් කැමැත්තාවූ අපගේ ස්වාමී වෙහියි! කීහ.

'ඉදින් පින්වත් ගොවින්ද ගිහිගෙයින් නික්ම පැවිදි වන්නේ නම්, අපිද ගිහිගෙයින් නික්ම පැවිදි වන්නෙමු එසේ ඇති කල්හි ඔබගේ යම් පරලොව ගතියක් වන්නේ නම් එය අපගේද පරලොව ගතිය වන්නේයයි' කීහ.

58 'පින්වත්නි, ඊට පසුව මහා ගොවින්ද බ්‍රාහ්මණ තෙමේ ඒ සත් දවස ඉක්ම ගිය කල්හි කෙස් දැලි රැවුලු කපා කාසාව වස්ත්‍රයන් ඇඳගෙන ගිහිගෙයින් නික්ම මහණවූයේය. මහණවූ මහා ගොවීන්ද බ්‍රාහ්මණයාට අනුව ක්ෂත්‍රිය කුලයෙහි උපන්නාවූ ඔටුණු පලන් සත් රජහුද, මහසල් බමුණෝ සත්දෙනද සත්සියයක් නහාතකයෝද සමාන ජාතිගොත්‍ර ඇති සම සතලිසක් භාර්‍ය්‍යාවෝද පැවිදිවූහ. එසේම නොයෙක් දහස් ගණන් ක්ෂත්‍රියෝද, නොයෙක් දහස් ගණන් බ්‍රාහ්මණයෝද, නොයෙක් දහස් ගණන් ගෘහපතීහුද, අන්තඃපුර ස්ත්‍රීන් අතුරෙන් නොයෙක් ස්ත්‍රීහුද, කෙස් දැලි රැවුල කපා සිවුරු හැඳ ගිහිගෙයින් නික්ම මහා ගොවින්ද, බ්‍රාහ්මණයාට අනුව මහණවූහ. පින්වත්නි, එකල්හි ඒ පැවිදි පිරිස පිරිවරණලද මහා ගොවින්ද බ්‍රාහ්මණ තෙමේ ගම් නියම් ගම් රාජධානිවල හැසිරීම් කරයි. පින්වත්නි, ඒ කාලයෙහි මහා ගොවින්ද බ්‍රාහ්මණ තෙම යම් ගමකට හෝ නියම් ගමකට පැමිණියේද එහි රජුන්ගේ රජද වෙයි. බ්‍රාහ්මණයන්ගේ බ්‍රාහ්මණද වෙයි. ගෘහපතියන්ගේ දේවතාද වෙයි. පින්වත්නි, ඒ කාලයෙහි යම් යම් මනුෂ්‍ය කෙනෙක්

නාසාවාත හරින්නේ හෝ කණුකටු ආදියක හැපෙන්නේ හෝ වෙත්ද, ඔව්හු මෙසේ කීහ. 'මහාගොවින්ද බ්‍රාහ්මණයාට නමස්කාර වේවා, පුරොහිතයන් සත්දෙනාටද, නමස්කාර වේවා' කියායි.

**59** "පින්වත්නි, මහා ගොවින්ද බ්‍රාහ්මණ තෙමේ මෛත්‍රිය සමග පැවති සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කෙළේය. එසේම දෙවන දිසාවද, එසේම තුන්වන දිසාවද එසේම සතරවන දිසාවද, මෙසේ උඩද, යටද, හරහද, යන සියලු කල්හි සියලු තන්හි පැතිර පවතින බැවින් සියල්ල ඇත්තාවූ විපුලවූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ ක්‍රොධ නැත්තාවූ මෛත්‍රිය සමග පැවති සිත පතුරුවා වාසය කළේය. කරුණාව සමග පැවති සිතින්ද එක් දිසාවක් පතුරුවා වාසය කළේය. එසේම දෙවන දිසාවද, එසේම තුන්වන දිසාවද, එසේම සතරවන දිසාවද, මෙසේ උඩ, යට, හරහදැයි සියලු කල්හි සියලු තැන පැතිර පවතින හෙයින් සියල්ල ඇත්තාවූ විපුලවූ මහත් බවට පැමිණියාවූ ප්‍රමාණයක් නැති වෛර නැති ව්‍යාපාද නැති කරුණාව සමග පැවති සිත පතුරුවා වාසය කෙළේය. මුදිතාව සමග පැවති සිතින්ද, එක් දිශාවක් පතුරුවා වාසය කෙළේය. එසේම දෙවන දිසාවද, එසේම තුන්වන දිසාවද, එසේම සතරවන දිසාවද, මෙසේ උඩද, යටද, සරසදැයි යන සෑම කල්හි සෑම තන්හි පැතිර පවතින බැවින් සියල්ල ඇත්තාවූ විපුලවූ මහත්වූ අප්‍රමාණවූ වෛරනැත්තාවූ ක්‍රොධ නැත්තාවූ සතුටු සමග පැවති සිත පතුරුවා වාසය කෙළේය. මධ්‍යස්ථතාව සමග පැවැති සිතින්ද, එක් දිසාවක් පතුරුවා වාසය කෙළේය. එසේම දෙවන දිසාවද, එසේම තුන්වන දිසාවද එසේම සතරවෙනි දිසාවද, මෙසේ උඩද, යටද, සරසදැයි යන සෑම කල්හි සෑම තැන්හි පැතිර පවතින බැවින් සියල්ල ඇත්තාවූ විපුලවූ මහත් බවට පැමිණියාවූ ප්‍රමාණයක් නැත්තාවූ වෛර නැත්තාවූ ක්‍රොධ රහිතවූ උපෙක්ෂා සහගත සිත පතුරුවා වාසය කෙළේය. ශ්‍රාවකයන්ටද, බඹලොව බ්‍රහ්මයාගේ සහභාවය පිණිස මාර්ගය දේශනා කෙළේය.

**60.** "පින්වත්නි, ඒ කාලයේදී මහා ගොවින්ද බ්‍රාහ්මණයාගේ ශ්‍රාවක කෙනෙක් සියලු ආකාරයෙන් සියලු අනුශාසනාව

දැනගත්තාහුද, ඔව්හු ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති බඹලොව උපන්හ. යම් කෙනෙකු සර්වප්‍රකාරයෙන් එක් අනුශාසනාවක්වත් නොදනිද්ද ඔව්හු ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු ඇතැම් කෙනෙක් පරනිර්මිත වසවර්ති දෙවියන්ගේ සහභාවයට පැමිණියාහුය. ඇතැම් කෙනෙක් නිර්මානරතී දෙවියන්ගේ සහභාවයට පැමිණියාහුය. ඇතැම් කෙනෙක් තුසිත දෙවියන්ගේ සහභාවයට පැමිණියාහුය. ඇතැම් කෙනෙක් යාම දෙවියන්ගේ සහභාවයට පැමිණියාහුය. ඇතැම් කෙනෙක් තව්තිසා වැසි දෙවියන්ගේ සහභාවයට පැමිණියාහ. ඇතැම් කෙනෙක් චාතුර්මහාරාජික දෙවියන්ගේ සහභාවයට පැමිණියහ. යම් කෙනෙක් සර්වප්‍රකාරයෙන් මේ සියල්ලටම වඩා අතිශයින් ලාමකවූ ගතියක් සම්පූර්ණ කළාහුද, ඔව්හු ගාන්ධර්ව නිකාය සම්පූර්ණ කළාහුය. මෙසේ ඒ සියලු කුලපුත්‍රයන්ගේ පැවිද්ද හිස් නොවීය, වඳ නොවීය, ඵල සහිත විය.

61. "භාග්‍යවතුන් වහන්සේ එය සිහි කෙරේදැයි" ඇසුවේය. "පඤ්චසිඛය, මම එය සිහි කරමි. මම ඒ කාලයේදී මහා ගොවින්ද බ්‍රාහ්මණ වූයෙමි. මම ඒ ශ්‍රාවකයන්ට බඹ ලොව බ්‍රහ්මයන්ගේ සහභාවය පිණිස පවතින මාර්ගය දේශනා කෙළෙමි. පඤ්චසිඛය, ඒ බ්‍රහ්මචය්‍ය්‍යාව සසර කලකිරීම පිණිස නොපවතී. සසර නොඇලීම පිණිසද නොපවතී. කෙලෙස් දුරු කිරීම පිණිසද නොපවතී, කෙලෙස් සංසිඳවීම පිණිසද නොපවතී, සංසාර වෘත්තය විශෙෂයෙන් දැනගැනීම පිණිස හෙවත් ඉතා උසස් ඥාණ ලාභය පිණිස නොපවතී. සම්‍යක් සම්බෝධිය ලැබීම පිණිසද නොපවතී. කෙලෙස් නැතිකර ලබන නිර්වාණය පිණිසද නොපවතී, බඹලොව ඉපදීම පිණිසම පවතී. පඤ්චශිඛය, මාගේ මේ බ්‍රහ්මචය්‍ය්‍යාව ඒකාන්තයෙන් සසර කලකිරීම පිණිසද, සසර නොඇලීම පිණිසද කෙලෙස් දුරුකිරීම පිණිසද, කෙලෙසුන් සංසිඳවීම පිණිසද, විශිෂ්ට ඥාණ ලාභය පිණිසද සම්‍යක් සම්බෝධිය පිණිසද, කෙලෙස් නැතිකිරීමෙන් ලබන නිර්වාණය පිණිසද පවතී. එනම් මේ අංග අටකින් යුක්තවූ ආය්‍ය්‍ය මාර්ගයයි, ඒ අට කවරේද යත්, සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාය සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය සම්‍යක් සමාධිය, යන මෙයි.

පංචශිඛය, ඒ මේ බ්‍රහ්මචර්‍ය්‍යාව ඒකාන්තයෙන් සසර කලකිරීම පිණිසද, සසර නොඇලීම පිණිසද, කෙලෙස් දුරුකිරීම පිණිසද, කෙලෙස් සංසිඳවීම පිණිසද, ඉතා උසස් ඥාණ ලාභය පිණිසද, සම්‍යක් සම්බෝධිය පිණිසද, නිර්වාණය පිණිසද පවතින්නේය.

**62.** "පංචශිඛය, යම් ශ්‍රාවක කෙනෙක් සියලු ආකාරයෙන් මාගේ අනුශාසනාව දැනගනිත්ද, ඒ ශ්‍රාවකයෝ කෙලෙස් නැති කිරීමෙන් කෙලෙස් රහිතවූ හිතේ නිදහසද අර්හත්ඵල ප්‍රඥාවද මේ ආත්ම භාවයේදීම තමන්ම ඉතා උසස්ඥානයෙන් දැන අවබෝධකොට ඊට පැමිණ වාසය කරත්. යම් ශ්‍රාවකයෙක් සියලු අනුශාසනාව දැන නොගණිද, ඒ ඇතැම් කෙනෙක් ඕරම්භාගිය (යට භජනය කරන) යයි කියනලද කාම භාවයෙහි රැහැන් පහ නැති කිරීමෙන් ඕපපාතික වෙත්. ඒ බඹලොවදීම පිරිනිවන් පාන ස්වභාව ඇත්තෝ වෙත්. ඒ බ්‍රහ්ම ලෝකයෙන් නැවත නොඑන ස්වභාව ඇත්තෝ වෙත්. යම් කෙනෙක් සර්ව ප්‍රකාරයෙන් සියලු අනුශාසනාව දැන නොගනිත්ද ඒ ඇතැම් කෙනෙක් තුන් ආකාර (සංයෝජන) රැහැන් නැතිකිරීමෙන් රාග ද්වේෂ මෝහයන්ගේ තුනී කිරීමෙන් සකෘදාගාමී වෙත්. එක් වරක්ම මේ ලොවට උත්පත්ති වශයෙන් පැමිණ සංසාර දුක කෙළවර කෙරෙත්. යම් ශ්‍රාවකකෙනෙක් සර්වප්‍රකාරයෙන් සියලු අනුශාසනාව නොදනිද්ද, ඒ ඇතැම් කෙනෙක් තුන් ආකාර (සංයෝජන) රැහැන් නැතිකිරීමෙන් ශ්‍රොතාපන්න පුද්ගල වෙත්. අපායෙහි වැටෙන ස්වභාව ඇත්තෝ නොවෙත්. අර්හත්වයට පැමිණීම නියතකොට ඇත්තෝ වෙත්. සම්බෝධිය පිහිට කොට ඇත්තෝ වෙත්. පංචසිඛය, මෙසේ ඇති කල්හි මේ සියලු කුල පුත්‍රයන්ගේ මහණකම හිස් නොවෙයි, වඳ නොවෙයි, විපාක සහිත වෙයි, දියුණුව සහිත වේයයි" භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍ර ධර්මය මෙසේ දේශනා කළෝය.

සතුටු සිත් ඇති පංචශිඛ ගාන්ධර්ව පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදේශනාව සතුටින් පිළිගෙන අනුමෝදන්ව භාග්‍යවතුන් වහන්සේ හොඳින් වැඳ පැදකුණුකොට (ගෞරව දක්වා) එහිදීම නොපෙනී ගියේය.

(මහා ගොවින්ද සූත්‍රය මෙතෙකින් නිමියේය.)

# 20. මහා සමය සූත්‍රය.

1. මාගේ ඇසීම මෙසේය: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහිවූ කිඹුල්වත්පුරය සමීපයෙහිවූ මහ වනයෙහි සියල්ලම රහත්වූ පන්සියයක් භික්ෂූන්ගෙන් යුක්තවූ මහත් භික්ෂු සංඝයා සමග වාසය කරනසේක. දස දහසක් ලොක ධාතුවෙන්ද දෙවියෝ බුදුරජුන්ද භික්ෂු සංඝයාද දැකීම පිණිස බොහෝසෙයින් රැස්වූවෝ වෙත්.

2. ඉක්බිත්තෙන් ශුද්ධාවාස බ්‍රහ්ම ලෝකයෙහි වසන්නාවූ බ්‍රහ්මයන් සතර දෙනෙකුන්ට මේ අදහස විය. "මේ භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත් පුරයට ආසන්නවූ මහ වනයෙහි සියල්ල රහත්වූ පන්සියයක් භික්ෂූන්ගෙන් යුක්තවූ මහත් භික්ෂු සංඝයා හා වාසය කරති. දස දහසක් ලොක ධාතුවෙන්ද දෙවියෝ බුදුරජහුන්ද භික්ෂු සංඝයාද දැකීමට බොහෝසෙයින් රැස්වූවෝ වෙත්. අපිත් යම් හෙයිකින් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතනට පැමිණෙන්නෙමු නම් පැමිණ බුදුන් හමුයෙහි එකි එකී ගාථාවක් කියන්නෙමු නම් ඉතා යෙහෙකැයි" කියායි.

3. එවිට ඒ දෙවියෝ ශක්තිමත් පුරුෂයෙක් හකුලන ලද අත යම්සේ දිගු කරන්නේද, දිගු කරනලද අත යම්සේ හකුළුවන්නේද එපරිද්දෙන්ම ශුද්ධාවාස බඹලොව දෙවියන් අතුරෙන් අතුරුදහන් වූවාහු භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි පහළ වූහ.

ඉක්බිති ඒ දෙවියෝ බුදුරජාණන් වහන්සේට නමස්කාරකොට එක්පැත්තක සිටියහ. එකත්පසෙක සිටියාවූ එක් දෙවියෙක් බුදුරජාණන් වහන්සේ හමුයෙහි මේ ගාථාව කීය.

"මේ මහ වනයෙහි මහා සමාගමක් විය. දිව්‍ය සමූහයෝ රැස්වූහ. කෙලෙස් මරුන් විසින් නොපරදවනලද සංඝයා දක්නා පිණිස මේ ධර්ම සමාගමට ආම්හයි" කියායි. එවිට අනික් දෙවි කෙනෙක් බුදුරජුන් හමුවෙහි මේ ගාථාව කීය. "ඒ මහා සමූහයෙහි භික්ෂූහු තමන්ගේ සිත සමාධියෙහි පිහිටවූහ. ඍජු කළාහුය.

ලනුවෙන් ගෙන රියැදුරා රථය හසුරුවන්නාක් මෙන් නුවණ ඇති අය පසිඳුරන් රකිත්යයි” කීය. එවිට අනික් දේවතාවෙක් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීය.

“(කෙලෙස් නමැති) හුල් කපා (කෙලෙසුන් නමැති) පලිඝය සිඳ ඉන්ද්‍රඛීලය උදුරා තෘෂ්ණා රහිතවූ පිරිසිදුවූ (කෙලෙස්) කසට නැති පසැස් ඇති බුදුරජුන් විසින් හොඳින් දමනය කරන ලද්දාවූ ඒ තරුණ රහත්හු හැසිරෙත්’ යයි කීය.

ඉක්බිති තවත් දේවතාවෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය. “යම් කිසිවෙක් බුදුන් සරණ ගියෝද ඒ සත්වයෝ අපායට නොයත්, මිනිස් සිරුර හැර දිව්‍ය ශරීර සම්පූර්ණ කරන්නාහු (දෙව් බවට පැමිණෙත්)” යයි කීය.

4. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්ට කථා කළසේක. “මහණෙනි, දස දහසක් ලෝක ධාතුවෙහි දෙවියෝ තථාගතයන්ද භික්ෂු සංඝයාද දැකීමට බොහෝ සෙයින් රැස්වූහ. මහණෙනි, යටගිය කාලයෙහි අර්හත්වූ යම් ඒ සම්‍යක් සම්බුදුවරයෝ වූවාහුද, ඒ භාග්‍යවතුන් වහන්සේලාටද මෙපමණම දෙවියෝ රැස්වූහ. දැන් මා දැක්මට යම් පමණක් රැස්වූවෝද, එතරම්ය.

“මහණෙනි, මතු කාලයෙහි අර්හත්වූ යම් ඒ සම්‍යක් සම්බුදුවරයෝ වන්නාහුද, ඒ භාග්‍යවතුන් වහන්සේලාටද මෙපමණම දෙවියෝ රැස්වන්නාහුය. දැන් මා දැක්මට යම් පමණක් රැස්වූවෝද, එතරම්ය.

“මහණෙනි, දිව්‍ය සමූහයන්ගේ නම් කියන්නෙමි. මහණෙනි, දිව්‍ය සමූහයන්ගේ නම් පහළ කරන්නෙමි. මහණෙනි, දිව්‍ය සමූහයන්ගේ නම් දේශනා කරන්නෙමි. එය අසව්, මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමියි” කීවෝය.

“එසේය ස්වාමීනියි” ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

5 “(අක්ෂරපද නියමිත) ගාථා කියන්නෙමි. යම් මේ තැනෙක්හි බුමාටු දෙවියෝ වෙසෙද්ද රහත්වූ ඒ ඒ තැන ඇසුරු කරන්නෝය. (භාවනාවට) යවනලද සිත් ඇත්තාවූ ලොමු

ඩැහැගැනීම මැඩපැවැත්වූ පිරිසිදු සිත් ඇත්තාවූ ශුද්ධවූ වෙසෙසින් පැහැදුනු, නොකැළඹුනු සිත් ඇත්තාවූ සිංහරාජයන් මෙන් සැඟවුනාවූ යම් බොහෝ රහත්හු පර්වත ගුහා ඇසුරු කළාහුද?"

නැවත ශාස්තෘන් වහන්සේ කිඹුල්වත් පුරයට නුදුරුවූ මහ වනයෙහි සස්නෙහි ඇලුනාවූ පන්සියයකට වැඩිවූ ශ්‍රාවකයන් දැක, අඬගා වදාළසේක. "මහණෙනි, දිව්‍ය සමූහයා රැස් වූවෝය. ඒ දිව්‍ය සමූහයන් දනිව්" කියායි. ඒ රහත්හුද බුදු රජාණන් වහන්සේගේ වචනය අසා වීයඞීය කළාහුය.

6 ඒ භික්ෂූන්ට (දෙවාදි) අමනුෂ්‍යයන් දක්නාවූ දිව්‍ය ඥානය පහළවිය. ඇතැම් රහත්හු (අමනුෂ්‍යයන්) සියයක් දුටහ. ඇතැම් රහත්හු දහසක් ද තවත් සමහැ සැත්තෑ දහසයක්ද, ඇතැම් රහත්හු ලක්ෂයක්ද දුටහ. ඇතැම් රහත්හු කෙළවරක් නැති දෙවි බඹුන් දුටුවාහුය. සියලු දිශාවෝ (දෙවි බඹුන්ගෙන්) පිරුණාහුය. පසැස් ඇත්තාවූ ශාස්තෘවරයන් වහන්සේ ඒ සියල්ලම උතුම් නුවණින් දැන වෙන්කොට නැවත සසුන්හි ඇලුනාවූ ශ්‍රාවකයන්ට අඬගා වදාළහ.

"මහණෙනි, දිව්‍ය සමූහයා රැස්වූහ. මම තොපට යම් දිව්‍ය සමූහයක් නම්වලින් පිළිවෙළින් ප්‍රකාශ කරම්ද, ඒ දිව්‍ය සමූහයන් දනිව්.

7 "කිඹුල්වත් පුරයෙහි වාසය කරන්නාවූ ඍද්ධි ඇත්තාවූ බැබලීම් ඇත්තාවූ ශරීර වර්ණය ඇත්තාවූ දිව්‍යමය යසස් ඇත්තාවූ සත් දහසක් භූමාටු දෙවියෝද සතුටුවෙමින් රහත් භික්ෂු සමූහයා දැක්මට මහ වනයට පැමිණියාහුය.

"හිමාලයෙහි වසන්නාවූ නොයෙක් පැහැයෙන් යුක්තවූ ඍද්ධි ඇත්තාවූ බැබලීම් හා වර්ණ ඇත්තාවූ යසස් ඇත්තාවූ සය දහසක් දෙවියෝද සතුටු වෙමින් රහත් භික්ෂූන් සමූහයා දැක්මට මහ වනයට පැමිණියාහ.

"සාතාගිරි පර්වතවාසීවූ නොයෙක් පැහැ ඇත්තාවූ ඍද්ධි ඇත්තාවූ, බැබලීම් හා වර්ණ ඇත්තාවූ, යසස් ඇත්තාවූ තුන් දහසක් දෙවියෝ සතටුවෙමින් අර්හත් භික්ෂූන් දැකීම සඳහා මහවනයට පැමිණියහ.

"මෙසේ නොයෙක් ආලොක ඇත්තාවූද, ඍද්ධි ඇත්තාවූද, බැබලීම් හා වර්ණ ඇත්තාවූද යසස් ඇත්තාවූද මේ දහසය දහසක් දෙවියෝද සතුටුවෙමින් අර්හත් භික්ෂුසමූහය දක්නට මහ වනයට පැමිණියහ.

8 "වෙස්සාමිත්ත නම් පර්වතයෙහි වැසි නොයෙක් ආලෝක ඇත්තාවූද, ඍද්ධි ඇත්තාවූද, බැබලීම් හා වර්ණ ඇත්තාවූද, යසැස් ඇත්තාවූද පන්සියයක් දෙවියෝ සතුටුවෙමින් අර්හත් භික්ෂු සමූහය දක්නට මහවනයට පැමිණියහ.

"රජගහනුවර උපන්නාවූ කුම්භීර නම් යක් සෙනෙවියෙක් විය. ඔහුගේ වාසස්ථානය වෙපුල්ල පර්වතය වන්නේය. ඔහු ලක්ෂයකට වැඩි යක්ෂ පිරිසක් ආශ්‍රය කරයි. රජගහනුවර උපන් ඒ කුම්භීර නම් යක් සෙනෙවියාද රහත් භික්ෂු සමූහයා දක්නට මහවනයට ආයේය.

9 "පෙරදිග්හි රජවූ ධෘතරාෂ්ට්‍ර වරම් රජතෙමේ ඒ පෙර දිගට අනුශාසනා කරයි. ගන්ධර්වයන්ට අධිපතිවූ යසස් ඇති ඒ ධෘතරාෂ්ට්‍ර නම් මහරජ තෙමේද ඒ වරම් රජහුගේ ඉන්ද්‍ර යන නම් ඇත්තාවූද, මහත් ශක්ති ඇත්තාවූ ඍද්ධි ඇත්තාවූද, බැබලීම් හා නොයෙක් පැහැ ඇත්තාවූද, යසස් ඇත්තාවූද බොහෝ පුත්‍රයෝද සතුටුවෙමින් අර්හත් භික්ෂු සමූහයා දක්නට මහවනයට පැමිණියාහුය.

'දකුණු දෙසට රජවූ විරූඪ නම් වරම් රජතෙමේද ඒ දිසාවට අනුශාසනා කරයි. කුම්භාණ්ඩයින්ට අධිපතිවූ යසස් ඇත්තාවූ ඒ විරූඪ නම් මහරජ තෙමේද ඍද්ධි ඇත්තාවූද, බැබලීම් හා නොයෙක් පැහැ ඇත්තාවූද, යසස් ඇත්තාවූද ඉන්ද්‍ර යන නම් ඇති ඔහුගේ බොහෝ පුත්‍රයෝද සතුටුවෙමින් අර්හත් භික්ෂු සමූහයා දක්නට පැමිණියහ.

"බටහිර දික්හි රජවූ විරූපාක්ෂ නම් වරම් රජතෙමේ ඒ දිශාවට අනුශාසනා කරයි. නයින්ට අධිපතිවූ යසස් ඇත්තාවූ ඒ විරූපාක්ෂ නම් මහරජ තෙමේද ඔහුගේ ඉන්ද්‍ර යන නම් ඇති මහත් බල ඇත්තාවූද, ඍද්ධි ඇත්තාවූද බැබලීම් හා නොයෙක් පැහැ ඇත්තාවූද, යසස් ඇත්තාවූද බොහෝ පුත්‍රයෝද සතුටුවෙමින් අර්හත් භික්ෂු සමූහය දක්නට පැමිණියහ.

"උතුරු දිග්හි රජවූ වෛශ්‍රවණ නම් වරම් රජ තෙමේ ඒ දිසාවට අනුසාසනා කරයි. යකුන්ට අධිපතිවූ යසස් ඇත්තාවූ ඒ වෛශ්‍රවණ නම් මහරජ තෙමේද ඉන්ද්‍ර යන නම් ඇති මහත් බල ඇත්තාවූද, ඍද්ධි ඇත්තාවූද බැබලීම් හා නොයෙක් පැහැ ඇත්තාවූද, යසස් ඇත්තාවූද ඔහුගේ බොහෝ පුත්‍රයෝද සතුටුවෙමින් අර්හත් භික්ෂු සමූහය දක්නට පැමිණියහ.

"නැගෙනහිර දික්හි ධෘතරාෂ්ට්‍ර නම් වරම් රජද දකුණු දික්හි විරූඪ නම් වරම් රජද, බස්නාහිර දික්හි විරූපාක්ෂ නම් වරම් රජද උතුරු දික්හි වෛශ්‍රවණ නම් වරම් රජද මෙකී සිව්වරම් මහරජදරුවෝ හාත්පසින් සිව්දිසාවන්හි කිඹුල්වත් පුරයට සමීප මහවනයෙහි දිලිසෙමින් සිටියාහ.

10 "ඒ සිව්වරම් දෙව් රජුන්ගේ මායා ඇත්තාවූ වංචා කරන්නාවූ කෛරාටිකවූ දාසයෝද, මායාකාරවූ කුටෙණ්ඩුය, වෙටෙණ්ඩුය, විටූච්චය, විටුඩය යන මොවුහුද ඔවුන් සමග ආවාහුය. චන්දනය, කාමසෙට්ඨය, කින්නුඝණ්ඩුය, නිඝණ්ඩුය, පනාදය, ඔපමඤ්ඤය, මාතලී දෙව්පුත්‍රය, ගාන්ධර්වවූ චිත්‍රය, සේනය යන දෙදෙනාද නළකාර නම් දෙව් රජද ජනෙසභ නම් දෙව්පුත්ද පඤ්චසිඛ දෙව්පුත්ද තිම්බරූ නම් ගාන්ධර්වයාද සූරියවච්ඡසා නම් දෙව්දුවද ආවාහුය.

"මෙකී ගාන්ධර්ව රජදරුවෝද අන් ගන්ධර්වයෝද තමන්ගේ රජුන් හා සතුටුවෙමින් රහත් භික්ෂු සමූහයා දක්නට මහ වනයට පැමිණියාහ.

11 එවිට නාභස නම් නාගයෝද විසාලී නාලොව වැසි නාගයෝද තච්ඡක නම් නාග පිරිස හා ආවෝය. කම්බල අස්සතර යන කුල දෙක්හි නාගයෝද පායාග නම් නාලොව වැසි නාගයෝද නෑයන් හා ආවෝය.

යමුනා නම් ගඟ වැසි නාගයෝද. ධෘතරාෂ්ට්‍ර නම් කුලයෙහි උපන් නාගයෝද යසස් ඇත්තාවූ නාගයෝද ආවෝය. ඓරාවන නම් මහා නාග තෙමේද අර්හත් භික්ෂු සමූහය දක්නට මහවනයට ආය. දිව්‍යානුභාවය ඇත්තාවූ ද්විජ නම්වූ පිරිසිදු ඇස් ඇත්තාවූ යම් ගරුඬ පක්ෂීහු නා රජුන් වහා ගෙනයද්ද ඒ

පක්ෂීහු මහවනයට අහසින් පැමිණියාහුය. චිත්‍රය, සුපර්‍ණය යනු ඔවුන්ගේ නාමයෝයි.

එකල්හි නා රජුන්ට භය නැති විය. සර්වඥයන් වහන්සේ ගුරුළන් කෙරෙන් භය නැති කළ සේක. නාගයෝද ගුරුළෝද මොළොක් වචනයෙන් කැඳවනු ලබන්නෝ බුදුන් සරණ ගියාහුය.

12 සක්දෙව් රජහු විසින් ජයගන්නා ලද මුහුද ආශ්‍රය කරන්නාවූ සක්දෙව් රජහුගේ සහෝදරවූ ඍද්ධි ඇත්තාවූ යසස් ඇත්තාවූ මේ අසුරයෝද, මහත් බියකරුවූ කාලකඤ්ජ නම් අසුරයෝද, දානවේඝස නම් අසුරයෝද වෙපචිත්ති නම් අසුරෙන්ද්‍රයාද, සුචිත්ති නම් අසුරේන්ද්‍රයාද, පහාරාද නම් අසුරේන්ද්‍රයාද, වසවත් මරු සමග ආවෝය. සියල්ලෝම වෙරොච යන නම් ඇති බලී නම් අසුරයාගේ පුත්‍රයෝ සිය දෙනෙක්ද බලසෙනග ගෙණ සැරසී රාහු අසුරිඳු කරා පැමිණියාහුය. "

නුඹවහන්සේට යහපත් වේවා. දැන් රහත් භික්ෂු සමූහය දක්නට මහ වනයට යාමට කල් වන්නේය."

13 එකල්හි අපොකසින (සමාපත්තියෙන් උපන්) දෙවියෝද එසේම තෙජෝ කසිණ (සමවතින්) උපන් දෙවියෝද වායො කසිණ සමවතින් උපන් දෙවියෝද ආවෝය. වරුණය, වාරුණය යන දෙවියෝද සොම නම් දෙවියාද යස නම් දෙවියන් සමග ආවාහුය. යසස් ඇත්තාවූ මෙත්තා කායික, කරුණා කායික දෙවියෝද ආවෝය. සියල්ලෝම නොයෙක් පැහැවත්වූ දස ආකාරයකින් යුක්තවූ සියල්ලෝම ඍද්ධි ඇත්තාවූද බැබලීම් හා වර්ණවත්වූද, යසස් ඇත්තාවූද මේ දෙවසමූහ දසය සතුටුවෙමින් අර්හත් භික්ෂු සමූහය දක්නට ආවාහුය.

14 වෙණ්හුය, සහලීය, අසමය, යම යන නම් දෙවියෝ දෙදෙනද, සඳ දෙවියන් ඇසුරු කරන්නාවූ දෙවියෝ සඳ දෙවියන් පෙරටුකොටද ආවෝය. හිරු දෙවියන් ඇසුරුකරන්නාවූ දෙවියෝ හිරු දෙවියන් පෙරටුකොටද නැකත් දෙවියන් (තරු) ඇසුරු කරණ දෙවියෝ නැකත් දෙවියන් පෙරටු කොටද ආවාහුය. මන්දවළාහක නම් දෙවියෝද ආවෝය. වසු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දෙවියන්ට අධිපති හෙයින් වාසව නම්වූද, පුරින්දද නම්වූද ශක්‍රයාත් ආයේය.

**15** දස ආකාරයකින් නොයෙක් පැහැ ඇත්තාවූද, ඍද්ධි ඇත්තාවූද, බැබලීම් හා වර්ණ ඇත්තාවූද, යසස් ඇත්තාවූද, මේ දෙව සමූහ දසය සතුටුවෙමින් අර්හත් භික්ෂු සමූහය දක්නට ආවාහුය.

නැවත සහභූ නම් දෙවියෝ ගිනි සිළු මෙන් බබලමින් ආවෝය. අරිට්ඨක නම් දෙවියෝද රොජ නම් දෙවියෝද (දියබෙරලිය මල් පැහැයෙන්) බබලන උම්මාපුප්ඵ නම් දෙවියෝද, වරුණය, සහධම්මය, අච්චුතය, අනෙජකය, සූලෙය්‍යය රුචිරය, යන දෙවියෝද, ආවාහුය. වාසවනෙසී නම් දෙවියෝද ආවාහුය.

දස ආකාරයකින් යුක්තවූ සියල්ලෝම නොයෙක් පැහැ ඇත්තාවූද, ඍද්ධි ඇත්තාවූද, බැබලීම් හා වර්ණ ඇත්තාවූද, යසස් ඇත්තාවූද මේ දෙව සමූහ දසය සතුටුවෙමින් අර්හත් භික්ෂු සමූහය දක්නට ආවාහුය.

**16** සමානය, මහා සමානය, මානුසය, මානුසුත්තමය. ඛිඩ්ඩාපදූසිකය යන දෙවියෝද ආවෝය. නැවත හරිනම් දෙවියෝද රත්ගල් වැසිවූ යම් දෙවිකෙනෙක් වෙද්ද ඔව්හුද, පාරග නම්වූද, මහාපාරග නම්වූද යසස් ඇත්තාවූ දෙවියෝද ආවාහුය.

දස ආකාරයකින් යුක්තවූ සියල්ලෝම නොයෙක් පැහැ ඇත්තාවූද, ඍද්ධි ඇත්තාවූද බැබලීම් හා වර්ණ ඇත්තාවූද, යසස් ඇත්තාවූද මේ දෙව සමූහයෝ දස දෙන සතුටුවෙමින් අර්හත් භික්ෂු සමූහයා දක්නට ආවාහුය.

**17** සුක්කාය, කරුම්හාය, අරුණය යන දෙවියන් සමග වෙඛනසා නම් දෙවියෝද ආවෝය. ඕදාතගය්හ නම්වූ පාමොක්ඛ නම් දෙවියෝද විචක්ඛණ නම් දෙවියෝද ආවෝය. සදාමත්ත නම් දෙවියෝද, හාරගජ නම් දෙවියෝද, යසස් ඇත්තාවූ මිස්සක නම් දෙවියෝද යම් දෙවියෙක් දිශාවන්හි වැසි කෙරේද, ඒ පජ්ජුන්න නම් දෙවි තෙමේද මේඝනාද කරමින් ආයේය.

දස ආකාරයකින් යුක්තවූ සියල්ලෝම නොයෙක් පැහැ ඇත්තාවූද, ඍද්ධි ඇත්තාවූද බැබලීම් හා වර්ණ ඇත්තාවූද මේ දෙව සමූහයෝ දසදෙන සතුටුවෙමින් අර්හත් භික්ෂු සමූහයා දක්නට ආවාහුය.

18 බෙම්ය නම් දෙවියෝද තුසී (පුර වැසි) දෙවියෝද යාම නම් (දෙව්ලොව) වැසි දෙවියෝද යසස් ඇත්තාවූ කට්ඨක නම් දෙවියෝද ලම්බීතක නම් දෙවියෝද ලාමසෙට්ඨ නම් දෙවියෝද ජෝති නම් දෙවියෝද ආසව නම් දෙවියෝද නිර්මාණරති නම් (දෙව්ලොව වැසි) දෙවියෝද ආවාහුය. නැවත පරනිර්මිතවසවර්ති (දෙව්ලොව වැසි) දෙවියෝද ආවෝය.

දස ආකාරයකින් යුක්තව සියල්ලෝම නොයෙක් පැහැ ඇත්තාවූද, ඍද්ධි ඇත්තාවූද, බැබලීම් හා වර්ණ ඇත්තාවූද, යසස් ඇත්තාවූද මේ දෙව සමූහයෝ දසදෙන සතුටුවෙමින් අර්හත් භික්ෂු සමූහයා දක්නට ආවෝය.

19 මේ සැටක් දෙව් සමූහයෝ සියල්ලෝම නොයෙක් පැහැයෙන් යුක්තවූවෝම තම තමන්ගේ නම් ගොත් වශයෙන් ආවාහුය. යම් සෙසු දෙවියෝද නම් ආදියෙන් සමාන වෙත් නම් ඔවුන් සමග ආවාහුය. පහවූ ජාති ඇත්තාවූ රාගාදී උල්රහිතවූ චතුරොඝයෙන් එතරවූ කෙලෙස් නැතිකළාවූ නාග නම්වූ කෘෂ්ණ භාවය ඉක්මවා ගියාවූ පූර්ණචන්ද්‍රයා වැනිවූ බුදු රජුන්ද දක්නෙමු.

20 ඍද්ධි ඇත්තාවූ ආයසී පුත්‍රවූ සුබ්‍රහ්ම නම්වූද පරමත්ත නම්වූ බ්‍රහ්මයෝද සනං කුමාර නම් මහා බ්‍රහ්මයාද තිස්ස නම් මහා බ්‍රහ්මයාද සිය පිරිස් සමග අර්හත් භික්ෂු සමූහය දක්නට මහ වනයට ආවාහුය.

බඹලෝ දහසකින් බ්‍රහ්මයන් දහසක්ද ආයේය. බඹලොව උපන්නාවූ ශොභාවත්වූ, මහත් කයක් ඇත්තාවූ, යසස් ඇත්තාවූ මහා බ්‍රහ්මයෙක්ද සිටින්නේය. මේ බඹ පිරිසෙහි වෙන වෙනම තම තමන්ගේ පිරිස් වසඟයෙහි පවත්වන්නාවූ ප්‍රධානවූ බඹුන් දසදෙනෙක් ආවෝය. ඒ මහ බඹුන්ගේ මද්ධ්‍යයෙහි බඹුන් විසින් පිරිවරණ ලද්දාවූ හාරිත නම් බඹරජ තෙමේද ආයේය.

21 මහ වනයට රැස්වූ ශක්‍රයා සහිතවූ, බඹුන් සහිතවූ, ඒ සියලු දෙවියන් කරා මාර සේනාවෝ පැමිණියාහුය. මාරයාගේ අඥානකම බලව. එව්, අල්වා ගනිව්, සියලු දිව්‍ය සමූහයා රාගයෙන් බඳනාලද්දේ වේවා, හාත්පසින් පිරිවරව්, තෙපි කිසිවෙක් ඒ දිව පිරිසෙන් එකෙකුදු නොමුදව්. මෙසේ කියා මහත් සේනාවක් ඇති ඒ වසවත් මරුතෙමේ අත්ලෙන් පොළෝතලයට ගසා විදුලිය සහිතවූ වැසි කල්හිවූ හෙවත් වර්ෂා කරන්නාවූ මෙඝයෙක් තෙමේ යම්සේ ගර්ජනා කරන්නේද එමෙන් බියජනක නාදකොට මර සෙනග ඒ දිව පිරිස මැදට යැවීය. එසමයෙහි ඒ වසවර්තිමාර තෙමේ දෙව් පිරිස තම වසඟයෙහි පවත්වාගත නොහැකිවූයේ අතිශයින් කිපුනෙක්ව ආපසු හැරීගියේය.

22 ඉක්බිත්තෙන් නුවණ නැමැති ඇස් ඇති බුදුරජාණන් වහන්සේ ඒ සියල්ල දැන ව්‍යවස්ථා කොට සස්නෙහි ඇලුනාවූ ශ්‍රාවකයන්ට කථාකර මෙසේ කීවෝය.

"මහණෙනි, මාර සේනාවෝ පැමිණියාහුය. ඒ මරුන් දනිව්" ඒ භික්ෂූද බුදුන්ගේ ධර්ම වචනය අසා කෙලෙස් තැවීමට වීර්‍ය්‍ය කළාහුය. වීතරාගීවූ දෙව් බඹුන් කෙරෙන් පහව ගියාහුය. ඒ වීතරාගීන්ගේ රෝමයකුදු කම්පා නොකළාහුය. ජයගත් මාර යුද්ධය ඇති ඉක්මවනලද බිය ඇති යසස් ඇත්තාවූ ජනයන් අතුරෙහි ප්‍රකටවූ ඒ සියලු බුදු සව්වෝම දේව බ්‍රහ්මාදී ආර්‍ය්‍ය ශ්‍රාවකයන් හා සතුටුවෙත්."

(20 වැනිවූ මහාසමය සූත්‍රය නිමියේය.)

---

## 21. සක්කපඤ්හ සූත්‍රය.

1 මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක මගධ ජනපදයෙහි රජගහ නුවරට බටහිර දිශාවෙහි අම්බසණ්ඩ නම් බමුණු ගමක් ඇත. ඊට උතුරු දිගින් වෙදික නම් පර්වතය සමීපයෙහිවූ ඉන්දසාල ගුහාවෙහි භාග්‍යවතුන් වහන්සේ වාසය කළෝය. ඒ කාලයේදී සක් දෙවිඳුට භාග්‍යවතුන් වහන්සේ දැකීම පිණිස උනන්දුවක් පහළවිය. සක් දෙවිඳුට මෙබඳු සිතක් ද විය.

'අර්හත් සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ දැන් කොහි නම් වැඩ වෙසෙත්ද?" යනුයි.

මගධ ජනපදයෙහි රජගහනුවරට බටහිර දිශාවෙහි අම්බසණ්ඩ නම් බමුණු ගමක් ඇත. ඊට උතුරු දිගින් වෙදික නම් පර්වතය සමීපයෙහිවූ ඉන්ද්‍රසාල ගුහාවෙහි වසන්නාවූ භාග්‍යවතුන් වහන්සේ සක් දෙවිඳු දුටුවේය. දැක තව්තිසා වැසි දෙවියන්ට කථා කළේය.

"නිදුකාණෙනි, මගධ ජනපදයෙහි රජගහනුවරට බටහිර දිශාවෙහි අම්බසණ්ඩ නම් බමුණු ගමක් ඇත. ඊට උතුරුදිගින් වෙදික නම් පර්වත සමීපයෙහිවූ ඉන්ද්‍රසාල ගුහාවෙහි භාග්‍යවතුන්වහන්සේ වැඩවෙසෙති. නිදුකාණෙනි අප අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන්වහන්සේ දැකීම පිණිස යන්නෙමු නම් යහපත් නොවේදැයි" ඇසුවේය. 'පින්වතුන් වහන්ස, එසේ වේවායි" තව්තිසා වැසි දෙවියෝ සක් දෙවිඳුට උත්තර දුන්හ.

2 එවිට සක් දෙවිඳු පංචසිඛ නම් ගන්ධර්ව පුත්‍රයාට කථා කළේය. "දරුව, පංචසිඛය, මගධ ජනපදයෙහි රජගහනුවරට බටහිර දිගින් අම්බසණ්ඩ නම් බමුණු ගමක් ඇත. ඊට උතුරු දිශාවෙහිවූ වෙදික නම් පර්වතය සමීපයෙහිවූ ඉන්ද්‍රසාල ගුහාවෙහි මේ භාග්‍යවතුන් වහන්සේ වැඩවෙසෙති. දරුව පංච සිඛය, අපි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ දැකීම පිණිස යන්නෙමු නම් යහපත් නොවේදැයි" කීය. පංචසිඛ නම් ගන්ධර්ව පුත්‍රයා, "පින්වතුන් වහන්ස, එසේයයි" සක් දෙවිඳුන්ට උත්තරදී බෙලුවපණ්ඩු නම් වීණාව ගෙන සක් දෙවිඳු ලඟට පැමිණියේය. එවිට සක් දෙවිඳු තව්තිසා වැසි දෙවියන් විසින් පිරිවරන ලදුව, පංචසිඛ නම් ගන්ධර්ව පුත්‍රයා පෙරටුකොට ගෙන, ශක්තිමත් පුරුෂයෙක් අකුලන ලද අතක් යම්සේ දිග හරින්නේද, දිග හරින ලද අතක් යම්සේ අකුලන්නේද එපරිද්දෙන් තව්තිසා වැසි දෙවියන් කෙරෙහි අතුරුදහන්ව මගධ ජනපදයෙහි රජගහනුවරට බස්නාහිර දිශාවෙහි අම්බසණ්ඩ නම් බමුණු ගම වේද ඊට උතුරු දිගින්වූ වෙදික නම් පර්වතයෙහි පහළවිය.

3 එකල්හි වෙදික නම් පර්වතයද, අම්බසණ්ඩ නම් බමුණු ගමද දෙවියන්ගේ ආනුභාවයෙන් වැඩියක් ආලෝකවත්විය.

එකල අවට ගම්වැසි මනුෂ්‍යයෝ මෙසේකීහ "වෙදික නම් පර්වතය ගිනි ගත්තේය. අද වෙදික නම් පර්වතය සම්පූර්ණයෙන් දැල්වුනේ වේ. අද වෙදික නම් පර්වතය දිලිසෙන්නේය. කුමක් නිසා අද වෙදික පර්වතය හා අම්බසණ්ඩ නම් බමුණු ගමත් වැඩියක් හටගත් ආලෝක ඇත්තේ දැයි" සංවේගයට පැමිණියාහු හටගත් ලොම් ඩැහැගැනීම් ඇත්තෝ වූහ.

4 එවිට සක්දෙව් තෙම පංචසිඛ නම් ගන්ධර්ව පුත්‍රයාට කථා කළේය. "දරුව පංචසිඛය, ධ්‍යාන ඇත්තාවූ ධ්‍යානයෙහි ඇලුනාවූ, ඊටපසුව එකඟ කළ සිත් ඇත්තාවූ තථාගතයන් වහන්සේලා ලගට මා වැන්නෙකු විසින් පැමිණීම පහසුනැත. දරුව පංචසිඛය තොප පළමුව භාග්‍යවතුන් වහන්සේ සතුටු කරන්නෙහිද? දරුව තොප විසින් පළමුව සතුටුකරන ලද්දාවූ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ වෙත පසුව අපි දැකීම පිණිස යන්නෙමු."

"පින්වතුන් වහන්ස, එසේයයි" කියා පංචසිඛ නම් ගන්ධර්ව පුත්‍රතෙම සක් දෙවිඳුගේ වචනය සතුටින් පිළිගෙන බෙලුවපණ්ඩු වීණාව ගෙන ඉන්ද්‍රසාල ගුහාව යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ 'මෙපමණකින් භාග්‍යවතුන් වහන්සේ මට ඉතා දුරක් නොවන්නේය. ඉතා ළඟත් නොවන්නේය. ශබ්දයද ඇසෙන්නේයයි' එක පැත්තක සිටියේය. එක පැත්තක සිටියාවූ පංචසිඛ නම් ගාන්ධර්ව පුත්‍ර තෙම බෙලුවපණ්ඩු වීණාව වාදනය කළේය. බුදු ගුණ සහිතවූද, දහම් ගුණ සහිතවූද, සඟ ගුණ සහිතවූද, කාම ගුණ සහිතවූද, මේ ගාථාවන්ද කීයේය.

5 "ශොභමානවූ මට සතුටු උපදවන්නාවූ තරුණ සූරියවච්ඡසාවෙනි, යමෙක් නිසා තී උපන්නී නම් 'තිම්බරු' නම්වූ ඒ තිගේ පියාට වඳිමි."

"වෙහෙසවූවකුට (ඩාදිය ඇත්තෙකුට) සිත් සතුටු කරන්නාවූ සුලඟක්මෙන්ද, තිබහඇත්තෙකුට බොන වතුරක්මෙන්ද, රහතුන්ට ධර්මය මෙන්ද, ලෙඩවූවෙකුට බෙහෙතක් මෙන්ද, බඩගිනි ඇත්තෙකුට ආහාරයක්මෙන්ද, එම්බා ශරීරකාන්තිය ඇත්තිය, තී මට ප්‍රිය වෙහිය. එම්බා සුන්දරිය, ඇවිලෙන ගින්නක් ජලයෙන් නිවන්නාක් මෙන් (මගේ ආසාව නමැති දැවිල්ල) නිවා දමව.

"ග්‍රීෂ්මයෙන් තැවුනාවූ ඇතෙක් පියුම් රේණු වලින් යුක්තවූ, සිසිල් දිය ඇති පොකුණකට බසින්නාක් මෙන් (මම) තිගේ ශරීරය නමැති පොකුණට බසින්නෙමි.

"අකුස්සට (හෙන්ඩුවට) කීකරු නොවන මද කිපුන ඇතෙක් මෙන්, මා විසින් කණ මුල විදින කටුව හා පා විදින කටුව (තෝමර) ජයගන්නා ලද්දේය. (තිගේ) ලක්ෂණ ශරීරයෙන් මත් කරන ලද්දාවූ මම රාගය නැති කරන විදිය නොදනිමි.

"තී කෙරෙහි පිළිබඳ සිත් ඇත්තෙමි. හිත පෙරලුනේය. බිලිය ගිල්ලාවූ මාලුවෙක් මෙන් නවතින්ට නොහැක්කෙමි."

"යහපත් රූපශ්‍රියෙන් යුත් සුන්දරිය, මා වැලඳ ගනුව, මඳ බැල්මෙන් බලන ඇස් ඇත්තිය, මා වැලඳ ගනුව, එම්බා කල්‍යාණිය මා හාත්පසින් වැලඳ ගනුව, මා විසින් මෙය නිතර ප්‍රාර්ථනා කරන ලදී."

"ඒකාන්තයෙන් මාගේ ස්වල්පවූම ආසාව, බොකුටු කෙස් ඇති තී ගැනම ඇතිවූයේ රහත් කෙනෙකුට දුන් දානයක් මෙන් නොයෙක් කොටස් ඇතිවූයේය.

"මා විසින් එබඳු රහතුන් විෂයෙහි කරන ලද යම් පිනක් ඇත්තේද, සර්වාංග කල්‍යාණිය, මගේ ඒ පිණ තී සමගම විපාක දේවා.

"මේ මහ පොලොවෙහි මා විසින් කරණලද යම් පිණක් ඇත්තේද, මාගේ ඒ සියලුම පින් තී සමගම විපාක දේවා.

"ධ්‍යානයෙන් එකග බවට පැමිණි නුවණින් හා සිහියෙන් යුක්තවූ ශාක්‍ය පුත්‍රවූ මුනීන්ද්‍රතෙම අමෘත මහා නිර්වාණය සොයන්නාක් මෙන්, සුරියවච්ඡසාවෙනි, මම තී සොයා හැසිරෙමි.

"බුද්ධ මුනිතෙම උතුම් බුදු බවට පැමිණ යම්සේ සතුටු වන්නේද, සුන්දරිය තී හා එක්වීමට පැමිණියාවූ මමද එපරිද්දෙන් සතුටු වෙමි.

"තව්තිසා වැසි දෙවියන්ට අධිපතිවූ සක්දෙව් තෙම (දිව්‍ය රාජ්‍යය ගනුවයි) මට වරයක් දෙන්නේද, එම්බා සුන්දරිය, මම එය හැර තී පතන්නෙමි. මාගේ ආසාව මෙසේ මහත්වේ.

"යමෙකුට මෙබඳු දුවක් වීද, සුන්දර ප්‍රඥා ඇත්තිය කලකින් මල් පිපුනාවූ සල්වනයක් වැනිවූ තීගේ පියාට වඳිමින් නමස්කාර කරමි."

**6** මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ පංචසිඛ නම් ගන්ධර්ව පුත්‍රයාට මෙසේ ප්‍රකාශ කළෝය. "පංචසිඛය, තාගේ වීණා තත් හඬ ගී හඬ සමගද, ගී හඬ වීණා තත් හඬ සමගද ගැළපේමය. පංචසිඛය, තාගේ වීණා තත් හඬ ගී හඬ ඉක්මවා නාද නොකෙරේ. ගී හඬ හෝ තත් හඬ ඉක්මවා නාද නොකෙරේ. පංචසිඛය, තාගේ මේ බුදු ගුණ ඇත්තාවූද, දහම් ගුණ ඇත්තාවූද, සඟ ගුණ ඇත්තාවූද කාම ගුණ දන්නාවූද මේ ගාථාවෝ කවර කලෙක්හි ගොතනලද්දාහුද?"

"ස්වාමීනි, මෙහි එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ උරුවෙල් දනව්වෙහි නෙරංජරා ගංතෙර නුග රුක මුල බුදු බවට පැමිණි මුල් කාලයේම වැඩ සිටියහ. ස්වාමීනි, ඒ කාලයේදී තරුණ හිරු මඬල වැනි ශරීරයක් ඇති භද්‍රා නම්වූ තිම්බරු නම් ගන්ධර්ව රජුගේ දුවක් වීද, මම ඈ කැමැත්තෙමි. ස්වාමීනි, ඒ දෙව් දූ වෙන අයට කැමැති වන්නියක් වේ. මාතලී නම් සංග්‍රාහකයාගේ සිඛණ්ඩි නම් පුත්‍රයාට ඈ කැමති වේ. ස්වාමීනි, යම් හේතුවකින් මම ඒ දෙව්දුව මොන ක්‍රමයකිනුදු නොලද්දෙමි. එවිට මම බෙලුව පණ්ඩු නම් වීණාව ගෙන තිම්බරු නම් ගන්ධර්ව රජුගේ නිවෙස යම් තැනෙක්හිද එතැනට ගියෙමි. ගොස් බෙලුව පණ්ඩු වීණාව ශබ්ද කෙළෙමි. බුදු ගුණ සහිතවූද, දහම් ගුණ සහිතවූද, සඟ ගුණ සහිතවූද, කාමයද යන මේ කියන (මේ අදහස් ඇති) ගාථාවන්ද කීයෙමි."

**7** "ලක්ෂණවූ මට සතුටු උපදවන්නාවූ තරුණ සුරියවච්ඡසාවෙනි, යමෙක් නිසා තී උපන්නී නම් "තිම්බරු" නම්වූ ඒ තිගේ පියාට වඳිමි."

"වෙහෙසවූවෙකුට (ඩාදිය ඇත්තෙකුට) සතුටු වන්නාවූ සුලඟක් මෙන්ද, තිබහ ඇත්තෙකුට බොන වතුරක් මෙන්ද, ලෙඩවූවෙකුට බෙහෙතක් මෙන්ද, බඩගිනි ඇත්තෙකුට ආහාරයක් මෙන්ද, එම්බා ශරීර කාන්තිය ඇත්තිය, තී මට ප්‍රිය

වෙහිය. එම්බා සුන්දරිය, ඇවිලෙන ගින්නක් ජලයේන නිවන්නාක් මෙන් (මාගේ ආසාව නමැති දැවිල්ල)නිවාදමව."

"ග්‍රීෂ්මයෙන් තැවුනාවූ ඇතෙක් පියුම් රේණු වලින් යුක්තවූ සිසිල් දිය ඇති පොකුණකට බසින්නාක් මෙන් (මම) තිගේ ශරීරය නමැති පොකුණට බසින්නෙමි."

"අකුස්සට (හෙන්ඩුවට) කීකරු නොවන මද කිපුණ ඇතෙක් මෙන්, මා විසින් කණ මුල විදින කටුව හා පා විදින කටුව (තෝමර) ජයගන්නා ලද්දේය. (තිගේ) ලක්ෂණ ශරීරයෙන් මත්කරන ලද්දාවූ මම රාගය නැති කරන ආකාරයක් නොදනිමි."

"තී කෙරෙහි පිළිබඳ සිත් ඇත්තෙමි, හිත පෙරළුනේය. බිලිය ගිල්ලාවූ මාලුවෙක් මෙන් නවතින්ට නොහැක්කෙමි."

"යහපත් රූපශ්‍රීයෙන් යුත් සුන්දරිය, මා වැලඳ ගනුව! මඳ බැල්මෙන් බලන ඇස් ඇත්තිය මා වැලඳ ගනුව. මා විසින් මෙය නිතර ප්‍රාර්ථනා කරන ලදී."

"ඒකාන්තයෙන් මාගේ ස්වල්පවූම ආසාව බොකුටු කෙස් ඇති තී ගැනම ඇතිවූයේ රහත් කෙනෙකුට දුන් දානයක් මෙන් නොයෙක් කොටස් ඇති වූයේය."

"මා විසින් එබඳු රහතුන් විෂයෙහි කරනලද යම් පිණක් ඇත්තේද සර්වාංග කල්‍යාණිය, මාගේ ඒ පිණ තී සමගම විපාක දේවා."

"මේ මහපොළොවෙහි මා විසින් කරන ලද යම් පිණක් ඇත්තේද මාගේ ඒ සියලුම පින් තී සමග විපාක දෙත්වා."

"ධ්‍යානයෙන් එකඟබවට පැමිණි නුවණින් හා සිහියෙන් යුක්තවූ ශාක්‍යපුත්‍ර මුනින්ද්‍ර තෙම අමෘත මහා නිර්වාණය සොයන්නාක් මෙන්, සූරියවච්ඡසාවෙනි, මම තී සොයා හැසිරෙමි.

"බුද්ධ මුනිතෙම උතුම් බුදු බවට පැමිණ යම්සේ සතුටු වන්නේද, සුන්දරිය, තී හා එක්වීමට පැමිණියාවූ මමද එපරිද්දෙන් සතුටු වෙමි.

"තව්තිසා වැසි දෙවියන්ට අධිපතිවූ සක්දෙවිතෙම (දිව්‍ය රාජ්‍යය ගනුවයි) මට වරයක් දෙන්නේද, එම්බා සුන්දරිය, මම එය හැර තී පතන්නෙමි. මාගේ ආශාව මෙසේ මහත්වේ.

"යමෙකුට මෙබඳු දුවක් වීද, සුන්දර ප්‍රඥා ඇත්තිය, කලකින් මල් පිපුණාවූ සල්වනයක් වැනිවූ තිගේ ඒ පියාට වඳිමින් නමස්කාර කරමි."

"ස්වාමීනි මෙසේ කී කල්හි තරුණ හිරු මඬලක්වැනිවූ ඒ භද්‍රාව මට මෙසේ කීවාය. 'නිදුකාණෙනි, ඒ භාග්‍යවතුන් වහන්සේ ඉදිරිපිටම නොදුටුවෙමි. එසේද වුවත් තව්තිසා වැසි දෙවියන්ගේ සුධර්මා නම් දිව්‍ය සභාවෙහි නටද්දී ඒ භාග්‍යවතුන් වහන්සේ ගැන අසන ලද්දේමය. නිදුකාණනි, යම් හෙයකින් ඔබ ඒ භාග්‍යවතුන් වහන්සේ ගැන කියන්නෙහි නම් අද අපගේ එකතුවීම වේවා" යි කීවාය. ස්වාමිනි, එයම ඒ දෙව්දුව සමග අපගේ සමාගම වූයේය. ඉන්පසු දැන් නැත්තේයයි කීය.

8 එවිට සක් දෙවිඳුට මෙබඳු සිතක් විය. 'පංචසිඛ ගන්ධර්ව පුත්‍රයා භාග්‍යවතුන් වහන්සේ සමගද, භාග්‍යවතුන් වහන්සේ පංචසිඛ දිව්‍ය පුත්‍රයා සමගද, වෙසෙසින් සතුටු වේමයි' යනුයි. එවිට සක්දෙවිඳු පංචසිඛ නම් ගන්ධර්ව පුත්‍රයාට කථාකළේය.

"මාගේ දරුවූ පංචසිඛය, තෝ භාග්‍යවතුන් වහන්සේට වඳුව, 'ස්වාමීනි, ඇමතියන් සහිතවූ, පිරිවර ජනයන් සහිතවූ ශක්‍රයා භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයන් මුදුනෙන් වඳීය' කියායි. "පින්වතුන් වහන්ස, එසේයයි" පංචසිඛ ගන්ධර්ව පුත්‍රයා සක්දෙවිඳුගේ වචනය සතුටින් අසා භාග්‍යවතුන් වහන්සේට වැන්දේය. "ස්වාමීනි, ඇමතියන් සහිතවූ, පිරිවර ජනයන් සහිතවූ සක්දෙවිඳු භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී පාදයන් මුදුනෙන් වඳීය" කියායි.

"පංචසිඛය, ඇමතියන් සහිතවූ, පිරිවර ජනයන් සහිතවූ සක්දෙවිඳු සැප ඇත්තෙක් වේවා."

"දෙවියෝද, මනුෂ්‍යයෝද, අසුරයෝද නාගයෝද, ගන්ධර්වයෝද මෙයින් අන්‍යවූ බොහෝ සත්ව සමූහයෝද වෙත් නම් ඔවුහුද සැප කැමැත්තෝමයයි" කීවෝය.

මෙසේ තථාගතවරයෝ මෙබඳු උසස් දෙවියන්ට ආශිංසනය (ආශිර්වාද) කරත්. මෙසේ ආශිංසනය ලත් සක්දෙවිඳු භාග්‍යවතුන් වහන්සේගේ ඉන්දසාල ගුහාවට ඇතුල්වී භාග්‍යවතුන් වහන්සේ වැඳ එකපැත්තක සිටියේය. තව්තිසා වැසි දෙවියෝද ඉන්දසාල

ගුහාවට ඇතුල්ව භාග්‍යවතුන් වහන්සේ හොඳින් වැඳ එකපැත්තක සිටියාහුය. පංචසිඛ ගන්ධර්ව පුත්‍රයාද ඉන්දසාල ගුහාවට ඇතුල්ව භාග්‍යවතුන් වහන්සේ හොඳින් වැඳ එකපැත්තක සිටියේය.

**9** ඒ කාලයේදී සමනොවූ ඉන්දසාල ගුහාව සමවූවාය. (උස පහත් තැන් ඇත්තී) සම්බාධවූවා මහත් විචිත්‍ර වූවාය. කළුවරවූ ගුහාව එළිය ඇතිවූවාය. ඒ දෙවියන්ගේ ආනුභාවයෙන්වූ ආලෝකයෙහි එවිට භාග්‍යවතුන් වහන්සේ සක් දෙවිඳුට මෙසේ කීහ. "ආයුෂ්මත් සක්දෙවිඳු පිළිබඳවූ මෙය පුදුමය, ආයුෂ්මත් සක්දෙවිඳු පිළිබඳවූ මෙය ඉතා පුදුමයි. (කුමක්දයත්) එපමණ බොහෝ කෘත්‍ය ඇත්තාවූ, බොහෝ කටයුතු ඇත්තාවූ තොපගේ යම්බඳු මෙහි පැමිණීමක් වීනම් එයයි."

"ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ දකිනු පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත එන්ට කැමැත්තෙමි. එසේද වුවත් තව්තිසා වැසි දෙවියන්ගේ යම් යම් කළයුතු වැඩවල යෙදුනෙමි. මේ නිසා භාග්‍යවතුන් වහන්සේ දකිනු පිණිස එන්ට නොහැකි වූයෙමි. ස්වාමීනි, මෙහි එක කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සලලාගාරයෙහි වසනසේක. ස්වාමීනි, එකල්හි මම භාග්‍යවතුන් වහන්සේ දැකීමට සැවැත් නුවරට පැමිණියෙමි.

**10** "ස්වාමීනි, එකල්හි භාග්‍යවතුන් වහන්සේ එක්තරා සමාධියකින් යුක්තව උන්හ. "භුංජති" නම්වූ වෙසමුණු රජුගේ බිසව දොහොත් මුදුනෙහි තබා වඳිමින් භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන පිණිස පැමිණ සිටියාය. ස්වාමීනි, මම එවිට භුංජති නම් පරිචාරිකාවට මෙය කීවෙමි. "මාගේ නැගනියනි, තී භාග්‍යවතුන් වහන්සේ වඳුව. ස්වාමීනි, ඇමතියන් සහිතවූ, පිරිවර සහිතවූ සක්දෙවිඳු භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයන් මුදුනෙන් වඳී"යි කියායි.

"මෙසේ කී කල්හි භුංජතී මට මෙය කීවාය. නිදුකාණනි, භාග්‍යවතුන් වහන්සේ දැකීමට මේ කාලය සුදුසු නොවන්නේය. භාග්‍යවතුන් වහන්සේ ඵලසමාපත්තියෙන් යුක්තය" යනුයි.

"නැගනිය, එහෙනම් යම් කලෙක භාග්‍යවතුන් වහන්සේ ඒ සමාධියෙන් නැගිටිසේක්ද, එකල්හි මාගේ වචනයෙන්

භාග්‍යවතුන් වහන්සේ වඳුව.' 'ස්වාමීනි, ඇමතියන් සහිතවූ පිරිවර සහිතවූ සක්දෙවිඳු භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයන් වඳියි' කියායි.

"ස්වාමීනි, මාගේ නැගනියවූ ඈ කිමෙක්ද භාග්‍යවතුන් වහන්සේ වැන්දේද? භාග්‍යවතුන් වහන්සේ ඇගේ වචනය සිහිකරන සේක්දැයි" ඇසුවේය.

"ශක්‍ර දේවේන්ද්‍රය ඒ නැගනිය මා වැන්දාය. මම ඇගේ වචනය සිහිකරමි. තවද මම යුෂ්මතාගේ රථයේ රෝද ශබ්දයෙන් ඒ සමාධියෙන් නැගිටියෙමියි" කීහ.

11 "ස්වාමීනි, යම් ඒ දෙවියෝ අපට වඩා පළමුව තව්තිසා භවනයෙහි උපන්නාහුද, මා විසින් ඔවුන්ගේ සමීපයෙන් අසනලදී, ඔවුන්ගේ සමීපයෙන් පිළිගන්නාලදී, යම් කලක ලොකයෙහි අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතවරයෝ උපදිත්ද, එකල්හි දිව්‍ය නිකායවල් (දිව්‍ය කොටස්) සම්පූර්ණ වෙත්. අසුර නිකායෝ පිරිහෙත්, යනුයි. ස්වාමීනි, යම් කලක අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතවරයෙක් ලොකයෙහි උපදින්නේද, එකල්හි දිව්‍ය නිකාය පිරෙත්ද, අසුර නිකාය අඩුවෙත්ද, ඒ මේ කාරණය මා විසින් සාක්ෂි වශයෙන් දක්නා ලදී. කෙසේද?"

"ස්වාමීනි, මේ කපිලවස්තු පුරයෙහිම බුදුන් කෙරෙහි පැහැදුනාවූද, ධර්මය කෙරෙහි පැහැදුනාවූද, සංඝයා කෙරෙහි පැහැදුනාවූද, සීලයන් සම්පූර්ණ කරන්නාවූද ගොපිකා නම් ශාක්‍ය දුවක් වූවාය. ඈ ස්ත්‍රීභාවය පිළිබඳ සිත පහකොට පුරුෂ්‍ය භාවය සම්බන්ධ සිත වඩා ශරීරය බිඳීමෙන්වූ මරණින් මතු සොභන ගති ඇත්තාවූ සැපයෙන් අග්‍රවූ ලොකයෙහි (දෙව් ලොව) උපන්නීය. අපගේ පුත්‍ර බවට පැමිණ තව්තිසා වැසි දෙවියන් සහ එක්වීමට පැමිණියාය. එහිදීද, ඔහු ගොපක දිව්‍ය පුත්‍රයාය, ගොපක දිව්‍ය පුත්‍රයාය යන නමින් දැනගනිත්. ස්වාමීනි, වෙනත් භික්ෂූන් තුන් නමක්ද භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි (බ්‍රහ්මචර්‍ය්‍යාව) උසස් හැසිරීම කොට පහත්වූ ගන්ධර්ව කොටසක උපන්නාහුය. ඔවුහු පස්කම් සැප විඳින්නාහු, එයින් යුක්ත වූවාහු, එහි ඉන්ද්‍රියයන් හසුරුවන්නාහු අපගේ උපස්ථානයට පැමිණෙත්. අපගේ සේවය පිණිස පැමිණියාවූ ඔවුන්ට ගොපක දිව්‍ය පුත්‍රයා

මෙසේ සිහි කෙරෙව්වේය ‘නිදුකාණනි, තොපි කවර ආකාරයකින් ඒ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය ඇසුවාහුද?’ ‘මම වනාහි ස්ත්‍රියක්වම බුදුන් කෙරෙහි පැහැදී, ධර්මය කෙරෙහි පැහැදී, සංඝයා කෙරෙහි පැහැදී සීලයන් සම්පූර්ණ කොට ස්ත්‍රී භාවය සම්බන්ධවූ සිත දුරුකොට පිරිමි බව ගැන සිත වඩා ශරීරය බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇත්තාවූ දෙව්ලොව ඉපදී සක්දෙවිඳුගේ පුත්‍ර බවට පැමිණ, තව්තිසා වැසි දෙවියන්ගේ එක්වීමට පැමිණියෙමි. මෙහිද මා ගොපක දිව්‍ය පුත්‍රයාය. ගොපක දිව්‍ය පුත්‍රයාය යන නමින් දැනගනිත්.

“නිදුකාණනි, තොපි වනාහි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි (බ්‍රහ්මචර්‍ය්‍යාව) උතුම් හැසිරීම කොට පහත්වූ ගන්ධර්ව නිකායට පැමිණියාහුය. ඒකාන්තයෙන් දැකීමට නුසුදුසු ආකාරයක් දුටුවෙමු. අපි යම් බඳුවූ පහත්වූ ගන්ධර්ව නිකායට පැමිණියාවූ සහ ධාර්මිකයන් (එකට හැසුරුණු අය) දුටුවෙමු නම් එයයි. ස්වාමීනි, ගොපක දිව්‍ය පුත්‍රයා විසින් සිහි කරවන ලද්දාවූ ඔවුන්ගෙන් දෙව්වරු දෙදෙනෙක් මේ ආත්මයේදීම (ධ්‍යානයෙන් යුත්) සිහිය හා බ්‍රහ්ම පුරොහිත ශරීර ලැබූහ. එක් දෙව් කෙනෙක් ඒ කාමයන්හිම ගැලී විසුවේය

12. “මම පසැස් ඇත්තාවූ බුදුන් වහන්සේගේ උපාසිකාවක්වීමි. මට ගොපිකා යන නමක්ද විය. බුදුන් කෙරෙහිද, ධර්මය කෙරෙහිද විශෙෂයෙන් පැහැදී, පැහැදුනු සිතින් සංඝයාට උපස්ථාන කෙළෙමි.

“ඒ බුදුන්ගේම ධර්මයේ යහපත් කමින් මහත් ආනුභාව ඇත්තාවූ, මහත් ආලොක ඇත්තාවූ දිව්‍ය ලොකයෙහි උපන්නාවූ මම ශක්‍රයාගේ පුත්‍රයෙක් වීමි. මෙහිදී මා ගොපක දිව්‍ය පුත්‍රයායයිද (නමින්) දැන ගනිත්.

“එකල්හි මම, ගන්ධර්ව නිකායට වාසය පිණිස ආවාවූ පෙර දක්නා ලද්දාවූ භික්ෂූන් දුටුවෙමි. පෙර මනුෂ්‍යවූ ගෞතම ශ්‍රාවකවූ, අපි යම්බඳුවූ ඒ භික්ෂූන්ට පය සේදීම් ආදියෙන් සංග්‍රහකොට ආහාරයෙන් හා පානවලින්ද උපස්ථාන කෙළෙමුද, මේ පින්වත්හු කවර නම් කරුණකින් බුද්ධ ධර්මය නොපිළිගත්තාහුද?

"පසැස් ඇත්තාවූ බුදුරදුන් විසින් අවබොධ කරන ලද්දාවූ, දෙශනා කරන ලද්දාවූ ධර්මය වනාහි තමාගේ දැකීමෙන්ම දතයුත්තේ වේ. මමද තෙපිද ඒ උත්තමයන්ගේ යහපත් වචනයන් අසා බුදුන් (උපාසනය) ආශ්‍රය කරන්නෝවීමු.

"(මම) මහත් ආනුභාව ඇති, මහත් කාන්ති ඇති, දිව්‍ය ලොකයෙහි උපන්නාවූ ශක්‍රයාගේ පුත්‍රයෙක් වෙමි. පින්වත්නි, තෙපි වනාහි ශ්‍රෙෂ්ඨවූ බුදුන් ආශ්‍රයකරමින් ඉතා උතුම් ශාසනයෙහි උතුම් හැසිරීම් (බඹසර) කොට ලාමකවූ තැනක උපන්නාහුය පින්වතුන්ගේ උත්පත්තිය සුදුසු නොවේ. පහත් තැනක උපන්නාවූ සහ ධාර්මිකයන් (එකට කටයුතුකළ අය) දැකීමට සුදුසු නැති ආකාරයකින් දුටුවෙමු.

'තෙපි ගන්ධර්ව නිකායට පැමිණියාහු දෙවියන්ගේ දාස බවට පැමිණියාහුය, ගිහිගෙයිම විසුවාවූ මාගේ මේ වෙනස බලව.

"ඒ මම ස්ත්‍රියක්වී අද දිව්‍යකාමයන්ගෙන් යුක්තවූ දිව්‍ය පුරුෂයෙක් වෙමි. ගෞතම ශ්‍රාවකවූ මා විසින් සිහි කරවන ලද්දාවූ ඔවුහු ගොපක දිව්‍ය පුත්‍රවූ මා වෙත පැමිණ සංවෙගයට පැමිණියාහුය. දැන් අපි උසස් බවට යමු උත්සාහ කරමු. අනුන්ගේ පණිවිඩ කාරයෝ නොවෙමු.

"ඔවුන්ගෙන් දෙදෙනෙක් වීර්‍ය්‍ය කිරීමට පටන් ගත්තාහුය. ගෞතමයන් වහන්සේගේ අනුශාසනයන් සිහි කරන්නෝවූහ. ඔවුහු මෙහිදීම සිත් නොඅලවා පංචකාමයන්ගේ දොස් දැක්කාහුය. පාපීවූ මාරයාගේ යෙදුම්වූ දූකසේ පහ කළ යුත්තාවූ කාම සංයොජනයන් හා කාම බැඳුම් සිඳදැමීම වශයෙන් දැක්කාහුය.

"දම්වැල් කඩාගන ගිය ඇතෙක් මෙන් තවුතිසා වැසි දෙවියන් ඉක්මවූහ. ඉන්ද්‍රයා (ශක්‍රයා) සහිත දෙවියෝද ප්‍රජාපතී සහිත දෙවියෝද යන සියල්ලෝම සුධර්මා නම් දිව්‍ය සභාවෙහි උන්නාහුය.

"එකට උන්නාවූ ඔවුන් අතරින් අනාගාමි මාර්ගය උපද වන්නාවූ දක්ෂවූ රාගය නැති කළාවූ ඔවුහු, ඔවුන් (එකට උන්

අනික් දෙවියන්) ඉක්ම වූහ. දෙවියන් මැඩ පවත්නාවූ ශක්‍රයා ඔවුන් දැක දෙව් සමූහයා මැද සංවේගයක් ඇති කෙළේය.

"හීන නිකායකට පැමිණි ඒ මොව්හු තව්තිසා වැසි දෙවියන් ඉක්මවත්යයි හටගත් සංවේග ඇති ශක්‍රයාගේ වචනය අසා ගොපක දිව්‍ය පුත්‍රයා ශක්‍රයාට (මෙසේ) කීයේය"

"දෙවෙන්ද්‍රය, මනුෂ්‍ය ලොකයෙහි බුදු කෙනෙක් ඇත. කාමයන් මැඩපැවැත්තුවාවූ ශාක්‍ය මුනියයි ප්‍රසිද්ධවේ. මොව්හු උන්වහන්සේගේ පුත්‍රයෝ වෙත්. (ධ්‍යානගත) සිහියෙන් වෙන්ව චුතවූ ඔවුහු මා විසින් නැවතත් සිහිය උපදවනු ලැබූහ.

'ඔවුන් අතුරින් ගන්ධර්ව නිකායට පැමිණි එක්කෙනෙක් මෙහි වාසයට පත්විය. (කෙලෙස්) වසඟ කළාවූ අනාගාමි මාර්ගයට අනුවවූ සමාධි ගත සිත් දෙදෙනෙක්ම දෙවියන් යටත් කෙරෙත්.

"මේ ශාසනයෙහි මෙබඳුවූ ධර්ම ප්‍රකාශවේ. එහි කිසියම් ශ්‍රාවකයෙක් කුමකටවත් සැක නොකෙරේ කාම ආදි ගංගාවලින් එතරවූ සැකය සිඳින ලද්දාවූ, පංචමාරයන් ජයගත්තාවූ බුදුරජාණන් වහන්සේ වඳිමු

"මෙහි ඔබ වහන්සේගේ යම් ධර්මයක් දැන, ඔවුන් අතරින් විශෙෂයකට පැමිණි ඒ දෙදෙනෙක් බ්‍රහ්ම පුරොහිත බඹ ලොවට පැමිණ මාර්ගඵල විශෙෂයක් අවබොධ කළාහුද,

"නිදුකාණන් වහන්ස, ඒ ධර්මයට පැමිණීම පිණිස ආවෙමු නිදුකාණන් වහන්ස භාග්‍යවතුන් වහන්සේ විසින් අවසර දෙන ලද්දාවූ අපි ප්‍රශ්න අසන්නෙමුයි" කීය.

එවිට භාග්‍යවතුන් වහන්සේට මේ අදහස විය. 'මේ ශක්‍රයා බොහෝ කලක් මුලුල්ලේම පිරිසිදුය. යම් කිසි ප්‍රශ්නයක් මගෙන් අසන්නේද, ඒ සියල්ල වැඩ ඇතිවම අසන්නේය. වැඩකට නැතිව නොඅසන්නේය. මගෙන් ඇසූ යමක් මම පහදා දෙන්නෙම්ද, එය වහාම දැනගන්නේය' කියායි.

නැවත භාග්‍යවතුන් වහන්සේ සක්දෙව් රජුට ගාථාවකින් මෙසේ වදාළහ.

"ශක්‍රය, මගෙන් ප්‍රශ්න අසව. තට යම් කිසිවක් කැමති නම්, තාගේ ඒ ඒ ප්‍රශ්න මම කෙළවර කරමි" යි කියායි.

(පළමුවෙනි බණවර නිමියේය.)

---

## 2

1. කරණ ලද අවකාශ ඇති ශක්‍ර දෙවෙන්ද්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේගෙන් මේ පළමුවැනි ප්‍රශ්නය ඇසුවේය. 'නිදුකාණන් වහන්ස, මනුෂ්‍යයෝද අසුරයෝද, නාගයෝද, ගන්ධර්වයෝද, මෙයින් අන්‍යවූ බොහෝ ජනයෝ වෙත් නම් ඔව්හුද ක්‍රොධ නැත්තාහු දඬුවම් නැත්තාහු සතුරන් නැත්තාහු සතුටු සිත් ඇත්තාහු 'අපි අවෛරීව වසන්නෙමුයි' ඔවුන්ගේ ප්‍රාර්ථනාවක් වේද, ඒ ඇති කල්හිත් ඔව්හු ක්‍රොධ සහිත වූවාහු දඬුවම් සහිතවූවාහු, සතුරන් සහිතවූවාහු, සිත් අසතුටු සහිතවූවාහු වෛර ඇත්තෝව වසති. ඒ කිනම් බැඳීමකින් බැඳීම නිසාද?" මෙසේ ශක්‍ර දෙවෙන්ද්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේගෙන් පළමුවෙනි ප්‍රශ්නය ඇසුවේය. ප්‍රශ්න අසන ලද්දාවූ භාග්‍යවතුන් වහන්සේ ඕහට මෙය ප්‍රකාශ කළෝය. "දෙවෙන්ද්‍රය, ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය (අනුන්ගේ සම්පත් නොඉවසීම, තම සම්පත් සැඟවීම) යන බැඳුම්වලින් බැඳීම හෙතුකොට ගෙන දෙවියෝද, මනුෂ්‍යයෝද, අසුරයෝද, නාගයෝද, ගන්ධර්වයෝද, මෙයින් අන්‍යවූ බොහෝ ජනයෝ වෙත් නම් ඔව්හුද ක්‍රොධ නැත්තාහු දණ්ඩන නැත්තාහු සතුරන් නැත්තාහු අසතුටු සිත් රහිතවූවාහු අපි අවෛරීව වසන්නෙමුයයි ඔවුන්ගේ ප්‍රාර්ථනාවක්වේද, එතකුදු වුවත් ඔව්හු ක්‍රොධ ඇත්තාහු දඬුවම් ඇත්තාහු සතුරන් ඇත්තාහු අසතුටු සිත් ඇත්තාහු වෛර ඇත්තෝව වෙසෙත්යයි' ශක්‍ර දෙවෙන්ද්‍රයා විසින් අසන ලද්දාවූ භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළෝය. සතුටු සිත් ඇති ශක්‍ර දෙවෙන්ද්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තේය, අනුමෝදන් විය. "භාග්‍යවතුන් වහන්ස, එය එසේය. සුගතයන් වහන්ස, එය එසේය. භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රශ්න විසඳීම් ඇසීමෙන් මෙහි 'කෙසේ කෙසේදැයි' පැවති සැකය නැති විය. මාගේ සැකය දුරින්ම දුරු විය."

**2** මෙසේ ශක්‍ර දෙවෙන්ද්‍ර තෙමේ භාග්‍යවතුන්වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන අනුමෝදන්ව භාග්‍යවතුන් වහන්සේගෙන් තවත් ප්‍රශ්නයක් ඇසුවේය. "නිදුකාණන් වහන්ස, අනුන්ගේ සැප නොඉවසීම හා තම සැප සැඟවීම යන දෙක කුමක් මුල්කොට ඇත්තේද? කුමක් හේතුකොට ඇත්තේද? කුමක් ජාතිකොට ඇත්තේද? කුමක් ඉපදීම කොට ඇත්තේද? කුමක් ඇති කල්හි අන් සැප නොඉවසීම හා තම සැප සැඟවීම වේද? කුමක් නැති කල අන් සැප නොඉවසීම හා තම සැප සැඟවීම නොවේදැයි" කීවාය.

"දෙවෙන්ද්‍රය, අන් සැප නොඉවසීම හා තම සැප සැඟවීම යනු දෙක, ප්‍රියවූදේද, අප්‍රියවූ දේද, මූලකාරණාකොට ඇත්තේය. ප්‍රිය අප්‍රිය දේ හේතුවකොට ඇත්තේය. ප්‍රිය අප්‍රියදේ ජාතිකොට ඇත්තේය. ප්‍රිය අප්‍රිය දේ ඉපදීමකොට ඇත්තේය. ප්‍රිය අප්‍රිය දේ ඇති කල්හිම ඊෂ්‍යාව හා මාත්සය්‍යීය වන්නේය. ප්‍රිය අප්‍රිය නැති කල්හි ඊර්ෂ්‍යාව හා මසුරු බව නොවේයයි" කීවෝය.

"නිදුකාණන් වහන්ස, ප්‍රිය අප්‍රිය දෙක වනාහි කුමක් නිදානකොට ඇත්තේද? කුමක් ජාතිකොට ඇත්තේද? කුමක් ඉපදීමකොට ඇත්තේද? කුමක් ඇති කල්හි ප්‍රිය අප්‍රිය දෙක වේද? කුමක් නැති කල්හි ප්‍රිය අප්‍රිය දෙක නොවේදැයි" ඇසීය.

"දෙවෙන්ද්‍රය, ප්‍රිය අප්‍රිය දෙක වනාහි ආසාව මුල්කොට ඇත්තේය. ආසාව හේතුකොට ඇත්තේය ආසාව ජාති කොට ඇත්තේය ආසාව ඉපදීමකොට ඇත්තේය. ආසාව ඇති කල්හි ප්‍රිය අප්‍රිය දෙක ඇතිවේ. ආසාව නැති කල්හි ප්‍රිය අප්‍රිය දෙක නොවේයයි" කීවෝය.

"නිදුකාණන් වහන්ස, ආසාව වනාහි කුමක් මුල්කොට ඇත්තේද? කුමක් හේතුකොට ඇත්තේද? කුමක් ජාති කොට ඇත්තේද? කුමක් ඉපදීම කොට ඇත්තේද? කුමක් ඇති කල්හි ආසාව වේද? කුමක් නැති කල්හි ආසාව නොවේදැයි' ඇසුවේය. "දෙවෙන්ද්‍රය, ආසාව වනාහි හිතින් පරීක්ෂාකර බැලීම මුල්කොට ඇත්තේය සිතින් පරීක්ෂා කර බැලීම හේතුකොට ඇත්තේය. හිතින් පරීක්ෂාකර බැලීම ජාතිකොට ඇත්තේය. හිතින් පරීක්ෂාකරබැලීම ඉපදීම කොට ඇත්තේය. හිතින් පරීක්ෂාකර

බැලීම ඇතිකල්හි ආසාව වේ, පරීක්ෂාකිරීම නැති කල්හි ආසාව නොවේය”යි කීවාහුය.

“නිදුකාණන් වහන්ස, හිතින් පරීක්ෂාකර බැලීම වනාහි කුමක් මුල්කොට ඇත්තේද? කුමක් හේතුවකොට ඇත්තේද? කුමක් ජාතිකොට ඇත්තේද? කුමක් ඉපදීමකොට ඇත්තේද? කුමක් ඇති කල්හි පරීක්ෂා කිරීම වේද? කුමක් නැති කල්හි සිතින් පරීක්ෂාකර බැලීම නොවේදැයි” ඇසුවේය.

“දෙවෙන්ද්‍රය, සිතින් විනිශ්චය කිරීම වනාහි ප්‍රමාදයට හේතුව ආශාව හා එක්ව යෙදුණ හැඟීම් මුල් කොට ඇත්තේය. ප්‍රමාදයට හේතුවූ ආශාව හා එක්ව යෙදුණ හැඟීම් ජාතිකොට ඇත්තේය. ප්‍රමාදයට හේතුවූ ආශාව හා එක්ව යෙදුණ හැඟීම් ඉපදීමකොට ඇත්තේය. ප්‍රමාදයට හේතුවූ ආශාව හා එක්ව යෙදුණ හැඟීම් ඇතිකල්හි පරීක්ෂාකිරීම වේ. ප්‍රමාදයට හේතුවූ ආශාව හා එක්ව යෙදුණ හැඟීම් නැති කල්හි පරීක්ෂාකිරීම නොවේය” යි වදාළෝය.

3 ‘නිදුකාණන් වහන්ස, කෙසේ පිළිපදින්නාවූ භික්ෂු තෙමේ ප්‍රමාදයට හේතුවූ ආශාව හා එක්වයෙදුණ හැඟීම් දුරු කිරීමට සුදුසුවූ මාර්ගයෙහි පිළිපදින්නේ වේදැ”යි ඇසුවේය.

“දෙවෙන්ද්‍රය, මම සැප වේදනාවද දෙපරිද්දෙකින් කියමි. සේවනය කටයුත්තද සේවනය නොකටයුත්තද යනුවෙනි. දෙවෙන්ද්‍රය, මම දුක්වේදනාවද දෙපරිද්දකින් කියමි. සේවනය කටයුත්තද සේවනය නොකටයුත්තද යනුවෙනි දෙවෙන්ද්‍රය, දුකසැපදෙකම මැදහත් විඳීමද මම දෙපරිද්දකින් කියමි. සේවනය කටයුත්තද සේවනය නොකටයුත්තද යනුයි දෙවෙන්ද්‍රය, මම සැප වෙදනාවද දෙපරිද්දකින් කියමි. එනම් සේවනය කටයුත්තද සේවනයනොකටයුත්තද යනුයි. යන මෙය කුමක් සඳහා කියන ලද්දේදයත්? එහි යම් සැප වේදනාවක් මෙසේ දන්නේද, කෙසේද, මේ සොම්නස සේවනය කරන්නාවූ මට අකුසලධර්මයෝ වැඩෙත්ද කුශලධර්මයෝ පිරිහෙත්ද, මෙබඳුවූ සැප වෙදනාව සේවනය නොකටයුතුයි. එහි යම් සැප වේදනාවක් මෙසේ දන්නේද? කෙසේද මේ සැප වෙදනාව සේවනය කරන්නාවූ මගේ අකුශල ධර්මයෝ පිරිහෙත්ද,

කුශලධර්මයෝ වැඩෙත්ද, මෙබඳුවූ සැප වෙදනාව සේවනය කටයුතුයි. එහි යම් සැප වේදනාවක් විතර්ක සහිතද විචාර සහිතද යම් සැප වෙදනාවක් විතර්ක රහිතද විචාර රහිතද, එයින් විතර්ක රහිත විචාර රහිත සැප වෙදනාව අතිශයින් උතුම්ය.

"දෙවෙන්ද්‍රය, මම සේවනය කළ යුත්තය, සේවනය නොකළ යුත්තයයි දෙපරිද්දකින් දුක් වෙදනාව කියමි යන යම් වචනයක් කියන ලද්දේ නම් එය කුමක් සඳහා කියන ලද්දේද? යම් දොම්නසක් සේවනය කිරීමෙන් අකුසල ධර්ම වැඩෙත්, කුසල ධර්ම පිරිහෙත්යයි දන්නේද ඒ දොම්නස සෙවනය නොකළ යුතුය, යම්දොම්නසක් සේවනය කිරීමෙන් අකුශල ධර්ම පිරිහෙත්, කුසල ධර්ම වැඩෙත්යයි දන්නේද, ඒ දොම්නස් වෙදනාව සෙවනය කළ යුතුයි. එහි විතර්ක විචාර සහිත දොම්නසක් ඇත්තේද විතර්ක විචාර රහිත දොම්නසක් ඇත්තේද එයින් විතර්ක විචාර රහිත දොම්නස ප්‍රණීතතරය.

"දෙවෙන්ද්‍රය, මම සේවනය කටයුත්ත සේවනය නොකට යුත්තයයි දුක් වේදනාව දෙපරිද්දකින් කියමියි මෙසේ යමක් කියන ලද්දේ නම්, එය මේ සඳහා කියනලදී.

"දෙවෙන්ද්‍රය, සේවනය කටයුත්තය, සෙවනය නොකට යුත්තයයි උපෙක්ෂාව මම දෙපරිද්දෙකින් කියමි යන වචනයක් කියන ලද්දේනම් එය කුමක් සඳහා කියන ලද්දේද යත් එහි යම් උපෙක්ෂාවක් සේවනය කරන්නාවූ මට කුශල ධර්මයෝ පිරිහෙත්, අකුශල ධර්මයෝ වැඩෙත්යයි දන්නේ නම් ඒ උපෙක්ෂාව සේවනය නොකළ යුතුයි. එහි යම් උපෙක්ෂාවක් මේ උපෙක්ෂාව සේවනය කරන්නාවූ මට අකුශල ධර්මයෝ පිරිහෙත්, කුශල ධර්මයෝ වැඩෙත්ය කියා දන්නේද, මෙබඳුවූ උපෙක්ෂාව සේවනය කටයුතුයි, එහි යම උපෙක්ෂාවක් විතර්ක සහිතද විචාර සහිතද යම් උපෙක්ෂාවක් විතර්ක රහිතද විචාර රහිතද, ඒ අවිතර්ක අවිචාර උපෙක්ෂාව අතිශයින් ප්‍රණීතය, දෙවෙන්ද්‍රය, මම උපෙක්ෂාවද, දෙපරිද්දෙකින් කියමි. සේවනය කටයුත්තද, සේවනය නොකටයුත්තදැයි කියා යම් වචනයක් කියන ලද්දේ නම්, එය මේ සඳහා කියනලදී. දෙවෙන්ද්‍රය, මෙසේ

පිළිපදින්නාවූ භික්ෂු තෙමේ ප්‍රමාදයට හෙතුවූ ආසාව සමග යෙදුණ හැඟීම් සංසිඳවීමම සුදුසු මාර්ගයයි කියනලද ප්‍රතිපදාවට පිළිපන්නේ වේයයි" ප්‍රකාශ කළෝය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ ශක්‍ර දෙවෙන්ද්‍රයාගේ ප්‍රශ්නවලට පිළිතුරු ප්‍රකාශ කළෝය. සතුටු සිත් ඇත්තාවූ ශක්‍ර දෙවෙන්ද්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටු විය.

"භාග්‍යවතුන් වහන්ස, එය එසේය. සුගතයන් වහන්ස, ඒ එසේය. භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රශ්න විසඳීම අසා මාගේ සැකය බැහැර ගියේය. කෙසේ කෙසේදැයි පැවති සැකය පහවූයේය."

4 මෙසේ මෙහිදී සක්‍ර දෙවෙන්ද්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන මත්තෙහිත් භාග්‍යවතුන් වහන්සේගෙන් ප්‍රශ්නයක් ඇසීය. "නිදුකාණන් වහන්ස, කෙසේ පිළිපදින්නාවූ භික්ෂු තෙමේ සීල සංවරය පිණිස පිළිපදින්නේ වේද?

"දේවේන්ද්‍රය, මම කයේ පැවැත්මද දෙපරිද්දෙකින් කියමි. සේවනය කටයුත්තද සේවනය නොකට යුත්තද යනුවෙනි.

"දෙවෙන්ද්‍රය, මම වචනයේ පැවැත්මද දෙපරිද්දකින් කියමි සේවනය කටයුත්තද, සේවනය නොකට යුත්තද යනුවෙනි.

"දෙවෙන්ද්‍රය, මම සෙවීමද දෙපරිද්දකින් කියමි. සේවනය කටයුත්තද සේවනය නොකටයුත්තද යනුවෙනි.

"දෙවෙන්ද්‍රය මම ශරීරයේ පැවැත්මද දෙපරිද්දකින් කියමි. සේවනය කටයුත්තද සේවනය නොකට යුත්තදැයි මෙසේ යම් වචනයක් කියන ලද්දේ නම් මෙය කුමක් සඳහා කියන ලද්දේදයත්. එහි යම් ශරීරයේ පැවැත්මක් මේ ශරීරයේ පැවැත්ම සේවනය කරන්නාවූ මට අකුශල ධර්මයෝ වැඩෙත්, කුශල ධර්මයෝ පිරිහෙත්යයි දන්නේද, මෙබඳුවූ කායික පැවැත්ම සේවනය නොකටයුතුයි. එහි යම් කායික පැවැත්මක් මේ ශරීරයේ පැවැත්ම සේවනය කරන්නාවූ මාගේ අකුශල ධර්මයෝ පිරිහෙත්. කුශල ධර්මයෝ වැඩෙත්යයි දන්නේද, මෙබඳුවූ ශරීරයේ පැවැත්ම සේවනය, කටයුතුයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"දෙවේන්ද්‍රය, මම ශරීරයේ පැවැත්ම දෙපරිද්දකින් කියමි. සේවනය කටයුත්තද සේවනය නොකට යුත්තදැයි මෙසේ යමක් කියන ලද්දේ නම් එය මේ සඳහා කියන ලදී.

"දෙවෙන්ද්‍රය, මම වචනයේ පැවැත්මද දෙපරිද්දෙකින් කියමි සේවනය කටයුත්තද සේවනය නොකටයුත්තදැයි මෙසේ යමක් කියන ලද්දේ නම් එය කුමක් සඳහා කියන ලද්දේද? එහි යම්වචනයේ පැවැත්මක් මේ වචනයේ පැවැත්ම සේවනය කරන්නාවූ මාගේ අකුශල ධර්මයෝ වැඩෙත්. කුශල ධර්මයෝ පිරිහෙත්යයි' දන්නේද, මෙබඳුවූ වචනයේ පැවැත්ම සේවනය නොකට යුතුයි. මේ වචනයේ පැවැත්ම සේවනය කරන්නාවූ මාගේ අකුශල ධර්මයෝ පිරිහෙත්, කුසල ධර්මයෝ වැඩෙත් යයි දන්නේද, මෙබඳුවූ වචනයේ පැවැත්ම සේවනය කටයුතුයි.

"දෙවෙන්ද්‍රය, මම වචනයේ පැවැත්ම දෙපරිද්දකින් කියමි. සේවනය කටයුතුද සේවනය නොකට යුත්තදැයි මෙසේ යමක් කියන ලද්දේ නම් එය මේ සඳහා කියනලදී.

"දෙවෙන්ද්‍රය, මම (පයෙෂීසනය) සෙවීමද දෙපරිද්දකින් කියමි. සේවනය කටයුත්තද, සේවනය නොකටයුත්තද යනුවෙනැයි. යම් වචනයක් කියනලද්දේද, එය කුමක් සඳහා කියනලද්දේද යත්, එහි මේ පයෙෂීසනය (සෙවීම) සේවනය කරන්නාවූ මාගේ අකුසල ධර්මයෝ වැඩෙත්. කුසල ධර්මයෝ පිරිහෙත් යයි යම් සෙවීමක් මෙසේ දන්නේද මෙබඳුවූ පයෙෂීසනය සේවනය නොකට යුතුයි. එහි මේ පයෙෂීසනය සේවනය කරන්නාවූ මාගේ අකුසල ධර්මයෝ පිරිහෙත්, කුසල ධර්මයෝ වැඩෙත්යයි, යම් පයෙෂීසනයක් මෙසේ දන්නේද, මෙබඳුවූ පයෙෂීසනය සෙවනය කටයුතුයි. දෙවෙන්ද්‍රය, මම පයෙෂීසනයද දෙපරිද්දකින් කියමි. සේවනය කටයුත්තද සේවනය නොකටයුත්තද යනුවෙනැයි මෙසේ යමක් කියනලද්දේ නම් එය මේ සඳහා කියන ලදී.

"දෙවෙන්ද්‍රය, මෙසේ පිළිපදින්නාවූ භික්ෂු තෙමේ ප්‍රාතිමොක්ෂ සංවරය පිණිස පිළිපදින්නේයයි" මෙසේ භාග්‍යවතුන් වහන්සේ ශක්‍රදෙවේන්ද්‍රයාගේ ප්‍රශ්නවලට උත්තර දුන්නෝය. සතුටු සිත් ඇත්තාවූ ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ

භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තේය. අනුමෝදන් විය. "භාග්‍යවතුන්වහන්ස, ඒ එසේයි සුගතයන් වහන්ස එය එසේය. මෙහිදී භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රශ්න විසඳීම අසා, මාගේ සැකය දුරුවිය. කෙසේ කෙසේ දැයි පැවති සැකය නැතිවිය"

**5** මෙසේ සක්‍ර දෙවෙන්ද්‍ර තෙමේ මෙහිදී භාග්‍යවතුන් වහන්සේගේ වචනය අනුමෝදන්ව මත්තෙහිත් භාග්‍යවතුන් වහන්සේගෙන් ප්‍රශ්නයක් ඇසීය. ඒ කෙසේද, 'නිදුකානන් වහන්ස, කෙසේ පිළිපදින්නාවූ භික්ෂුතෙමේ ඉන්ද්‍රිය සංවරය පිණිස පිළිපදින්නේවේදැයි" කියායි.

"දෙවෙන්ද්‍රය, මම ඇසින් බලා දතයුතුවූ රූපය දෙපරිද්දකින් කියමි සේවනය කටයුත්තද, සේවනය නොකට යුත්තද යනුයි.

"දෙවෙන්ද්‍රය, මම කණින් අසා දතයුතුවූ ශබ්දයද දෙපරිද්දකින් කියමි. සේවනය කටයුත්තද සෙවනය නොකටයුත්තද යනුයි.

"දෙවෙන්ද්‍රය, මම නාසයෙන් ගඳ සුවඳ විඳ දතයුතුවූ ගන්ධයද දෙපරිද්දෙකින් කියමි. සේවනය කටයුත්තද සේවනය නොකටයුත්තද යනුයි.

"දේවෙන්ද්‍රය මම දිවෙන් රස විඳ දතයුතුවූ රසයද දෙපරිද්දකින් කියමි. සේවනය කටයුත්තද සේවනය නොකටයුත්තද යනුයි.

"දේවෙන්ද්‍රය, මම ශරීරයෙන් ස්පර්ශ කොට දතයුතුවූ ස්පර්ශයද (පහසද) දෙපරිද්දකින් කියමි. සේවනය කටයුත්තද සේවනය නොකටයුත්තද යනුයි.

"දේවෙන්ද්‍රය සිතෙන් පරීක්ෂාකොට බලා දතයුතුවූ ධර්මයද දෙපරිද්දකින් කියමි. සේවනය කටයුත්තද සේවනය නොකටයුත්තද යනුයයි" කීවාහුය.

මෙසේ කී කල ශක්‍ර දෙවෙන්ද්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දැන්නුවේය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් කොටින් වදාරණලද මේ ධර්මයාගේ අර්ථය මම විස්තර වශයෙන් දනිමි. ස්වාමීන් වහන්ස, යම්බඳුවූ ඇසට

පේන රූපයක් සේවනයකරන්නහුගේ අකුශල ධර්මයෝ වැඩෙත්ද කුසල ධර්මයෝ පිරිහෙත්ද, මෙබඳුවූ ඇසට පෙනෙන්නාවූ රූපය සේවනය නොකටයුතුයි. ස්වාමීනි, යම් බඳුවූ ඇසට පේන රූපයක් සේවනය කරන්නහුගේ අකුසල ධර්මයෝ පිරිහෙද්ද, කුසල ධර්මයෝ වැඩෙද්ද, මෙබඳුවූ ඇසට පේන රූපය සේවනය කටයුතුයි.

"ස්වාමීනි, යම්බඳුවූ කණට ඇසෙන ශබ්දයක් සේවනය කරන්නහුගේද, ස්වාමීනි, යම්බඳුවූ නාසයෙන් ගඳ සුවඳ විඳ දැනගන්නාවූ ගන්ධයක් සේවනය කරන්නහුගේද ස්වාමීනි, යම්බඳුවූ දිවට දැනෙන්නාවූ රසයක් සේවනය කරන්නහුගේ ද, ස්වාමීනි, යම් බඳුවූ ශරීරයට දැනෙන්නාවූ ස්පර්ශයක් සේවනය කරන්නහුගේද, ස්වාමීනි, යම්බඳුවූ සිතින් දැන ගන්නාවූ ධර්මයක් සේවනය කරන්නහුගේද, අකුසල ධර්මයෝ පිරිහෙත්ද, කුසල ධර්මයෝ වැඩෙත්ද, මෙබඳුවූ සිතින් දැනගන්නාවූ ධර්මය තෙමේ සේවනය කටයුතුයි. ස්වාමීන් වහන්ස, යම්බඳුවූ සිතින් දැනගන්නාවූ ධර්මයක් සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුසල ධර්මයෝ වැඩෙත්ද, මෙබඳුවූ සිතින් දැනගන්නාවූ ධර්මයෝ සේවනය කටයුතුයි.

"ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ විසින් කොටින් වදාරණ ලද මේ ධර්මයාගේ අර්ථ විස්තරයෙන් දන්නාවූ මා විසින් මෙහිදී භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රශ්න විසඳීම අසා සැකය දුරුකරනලදී කෙසේ කෙසේදැයි පැවති සැකය නැතිවීයයි" ප්‍රකාශ කෙළේය.

**6** මෙසේ මෙහි ශක්‍ර දෙවෙන්ද්‍රතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන අනුමෝදන්ව භාග්‍යවතුවන් වහන්සේගේ මත්තෙහිත් ප්‍රශ්නයක් ඇසුවේය.

"සියලුම ශ්‍රමණ බ්‍රාහ්මණයෝ සමාන වාද ඇත්තාහුද? සමාන ඡන්ද ඇත්තාහුද? සමාන කෙළවර ඇත්තාහුද?" " දෙවෙන්ද්‍රය, සියලු ශ්‍රමණ බ්‍රාහ්මණයෝම සමාන වාද ඇත්තෝද, සමාන ආචාර ඇත්තෝද, සමාන කෙළවර ඇත්තෝද, නොවෙත්මයයි" කීවාහුය.

"නිදුකාණන් වහන්ස, කවර හෙයකින් සියලු ශ්‍රමණ බ්‍රාහ්මණයෝම සමාන වාද ඇත්තෝ සමාන ඡන්ද ඇත්තෝ, සමාන කෙළවර ඇත්තෝ නොවෙද්ද?"

"දේවෙන්ද්‍රය, ලෝක සත්වතෙමේ අනේක අදහස් නොයෙක් අදහස් ඇත්තේමය. ඒ අනේක අදහස් නොයෙක් අදහස් ඇති ලෝකයෙහි සත්වයෝ යම් යම් අදහස් ගනිද්ද, ඒ ඒ අදහසම දැඩි සේ ගෙන යහපත් ලෙස ගෙන මේ අපගේ වචනයම සත්‍යයි අන්‍යයන්ගේ වචනය වරදයයි කියත්. එහෙයින් සියලුම ශ්‍රමණ බ්‍රාහ්මණයෝ සමානවාද ඇත්තෝද සමාන ලබ්ධි ඇත්තෝද සමාන කෙළවර ඇත්තෝද නොවෙත්යයි" කීවෝය.

"නිදුකාණන් වහන්ස, සියලු ශ්‍රමණ බ්‍රාහ්මණයෝම විනාශය කෙළවර කිරීමක් ඇත්තෝද, විනාශය ඉක්ම වන්නාවූ සසර බැඳීම් සිඳින්නාවූ නිර්වාණය ඇත්තෝද, විනාශය කෙළවර කරන උතුම් හැසිරීම් ඇත්තෝද, නිත්‍යවූ අවසානයක් ඇත්තෝද?"

"දෙවෙන්ද්‍රය, සියලු ශ්‍රමණ බ්‍රාහ්මණයෝ විනාශය ඉක්මවූ කෙළවරක් ඇත්තෝද, විනාශය ඉක්මවන්නාවූ සසර බැඳීම සිඳින්නාවූ නිර්වාණය ඇත්තෝද, විනාශය කෙළවර කරන උතුම් හැසිරීම ඇත්තෝ නිත්‍යවූ කෙළවර ඇත්තෝද නොවෙත්යයි" කීවාහුය

"නිදුකාණන් වහන්ස, කවර හෙයින් සියලු මහණ බමුණෝ අත්‍යන්ත නිෂ්ඨා ඇත්තෝ අත්‍යන්ත යොගක්ෂෙම සංඛ්‍යාත නිර්වාණය ඇත්තෝ අත්‍යන්ත බඹසර ඇත්තෝ අත්‍යන්ත කෙළවර ඇත්තෝ නොවෙද්ද?'

"දෙවෙන්ද්‍රය, යම් ඒ මහණ බමුණෝ තණ්හාව ක්ෂය කිරීමෙන් මිදුණාහු වෙද්ද, ඔව්හු අත්‍යන්ත නිෂ්ඨා ඇත්තෝ අත්‍යන්ත යොගක්ෂෙම ඇත්තෝ අත්‍යන්ත බඹසර ඇත්තෝ අත්‍යන්ත කෙළවර ඇත්තෝ වෙත්.

'එහෙයින් සියලු මහණ බමුණෝම අනිත්‍ය ඉක්මවූ නිෂ්ඨා ඇත්තෝ, අනිත්‍යය ඉක්මවූ යොගාක්ෂෙම ඇත්තෝ, අනිත්‍යය ඉක්මවූ බඹසර ඇත්තෝ, අනිත්‍ය ඉක්මවූ කෙළවර ඇත්තෝ නොවෙත්යයි" කීවාහුය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ ශක්‍ර දෙවෙන්ද්‍රයා විසින් අසනලද ප්‍රශ්නවලට උත්තර දුන්නෝය. සතුටු සිත් ඇත්තාවූ ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තේය. අනුමෝදන් විය. කෙසේද, "භාග්‍යවතුන් වහන්ස,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ඒ එසේය සුගතයන් වහන්ස, ඒ එසේය. මෙහි භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රශ්න විසඳීම අසා, මාගේ සැකය දුරුවිය. කෙසේද කෙසේදැයි පැවති සැකය නැතිවූයේයයි" ප්‍රකාශ කෙළේය.

7 මෙසේ මෙහි ශක්‍ර දෙවෙන්ද්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනය පිළිගෙන අනුමෝදන්ව භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දැන්නුවේය. "ස්වාමීන් වහන්ස තෘෂ්ණාව රෝගයකි. තණ්හාව ගඩයකි. තණ්හාව උලකි. තණ්හාව මේ පුරුෂයා ඒ ඒ භවයාගේ ඉපදවීම පිණිස අදින්නේය එහෙයින් මේ පුරුෂයා උස් පහත් බවට පැමිණේ"

'ස්වාමීන් වහන්ස, යම්බඳුවූ ප්‍රශ්නයක් සම්බන්ධව මෙයින් පිට අන්‍යවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගෙන් මම අවකාශ පාත්‍රයකුදු නොලද්දෙම්ද, බොහෝ කලක සිට පැවැත්තාවූ ඒ ප්‍රශ්නයෝ භාග්‍යවතුන් වහන්සේ විසින් මට ප්‍රකාශ කරන ලද්දාහ. මාගේ යම්බඳුවූ විචිකිච්ඡා සංඛ්‍යාත කෙසේ කෙසේ දැයි පැවති සැක නමැති හුලක් වූයේනම් භාග්‍යවතුන් වහන්සේ විසින් එයද උදුරන ලද්දේයයි" දැන්නුවේය

"දේවෙන්ද්‍රය, මේ ප්‍රශ්න අන්‍යවූ මහණ බමුණන්ගෙන් ඇසුවෙහිදැයි ඔබ දන්නෙහිද?"

"ස්වාමීන් වහන්ස, මේ ප්‍රශ්න අන්‍යවූ මහණ බමුණන් ගෙන් ඇසුවෙමියි, මම දනිමි.'

"දේවෙන්ද්‍රය, කෙසේ නම් ඔව්හු ප්‍රකාශ කළාහුදැයි ඉදින් තොපට බරක් නොවේ නම් කියවයි" කීවාහුය.

"ස්වාමීන් වහන්ස, යම් තැනෙක්හි භාග්‍යවතුන්වහන්සේ හෝ භාග්‍යවතුන් වහන්සේට සමාන ඇත්තෝ හෝ වන්නාහු නම් මට බරක් (අපහසුවක්) නැත"

"දේවෙන්ද්‍රය, එසේ වීනම් කියවයි" ප්‍රකාශ කළෝය.

"ස්වාමීන්වහන්ස, යම් මහණ බමුණන් වනවාසීහුයයි කියා හෝ ප්‍රාන්ත සේනාසන ඇත්තෝයයි කියා හෝ හඟිම්ද, මම ඔවුන් වෙත පැමිණ මේ ප්‍රශ්නයන් ඇසුයෙමි. මා විසින් අසන ලද්දාවූ ඔව්හු නොදනිත්. නොදන්නාවූ ඔව්හු මගෙන්ම ආපසු අසත්. 'ආයුෂ්මත් තෙමේ කවර නම් ඇත්තේදැයි' අසනලද

මම ඔවුන්ට 'නිදුකාණෙනි, මම ශක්‍ර දේවෙන්ද්‍රයයි' ප්‍රකාශකරමි. ඔව්හු 'ආයුෂ්මත් දේවෙන්ද්‍ර තෙමේ කවර කර්මයක්කොට මේ ස්ථානයට පැමිණියේදැයි' මත්තෙහිත් අසත්. ඔවුන්ට මම අසනලද පරිදි ඉගෙනගන්නාලද පරිදි ධර්මය දෙසමි. ඔව්හු එපමණකින්ම සතුටු සිත් ඇත්තෝ වෙත්. කෙසේද, 'අප විසින් ශක්‍ර දේවෙන්ද්‍රතෙමේ දක්නා ලද්දේය. අපි යමක් ඇසුවෙමු නම් එයද අපට ප්‍රකාශ කරන ලද්දේය' කියායි ඔව්හු තුමූ මා ළඟට පැමිණෙත්. මම ඔවුන් ළඟට නොපැමිණියෙමි. ස්වාමීන් වහන්ස, මම වනාහි සෝවාන්වූ, අපායෙහි නොවැටෙන ස්වභාව ඇත්තාවූ නියතවූ රහත් බව පිහිටකොට ඇත්තාවූ බුද්ධ ශ්‍රාවකයෙක්මි. 'දේවෙන්ද්‍රය, මීටපෙර මෙවැනිවූ ප්‍රීතියක් ලැබීමක් සොම්නසක් ලැබීමක් දන්නෙහිදැයි' ඇසූහ. "ස්වාමීන්වහන්ස, මෙයින් පෙර මෙබඳුවූ මෙවැනි ප්‍රීතියක් ලැබීමක් සොම්නසක් ලැබීමක් මම දනිමි." "දේවෙන්ද්‍රය, මෙයින් පෙර මෙබඳුවූ ප්‍රීතියක් සොම්නසක් ලැබීමක් කෙසේ නම් දන්නෙහිද?" "ස්වාමීනි, පෙර කාලයෙහි දෙවියන්ගේ හා අසුරයන්ගේ යුද්ධයක් වූයේය. ස්වාමීනි, ඒ යුද්ධයේදී දෙවියෝ දිනූහ. අසුරයෝ පරාජය වූහ. ස්වාමීනි, ඒ විශෙෂයෙන් දිනනලද යුද්ධ ඇති ඒ මට මේ සිත විය, දැන් යම්බඳුවූ දිව්‍ය ඕජසක් වේද, යම්බඳුවූ අසුර ඕජසක්වේද, මේ දෙකොටසම දෙවියෝ පරිභොග කරන්නාහු යයි කියායි. ස්වාමීන්වහන්ස, යම්බඳුවූම මාගේ දඬුවම් සහිතවූ ආයුධ සහිතවූ ප්‍රීති ප්‍රතිලාභය හෝ සොම්නස් ප්‍රතිලාභය හෝ සසර කලකිරීම පිණිස නොපවතී. රාගය නැති කිරීම පිණිස නොපවතී. නිරොධය පිණිස නොපවතී. කෙලෙස් නැතිකිරීම පිණිස නොපවතී. සම්බෝධිය පිණිස නොපවතී. නිර්වාණය පිණිස නොපවතී. භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා ලබන ලද්දාවූ ඒ දඬුවම් රහිතවූ ආයුධ රහිතවූ ප්‍රීති ප්‍රතිලාභය සොම්නස් ප්‍රතිලාභය ඒකාන්තයෙන් සසර කලකිරීම, පිණිස රාගය නැතිකිරීම පිණිස, නිරොධය පිණිස කෙලෙස් නැති කිරීම පිණිස, විශෙෂ අවබෝධය පිණිස, සම්බෝධිය පිණිස පවතීයයි" ප්‍රකාශ කෙළේය.

8. "දේවෙන්ද්‍රය, ඔබ කිනම් කාරණයක් අර්ථ වශයෙන් දක්නේ මෙබඳුවූ තුෂ්ටි ප්‍රතිලාභයක් සොම්නස් ප්‍රතිලාභයක් විඳින්නෙහිදැයි" ඇසුවෝය.

"ස්වාමීන්වහන්ස, මම කාරණා හයක්ම අර්ථ වශයෙන් දක්නේ මෙබඳුවූ තුෂ්ටි ප්‍රතිලාභයක්, සොම්නස් ප්‍රතිලාභයක් විඳිමි"යි ප්‍රකාශ කෙළේය. "මේ ස්ථානයෙහි සිට ගෙනම මා විසින් නැවත ජීවිතයද ලබනලදී. නිදුකාණන් වහන්ස, මෙසේ දැන වදාළ මැනවි.

"ස්වාමීනි, මේ ප්‍රථම කාරණය දක්නාවූ මම මෙබඳුවූ තුෂ්ටි ප්‍රතිලාභයක් හෝ සොම්නස් ප්‍රතිලාභයක් විඳිමියි" දැන්නුවෝය.

"මම දිව්‍ය ලෝකයෙන් චුතවූයෙම්, සිහි මුළා නොවී මිනිස් ලොව යම්ක්ෂත්‍රියාදි කුලයෙහි සිත ඇලේනම් එහි ගර්භොත්පත්තියට පැමිණෙන්නෙමි.

"ස්වාමීනි, මේ දෙවැනි කාරණය අර්ථ වශයෙන් දක්නාවූ මම මෙබඳුවූ තුෂ්ටි ප්‍රතිලාභයක්, සොම්නස් ප්‍රතිලාභයක් ලබමි. ඒ මම මුළා නොවන ප්‍රශ්න ඇත්තේ ශාසනයෙහි ඇලී වාසය කරමින් යහපත් ප්‍රඥා ඇත්තෙම්, සිහි ඇත්තෙම්. නුවණින් වාසය කරන්නෙමි.

"ස්වාමීනි, මේ තුන්වැනි කාරණය අර්ථ වශයෙන් දක්නාවූ මම මෙබඳුවූ තුෂ්ටි ප්‍රතිලාභයක්, සොම්නස් ප්‍රතිලාභයක් ප්‍රකාශ කරමි.

"න්‍යාය ක්‍රමයෙන් හැසිරෙන්නාවූ මට සම්බෝධිය සකෘදාගාමි මාර්ගය වන්නේ නම් දැනගනු කැමතිව වාසය කරන්නෙමි. එය මනුෂ්‍ය ලෝකයෙහි මාගේ කෙළවර වන්නේය"

"ස්වාමීනි, මේ හතරවැනි කාරණය අර්ථ වශයෙන් දක්නෙම් මෙබඳුවූ තුෂ්ටි ප්‍රතිලාභයක්, සොම්නස් ප්‍රතිලාභයක් ප්‍රකාශ කරමි.

"මම මනුෂ්‍ය ආයුෂ ගෙවා මනුෂ්‍ය ලෝකයෙන් චුත වන්නෙම් නැවත දිව්‍ය ලෝකයෙහි උතුම්වූ දෙවියෙක් වන්නෙමි.

"ස්වාමීනි, මේ පස්වැනි කාරණය අර්ථ වශයෙන් දක්නාවූ මම මෙබඳුවූ තුෂ්ටි ප්‍රතිලාභයක්, සොම්නස් ප්‍රතිලාභයක් ප්‍රකාශ කරමි.

"කීර්ති ඇත්තාවූ අතිශයින් ප්‍රනීතවූ අකනිට්ඨ බඹලොව වාසීවූ ප්‍රසිද්ධ දෙවියෝ වෙත්ද අන්තිම භවය පවත්නා කල්හි ඒ නිවාසස්ථානය වන්නේය'

"ස්වාමීනි, මේ සවැනි කාරණය අර්ථ වශයෙන් දක්නාවූ මම මෙබඳුවූ තුෂ්ටි ප්‍රතිලාභයක් ප්‍රකාශ කරමි. ස්වාමීන් වහන්ස, මේ කාරණා හය දක්නාවූ මම මෙබඳුවූ තුෂ්ටි ප්‍රතිලාභයක්, සොම්නස් ප්‍රතිලාභයක් ප්‍රකාශ කරමි

**9** "නිම නොකරනලද මනෝරථ ඇත්තේ සැක ඇත්තේ කෙසේ කෙසේදැයි පැවැති සැක ඇත්තේ තථාගතයන් වහන්සේ යොයමින් බොහෝ කලක් හැසුරුනෙමි.

"යම් ශ්‍රමණයන් විවේක විහරන ඇත්තවුන් කොට හඟිම්ද, සම්බුද්ධයයි සිතමින් උන්වහන්සේලා ආශ්‍රය කරන්ට යමි.

'මාර්ගයෙහි හෝ ප්‍රතිපදාවන්හි කෙසේ සම්පාදනයවේද, කෙසේ අසම්පාදනය වේදැයි මෙසේ අසන ලද්දාවූ ඔව්හු සම්පාදනය කොට කියන්ට නොහැකි වෙත්.

"අපගේ සමීපයට ශක්‍රතෙමේ පැමිණියේයයි ඔව්හු තුමූ යම් කලෙක්හි මා දැනගනීද, කිනම් කර්මයක් කොට ශක්‍ර බවට පැමුණුනෙහිදැයි ඔව්හු තුමූ මා විචාරත්. ඔවුන්ට ජනයා කෙරෙහි ප්‍රසිද්ධවූ ධර්මය ඇසූ පරිද්දෙන් මමද ප්‍රකාශ කරමි. එයින් අප විසින් ශක්‍රතෙමේ දක්නා ලද්දේයයි කියාද, ඔව්හු සතුටු සිත් ඇත්තෝ වෙත්.

"යම් කලෙක්හි මම සැක දුරුකළාවූ බුදුරජාණන් වහන්සේ දුටුයෙම්ද ඒ මම අද සර්වඥයන් වහන්සේ ආශ්‍රය කොට පහවූ භය ඇත්තෙක් වෙමි. තණ්හාව නැමැති හුල නැසුවාවූ සමාන පුද්ගලයෙක් නැති හෙයින් අප්‍රති පුද්ගලවූ බුදුරජාණන් වහන්සේ මම වඳින්නෙමි. සූර්‍ය්‍ය බන්ධුවූ මහා වීරයන් වහන්සේ මම වඳිමි. නිදුකාණන් වහන්ස, දෙවියන් සමග බ්‍රහ්මයාට අපි යම් නමස්කාරයක් කෙළෙමුද, ඒ නමස්කාරය අද නුඹවහන්සේට කරමු. එබැවින් තුමූම නුඹ වහන්සේට නමස්කාර කරමු නුඹවන්සේම සම්බුද්ධ වෙහිය, නුඹවහන්සේ නිරුත්තරවූ ශාස්තෘය, දෙවියන් සහිත ලෝකයෙහි නුඹවහන්සේට ප්‍රති පුද්ගලයෙක් නැත්තේය."

**10.** ඉක්බිති ශක්දෙව් තෙමේ පඤ්චසිඛ නම් ගන්ධර්ව පුත්‍රයාට කථාකර මෙසේ කීවේය. "දරුව පඤ්චසිඛය, තොප මට බොහෝ උපකාර ඇත්තෙහිය. යම් හේතුවකින් තොප

භාග්‍යවතුන් වහන්සේ පළමුකොටම පැහැදෙව්වෙහිද එහෙයිනි, දරුව තා විසින් පළමුකොට පහදවන ලද අර්හත් සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ දැක්මට අපි පසුව එළඹියෙමු. ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ පිය තනතුරෙහි තබන්නෙමි. තොපි ගන්ධර්ව රාජ වන්නෙහිය. සූර්‍ය්‍ය මණ්ඩලයක් වැනි ශරීර කාන්තිය ඇති භද්‍රාවන්ද තොට දෙමි. ඕතොමෝ වනාහි තොප විසින් විශෙෂයෙන් පතන ලද්දීයයි” කීහ. එවිට ශක්‍ර දේවෙන්ද්‍ර තෙමේ අතින් පෘථිවිය පිරිමැද තුන් යලක් ප්‍රීති වාක්‍ය කීවේය. කෙසේද? “ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා. ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා. ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා” කියායි. මේ ප්‍රශ්න විසඳීම කරනු ලබන කල්හි ශක්‍ර දේවෙන්ද්‍රයාට රාගාදී කෙලෙස් රහිතවූ පහවූ කෙලෙස් මල ඇති ධර්ම ඇස උපන්නේය, කෙසේද ‘සමුදය ස්වභාවවූ යම් කිසිවක් වේනම්, ඒ සියල්ලම නැතිවීම ස්වභාව කොට ඇත්තේය යනුවෙනි’ අන්‍යවූ අසූදහසක් දේවතාවන්ටද මෙසේ ධර්ම ඇස උපන්නේය. මෙසේ මෙහි ශක්‍ර දේවෙන්ද්‍රයන් විසින් ආරාධනා කරණ ලද්දාවූ යම් ප්‍රශ්නයෝ අසන ලද්දාහුද භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ ප්‍රශ්නයෝ විසඳන ලද්දාහුය. එහෙයින් මේ ධර්මයට සක්කපඤ්හයයි කියාම නාමය වූයේය.

(සක්කපඤ්හ සූත්‍රය නිමවන ලදී.)